භදන්තාචරිය ධම්මපාල සථවිරපාදයන් විසින් විරචිත

පරමත්ථ දීපනී නම් වූ
උදානට්ඨකථා

(සිංහල පරිවර්තනය)



ප්‍රකාශනය
බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

උදානට්ඨ කථා
සිංහල පරිවර්තනය

භදන්තාචරිය ධම්මපාල සථවිරපාදයන් විසින් විරචිත පරමත්ථ දීපනී නම් වූ උදානට්ඨකථාව බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි සිංහලට පරිවර්තනය කළ දකුණු සිරිලක හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මිරිස්ස මිහිරිවැල්ලේ පදිංචි විජයකුංග ලියනපටබැඳිගේ ධර්මදාස මහතා 1962 දී විද්‍යෝදය පරිවෙණාස්ථ ශ්‍රී සුමංගල ගුණානුස්මරණ සංගමය මගින් දෙමටගොඩ පධානසර විහාරයේදී පවත්වන ලද ත්‍රිපිටක ධම් පරීක්ෂණයෙන් සමත්ව ත්‍රිපිටකාචාර්‍ය උපාධිය ද, විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙන් ශ්‍රාස්ත්‍රවේදී උපාධිය ද ලබාගත්හ.

අම්බලන්ගොඩ රන්දොඹේ ශික්ෂාලඬ්කාර විද්‍යාලයේ සහ දික්වැල්ල වැවුරුකන්නල විද්‍යානුංග පිරුවෙනෙහි අධ්‍යාපනය ලැබූ මොහු එම පිරිවෙණෙහිම ආචාර්ය වරයකු ලෙස කටයුතු කර ඇත. 1971 දී ගුරුආඥප්තියෙන් ඉවත් වැ රාජ්‍ය සේවාවතිර්ණව දිවයිනේ විවිධ පෙදෙස් හි සේවා නිරතව දැනට විශ්‍රාමිකව වෙසේ.

පාලි, හින්දි, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාවන් පිළිබඳ හසළ දැනුමකින් හෙබි මොහු මිරිස්ස සිරි සුනන්දාරාමස්ථ ශ්‍රී ප්‍රඥාලෝක දහම් පාසැලේ ගුරුවරයෙකු ලෙස ද ක්‍රියාකර ඇත. විශ්‍රාම ගැනීමෙන් පසු මොහු කළ ප්‍රථම පරිවර්තන කෘතිය ලෙස පටිසම්භිදා මග්ග අට්ඨකථාව සඳහන් කළ හැකිය.

මේ එතුමාගේ දෙවැනි පරිවර්තන කෘතියයි.

භදන්තාචරිය ධම්මපාල ස්ථවිරපාදයන් විසින් විරචිත

පරමත්ථදීපනී නම් වූ
උදානට්ඨ කථා
(සිංහල පරිවර්තනය)

බුද්ධශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ අනුග්‍රහයෙනි.

භදන්තාචරිය ධම්මපාල ස්ථවිරපාදයන් විසින් විරචිත

පරමත්ථදීපනී නම් වූ
උදානට්ඨ කථා
(සිංහල පරිවර්තනය)

සිංහල පරිවර්තනය

විජයතුංග ලියනපටබැඳිගේ ධර්මදාස

ත්‍රිපිටකාචාර්ය - ශාස්ත්‍රවේදී

අධීක්ෂණය

විජිතනන්ද සරත්චන්ද්‍ර

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256 ෆැක්ස්: 2736737

භදන්තාචරිය ධම්මපාල ස්ථවිරපාදයන් විසින් විරචිත

පරමත්ථදීපනී නම් වූ

උදානට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2008

ISBN 978-955-1604-36-3

පරිගණක අකුරුකරණය

උපමාලි කුලසේකර - කටුගස්තොට.

පිටකවරය

සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම.

මුද්‍රණය

අජිත් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය, බොරලැස්ගමුව.

දුරකථනය: 0112517269

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737

විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk

www.buddhistcc.com

ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලී එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශවල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේ ද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය රීස් ඩේවිඩ්ස් තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනී ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් සහ ඊ කුන් සහ ඔටෝ ප්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාරයයි යන බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෙගර් තුමා අනුමත කරයි.

4. බුදුරජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සලකන වින්ටර්නිට්ස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය බව පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රණයද ඇතිව ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයික භාෂාවකැයි පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුණු පන්සාළිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට

කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වූවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කුත් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදුරජාණන් වහන්සේ දක්වා වදාළ ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභංග සූත්‍රයෙනි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍ය ලෙස දැඩිව එල්බ ගත් ශාස්තෘෘවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කල ඒ එක නාමයක් දැඩිව අල්ලා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කළ යුතු බවත් ලෝක ව්‍යවහාරය නොඉක්මවිය යුතු බවත් අරණ විභංග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරළා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත් මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත් මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුළුල්ලෙහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර, මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ප්‍රසාදය දිනාගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස් කිරීමත් ආදිය නිසා බුද්ධ ධර්මයත් පාළි භාෂාවත් බුද්ධජන්මභූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාදීපයේ තහවුරු විය.

හෙළඅටුවා

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත්විය. මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දාහක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය

මිහිඳු මහ රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදී. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන් තිබූ ත්‍රිපිටකයේ ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කර දීම අවශ්‍ය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන්වලදී විස්තරාර්ථ සැපයීමත්ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

මහා අට්ඨකථා
කුරුන්දි අට්ඨකථා
පච්චරිය අට්ඨකථා නම් වේ.

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුනු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂය අතින් සෙසු හෙළටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණ මහා අට්ඨකථාවේ ලක්දිව සිදුවූ දේ පිළිබඳව බොහෝ වෘත්තාන්ත ද සඳහන්ව තිබුණ බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පනුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කිපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ කාඤ්චිපුර

(කොන්ජිවරම්) යෙහි පැවති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධී මණ්ඩපයට දකුණුදිග බමුණුගම උපන් බව සද්ධම්මසංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමංශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩඛේටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍ර දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ තලුන් පෙදෙසේ "කෝටනේමලී පුරිගුන්ඩ්ලු පල්ලි" යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩඛේටක යැයි පැවසේ. උන්වහන්සේ උපන් පෙදෙස මොරන්ඩඛේටක යැයි විසුද්ධි මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කථාවේ කර්තෘ සංදර්ශක ගාථාවක මයුර සුත්ත පට්ඨන හෝ මයුර රූප පට්ඨන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහි ද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කාය ව්‍යවච්ඡේද විද්‍යාවන් හීද ලක්ෂණ ශාස්ත්‍රයෙහිද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් එතුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයත් අත්ථසාලිනී අටුවාවත් දඹදිව දී කළ බවද සඳහන්ය. බුද්ධෝඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියෙකුව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවසය. බුද්ධවර්ෂ 953-975 අතර කාලයේය. උන්වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කීපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙළ බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාරීන්ගේ මතවාද ඇතුලත් වුන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවසම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන්ද දැන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදුදහම විරස්ථායී වීමට හේතුවක් යැයි උන්වහන්සේ ද සලකා හෙළටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාල දෙලක්ෂ පන්සැත්තෑ දහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්ෂ එක්සැට්දහස් සත්සියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැගූ සේකැයි දත යුතු යැයි පූජාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරකයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියෙහි වූ හෙළටුවාවන්හි අන්තර්ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඬු කරමින්, අවශ්‍ය ස්ථාන විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස් කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා 'මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය' යන කොන්දේසිය ද සහිතවය.

"මහා අට්ඨකථාව ශරීරය කොටගෙන මහාපච්චරිය කුරුන්දි ආදී විශ්‍රැතඅර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේද එහි යුක්තාර්ත සහ ඇතුලත් වන්නා වූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු."

තව ද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඬුකොට සියලුම විනිශ්චයන් ඇතුලත් කොට කිසිම තන්හි යුත් අත් නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු යි බුදුගොස් හිමියෝ පවසති.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදුසමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවාවන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැගීම වෙයි. පාළි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයායි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහළ වූයේ බුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටමය යන ජන ජනප්‍රවාදයක් ද ඇත.

අටුවා විස්තරය

විනය පිටකය

පෙළ		අටුවාව	කර්තෘ	කාලය
උභය විභංග	1 පාරාජිකා පාළි	1 ආණා දෙසනා සමන්තපාසාදිකා	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
	2 පාචිත්තිය පාළි	2 යථාපරාධ සාසන විනය අට්ඨකථා		
ඛන්ධක	3 චුල්ල වග්ග පාළි	3 සංවරාසංවර කථා		
	4 මහාවග්ග පාළි			
පරිවාර	5 පරිවාර පාළි			
		භික්ඛුපාතිමොක්ඛ කඞ්ඛා විතරණී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
		භික්ඛුණී පාතිමොක්ඛ (මාතිකට්ඨ කථා)		

අභිධර්ම පිටකය

1 ධම්මසංගණිප්පකරණ	1 පරමත්ථ දේසනා	අත්ථසාලිනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
2 විභංගප්පකරණ	2 යථාධම්ම සාසන	සම්මොහ විනොදනී	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
	3 නාමරූප පරිච්ඡේද කථා			
3 කථාවත්තුප්පකරණ			බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
4 පුද්ගලපඤ්ඤත්තිප්පකරණ				
5 ධාතුකථාප්පකරණ		පරමත්ථදීපනී		
6 යමකප්පකරණ		පඤ්චප්පකරණට්ඨකථා		
7 පට්ඨානප්පකරණ				

සූත්‍ර පිටකය

1 දීඝනිකාය	1 වොහාරා දේශනා	සුමංගල විලාසිනී	බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
2 මජ්ඣිමනිකාය	2 යථානුලෝමසාසන	පපඤ්ච සූදනී	බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
3 සංයුක්තනිකාය	3 දිට්ඨි විනිවෙඨන කථා	සාරත්ථප්පකාසිනි	බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
4 අංගුත්තරනිකාය		මනෝරථපූරණී	බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
5 බුද්දක නිකාය			
1 බුද්දකපාඨ	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
2 ධම්මපද	ධම්මපදට්ඨ කථා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
3 උදාන	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
4 ඉතිවුත්තක	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
5 සුත්තනිපාත	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
6 විමානවත්ථු	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
7 පේත වත්ථු	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
8 ථේර ගාථා	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
9 ථෙරී ගාථා	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
10 ජාතක	ජාතකට්ඨකථා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
11 නිද්දේස (චුල්ල-මහා)	සද්ධම්ම ජෝතිකා		උපසේන ආචාර්ය 6වන ශ.ව.
12 අපදාන (ථේර-ථෙරී)	විසුද්ධ ජන විලාසනී		මහානාම ආචාර්ය 7වන ශ.ව.
13 පටිසම්භිදා මග්ග	සද්ධම්මප්පකාසිනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
14 බුද්ධවංස	මධුරත්ථප්පකාසිනී		බුද්ධදත්ත හිමි 5වන ශ.ව.
15 චරියාපිටක	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.ව.
	විසුද්ධි මග්ග		බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.

නෙත්තිප්පකරණ	නෙත්ති අට්ඨකථා	ධර්මපාල ආචාර්ය 5වන ශ.ව.
චතුභාණවාරපාළි	චතුභාණවාර අට්ඨකථා	ආනන්ද වනරතන 8වන ශ.ව.

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාලියට නගන ලද්දේ බුද්ධදත්ත ධම්මපාල උපසේන සහ මහානාම තෙරවරුන් විසිනි.

බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනී නම් බුද්ධවංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

උපසේන හිමි

සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදි.

මහානාම හිමි

පටිසම්භිදාමග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනිය මුන්වහන්සේ විසින් ලියන ලදී.

ධම්මපාල හිමි

පරමත්ථදීපනී අට්ඨකථා - උදාන - ඉතිවුත්තක - විමානවත්ථු - ප්‍රේතවත්ථු - ථෙර ථෙරී ගාථා අට්ඨකථා මුන්වහන්සේ ලියන ලදී.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්ෂා කළ අය අට්ඨකථීකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථාචරියා යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරිය වාද, ආචරිය මත, ආචරිය වාද යන නම්වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවතී. මෑතකාලීන වියතුන් අතුරින් අග්ගමහාපණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතරද විවිධ මතභේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ ලිඛිතව නොතිබූ අර්ථ කථා සාහිත්‍යයට එවැනි දේ ඇතුළත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙළටුවා පස්වන සියවසේ බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන්වලදී එම මතිමතාන්තර ඇතුළත් වන්නට ඇති බව සිතිය යුතුය.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරා හිද එවැනි සම්ප්‍රදායන් පැවතුණු බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මතවලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දැන දැනත් සිය මතය

තහවුරු කරනු සඳහා ඒවා මදකිනිදු වෙනස් නොකර, ඉවත් නොකර, සංගායනාවලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාමවල පොත්ගුල්වල තබා පුස්තකාලවල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙළ ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කර ඇත. ඒ ධර්මපාලතුමා විසින් ඇතිකරන ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාෂයකි. 1916 ජූලි 05 දින **ත්‍රිපිටක මුද්‍රණසභා** නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදහත්වීමෙන් කොල්ලුපිටියේ පාම් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජූනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ඩික්මන් පාරේ තක්සලාහිදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමියන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සහභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාලතුමා ප්‍රධාන සාසනමාමක පිරිස්ද මෙම රැස්වීමට සහභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය භාරගත් බවද සඳහන් වේ.

සවිමන් හේවාවිතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවීය. එම අරමුදල මගින් හේවාවිතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයනවලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුණින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ සිංහල අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීම මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත්පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලට

පරිවර්තනය කර මුද්‍රණය කිරීමත් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර්මුද්‍රණය නිමවීමෙන් පසු අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කරන ලදී. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනී" නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්මදේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනී නම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනීනම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරීතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ විමසිලිමත් වනවිට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යතාව වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනාංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකූල අට්ඨකථාවල සිංහල පරිවර්තන නොමැතිකමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීමද අපේ පරමාර්ථයකි.

අපගේ ඉල්ලීමද පූජ්‍ය රාජකීය පණ්ඩිත වැළමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාවද අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදූර කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුළ අවසන් කිරීම සඳහා අපට පවරන ලදි. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දක්වූ ආදර්ශයත් ගොඩනැගූ විශ්වාසයත් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්යය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ට, ගරු අගමැතිතුමන්ට, ගරු බුද්ධශාසන නියෝජ්‍ය ඇමතිතුමන්ට, ආගමික අමාත්‍යාංශයේ ලේකම් මහතාට සහ අමරගේවා මද්දුම මහතාට ද අපේ කෘතඥතාවය, පුණ්‍යානුමෝදනාපූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී ආමිෂ ලාභයම නොව ශාසනික සේවයම සලකා එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන් පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද, උගත් ගිහි මහතුන්ට ද අපගේ

කෘතඥතාව හිමිවේ. සිංහල අටුවා පරිවර්තන සම්ක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධීකරණය කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාරවූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාටය. මෙම මහත්වරු දෙපළම ඉතා උනන්දුවෙන් මෙම කටයුතුවල නියැලීම පිළිබඳව එම මහත්වරුන්ටද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව මෙම කාර්යයට හොඳහිතින් අවංකව සහාය දුන් සියලු දෙනාටම පින් පුරවමින් ආසිරි පතමිහ.

මෙයට,

ශාසනස්ථිතිකාමී,

කිරම විමලජෝති ස්ථවිර,
අධ්‍යක්ෂක, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
නැදිමාල, දෙහිවල.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක මණ්ඩලය

පූජ්‍ය රාජකීය පණ්ඩිත ආඳාවල දේවසිරි නායක මාහිම්පාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවනානේ සෝමින්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පන්නල සුමේධ හිමිපාණන් වහන්සේ

රාජකීය පණ්ඩිත	කීර්ති නාරම්පනාව මහතා
ශාස්ත්‍රවේදී	ඇන්.එච්. පෙරේරා මහතා
පණ්ඩිත	ජේ.පී. නිමල්ලාල් රංජිත් මහතා
පණ්ඩිත	ටී.ජී. ජයතිලක මහතා
පණ්ඩිත	ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා
පණ්ඩිත	බී.ඇම්.පී. බාලසූරිය මහතා
පණ්ඩිත	සෝමරත්න ගම්ලත් වෙලගෙදර මහතා
පණ්ඩිත	දයා ගුණසේකර මහතා
පණ්ඩිත	ඩබ්ලිව්. ඇල්.පී. ධර්මදාස මහතා
පණ්ඩිත	ජිනදාස ගොඩකන්ද මහතා
පණ්ඩිත	පී.ඇල්.කේ. පෙරේරා මහතා

සම්බන්ධීකරණය:- විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක සමීක්ෂණ මණ්ඩලය

1. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
(පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
2. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ
(කැලණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
3. පූජ්‍ය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
4. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
5. හේමචන්ද්‍ර දිසානායක මහතා. (ශාස්ත්‍රවේදී)
6. පණ්ඩිත දයා ගුණසේකර මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
7. පණ්ඩිත ඒ ලසිත් නලන්ත මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
8. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා (ශාස්ත්‍රවේදී)
9. අභිධර්මාචාර්ය බුද්ධික විජේසිංහ මහතා (ශාස්ත්‍රවේදී-විද්‍යාවේදී)

සංඥාපනය

තෙලක් මිම්මට ගත නොහැකිව වැගිරී යන්නේ ද, එය ගලායාමකි. යම් ජලයකින් පොකුණක් පිරීමෙන් පසු උතුරා යන්නේ ද එය ඕඝයකි. එසේ යම් ප්‍රීතියක් හදවතට අසීමිතව දරාගත නො හැක්කේ ද, වැඩි වී හදවත නොරැඳී උතුරා පිටතට නික්මේ ද ගලායේ ද, එය උදානයයි.

දීඝනිකාය අට්ඨවාවේත්, උදාන අට්ඨවාවේත් උදානය හඳුන්වා ඇත්තේ මෙසේය.

මේ අනුව උදාන යනු පිරිසිදු නික්ලේශී හදවතකින් උතුරා යන්නා වූ ප්‍රීති වාක්‍යයයි. බුදුවරුන් විසින් ද, පසේ බුදුවරුන් විසින් ද, ශ්‍රාවකයන් වහන්සේලා විසින් ද ප්‍රකාශ කරන ලද උදාන අසූවක් පමණ විස්තර කරන අට්ඨවාව උදාන අට්ඨවාවයි. ක්ෂීණාශ්‍රව වූ තෙරණින් වහන්සේලා විසින් ද සමහර තැනක උදාන ප්‍රීති වාක්‍ය ගයා ඇත. ඒවා ථේරී ගාථාවල ඇතුළත් වේ.

උදානට්ඨ කථාව රචනාකර ඇත්තේ අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ මාහිමියන් විසිනි. උන්වහන්සේගේ රචනා මාර්ගය ආරම්භක ගාථාවල දැක්වේ. පූර්වාචාර්යවරයන්ගේ විනිශ්චයන් අනුව, මහා විහාරවාසීන්ගේ ඉගැන්වීම් වෙනස් නො කොට සද්ධර්මයාගේ චිරපැවැත්ම සඳහා උදානට්ඨ කථාව රචනා කරන බව උන්වහන්සේ කියති. උදානයේ ඇති වැදගත් විශේෂත්වය බෞද්ධ ජීවන දර්ශනයේ ඇතුළත පැහැදිලි ස්වරූපය ප්‍රකට වීමයි.

උදාන අට්ඨවාවේ වර්ග අටක් දැක්වේ. සත්වෙනි වර්ගයේ හැර අනෙක් සෑම වර්ගයකම සූත්‍ර දහය බැගින් වර්ණිතයහ. සෑම සූත්‍රයකම බුදුරදුන්ගේ ගාථාබද්ධ උදාන වෙයි. උදාන ශෛලිය සරලය.

ප්‍රථම වර්ගයේ දහවන සූත්‍රයේ බාහිය දාරුචීරිය තෙරුන්ගේ කථාව වෙයි. සංසාරයේ එක් ආත්මභාවයක දී වසර විස්සක් මහණකම් කළත්

කිසිවකුට පාත්‍රයක්, සිවුරක්, දානයක් වැනි දෙයක්වත් නොදී තනිවම භුක්ති විඳීම නිසා, අවසාන ආත්ම භාවයේ දී, රහත්ඵලයට පත් වූවත් මහණ වන්නට සිවුරක් පාත්‍රයක්, අටපිරිකරක් නො ලැබුනි. සිවුරු සොයන්නට ගිය වේලේ එළදෙනෙකු විසින් ඇන මරණයට පත්විය. සසර වසද්දී පසේ බුදුවරයෙකුට ඊතලයකින් විද උන්වහන්සේ ගේ සිවුරු සොරා ගැනීමේ අකුසලය ද මේ සඳහා විපාක දී ඇත. දාරුචීරියට ඒහිභික්ෂුභාවය තබා නිකම්වත් පැවිද්ද ලබාගැනීමට නො හැකි වූයේ ඒ කර්ම විපාකයෙනි. එහෙත් පෙර ප්‍රාර්ථනානුකූලව වහා ධර්මය අවබෝධ කරගන්නන් අතුරෙන් අග්‍රස්ථානය ලැබිණ. ආදාහනයෙනුත් පසුව ඒතදග්‍ර ස්ථානය පැවරිය.

මුවලින්ද වර්ගයේ සුප්පාවාසා ගේ කථාව එයි. සුප්පවාසා යනු සිවලී හාමුදුරුවන්ගේ මවය. සිවලී කුමරු සත් වස් සත් මස් සත් දවසක් මව්කුසේ සිටියහ. මේ වූ කලී යුද්ධ්‍යක විපාකය. සිවලී කුමරු සසර සැරිසරණ එක් ආත්මභාවයක දී රටක් අල්ලා ගැනීමට ගොස් එරට වැසියන්ට කෑම-බීම-වතුර-ලුණු ආදිය පිටතින් ගෙනයන්න නොහැකි ආකාරයට රට වට කළහ. ඒ මගින් ඒ රටවැසියාගේ මූලික මානව අයිතිවාසිකම් අහෝසි කළේය. එයට උපදෙස් දුන්නේ ඔහුගේ මව ය. ඒ අකුසල කර්ම විපාකයේ ඵලවිපාක වශයෙන් සිවලී කුමරු සත් වස් සත් වස් සත් මස් සත් දවසක් කුස තුළ දුක්විත්ද අතර මව සත් දවසක් විලිරුදාවෙන් දුක් වින්දාය. ඇය දරුවා බිහි කළේ බුදුරදුන් ගේ ආශිර්වාදයෙනි. නික්ලේශී උතුමන්ගේ ආශිර්වාදයෙන් මෙලොව දුක් කරදරවලින් අත් මිදෙන්නට හැකිය යන විශ්වාස මේ කථාවෙන් තහවුරු වේ. මහාත්මයන්ගේ ආශිර්වාද වචනවල යහපත රැඳී ඇත. එසේ ගර්භාවක්‍රාන්ති දුක මවත් දරුවාත් වින්දද, පෙර කුසල කර්මයන්ගේ විපාක හා පූර්ව ප්‍රාර්ථනානුකූලව සිවලී රහත් වූ අතර ලාභීන් අතුරෙන් අග්‍රස්ථානය ද ලැබීය. සිවලී රහතන් වහන්සේ බෞද්ධ ව්‍යාපාරිකයන්ගේ විශේෂ ගෞරවයට භාජනය වේ.

භික්ෂූන් අරුත් රහිත ඕපාදූප කථාවල යෙදෙන අයුරු දෙවෙනි වර්ගයේ සඳහනි. බිම්බිසාර රජු වඩා බලවත් ද කොසොල් රජු වඩා බලවත්ද, මේ දෙදෙනාගෙන් කවුරුන්ට විශාල යුද හමුදාව තිබේද, කවුරු සම්පතින් යුක්තද ආදී වශයෙනි. මෙය ඇසූ බුදුරදුන් භික්ෂූන්ට වදාළේ ධර්මානුකූල කථාවක් කළ නො හැකිනම් නිශ්ශබ්දව සිටින ලෙසය. මෙය භික්ෂූන්ට සදාකාලිකව වටිනා උපදේශයකි.

තුන්වන වර්ගයේ දහවන සූත්‍රයේ නොඇලීම ම විමුක්ති මාර්ගය බව දක්වයි.

හතරවන වර්ගයේ අටවන සූත්‍රයේ 418 සඳහන් වන්නේ සුන්දරී පරිබ්‍රාජිකාව ලවා භාග්‍යවතුන් වහන්සේට ආරෝපනය කරන ලද මාගම්සෝලි කුමන්ත්‍රණ කථාවය. අන් තොටුවන්ගේ සාකච්ඡාවේ දී තථාගතයන් වහන්සේගේ ශක්තීන්, පරිත්‍යාග, සමාජ සේවා ආදී සියලු තොරතුරු පිළිගනිමින් කථා කළ තීර්ථකයෝ, 'මේ සත්ත්ව ලෝකයේ මාගම් සුවයෙහි නො ඇළෙන සත්ත්වයෙක් නම් නැත. තවත් ගෞතමයෝ දෙවියෙක් හා සමානය. මනා රූ ඇත්තේය. සුන්දරී ද දැකුම්කළුය. මනා රූ ඇත්තිය.' ආදී වශයෙන් සාකච්ඡා කර ඇත. මේ කථාව වෙනත් තැන්වල විසිරවන්නේ තීර්ථකාරාමයට සුන්දරී පැමිණි බවයි. උදානට්ඨ කථාවේ සඳහන් වන්නේ සුන්දරී හමුවීම සඳහා අන්තොටුවන් පිරිස සුන්දරී පරිබ්‍රාජිකාවගේ අරමට ගිය බවයි. එහි ගොස් ඇය කැමති කරවා ගත් බවයි. මෙහි දී එරට රජු මේ ප්‍රශ්නය පිළිබඳව අනුගමනය කර ඇති ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙත ප්‍රශස්තය.

මහා වර්ගයේ පස්වෙනි සූත්‍රයේ භික්ෂූන් වහන්සේලා ගේ විනය කර්මයක් පිළිබඳව තොරතුරු එයි. විනයකර්මයක් සඳහා භික්ෂූන් රැස්වූ විට ඒ අතර දුශ්ශීලයකු සිට ඔහුට පිටවන ලෙස තුන්වරක් දැනුම් දී ඇත. එහෙත් ඔහු පිට නොවීම නිසා ඔහුගේ අතින් අල්ලා සීමා භූමියෙන් පිටමං කළ බව විස්තර වේ. මෙසේ සංඝයා අතර භේදයක් ඇතිවීම නිසා, භාග්‍යවතුන් වහන්සේ සහභාගි නො වී, භික්ෂූන්ට උපෝසථය කිරීමට පවරා ඇත. විසිවසක් ඕවාද ප්‍රාතිමෝක්ෂය උදෙසා, ඉන්පසුව ආණ ප්‍රාතිමෝක්ෂය දෙසීමට භික්ෂූන්ට අනුදැන වදාළ බව පෙනේ.

මහා වර්ගයේ දෙවෙනි සූත්‍රයේ මහාමායාගේ අභාවය පිළිබඳව සඳහනි. ආනන්ද හිමියන්ට දවසක් මෙසේ සිතිණ. මව්වරු දරුවන්ගේ රූපශ්‍රීය බලන්නට කැමැත්තාහු වෙති. මහාමායා සිටියේ නම් අද මේ බුදු හාමුදුරුවන්ගේ රූපශ්‍රීය බලා කෙතරම් සතුටු වන්නේ ද, මහාමායා සිටියේ නම් මහාමායාත් ප්‍රජාපතීත් යන දෙසොහොයුරියන්ම එක්ව භික්ෂුණී ශාසනය කෙතරම් අගේට බබළවන්නේ ද, එසේ ඇය සිටියේ නම් වැඩි උත්සාහයක් නො කොට ම පෙරැත්ත නො කරම භික්ෂුණී ශාසනය පිහිටුවීමට පහසුවෙන් අවසර ලැබෙනවා නොවේද, ආදී වශයෙනි.

මෙය ආනන්ද තෙරුන් භාග්‍යවතුන්ගෙන් විමසීය. තථාගතයන් පිළිතුරු දී ඇත්තේ, මම තව්තිසාවේ සිටිය දී පස්මහ බැලුම් බලත්දීම, මාස දහයකුත් හත් දවසක් ආයුෂ ඇති මහාමායාව ම මව් වශයෙන් තෝරා ගතිමි යනුවෙනි. මහාමායා අන්තරා වූයේ වැදූ හේතුවෙන් නොව, ආයුෂය අවසන් වීමෙන් බව පැහැදිලි කර ඇත. බෝසත්වරුන් පිළිසිඳගෙන සිටි කුස චෛත්‍ය ගෘහයක් හා සමානය. වෙනත් අයගේ පරිභෝගයට එය සුදුසු නො වේ. බෝසත් මව ඉවත්කොට වෙනත් අයෙකු අගමෙහෙසින් කළ නොහැක. බෝසත් මව්වරු ප්‍රථම වයස්හී සම්පත් විඳ මධ්‍යම වයසේ තෙවෙනි කොටසේ දරුවා ප්‍රසූත කොට මිය යති. එය ස්වභාව ධර්මයයි. ආගම නියමයයි.

අටවන වර්ගයේ පස්වෙනි සූත්‍රය කරුණු වශයෙන් මහා පරිනිබ්බාණ සූත්‍රයේ එන කරුණුවලට සමානය. සූකර මද්දවය යනු උණ කිළිල් විශේෂයක් බව එහි කියයි. තථාගතයන් දින කීපයක සිටම ලේ විරේචනයකින් වේදනා විඳි බව සඳහන් ය. වෙනත් අයකුට නම් පියවරක් තබා අනෙක් පියවර ගැනීමට පවා අමාරුය. නො හැකි තරම් ය. ඇතුන් කෝටි දහයක පමණ ශරීර බලය කිරිගොට්ටක දමන ලද සහල්වල දිය මෙන් ක්ෂය වූ බව දැක්වේ. කුසිනාරාවට යන අතරමග විසිපස් පලක වාඩි වී ගිමන් හළ බව වැඩිදුරටත් විස්තර වේ.

අටවන වර්ගයේ හයවන සූත්‍රයේ පාඨලී පුත්‍ර නගරවාසීන් විසින් කරවන ලද මහා ශාලාවක විස්තර සඳහනි. එය හඳුන්වා ඇත්තේ 'ආවාසථාගාරය' නමිනි. එහි එක් පැත්තක ධනවතුන්ගේ භාණ්ඩ තැන්පත් කරන ගබඩාය. එක් පැත්තක වාසස්ථානය. අනිත් පැත්තක දිළින්දන්ට කාමරය. තව පැත්තක කපණයන්ට, එක්පැත්තක් ආගන්තුකයන්ට, මගීන්ට පැත්තක් ගිලනුන්ට, වශයෙන් වෙන්කර ඇත. මෙය විවෘත කරවන ලද්දේ බුදුන් ප්‍රමුඛ මහා සංඝයා විසිනි. මුළු රැයක් ධර්මදේශනා කර ඇත.

චූල වර්ගයේ නව වන සූත්‍රයේ ථූන ගම්වාසී බමුණන්ගේ මූඩ ක්‍රියාවක් සඳහනි. බුදුන්වහන්සේ ථූන ගමට වැඩමවන බව ආරංචි වී එහි බමුණෝ එගම තිබුණු එකම ළිඳ තණකොළ - පිදුරු ආදිය දමා මුළුමනින්ම වසා දැමීය. ඒ තථාගතයන්ට වතුර නැති කිරීම සඳහාය. තථාගතයන් එහි වැඩමවා වතුර රැගෙන එන ලෙස ආනන්ද හිමියන්ට පැවරූහ.

ආනන්ද හිමියන් කීවේ ළිඳ වසා ඇති බැවින් වතුර නැති බවයි. තථාගතයන් වහන්සේ විසින් තෙවරක් කීමෙන් පසුව අනඳ හිමි පාත්‍රයත් රැගෙන වතුර ගෙන ඒමට ගියේය. ළිඳ උතුරමින් වතුර ගලා යයි. අනඳ හිමි දිය ගෙනාවේය. ළිඳේ වතුර උතුරා ගොස් මුළු ගමම යට විය. බමුණෝ පැමිණ තථාගතයන් වහන්සේ ක්ෂමා කරවාගෙන විනාශයෙන් බේරුණහ. මෙය බුද්ධ බලයකින් හෝ දේව බලයකින් සිදුනොවූ බවත් පුණ්‍ය බලයෙන් සිදු වූ බවත් භාග්‍යවතුන් වහන්සේ වදාළහ. මෙය කුකුත්ථක නදියේ දිය ගෙන ඒමට සමානය.

ජාත්‍යන්ධ වර්ගයේ ප්‍රථම සූත්‍රය පැහැදිලි කරන්නේ ආයු සංස්කාර හැරියේ මාරයාගේ ඉල්ලීමට නොව භික්ෂුවිය යුතු පුද්ගලයන් ඉතිරිව නො සිටි නිසා බවයි.

ජාත්‍යන්ධ වර්ගයේ එන තවත් පුවතක් නම් අන්ධයන් පිරිසක් ඇතාගේ විස්තර කී අයුරුය.

පුක්කුසාති, බාහිය දාරුචීරිය, සබ්බදාඨික-සුප්‍රබුද්ධ යන මේ හතරදෙනාම භාග්‍යවතුන් වහන්සේගෙන් බණ අසා රහත් වූහ. එහෙත් ඒ එක් අයෙකුටවත් පැවිදි වන්නට නොපුළුවන් විය. මේ හතරදෙනම පැවිදි වන්නට සිවුරු සොයන්නට ගිය වේලේ එළදෙනක විසින් ඇන මරාදමන ලදී. බැලූ බැල්මට නො අදහනු ඇත. මේ හතර දෙනම එක්තරා ආත්මයක යහළුවන් වී සිට ගැහැණියක් දූෂණයකොට අවසානයේ ඒ ගැහැණිය මරා ඇගේ ආභරණ ද අතේ තිබුණු මුදල් ද පැහැර ගත්හ. ඇය මළේ කවදා හෝ මා යක්ෂණියක් වී නොපව මරණවා යයි පතමිනි. මේ එළදෙන්ගේ වේශයෙන් ආවේ ඒ යකින්නයි. එසේම මේ බාහිය දාරුචීරිය වැන්නන් සංසාරයේ දී විසි අවුරුදු පමණ කල් මහණ වී මහණදම් රැක ඇත. එහෙත් මේ කාලය තුළ තනිවම සන්තර්පනය වූවා විනා කිසිම වෙනත් භික්ෂුවකට පාත්‍රයක්-අඳනයක් සිවුරක් පරිත්‍යාග කර නැත. ඒ සියල්ල මේ අවසාන ආත්ම භාවයේදීත් එළවා එළවා විපාක දුන්හ.

අටවැනි වර්ගයේ නිවන පිළිබඳව දේශනාවක් එයි. මහණෙනි, ඒ **එක්තරා ආයතනයකි. එහි පෘථිවිය නැත. ජලය නැත. උණුසුම නැත. වාතය නැත. ආකාසානඤ්චායතනය නැත. විඤ්ඤාණඤ්චායතනය නැත. ආකිඤ්චඤ්ඤායතන, නේවසඤ්ඤානාසඤ්ඤායතන නැත.** මේ ලෝකය

නැත. පරලෝකය නැත. සඳ නැත. හිරු නැත. එය අනගි යයි නො කියමි. ගති යයි නො කියමි. එහි පැවැත්මක් නැත. වුුතියක් නැත. උපතක් නැත. එයට ආධාරකයක් නැත. මෙය දුකේ අවසානයයි.

සියල්ලෝ ඒ නිවනට යෙත්වා!

විජිතනන්ද සරත්චන්ද්‍ර

මෙම ග්‍රන්ථයේ මුල් සූත්‍ර කීපයක්,
මහෝපාධ්‍යාය චන්ද්‍රකීර්ති ශ්‍රී පණ්ඩිත අම්බලන්ගොඩ සුමංගල
අමරපුර නිකායේ මහා නායක මාහිමියන් විසින්
සිංහලට පරිවර්තනය කරන ලද බැවි කෘතඥතා පූර්වකවැ
සඳහන් කරමි. උන්වහන්සේගේ පාණ්ඩිත්‍යයට, බහුශ්‍රැත භාවයට
හා කෘතහස්ත බවට ගරුකිරීම් වශයෙන්
එම පරිවර්තනවල කිසිදු වෙනසක් නොකළ බව සඳහන් කරමි.

පටුන

1 පළමුවන බෝධි වර්ගය 1-68

1-1 පළමුවන සූත්‍ර වර්ණනාව 1
1-2 දෙවන සූත්‍ර වර්ණනාව 2.5
1-3 තෙවන සූත්‍ර වර්ණනාව 28
1-4 සිව්වන සූත්‍ර වර්ණනාව 30
1-5 පස්වන සූත්‍ර වර්ණනාව 34
1-6 සයවන සූත්‍ර වර්ණනාව 37
1-7 සත්වන සූත්‍ර වර්ණනාව 42
1-8 අටවන සූත්‍ර වර්ණනාව 47
1-9 නවවන සූත්‍ර වර්ණනාව 50
1-10 දසවන සූත්‍ර වර්ණනාව 53

2 දෙවැනි මුචලින්ද වර්ගය 69-124

2-1 පළමුවන සූත්‍ර වර්ණනාව 69
2-2 දෙවන සූත්‍ර වර්ණනාව 70
2-3 තුන්වන සූත්‍ර වර්ණනාව 74
2-4 සිව්වන සූත්‍ර වර්ණනාව 75
2-5 පස්වන සූත්‍ර වර්ණනාව 77
2-6 සයවන සූත්‍ර වර්ණනාව 79
2-7 සත්වන සූත්‍ර වර්ණනාව 80
2-8 අටවන සූත්‍ර වර්ණනාව 83
2-9 නවවන සූත්‍ර වර්ණනාව 118
2-10 දසවන සූත්‍ර වර්ණනාව 121

3 තෙවැනි නන්ද වර්ගය 125-165

3-1 පළමුවන සූත්‍ර වර්ණනාව 125
3-2 දෙවන සූත්‍ර වර්ණනාව 128
3-3 තෙවන සූත්‍ර වර්ණනාව 139
3-4 සිව්වන සූත්‍ර වර්ණනාව 150
3-5 පස්වන සූත්‍ර වර්ණනාව 153

3-6 සයවන සූත්‍ර වර්ණනාව 155
3-7 හත්වන සූත්‍ර වර්ණනාව 160
3-8 අටවන සූත්‍ර වර්ණනාව 162
3-9 නවවන සූත්‍ර වර්ණනාව 164
3-10 දසවන සූත්‍ර වර්ණනාව 165

4 සිව්වන මේඝිය වර්ගය 174-232
4-1 පළමුවන සූත්‍ර වර්ණනාව 175
4-2 දෙවන සූත්‍ර වර්ණනාව 196
4-3 තෙවන සූත්‍ර වර්ණනාව 199
4-4 සිව්වන සූත්‍ර වර්ණනාව 202
4-5 පස්වන සූත්‍ර වර්ණනාව 205
4-6 සයවන සූත්‍ර වර්ණනාව 209
4-7 හත්වන සූත්‍ර වර්ණනාව 212
4-8 අටවන සූත්‍ර වර්ණනාව 213
4-9 නවවන සූත්‍ර වර්ණනාව 226
4-10 දහවන සූත්‍ර වර්ණනාව 230

5 පස්වන සෝණ වර්ගය 232-277
5-1 පළමුවන සූත්‍ර වර්ණනාව 232
5-2 දෙවන සූත්‍ර වර්ණනාව 235
5-3 තෙවන සූත්‍ර වර්ණනාව 238
5-4 සිව්වන සූත්‍ර වර්ණනාව 252
5-5 පස්වන සූත්‍ර වර්ණනාව 253
5-6 සයවන සූත්‍ර වර්ණනාව 263
5-7 හත්වන සූත්‍ර වර්ණනාව 270
5-8 අටවන සූත්‍ර වර්ණනාව 272
5-9 නවවන සූත්‍ර වර්ණනාව 274
5-10 දහවන සූත්‍ර වර්ණනාව 275

6 සයවන ඡචඤ්ඩ වර්ගය 277-313
6-1 පළමුවන සූත්‍ර වර්ණනාව 277
6-2 දෙවන සූත්‍ර වර්ණනාව 285

6-3 තෙවන සූත්‍ර වර්ණනාව 289
6-4 සිව්වන සූත්‍ර වර්ණනාව 292
6-5 පස්වන සූත්‍ර වර්ණනාව 296
6-6 සයවන සූත්‍ර වර්ණනාව 300
6-7 හත්වන සූත්‍ර වර්ණනාව 302
6-8 අටවන සූත්‍ර වර්ණනාව 303
6-9 නවවන සූත්‍ර වර්ණනාව 307
6-10 දහවන සූත්‍ර වර්ණනාව 310

7 සත්වෙනි චූල වර්ගය 313-338
7-1 පළමුවන සූත්‍ර වර්ණනාව 313
7-2 දෙවන සූත්‍ර වර්ණනාව 315
7-3 තෙවන සූත්‍ර වර්ණනාව 317
7-4 සිව්වන සූත්‍ර වර්ණනාව 318
7-5 පස්වන සූත්‍ර වර්ණනාව 320
7-6 සයවන සූත්‍ර වර්ණනාව 323
7-7 හත්වන සූත්‍ර වර්ණනාව 324
7-8 අටවන සූත්‍ර වර්ණනාව 326
7-9 නවවන සූත්‍ර වර්ණනාව 328
7-10 දහවන සූත්‍ර වර්ණනාව 333

8 අටවෙනි පායල්ගාම වර්ගය 338-382
8-1 පළමුවන සූත්‍ර වර්ණනාව 338
8-2 දෙවන සූත්‍ර වර්ණනාව 343
8-3 තෙවන සූත්‍ර වර්ණනාව 344
8-4 සිව්වන සූත්‍ර වර්ණනාව 347
8-5 පස්වන සූත්‍ර වර්ණනාව 349
8-6 සයවන සූත්‍ර වර්ණනාව 356
8-7 හත්වන සූත්‍ර වර්ණනාව 373
8-8 අටවන සූත්‍ර වර්ණනාව 375
8-9 නවවන සූත්‍ර වර්ණනාව 378
8-10 දහවන සූත්‍ර වර්ණනාව 382

පරමත්ථදීපනී නම්
උදානට්ඨ කථා

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට
නමස්කාරය වේවා !

දතයුතු සියලු ධර්ම නමැති සාගරයෙහි පරතෙරට පැමිණි, විචිත්‍ර වූ දේශනා ක්‍රම හා සියුම් ගැඹුරු නුවණ ඇති, සියලු සතුන්ට පිහිටවන මහා කාරුණික බුදුරජාණන් වහන්සේට නමස්කාර කරමි.

විද්‍යාචරණ සම්පන්න වූවාහු, යම් ධර්මයකින් සත්ත්වයා සංසාර නමැති ලෝකයෙන් නිවනට පමුණුවත් ද සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් පුදන ලද ඒ උතුම් ධර්මය නමස්කාර කරමි.

සීලාදී ගුණයන්ගෙන් යුක්ත වූ මාර්ගඵල සම්පත් ලැබූ යම් සංඝ රත්නයක් වේ නම් අතිශයින් ම උතුම් පුණ්‍යක්ෂේත්‍ර වූ ඒ ආර්ය සංඝරත්නය නමස්කාර කරමි.

මෙසේ රත්නත්‍රය වන්දනා කිරීමෙන් උපදවා ගත් යම් පුණ්‍ය සම්පත්තියක් වේ නම් එම පුණ්‍ය තේජසින් මම සියලු තන්හි නසන ලද අනතුරු ඇත්තෙක් වෙමි.

මහර්ෂි වූ ලොවට හිතැනි බුදුරදුන් විසින් සුද්ධ වූ ජීවිතකථා පිළිබඳ යම් උදාන දේශනා කර තිබේ නම් ඒ සියල්ල ධර්මසංග්‍රාහික

රහතන් වහන්සේලා විසින් එක් තැනකට එකතු කිරීම සඳහා සංග්‍රහ කරන ලද ධර්මය උදාන නම් වේ.

එය බුදුරජාණන් වහන්සේගේ ධර්ම සංවේගය හා ප්‍රීතිය ප්‍රකට කිරීම සඳහා සොම්නස් සහගත සිතින් දේශනා කරන ලද ගාථාවන්ගෙන් යුක්ත වේ.

ඒ බුදුරජාණන් වහන්සේගේ ගැඹුරු සියුම් නුවණින් විනිවිද ලෙස බලමින් දේශනා කරන ලද බැවින් එම ධර්මය පිළිබඳව මා විසින් කරනු ලබන අර්ථ වර්ණනාව අතිශයින් ම දුෂ්කර කාර්යයකි.

යම් ලෙසකින් එම අර්ථ වර්ණනාව සහ ශාස්තෘ ශාසනය උතුම් පූර්වාචාර්යවරුන්ගේ විනිශ්චය නිසාම පවතී නම් එම විනිශ්චයන් පාදක කරගෙන පුරාණ අට්ඨකථා ක්‍රමය හානිකාය ග්‍රන්ථ පස ඇසුරු කරගෙන

මහා විහාර වාසීන්ගේ ඉගැන්වීම වෙනස් නොකොට අතිශයින්ම පිරිසුදු, අසංකීර්ණ වූ සියුම් අර්ථ විනිශ්චය නැවත නැවතත් දැක්වෙන අර්ථ මැනවින් ඉවත්කොට උදාන පාලියෙහි අර්ථ වර්ණනාව ශක්ති පමණින් කරන්නෙමි.

මෙසේ සද්ධර්මයාගේ චිර පැවැත්ම ප්‍රාර්ථනා කරමින් විස්තර වශයෙන් ප්‍රකාශ කරනු ලබන මෙම අර්ථ කථාව පින්වත්හු මැනවින් පිළිගනිත්වා.

එහි උදාන නම් :

කවර අර්ථයකින් උදාන වීද?
ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කිරීම අර්ථයෙන් උදාන නම් වේ.
ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කිරීම යනු කුමක්ද?
සිතෙහි ප්‍රීති වේගයෙන් හටගත් අදහස ප්‍රකාශ කිරීමයි.

යම් සේ තෙල් ආදී මැනිය යුතු වස්තුවක් මැණීම් ගැනීමට නොහැකිව පිටත ගලා යයිද එය ඉතිරි වූ දෙයයි කියනු ලැබේ. යම් චතුරක් විලක නොරැඳී පිට උතුරා යයි ද එය ඕඝ යි (ගලා යන දිය පහරක්) කියනු ලැබේ.

එසේම ප්‍රීති වේගයෙන් සිතෙහි හටගත් සිතිවිලි පැහිරී ගොස් හදවත ඇතුලෙහි රැඳෙන්නට නොහැකිව උතුරා යාමෙන් වාග් ද්වාරයෙන් නිකුත්වන ප්‍රකාශ කිරීම් විශේෂය උදානය යි කියනු ලැබේ. ධර්ම සංවේග වශයෙන් ද මේ උදානය ඇතිවේ. එම උදානය සමහර තැනක ගාථා බන්ධන වශයෙන් ද, සමහර තැනක වාක්‍ය වශයෙන් ද පවතී. අර්ථ කථාවන්හි

'සොමනස්ස ඤාණමයික ගාථා පතිසංයුත්තං'

(සොමනස් සහගත ඥාන සම්ප්‍රයුක්ත ගාථාවන්ගෙන් යුක්ත වූ) උදාන ලක්ෂණ බෙහෙවින් කියන ලදී.

ප්‍රීතියෙන් හා සොම්නසින් යුක්ත වූ ගාථා බන්ධනයන්ගෙන් යුක්ත උදාන ද බෙහෙවින් කියන ලදී. එයට අමතරව 'ආපෝ භික්ඛවෙතදායතනං යත්‍ථ තෙව පථවි ත ආපො - තං එසෙවනෙත්‍ථා දුක්ඛසසාති'

'සුබ කාමාති භූතානි යො දණ්ඩෙන විහිංසති හි'

'යමෙක් සැප කැමති සත්ත්වයන් දඬුවමින් හිංසාවට ලක් කෙරේද, 'සචෙ භායථ දුක්ඛසසාති' ඉදින් දුකට බියවන්න යන මේ ආදී තැන්හි දක්නට ලැබේ. මෙසේ ඒ මේ උදානය **සබබඤඤූ බුද්ධ භාසිතය, පචෙචක බුද්ධ භාසිතය, සාවක භාසිතය** යි තෙවැදෑරුම් වේ. ඒ අතර පචෙචකබුද්ධ භාසිතය 'සබෙබසු භූතෙසු නිධාය දණ්ඩං අහෙඨයං අඤඤතරමපි තෙසං' ආදී වශයෙන් බගවිසාණ සූත්‍රයෙහි සඳහන් වන්නේය.

ශ්‍රාවක භාසිත වනාහි

සබෙබා රාගො පහීණො මෙ
සබෙබා දොසො සමූහතො
සබෙබා මෙ විහතො මොහො
සීතිභූතොස්මි නිබ්බුතො

(මාගේ සියලු රාගය ප්‍රහීණ විය. සියලු ද්වේෂය මැනවින් නසන ලද්දේ ය. මෝහයද ඉවසෙසින් නසන ලද්දේය. එබැවින් මම සිසිල් වූවෙමි. නිවුනේ වෙමි) යන ආදී වශයෙන් ථෙරී ගාථාවන්හිද

කායෙන සංවුතා ආසිං
වාචාය උද චෙතසා
සමූලං තණ්හං අබ්බුය්හ
සීතිභූතාසම්හි නිබ්බුතා

'මම කයෙන් සංවර වීමි.
වචනයෙන් ද සංවර වීමි.
තෘෂ්ණාව මුල් සහිතවම උදුරා දැමීමි. සිසිල් වීමි.
නිවුනා වෙමි' ආදී වශයෙන් ථෙරි ගාථාවන්හිද සඳහන් වේ.

මේ උදානයෝ ඒ ස්ථවිරුන්ගේ හා ස්ථවිරාවන්ගේ උදාන පමණක් නො වෙති. ඔවුන්ගේ සිංහනාදයෝ ද වෙති.

ශක්‍ර ආදී දෙවිවරුන් විසින් කියන ලද 'අහො දානං පරමදානං කසසපෙ සුපතිට්ඨිතං' යන ආදිය ද ආරාමදණ්ඩ බ්‍රහමණාදීන් විසින් හා මනුෂ්‍යයන් විසින් කියන ලද

'නමො තසස භගවතො' යනාදී ත්‍රිවිධ සංගීතියට ඇතුලත් කරන ලද උදාන ඇත. එම උදාන මෙහි ඇතුලත් නැත. බුදුරජාණන් වහන්සේ විසින් ම දේශනා කරන ලද ජින වචන නම් වූ නව ආකාරයට බෙදා දැක්වූ පර්යාප්ති ධර්මයට අයත් වූ උදානම ධර්මසංග්‍රාහක රහතන් වහන්සේලා විසින් සංග්‍රහ කරන ලද්දේ ද, එම උදානම වර්ණනා කිරීම පිණිස මෙහි ඇතුලත් කරන ලද්දේය.

භාග්‍යවතුන් වහන්සේ විසින් බෝධි රුක්ෂ මූලයෙහි දී 'අනෙකජාති සංසාරං' ආදී ගාථාවෙන් ප්‍රකාශ කරන ලද උදානගාථාව නොයෙක් දහස් ගණන් සම්මා සම්බුදුරජාණන් වහන්සේලා විසින් අත් නොහරින ලද උදාන ගාථාවකි. එය මෑත කාලයෙහි ධර්ම භාණ්ඩාගාරිකයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද බැවින් ධර්මසංග්‍රාහික රහතන් වහන්සේලා විසින් උදාන පාලියෙහි ඇතුලත් නොකොට ධර්මපද පාලියෙහි සංග්‍රහ කරන ලදී. 'අක්‍ඛාසි වත භො කොණ්ඩඤ්ඤෝ' යන උදාන වචනය දස දහසක් ලෝකයන්හි දෙවි මිනිසුන්ට දැන ගැනීමට සමර්ථ වූ මහා ශබ්ද පැතිරීමක් භාග්‍යවතුන් වහන්සේ විසින් කරන ලදී. එය ද ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාව

අවසානයේ දී තමන්වහන්සේ විසින් අවබෝධ කරගත් ධර්මයෙහි එක් කොටසක් වූ ආර්ය මාර්ගය ශ්‍රාවකයන් සියලු දෙනාටම ප්‍රථම කොණ්ඩඤ්ඤ තෙරුන් විසින් අවබෝධ කරගත් බැවින් තමන්ගේ උත්සාහයෙහි සාර්ථකභාවය සිහිකිරීම නිසා ප්‍රකාශ කරන ලද්දකි. ප්‍රථම බෝධියෙහි සියලු භික්ෂූන්ට මැනවින් ප්‍රතිපත්ති නුවණින් සිහිපත් කිරීම පිණිස හේතු වූ 'ආරාධයිංසු වත මං භික්ඛූ එක සමයං' යන ප්‍රකාශය මෙන් ප්‍රීතිසෝමනස්ස උපදවන ප්‍රකාශ මාත්‍රයක් පමණි. 'යදා හවෙ පාතුභවනති ධම්මා' ආදි ප්‍රකාශය මෙන් පවතින හෝ නොපවතින ප්‍රකාශන ධර්මසංග්‍රාහකයන් වහන්සේලා විසින් උදාන පාලියෙහි සංග්‍රහ නොකරන ලද බව දතයුතුයි.

ඒ මේ උදානය වනාහි විනය පිටකය සුත්තනත පිටකය, අභිධම්ම පිටකය යන තුන් පිටකය අතරින් සුත්තනත පිටකයට අයත් වන්නේය. දීඝනිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය, බුද්දක නිකාය යන නිකායග්‍රන්ථ පස අතරින් බුද්දක නිකායට අයත් වේ. සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන නවාංග ශාස්තෘ ශාසනයෙහි උදානය ඇතුලත් වේ.

චුරාසීතිං බුද්ධතො ගණ්හි දෙව සහස්සානි භික්ඛු තො
චතුරාසීති සහස්සානි යෙ මෙ ධම්මා පවත්තිතො'ති

බුදුරදුන්ගෙන් උදාන අසූදෙකක් ද, භික්ෂූන්ගෙන් දෙ දහසක් ද යි මේ ධර්මයෝ අසූහාර දහසක් වෙති.

මෙසේ ධර්ම භාණ්ඩාගාරිකයන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද අසූහාර දහසක් ධර්මස්කන්ධයෙහි උදාන පාලිය සංග්‍රහ වී ඇත.

බෝධි වර්ගය, මුචලින්ද වර්ගය, නන්ද වර්ගය, මේඝිය වර්ගය, සෝණ වර්ගය, ජච්චන්ධ වර්ගය, චුල්ල වර්ගය, පාටලීගාමිය වර්ගය යි වර්ග වශයෙන් අටකි. සූත්‍ර වශයෙන් සූත්‍ර අසූවකි. ගාථා වශයෙන් අනූපසක් උදානගාථා සංග්‍රහ වී ඇත. භාණවාර වශයෙන් සතලිස් පහකි.

බෝධි සූත්‍රයෙහි පුච්ඡා අනුසන්ධි වශයෙන් එක් අනුසන්ධියකි. සුප්පාවාසා සූත්‍රයෙහි පච්ඡා අනුසන්ධි දෙකකි. සෙසු තන්හි අනුසන්ධි

වශයෙන් එකම අනුසන්ධියකි. අජ්ඣාසය අනුසන්ධි මෙහි නැත. මෙසේ අසූ එකක් අනුසන්ධි සංග්‍රහ වී ඇත. පද වශයෙන් එක්විසි දහස් සියයකි. ගාථා පද වශයෙන් විසිඅට දහස් හාරසිය විසිතුනකි. අක්ෂර වශයෙන් හැටහත්දහස් තුන්සිය අසූ දෙකක් වේ.

එය මෙසේ කියනු ලබයි.

අසීති එව සුත්තන්තා වග්ගා අට්ඨ සමාසතො
ගාථා ච පඤ්චනවුති උදානස්ස පකාසිතා

අඩ්ඪුන නවමත්තාව භාණවාරා පමාණතො
එකාධිකා තථාසීති උදානස්සා නු සත්ථියෝ

එකවීස සහස්සානි සතඤ්ච ව විචක්ඛණෝ
පදානෙතානුදානස්ස ගණිතානි විනිද්දිසෙ

ගාථා පද වශයෙන් :

අට්ඨසහස්ස මත්තානි චත්තාරෙව සතානිච
පාදානෙතානුදානස්ස තෙ විසති ච නිද්දිසෙ

අක්ඛරානං සහස්සානි සට්ඨිසත්ත සතානි ච
තිණිඤ්ඩාසීති ච තථා උදානස්ස පමෙදිතා

ඒ වර්ග අට අතර බෝධිවර්ගය ප්‍රථම වර්ගයයි. සූත්‍ර අතර බෝධි සූත්‍රය යි. එහි ද 'මා විසින් මෙසේ අසන ලදි' (**එවමෙම සුතං**) ආදිය ආයුෂ්මත් ආනන්ද හිමියන් විසින් ප්‍රථම සංගීති අවස්ථාවෙහි කියන ලද නිදාන ආදියයි. ප්‍රථම සංගීතියෙහි දී විනය පිටකයෙහි පාලියට නගන ලද එය නිදානය කමට ඇති දක්ෂ බව පැහැදිලි කිරීමේ කථා මාර්ගයයි. එය සුමංගල විලාසිනී දීඝනිකාය අර්ථ කථාවෙහි කියන ලද පරිදි දතයුතුයි.

මෙහි **එවමෙමසුතං** යන ආදිය නිදානයයි. එහි **එවං** යනු නිපාතයකි. **මෙ** යනු නාමපදයකි. 'උරුවෙලා යං විහරති' යන මෙහි **වි** යනු උපසර්ග

පදයෙකි. **හරති** යනු ආඛ්‍යාත පදයෙකි. මේ ක්‍රමය අනුව සියලු තන්හි පද විභාගය දතයුතුයි.

අර්ථවශයෙන් 'එවං' ශබ්දය උපමා, උපදේශ සතුටුවීම, ගැරහීම, නිදර්ශන කිරීම, අවධාරණය, ප්‍රශ්න කිරීම, ප්‍රමාණ කිරීම ආදී විවිධ අර්ථ ඇති පදයෙකි.

එවං ජාතෙන, මවෙචන කත්තබ්බං කුසලං බහුං
මේ ආදී තැන්හි උපමාවෙහි ආයේය.

'එවං තෙ අභික්කමිතබ්බං' ආදී තැන්හි උපදේශයෙහි ආයේය. එවමෙතං භගවා එවමෙතං සුගතාති'

මෙතැන්හි සතුටු වීමෙහි ආයේය.

'එවංමෙවං පනායං වස ලී යසම්ං වා තසම්ං වා තසස මුණ්ඩකසස සමණසස වණණං භාසති'

යන ආදී ගර්හා කිරීමෙහි ද, 'එවමහනෙත ති බො තෙ භික්ඛු භගවතො පච්චසෙසා සුං' ආදී තන්හි වචන පිලිගැනීමෙහි ද, ධම්මං දෙසිතං අජානාමි'

මේ ආදිය ආකාරය ප්‍රකාශ කිරීමෙහි ද, 'එහි ත්වං මාණව, යෙන සමණො ආනන්දො තෙනුපසංකමෙය්‍යාසි' උපසංකම්ත්වා මම වචනෙන සමණං, ආනන්දං අප්පාබාධං අප්පාතබ්බං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡසසු, සුභො මානවො තොදෙය්‍යපුත්තො භවන්තං ආනන්දං..... ඵාසු විහාරාය පුච්ඡතීති එවඤ්ච වදෙහි සාධු කිර භවං ආනන්දො යෙන සුභසස මාණවසස තොදෙය්‍යපුත්තසස නිවෙසනං තෙනුපසංකමතු අනුකම්පං උපාදාය'

මේ ආදී තන්හි කරුණු ඉදිරිපත් කිරීමෙහි ද 'තං කිං මඤ්ඤථ කාලාමා ඉමෙ ධම්මා කුසලාවා අකුසලා -පෙ- එවං නො එත්ථ හොති' යනාදි තන්හි අවධාරණ කිරීමෙහිද,

එවමෙතෙ සුනහාතා සුවිලිතතා කපපිතකෙසමසසු ආමුතතමාලාභරණ යන ආදී තන්හි ප්‍රශ්න කිරීමෙහිද එවංලහුපරිවතතං එවමායුපරියනෙතා ආදී තන්හි ප්‍රමාණය දැක්වීමෙහි ද, එවං ජාතෙන මවෙචන ආදිය උපමා සඳහා උදාහරණ වශයෙන් යෙදී ඇත.

'යථාපි පුපඵරාසිමහා කයිරාමාලා ගුණෙ
එවං ජාතෙන මවෙචන - බහූ කතතබබං කුසලං බහුං'
යන මෙය උපමා දැක්වීම සඳහා කියන ලද්දේය.

'එවං ඉමිනා ආකාරෙන අභික්කමිතබබං' යන ආදිය අවවාද සඳහා කියන ලදී. 'එවං තෙ අභික්කමිතබබං එවං තෙ පටික්කමිතබබං යන ආදිය උපදේස සඳහා කියන ලදී.

එතදග්ගංභික්ඛවෙ මම සාවකානං බහුසසුතානං යදිදං ආනන්දෝ ගතිමනතානං සතිමනතානං ධිතිමනතානං උපට්ඨාකාහං යදිදං ආනන්දෝ' යනාදිය අවධාරණ අර්ථයෙහි වේ.

'මෙ' ශබ්දය අර්ථ තුනක දැක්වේ. ගාථාභිගීතමෙම අභොජනීයං යන ආදී තන්හි මා විසින් යන අර්ථ ඇත්තේය. සාධු මෙ භනෙත භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු යන ආදී තන්හි මට යන අර්ථ ඇත්තේය.

ධම්මදායාදා මෙ භික්ඛවෙ භවථා'ති ආදී තන්හි මා විසින් යන අර්ථ ඇත්තේය. මෙහි වනාහි මයා සුතං, මම සුතං යන අර්ථ දෙක්හි යෙදේ.

'සුතං' යන මේ ශබ්දය උපසර්ග සහිතව ද, රහිතව ද යෙදේ. එය ගමන්කිරීම ප්‍රකට බව, තෙත් බව රැස්කිරීම ආදී නොයෙක් අර්ථ ඇත්තේය. එහි සෙනාය පසුතො යන තැන්හි යන්නේය යන අර්ථයි. සුනධම්මසස පසසනො ආදී තැන්හි ප්‍රකට ධර්මය යන අර්ථයි. අවසසුතාවසසුතසස කෙලෙසුන්ගෙන් කිලිටි වූ යන අර්ථ ඇත්තේය. තුමෙහගි පුඤඤං පසුතං ආදී තැන්හි රැස්කරන ලද යන අර්ථ ඇත.

'යෙඣානපසුතා ධීරා' ආදී තැන්හි ධ්‍යානයන්හි යෙදුනෝය යන අර්ථ ඇත. 'දිටඨං සුතං මුතං' යන තැන්හි අසන ලදි යන අර්ථ ඇත.

'එවං මේ සුතං' යන සියලු වචනයෙන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ බුදුන් වදාළ ධර්මය තමා විසින් අදහමින් අසත්පුරුෂ භූමිය ඉක්මවයි. ශ්‍රාවක බවප්‍රකාශ කරමින් සත්පුරුෂ භූමියට බැස ගනියි. එසේම අසද් ධර්මයෙන් සිත නගා සිටුවයි. සද්ධර්මයෙහි සිත පිහිටුවා ගනියි. හුදෙක් මා විසින් අසන ලද්දේ ඒ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද වචනය යි තමා නිදහස් වෙයි. බුදුරජාණන් වහන්සේ සාක්ෂාත්කොට ගනියි. බුද්ධ වචනය සිත තුල තැන්පත් කර ගනියි. මා විසින් ඒ භගවත් චතුර්වෛශාරද්‍ය විශාරද, දසබලධර, ශ්‍රේෂ්ඨභාවයට පත්, සිංහනාද පවත්වන, සියලු සත්ත්වයන්ට උත්තම, ධර්මේශ්වර, ධර්මරාජ, ධර්මාධිපති, සද්ධර්මවරචක්‍රවර්ති සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ධර්මයෙහි සැකයක්, විමතියක්, නො කළ යුතුයි. මේ ධර්මයෙහි සියලු දෙවි මිනිසුන්ගේ අශ්‍රද්ධාව නැති කරයි. ශ්‍රද්ධාව උපදවයි.

එහෙයින් කියන ලදී.
විනාසයති අසද්ධං සද්ධං වඩ්ඪති සාසනෙ
එවමෙසුතමිච්චෙවං වදං ගොතමසාවකො

'එකං' සංඛ්‍යාව ප්‍රකාශ කිරීමයි. මේ එක ශබ්දය අන්‍යාර්ථ, මිශ්‍රාර්ථ, සහය සංඛ්‍යා ආදී අර්ථයන් යෙදේ. **සසසතො අත්තාව ලොකොව ඉදමෙව සචචං මොඝමඤ්ඤන්ති ඉච්චෙකෙ අභිවදන්ති** ආදි තන්හි අන්‍යාර්ථයෙහිද, 'චෙතසො එකොදිභාවං' මෙතැන්හි මිශ්‍රාර්ථයෙහි ද, 'එකොවූපකටෙඨා' මෙතැන්හි අසහාය අර්ථයෙහිද 'එකො ච බො භික්ඛවෙ බණොච සමයොච බ්‍රහ්මචරියවාසාය' යන තැන්හි සංඛ්‍යාර්ථයෙහිද යෙදේ.

'එකං සමයං' එහි සමය ශබ්දය අවිනිශ්චිතාර්ථය හා අනියම් අවස්ථාවක් ප්‍රකාශ කරයි. එසේම එක්වීමෙහි, අවස්ථාවෙහි කාලයෙහි, සමූහයෙහි, හේතුවෙහි, දෘෂ්ටියෙහි, ප්‍රතිලාභයෙහි, ප්‍රහාණ කිරීමෙහි හා අවබෝධ කිරීමෙහි යෙදේ.

එහෙයින් මේ ශබ්දයාගේ 'අපෙපව නාම සෙවපි උපසංක මෙය්‍යාම කාලඤ්ඤ සමයඤ්ඤ උපාදායා යන මේ ආදියෙහි සමවාය හෙවත් රැස්වීම් අර්ථයෙහි යෙදේ.

'එකොච බො භික්ඛවෙ බණ්ණ ච සමයො ච බ්‍රහ්මචරියවාසාය' යනාදියෙහි ක්ෂණය හෙවත් අවස්ථාව යන අර්ථයද 'උණ්හසමයො පරිළාහසමයො' යනාදියෙහි කාලය ද, 'මහාසමයො පවනසමිං' යනාදියෙහි සමූහ අර්ථය ද,

'සමයොපි බො තෙ භද්දාලි අපපටිවිද්ධො අහොසි භගවා බො සාවත්ථියං විහරති, භගවාපි මං ජානිසසති භද්දාලි නාම භික්ඛු සත්ථුසාසනෙ සික්ඛාය න පරිපූරකාරිති අයම්පි බො තෙ භද්දාලි සමයො අපපටිවිද්ධො අහොසි' යනාදියෙහි හේතුව යන අර්ථයද 'තෙන බො සමයෙන උගගාහමානො පරිබ්බාජකා සමණමණ්ඩිකා පුතෙතා සමයප්පවාදකෙ තින්දුකාවීරෙ එකසාලකෙ මල්ලිකාය ආරාමෙ පටිවසති' යනාදියෙහි දෘෂ්ටිය යන අර්ථයද ප්‍රකාශ කරයි. එහි වසන්නා වූ තීර්ථකයන් තම තමන්ගේ දෘෂ්ටි සංඛ්‍යාත ධර්මය ප්‍රකාශ කරන බැවින් ඒ පරිව්‍රාජකාරාමය සමයප්පවාදකය යි කියනු ලැබේ.

දිට්ඨෙව ධම්මෙ යො අත්ථො
යො වත්ථො සම්පරායිකො
අත්ථාභිසමයා ධීරො
පණ්ඩිතොති පවුච්චති

යනාදිය ප්‍රතිලාභයෙහි එයි. සම්මා මානාභිසමයා 'අත්තමකාසි, දුකඛසස' යනාදියෙහි ප්‍රහාණය යන අර්ථ ද 'දුකඛසස පීළනට්ඨා සංඛතට්ඨා සන්තාපට්ඨා විපරිණාමට්ඨා අභිසමයට්ඨා ආදි තන්හි ප්‍රතිවෙධ අර්ථ ය ද ප්‍රකාශ කරයි.

මෙහි වනාහි සමය ශබ්දයාගේ කාලය යන අර්ථය ප්‍රකාශ වේ.

එයින් සංවත්සර, ඍතු, මාස, අර්ධමාස, රාත්‍රි, දහවල්, පූර්වාහන, මධ්‍යාහ්න, සායාහන ප්‍රථම මධ්‍යම පශ්චිම යාම මුහුර්තාදී කාලභේද වූ සමයන් අතුරෙහි එක් කාලයකැයි දක්වයි. එහි මේ සංවත්සරාදිය අතුරෙහි යම් සූත්‍රයක් දෙසන ලද්දේ ද ඒ සියල්ල තෙරුන්වහන්සේ විසින් මනාකොට දන්නා ලදී. මනාව නිශ්චය කරන ලදී. යම්හෙයකින් අසුවල් අවුරුද්දෙහි, අසුවල් ඍතුවෙහි, අසුවල් මාසයෙහි, අසුවල් පක්ෂයෙහි අසුවල් රාත්‍රී භාගයෙහි හෝ දිවා භාගයෙහි මා විසින් මෙසේ අසන ලදැයි මෙසේ කී

කල්හි සුවසේ දරන්නට හෝ උදෙසන්නට හෝ උදෙසවන්නට හෝ නොහැකිය. බොහෝ දෙයක් කියයුතු අවස්ථාවක එකට පදයකින් එහි සියල්ල ගලපා එක් සමයෙකැයි කීහ.

යම් මේ ගර්භාවක්‍රාන්ති සමය, ජාති සමය, සංවේග සමය, අභිනිෂ්ක්‍රමණ සමය, දුෂ්කරක්‍රියා සමය, මාරවිජය සමය, අභිසම්බෝධි සමය, දිට්ඨධම්මසුඛවිහාර සමය, දෙසනාසමය, පරිනිර්වාණසමය යන මෙබඳු වූ භාග්‍යවතුන් වහන්සේගේ දෙවිමිනිසුන් අතර බෙහෙවින් පළ වූ නොයෙක් කාලප්‍රභේදයෝම සමයෝය. ඒ සමයයන් අතර දේශනා සමය නමින් ප්‍රකාශ වන අවස්ථා 'එක් සමයෙකැයි' දක්වයි. ඥාන-කරුණාකෘත්‍ය සමයන් අතර අතරෙහි යම් මේ කරුණාකෘත්‍ය සමයක් වේද, අතෘහිතපරහිත පටිපත්ති සමයන් අතුරෙහි පරහිතපටිපත්ති සමයක් වේද රැස්වූවන්ට කරණීයද්වය සමයයන් අතුරෙහි ධාර්මික කථා සමයක් වේද, දේශනා ප්‍රතිපත්ති සමයන් අතුරෙහි දේශනා සමයක් වේද ඒ සමයන් අතුරෙහි එක්තරා කාලයක් සඳහා එක් සමයෙකැයි කීහ.

කුමක් හෙයින් වනාහි අභිධර්මයෙහි මෙන් 'යසමිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති' යනුවෙන් ද, මෙයින් අන්‍ය වූ සූත්‍ර පදයන්හි 'යසමිං සමයෙ භික්ඛු විවිචෙචව කාමෙහි විවිචව අකුසලෙහි ධම්මෙහි' යනුවෙන් ආධාර විභක්තිය නිර්දේශ කරන ලද්දේද, විනයෙහි 'තෙන සමයෙහි බුද්ධා භගවා' යනුවෙන් කරණ විභක්ති වචනයෙන් නිර්දේශ කරන ලද්දේ ද, එසේ නොකොට **එක සමයං** යනුවෙන් අත්‍යන්ත සංයෝගාර්ථයෙහි උපයෝග වචනයෙන් (කර්ම විභක්තියෙන්) නිර්දේශ කරන ලද්දේ ද එහි එසේ වෙනත් අයුරකින් ද අර්ථ සම්භවය වන බැවිනි. ඒ අභිධර්මයෙහි ද මෙයින් අන්‍ය වූ සූත්‍රපදයන්හි ද, අධිකරණ අර්ථයද, භාවයෙන් භාව ලක්ෂණාර්ථය ද හටගනී. අධිකරණය වනාහි කාලාර්ථය හා සමූහාර්ථය ඇති සමයයි. එහි කියන ලද ස්පර්ශ ආදී ධර්මයන්ගේ ක්ෂණසමවාය හේතුසංඛ්‍යාත වූ සමයාගේ ස්වභාවයෙන් ඔවුන්ගේ ස්වභාවය සැලකේ. එහෙයින් එම අර්ථය ප්‍රකාශ කිරීම සඳහා ආධාර විභක්ති වචනය නිර්දේශ කරන ලදී. විනයෙහි ද හේතු අර්ථය හා කරණාර්ථය ද සම්භවය වෙයි. යම් ශික්ෂාපද ප්‍රඥප්ති සමයක් ශාරිපුත්‍රාදී මහරහතන් වහන්සේලා විසින් වටහාගැනීම දුෂ්කර වන්නේ ද මේ කරුණු හේතුකොට ගෙනය. යම් සමයක භාග්‍යවතුන් වහන්සේ යම් සූත්‍රාන්තයක් දේශනා කළසේක් ද ඒ සමයෙහි නිරන්තරයෙන්ම කරුණා සහගතවම

විසූ සේක. එබැවින් එම අර්ථය ප්‍රකාශ කිරීම සඳහා මෙහි කර්ම විභක්ති වචනය නිර්දේශ කරන ලදී. එහෙයින් මෙය කියන ලදී.

තං තං අත්ථමවෙකඛිත්වාභූමෙමන කරණෙන ච
අඤ්ඤත්ථ සමයො වුත්තෙතා උපයොගෙන සො ඉධ

ඒ ඒ අර්ථය සලකා අන් තන්හි ආධාර විභක්තියෙන් හා කරණ විභක්තියෙන් ද, මෙහි කර්ම විභක්තියෙන් ද ඒ සමය ශබ්දය කියන ලදී.

(යස්මිං සමයෙහි) යම් සමයෙක් හි කියා හෝ, (තෙන සමයෙන) ඒ සමයෙන් කියා හෝ (තං සමයං) ඒ සමය කියා හෝ ප්‍රකාශ වන්නේ එක් සමයෙක්හි යන අර්ථය යි. පෞරාණිකයෝ පවසති.

භගවා යනු ගරු යන අර්ථ ඇත්තේය. ගරු නම් ගුරුවරයාය. භාග්‍යවතුන් වහන්සේ ලෝකයේම ගුරුවරයායි කියති. බුදුරජාණන් වහන්සේ සියලු ගුණයන්ගෙන් යුක්ත වූ හෙයින් සියලු සත්ත්වයන්ට ගුරුවරයා වෙති. එබැවින් භගවත් යි දතයුතුය. පෞරාණිකයන් විසින්ද මෙසේ කියන ලදී.

භගවාති වචනං සෙට්ඨං භගවාති වචන මුත්තමං
ගරුගාරවයුත්තෙතා සො භගවා තෙන පවුච්චති

භගවා යන වචනය උතුම්ය. ශ්‍රේෂ්ඨය යන අර්ථය ප්‍රකාශ කරයි. ගුරු ගෞරවයෙන් යුක්ත වූ හෙයින් ද විශිෂ්ට ශාස්තෘ ගුණයෙන් යුක්ත වූ හෙයින් ද භගවා යි කියනු ලැබේ.
තවද :

භාග්‍ය ඇත්තේද, කෙලෙස් භග්න කෙළේ ද, ඓශ්වර්යාදී භග (වාසනා) ධර්මයන්ගෙන් යුක්ත වූයේද, ධර්මය විභාගකොට ප්‍රකාශ කළ සේක්ද, උතුරු මිනිස්දම් භජනය කෙළේද, භවයන්හි වමනය කළ (විනාශ කළ) ගමන් ඇත්තේද, එහෙයින් භගවත් නම් වේ.

භාග්‍යවා භගවා යුත්තෙතා - භගෙහි ච මිභතවා
භත්තවා වනත ගමනො - භවෙසු භගවා තතො

මේ ගාථාව වශයෙන් ද මේ පදයාගේ අර්ථය විස්තර වශයෙන් දතයුතුය. එය විශුද්ධි මාර්ගයෙහි බුද්ධානුස්සති නිර්දේශයෙහි කියන ලද්දේමය.

එසේම අතට පත් සක්විති රාජ්‍ය සම්පත්තිය ද, දෙදෙව්ලොව ආධිපත්‍යයට සමාන වූ, චාතුර්මහා ද්වීපික ඓශ්වර්ය සම්පත්තිය සක්විති සම්පත්තිය, සප්ත රත්නයන්ගේ පහළවීම ආදී සියලු සම්පත් තණ පිඩක් මෙන් සලකා ප්‍රතික්ෂේප කොට මහාභිනිෂ්ක්‍රමණය කොට සම්‍යක් සම්බුද්ධත්වයට පත්වූ සේක. එහෙයින් එවැනි සැප සම්පත් අත්හළේය යන අරුතින් භගවා නම් වේ. තව ද භානි නම් නැකැත් තරුය. ඔවුන් හා සමානව ගමන් කරන්නේ, පවතින්නේ භගා නම් වේ. සිනෙරු යුගන්ධර, උතුරුකුරු හිමවත්, ආදී ලෝකනිශ්‍රිත සෝභාවන් කල්පයක් පුරා වඩන්නේ ඔවුන් අතුරෙන් භාග්‍යය වමාරන්නේ - සංසාරවාසී සත්ත්වයින් සමතික්‍රමණය කොට ඒ පිළිබඳ ඡන්ද රාගය ප්‍රහාණ කළේ යයි මෙසේ වාසනා සම්පත් වමනය කළ හෙයින් භගවා නම් වේ. මේ ආදී ක්‍රමයෙන් භගවා යන පදයේ අර්ථ දතයුතුයි.

එවං මෙ සුතං යන වචනයෙන් අසන ලද පරිදි ධර්මය දේශනා කරන්නේ භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්මකාය ප්‍රත්‍යක්ෂ කරයි. එයින් 'මේ බුද්ධ වචනය අතිකකන්තසජ්ජුක (ශාස්තෘන් වහන්සේගෙන් වෙන් වූවක්) නොවේ. මේ ඔබගේ ශාස්තෘ'යි ශාස්තෘන් වහන්සේ නොදැක්මෙන් උකටලී වූ ජනයා අස්වසාලයි. **'එකං සමයං භගවා'** යන වචනයෙන් ඒ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේගේ අවිද්‍යමානත්වය දක්වන්නේ රූපකාය පරිනිර්වාණය සිහි කරවයි. එබැවින් මෙබඳු උතුම් ධර්මයක් දේශනා කරන්නා වූ වජ්‍ර-මාණික්‍යයකට සමාන රූපකායයක් ඇති ඒ භාග්‍යවතුන් වහන්සේ ද පිරිනිවන්පෑ සේක. එසේනම් අන් කුමක් නිසා ජීවිතයෙහි ආශාව උපදවිය යුත්තේදැයි ජීවිත මදයෙන් මත් වූ ජනයා සංවේගයට පත් කරවයි. සද්ධර්මයෙහි ජනයාගේ උනන්දුව උපදවාලයි. 'එවං'යි ද කියමින් දේශනා සම්පත්තිය නිර්දේශ කරයි. **'මේ සුතං'** යනුවෙන් ශ්‍රාවක සම්පත්තිය හා ශ්‍රවණ සම්පත්තිය නිර්දේශ කරයි. එය පටිසම්භිදා ඥානය ලැබීමෙන් පසු කරුණු පසක් හේතුකොට භාග්‍යවතුන් වහන්සේ විසින් එතදග්ග පාලියෙහි තබන ලද ධර්මභාණ්ඩාගාරික භාවය ප්‍රකාශ කිරීමට දක්වන ලද්දකි. **'එකං සමයං'** කාල සම්පත්තිය හා ශ්‍රවණ සම්පත්තිය නිර්දේශ කරයි. භගවා යනු

විශිෂ්ට ගුණ ඇති ශ්‍රේෂ්ඨ උත්තමයකුගේ උතුම් බව ප්‍රකාශ කිරීම් වශයෙන් දේසක සම්පත්තිය නිර්දේශ කරයි.

'උරුවෙලායං' යනු මහා වැල්ලයි. මහත් වූ වැලි සමූහයෙක්හි යන අර්ථයි. හෙවත් 'උරු' යනු වැල්ලයි. 'වෙලා' යනු මර්යදාවයි. හෙවත් සීමාවයි. වැල්ල නො ඉක්මවා පැමිණි වැල්ල උරුවෙලා යි අර්ථය දතයුතුයි.

අතීතයෙහි බුදුරජාණන් වහන්සේලා ඉපදීමට පෙර ඒ පෙදෙසෙහි වාසය කරන තාපසයන්ගේ කාය කර්ම වාග් කර්ම අනුන් අතර ප්‍රකට වේ. මනඃකර්මය ප්‍රකට නොවේ. එබැවින් යමෙක් මිථ්‍යා විතර්කයක් (වැරදි කල්පනාවක්) සිතයිද, හෙතෙම තමා විසින් තමාටම චෝදනා කොට කොළඹොටුවකට වැලිරැස්කොට ගෙනවුත් එහි විසුරුවයි. මෙසේ ක්‍රමයෙන් එහි මහා වැලි ගොඩක් ඇතිවිය. ඉක්බිති පශ්චිම ජනතාව එතැන වටකොට චෛත්‍යස්ථාන කලහ. ඒ සඳහා කියන ලදී. **උරුවෙලායං** මහත් වූ වැලිගොඩක් එකතු කළ තැන යන්නයි.

විහරති යනු මෙය අවිශේෂයෙන් ඉරියාපථ දිබබ බ්‍රහම අරියවිහාරයන් අතුරෙන් එක්තරා විහරණයක් දැක්වීමයි. මෙහි වනාහි සිටීම, යාම, හිඳීම, නිදීම යන ප්‍රභේද ඇති ඉරියව් අතුරෙන් එක්තරා ඉරියව්වක යෙදීම දැක්වීමයි. ආර්ය විහරණය දැක්වීම යනුයි දතයුතුයි. එක් ඉරියව්වක් වෙනස් කරමින් නො නවත්වා ආත්මභාවය පරිහරණය කරති. පවත්වාගෙන යති. එහෙයින් විහරති යන පදයාගේ අර්ථය ඉරියව් වශයෙන් දතයුතුය. යම්හෙයකින් වනාහි භාග්‍යවතුන් වහන්සේ දිවා විහරණය සත්ත්වයන්ට විවිධ අන්දමින් හිත පිණිස සුව පිණිස පවත්වති.

නජ්ජා යනු නාද කරයි. ගලා බසියි යන අර්ථයෙන් නදී නම් වේ. ඒ නදියෙහි පහළ කොටසෙහි යන අර්ථයි. නෙරඤ්ජරාය යනු පවිත්‍ර ජල ඇත්තේය යන අර්ථයි. නෙලංජලා යි කියයුතු තැන ලකාරයට 'ර'කාර ආදේශ කොට 'නෙරඤ්ජරාය' කියන ලදී.

මඩ, සෙවල කොල ආදී දෝස රහිත ජලය යනු අර්ථ ඇත්තේය. සමහරෙක් නීලජලාය යි කිය යුතු තැන නෙරඤ්ජරාය යි කියන ලදැයි

කියති. එම නදී ඉවුරෙහි යම්තැනක භාග්‍යවතුන් වහන්සේ විසූ සේක් ද එය දක්වන්නට **බොධිරුක්ඛමූලෙ** යි කියන ලදී.

එහි සිවුමග පිළිබඳ නුවණ බෝධි නමිය. එහි මාර්ග ඥානය බෝධියි කියන ලදී. **'පපොති බෝධිං වරභූරිමෙධසො'** යන තැන් සබ්බඤ්ඤුත ඥානය කියන ලදී. භාග්‍යවතුන් වහන්සේ මේ දෙවැදෑරුම් බෝධියට මෙහි පැමිණි සේක්නුයි ඒ වෘක්ෂයද බෝධිරුක්ඛ යන නම ලැබීය. තවද භාග්‍යවතුන් වහන්සේ සත්තබොජ්ඣංග ධර්මයන් අවබෝධ කළ බැවින් බෝධි නම් වෙති. එම ධර්මයන් අවබෝධ කරමින් මෙහි වැඩසිටි බැවින් එම වෘක්ෂය 'බෝධිරුක්ඛ' යන නම ලැබීය. 'මූලෙ' යනු එම බෝධි වෘක්ෂ මූලයෙහි. මේ මූල ශබ්දය 'මූලානි උද්ධරෙය්‍ය අත්තමසො උසීරනාළ මත්තානිපි' යන ආදී තන්හි මූල මූලෙහි දක්නට ලැබේ. 'ලොභො අකුසලං මූල' යන ආදී තන්හි අසාධාරණ හේතුවෙහි දැක්වේ. මෙහි සමීපාර්ථයෙහි ආයේය. එබැවින් මෙහි බෝධිවෘක්ෂ මූල සමීපයෙහි යන අර්ථය දතයුතුය.

පඨමාභිසම්බුදෙධා යනු පළමුකොට සම්බුදුබවට පැමිණ, සියල්ලටම ප්‍රථම යන අර්ථයි. මෙපමණකින් උදාන දේසනාව සඳහා නිදානය තබන්නා වූ ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරුන් විසින් කාලය, දේශක, ප්‍රදේශය හා කාරණය විශේෂයෙන් ප්‍රකාශ කරන ලදය. කුමක් නිසා ධර්ම විනය දෙක සංග්‍රහ කිරීමේදී නිදානය කියන ලද්දේ ද? භාග්‍යවතුන් වහන්සේ විසින් ම ප්‍රකාශ කරන ලද වචනය සංග්‍රහ කළ යුතු නිසාය. කාල, දේසක, වත්‍ථු ආදිය සම්බන්ධ කොට ප්‍රකාශ කරන ලද දේශනා බොහෝකල් පවතින්නේ ය. එහෙයින් ආයුෂ්මත් මහා කාශ්‍යප තෙරුන් විසින් 'ඇවැත් ආනන්ද, ප්‍රථම කවර ස්ථානයක දේශනා කරන ලදදැයි ඇසූ කල්හි එය විසඳීම පිණිස ධර්මභාණ්ඩාගාරික ආනන්ද තෙරුන් විසින් **'එවං මෙසුතං'** ආදී වශයෙන් උදානයෙහි නිදානය කියන ලද්දේය.

තවද නිදාන වචනය ශාස්තෘන් වහන්සේ ගේ සම්පත්තිය ප්‍රකාශ කරන්නේය. භාග්‍යවත් තථාගතයන් වහන්සේගේ ප්‍රථම දේශනා පිළිබඳව පවත්නා සැක දුරුකර ගැනීමට උපකාර වන්නේය. එය එහි පැමිණි පිරිසට තම අදහස අනුව තැනට සුදුසු පරිදි අවබෝධ කරගැනීම පිණිස ධර්මදේශනා පැවැත්වීමකි. මෙහි වනාහි විමුක්ති සුවය ලබාදෙන ප්‍රතීත්‍ය සමුත්‍පාදය සිහිකරවීම සඳහා කරන දේශනාව'යි යොදාගත යුතුයි. එබැවින්

'සත්‍ථු සම්පත්ති පකාසනත්‍ථං නිදානවචනං'යි කියන ලදී. එසේම සාසන සම්පත්තිය ප්‍රකාශ කිරීම ද නිදාන නම් වේ. භාග්‍යවතුන් වහන්සේගේ ඤාණයෙන් හා කරුණාවෙන් පරිපූර්ණ වූ සියලු ක්‍රියාවන්හි නිරර්ථක ප්‍රතිපත්තියක් නැත. එහෙයින් තමන්ගේ හා අනුන්ගේ යහපත පිණිස හේතුවන සියලුම කාය වාක් මනඃ කර්ම මෙලොව පරලොව යහපත පිණිස හේතුවන බැවින් උදානය සත්ත්වයන්ට අනුශාසනා **කිරීම්** අර්ථයෙන් සාසන නම් වේ. කාව්‍ය රචනා නොවේ. ශාස්තෘන් වහන්සේ විසින් රචනා කළ ඒ මේ උදානය කාලය, දේශය, දේශකයා, පිරිස, ප්‍රදේශය ආදිය සමග ඒ ඒ තැන්හි නිදාන වචනයෙන් සුදුසු පරිදි ප්‍රකාශ කරනු ලැබේ.

මෙහි වනාහි අභිසම්බෝධි විමුක්ති සුවය විඳීම් වශයෙන් ප්‍රතීත්‍ය සමුත්පාදය සිහිකිරීම යයි යොදාගත යුතුයි. එබැවින් **'සාසන සම්පත්ති පකාසනත්‍ථනිදාන වචනං'**යි කියන ලදී.

තවද ශාස්තෘන් වහන්සේ ගේ ප්‍රමාණ භාව ප්‍රකාශනයෙන් ශාසනයාගේ ද ප්‍රමාණභාව දැක්වීම සඳහා නිදාන වචනය හේතු වේ. භාග්‍යවතුන් වහන්සේ රාග, දෝස, මෝහ ආදී වූ සියලු කෙලෙසුන් නැසීමෙන් අනන්‍ය අසාධාරණ ඤාණ කරුණා ආදී ගුණ විශේෂයන් ප්‍රකාශ කිරීම පිණිස මෙම නිදාන වචනය ආරම්භ කිරීම් වශයෙන් යොදන ලද්දේය.

එය වනාහි 'එවං මෙ සුතං'යි පටන් ගෙන 'ඉමං උදානං උදානෙසි' යන තැන දක්වා උදානයාගේ නිදානය දතයුතුය.

භාග්‍යවතුන් වහන්සේ මේ උදානය ප්‍රකාශ කළ සේකැයි මූලපටන් බුදුරජාණන් වහන්සේගේ කායික චෛතසික, ප්‍රතිපත්ති ප්‍රකාශ කිරීම පිණිස සංගීතිකාරක රහතන් වහන්සේලා විසින් සංගීති කාලයෙහි ප්‍රකාශ කරන ලද වචනයෝය.

'ඉමසමිං සති ඉදං හොති' යනු භාග්‍යවතුන් වහන්සේගේ ම වචනයක් වීම සුදුසු ද? ශාස්තෘන් වහන්සේ හැර අනිකෙක් පටිච්ච සමුප්පාදය දේශනා කරන්නට සමර්ථ නොවේ. එයම සත්‍ය වේ. යම් සේ වනාහි භාග්‍යවතුන් වහන්සේ බෝධි වෘක්ෂ මූලයෙහි ධර්ම ස්වභාව ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන් ප්‍රතීත්‍ය සමුත්පාදය සිහිකල සේක් ද, එම

ධර්මය අවබෝධ කරගැනීමට සුදුසු අයට අවබෝධ කරගැනීම සඳහා පටිච්චසමුප්පාද නමැති සිංහනාදය දේශනා කළහ. භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කළ ධර්මසංග්‍රාහක මහතෙරවරු මෙම නිදානය සංග්‍රහ කළහයි එසේ කියන ලද වචනය අවසාන තීරණය යි ගතයුතුය. අනෙක් සූත්‍රවලද මේ ක්‍රමයම අනුගමනය කළ යුතුයි.

මෙහි ද අත්තජ්ඣාසය, පරජ්ඣාසය, පුච්ඡාවසික, අත්ථුප්පත්තික යි සූත්‍ර නික්ඛේප සතරකි. යම්සේ නොයෙක් සියගණන්, දහස් ගණන් සූත්‍රයෝ වෙත්ද ඒ සියලු සූත්‍ර අත්තජ්ඣාසය ආදී සූත්‍ර නික්ඛේප වශයෙන් සිවුවැදෑරුම් වේ. අත්තජ්ඣාසය, අත්ථුප්පත්තිය යන දෙක පරජ්ඣාසය, අත්ථුප්පත්තිය යන දෙක පරජ්ඣාසය, පුච්ඡාවසික දෙක සමග සංසර්ග භේදය හටගනී. මේ එහි වචනාර්ථයයි. **නිකමපනං** යනු ඇතුලත් කිරීමයි. සූත්‍රයන්ගේ ඇතුලත් කිරීම සූත්‍ර නික්ඛේපයයි. සූත්‍ර දේශනාව යන අර්ථයි. තමන්ගේ අධ්‍යාශය අත්තජ්ඣාසය නම් වේ. තමන්ගේ අධ්‍යාසය මෙහි ඇත්තේනුයි හෝ අත්තජ්ඣාස නම් වේ. පරජ්ඣාසය යනු ද මෙසේමය. විචාරීමෙන් හා ප්‍රකාශ කිරීමෙන් යුක්ත වූයේ පුච්ඡාවස නම් වේ. එම පුච්ඡාවසය මොහුට ඇති නිසා පුච්ඡාවසික නම් වේ. සූත්‍ර දේශනාව සඳහා යම්කිසි කාරණයක් හටගැනීම අත්ථුප්පත්ති නම් වේ. එම අත්ථුප්පත්තිය මොහුට ඇති නිසා අත්ථුප්පත්තික නම් වේ.

මෙහි වනාහි යම් උදාන භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන් හමුවෙහි ප්‍රකාශ කරන ලද ද, ඒවා වචනයෙන් පුරුදුකොට, මනසින් නැවත නැවතත් පරීක්ෂාකොට ප්‍රකාශ කරන ලද්දේය. ඒවා නැවත භාණ්ඩාගාරික ආනන්ද තෙරුන්ට ප්‍රකාශ කරන ලද්දේය.

භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන් නැති තැනදී ප්‍රකාශ කරන ලද යම් උදාන වේ නම් ඒ සියලු උදාන ද භාණ්ඩාගාරික ආනන්ද තෙරුන්ට පසුව දේශනා කරන ලද්දේය. ඒ සියලුම උදාන ආයුෂ්මත් ආනන්ද ස්ථවිර ධාරණය කොට භික්ෂූන්ට ප්‍රකාශ කරන්නේ පසුකාලයෙහි ප්‍රථම සංගීති කාලයෙහි උදාන දේශනාය යි සංග්‍රහයට ඇතුලත් කරන ලදැයි දතයුතුයි.

තෙන බො පන සමයෙන යන ආදී තන්හි **තෙන සමයෙන** යනු සප්තමී අර්ථයෙහි කරණ විභක්ති වචනයකි. බො පන යනු නිපාතයෝය.

එම කාලයෙහි යන අර්ථය කවරනම් කාලයකද? භාග්‍යවතුන් වහන්සේ යම් කාලයක නේරඤ්ජරා නදී ඉවුරෙහි උරුවෙලාවෙහි බෝධිවෘක්ෂ මූලයෙහි බුදුවන්නට පෙර වාසය කළ සේක්ද එම කාලයෙහි ය. **සත්තාහං** යන දින සතකි. අත්‍යන්ත සංයෝගයෙහි උපයෝග වචනයකි. යම් ලෙසකින් භාග්‍යවතුන් වහන්සේ සත්දිනක් නිබඳවම අතරමඟ නොනවත්වා ඵලසමාපත්ති සුවයෙන් වාසය කළ සේක් ද, එබැවින් අත්‍යන්ත සංයෝගයෙහි උපයෝග වචනයෙන් කියන ලදී. **එකපල්ලංකෙන** යනු වෙසක් පුණු පොහෝදින සූර්යයා බැසයාමට පෙර අපරාජිත පර්යංකය වූ වජ්‍රාසනයෙහි වැඩහුන් කාලයෙහි පටන් එක් වරක්වත් නො නැගිට පලක් බැඳගෙන එකම පර්යංකයෙන් **විමුත්ති සුඛපටිවෙදී** විමුක්ති සුවය හා පලසමවත් සුවය විඳිමින් වැඩසිටි සේක යන අර්ථයි. එහි විමුත්ති යනු තදංග, වික්ඛම්භන, සමුච්ඡේද, පටිප්පස්සද්ධි, නිස්සරණ යන විමුක්ති පසයි. දාන පරිත්‍යාග වශයෙන් ඒ ඒ ගුණාංගයන් ගෙන් ද නාම රූප භේදයන් විදර්ශනා වශයෙන් බැලීමෙන් ද සිතෙහි පිරිහීම සඳහා හේතුවන ප්‍රතිපක්ෂ ධර්මයන් ප්‍රහානය කිරීමෙන් ඇති විමුක්තිය තදංග විමුක්තිය යි. දන් දීමෙන් මසුරුකමද, සීලයෙන් හා නාමරූපයන් වෙන් වෙන් සලකා බැලීමෙන් සක්කාය දෘෂ්ටිය ද, විචිකිච්ඡාවද ආදී නීවරණ ධර්මයන් ප්‍රහීණ කිරීමෙන් ලැබෙන විමුක්තිය **තදංග විමුත්ති** නම් වේ. උපචාර, අර්පණා සමාධියෙන් සිතෙහි පරිහානිය අකුසලයන් වූ කාමච්ඡන්දා දී පංචනීවරණයන් හා විතර්ක ආදියද නැවත නූපදිනා අයුරින් දුරුකිරීම **විකඛම්භන විමුත්ති** නම් වේ. සතර ආර්ය මාර්ගයන් පුරුදු කිරීමෙන් ඒ ඒ මාර්ගයෙන් ආර්යයන් වහන්සේ ගේ සන්තාන ගත සියලු කෙලෙස් සමූහය සම්පූර්ණයෙන් ප්‍රහාණය කිරීම **සමුච්ඡේද විමුත්ති** නම් වේ. ඵලඥානය අවබෝධ කිරීමේ දී ක්ලේශයන් ගේ සංසිඳීම් වශයෙන් ලබන විමුක්තිය **පටිප්පස්සද්ධි විමුත්ති** නම් වේ. සියලු සංඛත ධර්මයන් විනාශ කිරීමෙන් සියලු සංස්කාර ධර්මයන්ගෙන් ලබන විමුක්තිය **නිස්සරණ විමුත්ති** නම් වේ. මෙහි වනාහි නිර්වාණය අරමුණුකොට ඇති ඵල විමුක්තිය අදහස් කරන ලදී. **විමුත්ති සුඛ පටිවෙදී** යි එහෙයින් කියන ලදී.

අථ යනු අධිකාරර්ථයෙහි (ප්‍රාර්ථනා කිරීමෙහි) නිපාත පදයෙකි. **ඛො** යන පද පූරණාර්ථයෙහිය. මෙම විමුක්ති සුඛපටිසංවේදනයෙන් අන්‍ය වූ ප්‍රාර්ථනාවක් දක්වයි. තවද **අථ** පසුව **ඉක්ඛිති** යන අර්ථයෙහි ද නිපාත පදයෙකි. ඒ සත් දිනකට පසුව කිය යුත්ත යන අර්ථයද ප්‍රකාශ කරයි. **තසසසත්තාහස්ස** පර්යංකයෙහි සත් දිනක්. **අච්චයෙන** ගතවීමෙන්

තමහා සමාධිමහා අර්හත්ඵල සමාධියෙන් අනතුරුව මෙහි වනාහි පිළිවෙළින් සත් සතියක් දැක්විය යුතුයයි සමහරෙක් විස්තර කළහ. අපි වනාහි මෙම උදාන පාලියට විරුද්ධ නොවන වර්ණනා කරන්නෙමු.

රත්තියා යනු මුලු රාත්‍රියම සම්බන්ධ කිරීමෙහි සප්තමී වචනයි. **පඨමං** යනු අත්‍යන්ත සංයෝගයෙහි උපයෝග වචනයි. භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රියෙහි ප්‍රථමයාමය පුරාම ප්‍රතීත්‍ය සමුත්පාදය සිහිකරමින් වීසූහ.

පටිච්ච සමුප්පාදං යනු ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයයි. අවිජ්ජා ආදී ප්‍රත්‍ය ධර්මයෝ පටිච්ච සමුප්පාද නම් වේ. එය කෙසේ දැනගත යුතුද? භාග්‍යවතුන් වහන්සේගේ වචනයෙන්, භාග්‍යවතුන් වහන්සේ විසින් 'ආනන්ද, එහෙයින් මෙහි ජරාමරණයට මේ ජාතියම හේතු වේ. මෙයම නිදාන වේ. මෙයම සමුදය වේ. මෙයම ප්‍රත්‍ය වේ. සංස්කාරයන්ට යම් අවිද්‍යා ආදියක් වේ නම් එයට හේතුව ද්වාදස වේ.

එය දොළොස් වැදෑරුම්ය. ද්වාදස වූ ප්‍රතීත්‍ය සමුත්පාදය යනු එහි වචනාර්ථ යි.

ප්‍රත්‍ය සමූහය ඔවුනොවුන් නිසා සමව සංඛාරාදි ප්‍රත්‍යයොත්පහන ධර්මයන් උපදවන හෙයින් පටිච්චසමුප්පාදය යි දේශනා කළහ. තවද හේතු කොටගෙන අවබෝධ කළයුතු බැවින්, අවබෝධ කළයුතු ප්‍රත්‍යයන්ගේ උත්පාදය පටිච්චසමුප්පාද නම් වේ. ඵලයක් උපදවීමට සමත් වූයේ හේතු නම් වේ. අවබෝධ කරගන්නට සුදුසු වූයේ පටිච්ච නම් වේ. මැනවින් තෙමේ ම උපදවානුයි සමුප්පාද නම් වේ. ප්‍රත්‍යයම සමුප්පාද වේනුයි පටිච්චසමුප්පාද නම් වේ.

අනුලොමං යනු අවිජ්ජා පච්චයා සංඛාරා ආදී වශයෙන් කියන ලද අවිජ්ජා ආදී ප්‍රත්‍යයාකාර ධර්ම තමන් විසින් අවබෝධ කරගත යුතු බැවින් අනුලොමයි කියනු ලැබේ. හෙවත් මුල පටන් අවසානය දක්වා කියයුතු බැවින් හා පවතින බැවින් අනුලෝමයි කියනු ලැබේ.

සාධුකං මනසාකාසි යමෙක් යම් ප්‍රත්‍ය ධර්මයක් යම් ප්‍රත්‍ය ධර්මයකට හේතු ප්‍රත්‍ය වශයෙන් ප්‍රත්‍ය වේද, ඒ ඒ ප්‍රත්‍ය වෙනස්

නො කොට, ඉතිරි නො කොට ප්‍රත්‍යවෙක්ෂා වශයෙන් සිතෙහි තබා ගත්තේය යන අර්ථය, යම් ලෙසකින් භාග්‍යවතුන් වහන්සේ පටිච්චසමුප්පාද ධර්මයන් අනුලෝම වශයෙන් සිතෙහි තැන්පත් කර ගත්තේ ද, සංක්ෂේපයෙන් එය පැහැදිලි කරන්නට **'ඉති ඉමසම්ං සති ඉදං හොති ඉමස්සුප්පාද ඉදං උප්පජ්ජති'** යි කියන ලදී.

එහි **ඉති** යනු මෙසේ නොයෙක් ආකාරයෙන් යන අර්ථයි. **ඉමසම්ං සති ඉදං හොති** යනු මෙම අවිජ්ජා ආදී ප්‍රත්‍යයන් ඇති කල්හි මේ සංඛාරාදී ඵල ඇති වේ. **ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති** යනු මෙම අවිජ්ජා ආදී ප්‍රත්‍යයන්ගේ හටගැනීමෙන් මෙම සංඛාරාදී ඵල උපදී යන අර්ථයි.

ඉමසම්ං අසති ඉදං නහොති ඉමසම්ං නිරොධා ඉදං නිරුජ්ඣති

අවිජ්ජා ආදීන්ගේ අභාවයෙන් සංඛාරාදීන්ගේ අභාවයත් අවිජ්ජා ආදීන්ගේ නිරෝධයත් සංඛාර ආදීන්ගේ නිරෝධයත් වේ. දෙවන තුන්වන සූත්‍රයන්ගෙන් මෙම ප්‍රථම ප්‍රත්‍ය ලක්ෂණය දක්වන ලද්දේය. 'ඉමසම්ං සති එව න අසති. ඉමස්සුප්පාදා එව න අනුප්පාදා අනිරොධා එව න නිරොධා' යන මෙයින් ප්‍රතීත්‍යසමුත්පාදයේ ඇතුලත නියමය කියන ලදැයි දතයුතුයි. නිරොධොති අවිද්‍යාදීන් ගේ නො ඇලීම් හේතුවෙන් මතු නො උපදවීම නො පැවතීම කියන ලදී. **අවිජ්ජායත්වෙව අසෙසවිරාග නිරොධො සංඛාර** නිරොධො යන ආදිය නිරොධනිරොධය ද උපපාදනිරොධී භාවයෙන් කියන ලදී. එබැවින් එය **'ඉමස්සනිරොධා ඉදං නිරුජ්ඣති'** දක්වන ලදී. එහි **සති** යනු මෙම විද්‍යමානත්ව හේතුකොට ප්‍රත්‍යයභාවය ප්‍රකාශ කරන්නේ ප්‍රතීත්‍යසමුත්පාදයාගේ නොවෙනස්වන බව දක්වයි. **උප්පාදා** යනු උත්පත්තිය ස්වභාවකොට ඇති ඵල උත්පත්තිය මුල්කොට ප්‍රකාශ කරන්නේ ප්‍රතීත්‍යසමුත්පාදයාගේ අනිත්‍ය බව දක්වයි. සති හා අසති. උප්පාදා න නිරොධාති යි හේත්වර්ථයෙහි සප්තමී වචනයෙන් දක්වන ලද ප්‍රතීත්‍යසමුත්පාදයාගේ සමුදය ජාති ස්වභාවය දක්වයි.

එහි **යදිදං** යනු නිපාතයෙකි. එය යම් මේ යන අර්ථ ඇත්තේ **අවිජ්ජා පච්චයා** යනු නො විඳිය යුතු කාය දුශ්චරිතාදිය විඳිනුයි **අවිජ්ජා** නම්. විඳිය යුතු කාය සුචරිතාදිය නො විඳිනුයි **අවිජ්ජා** නම්. ධර්මයන්ගේ නොවෙනස්වන ස්වභාවය නොවටහා ගන්නේ **අවිජ්ජා** නම්. කෙළවරක් නැති සසරෙහි භව ආදියෙහි සත්ත්වයන් දුවවානුයි **අවිජ්ජා** නම්. අවිද්‍යමාන වස්තූන් විෂයෙහි දුවයි. විද්‍යමාන වස්තූන් විෂයෙහි නොදුවයි යි

අවිජ්ජා නම්. විද්‍යාවට විරුද්ධ වූ හෙයින් **අවිජ්ජා** නම්. එය 'දුකෙඛ අඤ්ඤාණං' ආදී වශයෙන් චතුර්විධ කොට දතයුතුයි. හේතුවක් ඇතිව ඵලයක් වෙයි. උපදියි. පවතියි යන අර්ථයෙන් **පච්චයො** නම් වේ. උපකාර අර්ථයෙන් හෝ පච්චය වේ. අවිද්‍යාවත් ඒ මය. ප්‍රත්‍යයත් ඒමනුයි. අවිජ්ජා පච්චය නම් වේ. පිළියෙල කරත්නුයි සංඛාර නම් වේ. එනම් ලෞකික කුශල අකුශල චේතනාවෝ ය. එය පුඤ්ඤාභිසංඛාර අපුඤ්ඤාභිසංස්කාර ආනෙඤ්ජාභිසංඛාර වශයෙන් ත්‍රිවිධ වේ. මැනවින් දනීනුයි විඤ්ඤාණ නම් වේ. එය ලෞකික විපාක විඤ්ඤාණ වශයෙන් දෙතිස්වැදෑරුම් වේ. නැමෙනුයි, අවනත වේනුයි නාම නම් වේ. ඒ වේදනා ආදී ස්කන්ධ තුනයි. විකාරයට, විනාසයට පත් වේනුයි රූප නම් වේ. භූත රූපය සහ චක්ඛු ආදී උපාදාන රූපයෝය. දීර්ඝභාවයට පමුණුවයි. දික්වූ සසර දුකට පමුණුවානුයි **ආයතන** නම්. ස්පර්ශ කෙරේනුයි ඵස්ස නම්. විඳිනුයි **වේදනා** නම්. **ඵස්ස** වේදනා දෙක ද්වාර වශයෙන් සවැදෑරුම් වේ. විපාක වශයෙන් ගැනීමේදී තිස්හයක් වේ. ආසාවෙන් පීඩාවට පත්වේනුයි **තණ්හා** නම් වේ. එය කාම තණ්හා ආදී වශයෙන් **සංක්ෂේපයෙන්** ත්‍රිවිධයි. විස්තර වශයෙන් එක්සිය අටකි. අල්ලා ගනිනුයි **උපාදාන** නම්. එය කාම උපාදාන ආදී වශයෙන් චතුර්විධය. උපදියි, උපදවයි යන අර්ථයෙන් භව නම් වේ. එය කම්ම උපපත්ති භේදයෙන් ද්විධය. ඉපදීම **ජාතියයි**. දිරීම ජරාවයි.

මැරෙන්නුයි මරණ නම් වේ. සෝක කිරීම **සෝකයයි**. විලාප කීම **පරිදේව** යයි. ශරීරය පෙළානුයි දුක්ඛ නම් වේ. උත්පාදත ස්ථිති වශයෙන් දෙපරිද්දෙකින් කනීනුයි **දුක්ඛ** නම්. දුෂ්‍ය වූ සිත් ඇති බව දොමනස්ස නම්. දැඩි චිත්ත පීඩාව **උපායාස** නම්. සම්භවනති යන මේ පදය හුදෙක් ශෝකාදීන් කෙරෙහි පමණක් නොව සියලු සංස්කාරාදී පදයන් කෙරෙහි ද යෙදිය යුතුයි. මෙසේ 'අවිජ්ජා පච්චයා සංඛාරා සම්භවනති' අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ හටගනිත් යි ප්‍රත්‍යසමුත්පන්න ව්‍යවස්ථාව දක්වන ලද්දේය. සියලු තන්හි ම මෙම ක්‍රමයමයි.

එහි නො දැනීම ලක්ෂණකොට ඇත්තේ අවිද්‍යාවයි. සම්ප්‍රයුක්ත ධර්ම හෝ සම්ප්‍රයුක්ත පුද්ගලයා මුලා කිරීම එහි කෘත්‍යය යි. ආලම්බන ස්වභාවය මුලා කිරීම එහි වැටහෙන ආකාරයයි. ආස්‍රව ආසන්න කාරණයයි. **සකස් කිරීම** ලක්ෂණකොට ඇත්තෝ සංස්කාරයෝ ය. **රැස් කිරීම** එහි කෘත්‍යයයි. චේතනාව වැටහෙන ආකාරයයි. අවිද්‍යාව ආසන්න කාරණයයි.

අරමුණු දැනීම විඤ්ඤාණයේ ලක්ෂණයයි. නාමරූපයන්ට පුරෝගාමී වීම එහි කෘත්‍යයයි. පූර්වභවය හා ගැලපීම වැටහෙන ආකාරයයි. සංඛාර ආසන්න කාරණයයි. වස්තු ආලම්බන හෝ ආසන්න කාරණයයි.

අරමුණට නැමෙන ලක්ෂණ ඇත්තේ නාමයයි. සිත හා සමග ද ඔවුනොවුන් හා සමගද සම්ප්‍රයෝග කෘත්‍ය ඇත්තේය. වෙන්ව නො පැවතීම වැටහෙන ආකාරයයි. විඤ්ඤාණය ආසන්න කාරණයයි.

අරමුණට නැමෙන ලක්ෂණ ඇත්තේ නාමයයි. සිත හා සමගද ඔවුනොවුන් හා සමගද සම්ප්‍රයෝග කෘත්‍ය ඇත්තේය. වෙන්ව නො පැවතීම වැටහෙන ආකාරයයි. විඤ්ඤාණය ආසන්න කාරණයයි.

කිපීම ලක්ෂණකොට ඇත්තේ රූපයයි. විසිරීම කෘත්‍යකොට ඇත්තේය. අව්‍යාකෘත භාවය වැටහෙන ආකාරයයි. විඤ්ඤාණ ආසන්න කාරණයයි.

ගැලපීම හෝ පැතිරීම ලක්ෂණකොට ඇත්තේ සළායතනයයි. දර්ශනාදීන්ට කරුණු වීම එහි කෘත්‍යයකි. යථායෝගයෙන් පංචවිඤ්ඤාණ ධාතූන්ට වස්තුද්වාර භාවයෙන් වැටහෙන්නේය. නාමරූප ආසන්න කාරණයයි.

අරමුණු ස්පර්ශ කිරීම ඵස්සයෝ ලක්ෂණයයි. අරමුණ සමග ගැටීම කෘත්‍යයයි. වස්තු ආලම්බන විඤ්ඤාණයන්ගේ එක්වීම වැටහෙන කාරණයයි. ෂඩායතන ආසන්න කාරණයයි.

ආරම්මන රස විඳීම ලක්ෂණ ඇත්තේ වේදනාවයි. රූපාදි විෂය රස අනුභවය කෘත්‍යයයි. සුවදුක් වැටහෙන ආකාරයයි. ස්පර්ශය ආසන්න කාරණයයි.

භව දුක්ඛ හේතුව ලක්ෂණකොට ඇත්තී තෘෂ්ණාවය. ඒ ඒ ආලම්බන, භූමි, භව ආදීන්හි ඇලීම කෘත්‍යය, තෘප්තියකට නොපැමිණීම වැටහෙන ආකාරයයි. වේදනාව ආසන්න කාරණයයි.

අරමුණ දැඩිව ගන්නා ලක්ෂණය ඇත්තේ උපාදානයය. **තෘෂ්ණ දෘෂ** අභිනිවෙශ වශයෙන් නො හැරීම එහි කෘත්‍යයයි. තෘෂ්ණාව ආසන්න කාරණයයි.

කර්ම කර්මඵල ලක්ෂණකොට ඇත්තේ භවයයි. හටගැනීම හා හටගැන්වීම එහි කෘත්‍යයයි. කුශල අකුශල අව්‍යාකෘත වැටහෙන ආකාරයයි. උපාදානය ආසන්න කාරණයයි. මෙසේ අවිද්‍යා ආදීන්ගේ ලක්ෂණ දතයුතුයි. මෙහි මේ සංක්ෂේප විස්තරයකි. සියලු ආකාරයෙන් විස්තරයක් දැනගැනීමට කැමැත්තහු විසින් සම්මෝහවිනෝදනි නම් වූ විභංගට්ඨ කථාවෙන් දැනගත යුතුයි.

එවං යනු දක්වන ලද කාරණය දැක්වීමකි. එබැවින් අවිද්‍යා ආදිය ඊශ්වර නිර්මාණ වශයෙන් නො දක්වයි. **එතස්ස** යනු කියන ලද පරිදි මිශ්‍ර නොවූ සියල්ලම පිළිබඳ දුකබකබ දුක් සමූහය ජීවත් වන්නවුන්ට සැපයක් නැති බවය. **සමුදයෝ හොති** උපදියි. හටගනියි. එතමතථං විදිත්වා අවිද්‍යාදි වශයෙන් සංස්කාර මුල්කොට ඇති දුක් සමූහයාගේ යම් මේ හටගැනීමක් වේයයි කියන ලද්දේ ද, සියලු ආකාරයෙන් ඒ අර්ථය (කාරණය) දැනගෙන. **තායං වෙලා යං ඉමං උදානං උදානෙසි.** එම අර්ථය අවබෝධ කළ වෙලාවෙහි **ඉමං උදානං උදානෙසි** එම අර්ථය අවබෝධ කළ කල්හි හේතුවේත්, හේතුසම්පන්න ධර්මයේත් වෙසෙසින් දැනගැනීමෙහි උසස් බව ප්‍රකාශ කිරීම පිණිස **යදා හවෙ පාතු - භවනති** යි ආදිකොට ඇති සොමනස්ස සම්ප්‍රයුක්ත ඤාණසමුට්ඨාන උදානය (භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ) ප්‍රකාශ කළහ. සිත් සතුට කරන ප්‍රකාශය නිකුත් කළේයයි කියන ලදී.

යම් කාලයක **භවෙ** යනු කීවේය. **ඛ්‍යතතං** ප්‍රකාශ කරන ලදී යන අර්ථ ඇති නිපාතයෙකි.

'**යොධෙථ මාරං පඤ්ඤායුධෙන**' යනු ක්ලේශමාරයා සමග යුද්ධකරන සමයයෙහි යන අර්ථයි. **පාතුභවනති** උපදිත්. ධම්මා යනු අනුලෝම ප්‍රත්‍යයාකාරයෙන් අවබෝධ කර ගතයුතු බෝධිපාක්ෂික ධර්මයෝය. **පාතුභවනති** ප්‍රකාශ කරත්. අවබෝධ කරගැනීම් වශයෙන් ප්‍රකාශ කළ දෙය ප්‍රකට වේ. **ධම්මා** යනු චතුර්විධ ආර්යසත්‍ය ධර්මයෝය. කෙලෙසුන් විනාශ කිරීම් අර්ථයෙන් වීර්යය ආතාප යි කියනු ලැබේ.

ආතාපිනො සම්‍යක්ප්‍රධාන වීර්ය ඇති අරමුණු හා එහි ස්වභාවය නැවත නැවත සිහිපත් කරමින් ධ්‍යාන වඩන **බ්‍රාහමණසස** කෙලෙසුන් වැඩූ රහතන් වහන්සේට **අතසසකංඛා වපයනති සඛා** ධර්මය අවබෝධ කරගත් ඔහුට 'කොනුඛො හනෙත ථුසති' ස්වාමීනි, කවරෙක් වනාහි ස්පර්ශ කෙරේද? භාග්‍යවතුන් වහන්සේ අපට සුදුසු මනෝඥ ප්‍රශ්නයක් ප්‍රකාශ කළහ. ආදී වශයෙන් ද 'කතමං ඛො භනෙත ජරාමරණං, කසස ච පනිදං ජරාමරණං' ස්වාමීනි, ජරාමරණ යනු කුමක්ද? ජරාමරණ කවරකු ළඟ ඇද? භාග්‍යවතුන් වහන්සේ අපට සුදුසු මනෝඥ ප්‍රශ්නයක් ප්‍රකාශ කලහ ආදී වශයෙන් ප්‍රත්‍යයාකාර ධර්මයන්හි සැකයක් කියන ලදී.

ප්‍රත්‍යාකාර ධර්මයන් අවබෝධ කර නොගත් බැවින් 'මම අතීතයෙහි වූයෙමිද'යි ආදි වශයෙන් සොළොස් වැදෑරුම් සැක ඇති වේ. ඒ සියලු සැක විනාස වේ. පහවේ. නැතිවේ. කුමක් හෙයින්ද? **යතො පජානාසි සහෙතු ධමමං** යම් ලෙසකින් අවිජ්ජා ආදී හේතු සමග සහේතුක වූ මෙම සංස්කාරාදිය සියලු දුකඛකඛන්ධ ධර්මය දැන ගත්තේය. අවබෝධ කරගත්තේය. බෝධිපාක්ෂික ධර්ම චතුර්විධ ආර්යසත්‍යය කවදා පහළවිද, ප්‍රකාශ කෙළේද ? **විපසසනාමගඟඥාණෙසු** එහි විදර්ශනා ඥානසම්ප්‍රයුක්ත වූවෝ සති ආදිය ද විදර්ශනා ඥානයද සුදුසු පරිදි තමන්ගේ අරමුණ වූ සුභසංඥා ආදිය දුරුකරත්.

කායානුපස්සනා ආදී වශයෙන් වෙන්ව උපදිත්. මාර්ගක්ෂණයෙහි වනාහි නිර්වාණය අරමුණුකොට සමුච්ඡේද වශයෙන් ප්‍රතිපක්ෂ ධර්මයන් දුරුකරමින් චතුර්විධ ආර්යසත්‍යයන් කෙරෙහි නො මුලාව සිහියෙන් යුක්තව අවබෝධ කරගැනීම් වශයෙන් එක්වරක් උපදිත්. මෙසේ පළමුකොටම බෝධිපාක්ෂික ධර්මයන්ගේ ඉපදීම් වශයෙන් පහලවීම දැනගත යුතුය.

'අයමපි උදානො වුත්තෙතා භගවතා ඉති මෙ සුතං' යන මේ පාලි පාඨය සමහර පොත්වල දක්නට ලැබේ. එහි **'අයං'** යන ශබ්දය **'ඉදමපි බුද්ධෙ රතනං පණීතං' අයමපි පාරාජිකො හොති'** යන ආදී තැන්වල එකතු කිරීම යන අර්ථය ප්‍රකාශ කරයි. එම පදයෙන් බෙහෙවින්ම එකතුකිරීම කරයි. 'වුත්තෙතා යන මෙම **වුත්ත** ශබ්දය හිසකෙස් කැපීම වැපිරීම, ජීවන වෘත්තිය, මිදුණුබව, බුද්ධ වචනය, ආරාධනාව, කථාකිරීම ආදී අර්ථයන්හි යෙදේ. එහි වනාහි **'පොසකා පටිකොමානවො දහරො වුත්තසිරෝ'** යන ආදී තන්හි හිසකෙස් කැපීමෙහි ආයේය.

'ගාවො තසස පජායනති - බෙතෙත වුත්තං විරූලහති
පුත්තානං ඵලමසනාති - යො චිත්තානං නදුහති'

යන ආදී තන්හි වැපිරීමෙහිද, 'පනනලොමො පදරවුතෙතා මිගභූතෙන චෙතසා විහරති' යන ආදී තන්හි ජීවිත වෘත්තියෙහි ද, 'පණ්ඩුපලාසො බන්ධනා පවුතෙතා අභබ්බො හරිතත්තා ය' යන ආදී තන්හි බන්ධනයෙන් මිදුණු බවෙහි ද, 'ගීතං පවුත්තං සම්හිතං' යන ආදී තන්හි බුද්ධ වචනයෙහි ද 'නපපවතතිකෙ වුතෙතා පාරායණො' ආදී තන්හි ආරාධනාවෙහි ද, 'වුත්තං ඛො පනෙතං භවතා ධම්මදායාදා මෙ භික්ඛවෙ භවථ ඛො ආමිසදායාදා යන ආදී තන්හි කථනයෙහි ද දැක්වේ.

එබැවින් මේ උදානය ද ප්‍රකාශ කරන ලද්දේය යන අර්ථ ඇත්තේය.

ඉතිපි එවමෙම සුතං යන පද දෙකෙහි අර්ථය නිදාන වර්ණනාවෙහි සියලු ආකාරයෙන් කියන ලද්දේමය.

පූර්වයෙහි එවමෙමසුතං යි නිදාන වශයෙන් කියන ලද්දේය. මෙහි නිගමන වශයෙන් කියන ලදී. කියන ලද වචනයෙහි අර්ථය නැවත කිම නිගමන නම් වේ. මෙසේ සූත්‍රයේ අර්ථ හැදෑරීමෙහි දී එවං ශබ්දයාගේ අර්ථය සමාන බැවින් එවමෙමසුතං යි මෙහි අර්ථ යෝජනාව විය. මෙසේ කියන ලද වර්ණනාවෙහි අප විසින් ප්‍රකාශ කරන ලද කරුණු කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය.

පඨම බෝධිසුත්ත වර්ණනාව නිමියේ ය.

දෙවැන්නෙහි, පටිලොමං යනු 'අවිජ්ජා නිරොධා සංඛාරනිරොධො'යි ආදි වශයෙන් කියන ලද අවිජ්ජා ආදී ප්‍රත්‍යයාකාර ධර්මයන් අනුප්පාද නිරෝධයෙන් විනාශ කරන්නේ තමන් විසින් කළයුතු කාර්යය නොකිරීම් වශයෙන් **පටිලොමො** යි කියනු ලැබේ. පටිලොමං යනු 'විසමං චන්දිමසූරියා පරිවත්තන්ති' යන ආදී තන්හි මෙන් භාවනප්‍රංසක නිර්දේශයෙකි.

ඉමසම්ං අසති ඉදං න හොති යන මෙහි අවිජ්ජා ආදී ප්‍රත්‍යයන් මාර්ගඥානයෙන් ප්‍රහීණව නැති වූ කල්හි මේ සංඛාර ආදී ඵලය නො උපදී. නො පවතී.

ඉමසස නිරොධා ඉදං නිරුජ්ඣති මේ අවිජ්ජා ආදී ප්‍රත්‍යයන් මාර්ගඥානයෙන් නිරෝධය කළ බැවින්, නො උපදින ස්වභාවයට පත්කළ බැවින් මේ සංඛාර ආදී ඵල නිරුද්ධ වේ. නොපවතී යන අර්ථ ඇත්තේය. මෙහි ද 'ඉමසම්ං සති ඉදං හොති ඉමසසුපපාදා ඉදං උපජ්ජති' යන මෙහි මෙය ඇතිකල්හිම උපද මොහුගේ උපදිමෙන් නිරුද්ධ නොවේ යි ඇතුලත නියමයෙන් දක්වන ලද්දේය. 'ඉමසම්ං අසති යෙවන නසති ඉමසස නිරොධා එව න උපපාදා' යනු ඇතුලත නියමයෙන් ලක්‍ෂණයෝ දක්වන ලදහයි දතයුතුය. එය ප්‍රථමබෝධි සූත්‍ර වර්ණනාවෙහි කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ යම් පරිදි පටිච්චසමුප්පාදය සිහිකළ සේක්ද, එය සංක්‍ෂේපයෙන් දක්වා පසුව විස්තර වශයෙන් දක්වන්නට 'අවිජ්ජා නිරොධා සංඛාර නිරොධො' යනාදිය කියන ලදී. එහි අවිජ්ජානිරොධා යනු ආර්ය මාර්ගඥානයෙන් අවිද්‍යාව ඉතිරි නො කොට සම්පූර්ණයෙන් සිදුකළ නිරෝධයයි. අනුශයප්‍රහාණ වශයෙන් ආර්යමාර්ග ඥානයෙන් අවිද්‍යාව සම්පූර්ණයෙන් විනාශකරන ලදය යන අර්ථයි. ඉදින් වනාහි ප්‍රථම ආර්යමාර්ග ඥානයෙන් ප්‍රහීණවන අවිද්‍යාව අතිශයින්ම ඇතුළත ගැටීම් වශයෙන් ප්‍රහීණ වේ.

එහෙත් සම්පූර්ණයෙන්ම ප්‍රහීණ නොවේ. අපායගාමී වූ අවිද්‍යාව ප්‍රථම මාර්ග ඥානයෙන්ම ප්‍රහීණ වේ. මෙලොව අනාර්යභූමියෙහි එක් වරක් ඉපදීමට හේතු වූ අවිද්‍යාව පිළිවෙළින් ද්විතීය, තෘතීය, ආර්යමාර්ගයන් ගෙන් ප්‍රහීණ වේ. ඉතිරි අවිද්‍යාව ප්‍රහීණ නොවේ. අර්හත්මාර්ග ඥානයෙන්ම ඉතිරි වූ අවිද්‍යාව ප්‍රහීණ වේ. **සංඛාර නිරොධො** යනු සංස්කාරයන් නැවත නූපදිනා ආකාරයට නිරුද්ධ වීමයි. මෙසේ නිරුද්ධ වූ සංස්කාරයන් ගේ නිරෝධයෙන් විඤ්ඤාණයද විඤ්ඤාණාදීන්ගේ නිරෝධයෙන් නාමරූප ආදියද නිරුද්ධ වේ යයි දක්වන්නට **සංඛාර නිරොධා විඤඤාණ නිරොධො** යන ආදිය දක්වා 'එවමෙතසස කෙවලසස දුකඛක්ඛන්ධසස නිරොධො හොති'යි කියන ලදී. එහි යමක් කිය යුතු නම් ඒ සියල්ල පෙර කියන ලද ක්‍රමයෙන් දතයුතුයි.

තවද මෙහි කිසියම් ලෙසකින් 'අවිජ්ජා නිරොධා සංඛාර නිරොධෙති සංඛාර නිරොධා විඤ්ඤාණනරොධොති' යන මෙපමණකින් සියලු දුක් සමූහයාගේ ඉතිරි නොකොට නිරෝධය කියන ලද්දේය. එසේම යම්සේ අනුලොම් වශයෙන් යම් යම් ප්‍රත්‍යය ධර්මයක් ඇතිකල්හි යම් යම් ප්‍රත්‍යුත්පන්න ධර්ම උපදී. පවතී යන මේ අර්ථය දැක්වීම 'අවිජ්ජා පචචයා සංඛාරා -පෙ- සමුදයො හොතී ති'යි කියන ලදී. මෙසේ ප්‍රතිපක්ෂ වශයෙන් ඒ ඒ පච්චය ධර්මයන්ගේ අභාවයෙහි දී ඒ ඒ පච්චුප්පන්න ධර්මය නිරුද්ධ වේ. නො පවතී යන දර්ශනාර්ථය මෙහි 'අවිජ්ජා නිරොධා සංඛාරනිරොධො සංඛාරනිරොධො විඤ්ඤාණ නිරොධො විඤ්ඤාණ නිරොධො නාමරූප නිරොධො -පෙ- දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති යි කියන ලදී.

අනුලොමයෙහි කාලත්‍රයට අයත් දුක් සමූහයෙහි නිරෝධය දැක්වීමට ද, අනාගතයෙහි ආර්යමාර්ග භාවනාව නැති කල්හි උපදින්නා වූ දුක් සමූහයේ නිරෝධය ආර්යමාර්ග භාවනාවෙන් කැමති වූයේය යන විශේෂය දතයුතුය.

එතමත්ථං විදිත්වා යනු අවිජ්ජා නිරොධ ආදී වශයෙන් යම් මේ සංඛාර ආදී වූ දුක් සමූහයේ නිරෝධය වේය යි කියන ලද්දේ ද සියලු ආකාරයෙන් ඒ කාරණය දැන **ඉමං උදානං උදානෙසි** මේ කාරණය දැනගත් කල්හි 'අවිජ්ජා නිරොධා සංඛාර නිරොධො යි' මෙසේ ප්‍රකාශ කරන ලද අවිජ්ජා ආදී ප්‍රත්‍යයන්ගේ විනාශය අවබෝධ කරගැනීමේ උතුම් බව ප්‍රකාශ කරන උදානය ප්‍රකාශ කළේය යන අර්ථ ඇත්තේය.

එහි සංක්ෂේප අර්ථය මෙසේය. යම්ලෙසකින් අවිජ්ජා ආදී ප්‍රත්‍ය ධර්මයන්ගේ අනුප්පාද නිරෝධ සංඛ්‍යාත වූ ක්ෂයභාවය දැනගත්තේය. අවබෝධ කෙළේය. එබැවින් කියන ලද පරිදි කෙලෙස් තවන වීර්යය ඇති, ධ්‍යාන වඩන බ්‍රාහ්මණයාට හෙවත් රහතන්වහන්සේට කියන ලද ප්‍රකාර ඇති බෝධිපාක්ෂික ධර්ම හා චතුරාර්ය සත්‍ය ධර්මයෝ පහළ වෙති. උපදිති. ප්‍රකාශයට පත්වෙති. නැතහොත් පච්චයනිරෝධ ධර්මයන් මැනවින් අවබෝධ කර නොගත් බැවින් පෙර කියන ලද සැක උපදින්නේ නම් ඒ සියලු සැක විනාශ වේ. නිරුද්ධ වේ. සෙසු කරුණු පෙර කියන ලද ක්‍රමයෙන් ම දැනගත යුතුයි.

දෙවෙනි බෝධිසූත්ත වර්ණනාව නිමියේ ය.

තුන්වැන්නෙහි **අනුලොමපටිලොමං** යනු අනුලෝමයද, පටිලෝමයද යම් සේ කියන ලද පරිදි අනුලෝම වශයෙන් හා පටිලෝම වශයෙන් ද යන අර්ථයි. පෙර ද අනුලෝම පටිලෝම වශයෙන් පටිච්ච සමුප්පාදය සිහිපත් කළ ප්‍රවෘත්තිය සූත්‍ර දෙකෙහි කියන ලද්දේ නොවේද, මෙහි කුමක් හෙයින් නැවතත් දෙ අයුරකින් එම සිහිපත් කිරීමේ ප්‍රවෘත්තිය කියා ද? එය දෙ අයුරකින් තුන්වෙනි වරටත් සිහිපත් කිරීමේ පුවත කිය යුතු නිසාය.

දෙයාකාරයකින් කෙසේ නම් සිහිපත් කිරීම පැවැත්වීද, අනුලෝම පටිලෝම වශයෙන් පෙර පසු නොවී එක්විටම පටිච්චසමුප්පාදය සිහිපත් කිරීමට නොහැකිය. එය එක්වර සිහිපත්කිරීම සිදුකෙළේය යි පිළිගත යුතු නැත. වාරයෙන් වාරයට සිහිපත් කෙළේය. භාග්‍යවතුන් වහන්සේ පළමුවෙන් අනුලෝම වශයෙන් පටිච්චසමුප්පාදය සිහිපත්කොට එයට අනුරූප වූ ප්‍රථම උදානය ප්‍රකාශ කළ සේක. දෙවෙනිවර පටිලෝම වශයෙන් සිහිපත්කොට එයට අනුරූප වූ උදානය ප්‍රකාශ කළ සේක. තුන්වෙනි වර එක් වරක් අනුලෝම වශයෙන් ද, අනෙක් වර පටිලෝම වශයෙන් ද සිහිපත් කිරීම් වශයෙන් අනුලෝම පටිලෝම සිහිපත් කළ සේක. අනුලොම පටිලොමං යි එබැවින් කියන ලදී.

මෙසේ අනුලෝම පටිලෝම වශයෙන් සිහිපත් කිරීමේ ප්‍රගුණ බව හා බලවත් බව ප්‍රකාශ කරන ලද්දේය.

තසෝ අවිජ්ජායත්වෙව අවිද්‍යාවෙන් ම අසෙස විරාගනිරොධා යනු විරාග සංඛ්‍යාත මාර්ගයෙන් සම්පූර්ණයෙන්ම වූ නිරෝධය අග්‍ර වූ මාර්ගයෙන් ඉතිරි නොකොට නැවත නූපදනා ලෙස කරන ලද ප්‍රහාණය යන අර්ථ ඇත්තේය. **සංඛාර නිරොධොති** යනු සියලු සංස්කාරයන්ගේ ඉතිරි නොකොට නැවත නූපදිනා ලෙස කළ නිරෝධයයි. යට සිට මාර්ගත්‍රයෙන් යම්කිසි සංස්කාර ධර්ම නිරුද්ධ වේද, යම්කිසි සංස්කාර ධර්ම නිරුද්ධ නොවේද, ඒ සියල්ල අර්හත්මාර්ග ඥානයෙන් අවිද්‍යා නිරෝධය ලැබීමෙන් සියලු සංස්කාර ධර්ම නිරුද්ධ වන්නේය. **එතමත්ථං විදිත්වා** යනු යම් මේ අවිජ්ජා ආදී වශයෙන් සංස්කාර ආදිය පිළිබඳ දුක් සමූහයේ සමුදය ද, නිරෝධයද, අවිජ්ජා ආදීන්ගේ සමුදය ද නිරෝධය ද වේයයි කියන ලද මේ කාරණය සියලු ආකාරයෙන් දැන **ඉමං උදානං උදානෙසි** යම් ආර්ය මාර්ගයකින් දුක් සමූහයාගේ සමුදය නිරෝධ

සංඛ්‍යාත වූ අර්ථය කෘත්‍ය වශයෙන් ද, ආරම්මණක්‍රියා වශයෙන් ද අවබෝධ කෙළේ, එම ආර්ය මාර්ගයාගේ ආනුභාවය ප්‍රකාශ කරන උදානය ප්‍රකාශ කෙළේය. මේ එහි සංක්ෂේප අර්ථයයි.

'කෙලෙස් තවන වීර්යය ඇති, ධ්‍යාන වඩන, දුරුකළ කෙලෙස් ඇති බ්‍රාහ්මනි නම් වූ රහතන් වහන්සේට යම්කලෙක බෝධිපාක්ෂික ධර්මයන් හේතුකොට ගෙන යම් ආර්ය මාර්ගයකින් චතුරාර්ය ධර්මයෝ පහළ වෙත්ද, එම ආර්යමාර්ගයෙන් **විධූපයං තිට්ඨති** මාරසෙනං යනු 'කාමා තෙ පඨමා සෙනා' ආදී ක්‍රමයට කියන ලද මාරසේනාව විනාශ කරමින් සිටී. කෙසේද යත්,

සුරියොව ඔභාසයමනතලික්ඛං යම්සේ සූර්යයා උඩට නැග තමන්ගේ ආලෝකයෙන් අහස බබලවමින් අන්ධකාරය විනාශ කරමින් සිටින්නේ යම්සේද, එසේම ඒ බිණාශ්‍රව වූ රහතන්වහන්සේ එම බෝධිපාක්ෂික ධර්මයන් හා සිවු මගින් චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කරමින් ක්ලේශ මාරසේනාව විනාශ කරමින් සිටිතියි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් පළමුවර පච්චයාකාර ධර්මයන් (පටිච්ච සමුප්පාදය) දැනීමෙන් ද, දෙවෙනිවර ප්‍රත්‍යක්ෂ කර ගැනීමෙන්ද, තුන්වෙනි වර අර්හත් මාර්ගඥානය අවබෝධ කරගැනීමේ ආනුභාවයෙන් මෙම උදාන තුන තුන් යාමයෙහි ප්‍රකාශ කරන ලද්දේය. කවර රාත්‍රියකද? සම්මා සම්බුදුබව ලැබීමෙන් පසු සත්වෙනි රාත්‍රියෙහිය.

භාග්‍යවතුන් වහන්සේ වෙසක් පුණු පොහෝදින රාත්‍රියෙහි ප්‍රථම යාමයෙහි පූර්වේනිවාසඥානය සිහිකොට මධ්‍යම යාමයෙහි දිබ්බචක්ඛු ඥානය පිරිසිදු කරගෙන, පශ්චිම යාමයෙහි ප්‍රතීත්‍යසමුත්පාද ධර්මයෙහි ඥානය යොදවා නානා නය සහිත තෙභූමික සංස්කාර ධර්මයන් විමසා බලා දැන් අරුණ නගින්නේ යයි සම්මා සම්බෝධියට පැමිණියේය. සර්වඥතා ඥානය අවබෝධ කරද්දීම අරුණ නැංගේය. ඉක්බිති එම පර්යංකයෙන්ම බෝධිවෘක්ෂ මූලයෙහි සත්දිනක් ගතකොට සත්වැනි රාත්‍රියෙහි ත්‍රිවිධ යාමයන්හි කියූ ක්‍රමයට පටිච්චසමුප්පාදය සිහිපත්කොට ඉක්බිති මේ උදාන ප්‍රකාශ කළ සේක.

බන්ධකයෙහි වනාහි තුන් වාරයකදී පටිච්චසමුප්පාදය අනුලෝම පටිලෝම වශයෙන් සිහිපත් කෙළේයයි සඳහන් වන බැවින්

බන්ධකට්ඨකථායං තුන් යාමයෙහි මෙසේ සිහිපත් කොට ප්‍රත්‍යාකාර ප්‍රත්‍යවේක්ෂණ වශයෙන් ප්‍රථම වශයෙන් උදානයද, නිර්වාණය ප්‍රත්‍යවේක්ෂණ දෙවන උදානයද, මාර්ග ප්‍රත්‍යවේක්ෂණ වශයෙන් තුන්වන උදානයදැයි මෙසේ මේ උදාන ප්‍රකාශ කෙළේ යයි කියන ලදී. එයද විරුද්ධ නොවේ.

භාග්‍යවතුන් වහන්සේ වනාහි රත්නඝරයෙහි විසූ සතිය හැර අනෙක් සති හයෙහි අතරින් අතර ධර්මය ප්‍රත්‍යවේක්ෂා කොට බෙහෙවින් ම විමුක්ති සුවය විඳිමින් වැඩ විසූහ. රත්නඝරයෙහි විසූ සතියෙහි වනාහි අභිධර්මය නැවත නැවත සිහිපත් කරමින් විසූහ.

තුන්වන බෝධිඝර සූත්‍ර වර්ණනාව යි.

සිවුවැනි සූත්‍ර වර්ණනාව

සිවුවැනි උදානයෙහි අජපාල නිග්‍රොධෙ යනු, එළුවන් රකින්නෝ එහි ගොස් නුගරුක් සෙවනෙහි හිඳිති. එහෙයින් අජපාල නිග්‍රොධයි නාමය ඇතිවිය. ඇතැමෙක් වේදය සඤ්ඣායනා කරන්නට අසමර්ථ වූ මහලු බමුණෝ එහි ප්‍රාකාර පරික්ෂේප වලින් යුක්ත වූ නිවෙස් සාදාගෙන සියල්ලෝම එහි විසූ බැවින් 'අජපාල නිග්‍රොධ' යන නාමය වීය යි කියති. එහි මේ වචනාර්ථයි. **න ජපනතී ති** (ජප නොකරත් නුයි) අජපා නම් වේ. මන්ත්‍ර සජ්ඣායනා නොකරන්නෝය යි අර්ථයි. 'අජපා' අය ඇලෙන රුචි කරන නිවාස මෙහි ඇති නිසා අජපාල යි සමහරු කියති. යම්ලෙසකින් මධ්‍යාන්හ සමයෙහි ඒ රුක වෙත පැමිණි එළුවන් තමන්ගේ සෙවනැල්ලෙන් පාලනය කරයිද, රකියි ද, එබැවින් අජපාල නම් නාමය ආරෝපණය විය යි වෙනත් කෙනෙක් කියති.

සියලු තන්හි මේ නම මෙසේ ව්‍යවහාර වේ. ඒ වෘක්ෂය සමීපයෙහි අජපාල නිග්‍රොධෙ යනු සමීපාර්ථයෙහි සප්තමී වචනයකි. **විමුත්ත සුඛපටිසංවෙදී** එම වෘක්ෂ මූලයෙහිම ධර්මය සිහිකරමින් විමුක්තිසුවය විඳිමින් වැඩහුන්හ. බෝධිවෘක්ෂයට නැගෙනහිර දිසාවෙහි මේ වෘක්ෂය පිහිටියේය. මෙය පර්යංක සතියට අතර සතියක් නොවේ. භාග්‍යවතුන්

වහන්සේ පර්යංක සතියට පසු තවත් සති තුනක් බෝධි වෘක්ෂය සමීපයෙහිම වාසය කළහ. එහි අනුපිළිවෙල කතාව මෙසේය.

භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බෝධියට පැමිණ එකම පර්යංකයෙන්ම වැඩහුන් කල්හි 'කිමෙක්ද, භාග්‍යවතුන් වහන්සේ නො නැගිටිති, බුද්ධත්වය ලැබීමට අවශ්‍ය තවත් කරුණු ඇත්තේදැ'යි සමහර දෙවිවරුන්ට සැකයක් ඇතිවිය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අටවෙනි දවසෙහි සමාපත්තියෙන් නැගිට දෙවියන්ගේ සැකය දැන ඒ සැකය නැතිකිරීම පිණිස අහසට පැන නැගී යමක ප්‍රාතිහාර්යය දක්වා ඔවුන්ගේ සැකය නැතිකොට නැගෙනහිරට හා උතුරු දෙසට අතර වූ ඊසාන පෙදෙසෙහි සිට සතර අසංඛ්‍යෙය්‍ය ලක්ෂයක් කල්පයන්හි රැස්කරන ලද පාරමිතා ධර්මයන්ගේ **පූරණාධිගමනී** බවත්, ඵලසමාපත්වලට පැමිණීමත්, පර්යංකයත්, බෝධිවෘක්ෂයත් ඇසිපිය හෙළීම් නැති ඇස්වලින් බලමින් සත්දිනක් ගතකළහ. ඒ ස්ථානය අනිමිස චෛත්‍ය නම් විය. ඉක්බිති පර්යංකය පිහිටි තැනට සමීපව පෙරදිගට හා බටහිරට අතර රත්න සක්මනෙහි සක්මන් කරමින් සතියක් ගත කළහ. ඒ ස්ථානය **රතනචංකම** නම් විය. ඉක්බිති බටහිර පෙදෙසෙහි දෙවිවරු රත්නගෘහය මැවූහ. එහි පර්යංකයෙන් වැඩහිඳ අභිධර්ම පිටකය විශේෂයෙන් අනන්තනය ඇති සියලු පටිඨාන ධර්මය විමසමින් සතියක් ගත කළහ. ඒ ස්ථානය **රත්නඝර චෛත්‍යය** යි නම් විය. මෙසේ බෝධිවෘක්ෂය සමීපයෙහිම සති සතරක් ගතකොට පස්වන සතියෙහි බෝධිවෘක්ෂ සමීපයෙන් අජපාල නිග්‍රොධ වෘක්ෂය වෙත පැමිණ එම වෘක්ෂය මූලයෙහි පර්යංකයෙන් වැඩ සිටියහ.

තමහා සමාධිමහා වුට්ඨාසි යනු යම්කිසි කාල පරිච්ඡේදයක් එහි වැඩසිට නැගී සිටියහ.

භාග්‍යවතුන් වහන්සේ එහි නැගී සිටි කල්හි බ්‍රාහ්මණයෙක් පැමිණ **ප්‍රශ්නයක් විචාළේය.** එහෙයින් **අථකො අඤ්ඤතරො** ආදිය කියන ලදී. **එහි අඤ්ඤතරො** යනු නාමගෝත්‍ර වශයෙන් නො හඳුනන අප්‍රකට එකෙකි. **නුහුංකජාතිකො** යනු හෙතෙම වනාහි දුටුදෙයින් ශුභාශුභ ඇතැයි සිතන දැඩි මානයක් ඇත්තෙකි. මාන වශයෙන් හා ක්‍රෝධ වශයෙන් සියල්ල විමසනු ස්වභාව ඇතිව බලමින් පිළිකුල් කරමින් නුහු නුහු කියමින් හැසිරෙන්නෙකි. එබැවින් 'නුහුංකජාතිකො' කියනු ලැබේ.

භුභුංකජාතිකො යි පාඨයක් ද ඇත. බ්‍රාහ්මණො යනු උපතින් බමුණෙකි. යෙන භගවා යනු යම් දිසාවක භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි සේක්. සප්තමී අර්ථයෙහි කරණ වචනයෙකි. යම් දිසාවකින් භාග්‍යවතුන් වහන්සේ වැඩමවිය යුතුනම් එම දිසාවෙන් වැඩමවූහ. හෙවත් 'යෙන' යනු හේත්වර්ථයෙහි කරණ වචනයෙකි. යම් කාරණයක් නිසා භාග්‍යවතුන් වහන්සේ වෙත දෙවිමිනිසුන් පැමිණිය යුතුනම් එම කාරණය නිසා පැමිණියේය යන අර්ථයි. කවර කරුණක් නිසාද? නන්වැදෑරුම් වූ රෝදුක් පීඩාවන්ගෙන් පෙළෙන රෝගී වූ මහජනයා මහත් ආනුභාව ඇති වෛද්‍යවරයෙකු වෙත රෝගයන්ට ප්‍රතිකාර ලබාගැනීම සඳහා පැමිණෙන්නාක් මෙන්, නන්වැදෑරුම් කෙලෙස් ලෙඩවලින් පෙළෙන රෝගී වූ දෙවි මිනිස්සු කෙලෙස් ලෙඩවලට ප්‍රතිකාර ලබා ගැනීම සඳහාත්, ධර්මශ්‍රවණය, ප්‍රශ්න ඇසීම ආදී කරුණු සඳහාත් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණිය යුතුය. මේ බ්‍රාහ්මණයා ද තමන්ගේ සැක දුරුකරගැනීම සඳහා පැමිණියේය. **උපසංකමිංසු** යනු සමීපයට පැමිණියේය යන අර්ථයි. **සමෙමාදි** මනාව සතුටු විය. භාග්‍යවතුන් වහන්සේගේ වචනයෙන් සතුටු විය. භාග්‍යවතුන් වහන්සේ විසින් '**කච්චි භොතො ඛමනීයං, කච්චි යාපනීයං**' ආදී වශයෙන් පිළිසඳරින් සතුට ඇතිවිය. **සම්මොදනීයං** සතුටු වීමට සුදුසු වූ. **කථං කතා සල්ලාපය. සාරණීයං** සිහිකටයුතු සත්පුරුෂයන් විසින් පැවැත්විය යුතු. **වීතිසාරෙත්වා** අවසන් කොට. **එකමන්තං** භාව නපුංසක නිර්දේසයකි. එක් ස්ථානයෙකි. බෙහෙවින්ම සමීප වූ කල්හි නිසද්‍ය දෝෂ භය දුරුකොට එක් පෙදෙසක යන අර්ථයි. **එතදවොච** එය දැන් කීවේය. 'භො වාදිනාම සොහොති සචෙ හොති සකිඤ්චනො' යි එසේ කියන ලදී. **ගොතමානි** භාග්‍යවතුන් වහන්සේට ගෝත්‍රයෙන් ආමන්ත්‍රණය කරයි.

කෙසේ නම් මේ බ්‍රාහ්මණයා මේ අවස්ථාවෙහි භාග්‍යවතුන් වහන්සේගේ ගෝත්‍රය දැනගත්තේද? එය මේ අවස්ථාවෙහි පමණක් නොවි. සය මසක් ප්‍රධන් වීර්යය කරන සමයෙහි උපස්ථායක පස්වග මහනුන් සමග හැසිරෙන කල්හිත් ඊට පසු ඒ ව්‍රතය අත්හැර උරුවෙලාවෙහි සේනානි ගම හුදකලාව පිඬු පිණිස හැසිරෙන කල්හිත් මේ බමුණා විසින් භාග්‍යවතුන් වහන්සේ දැක ඇත. කතාබහ ද කර ඇත. එබැවින් එම බමුණා පෙර පස්වග මහණුන් විසින් භාග්‍යවතුන් වහන්සේගේ ගෝත්‍රය සිහි කරමින් 'ගොතම' යි ඇමතීම අසා ඇත. එතැන් පටන් ශ්‍රමණ ගෞතමයන්'යි භාග්‍යවතුන් වහන්සේ චන්ද්‍රයා මෙන්, සූර්යයා මෙන් ප්‍රකට වූහ. ප්‍රසිද්ධ වූහ.

බ්‍රාහ්මණකරණා යනු බ්‍රාහ්මණභාවය කරත්නුයි බ්‍රාහ්මණකාරණා නම් වේ. **කිත්තාවතා** යනු යම් ධර්ම සමූහයකින් බ්‍රාහ්මණයෙක් වේද, එම ධර්මයන්ගේ ප්‍රමාණය විමසයි.

කතමෙ ච පනාති එහි ස්වරූපය විමසයි.

එතමත්ථං විදිත්වා ඔහු විසින් ඇසූ ප්‍රශ්නයේ සියල්ල දැන. **තායං වේලායං ඉමං උදානං උදානෙසි** ඒ බමුණාට ධර්මය දේශනා නොකළහ. කුමක් නිසාද? ධර්මදේශනාවට සවන් නො දෙන බැවිනි. එසේ වුවත් මේ ගාථාව අසා ඒ බමුණාට සත්‍ය අවබෝධ නොවීය. මෙසේ මේ උපක ආජීවකයාට බුද්ධගුණ ප්‍රකාශිත ධම්මචක්ක සූත්‍රය දේශනා කිරීමට පෙර භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද කොටස ඇසූ තපස්සුභල්ලිකයන්ට දෙසරණ ලැබීම මෙන් වාසනා සම්පතම උපන්නේය. ශෛක්ෂභාවය (රහත්මග හැර ඉතිරි මාර්ගඵල) හෝ ධර්මය අවබෝධ වීමක් නොවීය. මේ වනාහි ධර්ම ස්වභාවයයි.

එහි **යො බ්‍රාහ්මණො** යනු යමෙක් බැහැර කරණ ලද පාපධර්ම ඇති බැවින් බ්‍රාහ්මණ වන්නේය. දකින ලද දෙය මංගල වශයෙන් නො සලකන හුනුංකාර ආදී පාපධර්මයන්ගෙන් යුක්ත වූයේ හුදෙක් උපතින්ම පමණක් බ්‍රහ්ම බව පිළිගනීද ඒ බ්‍රාහ්මණයා බැහැර කරන ලද පාපධර්ම ඇති බැවින් හුනුංකාරය ප්‍රහාණය කළ බැවින් **නිහුනුංකා** නම් වේ. රාගාදී කසට ප්‍රහීණ කළ බැවින් **නිකසාවො** නම් වේ. භාවනාවට නැමුනු සිත් ඇති බැවින් යතතෙතා නම් වේ. සතර මාර්ගඥාන නම් වෙදයන්ට ඇතුලත් වූ සංස්කාර ධර්මයන්ගේ අවසානය වූ නිර්මානය වේදයන්ගේ අන්තය වූ බැවින් **වෙදනතගු** නම් වේ. මාර්ග බ්‍රහ්ම චර්යාවෙහි විසූ බැවින් **වුසිතබ්‍රහමචරියො** ධමෙමන බ්‍රහමවාදං වදෙය්‍ය මම බ්‍රාහ්මණයෙකැයි යන ප්‍රකාශය කරන්නේය. සකල සත්ත්වලෝකයෙහි කිසියම් තැනෙක එකම අරමුණක වත් රාග දෝස මෝහ සිතිවිල්ලක් හෝ මනුෂ්‍යයන් පිළිබඳව හා දෘෂ්ටිය පිළිබඳ කිලෙස් අරමුණු නැති බැවින් **උසසදානසී** නම් වේ. ඉතිරි නොකොට සම්පූර්ණයෙන්ම ප්‍රහීණ කෙළේය යන අර්ථයි.

සතරවන සූත්‍ර වර්ණනාව යි.

පස්වෙනි සූත්‍ර වර්ණනාව

පස්වෙනි සූත්‍රයෙහි **සාවත්ථියං** යනු එනම් නගරයෙහි ඒ නගරය වනාහි සවත්ථ නම් ඍෂිවරයකුගේ වාසය කළ තැන මවන ලද බැවින් සාවත්ථී යි කියනු ලැබේ. යම් සේ 'කාකන්දි මාකන්දි' යි මෙසේ හුදෙක් පවසන්නේ අක්ෂර සමූහයක් පමණකි. අර්ථකථා ආචාර්යවරු මනුෂ්‍යයන්ට අවශ්‍ය උපභෝග පරිභෝග සියලු දෙය මෙය මෙහි ඇති නිසා 'සාවත්ථී'යි කියති. වෙළෙන්දන් කිමෙක්ද? මෙහි බඩු ඇත්තේ දැයි ඇසූ කල්හි සියලු දේ ඇත යන ප්‍රකාශය නිසා සාවත්ථී නම් විය.

සියලු කල්හි සියලු උපකරණ සැවැත්නුවර රැස්කොට ඇත. එබැවින් සියලු දෙය නිමිති කරගෙන 'සාවත්ථී' යි කියනු ලැබේ.

ඒ සැවැත්නුවර සමීපාර්ථයෙහි සත්තමී වචනයි. **ජෙතවනෙ** යනු තමන්ගේ තමන්ගේ සතුරන් දිනා යි ජෙත නම් වේ. රජු විසින් සතුරු ජනයා දිනූ කල්හි ආරම්භ වූ බැවින් **ජෙතො** නම් වේ. මංගල සම්මත වූ වචනයෙන් මේ නම තබන ලද බැවින් **ජෙතතා** නම් වේ. උපදිනුයි **වන** නම් වේ. තමන්ගේ සම්පත්තියෙන් සත්ත්වයන්ගේ ආදරය තමන් කෙරෙහි උපදවයි යන අර්ථයි. කැමති වේනුයි **වන** නම් වේ. විවිධ මල් සුවඳින් සතුටට පත් කෝකිල ආදී පක්ෂීන්ගේ නාදයෙන් ද, මඳ සුලඟින් සෙලවෙන ගස් හා වැල් අතුර නමැති අත්වලින් 'එන්න මා පරිභෝග කරන්න'යි ප්‍රාණීන්ගෙන් ඉල්ලයි යන අර්ථ ඇත. ජේත කුමාරයාගේ වනය ජේතවනය විය. එය වනාහි ජේත රජකුමරු විසින් ආරම්භ කොට සංවර්ධනය කොට පාලනය කරන ලද්දේය. ඒ රජ කුමරුම එහි අයිතිකාරයා විය. එබැවින් ජේතවන යි කියනු ලැබේ. එම ජේතවනයෙහි **අනාථ පිණ්ඩිකස්ස** ආරාමෙ යනු මවුපියන් විසින් තබන ලද නම සුදත්ත නම් විය. ඒ මහා සිටු සියලු සම්පත්වලින් සමෘද්ධිමත්ව පහවූ මසුරු මල ඇත්තේ කරුණාදී ගුණයන්ගෙන් යුක්තව නිරන්තරයෙන් අසරණ අයට ආහාර දෙයි. එබැවින් අනාථපිණ්ඩික යි කියනු ලැබේ. සත්ත්වයන්ගේ, විශේෂයෙන් පැවිද්දන්ගේ සිත් සතුටු කෙරේනුයි ආරාම නම් වේ. මල්පල ආදී සෝභාවෙන් ද, බෙහෙවින් දුරක් නොවූ, ලඟත් නොවූ පස්වැදෑරුම් සේනාසන අංගයන්ගෙන් යුක්ත වූ එහි ඒ ඒ තැන්වලින් පැමිණ සතුටු වෙත්. බෙහෙවින් සතුටු වෙති. නො කලකිරී වාසය කරති යන අර්ථ ඇත්තේය.

එම ජේතවනාරාමය අනේපිඬු සිටාණන් විසින් ජේත නම් රාජකුමාරයාගෙන් දසඅට කෝටියක් රන් කහවණු දී මිලදී ගෙන දසඅට කෝටියක් රන් කහවණු වැයකොට සෙනසුන් කරවා, දස අට කෝටියක් රන් කහවණු වැයකොට විහාර පූජා කිරීමේ උත්සවය නිමකොට මෙසේ කහවණු පනස් සතරකෝටියක් වැයකොට බුද්ධප්‍රමුඛ සංඝරත්නයට පූජා කරන ලදී. එබැවින් අනාථපිණ්ඩිකස්ස ආරාමය යි කියනු ලැබේ. එහි 'ජෙතවනෙ' යනු පුරාණ අයිතිකාරයා ප්‍රකාශ කිරීම යි. 'අනාථ පිණ්ඩිකසස ආරාමෙ' යනු පශ්චිම අයිතිකාරයා ප්‍රකාශ කිරීමයි.

එහි පළමුකොට සැවැත්නුවර ජේතවනයෙහි භාග්‍යවතුන් වහන්සේ වාසය කරතියි නො කිය යුතුයි. එසේම ජේතවනයෙහි සැවැත්නුවර වාසය කරතියි නොකිය යුතුයි. ස්ථාන දෙකක එකවිට වාසය කළ නො හැකිය. එබැවින් සැවැත්නුවර සමීපයෙහි ජේතවන විහාරයෙහි වාසය කරතියි කිය යුතුයි.

'ආයසමා සාරිපුත්තෙතා' ආදී තන්හි **ආයසමා** යනු ප්‍රිය වචනයකි. 'ච' ශබ්දය එකතු කිරීම සඳහාය. රූපසාරී නම් බ්‍රාහ්මණියගේ පුත්‍රයා **සාරිපුත්තෙතා** නම් වේ. මහා මොග්ගල්ලා නො යනු මහතෙතා මොග්ගල්ලානො, මහා මොග්ගල්ලාන නම් විය. ගුණ විශේෂ පූජා වචනයකි. **රෙවතො** බදිරවන වාසි රේවතය. කංඛා රේවත නොවේ.

භාග්‍යවතුන් වහන්සේ එක් දවසක රක්තවර්ණ තිරයකින් වටකරන ලද්දාක් මෙන්, ස්වර්ණ ප්‍රාසාදයක් පබළු ධජවලින් වටකරන ලද්දාක් මෙන් නවදහසක් හංසයන් විසින් පිරිවරාගත් හංස රාජයකු මෙන් අසූහාර දහසක් සේනාව විසින් පිරිවරාගත් චක්‍රවර්ති රාජයකු මෙන් මහා සංඝයා විසින් පිරිවර කර ලැබුවානු අහස මැද චන්ද්‍රයා ඔසවා තබන්නාක් මෙන් සිවු පිරිස මැද ධර්මදේශනා කරමින් හුන්නානු වෙති. එසමයෙහි මේ අග්‍රශ්‍රාවකයන් දෙදෙන භාග්‍යවතුන් වහන්සේ ගේ සිරිපා වන්දනාව පිණිස එහි පැමිණියහ.

භික්ඛු ආමනෙතසි යනු තමන් පිරිවරාගෙන සිටි ඒ භික්ෂූන්ට එන්නා වූ දෙදෙනා පෙන්වා ප්‍රකාශ කළහ.

භාග්‍යවතුන් වහන්සේ සීල, සමාධි, ප්‍රඥා ආදී ගුණයන්ගෙන් යුක්ත වූ, ශ්‍රේෂ්ඨ සත්සුන් බවෙන් උතුම්ම ආකල්ප සම්පත්තියෙන් යුක්තව, තමන් වෙත පැමිණෙන ඒ ආයුෂ්මතුන් දෙදෙන දැක ප්‍රසන්න සිත ඇත්තාහු ඔවුන්ගේ විශේෂ ගුණයන් වර්ණනා කිරීම පිණිස භික්ෂූන් ඇමතූ සේක. **එතෙ භික්ඛවෙ බ්‍රාහ්මණා ආගච්ඡන්ති, එතෙ භික්ඛවෙ බ්‍රාහ්මණා ආගච්ඡන්ති** යි ප්‍රසාද වශයෙන් හා ප්‍රශංසා වශයෙන් මේ එක වාක්‍යය දෙවරක් කීම සුදුසුය. **එවං මුත්තෙ ති** මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ ආයුෂ්මතුන් බ්‍රාහ්මණයි කී කල්හි **අඤ්ඤතරෝ නම්** ගොත්වලින් අප්‍රකට අයය. එම පිරිසෙහි හුන් එක් භික්ෂුවක් **බ්‍රාහ්මණ ජාතික** නම් බ්‍රාහ්මණ කුලයෙහි උපන්නෙකි. හෙතෙම මහත් වස්තු ඇත්තෙක් වෙයි. බ්‍රාහ්මණ මහාසාර කුලයෙන් පැවිදි වූ ඔහුට මෙබඳු අදහසක් ඇති විය. 'මේ බ්‍රාහ්මණයෝ උභයකුල පාරිසුද්ධව උපන්නෝය. බ්‍රාහ්මණ ඉගැන්වීම් ද අවසන් කර ඇත. භාග්‍යවතුන් වහන්සේ ද මේ ආයුෂ්මතුන් දෙදෙන බ්‍රාහ්මණයෝය යි ප්‍රකාශ කරති. මම භාග්‍යවතුන් වහන්සේගෙන් බ්‍රාහ්මණ ලක්ෂණ කවරේදැයි අසන්නේ නම් යෙහෙකැයි සිතුවේය. මේ කරුණ නිසාම භාග්‍යවතුන් වහන්සේ ඒ තෙරවරුන් බ්‍රාහ්මණයෝ යයි වදාළහ. **බ්‍රහ්මං අණතීති බ්‍රාහ්මණෝ** වේද මන්ත්‍ර සජ්ඣායනා කෙරේ බ්‍රහ්ම නම් වේ. බ්‍රාහ්මණෝ යනු උපතින් බ්‍රාහ්මණයන්ට කියන නමෙකි. ආර්යයෝ වනාහි පවු දුරු කළ බැවින් බ්‍රාහ්මණ නම් වෙති. එබැවින් 'බාහිතපාපතතා බ්‍රාහමණෝ **සමචරියාය** සමණොති වුචචති' යි කියන ලදී. **එතමත්ථං විදිත්වා** යනු බ්‍රාහ්මණ ශබ්දයාගේ පරමාර්ථ වශයෙන් ඇති සකල අර්ථය දැන **ඉමං උදානං** පරමාර්ථ වශයෙන් බ්‍රහ්මභාවය ප්‍රකට කිරීම සඳහා මේ උදානය ප්‍රකාශ කළහ.

එහි **බාහිත්වා** යනු තමන්ගේ සන්තානයෙන් බැහැරකොට, **සමුච්ඡේද** ප්‍රහාණ වශයෙන් දුරුකොට යන අර්ථයි. **පාපකෙ ධම්මෙ** යනු ලාමක පහත් ධර්ම, දුශ්චරිත වශයෙන් ත්‍රිවිධ දුශ්චරිත, අකුශල සිත් වශයෙන් දොළොසකි. අකුශල කර්මපථ වශයෙන් සියලුම අකුශල ධර්ම **යෙ චරන්ති සදා සතා** යනු යම් කෙනෙක් සිහිය මහත් බවට පැමිණි බැවින් සියලු කල්හි රූපාදි අරමුණු සයෙහි සිහියෙන් යුක්තව වසන බැවින් සතිමන්තව සිවු ඉරියව්වල හැසිරෙත්ද, එබැවින් **යෙ චරන්ති සදා සතො** නම් වේ. මෙහි සති ශබ්දය ගැනීමෙන් විමසීම් සහිත නුවණ ගන්නා ලදැයි දැනගත යුතුයි. **ඛීන සංයෝජනා** යනු සතර ආර්යමාර්ග නුවණින් දශවිධ සංයෝජනයන් සම්පූර්ණයෙන් ප්‍රහීණ කළාහුය යන අර්ථය.

බුදධා යනු චතුරාර්යසත්‍ය ධර්මයන් අවබෝධ කළ බුදුවරුය. ඔවුහු වනාහි සාවක බුද්ධ, පච්චේක බුද්ධ, සම්මා සම්බුද්ධ යි ත්‍රිවිධ වෙති. ඔවුන් අතර මෙහි ශ්‍රාවක බුද්ධ අදහස් කෙරේ. **තෙව ලොකසමිං බ්‍රාහමණා** යනු- ඔවුහු ශ්‍රේෂ්ඨ අර්ථයෙන් බ්‍රාහ්මණ සංඛ්‍යාත ධර්මයෙන් ආර්ය ජාතියෙහි උපන්නෝ, බ්‍රාහ්මණ නම් වූ භාග්‍යවතුන් වහන්සේගේ ඖරස පුත්‍රයෝය. සත්ත්වලෝකයෙහි පරමාර්ථ වශයෙන් බ්‍රාහ්මණ නම් වෙති. ජාතිගෝත්‍ර වශයෙන් හෝ ජටා දැරීම නිසා හෝ බ්‍රාහ්මණ නොවෙති. මෙම සූත්‍ර දෙකෙහි අර්හත් ඵලයට පැමිණි පසු වූ බ්‍රාහ්මණ ධර්ම කියන ලදී.

පස්වැනි සූත්‍ර වර්ණනාව යි.

සයවැනි සූත්‍ර වර්ණනාව

සයවැනි සූත්‍රයෙහි රාජගහෙ යනු මෙනම් නගරයෙහි මහාමත්‍යාතු, මහා ගෝවින්ද ආදී රජවරුන් විසින් අයිති කරගත් බැවින් රාජගහ යි කියනු ලැබේ. සතුරු රජවරුන්ට යටත්කර ගැනීමට අපහසු බැවින් හා තවත් ආකාරයෙන් ද වර්ණනා කරති. මේ නගරය බුද්ධ කාලයෙහි හා චක්‍රවර්ති කාලයෙහි නගරයක් වෙයි. අනෙක් කාලයන්හි යක්‍ෂයන් විසින් අයිති කරගන්නා බැවින් ශූන්‍ය වේ. **වෙළුවනෙ කලන්දක නිවාපෙ** වෙළුවන යනු එම විහාරයේ නාමයයි. එය වනාහි දහඅට රියනක් උස ප්‍රාකාරයකින් වටකරන ලද්දේය. භාග්‍යවතුන් වහන්සේට වාසය කිරීමට සුදුසු පරිදි මහත් වූ ගඳකිළියකින් ද තවත් ප්‍රාසාද කූටි ලෙන් මණ්ඩප සක්මන් මළු දොරකවුළු, නානතොටු ආදියෙන් ද යුක්ත විය. පිටත නිල් පැහැයෙන් බබලන සිත්කළු හුණ පඳුරුවලින් යුක්ත විය. එබැවින් වෙළුවන යි කියනු ලැබේ. ලෙහෙණුන්ට වාසස්ථාන වූ බැවින් කලන්දක නිවාප නම් විය.

පෙර එක්තරා රජකෙනෙක් උයන්කෙළි සඳහා මෙහි පැමිණියේ සුරාමදයෙන් මත්ව දහවල නිදා ගත්තේය. ඔහුගේ පිරිවර ජනයාද රජු නිදන්නේය යි එහි මල්පලවලට ආසාවෙන් ඔබ මොබ හැසිරෙන්නේය.

එකල්හි සුරාගඳ නිසා එක් කළු නයෙක් රුක් සිදුරකින් නික්ම රජු ඉදිරියට එන්නේය. එය දුටු රුක් දෙවියෙක් රජුට ජීවිතය දෙන්නෙමියි ලෙහෙනෙකුගේ වේසයෙන් එහි ගොස් රජුගේ කණ ලඟ ශබ්ද කෙළේය. රජු අවදි විය. කළු නයා නැවතුනේය. රජු එය දැක මේ ලෙහෙනා විසින් මට ජීවිතය දෙන ලදැයි එහි තැන් තැන්වල ලෙහෙනුන්ට වාසස්ථාන ඉදි කෙළේය. මෙය අභය භූමියක් ලෙස ප්‍රකාශ කෙළේය. එතැන් පටන් කලන්දක නිවාප යි ප්‍රසිද්ධ විය. කලන්දක යනු ලෙහෙනුන්ට නමකි.

මහා කස්සපොති මහත් වූ ශීලස්කන්ධයකින් යුක්ත වූ බැවින් මහා කස්සප විය. තවද කුමාර කස්සප තෙරුන් නිසා මේ ස්ථවිර මහාකස්සපයි කියති. **පිප්පලීගුහායං** එම ගුහාවෙහි දොරටුව සමීපයෙහි එක් පිලිල ගසක් විය. එබැවින් එය පිප්ඵලී ගුහාවයි ප්‍රකට විය. එම පිප්ඵලී ගුහාවෙහි ආබාධිකො ආබාධයක් ඔහුට ඇත්තේනුයි ආබාධික නම් වේ. **දුක්ඛිතොති** කායික දුකක් හටගත් නිසා දුක්ඛිත විය. **බාළ්හගිලානො ති** බොහෝ වූ ගිලන් බව. එම ගිලන් බව සිහිනුවණින් යුක්තව ඉවසයි. මේ පුවත දැන බුදුරජාණන් වහන්සේ එහි ගොස් බොජ්ඣංග පිරිත දේශනා කළහ. එම සූත්‍ර දේශනාවෙන් කාශ්‍යප තෙරුන්ගේ ඒ ආබාධය සන්සිඳුනේය. බොජ්ඣංග සූත්‍රයෙහි එය කියන ලදී.

'එ සමයෙහි ආයුෂ්මත් මහා කාශ්‍යප රහතන් වහන්සේ ආබාධිතව, කායික දුකෙන් යුක්තව දැඩි ලෙස ගිලන්ව පිප්ඵලී ගුහාවෙහි වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පස්වරු විවේක සුවයෙන් නැගිට මහා කාශ්‍යප තෙරුන් වාසය කරන ස්ථානයට පැමිණ පැනවූ අසුනෙහි වැඩ හුන්හ. එසේ වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේට මෙසේ වදාළ සේක.

'කිමෙක්ද? කාශ්‍යපය, ඔබට ඉවසිය හැකිද? කිම යැපිය හැකිද? හෙවත් ඔබගේ ශරීරය පවත්වා ගන්නට හැකිද? කිමෙක් ද? දුක්වේදනා අඩු වේද? වැඩිවීමක් නැද්ද? දුක් වේදනාවන්ගේ කෙළවරක් පෙනේද? වැඩිවීමක් නොපෙනේද?

'ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මට ඉවසිය නොහැකියි. දුක් වේදනා වැඩිවනු මිස අඩුවීමක් නො පෙනේය'යි.

'කාශ්‍යප ය, මේ සප්තබෝධ්‍යංග ධර්ම මා විසින් මැනවින් කියන ලද්දේය. වඩන ලද්දේය. නැවත නැවත පුරුදු කරන ලද්දේය. ඒ ධර්ම චතුස්සත්‍ය ධර්මයන් විශිෂ්ඨඥානයෙන් දැනගැනීම පිණිස, අවබෝධය පිණිස, නිවන් පිණිස පවතී. ඒ බොධ්‍යංග ධර්ම සත කවරේද?

'කාශ්‍යපය, සති සම්බොජ්ඣංගය මා විසින් මැනවින් කියන ලදී. වඩන ලදී. නැවත නැවත පුරුදු කරන ලදී. එය චතුස්සත්‍ය ධර්මයන් විශිෂ්ට ඥානයෙන් දැනගැනීම පිණිස, අවබෝධය පිණිස, නිවන් පිණිස පවතී.

කාශ්‍යපය, උපෙක්ඛා සම්බොජ්ඣංගය මා විසින් මැනවින් කියන ලදී. වඩන ලදී. නැවත නැවත පුරුදු කරන ලදී. එය චතුස්සත්‍ය ධර්මයන් විශිෂ්ට ඥානයෙන් දැනගැනීම පිණිස, අවබෝධය පිණිස, නිවන් පිණිස පවතී. කාශ්‍යපය, මේ සප්ත බෝධ්‍යංග ධර්ම මා විසින් මැනවින් කියන ලදී. වැඩි වශයෙන් පුරුදු කරන ලදී. නැවත නැවතත් පුරුදු කරන ලදී. ඒ ධර්ම විශිෂ්ට ඥානයෙන් චතුස්සත්‍යය අවබෝධ කර ගැනීම පිණිස, නිවන් පිණිස පවතී.'

'භාග්‍යවතුන් වහන්ස, බෝධ්‍යංග ධර්ම ඒකාන්තයෙන් මැනව. සුගතයන් වහන්ස, බෝධ්‍යංග ධර්ම ඒකාන්තයෙන් මැනවි යි. කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ සැල කළහ. එයට සතුටු වූ ආයුෂ්මත් මහා කස්සප ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට වෙසෙසින් සතුටු වූහ. මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ එම ආබාධයෙන් සුවපත් වූහ. එම ආබාධය අවසන් විය. එහෙයින් කියන ලදී.

ඉක්බිති ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පසුකලෙක එම ආබාධයෙන් සුවපත් වූහ.

එතදහොසීති පෙර ගිලන් දවස්වල එකට විසූ භික්ෂූන් විසින් ලඟට ගෙනවුත් පිළිගැන්වූ පිණ්ඩපාතය වළඳ විහාරයෙහිම විසීය. ඉක්බිති එම ආබාධයෙන් සුවපත්ව නැගී සිටි උන්වහන්සේට 'මම රජගහනුවර පිඬු පිණිස පිවිසෙන්නෙම් නම් ඉතා යෙහෙකැයි' යන කල්පනාව ඇතිවිය. **පඤ්චමත්තානි දෙවතා සතානි** යනු සක්දෙවිරදුන්ගේ පිරිවර වූ පරෙවියන්ට මෙන් පා ඇති දෙවඟනෝ **උසභකං** ආපනනානි හොනති යනු

මහාකාශ්‍යප රහතන් වහන්සේට පිණ්ඩපාතය දෙන්නෙමුයි පන්සියයක් පිණ්ඩපාත සකස්කොට රන්බඳුන්වලින් ගෙනවුත් අතරමග සිට 'ස්වාමීනි, මේ පිණ්ඩපාත පිළිගන්න. අපට සංග්‍රහ කරන්නැයි කියමින් පිණ්ඩපාත දීමෙහි යෙදී පැහැදී සිටියෝය. එහෙයින් කියන ලදී. **ආයස්මතො මහා කස්සපස්ස පිණ්ඩපාත පටිලාභය යි.**

සක්දෙව් රජු කාශ්‍යප තෙරුන් වහන්සේගේ අදහස දැන 'යන්න නුඹලා ආර්ය වූ මහා කස්සප තෙරුන් වහන්සේට පිණ්ඩපාතය දී තමන්ට පිහිටක් කරගන්න'යි ඒ අපස්රාවන් පිටත් කරවීය. ඔහුට මෙබඳු අදහසක් ඇතිවිය. 'මේ සියලු අප්සරාවන් ගියපසු කිසියම් එක අප්සරාවකගේ අතින් පිණ්ඩපාත පිළිගත්තේ නම් එය ඇයට බොහෝ කාලයක් හිතසුව පිණිස පවතින්නේය.

ස්ථවිරයන් වහන්සේ පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කළහ. 'ස්වාමීනි, මාගේ පිණ්ඩපාතය ගන්න. මාගේ පිණ්ඩපාතය ගන්න'යි කියමින් අප්සරාවෝ සිටියහ.

'යන්න තෙපි කළ පින් ඇති, මහා වස්තු ඇත්තෝය. මම දුප්පත් අයට සංග්‍රහ කරන්නෙමි'

'ස්වාමීනි, අප නො නසන්න. අපට සංග්‍රහ කරන්න'යි අප්සරාවෝ කීහ. නැවතත් කාශ්‍යප තෙරුන් ප්‍රතික්ෂේප කළ නමුත් අප්සරාවන් ඉවත්ව යන්නට අකමැති වූ විට කාශ්‍යප ස්ථවිරයන් වහන්ස 'තෙපි තමන්ගේ ප්‍රමාණය නො දන්නාහුය. ඉවතට යන්න යි අසුරක් ගැසූහ. ඒ දෙවඟනෝ තෙරුන්ගේ අසුරු හඬ අසා තැති ගත්තෝ එහි සිටින්නට නො හැකිව පලා ගොස් දෙව්ලොවටම ගියහ.

එහෙයින් කියන ලදී. **පඤ්චමත්තානි දෙවසතානි පටිකබ්පිත්ථා** යි පුබබණ්හසමයං යනු පෙරවරු එක් කාලයක **නිවාසෙත්වා** යනු දැඩි ලෙස වාසය කොට **පත්තචීවරමාදාය** යනු සිවුරු පොරවා පාත්‍රය අතින් ගෙන, **පිණ්ඩාය පාවිසි පිඬු පිණිස පිවිසියේය.**

දළිද්දවිසිබා යනු දුප්පත් මිනිසුන් වාසය කරන වීථිය.

කපනවිසිබා යනු අසරණ දිළිඳු මිනිසුන් වාසය කරන වීථිය.

පෙසකාර විසිබා රෙදි වියන්නන් වාසය කරන වීථිය. අඳසා බො **භගවා** භාග්‍යවතුන් වහන්සේ දුටහ. කුමක් දුටුසේක්ද? ආබාධයෙන් සුවපත් වූ මාගේ පුත්‍ර කාශ්‍යප කුමක් කරන්නේදැයි ආවර්ජනා කරමින් වෙළුවන විහාරයෙහි වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දිවැසින් මෙසේ දුටුවෝය. **එතමත්ථං විදිත්වා** යනු ආයුෂ්මත් මහා කාශ්‍යප තෙරුන් විසින් පන්සියයක් අප්සරාවන් විසින් ලඟට ගෙන එන ලද නොයෙක් සුප්වලින් හා නොයෙක් ව්‍යඤ්ජනවලින් යුක්ත වූ දිව්‍ය පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කොට දුප්පත් ජනතාවට අනුග්‍රහ ප්‍රතිපත්තියක් කියන ලද්දේද මේ කාරණය දැන ඉමං **උදානං** යනු උතුම් වූ අප්පිච්ඡතා ගුණය ප්‍රකාශ කිරීමට හා රහතන් වහන්සේලාගේ භාව අනුභාව ගුණය ප්‍රකාශ කරන උදානය ප්‍රකාශ කෙළේය.

එහි **ආනඤ්ඤපොසීති** අනිකකු පෝෂණය කෙරේනුයි අඤ්ඤපොසි නම්.

න අඤ්ඤපොසි, අනඤ්ඤපොසි - අනිකකු පෝෂණය නොකෙරේනුයි අනඤ්ඤපෝසි නම්. තමන් විසින් පෝෂණය කළයුතු, අනිකකු නැති බැවින්, දෙවැන්නකු නැති බැවින් අදුතිය නම් වූයේ එකපෝසීති යන අර්ථ ඇත්තේය. ඒ තෙරුන්ගේ ස්ව කැමැත්තෙන් හැසිරීම දක්වයි. ස්ථවිර තෙමේ වනාහි කය පරිහරණය කරන සිවුරෙන්ද, කුස පරිහරණය කරන පිණ්ඩපාතයෙන් ද තමා පමණක් පෝෂණය කරන්නේ පරම අල්පේච්ඡව වාසය කරයි. ඤාතිමිත්‍රාදීන් අතර අන් කිසිවකු පෝෂණය නො කරයි. කිසිවක් කෙරෙහි නො ඇලෙන බැවින් හෙවත් පෝෂණය කළයුතු අනිකකු නැති බැවින් අනඤ්ඤපෝසි නම් වේ.

යම් භික්ෂුවක් එකම ප්‍රත්‍යදායකුගේ සිවුපසය පිළිගන්නේ නම් හෙතෙම අනඤ්ඤපෝසි නම් නොවේ. ස්ථවිරයන් වහන්සේ වනාහි 'යථාපි භමරෝ පුප්ඵං' යන ගාථාවෙන් කියන ලද කුමයට ඇවිදීමේ ශක්තිය නිසා පිඬු පිණිස හැසිරෙන්නේ කුලයන්හි නිත්‍යයෙන්ම අලුත් කෙනෙකු වී මිශ්‍ර බතින් යැපෙති' එය වනාහි භාග්‍යවතුන් වහන්සේ චන්ද උපමා පටිපදාවෙන් වර්ණනා කළහ.

අඤ්ඤතං යනු විශේෂයෙන් දැන ගැනීමය. යම් ඒ කියන ලද ගුණයන්ගෙන් ශාන්ත වූ බැවින් ද අනුන් විසින් පෝෂණය නො කරන බැවින් ද, අල්පේච්ඡ ගුණයෙන් හා ලද දෙයින් සතුටුවීමේ ගුණයෙන් ද විශේෂයෙන් දන්නා ලද්දේය. ප්‍රකට වූයේය. **දන්තං** යනු සවැදෑරුම් ඉඳුරන් සපුරා උතුම් ලෙස දමනය කළ **සාරෙ පතිට්ඨිතං** යනු විමුක්ති නම් නිර්වාණ සාගරයෙහි සිටි, අශෛක්ෂ ශීලස්කන්ධාදි සාරයෙහි පිහිටි, **ඛීණාසවං වන්ත** දොසං කාමාදි චතුර්විධ ආස්‍රවයන් ඉතිරි නො කොට ප්‍රහීණ කළ බැවින් ඛීණාසවං නම්. එසේම කාමාදි ආස්‍රවයන් සියලු අයුරින් විනාශ කළ බැවින් වන්ත දොස නම් වේ. **තමහං බ්‍රූමි බ්‍රාහමණ** යනු කියන ලද පරිදි ගුණයන්ගෙන් යුක්ත වූ පරමාර්ථ බ්‍රාහ්මණයා මම බ්‍රාහ්මණය යි කියමි. මෙහි පෙර කියන ලද පරිදිම බුද්ධ දේශනාව නන් අයුරින් දතයුතුය.

සයවැනි සූත්‍ර වර්ණනාව යි.

සත්වැනි සූත්‍ර වර්ණනාව

සත්වැන්නෙහි පාවායං යනු මේ නම ඇති මල්ල රජවරුන්ගේ නගරයෙහි **අජපාලකෙ චෙතියෙ** යනු අජකලාපක නම් යක්ෂයා විසින් අරක්ගත් බැවින් අජකලාපක නම් යක්ෂයා විසින් අරක්ගත් බැවින් අජකලාපක නම් වූ මනුෂ්‍යයන්ගේ සිත් ගත් ස්ථානයකි. ඒ යක්ෂයා වනාහි එලුවන් සමූහ වශයෙන් බැඳ බලි පූජා කරයි. එහෙයින් අජකලාපක යි ප්‍රකට විය. ඇතැමෙක් සතුන් බලිපූජාව සඳහා එහි ගෙනවිත් එලුවන්ගේ හඬ හා සමානව ශබ්ද නගා බලිපූජා කරති. ඔවුහු එයින් සතුටු වෙති. එහෙයින් අජකලාපක යි කියනු ලැබේ. ඒ යක්ෂයා වනාහි ආනුභාව සම්පන්නය. නපුරුය. එරුසය. ඒ ස්ථානයෙහි වසන්නේය. එබැවින් එම ස්ථානයට මිනිස්සු පූජා පවත්වති. වරින්වර බලි පූජා ද කරති. එබැවින් 'අජකලාපකෙ චෙතියෙ' යි කියන ලදී.

අජකලාපකසස යකඛසස භවනෙ යනු ඒ යක්ෂයාගේ විමානයයි. එකල්හි වනාහි ශාස්තෘන් වහන්සේ ඒ යක්ෂයා දමනය කරනු කැමතිව සවස් කාලයෙහි හුදෙකලාව පාසිවුරු ගෙන අජකලාපක යක්ෂයාගේ භවනයෙහි දොරටුව වෙත ගොස් එහි සිටි දොරටුපාලයාගෙන් එහි පිවිසීමට අවසර පැතූහ. 'ස්වාමීනි, ඒ අජකලාපක යක්ෂයා නපුරුය. ශ්‍රමණයෙකැයි, බ්‍රාහ්මණයෙකැයි ගෞරව නොකරයි. එබැවින් ඔබවහන්සේ ම සුදුසු දෙයක් සිතා බලන්න. මා විසින් මෙය ඔහුට නොදැන්වීම අයුක්තකි යි එකෙණෙහිම වාත වේගයෙන් යක්ෂ සමාගමට ගිය අජකලාපක යක්ෂයා වෙත ගියේය. ශාස්තෘන් වහන්සේ භවන ඇතුලට පිවිස අජ කලාපක යක්ෂයා හිඳින මණ්ඩපයෙහි පනවන ලද අසුනෙහි වැඩහුන්හ. එකල්හි යක්ෂයාගේ අන්තඃපුර ස්ත්‍රීහු ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ වැඳ එකත්පසෙක සිටියහ. ශාස්තෘන් වහන්සේ ඔවුන්ට කාලීන ධර්ම කථාවක් ප්‍රකාශ කළහ.

එහෙයින් **පාවායං විහරති අජකලාපකෙ චෙතියෙ අජකලාපකසස යකඛසස භවනෙ** යි කියන ලදී. එකල්හි සාතාගිර හේමවත යන යක්ෂයන් දෙදෙන අජ කලාපක යක්ෂයාගේ භවනය උඩින් යන්නෝ තමන්ගේ ගමනට බාධා වූ බැවින් කුමක් නිසා මෙසේ වීදැයි කල්පනා කරන්නෝ අජකලාපයක්ෂ භවනයෙහි වැඩවසන ශාස්තෘන් වහන්සේ දැක එහි ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ 'ස්වාමීනි, අපි යක්ෂ සමාගමට යන්නෙමු'යි ප්‍රකාශකොට බුදුරදුන් ප්‍රදක්ෂිණාකොට ගියහ. යක්ෂ රැස්වීමෙහි සිටි අජකලාප යක්ෂයා දැක 'ඇවැත්නි, අජකලාපක, ඔබට මහත් ලාභයකි. ඔබගේ භවනයෙහි දෙවියන් සහිත ලෝකයෙහි අග්‍ර පුද්ගල වූ භාග්‍යවතුන් වහන්සේ වැඩ වෙසෙති. එහි පැමිණ භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කරන්න. ධර්මයද අසන්නැ'යි තමන්ගේ සතුට ප්‍රකාශ කළහ. හෙතෙම ඔවුන්ගේ කතාව අසා මොවුනු ඒ මුඩු ශ්‍රමණයා භවනයෙහි හුන් බව ප්‍රකාශ කරතියි ක්‍රෝධයෙන් මඩනා ලද්දේ 'අද ඒ ශ්‍රමණයා සමග මාගේ යුද්ධයක් වන්නේ' යයි සිතා යක්ෂ සමාගමෙන් නැගිට දකුණු පය ඔසවා සැට යොදුනක් පමණ වූ පර්වතය පැගුවේය. ඒ පර්වතය දෙකඩ විය. ඉතිරි කථාව පිළිබඳව යමක් මෙහි කියයුතු නම් ඒ සියල්ල ආලවක සූත්‍ර වර්ණනාවෙහි සඳහන් පරිදි දතයුතුය අජකලාපක සමාගමය ආලවක සමාගමය හා සමාන වේ. යක්ෂයාගේ ප්‍රශ්න කිරීමත්, එය විසඳීමත් හා යක්ෂ භවනයෙන් තුන්වරක් නික්මීමත්, ප්‍රවේශ වීමත් එය හා සමාන වේ. අජකලාපකයා එන අතරම 'මේ ශ්‍රමණයා පලවා හරින්නෙමියි චණ්ඩ

මාරුතය පටන් වර්ෂා නවයක් වස්වා හිංසා කළත් එයින් භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙහි ස්වල්පමාත්‍ර සෙලවීමක් කරන්නට නොහැකිව නානාවිධ ආයුධ ගත් අත් ඇතිව සිටි භයානක රූප ඇති අමනුෂ්‍යයන් මවා ඔවුන් සමග භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ හැසිරෙමින් මුලු රැයක් විවිධ විප්‍රකාර කළත් භාග්‍යවතුන් වහන්සේගේ කෙස් අගක් පමණකුදු වැඩහුන් තැනින් සොලවන්නට නොහැකි විය. 'මේ ශ්‍රමණයා මාගෙන් නොඅසා මාගේ භවනයට ඇතුල් වී හිඳියි' යි ක්‍රෝධයෙන් දැවෙයි. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ සිතිවිලි දැක යම් ලෙසකින් මේ චණ්ඩ වූ යක්‍ෂයාගේ නාසයෙහි පිට බිඳෙන්නේ නම් හෙතෙම බෙහෙවින්ම නපුරු වන්නේය. යක්‍ෂයා මා මෙහි හුන්කල්හි හිත නපුරු කරගනියි. එබැවින් මෙතැනින් ඉවතට යන්නේ නම් ඉතා යෙහෙකැයි භවනයෙන් නික්ම එලිමහන් තැන වැඩ සිටියේය.

තෙන ඛො පන සමයෙන භගවා රත්තන්ධකාරතිමිසායං අබ්භොකාසෙ **නිසිනෙනා හොති'නි** යි එහෙයින් කියන ලදී. එහි 'රත්තන්ධකාර තිමිසායං' යන රාත්‍රියෙහි බලවත් අන්ධකාරයෙහි, ඇසට නොපෙනෙන බලවත් අන්ධකාරයක් යන අර්ථයි. අංග හතරකින් යුත් අන්ධකාරයක් එකල්හි තිබුනේය යන අර්ථයි. ඉක්බිති මේ ශබ්දයකින් මේ ශ්‍රමණයා තැතිගන්වා එලවා දමන්නෙමි යි භාග්‍යවතුන් වහන්සේ ලඟට ගොස් 'අකතුලො' ආදී ශබ්දයන්ගෙන් බියජනක තත්ත්වයක් ඇති කෙළේය. අථකො අජකලාපකො ආදිය එහෙයින් කියන ලදී. එහි 'භයං' යනු තැති ගැනීමයි. **ඡම්භිතත්තං** යනු සිරුර වෙව්ලන ස්වභාවයයි. 'ලොමහංසං' යනු ලොම්දැහැ ගැනීමයි. පද තුනෙන් බියට පත්වීම දක්වයි. **උපසංකමී** ති කුමක් අදහස් කරගෙන සමීපයට ගියේද යත්, මුලදී ස්වකීය භවනයෙහි සිටි භාග්‍යවතුන් වහන්සේට කිසිම විපතක් කරන්නට නොහැකි විය. දැන් භවනයෙන් පිට සිටින භාග්‍යවතුන් වහන්සේ බියට පත්කොට එලවා දමන්නට හැකියයි සිතමින් බුදුන් සමීපයට පැමිණියේය. මේ යක්‍ෂයා තමන්ගේ භවනය වීරභූමියක් ලෙස සලකයි. එහි සිටි බැවින් මේ ශ්‍රමණයා බයට පත් නොවේ යි කල්පනා කරයි. **නිකඛණත්තං අකකුලෙ පකකුලොති අකකුල පකකුලිකං අකාසි** යනු තුන්වරක් බියට පත්කිරීම සඳහා මෙවන් ශබ්දයක් කෙළේය. එකල්හි මේ යක්‍ෂයා මහමෙර ඔසවා පොළොවට පෙරලන්නාක් මෙන් ද, හෙන දහසක් එකට ගැටීමක් මෙන් ද, එකම තැනකට එකතුව දිසා හස්තින් නිකුත් කරන ගර්ජනාවක් මෙන්ද, කේසර සිංහයන්ගේ ඝෝෂාව මෙන්ද, යක්‍ෂයන්ගේ 'හුංකාර' ශබ්දය

මෙන්ද, භූතයන්ගේ මහ සිනාවක් මෙන්ද, අසුරයන්ගේ අත්පොලසන් හඬ මෙන් ද, ශක්‍රදෙවියන්ගේ වජ්‍රායුධයෙන් නිකුත්කරන මහා ශබ්දය මෙන්ද, පෘථග්ජන ජනතාවගේ හදවත පලන්නාක් වැනි ක්‍රෝධයෙන් යුක්ත වූ මහා ගර්ජනාවක් තුන්වරක් කෙළේය. මේ ගර්ජනාවෙන් මේ ශ්‍රමණයා බියට පත්කොට එලවන්නෙමි යි කළ මේ ඝෝෂාවෙන් පර්වතයෝ එකටෙක ගැටුනෝය. විශාල වනස්පති වෘක්ෂ පටන් සියලුම ගස් ලියගොමුවල කොළ ගෙඩි මල් සියල්ල බිම වැටුනෝය.

යොදුන් තුන්දහසක් පුළුල් වූ හිමාලය පර්වත රාජයාද කම්පනයට පත්විය. බූමාටු දෙවියන් පටන් සියලු දෙවියන්ටද, අනෙක් අපා දෙපා සිවුපා සියලු සතුන්ට මහපොළොවෙ කම්පාවෙන්නාක් මෙන් මහත් බියජනක ශබ්දයක් ඇතිවිය. මුලු දඹදිව මහත් වූ කෝලාහලයක් ඇතිවිය. භාග්‍යවතුන් වහන්සේ එම ශබ්දය කවරක්දැයි නොසිතමින් වැඩහුන්හ. මේ ඝෝෂාවන්ගෙන් කිසිවකුටවත් අනතුරක් නොවේවායි අධිෂ්ඨාන කළහ.

එසො තෙ සමණ පිසාචො යනු එම්බා ශ්‍රමණය, නුඹ ලඟට පිසාචයෙක් පැමිණියේ යයි මහත් වූ භෛරව රූපයක් මවා යක්ෂයා කියයි. **එතමත්ථං විදිත්වා** මේ යක්ෂයා විසින් කයෙන් හා වචනයෙන් කරන විප්‍රකාරයද, එයින් තම මැඩ පැවැත්වීමට නොහැකිවීම සඳහා හේතු වූ ලෝක සත්ත්වයා කෙරෙහි ඇති මහා කරුණාව සියලු ආකාරයෙන් දැන **තායං වෙලායං** ඒ විප්‍රකාර කරන වෙලාවෙහි **ඉමං උදානං** භාග්‍යවතුන් වහන්සේ මේ උදානය පහළ කළ සේක.

එහි **යදා සකෙසු ධම්මෙසු** යම්කලෙක ස්වකීය ආත්මභාව සංඛ්‍යාත පංචඋපාදානස්කන්ධ ධර්මයන්හි, 'පාරඥ' යනු සම්පූර්ණ ලෙස අවබෝධ කරගැනීමෙන් පරතෙරට ගිය ඒ උපාදානස්කන්ධයන්ගේ ඇතිවීමට හේතුව, ඒවා පවත්නා ආකාරය නිරුද්ධවීම හා නිරෝධගාමිනී ප්‍රතිපදාවද හා ප්‍රභාණයද අවබෝධ කරගැනීම වශයෙන් පරතෙරට ගිය **හොති බ්‍රාහ්මණො** යනු සියලු ආකාරයෙන් කෙලෙසුන් නැසූ බැවින් බ්‍රාහ්මණ නම් වෙයි. සියලු අයුරින් ස්වකීය ආත්මභාවය පිළිබඳව අවබෝධය ලබා චතුස්සත්‍ය ධර්මය අවබෝධ කළ බැවින් බ්‍රාහ්මණ නම් වෙයි. **ඉමසමිං යෙව බ්‍යාමමත්තෙ කලෙබරෙ සසඤ්ඤී සමනකෙ ලොකඤ්ච ලොකසමුදයඤ්ච පඤ්ඤාපෙමී**'යි එහෙයින් කියන ලදී.

තවද **සකෙසු ධම්මෙසු** යනු තමන්ගේ ධර්මයන්හි, තමන්ගේ ධර්ම නම් දියුණුව කැමති පුද්ගලයාගේ සීලාදී ධර්මයෝය. සීල සමාධි ප්‍රඥා විමුක්ති ආදී කෙලෙසුන් දුරුකිරීමෙන් පාරිශුද්ධිය (නිවන්සුව) ලබාදෙන ධර්මයෝය. අනර්ථය ලබාදෙන ක්ලේශධර්ම නොවේ.

පාරගු යනු එම සීලාදී ධර්ම සම්පූර්ණ කිරීමෙන් පරතෙරට, නිවනට ගියේය. සීලං ලෞකික, ලෝකෝත්තර වශයෙන් දෙකකි. ලෞකික සීලය නම් පූර්වභාග සීලයයි. එය සංක්ෂේප වශයෙන් ප්‍රාතිමෝක්ෂ සංවර ආදී වශයෙන් චතුර්විධ වේ. විස්තර වශයෙන් නොයෙක් භේද ඇත. ලෝකෝත්තර සීලය මාර්ග, ඵල වශයෙන් දෙකකි. සීලය මෙන් සමාධිය ප්‍රඥාවද ලෞකික ලෝකෝත්තර වශයෙන් දෙකකි. ලෞකික සමාධිය නම් උපචාර සහිත අෂ්ට සමාපත්තිය, ලෝකෝත්තර සමාධිය නම් මාර්ග සතරකින් යුක්ත වූ සමාධියයි. ප්‍රඥාව ලෞකික, සුතමය, චින්තාමය, භාවනාමය සාසව වශයෙන් භේද ඇත. ලෝකෝත්තර ප්‍රඥාව නම් මාර්ග ඵලවලින් යුක්ත වීමය. විමුක්ති ප්‍රඥාව නම් ඵල විමුක්තිය හා නිර්වාණයයි. එබැවින් එය ලෝකෝත්තර විමුක්තියයි. ඥාන දර්ශනය ලෞකික වේ. එය එකුන්විසි වැදෑරුම් ප්‍රත්‍යවේක්ෂා නුවණින් ලැබේ.

මෙසේ ශීලාදී ධර්මයන් තමන්ගේ සන්තානයෙහි අර්හත් සමාධියට පැමිණීමෙන් සම්පූර්ණයෙන් උපදවාගෙන පරතෙරට ගියේ වන්නේය. **හොති බ්‍රාහ්මණොති** හොති බ්‍රාහ්මණො යනු එකල්හි පාපධර්මයන් විනාශ කළ බැවින් පරමාර්ථ වශයෙන් පරමාර්ථබ්‍රහ්ම නම් වේ. **'අථ එතං විසාවඤ්ච පකකුලඤ්චාති වතතතීති** යනු කියන ලද පරිදි පරතෙරට ගිය මනසක් ඇති බැවින් අජකලාපක තා විසින් දක්වන ලද අකකුල පකකුල ආදිය ඉක්මවා සිටියි. මැඩපවත්වයි. ඉක්බිති අජකලාපක යක්ෂයා තමා විසින් කරන ලද බියජනක දෙයින් හා හිංසා පීඩාවන්ගෙන් වැඩක් නොවූ බව හා බුදුරදුන්ගේ නොසෙල්වන බව කම්පා නොවන බව දැක ඒකාන්තයෙන් මෙය ආශ්චර්යකියි ප්‍රසන්න සිතින් ශ්‍රද්ධාව තමා කෙරෙහි පහළ වූ බව ප්‍රකාශ කරමින් බුදුරදුන්ගෙන් උපාසක භාවය ආයාචනා කෙළේය.

සත්වැනි සූත්‍ර වර්ණනාව යි.

අටවැනි සූත්‍ර වර්ණනාව

අටවැනි සූත්‍රයෙහි **සංගාමජී** යනු ඔහුගේ නාමයයි. මොහු සැවැත්නුවර **සම්පත්** ඇති මහා ධනවතකුගේ පුත්‍රයා ය. ඔහු වැඩිවියට පත්වූ පසු මව්පියන් විසින් සුදුසු බිරිඳක් කැඳවා වස්තුව පවරා විවාහය කරවන ලද්දේය. සැවැත්නුවර පෙරවරු දන්දී සිල්සමාදන්ව සිට සවස සුදුරෙදි හැඳ සුදු උතුරු සළුවලින් සැරසී සුවඳ මල් ගෙන ධර්මශ්‍රවණය සඳහා දෙව්රම් වෙහෙරට යන උපාසකයන් දැක 'කොහි යන්නහුදැ'යි අසා ධර්මශ්‍රවණයට දෙව්රම් වෙහෙරට යන බව දැන ඔහු ද 'මම ද එන්නෙමි'යි දෙව්රම් වෙහෙරට ගියේය. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ රන් ගුහාවක සිංහනාද කරන කේශර සිංහරාජයකු මෙන් සද්ධර්ම මණ්ඩපයෙහි පනවන ලද අසුනෙහි වැඩහිඳ සිවුපිරිස මැද ධර්මය දේශනා කරති. එකල්හි උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසක හුන්හ. සංගාමජී කුලපුත්‍රයා එම පිරිස් කෙළවර ධර්මය අසමින් සිටියේය. භාග්‍යවතුන් වහන්සේ අනුපුබ්බී කථාව පවත්වා චතුරාර්ය සත්‍ය ධර්මය දේශනා කළහ. දේශනාව අවසානයෙහි දහස් ගණනක් පිරිසට ධර්මාවබෝධිය විය. සංගාමජී කුලපුත්‍රයා සෝවාන්ඵලයට පත්ව පිරිස නැගිසිට ගියකල්හි භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ 'ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මා පැවිදි කරනු මැනවැ'යි පැවිද්ද ඉල්ලුවේය. 'ඔබ මවුපියන්ගෙන් පැවිද්ද සඳහා අනුමතය ලබාගත්තෙහිද?' 'ස්වාමීනි, මම අනුමතය නොගත්තෙමි. 'සංගාමජී, තථාගතයන් වහන්සේලා මවුපියන්ගෙන් අනුමතය නොගත් පුත්‍රයකු පැවිදි නොකරති. 'ස්වාමීනි, මම එසේ කරන්නෙමි. මවුපියන්ගෙන් අනුමතය ලබාගන්නෙමි'යි භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගොස් මවුපියන් වෙත පැමිණ 'මෑණියනි, පියාණෙනි, මට පැවිදි වීමට අවසර දෙන්නැ'යි කීයේය. එතැන්සිට රට්ඨපාල සූත්‍රයෙහි සඳහන් වන පරිදි දතයුතුය.

ඉක්බිති හෙතෙම 'පැවිදිව මවුපියන් දකින්නට එන්නෙමි'යි පොරොන්දුවක් දී මවුපියන්ගෙන් අනුමතය ලැබ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ පැවිද්ද ඉල්වීය. භාග්‍යවතුන් වහන්සේ සම්පයෙහි පැවිද්ද හා උපසම්පදාව ද ලැබීය. පැවිදිව නොබෝ කලකින් හෙතෙම ඉතිරි මාර්ගඵල ලැබීම සඳහා උත්සාහ කරන්නේ එක්තරා ආරණ්‍යවාසයක වස් වසා ඡඩ් අභිඥාලාභීව, වස් පවාරනකොට භාග්‍යවතුන් වහන්සේ දැකීමටත්, මව්පියන්ට දුන් පොරොන්දුවෙන් මිදීම සඳහාත්, සැවැත්නුවරට

ගියේය. එහෙයින් **'තෙන ඛො පන සමයෙන ආයසමා සංගාමජී සාවත්ථිං අනුපපත්තෙතා හොති'**යි කියන ලදී. ඒ ආයුෂ්මත් තෙමේ දුර ගමක පිඬු සිඟා වළඳ පස්වරු දෙවිරම් වෙහෙරට පිවිස භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ කරන ලද පිළිසඳර ඇත්තේ අනෙක් කාරණය ප්‍රකාශ කොට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්ම එක්තරා රුක්මූලක දහවල් කාලය ගත කෙළේය. ඉක්බිති ඔහුගේ මවුපියෝ ද ඥාති මිත්‍රයෝද ඔහුගේ පැමිණීම අසා සංගාමජී තෙර මෙහි පැමිණියේය යි සතුටු සිත් ඇතිව වහ වහා වෙහෙරට ගොස් සොයන්නෝ එහි හුන් ඔහු දැක සමීපයට ගොස් පිළිසඳර කොට දරුවන් නැති වස්තුව රජවරු අරගෙන නොයාම පිණිස, දායාද අල්වා නොගැනීම පිණිස දරුව එන්න, පැවිද්දෙන් ප්‍රයෝජන නැත. ගිහි බවට පත්වන්නැයි ඉල්ලා සිටියහ. එය අසා ස්ථවිර තෙමේ මොවුහු මට කාමවස්තූන්ගෙන් ප්‍රයෝජන නැති බව නොදනිති. අසූචි දරන්නන් මෙන් අසූචි සංඛ්‍යාත කම්සැපෙහි ඇලීම කැමති වෙති. මොවුන් ධර්මකථාවෙහි යොමු කරන්නට නො හැකිය යි නො ඇසෙන්නාක් හුන්නේය. ඔවුහු නොයෙක් අයුරින් ඉල්ලා සිටියත් තමන්ගේ ඉල්ලීම නො පිළිගන්නා බව දැක නිවසට පැමිණ 'අපි නොයෙක් ආකාරයෙන් අයැද සිටියත් ඔහුගේ කැමැත්ත නොලබා පැමිණියෙමු. සොඳුර, යන්න ඔබගේ සැමියාට දරුවා පෙන්වා යාඥා කොට කැමැති කරවා ගන්නැයි ඔහුගේ භාර්යාව පිරිවර සමග පිටත් කළහ. ඔහු ඇතිවුනු ආසාව නිසා පැවිදි විය යි සිතා ඇය එය පිළිගෙන දරුවාද රැගෙන මහත් පිරිවර සමග දෙවිරම් වෙහෙරට ගියාය.

'අසෙසාව ඛො ආයසමතො සංගාමජීසසා ආදිය එහෙයින් කියන ලදී. එහි පුරාණදූතියිකා යනු පෙර ගිහිකල සිටි භාර්යාවයි. අයෙයා යනු ආර්යපුත්‍රය යි කිය යුතු වුවත් පැවිද්දන්ට සුදුසු පරිදි අය්‍යෝ යි කියයි. **කිර** යනු වනාහි යන අර්ථ ඇත්තේය. **බුද්ද පුත්තාමහි සමණ පොස මං** යනු කුඩා පුතා ද මා ද පෝෂණය කරන්න. තිබුණු ආසාව නිසා මා අත්හැර පැවිදි වූවෙහිය. ඔබ වැනි කුඩා පුතා ද මා ද අත්හැර මහණදම් පිරීම යුතු නැත. එබැවින් ශ්‍රමණයන් වහන්ස, පුතාද මා ද ආහාරපාන හා වස්ත්‍රවලින් පෝෂණය කරන්න. ආයුෂ්මත් සංගාමජී තෙර ඇස් ඇර නොබලයි. කිසිවක් කතා නොකරයි.

එවං වුත්තෙ ආයසමා සංගාමජී තුණ්හී අහොසියි යි කීයේ එහෙයිනි.

ඇය තුන්වරක් එසේම කියා නිශ්ශබ්දවම සිටින බව දැක පුරුෂයෝ වනාහි භාර්යාවන් කෙරෙහි අපේක්ෂාව නොදැක්වූවත් දරුවන් කෙරෙහි අපේක්ෂා සහිත වෙති. දරු සෙනෙහස පියාගේ ඇටමිදුළු විදගෙන යයි. එබැවින් දරු සෙනෙහසින් මාගේ වසඟයට පත්කරගන්නෙමියි සිතා ඇය පුතා තෙරුන්ගේ උකුලෙහි තබා එකත්පසින් බැහැරව 'ශ්‍රමණය මොහු ඔබගේ පුත්‍රයාය. ඔහු පෝෂණය කරන්නැ'යි **'එසො තෙ සමණ පුත්තො පොසෙතබ්බ තී'** කියා ටික දුරක් ගියාය. ඇයට ශ්‍රමණයන් වහන්සේගේ තේජසින් ඉදිරියෙහි සිටින්නට නොහැකි වූවාය. ස්ථවිරයන් වහන්සේද දරුවා දෙස නොබලති. දරුවා සමග කතා නොකරති. ඉක්බිති ඒ ස්ත්‍රියද නුදුරෙහි සිට මුහුණ හරවා බලන්නී තෙරුන්ගේ ඒ ආකාරය දැක ආපසු හැරී මේ ශ්‍රමණයාට පුත්‍රයාගෙන් ප්‍රයෝජනයක් නැතැයි දරුවා අරගෙන ගියාය.

අථ බො ආයසම්තො සංගමජ්ජස්ස පුරාණදුතියිකා යි එහෙයින් කියන ලදී.

එහි **පුතෙතනපි** යනු මේ ශ්‍රමණයා තමන්ගේ ඖරස පුත්‍රයා කෙරෙහිද ආදරයක් නැත. අනෙක් දරුවන් කෙරෙහි කියනුම කවරේද? යන අදහසයි. **දිබ්බන** යනු මෙහි දෙව්ලොව වූයේ දිබ්බ නම් වේ. දෙවියන්ට වනාහි යහපත් ක්‍රියා නිසා උපන් පින් සෙම් ලේ අපවිත්‍ර නොවූ දුරසිටම බැලිය හැකි දිව්‍යමය වූ චක්ෂුප්‍රසාද ඇත. මෙයද චතුර්ත්ථ ධ්‍යාන සමාධිය නිසා උපන් අභිඥා ඇසකි. එය දිව්‍යමය ඇසකට සමාන බැවින් දිබ්බ නම් වේ. **විසුද්ධන** යනු නීවරණ ආදී කෙලෙස් නැති කිරීමෙන් අතිශය පවිත්‍රභාවයට පත් යන අර්ථයි. අතික්කන්තමානුසකෙන යනු මනුෂ්‍ය විෂය ඉක්ම වූ යන අර්ථයි. **ඉමං එවරූපං විප්පකාරං** යනු මෙම විප්‍රකාරය පැවිද්දන්ට නොසුදුසුය. ඇකයෙහි දරුවකු තැබීම නො සුදුසු ක්‍රියාවකි. **එතමත්ථං** යනු මෙය ආයුෂ්මත් සංගාමජි තෙරුන්ට අඹුදරුවන් ආදී සියලු දෙය කෙරෙහි අපේක්ෂාවක් නැති බව සියලු අයුරින් දැන යන අර්ථයි. ඉමං උදානං යනු එම තෙරුන්ගේ ඉටු අනිටු සියලු දෙය කෙරෙහි කම්පා නොවන බව ප්‍රකාශ උදානයක් පහළ කෙළේය යන අර්ථයි. එහි **ආයනතිං** යනු එන්නීය. පැරණි අදහස් කෙරේ.

නාභිනන්දති මා දකින්නට ආවා යයි සතුටු නොවෙයි. **පකකමනති මෝතෙ** මා දැක අසතුටෙන් යන. **නසෝමති** සිත් තැවුලකට පත්

නොවේ. යම් කරුණකින් වනාහි ස්ථවිර තෙමේ මෙසේ නො සතුටු වෙයිද එය දැක්වීමට **සංගා සංගාමජිං මුත්තං** යි සියලු ඇලීම්වලින් මිදුනේය යි කියන ලදී. එහි **සංගා** යනු රාග-දෝස-මෝහ-මාන, දිට්ඨි යන පස්වැදෑරුම් ඇලීම්වලින් සමුච්ඡේද පටිපස්සද්ධි විමුක්තින්ගෙන් මිදුණු සංගාමජී භික්ෂුව **තමහං බ්‍රහ්මි බ්‍රාහ්මණං** යනු තාදී ගුණයට පත් ඒ ක්ෂීණාශ්‍රව යන සියලු පව් දුරුකළ බැවින් බ්‍රාහ්මණ යි කියමි.

අටවෙනි සූත්‍ර වර්ණනාව යි.

නවවෙනි සූත්‍ර වර්ණනාව

නව වැන්නෙහි **ගයාය** යනු, මෙහි ගයා නමින් ගමක්ද තොටුපලක්ද ඇත. ගයා ගමට නුදුරුතැන්හි වාසය කරන බැවින් බුදුරජාණන් වහන්සේ ගයාවෙහි වාසය කරතියි කියති. ගයා තොටුපලට හා ගයා ගමට **සමීපයෙහි** එක් පොකුණක් ද ගඟක් ද ඇත. ලෞකික මහජනයා ඒ ස්ථාන දෙකම පව් සෝදා හරින්නේය යි විශ්වාස කරති. **ගයාසීසෙ** ඇත් හිසක් හා සමාන පර්වත මුදුනෙහි, එහි ගයාසීස නමින් එක් පර්වතයක් ඇත. යම් තැනෙක ඇත් හිසක් හා සමාන පර්වත මුදුනෙහි දහසක් භික්ෂූන්ට විසීමට පහසුකම් ඇත්තේද, එහි භාග්‍යවතුන් වහන්සේ වාසය කරති. එබැවින් **ගයායං විහරති ගයාසසෙ** යි කියන ලදී.

ජටිල තාපසයෝය. ඔවුන් ජටා දරණ බැවින් ජටිලා යි කියන ලදී.

අනතරථ්‍ය කෙ හිමපාතසමයෙ හේමන්ත ඍතුවට ඇතුලත් නවම් (පෙබරවාරි) මස අවසානයෙහි දින සතරක් හා මැදින් (මාර්තු) මස මුල දින හතරක් යන හිම වැටෙන සමයෙහි ගයාවෙහි **උම්මුජ්ජනහි** දියෙහි ගිලී මතුවෙති. සමහරෙක් තිත්ථි සම්මත වූ එහි ප්‍රථමයෙන් සියලු ශරීරයම දියෙහි ගිල්වා දියෙන් මතු වෙති. නැගිටිති. පිහිනති. **නිම්මුජ්ජනහි** හිස සහිතව දියෙහි ගිලෙති. **උම්මුජ්ජ නිම්මුජ්ජම්පි කරොනහි** නැවත නැවතත් දියෙහි ගිලීම මතුවීම කරති.

එක්වරක් පමණක් දියෙහි ගිලීමෙන් පාප ශුද්ධිය (ආත්ම ශුද්ධිය) වේයයි දෘෂ්ටි ගත් සමහරු එසේ ගිලීම් කොට යති.

ගිලීම මතුවීම අතරෙහි වෙනසක් නැතැයි සමහරු දියෙන් මතුවීමෙන්ම පාපශුද්ධිය මේයයි එක්වරක් පමණක් දියෙන් මතුවී ගිලීමද කර ඉවත්ව යති. සමහරු තීර්ථයෙහි ගිලීමෙන් පමණක්ම පාපශුද්ධිය වේයයි ගිලී හුස්ම ගැනීම හා පිටකිරීම නවත්වා පර්වතයෙන් වැටුනාක් මෙන් ජීවිතක්ෂයට පත්වෙති. **බහුමපි** ඔවුන්ගේ බොහෝ බව දැක්වීම පිණිස දියෙහි ගිලීම පළමුකොට කියන ලදී. **ජටිලාති** බොහෝ බව නිසා කියන ලදී. හිස මුඩුකළ බ්‍රාහ්මණයෝ ද උදක ශුද්ධිය සඳහා වරින්වර එසේ කරති. **ඔසිඤ්චනති** ගයා තීර්ථයෙහි ජලය අතින් ගෙන තමන්ගේ හිසෙහි හා ශරීරයෙහි වත්කර ගනිති. සමහරෙක් කලවලින් වතුර ගෙන ඉවුරෙහි සිට එසේ කරගනිති. **අග්ගිං ජුහනති** සමහරෙක් ගයා ගං ඉවුරෙහි මලුව පිළියෙල කොට දර කෙසෙල් ආදිය පූජාවස්තු ගෙනවුත් ගිනිපූජා කොට යාග කරති. විශේෂයෙන් වඩාත් යාග කරති. ගයා ගං ඉවුරෙහි දියෙහි ගිලීම් ආදියෙන්, ගිනි පූජා කිරීමෙන් පව්මල ශුද්ධියත් පව් අවසන් කිරීමෙන් සංසාර ශුද්ධියම වේ යයි මෙසේ දෘෂ්ටි ගත්තෝය. දියෙහි ගිලීම් ආදිය මෙහි නිදසුනක් වශයෙන් කියන ලදැයි දතයුතුය.

ඔවුන් අතර ජලයෙහි වාසය කරති. සමහරෙක් ජලයට වදිති. සමහරෙක් ඒ ජලයෙහි සිට සඳ හිරු දෙදෙනා නැවත නැවත පැමිණෙතියි දහස්වාරයක් ස්තෝත්‍ර ජපකරති. සමහරෙක් 'දෙවිය එන්න'යි සිහිමුළා වී ජපකරමින් ධ්‍යානෙති. සමහරෙක් ගෞරවයෙන් උපස්ථාන කරති. මෙසේ කරමින් සමහරෙක් එතෙර වෙති. සමහරෙක් එතෙරවී පසුව නැවතත් ගඟට පැමිණෙති. සමහරෙක් දියෙහි සිට වීණා වාදනය කරති. මෙසේ නොයෙක් නොයෙක් විකාර කරමින්ම ජලයෙහි ගිලීම්, මතුවීම් කරති. මෙසේ කලබල පවතින කල්හි පර්වත මුදුනෙහි වැඩසිටි බුදුරජාණන් වහන්සේ ඔවුන්ගේ මහා ඝෝෂාව අසා එය කුමක්දැයි බලන්නාහු එම විකාර ක්‍රියා දුටහ. එබැවින් **අද්දසා බෝ භගවා** -පෙ- ඉමිනා සුද්ධි යි කියන ලදී. **එතමත්ථං විදිත්වා** යනු ජලයට බැසීම් ආදී අශුද්ධි මාර්ගය ශුද්ධි මාර්ගය යි පිළිගැනීම හා ඔවුන්ගේ නොදැනීම නිසා සත්‍ය ආදී ශුද්ධි මාර්ගය අවබෝධ කර නොගැනීම සියලු ආකාරයෙන් දැන **ඉමං උදානං** උදක ශුද්ධියෙන් අශුද්ධ මාර්ගය ඇතිවන බව හා ශුද්ධ මාර්ගය ප්‍රකාශ කිරීමට මෙම උදානය ප්‍රකාශ කෙළේය.

එහි **න උදකෙන සුචිහොති** මෙහි උදකෙන උදකම්මූජජනා යන තන්හි පසුපද ලෝපයෙන් උදකං යි කියන ලදී. රූප භවෝ රූපං යන තැන මෙහි ජලයෙන් පව්මල සෝදා පිරිසිදු වූ සත්ත්වයෙක් නැත. කවර හෙයින් ද **බහ්වෙත්ථ තහායති ජනෝ** යම් ලෙසකින් දියෙහි ගිලීම් මතුවීම් ආදියෙන් කියන ලද පරිදි පාපසුද්ධියක් වේ නම් මව් නැසීම ආදී පාපකර්ම කළ අයද, ගව මීගව ආදීහුද යටත් පිරිසෙයින් මත්ස්‍ය හා කැස්බාවෝද දියෙහි නෑම කරති. ඒ සියලු දෙනාගේම පාපශුද්ධිය විය යුතු නොවේද? එය නොවන්නේය. කවර හෙයින්ද යත්? නෑම කරන්නාගේ පව්වලට විරුද්ධ නොවන බැවිනි. යමක් විනාශ කරන්නේ **නම්** හෙතෙම ඔහුට විරුද්ධ වන්නේය. අන්ධකාරයට ආලෝකයත්, අවිද්‍යාවට විද්‍යාවත් මෙනි. නෑම කරන්නාට පාපය විරුද්ධ නොවේ. එබැවින් ජලයෙන් පිරිසිදු නොවේය යන මෙය පිළිගත යුතුය. යම්ලෙසකින් පිරිසිදු වේ **නම්** එය ප්‍රකාශ කරන්නට **යම්හි සච්චඤ්ච** ආදිය කීයේය. මෙහි **යම්හි** යනු යම් පුද්ගලයකු කෙරෙහි **සච්චනති** වාග් සත්‍යය හා විරති සත්‍යයි. නොහොත් ඥාන සත්‍යය හා පරමාර්ථ සත්‍යයයි. **ධම්මෝ** ආර්යමාර්ග ධර්මය හා ජලධර්මයයි. ඒ සියල්ලම යම් පුද්ගලයෙකු කෙරෙහි පිහිටා **නම් සෝ සුචි සොච බ්‍රාහමණෝ** ඒ ආර්ය පුද්ගලයා විශේෂයෙන් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ. අතිශයින්ම පිරිසිදු වූ හෙතෙම සුචි ච බ්‍රාහ්මණද වන්නේය. කුමක් හෙයින්ද යත් මෙහි සත්‍ය ධර්ම වශයෙන් වෙන් වෙන් කොට අවබෝධ කරගත් බැවිනි. සත්‍යයෙන් බොහෝ උපකාර ඇත්තේය. එබැවින් **'සච්චං හවෙ සාදුතරං' සච්චෙන අපෙ ධම්මෙව ආහු සනෙතා පතිට්ඨිතා' 'සච්චෙ ඨිතා සමණ බ්‍රාහමණා'** ආදී නොයෙක් සූත්‍ර දේශනාවන්ගෙන් සත්‍යගුණ ප්‍රකාශ කරන ලද්දේය. සත්‍ය නො කියන්නා **'එකං ධම්මං අතීතසස මුසාවාදිසස ජනතුතෝ' 'අභූතවාදී නිරයං උපෙති'** ආදී දේශනාවන්ගෙන් විස්තර කරන ලදී.

නව වෙනි සූත්‍ර වර්ණනාව යි.

දසවෙනි සූත්‍ර වර්ණනාව

දසවෙනි සූත්‍රයෙහි බාහියො යනු ඔහුගේ නාමයයි. දාරුචීරියො යනු ලීපොතුවලින් සෑදූ වස්ත්‍රය. සුපාරකෙති එනම් වරාය අසල වසයි. මේ බාහිර කවරක්ද? දාරුචීරිය වූයේ කෙසේද? සුප්පාරක වරායං (පටුනට) කෙසේ පැමිණියේද?

එහි පිළිවෙල කතාව මෙසේය.

මෙයට පෙර කල්ප සිය දහසකට පෙර පදුමුත්තර බුදුරජාණන් වහන්සේ කාලයෙහි හංසවතී නුවර දසබලයන් වහන්සේගේ ධර්මදේශනාව අසන එක් කුලපුත්‍රයෙක් ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් වහා ධර්මය අවබෝධ කරගන්නා භික්ෂූන් අතර අග්‍රස්ථානයෙහි තබන බව දැක, මේ භික්ෂුව මහා වාසනාවන්තයෙකි. යම් භික්ෂුවක් ශාස්තෘන් වහන්සේ විසින් අග්‍ර ස්ථානයෙහි තබනු ලැබේ නම් ඒකාන්තයෙන් මම ද මෙබඳු සම්මා සම්බුදුවරයකුගේ ශාසනයෙහි පැවිදිව ශාස්තෘන් වහන්සේ විසින් මේ සමානව අග්‍රස්ථානයෙහි තැබිය යුත්තෙක් වන්නේ නම් මට වාසනාවන්තයෙක් වන්නෙමියි මේ භික්ෂුව මෙන් ඒ තනතුර පතා එයට සුදුසු වූ බෝධිකාරක කර්ම කොට, දිවි ඇති තෙක් පින් කොට සුගතිගාමීව දිව්‍ය මනුෂ්‍ය ලෝකයන්හි සැරිසරන්නේ කාශ්‍යප බුදුන්ගේ සසුනෙහි පැවිදිව පිරිපුන් සිල් ඇතිව මහණදම් පුරන්නේ ජීවිතක්ෂයට පත්ව දෙව්ලොව උපන්නේය. හෙතෙම බුදුවරු දෙනමක් අතර කාලයක් දෙව්ලොව වසා මේ බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි බාහිය රටේ කුලගෙයක උපන්නේය. බාහිය රටෙහි උපන් බැවින් 'බාහියො'යි ඔහු හැඳින්වූහ. හෙතෙම වයසට පැමිණ වෙළඳම පිණිස බොහෝ බඩුවලින් නැවක් පුරවා මුහුදට පිවිස සත්වරක් නොයෙක් රටවලට ගොස් දියුණුව ලබා තමන්ගේ නගරයට පැමිණියේය.

අටවෙනි වාරයෙහි වනාහි ස්වර්ණභූමියට යන්නෙමියි පුරවන ලද භාණ්ඩ ඇතිව නැව් නැංගේය. නැව මහා සමුද්‍රයෙහි ගිලී තමන් කැමති දේශයට නො පැමිණම මුහුදු මැද බිඳී එහි සිටි මහජනයා මසුන් කැසඹුවන් විසින් කන ලද්දේය.

බාහිය වනාහි නැවෙහි ලෑල්ලක් ගෙන පිහිනන්නේ රළපහර නිසා ටිකෙන් ටික වේගයෙන් පිහිනා සත්වැනි දවසෙහි සුප්පාරක නම් පටුන් පෙදෙසට (වරායට) පැමිණියේය. හෙතෙම ඇඳීමට වස්ත්‍රයක් නැතිව උපන් ස්වරූපයෙන්ම (නිරුවත්ව) සමුද්‍ර තීරයෙහි හොත්තේ වෙහෙස දුරුකොට සුලු සැනසිල්ලක් නැගිට ලජ්ජාවෙන් පඳුරු අතරට පිවිස විලි වසාගෙන ඇඳීමටකිසිවක් නොදැක වරා ඉති කඩා ගස් පට්ටාවලින් වෙලා අඳින වස්ත්‍රයක් මෙන් ඇන්දේය. සමහරු ලී පතුරු විද ගස් පට්ටාවලින් අමුනා අඳින වස්ත්‍රයක් මෙන් කොට ඇන්දේය යි කියති. මෙසේ සියලු කල්හිම ලී පතුරුවලින් සෑදූ වස්ත්‍ර දැරූ හෙයින් දාරුචීරියෝ යි ද පූර්වනාමය වශයෙන් බාහියෝ යිද ප්‍රකට විය. එක් කබලක් අතින් ගෙන සුප්පාරක පටුනෙහි පිඬු පිණිස හැසිරෙන ඔහු දැක මිනිස්සු 'දෙවියන් සහිත ලෝකයෙහි රහත්හු වෙති. මොහුද එවැන්නෙකු විය යුතුයි. කිමෙක්ද, මේ ආර්යයා දෙනු ලබන වස්ත්‍ර ගන්නේද, නැතිනම් අල්පේච්ඡභාවය නිසා නො ගන්නේ ද'යි විමසමින් නොයෙක් දිසාවන්ගෙන් ගෙන අවුත් වස්ත්‍ර පිළිගැන්වූහ. 'ඉදින් මම මේ ආකාරයට නො පැමිණියෙමි නම් මේ අය මා කෙරෙහි නොපහදින්නෝය. මම මේ වස්ත්‍ර ප්‍රතික්ෂේප කොට මේ ආකාරයෙන්ම වාසය කරන්නෙමි නම් මෙසේ මට ලාභ සත්කාර උපදින්නේයයි සිතුවේය. හෙතෙම මෙසේ සිතා කුහක බවෙහි පිහිටා වස්ත්‍ර පිළි නොගත්තේය. මිනිස්සු ආශ්චර්යයෙකි. මේ ආර්යයා ඒකාන්තයෙන් අල්පේච්ඡයෙකි. බෙහෙවින් සතුටට පැමිණ පැහැදුනු සිතින් මහත් වූ සත්කාර සම්මාන කළහ. හෙතෙමේ ද දන් වළඳ නුදුරු තන්හි ඇති දේව ආයතනයකට ගියේය. මහජනයාද ඔහු සමගම ගොස් ඒ දේව ආයතනය සංස්කරණය කොට දුන්නේය. හෙතෙම 'මොවුහු මාගේ ලී පතුරු දැරීම් පමණෙහි පැහැදී මෙසේ විවිධ සත්කාර සම්මාන කරති. මොවුන් මා ඉතා උසස් පිළිවෙතින් සිටිතියි සිතන බැවින් සැහැල්ලු පිරිකර ඇතිව අල්පේච්ඡවම විසුවේය. ඔවුන් විසින් රහත් කෙනෙකැයි පිළිගන්නා බැවින් තමන් රහතෙකැයි සිතුවේය.

මතු මතුත් ඔහුට උපන් සත්කාර බොහෝ විය. මහත් වූ ප්‍රත්‍යලාභය සිදුවිය.

එහෙයින් **තෙන බො පන සමයෙන බාහියො දාරුචීරියො සුපපාරකෙ පටිවසති සමුද්දතීරෙ සක්කතො ගරුකතොති** ආදිය කියන ලදී. එහි **සක්කතො** යනු සකස්ව ආදරයෙන් උපස්ථාන වශයෙන් සත්කාර

කිරීම ගරුකතො යනු විශේෂ ගුණ ඇත්තේ යයි ගරු කිරීම. **මානිතො** යනු සිතින් ශ්‍රද්ධාවෙන් ගරුකිරීම. **පූජිතො** යනු මල්සුවඳ ආදියෙන් පූජා කිරීම. **අප තොති** වෙසෙසින් ප්‍රසන්න සිතින් අග්‍රදාන ආසන පිළියෙල කිරීම් වශයෙන් පූජා කිරීම ලාභිච්වර -පෙ- පරික්ඛාරානං යනු මතු මතුත් පුදන ලබන ප්‍රණීත වූ සිවුරු හා සිවුපසය ලැබීම තවත් විස්තර කිරීමක් ඇත. **සකකතො** සත්කාර කරන ලද්දේ. **ගරුකතො** ගෞරව ලබන්නේ. **මානිතො** බෙහෙවින් ගරු කරනු ලබන්නේ. **පූජිතො** සිවුපසයෙන් පුදන ලද්දේ. **අපචිතො** ගෞරව කරනු ලබන්නේ. ඔවුහු බාහියට මේ සියල්ල කළහ. 'බාහියො දාරුචීරියො සුපපාරකෙ පටිවසති'යි එහෙයින් කියන ලදී. මෙහි සිවුරක් පිළිනොගන්නා හෙතෙම 'ස්වාමීනි, එන්න මේ වස්ත්‍රය පිළිගන්න පිළිගැන්වීමට සිවුරක් ලැබුවේය යි කියන ලද්දේ රහොගතසස රහස්‍යභාවයට ගිය **පටිසලලීනසස** එක් වූ ඔහුට බොහෝ මිනිසුන් විසින් අරහා යයි කියනු ලබන ඔහුට දැන් කියනු ලබන ආකාරයෙන් **චෙතසො පරිවිතකෙකා** උදපාදි සිතෙහි මිථ්‍යා සංකල්පයක් උපන්නේය.

කෙසේද යත් 'ලෝකයෙහි යම් රහත්හු හෝ අර්හත් මාර්ගයට පිළිපන්නෝ වෙත් නම් මමද ඔවුන් අතර එක්තරා කෙනෙකි. යම් කෙනෙක් මේ සත්ත්ව ලෝකයෙහි කෙලෙස් නසන ලද බැවින්ද, පූජාසත්කාර ආදියට සුදුසු වන බැවින්ද, කෙලෙස් නැසීමෙන් අර්හත් මාර්ගයට පිළිපන්නාහු නම් ඔවුන් අතර මම ද එක්තරා එකෙකි යන අදහසයි. **පුරාණ සාලොහිතානි** පෙර භවයෙක ලෙයින් බැඳුනු නෑකම් ඇති එකට මහණදම් කළ දෙවියෙකි. පුරාණ සාලොහිතා යනු පෙර එක් භවයෙක ලෙයින් නෑකම් ඇති මවක වූ එක දෙවියෙකැයි කියති. එම අර්ථ කථාව ප්‍රතික්ෂේප කොට කලින් කියන ලද අදහසම ගත යුතුයි.

පෙර කාශ්‍යප දසබලයන් වහන්සේගේ සාසනයෙහි මහණදම්හින් පසුබැස සිටින සාමණේර ආදීන්ගේ විප්‍රකාරය දැක සංවේගයට පැමිණි භික්ෂූන් සත්දෙනෙක් ශාසනය අතුරුදහන් වන්නට පෙර තමන්ට පිහිටක් කරගන්නෙමු යි **ස්වර්ණ** චෛත්‍යය වැඳ ආරණ්‍යට පිවිස එක් පර්වතයක් දැක 'ජීවිතයට ආශාව ඇත්තෝ නවතිත්වා. ආශාව නැත්තෝ මේ පර්වතයට නගිත්වා'යි කියා ඉනිමගක් බැඳ සියල්ලෝ ඒ පර්වතයට නැග ඉණිමග පහතට හෙලා මහණදම් කළහ. ඔවුන් අතර වැඩිමහල් ස්ථවිර එක් රැයක් ඉක්මෙනවිටම අර්හත් බව ලැබිය. හෙතෙම උතුරුකුරු දිවයිනෙන් පිණ්ඩපාතය ගෙනවුත් 'ඇවැත්නි මෙයින් පිණ්ඩපාතය

වළඳන්නැ'යි කීවේය. ඒ භික්ෂූහු 'ස්වාමීනි, ඔබවහන්සේ තමන්ගේ ආනුභාවෙන් මෙසේ කළාහුය. අපිද ඔබවහන්සේ මෙන් විශේසාධිගමයක් උපදවන්නෙමු. තමන්ම ගෙනවුත් වළඳන්නෙමු යි කැමති නොවූහ. ඉක්බිති දෙවෙනි දිනයෙහි දෙවන ස්ථවිර අනාගාමි ඵලයට පැමිණියේය. හෙතෙමේද එසේම පිණ්ඩපාතය ගෙන එහි ගොස් අනෙක් අයට ආරාධනා කෙළේය. ඔවුහු එසේම ප්‍රතික්ෂේප කළහ. ඔවුන් අතර අර්හත්ඵලයට පත්වූ තැනැත්තා පිරිනිවන්පෑවේය. අනාගාමි වූ තැනැත්තා ශුද්ධාවාස බ්‍රහ්මලෝකයෙහි උපන්නේය. ඉතිරි පස්දෙනා උත්සාහ කළත් විශේෂාධිගමයක් ලබා ගැනීමට නොහැකිවූහ. එයට අපොහොසත් වූ එහිම වැස දෙව්ලොව ඉපිද එක් බුද්ධාන්තර කාලයක් දෙව්ලොව සැරිසරා මේ බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි දෙව්ලොවින් චුතව ඒ ඒ කුලගෙවල්වල උපන්හ. ඔවුන් එක් තැනැත්තෙක් කුමාරකස්සප විය. එකෙක් දබ්බමල්ලපුත්ත විය. එකෙක් සභිය පරිව්‍රාජක විය. එකෙක් බාහිරදාරුචීරිය විය. ඔවුන් අතර යමෙක් අනාගාමි බ්‍රහ්මලෝකයෙහි උපන්නේද ඔහු සඳහා **පුරාණ සාලොහිතා දෙවතා** යි කියන ලදී. දෙවපුත්ත ද දෙවධීතා මෙන් දෙවොළු එව දෙවතා යි කියන ලදී. **අථඛො අඤ්ඤතරා** දෙවතා යි ආදි තැන්වල මෙනි. මෙහි වනාහි බ්‍රහ්මදේවතා අදහස් කරන ලදී.

ඉක්බිති ඒ බ්‍රහ්මයා එහි උපන් මොහොතෙහිම තමාගේ බ්‍රහ්ම සම්පත්තිය දැක පැමිණි තැන විමසන්නේ සත්දෙනා පර්වතයට නැග මහණදම් පිරීමද, ඔවුන් අතර එක් තැනැත්තකු ගේ පිරිනිවන් පෑමද, අනාගාමි ඵලයට පැමිණ තමා එහි උපන් බවද සිහිවිය. හෙතෙම ඉතිරි පස්දෙනා කොහිදැයි ආවර්ජනා කරන්නේ කාමාවචර දෙව්ලොව ඔවුන් උපන් බව දැන මේ කාලයෙහි කුමක් කරත්දැයි විමසන්නේ ඔවුන්ගේ තත්ත්වය දුටුවේය. මේ කාලයෙහි ඔවුන්ගේ තත්ත්වය කෙසේදැයි විමසන්නේ බාහිය සුප්පාරක පටුන ඇසුරු කරමින් දාරුචීරධාරීව කුහකකමින් දිවි ගතකරන බව දැක මොහු මා සමග පෙර ඉණිමගක් බැඳ පර්වතයට නැග මහණදම් කරන්නේ ඉතා සැහැල්ලු පැවතුම්වලින් යුක්තව ජීවිත ආසාව දුරුකර රහතන් වහන්සේ විසින් ගෙනෙන ලද පිණ්ඩපාතය නොවළඳ දැන් ගෞරව බලාපොරොත්තුවෙන් නොලද අර්හත් බවක් ප්‍රකාශකොට ලාභ සත්කාර බලාපොරොත්තුවෙමින් හැසිරෙයි. දසබලයන් වහන්සේ උපන් බව නොදනියි. ඒකාන්තයෙන් මොහු සංවේදී බවට පත්කොට බුදුන් උපන් බව දන්වන්නෙමි යි සිතීය.

එකෙනෙහිම බඹලොවින් බැස රාත්‍රී කාලයෙහි සුප්පාරක පටුනෙහි දාරුචීරියගේ ඉදිරියෙහි පහළ විය. බාහිර තමන්ගේ වසනතැන මහත්වූ ආලෝකය දැක මේ කිමෙක්දැයි පිටතට නික්ම බලන්නේ අහසෙහි සිටි මහා බ්‍රහ්මයකු දැක ඇඳිලි බැඳ ඔබ කවරෙක්දැයි විචාලේය. ඉක්බිති ඔහුට ඒ බ්‍රහ්මයා 'මම ඔබගේ පැරණි යහලුවෙකි. එදා අනාගාමී ඵලයට පැමිණ බඹලොව ඉපදුනෙමි. නුඹ වනාහි කිසියම්ම අධිගමයක් උපදවාගන්නට නොහැකිව පෘථජ්ජනව කලුරිය කොට සැරිසරන්නේ දැන් නිර්ඵල වේසඩාරීව රහත් නොවී අර්හත් යයි ලබ්ධියක් ගෙන හැසිරෙන්නේය යැයි දැන ආවෙමි. බාහිය නුඹ රහතෙක් නොවේ. පාපසහගත ඒ දෘෂ්ඨිය අත්හරින්න. ඔබට බොහෝ කලක් අහිතක් දුකක් නොවේවා. සම්මා සම්බුදුවරයන් වහන්සේ ලොව උපන්හ. ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් වෙති. යන්න ඒ භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කරන්නයි කීයේය.

එහෙයින් අථකො බාහියසස දාරුචීරියසස පුරාණ සාලොහිතා දෙවතා ආදිය එහෙයින් කියන ලදී.

එහි **අනුකම්පිකා** අනුග්‍රහ දැක්වීමට කැමති, අධික කරුණාව ඇති. **අත්ථකාමා** හිත කැමති, අධික මෛත්‍රිය ඇති. ප්‍රථම පදයෙන් බාහියගේ දුක් නැති කිරීමට කැමති බව ඒ දෙවියා විසින් දක්වන ලදී. පදයෙන් හිතවත් උපකාර කිරීමට කැමති බව දක්වයි. **චෙතසා** තමන්ගේ සිතින් **චෙතො පරිවිතකකං** ඔහුගේ සිතෙහි ස්වභාවය. **අඤ්ඤය** දැන. **තෙනුපසංකමි.** බලවත් පුරුෂයෙක් හකුලන ලද අත දික් කරන්නේ යම්සේද, **දික්** කළ අත හකුලන්නේ යම්සේ ද එසේම බඹලොවින් චුතව බාහියගේ ඉදිරියෙහි පෙනී සිටියේය. **යෙ ඛො කෙචිලොකෙ අරහනෙතා** වා ආදිය මිථ්‍යාකල්පනාව ඇති බාහිය බඩුත් සමග සොරකු අල්ලා ගන්නාක් **මෙන් නෙව ඛො තවං බාහිය අරහාති** මෙයින් බාහියගේ අසෙඛභාවය **ප්‍රතික්ෂේප** කරයි. **නපි අරහනතමගගං වා සමාපතෙන** ඔහු ආර්ය නොවන දක්වයි. **සාපි තෙ පටිපදා නතථි යායතවං අරහා වා අසස අරහනතමගග වො සමාපතෙනා ති** මෙයින් ඔහුගේ කල්‍යාණ පෘථජ්ජන භාවය ද **ප්‍රතික්ෂේප** කරයි.

ඉක්බිති බාහිය අහසෙහි සිට කථා කරන මහා බ්‍රහ්මයා දැක 'මම රහත් නොවී රහත් යැයි සිතුවෙමි. මා බරපතල කර්මයක් කරන ලදී. මා

හට අර්හත් මාර්ග ප්‍රතිපදාවක් වත් නැතැයි ඔහු කියයි. ලෝකයෙහි කිසියම් රහත් කෙනෙක් සිටිත්දැයි ඇසුවේය. **ලොකෙ** අවකාශ ලෝකයෙහි සියලු දඹදිව අසවල් තැන අර්හත් කෙනෙක් හෝ අර්හත් මගට පිළිපන් කෙනෙක් හෝ දැන් වාසය කරත් නම් අපි ඔවුන් වෙත පැමිණ ඔවුන්ගේ අවවාදයෙහි පිහිටා සසර දුකින් මිදෙන්නෙමු යි සිතුවේය.

උතතරෙසු සුප්පාරක පටටනෙහි පූර්ව උත්තර දිසා භාගයයි. අරහං කෙලෙස් දුරුකළ බැවින් අරහං නම් වේ. හෙතෙම සියලු කෙලෙසුන් මිදුනේය. මාර්ග ඥානයෙන් වාසනා සහිත කෙලෙස් අරයන් (දැඩි) ඉතිරි නොකොට ආර්ය මාර්ගයෙන් නසන ලද බැවින් විනාස කළ බැවින් අරහං නම් වේ. අවිද්‍යාවෙන් හා භව තෘෂ්ණාවෙන් නිපදවුනු පුඤ්ඤාදි අභිසංඛාර නමැති අරද, ජරා මරණ නමැති නිම්වලල්ල ද, ආස්‍රව සමුදයෙන් නිපන් අලවංගුවෙන් විද ත්‍රිවිධලෝකය නමැති රථයෙහි මැනවින් යොදන ලද බොහෝ කාලයක් පවතින සංසාර චක්‍රය බෝධි මණ්ඩපයෙහි වීර්ය නමැති පාවලින් සීල නමැති පොළවෙහි පිහිටා ශ්‍රද්ධා නමැති හස්තයෙන් කර්මක්ෂය කර ඤාණ නමැති පොරව ගෙන සියලු අර (දැමී) නැසූ බැවින්, විනාස කළ බැවින් අරහං නම් වේ. භාග්‍යවතුන් වහන්සේ වනාහි දෙවියන් සහිත සියලු ලෝකයෙහි අග්‍ර දක්ෂිණාර්හ වන බැවින් මහත් වූ චීවරාදී ප්‍රත්‍යයන් හා විශේෂ පූජා ලැබීමට සුදුසු වූ බැවින් අරහං නම් වෙති. රහසක් නැති බැවින්ද අරහං නම් වෙති. තථාගතයන් වහන්සේ සියළු ආකාරයෙන් විනාස කළ රාගාදි කෙලෙස් ඇති බැවින්ද පාප ක්ලේශයන් පුරුදු නොකරන ලද බැවින්ද රහසින්වත් පව් නොකරන ලද බැවින්ද අරහං යි කියනු ලැබේ. මැනවින් තමන් විසින්ම සියලු ධර්මයන් අවබෝධ කරගත් බැවින් **සම්මා සම්බුද්ධ** නම් වෙති. අවබෝධ කළයුතු ධර්ම අවබෝධ කළ බැවින්ද, විශේෂයෙන් දතයුතු ධර්ම විශේෂයෙන් දත් බැවින් ද පහකළ යුතු ධර්ම පහකළ බැවින් ද, සාක්ෂාත් කළයුතු ධර්ම සාක්ෂාත් කළ බැවින් ද වැඩිය යුතු ධර්ම වැඩීමෙන් අවබෝධ කළ සේක.

අභිඤ්ඤෙයයං අභඤ්ඤාතං
භාවෙ තබබං ච භාවිතං
පහාතබබං පහීණං මෙ
තසමා බුද්ධොසමී බ්‍රාහමණ යි එහෙයින් කියන ලදී.

තවද කුශල ධර්මයෙහි අනවද්‍ය සැප විපාක වශයෙන් ද, අකුශල ධර්මයෙහි සාවද්‍ය දුක් විපාක වශයෙන් ද මෙහි අර්ථය තේරුම්ගත යුතුයි. මෙසේ විපරීත නොවූ ස්වයම්භූ ඥානයෙන් සියලු ආකාරයෙන් සියලු ධර්මයන් මැනවින් අවබෝධ කරගත් බැවින් සම්මා සම්බුද්ධ නම් වෙති. මේ සංක්ෂේප විස්තරයකි. වැඩි විස්තර විශුද්ධි මාර්ගයෙහි සඳහන් වන පරිදි දතයුතුයි.

අරහන්තාය අග්‍රඵල ප්‍රතිලාභය පිණිස. **ධම්මං දෙසෙති** ආදි කල්‍යාණ ආදි ගුණ විශේෂයන්ගෙන් යුක්ත වූ ශීලාදි ප්‍රතිපදා ධර්ම හා සමථ විදර්ශනා ධර්ම භික්මිය යුත්තන්ගේ අදහස අනුව උගන්වති. දේශනා කරති. **සංවේදිතෝ** පින්වත, මට ඒකාන්තයෙන් නින්දා වේවා. පෘථජ්ජභාවයෙන් සිටින මම නොරහත්ව සිටින්නේ අර්හත්යයි සිතිමි. සම්මා සම්බුදුරජුන් ලෝකයෙහි ඉපිද ධර්මය දේශනා කරන බව නොදත්තෙමි. 'මේ ජීවිතය දැනගැනීමට අපහසුය. මරණය දැනගැනීමට අපහසුයයි සංවේගයට පැමිණියේ දේවතාවගේ වචනයෙන් කලකිරීමට පත් මනසක් ඇත්තේය යන අර්ථයි. **තාවදෙව එකෙනෙහිමි. සුප්පාරකා පක්කාමි** බුද්ධ යි වචනය ඇසීමෙන් උපන් බුදුන් අරමුණ ගත් ප්‍රීතියෙන් හා සංවේගයෙන් චෝදනා කරනු ලබන සිත් ඇත්තේ සුප්පාරක පටුනෙන් සැවැත්නුවරට ගියේ **සබ්බඤ්ඤුතඤාණං එකරතති පරිවාසෙන** සියලුම මාර්ගය එක් රැයක් ගතකිරීමෙන් පැමිණියේය. සුප්පාරක පටුනේ සිට සැවැත්නුවරට එක්සිය විසියොදුනක් ඇත. එපමණ වූ මාර්ගය එක් රැයක් ගතකිරීමෙන් ගියේය. යම් කලෙක සුප්පාරක පටුනෙන් නික්මුනේද එදිනම සැවැත්නුවරට පැමිණියේය. මෙතෙම මෙසේ ගියේ කෙසේද දේවතානුභාවයෙන් හා බුද්ධානුභාවයෙන් යි කියති. සියලුමග එක් රැයක් ගත කිරීමෙන් යි කියන ලද බැවින් මාර්ගයෙහි එක්සිය විසි යොදුනක් ඇති බැවින් අතරමග ගම්නියම්ගම් රාජධානිවල ඒ ඒ තැන වාසය කරමින්දෙවෙනි දවසෙහි අරුණ නැගෙනවිට එක් රැයක් ගතවීමෙන් සැවැත් නුවරට පැමිණියේය යන අදහස ප්‍රකාශ වේ. හෙතෙම එක් රැයක් පමණකින් ඒ සියලු මාර්ගයෙහි වාසය කොට දෙවෙනි දවසෙහි පෙරවරු සැවැත්නුවරට පැමිණියේය. භාග්‍යවතුන් වහන්සේද බාහියගේ පැමිණීම දැන පළමුකොටම ඔහුගේ **සද්ධා** ආදී ඉන්ද්‍රියයෝ සුලු කාලයකින් සම්පූර්ණ බවට පත්වෙතියි ඔහුගේ ඉන්ද්‍රියයන් සම්පූර්ණ වනතුරු **මහා භික්ඛු සංඝයා** සමග ඒ වේලාවෙහි සැවැත්නුවර පිඬු පිණිස වැඩියහ. බාහියද අලුයම ආහාර ගෙන කායික වෙහෙස දුරුකර ගැනීමට සිටිනවිට එළිමහනෙහි සක්මන් කරමින් සිටි

බොහෝ භික්ෂූන් දැක 'භාග්‍යවතුන් වහන්සේ දැන් කොහිදැ'යි ඇසුවේය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස සැවැත් නුවරට වැඩිසේකැයි කියා නුඹ කොහි සිට ආවෙහිදැයි ඇසූහ. සුප්පාරක පටුනේ සිට ආවෙමි. දුරසිට ආවෙහිය. හිඳින්න. පළමුකොට පා දොවා වේලා ටික වේලාවක් විවේක ගන්න. ශාස්තෘන් වහන්සේ වැඩම වූ කල්හි දකින්න. ස්වාමිනි, මම මාගේ ජීවිතයට අනතුරක් වේදැයි නොදනිමි. මම එක් රැයකින්ම කිසිම තැනක වැඩි වේලාවක් නොසිට විසියොදුන් සියයක් මග ගෙවා ආවෙමි. ශාස්තෘන් වහන්සේ දැකීමෙන් පසුවම විවේක ගන්නෙමි යි කියා ඉක්මන් ස්වභාව ඇත්තේ සැවැත් නුවරට පිවිස උපමා කළ නොහැකි බුද්ධශ්‍රී සම්පත්තියෙන් හා අලංකාරයෙන් බබලමින් වඩමවන භාග්‍යවතුන් වහන්සේ දුටුවේය.

තෙන බො පන සමයෙන සම්බහුලා භික්ඛූ අබ්භොකාසෙ චංකමන්ති. අථ බො බාහියො දාරුචීරියො යෙන තෙ භික්ඛූ තෙනුපසංකමි යනාදිය එහෙයින් කියන ලදී.

එහි කච්චං යනු කොහිද යන අර්ථයි. නූනි යනු සංශයාර්ථයි. බොති යනු පද පූර්ණාර්ථයි. කවර පෙදෙසකද යන අර්ථ ඇත්තේය. දස්සනකාම මහානි යනු දකිනු කැමැත්තෝ වෙමු. අපි වනාහි ඇස් අන්ධ වූවෙකු මෙන්ද, කන් බිහිරෙකු මෙන් ද, යහපත් වචනයක් කතා කරන්නට නොහැකි ගොලුවෙකු මෙන්ද, අත්පා විකල වූ කෙනෙකු මෙන්ද, දිළින්දකු මෙන්ද, කාන්තාර මගට පිළිපන්නකු මෙන්ද, මහා සමුද්‍රයෙහි බිඳුන නැවක් මහා ඉවුරක් දකින්නකු මෙන්ද බුදුන් වෙත යන්නට කැමැත්තෙමු. තරමානරූපොති යනු ඉක්මන්සුළු බවය. පාසාදිකං යනු දෙතිස්මහා පුරුෂ ලක්ෂණ, අසූ අනුව්‍යඤ්ජන, ව්‍යාමප්‍රභාව, කේතුමාලාලංකාරය, ආදියෙන් සර්වප්‍රකාරයෙන් පහදවන සුළු, ස්වකීය ශ්‍රේෂ්ඨ සොභා සම්පත්තියෙන් රූපකාය බැලීමට කැමති මහජනයාට ප්‍රසාදය උපදවන සුළු, පසාදනීයං යනු දසබල චතුර් වෛශාරද්‍ය ඤාණය, ෂඩ් අසාධාරණ ඤාණ, දහඅටක් වූ ආවේණික ධර්ම ගුණ පටන් අප්‍රමාණ වූ ගුණ සමූහයන්ගෙන් යුක්ත වූ ධර්මකාය සම්පත්තියෙන් මහජනයාට ප්‍රසාදය ඇතිකරවන සුළු, සනතින්ද්‍රියං යනු චක්ෂු ආදී පංචෙන්ද්‍රියන් රාගය පහකොට ඇති ප්‍රසන්න වූ පංචෙන්ද්‍රියෝය. සනතමානසං යනු සවැනි මනස් ඉන්ද්‍රිය සංසුන් කරගත් බැවින් සංසිඳුනා වූ මනසක් ඇති. උත්තම දමථ, සමථ, මනුපපනනංති යනු ලෝකෝත්තර ප්‍රඥා විමුක්තියෙන් හා චේතෝ විමුක්ති

සංඛ්‍යාත උතුම් දැමුනු සංසිඳුනු මනසක් ඇති බවය. **දනතං** යනු සුපරිසුද්ධ කාය සංවරයෙන් හා කුක්කුච්ච අභාවයෙන් කම්පා නොවන සුළු කයින් දැමුනු, ගුත්තං යනු වෙසෙසින් පිරිසිදු වචී සමාචාර ඇති බැවින්ද නිරර්ථක වචන නැති බැවින් ද යන දෙවිධියෙන්ම සංවර වූ. **යතින්ද්‍රියානි** යනු අතිශයින් පිරිසිදු මනස් ඇති, ආර්ය ඉරියව්වලින් යුක්ත වීමෙන් සසංඛාර ධර්මයන් අභාවයට පත්කල බැවින්ද **යතින්ද්‍රියං** නම්. **නාගං** යනු ඡන්ද ආදී වශයෙන් රාගාදී විවිධ කෙලෙසුන් නැවත තමන් වෙත නොපැමිණීම නිසාත්, පුනර්භවයක් නැති නිසාත් නාග නම් වේ. **පාසාදිතං** යනු මෙම ධර්ම කයින් **සනතින්ද්‍රියං** යනු ආදී සියලු ප්‍රමාණයන්ගෙන් බබළයි. එහෙයින් ලෝකයෙහි සියලු සත්ත්වයන්ට භාග්‍යවතුන් වහන්සේගේ තත්වය ප්‍රකාශ කරන ලද්දේ යැයි දතයුතුයි. මෙසේ අතුරු වීථියකට පැමිණ වඩමවන භාග්‍යවතුන් වහන්සේ දැක, මා විසින් සම්මා සම්බුදුරජාණන් වහන්සේ දකිනු ලැබීමෙන් බොහෝ වාසනාව ලැබුවේයැයි සතුටු සිත් ඇත්තේ පස්වනක් ප්‍රීතියෙන් නිරතුරුව සතුටු වූයේ නිශ්චල ඇස් ඇත්තේ දුටුතැන සිට නැමුනා වූ ශරීර ඇතිව භාග්‍යවතුන් වහන්සේගේ ශරීර ප්‍රභාව මැදට පැමිණ එහි ගිලෙමින් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ පසඟ පිහිටුවා වැඳ භාග්‍යවතුන් වහන්සේගේ පා අතගාමින්, ඉඹිමින් ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මට ධර්මය දේශනා කරන්න යැයි කීවේය. 'භගවතො පාදෙ සිරසා නිපතිත්වා, භගවනතං එතදවොච දෙසෙතු මෙ භනෙත භගවා ධම්මං දෙසෙතු සුගතො ධම්මං යං මමසස දීඝරත්තං හිතාය, සුඛාය'යි එහෙයින් කියන ලදී.

දීපංකර පාද මූලයේ පටන් බෝධි මණ්ඩපය දක්වා සමතිංසත් පාරමී ධර්ම සම්පූර්ණ කිරීමෙන්ද, යහපත් ප්‍රතිපත්තීන් ද ඤාණකථා චරියා, ලොකත්ථචරියා, බුද්ධත්ථචරියා යන චරියාවන්ගේ අවසානයට පැමිණ සියලු ලෝකයට හිතසුව පිණිස හැසිරෙමින් ශාස්වත, උච්ඡේදවාදයන් හා කම්සැපද, අත්තකිලමතානුයෝගය යන මේ සියලු අන්තයන් වෙත නොපැමිණ නිරුත්තර වූබොධ්‍යංග භාවනා සංඛ්‍යාත වූ මජ්ඣිමා පටිපදාවෙන් ආර්ය සත්‍ය ධර්මයන් අවබෝධකර ගැනීමෙන් සියලු සත්ත්වයන් කෙරෙහි මහා කරුණාවෙන් ධර්මය දේශනා කළ බැවින් සුගත නම් වේ.

යං මමසස දීඝරත්තං හිතාය සුඛායාති යමක් මට බොහෝ කාලයක් හිතපිණිස පවතින්නේය. **අකාලො බො තාව භාහියානි** යනු ධර්ම දේශනාව

පිණිස මේ කාලය නොවේ. කිමෙක්ද? භාග්‍යවතුන් වහන්සේගේ සියලු සතුන් කෙරෙහි හිතවත් ප්‍රතිපත්තියෙන් අකාලය යැයි යමක් ඇද්ද? යම්ලෙසකින් භාග්‍යවතුන් වහන්සේ කාලවාදී කියනු ලැබේද මෙහි කාලය නම් හික්මිය යුතු පුද්ගලයන්ගේ ඉන්ද්‍රියයන් මුහුකුරා ගිය කාලය අදහස් කරයි. යම්ලෙසකින් එකල්හි භාභියට තමන්ගේ ඉඳුරන් මුහුකුරා ගියා බව දැකීමට නොහැකි බැවින් භාග්‍යවතුන් වහන්සේ එය නොකියා, ඇතුල් විථියෙහි සිටි බව ප්‍රකාශ කරමින් කීයෝය. **ජීවිතනන්තරායාති** යනු ජීවිතයට අන්තරායකර ධර්ම තිබේද? නැත්තේදැයි කියනු කැමැත්තේ සම්භව වශයෙන් ජීවිත අන්තරාය යැයි කීහ. එසේම නොයෙක් හේතූන් නිසා ජීවිතයට විවිධ අනතුරු සිද්ධවන බවය.

අජ්ජේව කිච්චං ආතපපං
කෝ ජඤ්ඤා මරණං සුවෙ
නහි නෝ සාගරනෙතන
මහාසෙනෙන මච්චුනා

කළයුත්ත අදම කළයුතුයි. මරණය හෙට වේයැයි කවරෙක් දන්නේද? අපට මහාසේන නම් මාරයා සමග අල්ලස් දීමෙන් ගැලවීමක් නැත.

කුමක් හෙයින් මොහුට ප්‍රථමයෙන් ජීවිත අනතුරක් වන්නේද? නො නිමි දක්ෂතා ඇති බැවිනි. සමහරු තවත් දෙවියකුගෙන් ජීවිතයට අනතුරක් ඇති බව ඇසූ බැවිනැයි කියති. අවසාන භව උත්පත්තිය නිසා ඔහුගේ හේතු සම්පත් ප්‍රකාශ කිරීම සඳහා මෙසේ ප්‍රකාශ කළ බව කියති. නොපැමිණි අර්හත් බව ඇති ඔවුන්ගේ ජීවිත ක්ෂය නොවේ. භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කරන්නට කැමැත්ත තියෙද්දීත් දෙවරක් ප්‍රතික්ෂේප කෙළේ කුමක් නිසාද? මා දුටු මොහොතේ සිට මොහුගේ මුළු සිරුර නිරතුරුවම ප්‍රීතියෙන් පිරී ගියේ බලවත් ප්‍රීති වේගයක් ඇතිවිය. එබැවින් ධර්මය අසා ධර්මය අවබෝධ කරගන්නට නොහැකි වන්නේය. ඔහු මැදහත් බවට පත්වනතුරු සිටීවා. විසියොදුන් සියයක් මග ගෙවා පැමිණි බැවින් ඔහුගේ කයෙහි බලවත් වෙහෙසක් ඇත. එබැවින් හෙතෙම එම වෙහෙස සංසිඳවා ගනීවා යි දෙවරක් ප්‍රතික්ෂේප කෙළේය. සමහරු ධර්මශ්‍රවණයෙහි ඇලීම ඇති කිරීම සඳහා මෙසේ කළහයි කියති. තුන්වැනි වර ආරාධනා කරන ලද්දේ ඔහුගේ මැදහත් බවත්, වෙහෙස සන්සිඳුණු

බවත් ඇති ඔහුට ජීවිත අනතුරක් දැක දැන් ධර්මය දේශනා කිරීමට කාලයයි සිතා **තසමානිහ** ආදියෙන් ධර්මදේශනාව ආරම්භ කළහ. යම්හෙයකින් උත්සාහවත් ව බෙහෙවින් මට ආරාධනා කෙළේය. ජීවිත අනතුරක් ඇති බව නොදැන එසේ කියයි. ඔහු ඉන්ද්‍රියයෝ ද මුහුකුරා ගොස් ඇත. එහෙයිනි **නිහ** යනු නිපාතයකි. **එවං** මෙසේ කියන ලද ආකාරයෙන්. **සිකඛිතබ්බං** අධිශීල ශික්ෂා ආදී ත්‍රිවිධ ශික්ෂාවන්ගෙන් හික්මීම කළයුතුයි ප්‍රකාශ කරමින් **දිට්ඨෙ දිට්ඨමත්තං හවිස්සති** ආදිය ප්‍රකාශ කළහ.

එහි **දිට්ඨෙ දිට්ඨමත්තං** යනු රූපායතනයන් දැනගන්නා සිතින් (**චක්ඛු විඤ්ඤාණයෙන්**) දැකීම් පමණෙකි. යම් සේ චක්ඛුද්වාරික **විඤ්ඤාණයෙන්** මාගේ දැකීම් පමණක් වන්නේය යි හික්මිය යුතුය. හෙවත් දැකීමෙහි දැකීම පමණක්ම චක්ඛුවිඤ්ඤාණයෙන් දැනගන්නේය. **මත්තං** යනු ප්‍රමාණයයි. චක්ඛු විඤ්ඤාණයෙන් පමණක්ම හිත පවතින්නේය යන අර්ථයි. යම්සේ තමාට පෙනුණු රූපයෙහි චක්ඛු විඤ්ඤාණය නොඇලෙයි. නොගැටෙයි. (දොම්නස් සහගත වෙයි) මුලා නොවෙයි. මෙසේ රාගාදිය නැති චක්ඛු විඤ්ඤාණය පමණකින් ජවන්සිත් වන්නේය. හෙවත් දකිනලද්ද නම් චක්ඛු විඤ්ඤාණයෙන් දකින ලද රූපයයි. එසේම උපන් සම්පටිච්ඡණ සන්තීරණ වොා යන සිත් තුන යම්ලෙසකින් නොඇලේද, දොම්නස් නොවේද (නො ගැටේද) මුලා නොවේදැයි තමන්ට පෙනෙන සම්පටිච්ඡන ආදි සිත්වලින් ජවන් සිත් උපදවන්නෙම් නම් මම ඒ ප්‍රමාණය ඉක්මවා ඇලීම් ආදිය උපදින්නට ඉඩ නොදෙන්නෙමි යි යන අර්ථය. සුත මුත දෙකෙහි ද මේ ක්‍රමයයි. **මුත** යනු එය අරමුණු කරගත් විඤ්ඤාණය සමග ගතධරස පොටඨබ්බ යන ආයතනයෙන් දතයුතුයි.

විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං යන මෙහි විඤ්ඤාත නම් මනෝද්වාරා ආවර්ජනයෙන් දැනගන්නා ලද ආරම්මණයයි. එබැවින් **විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං** යනු මේ ආවර්ජනයෙන් නො ඇලේ ද, නො ගැටේද, මුලා නොවේද මෙසේ ඒවා උපදින්නට නොදී ආවර්ජනා මාත්‍රයෙන් සිත තබාගන්නෙමි යි යන අර්ථයි. **එවං හි තෙ බාහිය සිකඛිතබ්බං** මෙසේ මේ ප්‍රතිපදාවෙන් ත්‍රිවිධ ශික්ෂාවන් අනුපිළිවෙළින් හික්මිය යුතුය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ බාහියගේ සිතෙහි කැමැත්ත පරිදි විඤ්ඤාණකාය සය සමග ආරම්මණ වශයෙන් බෙදුණු විදර්ශනා විෂයෙහි දිට්ඨ ආදී

කොටස් සතර බෙදා එහි වෙසෙසින් දැනගැනීම් සංඛ්‍යාත තීරණ පරිඥාව දක්වති. කෙසේද? මෙහි රූපායතනය දක්නා ලද බැවින් දිට්ඨ නම් වේ. චක්ඛු විඤ්ඤාණය ද්වාර විඤ්ඤාණයත් සමග දක්නා ලද බැවිනි. ඒ දෙකම පැමිණි කල්හි තත්වූ පරිදි මෙහි කරන්නෙක් හෝ කරවන්නෙක් නැත. යමක් ඇතිවී නැතිවේ නම් එය අනිත්‍යයයි. ඉපදීමෙන් හා විනාශ වීමෙන් ඇතිවන පීඩාව දුක්ඛයයි. තමා යටතෙහි නො පැවතීම අනාත්මයයි. එහි පණ්ඩිතයකුට ඇලීම් ආදිය කොහිද? යන අර්ථ මෙයින් අදහස් කෙරේ. දැන් අසන ලද ඤාණ තීරණයන්හි පිහිටි ඔහුට පසුව පහාණ පරිඤ්ඤාව දැක්වීමට **යතොඛො තෙ බාහිය** ආදිය කියන ලදී. එහි යතො යම්කලෙක, එහෙයින් **තෙ** නුඹගේ. **තෙන** දිට්ඨාපටිබද්ධ වූ රාගාදි කෙලෙස්වලින් මෙය කියන ලදී. බාහිය යම්කලෙක යම් කරුණක් නිසා දිට්ඨ ආදියෙහි මා කියන ලද පරිදි පිළිපදින ඔබට වැරදි අවබෝධය නිසා දැකීම් පමණක්ම වන්නේ ද එකල්හි එම කාරණයෙන්ම දැකීම් පමණකින් රාගාදිය ප්‍රහාන වන්නේය. ඇලීමක් හෝ දොම්නස් සහගත වීමක් හෝ මුලාවක් හෝ නොවන්නේය. **තතො ත්වං බාහිය නතත්‍ථ** යම්කලෙක නුඹ ඒ රාගයෙන් ඇලුනේ, **ද්වේෂයෙන් දූෂ්‍ය** වූයේ මෝහයෙන් මුලා වූයේ නොවන්නෙහි ද එකල්හි නුඹ දිට්ඨ ආදිය නො ගන්නෙහිය. එම දිට්ඨ සුත මුත විඤ්ඤාත යන අවස්ථාවන්හි 'එය මාගේය. ඒ මම වෙමි. මෙය මාගේ ආත්මයයි. තණ්හා මාන දිට්ඨීන්ගෙන් ඇලුනෙක් නො වන්නේය. මෙ පමණකින් ප්‍රහාණ පරිඥාව මුදුන් පමුණුවා **ක්ෂීණාශ්‍රව** භූමිය දක්වන ලද්දේය. **තතො ත්වං බාහිය නෙවිධ න හුරං න උභය** මනතරෙන යම්කලෙක නුඹ ඒ රාගාදියෙන් පටිබද්ධ නො වන්නෙහි ද එකල්හි නුඹ මෙලොව පරලොව දෙක්හි නොම උපදින්නෙහිය. **එසවනෙතා දුක්ඛස්ස** යනු කෙලෙස් දුකෙහි හා සසර දුකෙහි අවසාන අවස්ථාවයි. යම් කෙනෙක් 'උභයමනතරෙන' යන පදය ගෙන අන්තරා භවය අනුමත කරති. එය ඔවුන්ගේ මිථ්‍යාවයි. අන්තරා භවයක් ඇතිවීම අභිධර්මයෙහි ප්‍රතික්ෂේප කරන ලද්දේමය. අන්තරා යන වචනය කල්පනා කිරීමක් පමණකි. මෙලොව පරලොව අතර අන් ස්වරූපයක් නැත. යම්කෙනෙක් අන්තරාපරිනිබ්බායි සම්භවෙසි යන මේ සූත්‍ර පදයන්ගේ අර්ථය නුනුවණින් ගෙන අන්තරා භවයක් ඇතැයි කියති. යම්ලෙසකින් අවිහ ආදි ඒ ඒ බ්‍රහ්මලෝකයන්හි ආයු ප්‍රමාණය නො ඉක්මවා ඒ අතර අර්හත්මාර්ගය අවබෝධ කරගැනීමෙන්, කෙලෙස් නැසීමෙන් පිරිනිවන් පාන්නේය යනු අන්තරාපරිනිබ්බායි නම් වේ. ඉපදීමක් සොයත්නුයි

සම්භවෙසි නම් වේ. ප්‍රහීණ නොකළ භව සංයෝජන ඇති බැවින් ශෛක්ෂයෝ ද, පෘථජ්ජනයෝ ද, සම්භවෙසි නම් වෙති. අණ්ඩජ ජලාබුජ සත්ත්වයෝ යම්තාක් කාලයක් අණ්ඩකෝෂය හා වස්තිකෝෂය නොබිඳ, සිටිත් ද ඒ තාක් සම්භවෙසි නම් වෙති. පළමුකොට සම්භවෙසී නම් වූ ඔවුහු අණ්ඩකෝෂයෙන් හා වස්තිකෝෂයෙන් පිටතට නික්මෙත්ද ඔවුහු භූත නම් වෙති. සංසේදජ, ඕපපාතික සත්ත්වයෝ ප්‍රථම චිත්ත ක්‍ෂණයෙහි සම්භවෙසි නම් වෙති. **ද්විතීය** චිත්ත ක්‍ෂණයෙහි පටන් භූත නම් වෙති. යම් ඉරියව්වකින් උපදිත් ද, අන් ඉරියව්වකට පැමිණෙනතුරු සම්භවෙසී නම් වේ. ඉක්බිති භූතයෝ නම් වෙති. එබැවින් නැතැයි ප්‍රතික්‍ෂෙප කළ යුතුය.

ඉධ යනු කාම භවයයි. **හුරං** යනු අරූප භවයයි. මේ දෙක අතර රූපභවය කියන ලදී. සමහරු **ඉධ** යනු **අජ්ඣත්තික** ආයතන ද **හුරං** යනු බාහිර ආයතනද කියති. ඒ දෙක අතර චිත්ත චෛතසිකයෝය. ඉධ යනු ප්‍රත්‍ය ධර්මයෝය. **හුරං** යනු ප්‍රත්‍යය උප්පන්න ධර්මයෝය. (හේතු ධර්මයෝය) ඒ දෙක අතර ප්‍රඥප්ති ධර්මයෝ යයි කියති. ඒ සියල්ල අර්ථකථාවන්හි නැත. මෙසේ පළමුකොට 'දිට්ඨෙ දිට්ඨමත්තං භවිසසති' ආදියෙන් දිට්ඨ ආදි වශයෙන් සිවු වැදෑරුම් තෙතුභූමික ධර්මයෝ අදහස් කරති. එහි සුබ නිත්‍ය **අනත්ත** හපරිවජ්ජන වශයෙන් දුක්ඛ අනිත්‍ය අනත්ත විදර්ශනා කියන ලදී. අවම වශයෙන් විසුද්ධීන් සමග සංක්‍ෂේපයෙන් විපස්සනාව කියන ලද්දිය. **තතො තවං බාහිය න තෙන** මෙයින් රාගාදීන්ගේ සමුච්ඡේද සංඛ්‍යාත අර්හත් මාර්ගයයි. **තතො තවං බාහිය න තත්‍රා** මෙයින් අර්හත් ඵලය ප්‍රකාශ කරයි. **නෙ විඤාති** ආදියෙන් අනුපා නිර්වාණ ධාතුව කියන ලදැයි දතයුතුයි.

එහෙයින් කියන ලදී. අථකො බාහියසස -පෙ- **ආසවෙහි චිත්තං විමුචචති** යි. මේ සංක්‍ෂිප්ත පද සහිත දේශනාවෙන්, **තාවදෙව** ඒ මොහොතෙහිම, **අනුපාදය** නොගෙන **ආසවෙහි** භවාග්‍රය දක්වා පවත්නා බැවින් බොහෝ කාලයක් පල්වීම නිසා සුරා ආසව හා සමානවන බැවින් ආසව යන නම් ලැබූ කාම රාග ආදියෙන් **විමුචචි** සමුච්ඡේද විමුක්තියෙන් හා පටිපසසද්ධි විමුක්තියෙන් මිදුනේය. අත්හැරියේය. හෙතෙම ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසමින් මෙසේ සිල් පවිත්‍ර කරගෙන සුදුසු පරිදි ලැබූ චිත්ත සමාධිය නිසා විදර්ශනාව වඩා වහා ධර්මය අවබෝධ

කරගෙන එකෙණෙහිම සියලු ආස්‍රවයන් විනාශ කොට සිවුපිළිසිඹියා, නුවණ සමග අර්හත් මාර්ගයට පැමිණියේය. හෙතෙම සංසාර ස්‍රොතය විනාශකොට සසරගමන අවසන් කෙළේ අවසාන දේහධාරීව එකුන් විසිවැදෑරුම් ප්‍රත්‍යවෙක්ෂාව නමැති ධර්මයෙන් උනන්දු කරනු ලබන්නේ භාග්‍යවතුන් වහන්සේගෙන් පැවිද්ද ඉල්වීය. භාග්‍යවතුන් වහන්සේ 'නුඹගේ පාසිවුරු සම්පූර්ණදැ'යි විමසූවිට සම්පූර්ණ නැතැයි හෙතෙම කීයේය. එවිට එසේ නම් පාසිවුරු සොයාගන්නැයි කියා භාග්‍යවතුන් වහන්සේ වැඩි සේක. අථ ඛො භගවා පෙ- පකකාමී යි එහෙයින් කියන ලදී.

හෙතෙම වනාහි කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි අවුරුදු විසිදහසක් මහණදම් පුරන්නේ හික්ෂුව විසින් තමන් ලබන සිවුපසය සුදුසු පරිදි කිසිවකුටත් දන් නොදී තමා පමණක් පරිභෝග කිරීම සුදුසුයයි එකම හික්ෂුවකටවත් පාත්‍රයෙකින් හෝ සිවුරකින් සංග්‍රහ නො කෙළේය. එය හේතුකොට ගෙන ඔහුට ඒහි හික්ෂු උපසම්පදාව ලැබීමට වාසනාවක් නොවීය. සමහරු 'හෙතෙම පෙර බුද්ධ ශූන්‍ය ලෝකයෙහි සොරෙක්ව ඉපිද දුනුකලාප සකස්කර ගෙන වනයෙහි සොරකම් කරන්නේ එක් පසේබුදුවරයකු දැක පාසිවුරු ලෝභයෙන් ඒ පසේබුදුරදුට ඊයෙන් විද පාසිවුරු ගත්තේය. එය හේතුකොටගෙන ඔහුට ඍද්ධියෙන් පාසිවුරු නො ලැබුනේ යයි කියති. ශාස්තෘන් වහන්සේ එය දැන ඒහිහික්ෂු භාවයෙන් පැවිද්ද නුදුන්හ. පාසිවුරු සෙවීමට යන ඔහුට එක් දෙනක් වේගයෙන් කඩා පැන පහරදී ජීවිතක්ෂයට පත් කළාය. එය මෙසේ කියන ලදී. අථ ඛො අචිරපකකනතස්ස භගවතො බාහියං දාරුචීරියං ගාවි තරුණවච්ඡා අධිපතිඛා ජීවිතා වොරොපෙසි එහි **අචිරපකකනතස්ස** භාග්‍යවතුන් වහන්සේ වැඩමවා සුලු වේලාවකින් **අධිපතිඛා** යටත් කරගෙන **ජීවිතා** වොරොපෙසි පෙර ආත්මභාවයක ලද ඝාතනය නිසා දුටු මොහොතෙහිම වෛර සිත උපදවා අගින් පහරදී මරණයට පත්කළාය.

ශාස්තෘන් වහන්සේ පිඬු පිණිස හැසිර දන් වළඳ බොහෝ හික්ෂූන් සමග නුවරින් නික්ම බාහියගේ ශරීරය කුණුගොඩකතිබෙනු දැක හික්ෂූන් අමතා 'මහණෙනි, එක් ගෙදරකින් ඇඳක් ගෙන්වාගෙන මේ ශරීරය නුවරින් බැහැරකොට දවා ස්තූපයක් කරන්න'යි හික්ෂූන්ට නියම කළ සේක. හික්ෂූහු එසේ කළහ. ඉක්බිති විහාරයට ගොස් ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ තමන් කළ කාර්යය දන්වා ඔහුගේ පරලොව ගැන විමසූහ.

භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට බාහිය පිරිනිවන්පෑ බව ප්‍රකාශ කෙළේය. භික්ෂූහු 'ස්වාමීනි, ඔබවහන්සේ බාහියදාරුචීරිය අර්හත් බවට පැමිණියේ යයි කියන්නාහුය. හෙතෙම කවදා අර්හත් බවට පත්වූයේදැ'යි ඇසූහ. 'මාගේ ධර්මය ඇසූ කල්හිය'යි කී කල්හි 'ඔබවහන්සේ කවදා ඔහුට ධර්මය දේශනා කරන ලද්දේ ද'යි ඇසූහ.

පිඬු පිණිස හැසිරුණු අදම ඇතුල් වීථියකදීය. 'අප්‍රමත්ත වූ හෙතෙම ස්වාමීනි, ඔබවහන්සේ ඇතුල් වීථියක සිට දේශනා කරන ලද ධර්මය අසා ඒ මොහොතෙහිම අර්හත්ඵලය ලබාගත්තේය කීහ. මහණෙනි කිමෙක්ද? මාගේ ධර්මය ස්වල්ප වේද, බොහෝ වේදැයි කල්පනා කරවිද? අනර්ථ සහිත වූ බොහෝ ගාථා දහසක් වේද ඒවා උතුම් නොවේ. අර්ථ නිශ්‍රිත වූ එකම ගාථා පදයක් වේ නම් එය උතුම් බව ප්‍රකාශ කරමින්

'සහස්සමපි චෙ ගාථා අනත්ථපද සංහිතා
එකං ගාථා පදං සෙය්‍යෝ - යං සුත්වා උපසම්මති'

ධර්මපදයෙහි සඳහන් මේ ගාථාව දේශනාකොට හුදෙක් පිරිනිවන්පෑමෙන් පමණක් නොව මහණෙනි, වහා ධර්මය අවබෝධ කරගන්නා මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර මේ බාහිය අග්‍ර වේ යයි අග්‍රස්ථානයෙහි තැබූහ.

අථඛෝ භගවා සාවත්ථියං පිණ්ඩාය චරිත්වා -පෙ- **පරිනිබ්බුතෝ හිකඛවෙ බාහියෝ දාරුචීරියොති**, ඒ සඳහා මෙසේ කියන ලදී. එහි **පච්චාහතතං** යනු දන් වැළඳීමෙන් පසු පිණ්ඩපාතය සෙවීමෙන් වැලකුණි. පද දෙකින්ම කරන ලද ආහාරකිස ඇත්තේයැයි කියන ලදී. **නීහරිත්වා** යනු නුවරින් බැහැරගෙන ගොස් **ඣාපෙථ** යනු ගිනි දල්වව්. ධූපඤ්ඣසස කරොථ යනු මේ බාහියගේ ශරීරධාතූන් ගෙන චෛත්‍යයක්ද කරව්. එයට හේතු මෙසේ කීය. **සබ්‍රහ්මචාරීවො හිකඛවෙ කාලකතො** මහණෙනි, ඔබලාගේ සබ්‍රහ්මචාරීවරයෙක් කළුරිය කළේය. එහි අර්ථය මෙසේය. නුඹලා ශ්‍රේෂ්ඨ සංඛ්‍යාත උතුම් අධිශීල ආදී ප්‍රතිපත්ති ධර්මයක් මෙලොවදීම අවබෝධ කරගත්තේ ද, නුඹලා විසින්ද ඒ හා සමාන උතුම් බ්‍රහ්මචරියාවෙහි හැසිරිය යුතුය. එබැවින් ඔහු ඇදක තබා බැහැර කරව්, ස්ථූපයක්ද කරව්. 'තසස කා ගති' යනු ඔහුගේ නැවත ඉපදීම කෙසේද? පස්වැදෑරුම් ගති

අතර ඔහුගේ ගතිය කුමක්ද? 'ගති' යනු උප්පත්තියයි. ආර්ය පෘථග්ජනයාගේ ගති තුනක් නිමාවිය යනු අර්ථයි. **අභිසම්පරායොති** යනු පරලොව භව උප්පත්තියයි. යම්ලෙසකින් ඔහුට ශ්‍රේෂ්ඨ කාරණයක් නැත්තේද පිරිනිවීම දක්වා ප්‍රකාශකරන ලද්දේය. යම් භික්ෂූහු එපමණකින් බාහියගේ අර්හත් බව නොදන්නා බැවින් ඒ භික්ෂූහු බාහියගේ ගතිය කවරක්දැයි විමසූහ. ප්‍රකට කරගැනීම සඳහා භාග්‍යවතුන් වහන්සේගෙන් විමසූහ. 'පණ්ඩිතොති' යනු රහත් බව අවබෝධ කරගත් බැවිනි. **සත්‍යවාදී** බවට ඔහු පිළිපන්නේය. 'ධම්මසසාති' ලෝකෝත්තර ධර්මයට **අනුධම්මනති** යනු සීල විසුද්ධාදි ප්‍රතිපදා ධර්මයයි. හෙවත් **ධම්මසසාති** නිර්වාණය ධර්මයට අනුරූප වූ ආර්යමාර්ග ඵල ධර්මයයි. **පරිනිබ්බුතො හිකඛවෙ** බාහියො දාරුචීරියොති යනු මේ බාහිය තෙරුන් අනුපාධිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවුණ බව, පිරිනිවන්පෑ කෂීණාශ්‍රවයන්ගේ ගතිය පෘථග්ජනයන් විසින් අවබෝධ කළ නොහැකි බව සියලු ආකාරයෙන් දැන, ඉමං උදානං මේ උදානය ප්‍රකාශ කළ සේක.

තත්‍ර යනු එම නිර්වාණ ධාතුවෙහි, යම් නිර්වාණධාතුවක ආපෝ ධාතුව, පෘථිවි ධාතුව, තේජෝ ධාතුව, වායෝ ධාතුව යන සතරමහා භූතයෝ නොපිහිටත්ද එහි තාරකාවෝ නොදිලෙත්ද, සූර්යා චන්ද්‍රයා ද නොදිලේද, එහි අන්ධකාරය නැත්තේද, එම නිවන මෞණ නම් වූ චතුරාර්ය සත්‍ය අවබෝධයෙන් අර්හත් මාර්ග ඥානය යම්කලෙක තමාම නිර්වාණය අවබෝධ කළේද එකල්හි රූප ලෝක ප්‍රතිසන්ධියෙන් ද, අරූපලෝක ප්‍රතිසන්ධියෙන් ද සුවදුක් සංඛ්‍යාත කාමලෝක ප්‍රතිසන්ධියෙන්ද මිදෙන්නේය. මෙසේ සියලු සසර දුකින් ඒකාන්තයෙන්ම මිදේයැයි දේශනා කළ භාග්‍යවතුන් වහන්සේ මාගේ පුත්‍ර වූ බාහියට මෙබඳු වූ නිර්වාණ ගතිය ලැබුනේයැයි ප්‍රකාශ කළ සේක.

දසවෙනි සූත්‍ර වර්ණනාව යි.

බෝධිවග්ග වර්ණනාව නිමියේ ය.

2. මුචලින්ද වග්ගය

2-1

මුචලින්ද වග්ගයේ ප්‍රථම සූත්‍රයෙහි **මුචලින්ද** මූලේ මෙහි මුචලින්ද නම් මිදෙල්ල ගසය. එය නිවුලයිද කියනු ලැබේ. ඒ ගස සමීපයෙහි, සමහරු මුචලයිද කියනු ලැබේ. එය වනයෙහි ජ්‍යෙෂ්ඨ ගසක් බැවින් මුචලින්ද වූයේ යැයි කියනු ලැබේ. **මහා අකාලමෙඝො** යනු වර්ෂා කාලය නොපැමිණි කල්හි ඇතිවුන මහා වර්ෂාවකි. එය ගිම්හාන ඍතුවෙහි අවසාන මාසයෙහි මුලු සක්වලම පුරමින් හටගත්තේය. **සත්තා භවදළිකා** යනු එය උපන්කල්හි හත් දවසක් නොකඩවා වැසි වැටුණේය. ඒ වර්ෂාවද ජලය හා මිශ්‍ර වූ ශීතල වාතයෙන් යුක්ත වූයේය. මුචලින්ද නම් නාරජු, එම ගස සමීපයේ පොකුණෙහි යට නාග භවනයක් ඇත. එහි උපන් මහානුභාව සම්පන්න නාගරාජයෙකි. **සකභවනාති** තමන්ගේ නාග භවනයෙන් **සත්තකඛත්තුංභොගෙහි පරිකඛිපිත්වා** යනු සත්වරක් තමාගේ ශරීරයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය වටකොට **උපරි මුද්ධනි මහන්තං ඵණං විභවව** යනු හිස මුදුනෙහි පෙණය තබා, භාග්‍යවතුන් වහන්සේගේ හිස මුදුන් පෙදෙසට මත්තෙහි තමන්ගේ මහත් වූ පෙණය දිගහැර තබා. **ඵණං කරිත්වා** යිද පාඨයක් ඇත. එයද ඉහත කී අර්ථයමය. භාග්‍යවතුන් වහන්සේ මාගේ භවන සමීපයෙහි ගසක් මුල වැඩවසති. දැන් හත් දවසක් වසින වැස්ස ඇත. එබැවින් බුදුරදුනට වාසයට සුදුසු ස්ථානයක් ලැබුනොත් යහපතැයි ඒ නාගරාජයාට අදහස ඇතිවිය. ඔහුට සත්රුවන්වලින් තැනූ ප්‍රාසාදයක් නිර්මාණය කරන්නට හැකි වූයේ නමුත් එසේ කළ කල්හි සිරුරෙන් ගතයුතු ප්‍රයෝජනය නොගත්තේ වන්නේය. දසබලයන් වහන්සේට කයින් වතාවතක් කරන්නෙමි යි මහත් වූ ශරීරයක් මවාගෙන ශාස්තෘන් වහන්සේ හත්වරක් දරණින් වටකොට හිසමත පෙණය තබා සිටියේය. දරණ ඇතුලත ලෝහමහා ප්‍රාසාදයක බඩු ගබඩාවක් පමණ විය යි අනධිඨ කථාවෙහි කියන ලදී. ශාස්තෘන් වහන්සේ කැමති කැමති ඉරියව්වකින් වාසය කරත්වා යනු නා රජුගේ අදහස විය. භාග්‍යවතුන් වහන්සේ හිඳගෙනම සත්දවස ගතකළහ.

මා භගවනතං සීතං භාග්‍යවතුන් වහන්සේට සීතලක් නොවේවා. හෙතෙම සීතද, උෂ්ණයද, මැසිමදුරුවන්ගෙන් වන හිරිහැර ද වැලැක්වීම සඳහා එසේ කෙළේය. සත් දවසක් වැසි වසිනවිට උෂ්ණයක් නැත.

එහෙත් වරින්වර වැස්ස නවතිනවිට උෂ්ණය ඇතිවන්නේය. එවිට උෂ්ණය නොවේවායි අදහස් කළ බව සිතිය යුතුය යි සමහරු කියති. **විදධං** විනාස වූ වැසි වලා දුරුවූයේය යන අර්ථයි. **විගතවලාහකං** පහවූ වැසිවලාවන්. දෙව අහස, **විදිත්වා** දැන් සීත ආදී උවදුරු නැතැයි දැන. **විනිවෙඨෙත්වා** පහව ගොස් **සකවණ්ණං** තමන්ගේ නාගරූපය. **පටිසංහරිත්වා** අතුරුදහන්කොට **මානවක වණ්ණං** කුමාර රූපය, **එතමත්ථං** මේ කාරණය සියලු ආකාරයෙන් දැන **ඉමං උදානං** මෙම විවේක සුවයේ උසස් බව ප්‍රකාශ කරන උදානය පහළ කළ සේක.

තත්‍ර සුඛෝ විවෙකෝ නිර්වාණ සංඛ්‍යාත උපධි විවේකය සැපය, තුටිඅසස සතර මාර්ගඥානයෙන් සතුටු වූ සුතධම්මස්ස ප්‍රකාශ කරන ලද නිවන් දහම් ඇති. **පස්සතෝ** ඒ විවේකය තමන්ගේ වීර්යයෙන් ලබාගත් නුවණැසින් බලන්නහුට. **අබ්‍යාපජ්ජං නෝ** - කිපෙන ස්වභාවය මෙයින් මෛත්‍රී පූර්වභාගය දක්වන ලදී. **පාණ භූතෙසු සංයමෝ** සත්ත්වයන් කෙරෙහි හික්මුනු බව, අවිහිංසා බව සැපය යන අර්ථයි. මෙයින් කරුණා පූර්වභාගය දක්වන ලද **සුඛා විරාගතා ලොකෙ** ලෝකයෙහි කාමයන්ගේ යම් ඉක්මවීමක් වේද, ඒ විතරාගය සැපය වේ. මෙයින් අනාගාමී මාර්ගය කියන ලදී. **අසම්මානසස යෝ විනයෝ** මෙයින් අර්හත් බව වනාහි අස්මිමානයාගේ සම්පූර්ණ විනාස කිරීමයි කියනු ලැබේ. මෙය හැර අනෙක් සැපයක් නැත. එවං වෙ **පරමං සුඛං** යි එහෙයින් කියන ලදී. මෙයින් අර්හත් බවේ උතුම් බව වේ.

ප්‍රථම සූත්‍ර වර්ණනාව යි.

2-2

දෙවන සූත්‍රයෙහි සමබහුලානං යනු විනය පිටකයට අනුව තුන්දෙනෙක් සමබහුලා යි කියති. එයින් මතු සංඝ නම් වේ. සූත්‍රාන්ත දේශනාව අනුවද තුන්දෙනෙක්මයි කියති.

මෙහි සූත්‍රාන්ත පරියාය වශයෙන් සම්බහුල යි කියති. **උපට්ඨාන සාලායං** ධර්මසභා මණ්ඩපයෙහි ධර්මදේශනාව පිණිස වැඩමවූ තථාගතයන් වහන්සේට භික්ෂූන් විසින් උපස්ථාන කරන ස්ථානය බැවින් උපට්ඨානසාලාය යි කියනු ලැබේ. තවද යම් ස්ථානයක භික්ෂූහු විනය

විභාග කරත් ද, ධර්මය දේශනා කරත්ද, සාකච්ඡා පවත්වත් ද, නොයෙක් ආකාරයෙන් රැස්වෙත්ද, එම සාලාව ද මණ්ඩපයද උපට්ඨාන සාලාව යි කියනු ලැබේ. එහෙත් බුද්ධාසනය නිබඳවම පනවන ලද්දේය. මෙය බුදුරදුන් ජීවමාන කාලයෙහි භික්ෂූන්ගේ චාරිත්‍රයක් විය.

සනනිසිනනාතං හිඳීම සඳහා පැමිණි අයට, **සනනිපතිතානං** ඒ ඒ ස්ථානවලින් පැමිණි පිරිසට, හෙවත් බුද්ධාසනය ඉදිරියෙන් තබා බුදුරදුන් හමුවෙහි මෙන් ආදර ගෞරවයෙන් යුක්තව සකස්ව රැස්ව සිටි අයට, **අයං** යනු මේ කාලය ප්‍රකාශ කරයි. **අනතරාකථා** යනු කමටහන් සිහිකිරීම, අවවාද කිරීම, ප්‍රකට කිරීම් ආදි කථාවන්ගෙන් එක්තරා කථාවක්. **ඉමෙසං විනනං රාජුනං** වෙන්කර දැක්වීමේ සම්බන්ධ විභක්තියයි. **මහද්ධනතරොවා** පොළොා සාරා ලැබුනු සප්තරතන සංඛ්‍යාත මහා ධනය මොහුට ඇති බැවින් මහද්ධන නම් විය. ධනවතුන් දෙදෙනෙකු අතර මෙතෙම බෙහෙවින් මහත්ධන ඇති බැවින් මහද්ධන නම් විය. නිබඳව වියදම් කිරීම සඳහා මොහුට බොහෝ වස්තුව ඇති බැවින් **මහාභොග** නම් විය. දිනපතා ලැබෙන විශාල ආදායමක් ඇති බැවින් **මහාකොස** නම් විය.

වජ්‍ර, මහානීල, ඉන්‍දනීල, මරකත, වෛදූර්ය, පද්මරාග, පුෂ්පරාග, කකෙතත, ථුලාක, විමල, ලොහිතකඛ, එළික, පබළු, ජෝතිරංග, ගොමූත්තක, ගොමේදක, සෞගන්ධික, මුතු, සංඛ, අඤ්ජනමූල, රාජවට්ට, අමතංසුක, ප්‍රියක, බ්‍රහ්මණියි සුවිස්සක් රත්නයෝ **වර්ණ** නම් වෙති. සත්වැදෑරුම් ලෝභවලින් තැනූ කහවනු **සාරා** නම් වේ. ඇඳ ඇතිරිලි පාපිසි ආදිය **වෙගහු** නම් වේ. සඳුන් අගරු කොකුම්, තුවරලා, කපුරු ආදිය ගුම්බා නම් වේ. එහි මුලින් දැක්වූ ආදී ශබ්දයෙන් හැල්වී මුං මෑ ආදී පූර්වදිග දේශයෙහි හා අවරදිග දේශයෙහි ධාන්‍යවර්ග ආදිකොට සත්ත්වයන්ගේ උපභෝග පරිභෝග වස්තු වේ නම් ඒ සියල්ල ඇතුලත් වේ. දිනන ලද රාජධානි ඇති බැවින් **මහාවිජිත** නම් වේ. මහත් වූ ඇත් අස් වාහන ඇති බැවින් ද **මහාවිජිත** නම් වේ. මහත් වූ සේනාබලය ඇති බැවින් මහාබල නම් වේ. තමන් කැමති දේ ලබාගැනීම නමැති පූර්ව **පුණ්‍යකර්ම සම්පත්තිය** ඇති බැවින් **මහිද්ධික** නම් වේ. දානාදි සතර සංග්‍රහ වස්තුවෙන් ජනතාව සතුටු කෙරේනුයි **රාජා** නම් වේ. මගධ රාජ්‍යයට අධිපති වූයේ **මාගධ** නම් මහත් වූ සේනාවන්ගෙන් යුක්ත වූ බැවින් ද සෝනිය ගෝත්‍ර ඇති බැවින්ද **සේනියෝ** නම්. **බිම්බි** නම් රත්රන් ය. රන්වන් පාට ඇති බැවින් **බිම්බිසාර** නම් වේ. සමහරු මේ නාමය රජුට පමණක් යෙදේයයි කියති. පසමිතුරු සේනාවන් ජයගත්

බැවින් **පසේනදි** නම් වේ. කොසොල් රටට අධිපති වූයේ **කෝසල** නම් **විජයකනා** යනු අවසන් නොකළ කථාය. ඒ භික්ෂූන්ගේ අනතුරු කථාවක් දක්වන ලදය. සායණ්හ සමයං, සවස එක් වේලාවක, **පටිසල්ලානාවුටඨිතො** ඒ ඒ රූපාදී අරමුණුවලින් සිත ආරක්ෂා කරගැනීම සඳහා පටිසල්ලානයි කියන ලද කාය, චිත්ත විවේකයෙන් නැගී සිටියේය.

භාග්‍යවතුන් වහන්සේ පෙරවරු භික්ෂු සංඝයා සමග සැවැත්නුවර වැඩමවා පහසුවෙන් ලද පිණ්ඩපාතය භික්ෂූන් සමග වළඳ, භික්ෂූන් සමග සැවැත්නුවරින් නික්ම විහාරයට පිවිස ගන්ධකුටියේ ඉදිරියෙහි සිට වත්පිළිවෙත් කළ භික්ෂූන්ට සුදුසු පරිදි අවවාද දී ඔවුන් අරණ්‍ය වෘක්ෂමූලයන්හි දහවල් කාලය ගත කිරීමට ගියපසු ගන්ධකුටියට වැඩමවා ඵලසමවත් සුවයෙන් දහවල් කාලය ගතකොට සුදුසු කල්හි සමවතින් නැගිට 'මාගේ නැවත පැමිණීම බලාපොරොත්තුවෙන් මුලුමහත් විහාරය පුරා දැන් මාගේ ධර්මදේශනාවට සවන්දීම පිණිස සිටින බැවින් ධර්මසභා මණ්ඩලයට යාමට රන් ගුහාවකින් නික්මෙන කේසර සිංහරාජයකු මෙන් හා උතුම් ගඳකිළියෙන් නික්ම රංචුව වෙත යන උතුම් ඇත් රජකු මෙන්ද, මනෝඥ වික්‍රම ගමන් ඇත්තේ අසූවක් කුඩා පුරුෂ ලක්ෂණයන්ගෙන් හා මහාපුරුෂ ලක්ෂණ දෙතිසකින් බබලමින්, ව්‍යාමප්‍රභාවෙන් හාත්පස අලංකාර කරමින්, අලංකාර කේතුමාලාවෙන් බබලමින්, නීල, පීත, ලෝහිත, ඕදාත, මාඤ්ජෂ්ඨ, ප්‍රභාශ්වර වශයෙන් ෂඩ්වර්ණ බුදුරැස් විහිදුවමින්, සිතිය නොහැකි ආනුභාවයෙන්, උපමා රහිත බුද්ධලීලාවෙන් යුක්තව, රූපකාය සම්පත්තියෙන් සියලු විහාරය ඒකාලෝක කොට උපස්ථාන ශාලාවට වැඩි සේක. එහෙයින් කියන ලදී. **අථඛො භගවා** -පෙ- **තෙනුපසංකමි** යි. මෙසේ පැමිණ වතාවත් කොට නිශ්ශබ්දව හුන් ඒ භික්ෂූන් දැක, මා කතා නොකරන විට මේ භික්ෂූහු බුද්ධ ගෞරවයෙන් කල්පයක් වුවද කතා නොකරන්නාහ යි කතාව ආරම්භ කිරීම සඳහා **කායානුපස්ස භික්ඛවෙ** ආදිය කීහ. එහි **කායානුපස්ස** යනු කවර කථාවකින් සිටියහු ද යනුයි.

කුලපුත්තානු : ජාති ආචාර කුලපුත්‍රයන්ගේ **සද්ධා** ශ්‍රද්ධාවෙන්, කර්මඵල විශ්වාසය හා රත්නත්‍රය කෙරෙහි ඇති විශ්වාසයෙන්, **අගාරසමා** ගිහිගෙයින්, **අනගාරියං** පැවිද්ද **පබ්බජිතානං** පැවිද්දට පැමිණි, **යං ක්‍රියාපදය** වෙනුවෙන්, මහණෙනි, ඔබලා රජුන්ගේ දඬුවමක් නිසා, සොරුන්ගේ දඬුවමක් නිසා, ණයකින් බේරීම සඳහා හෝ ජීවත්වීම සඳහා පැවිදි වූවෝ නොවෙති. ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම මාගේ සාසනයෙහි

පැවිදි වූ ඔබලා දැන් මෙබඳු රජුන් පිළිබඳ හෝ තිරිසන් කථා හෝ කරන්නාහු නම් එය සුදුසු නැත. මෙසේ රැස්වූ පැවිද්දන්ට නුසුදුසු කථා ප්‍රතික්ෂේප කොට ඔවුන්ට ප්‍රතිපත්තිය නියම කරන සේක් **ඝනනිපතිතානං** වෝ භික්ඛවෙ දවයං කරණීයං ධම්මී වා කථා අරියෝ වා තූණහීභාවෝ මහණෙනි, රැස් වූ ඔබලා කළයුතු දෙකක් ඇත. එනම් දැහැමි කතාවක් කිරීම හෝ උතුම් නිශ්ශබ්දව සිටීම යන දෙකයි.

එතමත්ථං විදිත්වා යනු එම භික්ෂූන් විසින් දක්වන ලද කාමසම්පත්තීන්ට වඩා ධ්‍යාන ආදී සම්පත් අතිශයින්ම ශාන්ත බවත්, අතිශයින් ප්‍රණීත බවත් යන මේ කාරණය සියලු අයුරින් දැන. **ඉමං උදානං** මෙම උතුම් සැප විහරණය පිළිබඳ උදානය ප්‍රකාශ කළහ.

එහි යඤ්ච කාමසුඛං ලොකෙනි යනු ලෝක ශබ්දය, ස්කන්ධ ලෝකය, ආයතන ලෝකය, ධාතු ලෝකය, සංස්කාර ධර්මයන් සඳහා යෙදෙන්නේය.

> **'යාවතා චන්දිමසූරියා පරිහරන්ති දිසාභනන්ති විරොචනා**
> **තාව සහසඤ්ඤා ලොකෝ එත්ථ තෙ වත්තා තෙ වසෝ'**
> ආදී තන්හි අවකාශයෙහි ආයේය.

'අද්දසා ඛෝ භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තෝ' යන ආදී තන්හි සත්ත්වලෝකය ප්‍රකාශ වේ. මෙහි වනාහි සත්ත්වලෝකය හා අවකාශ ලෝකය ද ප්‍රකාශ වේ. එබැවින් අවීචියෙහි පටන් රූප බ්‍රහ්මලෝකය දක්වා ගතයුතුයි. **යඤ්චිදං දිවියං සුඛං** යනු මේ දිව්‍යවිහාර වශයෙන් ලැබිය යුතු රූපාවචර සමාපත්ති සැපයයි. **තණ්හක්ඛය සුඛස්ස** යන යම් සැපතකට පැමිණ තෘෂ්ණාව ප්‍රහීණ වේද ඒ නිවන්සුව අරමුණු කොට තෘෂ්ණාව පටිපස්සම්භන වශයෙන් ලබන ඵලසමාපත්ති සැපය තණ්හක්ඛය සුඛ නම් වේ. එම තණ්හක්ඛය සැපෙහි **සොළසිං** දහසයක් සම්පූර්ණ වීම මෙහි කෙටි තේරුමයි. සක්විති සැපතේ සිට සියලු මිනිස්ලොව සැපද, නාගසුපර්ණ ආදී ලෝකයන්හි නාගාදීන් විසින් අනුභව කළයුතු සැප ද, චාතුම්මහාරාජිකාදී සදෙව්ලොව සයවැදෑරුම් කම්සැපද යන එකොළොස් වැදෑරුම් කාමසැපද, යම් මේ රූපාරූප භවයන්හි දිව්‍ය සැපද, යන සියලු සැප තෘෂ්ණාව ක්ෂය කිරීම නිසා ලැබෙන ඵලසමාපත්ති සැපය කියන ලදී.

ද්විතීය සූත්‍ර වර්ණනාව යි.

2-3

තුන්වෙනි සූත්‍රයෙහි **කුටාරකා** යනු දරුවෝය. **අනතරාව සාවත්ථිං අනතරාව ජේතවනං** තන්හි අන්තරා ශබ්දය 'තදනන්තරං කෝ ජානෙය්‍ය අඤ්ඤත්‍ර තථාගතා' යි ද ජනා සංගමම මනෙතති මඤ්ච තවඤ්ච කිමනන්තරං' යන ආදී තන්හි කාරණයෙහි සඳහන් වේ. 'අඳසා මං භනෙත අඤ්ඤතරා ඉත්ථී විඡ්ජනතරිකාය භාජනං ධොවනති' යන ආදී තන්හි වේලාවෙහි ද 'යසසනන්තරතෝ න සන්ති කොපා' ආදී තන්හි සිත යන අර්ථයෙහි ද 'අපිමායං තපොදා දවිනනං මහානිරයානං අනන්තරිකාය ආගචඡති' යන තන්හි අවකාශයෙහි ද සඳහන් වේ. එබැවින් සැවැත් නුවරටද, ජේතවනයට ද අතරෙහි යි අර්ථගත යුතුයි.

අහි දණ්ඩන හනනති යනු බිලයෙන් නික්ම ගොදුරු සොයා යන බඩගින්නෙන් සිටි කළු නයෙකු ලුහුබැඳ දඬුවලින් පහරදෙති. එකල්හි සැවැත්නුවර පිඬු පිණිස හැසිරෙන බුදුරජාණන් වහන්සේ අතරමග ඒ දරුවන් දැක 'දරුවෙනි, කුමක් නිසා මේ නයාට දණ්ඩෙන් පහර දෙවුදැ'යි අසා 'ස්වාමීනි දෂ්ඨ කිරීමේ බියෙන්'යි කී කල්හි 'මොවුහු තමන්ට සැප බලාපොරොත්තුවෙන් මේ නයාට පහරදී උපනුපත් තන්හි දුක් අනුභව කරන්නෝය. අහෝ අවිද්‍යාවෙන් මුලාකරන ලද මුන්ගේ දක්ෂකමෙකියි ධර්මසංවේගය උපදවූයේය. එසේ ධර්ම සංවේගයෙන් උදානය පහළ කළ සේක. එහෙයින් **අථ ඛො භගවා** ආදිය දැක්වීය. **එතමත්ථං විදිත්වා** යනු 'මේ දරුවෝ තමන්ගේ සැප පිණිස අනුන්ට දුක් දෙන්නෝ පරමාර්ථ සුවයක් නොලබන්නාහයි යන මේ කරුණ දැන අනුන්ට වැරදි ලෙස පිළිපැද සැප සොයන්නට මතු දුක් ලැබෙන බවත්, යහපත් ලෙස පිළිපදින්නන්ට ඒකාන්තයෙන් සැප ලැබෙන බවත් දේශනාකොට අනුන්ට හිංසා කිරීමෙන් වැලකී ඒකාන්තයෙන්ම සැප ලැබිය යුතු බවත් බුදුරජාණන් වහන්සේ මේ උදානය පහළ කළ සේක.

එහි **සුඛකාමානි** ඒකාන්තයෙන්ම සැප කැමති තමන්ට සැප බලාපොරොත්තු වෙයි. **භූතානි** යනු ප්‍රාණීහුය. **දණ්ඩෙන** යනු දේශනා මාත්‍රයකි. දණ්ඩකින් හෝ ගල්කැටවලින් හෝ ආයුධයකින් හෝ අත්වලින් හෝ පහරදීම, යමෙක් සැප කැමති මේ සියලු සතුන්ට ජාතිවාදයෙන් බැණීම් සංඛ්‍යාත වාග්දණ්ඩයෙන් හෝ අත් මුගුරු ආයුධ ආදියෙන් පෙළීම්, තැලීම්, කැපීම් ආදි වශයෙන් ශරීර දණ්ඩනයෙන් හෝ කහවණු සියයක් දහසක් තබාගැනීම් වශයෙන් ධන දණ්ඩනයෙන් හෝ යන මේ දණ්ඩනවලින් මෙම දණ්ඩන අතරින් යම්කිසි දණ්ඩනයකින් **විහිංසති**

වෙහෙසට පත්කරයි. දුකට පත්කරයි. **අත්තනො සුඛ මෙසානො පෙච්ච සො න ලභතෙ සුඛං** ඒ පුද්ගලයා තමන්ගේ සැප සොයන්නෙ, ප්‍රාර්ථනා කරන්නේ පරලොව මිනිස් සැප දිව්‍ය සැප, නිවන්සැප යන ත්‍රිවිධ සුඛයම නොලබයි. ඒකාන්තයෙන් එම හිංසා කිරීම් නිසා දුකම ලබා යනු මෙයින් අදහස් වේ. **පෙච්ච සො ලභතෙ සුඛං** මෛත්‍රියෙන් යුක්ත වූ මම සැප කැමැත්තේ දුක් පිළිකෙව් කෙළේ මෙසේ සියල්ලෝම සිතත්වායි කියන ලද පරිදි කිසියම් හිංසාවකින් සියලු සත්ත්වයන්ට හිංසා නොකරයි. ඒ පුද්ගලයා පරලොව මිනිසකු වූයේ මිනිස් සැපද, දෙවියකු වූයේ දිව්‍යසැපද, ඒ සැප දෙක ඉක්මවා නිවන්සැපද ලබයි යනු ප්‍රකාශකිරීම සඳහා **ලභතෙ** යි කියන ලදී.

තුන්වෙනි සූත්‍ර වර්ණනාව යි.

2-4

සිව්වෙනි සූත්‍රයෙහි **තෙන ඛො පන සමයෙන භගවා සක්කතො හොති** යනු කල්ප ලක්ෂයකට පෙර සතර අසංඛ්‍යය තුල පුරන ලද පුණ්‍යසම්භාර ධර්ම නිසා ලද විපාක හේතුවෙන් මෙයින් මතු මට අවසරයක් නැතැයි වැඩි වැඩියෙන් උපන් සත්කාර ආදියෙන් භාග්‍යවතුන් වහන්සේ පුදන ලද්දාහ. සියලු දිසාවන්හිම මහා වර්ෂා දෙකක් ඇතිවී මහා ගංවතුරක් මෙන් සියලු පාරමී ධර්ම එකම ආත්මභාවයක දක්වන්නෙමුයි එක්වුනාක් මෙන් භාග්‍යවතුන් වහන්සේට ලාභසත්කාර මහා ගංවතුරක් පහළ විය. ඉක්බිති ආහාරපාන වස්ත්‍ර යාන වාහන, මල් ගඳවිලවුන් ආදිය ගත් ඇති **ක්ෂත්‍රියයෝ** 'බුදුරජාණන් වහන්සේ කොහිද? භාග්‍යවතුන් වහන්සේ කොහිද? දේව දේවයන් වහන්සේ කොහිද? ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයා කොහිද? පුරුෂ සිංහයා කොහිද?යි භාග්‍යවතුන් වහන්සේ සොයති. ගැල් සියයකින් සිවුපසය ගෙනවුත් බුදුන් හමුවීමට ඉඩක් නොලබමින් හාත්පස ගව්වක් පමණ එකට ගැටී සිටිති. සමහරෙක් අනුව යති. ඒ සියල්ල බඩක ග්‍රන්ථයෙහි ඒ ඒ සූත්‍රවල සඳහන් වන පරිදි දතයුතුයි. **යථාච ඛො චුන්ද එතරහි සංඝා වා ගණාවා ලොකෙ උප්පන්නා නානං චුන්ද එතරහි අඤ්ඤං එකසංඝ සමනුපසසාමි එවං ලාභගග -යසගගපත්තා යථරිව චුන්ද භික්ඛසංඝො** යි දේශනා පරිදි භාග්‍යවතුන් වහන්සේට හා භික්ෂු සංඝයාට උපන් ඒ මේ ලාභසත්කාරය එකතු වී මහා ගංගා දෙකක මහා ජලකඳ දෙකක් මෙන් අප්‍රමාණ විය. එහෙයින් කියන ලදී. **තෙන ඛො පන සමයෙන භගවා සක්කතො හොති** -පෙ- **පරික්ඛාරානං**

භික්ඛුසංඝොපි සකකතො -පෙ- **පරික්ඛාරානං යි කී** පරිදි **තිර්ථකයෝ** වනාහි පූර්වයෙහි පින් නොකළ බැවින් ද, දුෂ්ප්‍රතිපත්ති නිසාද, සකස් නොවූවෝ ගරු බුහුමන් නොලැබුවෝ බුද්ධෝත්පාදයෙන් පසු ලාභයන්ගෙන් පිරිහුනෝ හිරු උදාවෙන් පසු කණාමැදිරියන් මෙන් ආලෝකයක් නැතිව, තේජසක් නැතිව, පිරිහුනු ලාභසත්කාර ඇත්තෝ වූහ. ඔවුහු භාග්‍යවතුන් වහන්සේට හා සංඝයාට ලැබුනු එබඳු ලාභසත්කාර නො ඉවසමින් ඊර්ෂ්‍යාවට පත්වූ ඔවුහු මෙසේ එරුසවචනයෙන් බැණ පලවා හරින්නෙමුයි උසුලු විසුලු පාමින් ඒ ඒ තැන භික්ෂූන්ට ආක්‍රොෂ පරිභව කරමින් හැසුරුනෝය.

එහෙයින් කියන ලදී. **අඤ්ඤතිත්ථියා පන පරිබ්බාජකා භගවතො සකකාරං අසහමානා භික්ඛුසංඝස්ස ගාමෙ ච අරඤ්ඤෙ ච භික්ඛු දිසා අසබභානි එරුසානි වාචානි අක්කොසනති පරිභාසනති** රොසෙනති **විහෙසෙනතීති** එහි අසබභානි යනු සභාවට නුසුදුසු වූ, සභාවෙහි යහපත් ජනයා අතර කියන්නට නුසුදුසු නොමනා වචනයෝය. **එරුසානි** යනු කර්කශ ලෝභ සහගත වචනයෝය. **අක්කොසනති** ජාති ආදී දස ආක්‍රෝශ වස්තුවෙන් ගටා බනිත්. **පරිභාසනති** කෝලාහල කිරීම් වශයෙන් බිය උපදවමින් තර්ජනය කරති. **රොසෙනති** අනුන්ගේ දෝෂයක් වේ නම් එය නැවත නැවත මතුකරමින් කතා කරති. **විහෙසෙනති** වෙහෙසට පත් කරවති. නොයෙක් ආකාරයෙන් අපහසුවට පත් කරති.

කුමක් නිසා මොවුහු සියලු දෙනාගේ ම පැහැදීම් ඇති භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි හා භික්ෂු සංඝයා කෙරෙහි වෛර කෙරෙමින් ආක්‍රොශ ආදියෙන් දොස් කීවෝ ද? භාග්‍යවතුන් වහන්සේට ලැබෙන ප්‍රණීත ලාභසත්කාර නිසා පලුදු කරගත් සිත් ඇත්තෝ පොළොව සාරමින් වෙහෙසෙන්නාක් මෙන්, පලුද්දක් නැති වප්‍රමාණික්‍යයෙහි පලුද්දක් උපදවන්නාක් මෙන් සුන්දරිකා නම් පරිබ්‍රාජිකාවක් කැඳවා ඇය ලවා ශාස්තෘන් වහන්සේ ගේ හා භික්ෂූන්ගේ නුගුණ කියවා ආක්‍රොෂ ආදිය සිදුකළහ. එම සුන්දරිකා කතාව පසුව සුන්දරිකා සූත්‍රයෙහි සඳහන් වේ.

එබැවින් මෙහි ලා යමක් කිය යුතු නම් එය එහිදීම වර්ණනා කරන්නෙමු. භික්ෂූනු භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ ඒ පුවත සැළ කළහ.

එහෙයින් කියන ලදී. **අථඛො සමබහුලා භික්ඛු යෙන භගවා තෙනුපසංකමිංසු** -පෙ- **විහෙසෙනතීති.**

එහි අර්ථය කලින් කියන ලද්දේය. **එතමත්ථං විදිත්වා** මෙම ඊර්ෂ්‍යාවෙන් පෙළුණු තීර්ථකයන්ගේ නොමනා පැවැත්ම සියලු

ආකාරයෙන් දැන, **ඉමං උදානං** ඊර්ෂ්‍යාවෙන් පෙළුණු ඒ තීර්ථකයන්ගේ විප්‍රකාර කෙරෙහි ප්‍රසන්න සිතින්ද, අනුන් විසින් කළ පුද පූජාවන්ගේ අනුභාවයෙන් ද ප්‍රකාශ කිරීම සඳහා මේ උදානය ප්‍රකාශ කළ සේක.

තසා ගාමෙ අරඤ්ඤෙ සුඛදුක්ඛ- පුථෝජාති ගමෙහි හෝ වනයෙහි හෝ යම්කිසි සැපයකින් හෝ දුකකින් පෝෂිතව සැපදුක් අනුභව කරන්නවුන්ගේ සිවුපසයෙන් යුක්ත වූ නෙවතනතො නො පරතො දහෙත මම සැපවත් වෙමි. මම දුක්ඛිත වෙමි. මාගේ සැපය, මාගේ දුකය, අන්‍යයා විසින්ද මට සුවදුක් උපදවන ලද්දේය. ඒ සුවදුක් තමන්ටද නැත. අනුන්ටද නැත. කුමක් නිසාද? මේ පංචස්කන්ධයෙහි මම ය කියා හෝ මාගේ ය කියා හෝ අනුන්ගේ කියා හෝ කිසිම දැකිය යුත්තක් නැත. හුදෙක් **සංස්කාර**යෝම හේතූන් පරිදි ඉපදී ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා විනාශ වෙති. මෙහි දේශනාවට හේතුව සැපදුක් ග්‍රහණයි. සියලු ලෝකධර්මයට අනුව අර්ථය දතයුතුය. මෙහි ඔහුට තමාගේ හා අන්‍යයාගේ රහත් බවට කරුණු දක්වයි. **ඵුසනති එසසා උපධිං පටිච්ච** මේ සුඛවේදනීය වූ ද දුක්ඛ වේදනීය වූද ස්පර්ශයෝ පංච ස්කන්ධ සංඛ්‍යාත උපධිය (නැවත නැවත ඉපදීම) නිසා එම පංචස්කන්ධය ඇතිකල්හි තමාට හැකි පමණින් එම විෂයය ස්පර්ශ කෙරෙති. අදුක්ඛමසුඛ වේදනාව ශාන්ත ස්වභාවය නිසා සැපයේම සංග්‍රහයට පත්වේ යයි දෙවැදෑරුම් වේ. ස්පර්ශ වශයෙන්ම මේ අර්ථ වර්ණනාව කරන ලදී. යම්ලෙසකින් ඒ ස්පර්ශයෝ ස්පර්ශ කෙරෙත්ද එය දැක්වීම පිණිස **නිරූපධිං** කෙන ඵුසෙයයුං **එසසා** යනු කියන ලදී. සියලු ආකාරයෙන් ස්කන්ධයන්ගේ උත්පත්තිය නැති කල්හි කවර කරුණකින් ඔවුහු ස්පර්ශයෝ ස්පර්ශ කෙරෙත්ද? එයට කාරණයක් නැත. ඉදින් වනාහි තෙපි ආක්‍රොශ ආදි වශයෙන් උපදින සැපදුක් කැමති නොවව් නම් සියලු අයුරෙන් උපධීන්ගේ අභාවය ඇති කල්හිත් යෝග කරව් යි අනුපාදිසෙස නිර්වාණ ධාතුව පිළිබඳව ගාථාව අවසන් කෙළේය.

මෙසේ මෙම උදානයෙන් වට්ට විවට්ට පිළිබඳ විස්තරය කියන ලදී.

සතරවැනි සූත්‍ර වර්ණනාව යි.

2-5

පංචම සූත්‍රයෙහි **ඉච්ඡානංගලකො** යනු ඉච්ඡා නංගල නම් කොසොල් රට එක් බ්‍රාහ්මණ ගමෙකි. එම ගම වාසය කරන නිසා හෝ, එහි උපන් නිසා හෝ ඉච්ඡානංගලක නම් වේ. තුන්සරණය යාමෙන් භාග්‍යවතුන්

වහන්සේ සමීපයෙහි උපාසක බව ලබාගත් උපාසක තෙමේ පන්සිල් සමාදන් වූයේ බුද්ධමාමක, ධම්මමාමක, සංඝමාමක වේ.

කෙනචිදෙව කරණීයෙනාති තබන ලද ණයක් නිදහස්කොට කිසියම් දෙවියකු විසින් කළයුතු බැවින් **නිරෙත්වා** නිමවා, මේ උපාසකයා පෙර නිතර භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ ආශ්‍රය කරයි. හෙතෙම කිසියම් කාලයක් කාර්යබහුල වීම නිසා බුදුරජාණන් වහන්සේ හමුවන්නට නොගියේය. භාග්‍යවතුන් වහන්සේ ඒ නිසා මෙසේ ප්‍රකාශ කළහ. **චිරස්සං ඛො තවං උපාසක ඉමං පරියාය - මකාසි යදිදං ඉධාගමනායාති** එහි **චිරස්සං** බොහෝ කලකින් **පරියායං** වාරයක්, **යදිදනති** යනු නිපාතයකි. චිරපටිකාහං මම බොහෝ කාලයක සිට, බොහෝ කාලයක සිට සමීපයට පැමිණෙන්නට, **කෙහිචි කෙහිචිති** ඇතැමෙකු විසින්, ඇතැමෙකු විසින් හෙවත් යම් අය විසින් ඔවුන් විසින් බුදුන් කෙරෙහි ආදරයක් දක්වනු ලැබේ. ශාස්තෘන් වහන්සේ කෙරෙහි වෙසෙසින් පැහැදුණු අයට හෝ ශාස්තෘන් වහන්සේ ගේ දැකීමෙන් හෝ ධර්මශ්‍රවණයෙන් ලද ආදරයත් අන්තැනක ඇති නොවේ. කිච්චකරණියෙහි අවශ්‍යයෙන් කළයුතු කටයුතු කුඩා හෝ ලොකු කළයුතුය. **ව්‍යාවටෝ උත්සාහවත් වූයේ. එතමත්ථං විදිත්වා** බුදුන්ගේ පහළවීම දුර්ලභ කල්හි හා මිනිසත් බව දුර්ලභ කල්හි සත්ත්වයන්ගේ කෙලෙස් ඇති බැවින් කුසලයට අනතුරක් වේ. කිසිම කෙලෙසක් නැත්තහුට යන මේ කාරණය සියලු අයුරින් දැන **ඉමං** උදානං මේ උදානය ප්‍රකාශ කෙළේය.

තසථ සුඛං වත තසස න හොති කිඤචීති යම් පුද්ගලයෙකුට කිසියම් රූපාදී වස්තුවක් මෙය මාගේය යි තෘෂ්ණාවෙන් අල්වා ගැනීම් වශයෙන් **න හොති** නැත. විද්‍යමාන නොවේ. එම පුද්ගලයාට ඒකාන්තයෙන්ම සැපයකි. 'න හොසී' යි ද පාඨයක් ඇත. එහි අතීත කාල වශයෙන් අර්ථය දතයුතුය. සමහරෙක් 'න හොති කිඤචි' යන පදයෙන් රාගාදී ක්ලේශයක් යමකුට නැත්තේ යයි අර්ථ ප්‍රකාශ කරති. එය සුදුසු නැත. යම් පුද්ගලයෙකුට කිසියම් ස්වල්ප වූ ද උවදුරු ලබා දෙන රාගාදී ක්ලේශයක් නැති බැවින් ඒකාන්තයෙන් සැපයකි යි අර්ථ ඇත්තේය. ඉදින් රාගාදි කෙලෙස් නැත්තේ කවරකු හටද? ඒ සංස්කාර ධර්මයන් අවබෝධ ඇත්තහුටය. යමෙක් සිවුමග පිළිබඳ වූ සොළොස්වැදෑරුම් කටයුතු අවසන්කොට ඇත්තේ ද හෙතෙම සංස්කාර ධර්මයන් පිළිබඳ කටයුතු අවසන්කොට ඇත්තේය. ඒ නිසා ප්‍රතිවේධය අවබෝධ කළ බැවින් බහුශ්‍රැත නම් වේ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ කෙලෙස් ප්‍රහීණ කළ බැවිහි අනුසස් දක්වා කෙලෙස් ප්‍රහීණ නොකළ බැවිහි ආදීනව දැක්වීමට **සකිඤචනං පසස** යන මේ ආදිය වදාළහ. එහි අදහස මෙසේය.

රාගාදී කෙලෙස් ඇතිවිට ඒ කෙලෙස් ඇතිබව නොදන්නහුට කාමය වස්තූන් සෙවීම, රැකීම හේතුවෙන් මමය, මාගේය යි ගැනීම නිසා විපතට පත් පුද්ගලයා බලන්න යි ධර්ම සංවේගයට පත් ශාස්තෘන් වහන්සේ තමන්ගේ හැඟීම ප්‍රකාශ කරති. **ජනො ජනසමිං පටිබද්ධ රූපො** තෙමේ අනෙක් පුරුෂයකු සමානය යි තෘෂ්ණා වශයෙන් ඇලුණු සිත් ඇති බැවින් වැනසෙහි. විපතට පත්වෙයි. 'පටිබද්ධචිත්තො' පාඨයක් ඇත. එහි අර්ථය මෙයමය.

'පුත්තා මත්ථි ධනම්මත්ථි ඉති බාලො විහඤ්ඤති
අත්තාහි අත්තනො නත්ථි කුතො පුත්තා කුතො ධනං'

මේ ආදී සූත්‍ර දේශනාවන්ගෙන් පැහැදිලි කළයුතුය.

පස්වැනි සූත්‍ර වර්ණනාව යි.

2-6

සවැන්නෙහි **අඤ්ඤතරස්ස පරිබ්බාජකස්ස** එක් කෙළෙඹි පරිබ්‍රාජකයකුගේ **දහරා** තරුණී **මාණවිකා** බ්‍රාහ්මණ දියණියකට ව්‍යවහාර කරන නමකි. **පජාපති** භාර්යාව. **ගබ්භනි** දරුවකු ලැබීමට ආසන්න ස්ත්‍රියක්. **විජඤ්ඤා** අද ද හෙටදැයි දරුවකු ලැබීමට ආසන්න කාලය වේ. මේ බමුණා වනාහි ශක්තිමත් රූපයකින් යුක්ත විය. එබැවින් බිරිඳක සමග වූ ඔහුට පරිව්‍රාජක වහරින් හඳුන්වති. ඔහුගේ භාර්යාවද බ්‍රාහ්මණ කුලයෙහි වූ ඔහුට බ්‍රාහ්මණයි අමතයි.

තෙලං තල්තෙල්ය. තල් තෙල් මිශ්‍ර වූ යම් යම් ඖෂධ වර්ග දරුවකු වදන කල්හි ප්‍රසව වේදනාවට ප්‍රතිකාර වශයෙන් අවශ්‍ය බැවින් ඒ ගිතෙල් තල්තෙල් ආදිය ගෙන්වනු මැනවැයි නියම කරයි. **යං මෙ විජාතාය භවිස්සති** යම් තල තෙලක් මා දරුවකු ලබන කල්හි එය පහසුවීම සඳහා වන්නේය. පරිබ්බාජිකාය යි පාඨයක් ද ඇත. **කුතො** කවර තැනකින් යම් ගෙදරකින් හෝ මිත්‍ර ගෙදරකින් හෝ තෙල් ආදිය ගෙන එන්නෙම් නම් එබඳු තැනක් මට නැත.

තෙලං ආහරාමි දැනට සමීපයෙහි ඇති තැනකින් තෙල් ගෙන එන්නෙමි. ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ ගිතෙල් හා තල්තෙල් කැමති තාක් බොන්නට දෙනු ලැබේ. **නො නහරිතුං** භාජනයකින් හෝ අතින් බැහැර ගෙන යන්නට දෙනු නොලැබේ. **උගහරිත්වා** වමනය කොට හෝ දෙන්නෙම් නම් යෙහෙකැයි සිතුවේය.

ඔහුට මෙසේ අදහසක් ඇතිවිය. මම රජුගේ කෝෂ්ඨාගාරයට ගොස් ඒ තෙල් කැමති තාක් බී එකෙණෙහිම ගෙදර පැමිණ එක් බඳුනක් තබා එහි වමනය කොට උඳුනක් සකස් කොට ඒ තෙල් පිත හා සෙම නිසා අපවිත්‍ර වී ඇත්නම් ගින්නෙන් ඒවා පුලුස්සා දමමි. **උද්ධං කාතුං** වමන වශයෙන් බැහැර කරන්නට, **න පන අධොවා නි** විරේක වශයෙන් බැහැර කරන්නට නො හැකි වෙයි. හෙතෙම අධික වූ පිත තමන්ම මුඛයෙන් ඉවත් කිරීමට උත්සාහ ගත් නමුත් එය අසාර්ථක වී විරේක කිරීමෙන්ද පහ කිරීමට අසමත් වූ බැවින් හුදෙක්ම දුක් වේදනාවන්ගෙන් පෙළෙයි. ඔබමොබ පෙරළෙයි. **දුක්ඛාහි** දුක් ඇත්තහු විසින් **තිප්පාහි** තියුණු, **කක්කලාහි කර්කශ** කටුකාහි අනිශයින් දරුණු වූ ආවට්ටනීහි එකම තැනෙක නොසිට තමන්ගේ ශරීරය ඔබ මොබ පෙරළෙයි. **පරිවට්ටනීහි** හාත්පස පෙරළෙයි. **එතමත්ථං විදිත්වා** මේ කරුණු සියලු අයුරින් දැන මේ උදානය පහළ කළ සේක. එහි සුබිනොවත ඒකාන්තයෙන් සැපවත් වූ සත්පුරුෂයෝය. ඔවුහු කවරහුද? **යෙ අකිඤ්චනා** යම් කෙනෙක් රාගාදී කෙලෙස් නැත්තෝ ද ඔවුහු අකිඤ්චන නම් වෙති. **වෙදගූනො හි ජනා අකිඤ්චනා** යම් කෙනෙක් ආර්යමාර්ග සංඛ්‍යාත වූ වේදය අවබෝධ කළ බැවින් නිවනට පැමිණියහ. වේදගූ නම් ඒ ආර්යයෝ **ක්ෂීණාශ්‍රව** පුද්ගලයෝය. අප්‍රමාණ රාගාදී කෙලෙසුන් අග්‍ර වූ අර්හත් මාර්ගයෙන් විනාශ කළ බැවින් **අකිඤ්චනා** නම් වෙති. රාගාදී කෙලෙස් නැති කල්හි අල්වා ගැනීම් වශයෙන් කෙලෙස් හටගන්නේද? මෙසේ ගාථාවෙහි මුල් කොටසින් රහත් බව ප්‍රශංසා කොට පසුකොටසින් අන්ධ (බාල) පෘථග්ජනයන් නින්දාවට ලක් කරමින් **'සකිඤ්චනං පසසාති'** ආදිය ප්‍රකාශ කළහ. එය පෙර සූත්‍රයෙහි කී පරිදිම මෙසේ මේ ගාථාවෙන්ද සසර දුක හා නිවන කියන ලද්දේය.

සවැනි සූත්‍ර වර්ණනාව යි.

2-7

සත්වැන්නෙහි **එකපුත්තෙහා** යනු එකම පුත්‍රයෙකි. ඔහු ද අනුකම්පාව ලැබිය යුතු වූ එකම පුත්‍රයෙකි. ප්‍රියකළ යුතු බැවින් **පියො** නම් වේ. සිත සතුටු කළ නිසා **මනාප** නම් වේ. ශරීර ශෝභාවෙන් දැකුම්කළු බවින් හෝ දර්ශනීය බවින් **පියො** නම් වේ. සීලාචාර පැවැත්මෙන් හා **කලණ** දහම් ඇති බැවින් **මනාපො** නම් වේ. කාලය ගෙවෙන බැවින් **කාලය** නම්. මරණයයි. ඒ මරණයට පැමිණි බැවින් **කාලංකතො** කාලය නමැති

මාරයා විසින් ග්‍රහණයට ගත් බැවින් නටුයේ නොදැකීමට පැමිණියේ **කලංකතො කළේරිය** කළේය. මළේය යන අර්ථයි. **සම්බහුලා උපාසකා** සැවැත්නුවර වාසී බොහෝ උපාසකවරු මියගිය උපාසක පුත්‍රයාගේ මරණය නිසා සොවින් තැවෙමින් සොහොන දක්වා පසුපසින් ගොස්, මෘත ශරීරයට කළයුතු දේ කරවා අවසන්කොට නැවැත්වීමෙන් පසුව ජලය ගෙනැවිත් නහා වස්ත්‍ර හැඳ තෙත වස්ත්‍ර පිටින්ම එක නිවසකට ගොස්, එක් උතුරු සළුවක් කොට, ඒ උපාසකයා පෙරටු කරගනිමින් ශෝකය දුරුකරගැනීම සඳහා ශාස්තෘන් වහන්සේ සමීපයෙන් ධර්මය අසමුයි භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියහ. එහෙයින් කියන ලදී. **අල්ලකෙසා** ආදිය. එහි **අල්ලකෙසා** යනු තෙත් ඉසකෙස් සහිත. එහි **අල්ලවත්‍ථා** ජලයෙන් තෙමුණු වස්ත්‍ර ඇතිව, **දිවා දිවසස්‍ස** එදවස දහවල් කල, මධ්‍යාහ්න කාලය යන අර්ථයි. යම්හෙයකින් යමක් දැනගෙනම තථාගතයන් වහන්සේ විචාරත්. සමහර කෙනෙක් දැනගෙන නො විචාරති. කල් දැන විචාරති. කල් දැන නො විචාරති. එහෙයින් දැනගෙනම කථාව ආරම්භ කිරීම සඳහා විමසන භාග්‍යවතුන් වහන්සේ **කින්නුතුම්හෙ උපාසකා** උපාසකයෙනි, කිමෙක්දැයි විචාළ සේක.

එහි අදහස මෙසේය. උපාසකයෙනි, තෙපි අනෙක් දවස්වල මා වෙතට එන්නේ, සුදු වස්ත්‍ර හැඳ පෙරවා සවස් කාලයේ එන්නෝ වෙති. අද වනාහි තෙත හිසකෙස් ඇතිව තෙත වස්ත්‍ර හැඳ දෙවෙන් දාවල මධ්‍යාහ්න කාලයේ පැමිණියාහුය. එයට හේතුව කුමක්ද?

තෙන මයනති ඒ පුත්‍රයා ගේ වියෝගයෙන් ඇති වූ සිත් තැවුලෙන් දැඩි සේ ශෝකයෙන් මැඩපවත්වන ලද අපි එසේ මෙහි පැමිණියෙමු. **එතමත්‍ථං විදිත්වා** යනු ප්‍රියවස්තුවක් නිසා හටගත් දුක්ඛ දෝමනස්ස ආදියෙහි ප්‍රියවස්තුවක් කෙරෙහි හටගත් මේ කාරණය අවබෝධ කරගෙන ඒ කාරණය ප්‍රකාශ කිරීම සඳහා මේ උදාන ප්‍රකාශය වදාළහ.

එහි **පියරූපා සාතගථිතාසෙ** යනු ප්‍රිය ස්වභාව ඇති රූපස්කන්ධාදීන් කෙරෙහි සුඛ වේදනාවෙන් හටගත් පිළිබඳ සිත් ඇත්තෝ යන අර්ථයයි. **සෙති** යනු නිපාත මාත්‍රයකි. **පියරූපා** යනු චක්ඛු ආදී ඉන්ද්‍රියයෝ ද, අඹුදරුවෝ ද වෙති. එය මෙසේ කියන ලදී. 'කිඤ්චි ලොකෙ පියරූපං සාතරූපං -පෙ- ධම්මතණ්හා ලොකෙ පියරූපං සාත රූපනති'

කෙත් වත් රන් රිදී ගව මහිෂ අශ්වයන් දැසි දසුන් හා තම නෑයන් කෙරෙහි බහුල වශයෙන් නැවත නැවත බැඳුණු සත්ත්වයෝ ලොල් වෙයි.

එහෙයින් පියරූපයන් ආශ්වාදනයේ ගිජුවුනු සිහිවිකල් බවට පත් එහි ඇලුනු යන අර්ථයි. එම පියරූප ඇති **සත්ත්වයෝ කවරහුද?** ඔවුන් මෙසේ දක්වයි. **දෙවකායා පුථුමනුසසා** යනු චාතුර්මහා රාජිකාදී බොහෝ දේව සමූහයා ද, දඹදිව් වැසි බොහෝ මිනිස්සු ද, **අසාචිනෝ** යනු කායික මානසික දුකෙන් දුකට පත් **පරිජුනනා** රෝගාදී විපත්වලින් යොවුන් බව නිරෝගි බව ආදී සම්පත්වලින් පිරිහුණු යථාලාභ වශයෙන් දෙවි මිනිසුන් අතර සැප ලැබූ අය මෙයින් අදහස් කෙරේ. නොහොත් **කැමති** කාන්ත සැපයෙන් සංවර්ධිත වූ, දෙවියන්ට දුක රෝග ජරා ආදිය නොපවතී. ඔවුන්ගේ එම ස්වභාවය ප්‍රකාශ කරනු පිණිස **අසාවුතෝ පරිජුනනා** යන්න කියන ලදී. ඔවුන්ට ද පෙර කර්මානුකූලව වැඩුණු මහළු බව ද, මානසික රෝග ද වශයෙන් දුක් ආදිය හටගැනීම වූයේ යයි දැනගත්තේය. **මච්ඡරාජස්ස වසං ගච්ඡනති** ප්‍රියවස්තු විෂයෙහි ඇති තෘෂ්ණාව ප්‍රහීණ නොකළ බැවින් නැවත නැවත මච්කුස පිළිසිඳ ගැනීම් ආදිය සිහිකිරීම් මෘත්‍යුරාජ සංඛ්‍යාත වූ මරණයේ වසඟයට පැමිණෙන්නේ ය. මෙසේ සංසාර දුක ප්‍රකාශකොට අනතරුව, **යෙ වෙ දිවා** ආදී වශයෙන් නිවන දක්වන්නේ ය. **යෙ වෙ දිවා ච රත්තො ච අපපමත්තා** එහි යම් කෙනෙක් දිවා රාත්‍රී දෙක්හි අප්‍රමාදී වූවෝ ය. දවස සක්මනෙන් ද, හිඳීමෙන් ද, කෙලෙස් ආවරණයන්ගෙන් සිත පිරිසිදු කෙරේනුයි කියන ලද පරිදි දිවා රාත්‍රී කාලයන්හි දැඩි අප්‍රමාදීව අප්‍රමාද ප්‍රතිපත්තිය පුරති. **ජහනති පියරූපං** චතුරාර්ය සත්‍ය භාවනාව වෙසෙසින් සම්පූර්ණකොට ආර්ය මාර්ගයට එළඹීමෙන් ප්‍රිය රූප, ප්‍රිය උපදවන ප්‍රිය දේ, චක්ඛු ආදී ප්‍රිය වස්තු පිළිබඳව දැඩි ආසාව දුරු කරයි. **තෙ වෙ ඛණනති අසමූලං මච්චුනො ආමිසා දුරතිවත්තනති** ඒ ආර්ය පුද්ගලයෝ සියලු සසර දුක් මුලින් උදුරා මෘත්‍යු නමැති මරණ දුක නොදෙන බැවින් ආමිසය ද එයින් බැහැර වූ කිසිදු මහණ බමුණු ආදීන් විසින් නැවැත්වීමට අපොහොසත් වන්නේද, එබැවින් හා අන්තිම වශයෙන් අවිද්‍යාව හා තණ්හාව ආර්ය මාර්ගය නමැති උදැල්ලෙන් සාරති. ස්වල්ප මාත්‍රයක්වත් ඉතිරි නොකොට මුලින්ම සිඳිත් යන අර්ථයි. මේ එහිම අර්ථයයි.

නොපමා බව නිවනට මගයි. පමාව මරණයට සසර නැවත නැවත ඉපදෙමින් මරණයට පත්වීමට මගයි. නොපමා වූවෝ නො මියෙත්. පමාවූවෝ මළාක් වැනියහ.

ආදී සූත්‍ර පදයන්හි විස්තර කරන ලද්දේය.

සත්වැනි සූත්‍ර වර්ණනාව යි.

2-8

අටවැනි සූත්‍රයේ **කුණ්ඩියායං** යනු මේ නම් ඇති කෝලියයන්ගේ නගරයයි. **කුණ්ඩධාන වනෙ** ඒ නගරය අසල කුණ්ඩධාන නම් වූ වනයක් අතීතයේ විය. ඒ වනලැහැබේ ඈත අතීතයේ කුණ්ඩ නම් වූ එක් යක්‍ෂයෙක් වාසය කළේය. සහල් කුඩුවලින් මිශ්‍ර වූ රොටිවලින් කරන පූජාවන්ගෙන් ඒ යක්‍ෂයා සතුටු වෙයි. එසේ පූජාවන් පැවැත්වූ හෙයින් මේ වනලැහැබ කුණ්ඩධාන නමින් හැඳින්විය. එම වන පෙදෙසට නුදුරුව

ඊට පසු කාලයක කෝලිය රජවරු එහි නගරයක් කරවූහ. එම නගරයද මෙම හඳුන්වාදීම පරිදිම කුණ්ඩියා නාමයෙන් හඳුන්වන ලදී. ඒ වනලැහැබෙහි කෝලිය රජවරු භාග්‍යවතුන් වහන්සේ සහිත භික්‍ෂු සංඝයාට වාසය පිණිස විහාරයක් ඉදිකළාහුය. එයද කුණ්ඩධාන වන නමින්ම ප්‍රකට විය. ජනපද චාරිකාවෙහි හැසිරෙන භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් එම විහාරයට පැමිණ එහි වාසය කළහ. එහෙයින් **එකං සමයං භගවා කුණ්ඩියායං විහරති කුණ්ඩධාන වනෙ** යන්න කියන ලදී.

සුපවාසා යනු ඒ උපාසිකාවගේ නමයි. **කෝලිය ධීතා** යනු කෝලිය රාජ කුමාරිකාවකි. භාග්‍යවතුන් වහන්සේගේ අග්‍ර උපස්ථායිකාව වූ ඇය ප්‍රණීතව දන් දෙන්නා වූ ශ්‍රාවිකාවන් අතර ඒතදග්ග ධුරයෙහි තබන ලද සෝතාපන්න ආර්ය ශ්‍රාවිකාවකි. භාග්‍යවතුන් වහන්සේලා යම් සුදුසු බාදනීය භෝජනීය දෙයක් හො ඖෂධයක් හෝ වෙනයම් දෙයක් හෝ, අන්‍ය වූ පුරුෂයන් විසින් ගෙනැවිත් සැපයූ දෙයක් වීනම් ඒ සියල්ල තමන්ම තමන්ගේ නුවණින් සොයා බලා මැනවින් සම්පාදනය කොට බුදුරදුන්ට පිළිගන්වයි. තව ද දිනපතා අටසියයකට සඟබත් ද, තමන්ගේම ධනයෙන් සකස්කොට පුද්ගලික බත් දෙයි. යම්කිසි භික්‍ෂුවක් හෝ භික්‍ෂුණියක් ඒ ගෙදරට පිඬුසිඟා වැඩියකල්හි හිස් අතින් නොයයි. මෙසේ නිරතම දෙන්න කැමැත්ත ඇති අති පිරිසිදු පින් කිරීමෙහි ඇළුණු ආයාචනයට සුදුසු දන් දීමේ සංවිධානයට ම ඇලුණ තැනැත්තියකි. ඇයගේ කුසෙහි පෙර බුදුවරුන්ගේ හමුයෙහි විවරණ ලැබ, පශ්චිම භවික, ශ්‍රාවක බෝධිසත්ත්වයෙක් පිළිසිඳ ගත්තේය. ඕ තොමෝ කිසියම් පාපකර්මයක් නිසා 'සත්වසක් හා සත් දවසක් මූලගර්භ' වූවාය. එහි **සත්තවස්සානි** යනු සත් වසරය. අත්‍යන්තර සංයෝගයෙහි සප්තමී වචනයි. **ගබ්භං ධාරෙති** ගැබ උසුලයි. ගර්භනී වූවා යන අදහසයි. සත් වසරක්. **මූළ්හගබ්භා** යනු සත් වසරක් නොසන්සුන් ගැබ ඇත්තිය. ගැබ මෝරා

දරුවා ලැබෙන කාලය කර්මජ වාතයෙන් සොලවා පෙරලා හරවන ලද්දේ, පා උඩට ගොස් ඔලුව පහළට වී යෝනි මුඛයෙහි කිසිතැනක නොලැගී, පිටතට නික්මෙයි. ප්‍රසූත නො කරන අවස්ථාවේ යෝනි මාර්ගය වසාගෙන, හරහට නොවීය. ස්වාභාවිකවම යෝනි මාර්ගය වැසේ. කර්මජ වාතයෙන් සුදුසු පරිදි ඔබ මොබ පෙරළීම වෙයි. එය 'මූලගර්භය'යි කියති. ඇයටද මේ අයුරින් සත්දිනක් 'විලිරුදාව' විය. මේ ගැබෙහි වූයේ සීවලී ස්ථවිරයෝය. ඇයට කෙසේනම් සත් වසක් ගැබ දැරීමේ දුක ද, සත්දවසක් විලිරුදා පැහැරීමේ දුක ද ඇතිවූ මේ මව සෝවාන් වූ ආර්යශ්‍රාවිකාවියකි. එසේ වූ ඇයට මේ දුක් ඇතිවීමේ හේතුව මෙසේ කියනු ලැබේ. පෙර බරණැස් නුවර කසී රජු රජකරන අවදියේ එක් කොසොල් රජකෙනෙක් මහත් බලසේනාවක් සමග ගොස් බරණැස් නුවර ගෙන ඒ රජු මරා ඔහුගේ අගමෙහෙසිය තමන්ගේ අගමෙහෙසිය බවට පත්කළාය. බරණැස් රජුගේ පුතා පියා මරණ කල්හි, කුරුබිල්දොරින් පලාගොස් තමන්ගේ නෑ මිත්‍ර හිතවතුන් එක්රැස්කොට අනුක්‍රමයෙන් බලසෙනග සංවිධානය කොට බරණැසට ඇවිත් නුදුරෙහි කඳවුරු බැඳ 'රජය හෝ දෙව යුද්ධ හෝ කරව' කියා ඒ රජුට හසුන්පත් යැවීය. රජ කුමරුගේ මව හස්න අසා යුද්ධයෙන් වැඩෙක් නැත. සියලු දිසාවන්ගෙන් ඇතුල්වීම වළක්වා බරණැස් නුවර වටකරව. ඉක්බිති දර, දිය, ආහාර නැතිවීමෙන් ක්ලාන්ත වන නුවරවැස්සෝ යුද්ධයෙන් තොරව රජු අල්ලාගෙන දක්වන්නේ යයි හසුන්පතක් යැවීය. හෙතෙම මවගේ අනුශාසනය අසා සතර මහවාසල් රකිමින් සත්වසක් නගරය වටකරගෙන සිටියේය. නුවර මිනිස්සු සුලු දොරවලින් නික්මී, දර ජලය ආහාර ගෙන සියලු කෘත්‍යයන් කරති. ඉක්බිති රජකුමරුගේ මව මගේ පුතා බාලයෙකි. ඔහු උපාය නො දනී. යව, සත් දවසක් නගරයේ සියලු කුඩා දොරවල්ද වසා මුරකාවල් යොදවන්නැයි කියවයි පුතාට රහස් පණිවුඩයක් යැව්වාය. හෙතෙම මවගේ අනුශාසනය අසා එසේ කළේය. නගරයෙන් නික්මීමට නොලබන්නෝ, (කෑම බීම් නැති වූ රටවැස්සෝ) සත්වෙනි දවසේ ඒ රජුගේ හිස කපා රජකුමරුට දුන්නාහ. කුමාරයා නුවරට පිවිස රාජ්‍යය භාරගත්තේය. ඔහු එදා සත්වසක් නගර දොරටු වසා තැබීමේ අකුසල කර්මයෙන් සත්වසක් ලෝකුඹු නරකය හා සමාන වූ මව්කුසෙහි විසීය. ඉතිරි හත්දවසක් කුඩා දොරටුද වසා තැබීමේ හේතුවෙන් විළිරුදාවෙන් වේදනා විඳීමට පැමිණියේය.

සත් දවසක් නගරය අවහිර කර අල්ලා ගැනීමෙහි විපාක වශයෙන් ලෝකුඹු නිරයෙහි වාසය කර සත් දවසක් ගැබ් මුළා බවට පැමිණියේ යයි ජාතකට්ඨ කථාවෙහි කියන ලදී. යම් හෙයකින් හෙතෙම පදුමුත්තර

සම්බුදු පාමුලදී "ලාභීන් අතර අග්‍ර වන්නෙමි" යයි ප්‍රාර්ථනය කළේද, යම් හෙයකින් විපස්සී බුදුරදුන්ගේ කාලයෙහි නුවරැන් සමඟ උක්සකුරු හා දීකිරි දී ප්‍රාර්ථනයක් කළේද ඒ අනුභසින් ලාභීන් අතර අග්‍ර වූයේය. සුප්පවාසා තොමෝද "දරුව නගරය අවහිර කර අල්ලා ගනුව" යි මෙහෙය වූ බැවින් අවුරුදු හතක් ගැබ පරිහරණය කර සත්දිනක් මුළා වූ ගැබ් ඇත්තී වූවාය. මෙසේ ඒ මවු පුතු දෙදෙන තමාගේ ක්‍රියාවට අනුරූප වූ මෙවැනි දුකක් වින්දාහුය.

තීහි විතක්කෙහි යනු තෙරුවන්හි ගුණානුස්මරණය හා බැඳුනු තෙවැදෑරුම් සිතුවිලි වලින්, **අධිවාසෙති** යනු මුළා වූ ගැබ් ඇති බැවින් උපන් දුක උසුලයි යනුයි. ඇය භාග්‍යවතුන් වහන්සේගේ සම්‍යක් සම්බුද්ධත්වය ද ආර්ය සංඝයාගේ මනා වූ පිළිවෙතට පිළිපන් බව ද නිර්වාණයෙහි දුක් දුරලන බව ද සිහි කරන්නී තමා වෙත උපන් දුක මෙනෙහි නොකිරීමෙන් ම මැඩපවත්වා ඉවසයි. එහෙයින් "තීහි විතක්කෙහි අධිවාසෙති" යනුවෙන් කියන ලදී. **සම්මා සම්බුද්ධො වත** යි ආදිය ඒ කල්පනාවන්ගේ පැවති ආකාරය දක්වීමයි. එහි අර්ථය (මෙසේය) උන්වහන්සේ පිනැති බව ආදී වූ කරුණින් "භගවා" නම් වූ සේක. ලෝකනාථයන් වහන්සේ සියළු ධර්මයන් නොවෙනස් ලෙස මුළුමනින් තෙමේම අවබෝධ කළේනුයි. "බුද්ධ" නම් වූ සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසමයෙහි මා විසින් අනුභව කරනු ලබන්නා වූ මෙවැනි දුකකට ද මෙබඳු වූ අන් සියළු සසර ද දුකහිද සන්සිදුවීම පිණිස ද වෙසෙසින් නිරුපධිසේස පරිනිර්වාණය පිණිසද ධර්මය දේශනා කරයි. විපරිත නොවූ ධර්මය දේශනා කරන හෙයින් ශාස්තෘ නම් වන සේක. සම්මා සම්බුද්ධත්වයත් සමඟ කියන ලද ගුණයන්ගෙන් යුක්ත වූ ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මශ්‍රවණාවසානයෙහි (භික්‍ෂුත්වය) උපන් හෙයින්ද, සීලයෙන් මනා දෘෂ්ටියෙන් හා ශ්‍රමණ බැවින් ස්ථිර වූ හෙයින්ද "ශ්‍රාවකසංඝ" යයි ලබන ලද නම් ඇති අෂ්ඨාර්ය පුද්ගල සංඝ සමූහයා ඒකාන්තයෙන් "සුපටිපන්න" වේ. පුදුමයකි! මනා වූ පිළිවෙතට පිළිපන් යම් ආර්ය සමූහයෙක් වේ ද උන්වහන්සේ මෙබඳු වූ සසර දුක ප්‍රහාණය කිරීම පිණිස නිරුපධිසේස නිරෝධය සඳහා වූ නොනවතින ප්‍රතිපදවට පිළිපන් සේක. ඒකාන්තයෙන් මනා වූ සැපයකි. පුදුමයකි ! යම් නිවනෙක්හි මෙබඳු සසර දුක් නොලැබෙද ඒ සියළු සංස්කාරයන් බැහැර කළ නිර්වාණය ඒකාන්තයෙන්ම යහපත් වූ සැපයකි. මෙහිදු "පටිපජ්ජමානාපි පටිපන්නා" යයි ප්‍රතිපදාවෙහි නොනවතින බැවින් කියන ලදී. තවද "උපපන්න"

ශබ්දය මෙන් "පටිපන්න" ශබ්දය ද වර්තමාන අර්ථයේ යැයි දතයුත්තේය. **සාමිකං** යනු සිය සැමියා වූ කොළිය රාජපුත්‍රයාය. **ආමන්තෙහි** යනු කීවේය **"මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දාහි"** යනු මගේ වචනයෙන් සක් ලකුණින් හෙබියා වූ පිපි පියුමෙහි සිරියෙන් යුත් බුදුරදුන්ගේ පාදයන් ඔබගේ සිරසින් වඳුව. උත්තමංගයෙන් (හිස නමා) නමස්කාර කරව යන අර්ථයි.

අපපාබාධං යනු මුලදී රෝගයකැයි සමාන නොවූ වේදනාව කියනු ලැබේ. මෙම වේදනාව එක් පසෙක ඉපිද ද සියළු සිරුර යකඩ පටියකින් වෙළා දමූවක් මෙන් හැගේ. **ආතංකො** යනු දුක්බර ජීවිතයක් ඇති කරන රෝගයයි. නැතහොත් (දුකසේ) යැපිය යුතු රෝගයයි. **ආතංකො** වෙනත් ආබාධයක්. සුළු වූ රෝගය ආතංක නම් වේ. බලවත් වූයේ ආබාධ නම් වේ අභ්‍යන්තරයේ හටගත් රෝගය ආබාධයයි ද පිටත හටගත් රෝගය ආතංක යයිද ඇතමෙක් කියත් ඒ දෙවැදෑරුම් වූ රෝගයන්ගේ නොමැති බව විමසුව යයි කියයි. ගිලන් වූවහුට නැගී සිටීම නම් බැරෑරුම් වූවක් වෙයි. ශරීර ශක්තිය නොවෙයි. එහෙයින් ගිලන් රහිත බව නිසා ඇතිවන සැහැල්ලු පැවැත්ම සංඛ්‍යාත සිරුරේ සැහැල්ලු බවද කාය ශක්තියද විමසුව යයි. කියයි. **ඵාසුවිහාරං** යනු සිටීම, හිඳීම සැතපීම හා ගමන් කිරීම සංඛ්‍යාත වූ සතර ඉරියව් පැවැත්මෙහි ද සැප විහරණය විමසුව. යනුයි. ඉක්බිති ඔහු විමසූ ආකාරය දක්වන්නී **සුපපවාසා භනෙත** ආදිය කීවේය. **එවඤ්ච වදෙහි** යනු දැන් පැවසිය යුතු අයුර දක්වයි **පරමං** යනු වදන් පිළිගැනුමයි. ඔහු විසින් මැනව සවාමීනි යම් සේ කියන ලදද එලෙස පිළිපදිමි යයි දක්වයි. **කොලියපුත්තො** යනු සුපපවාසාවගේ සැමියා වූ කෝලිය රාජ පුත්‍රයාය. සුබිනි හොතු යනු දෙවියන් සහිත ලෝකයෙහි දක්ෂිණාර්හ උතුමන් අතර ප්‍රමුඛ වූ ශාස්තෘන්වහන්සේ සුපපාවාස විසින් යවන ලද වැඳුම පිළිගෙන, අනතුරුව තමන් වහන්සේ ගේ මෛත්‍රී සහගත විහරණය ප්‍රකාශ කරන්නා වූ, බුදුරදුන් විසින් පුරුදු කරන ලද සුබ විහරණය ඇයට සාධාරන කොට වදරා නැවත ඇයගේ පුතුටද, විපත් මුල් කොට ඇති ගැබට හෝ දුකට පත්වීම බැහැර කිරීම මුල් කොට ඇති සුබ විහරණය දක්වන සේක්. 'සුවපත් වූවා. නිරෝගි වූවා. නිරෝගි පුතෙකු වදාවා' යි වදාල සේක. **සහවචනා** යනු භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රකාශයත් සමඟම, යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ එසේ වදාල සේක් ද එකල්හිම එම කටයුත්තද නිමාවට පැමිණියේය. ශාස්තෘන් වහන්සේ එම කර්මයාගේ ගෙවී ගිය බව බලා එසේ කළ සේක.

ඇතැමෙක් මෙසේ ද කියත් ඉදින් තථාගතයන් වහන්සේ එසේ නොකියන්නේද ඉන් පසුවද කිසියම් කාලයක් ඒ දුක ඇය ලුහුබඳින්නේය. යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ විසින් "සුවපත් වූවා නිරෝගී වූවා නිරෝගි වූ පුතෙකු වදවායි කියන ලද්ද එහෙයින් ඒ වචනයට සම වූ කල්හිම ඒ ගැබ වියවුල් බව හැර පහසුවෙන්ම පිටතට නික්මුනි. මෙසේ ඒ මවු පුතුන්ට සැපත විය. බුදුවරුන්ගේ බුද්ධමහිමය නොසිතිය හැකිය. යම් සේ පටාචාරාව විසින් ප්‍රියයන්ගෙන් වෙන්වීමෙන් හටගත් ශෝකයෙන් උමතු බවට පැමිණ.

"මගේ දරු දෙදෙනා කළුරිය කළෝය. සැමියා මාවතෙහිදී මළේය. මවද පියාද සොහොයුරාද එකම සෑයක දැවෙත්" යයි.

කියා උපන් ස්වරූපයෙන් (නිරුවතින්) හැසිරෙන්නියට "සොහොයුරිය සිහි එළවව"යි යන භාග්‍යවතුන් වහන්සේගේ වචනය සමගම උමතු බව සංසිඳුනි. එසේම සුප්පියා උවැසිය තමාම තමාගේ කලවායෙහි කරන ලද මහත් වූ තුවාලය කරණකොට නැගී සිටින්නට නොහැකි වන්නී යහන මත හුන්නී "පැමිණ වඳුව" යයි යන වචනය සමගම තුවාලය ප්‍රකෘතිමත් (සුවපත්) වූ කල්හි තෙමේම භාග්‍යවතුන් වහන්සේ වැන්දේ යැයි මෙවැනි ප්‍රවෘත්තීන් මෙහි ගෙන හැරදැක්විය යුතුය යනුයි. **එවං හනෙත** යනු සඟාමීනි යම් සේ භාග්‍යවතුන් වහන්සේ පුතු සහිත වූ ඇයගේ නීරෝගී බව බලාපොරොත්තු වන්නේ "සුවපත් වූවා නිරෝගී වූවා නිරෝගී පුතෙකු වදාවායි යි වදාල සේක් ද එය එසේමය කිසිදිනෙක භාග්‍යවත් වූ බුදුරදුන්ගේ වචනයේ වෙනස් බවක් නොවන්නේය යන අදහසයි. ඇතමෙක් වූ කලී ස්වාමීනි මෙසේ වේවායි ! කියත් අනිකක් හෝ වේවායි වචනයට අර්ථය ගෙන වර්ණනා කරත්. **අභිනන්දිත්වා** යනු භාග්‍යවතුන් වහන්සේ විසින් කොවුල් හඬ මෙන් මිහිරි වූ බ්‍රහ්ම ස්වරයෙන් එම වචනයන් වදරන කල්හි සතුටු සොම්නස් බව ලැබීමෙහි යොමුවීමෙන් සතුටු වී **අනුමොදිත්වා** යනු එයින් අනතුරුවද අනුව සතුටු වීම උපදවා සිතින් හෝ සතුටු වී වචනයෙන් අනුමෝදන්ව වාක්සම්පත්තියෙන් හෝ සතුටු වී අර්ථ සම්පත්තියෙන් අනුමෝදන් වී. **සකං ඝරං පවිචායාසි** යනු තමාගේ නිවෙස්නට පෙරළා ගියේය. යමෙක් වනාහී "යෙන සකංඝරං" යනුවෙන් ද කියත් ද ඔවුන්ගේ (ප්‍රකාශනයෙහි ලා) ඉදින් යං-තං යන ශබ්දයෙන් ගේ සම්බන්ධය නිසා "තෙන" යන පදයද කියන ලද්දේම වෙයි. එසේ වූවද "පවිසායිත්වා" යන අනෙක්

වචනයද යෙදිය යුත්තේ වෙයි. **විඤාතා** යනු වදන ලද්දීය. ප්‍රසූත කරණ ලද්දීය යන අර්ථයි. **අච්ඡරියං** යනු අහඩයාගේ කඳු නැගීම මෙන් නිතර නොවන්නේ නුයි. ආශ්චර්ය වේ. මෙ වූ කලී ශබ්දය පිළිවෙලයි. අට්ඨකථාවන්හි වූ කලී "අච්ඡරා යොගඟං" යයි කියන ලදී. අසුරුසනක් ගැසීමට සුදුසු යයි යන අර්ථයි. **වත** යනු අවධාරණයෙහි වේ. පුදුමයකි ආශ්චර්යජනකය යන අර්ථයි. "**භො**" යනු දැහැමි ඇමතීමයි. නොවූ විරූවෙනැයි **අබ්භූතං** වේ.

තථාගතස්ස යනු කරුණු අටකින් භාග්‍යවතුන් වහන්සේ තථාගත වේ. එසේ පැමිණියේනුයි තථාගත වේ. එසේ ගියේනුයි තථාගත වේ. ඇති ලකුණු පරිදි පැමිණියේනුයි තථාගත වේ. සත්‍ය වූ ධර්මයන් තතු පරිදි අවබෝධ කළේනුයි තථාගත වේ. ඇත්ත ඇති පරිදි දුටු හෙයින් තථාගත වේ. සත්‍යය ප්‍රකාශ කරන හෙයින් තථාගත වේ. තත් වූ පරිදි කටයුතු කරන හෙයින් තථාගත වේ. අභිභවනාර්ථයෙන් තථාගත වේ.

භාග්‍යවතුන් වහන්සේ කෙසේ නම් "එසේ පැමිණියේනුයි" තථාගත වේද? සියළු ලෝවැසියන්ගේ හිතසුව පිණිස උත්සාහී බවට පත් පෙර බුදුවරු යම් සේ පැමිණියහද? කිම කියන ලද්දේ වෙයි? යම් ප්‍රාර්ථනාවකින් ඒ භාග්‍යවතුන් වහන්සේලා පැමිණියාහුද අෂ්ට ගුණයන්ගෙන් සමන්විත වූ ඒ ප්‍රාර්ථනාවෙන් මේ භාග්‍යවතුන් වහන්සේ ද පැමිණි සේක. ඒ භාග්‍යවතුන් වහන්සේලා යම් පරිදි දාන - සීල නෛෂ්ක්‍රම්‍ය ප්‍රඥා - වීර්ය ක්ෂාන්ති සත්‍ය අධිෂ්ඨානය මෛත්‍රී උපේක්ෂා යන පාරමිතාවන් දස පාරමිතා දස උපපාරමිතා දස පරමත්ථ පාරමිතා යැයි සමතිසක් පාරමිතාවන් පුරා පංච මහා පරිත්‍යාගයන් පරිත්‍යාග කර පෙර ආත්මභාවයන්හි පුරුදු කරන ලද ධර්මස්කන්ධයන්ගේ අධිගතාර්ථ චර්යාවන්ද පූරණය කර බුද්ධිචර්යාවෙහි කෙළවරට පත්ව ආවාහුද මේ භාග්‍යවතුන් වහන්සේද එසේ පැමිණි සේක. යම් සේ ඒ භාග්‍යවතුන් වහන්සේලා ද සතර සතිපට්ඨානයන් -පෙ- ආර්ය අෂ්ටාංගික මාර්ගය. වඩා වර්ධනය කර ආවාහුය. එසේ මේ භාග්‍යවතුන් වහන්සේද පැමිණි සේක. එසේ පැමිණියේනුයි තථාගත වන සේක.

කෙසේ නම් "එසේ ගියේනුයි" තථාගත වන්නේ ද? යම් යම් පරිද්දකින් දන් උපන්නේ ද ඒ භාග්‍යවතුන් වහන්සේලා ද සිය පාදයන්ගෙන් පොළොවෙහි පිහිටා උතුරට අභිමුඛව සත් පියවරක් ගියාහු ශ්වේතඡත්‍රයන් දරනු ලබන කල්හි සියළු දිසාවන් බැලුවාහුය. ශ්‍රේෂ්ඨ වූ වචනයක් ප්‍රකාශ කළාහුය. ලොව තමාගේ ජ්‍යෙෂ්ඨ බව, ශ්‍රේෂඨ බව ප්‍රකාශ කරන්නා වූද

මුන් වහන්සේලා ගේ ගමන තත් වූ පරිදි විය. නන් වැදෑරුම් වූ විශිෂ්ය අධිගමනයන්ට පූර්ව නිමිත්ත හෙයින්ම නොවෙනස් වූයේද වේ. යම් පරිද්දකින් මේ භාග්‍යවතුන් වහන්සේ ගියේ ද උන්වහන්සේගේ ඒ ගමන ද එසේම විය. ඒ විශිෂ්ය අධිගමයන්ට පූර්ව නිමිත්ත වන හෙයින් නොවෙනස් විය. මෙසේ "එසේ ගියේනුයි" තථාගත වේ. ඒ භාග්‍යවතුන් වහන්සේලා යම් පරිද්දකින් නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය දුරුකර අව්‍යාපාදයෙන් ව්‍යාපාදයද ආලෝක සඤ්ඤාවෙන් ථීනමිද්ධයද අවික්ෂිප්ත බැවින් උද්ධච්ච කුක්කුච්චය ද ධර්මව්‍යවස්ථානයෙන් විචිකිච්ඡාවද දුරුකර ගියාහුද සර්වඥතාඥානයෙන් අවිද්‍යාව දෙපළ කොට (වසනා) ප්‍රමුදිත බැවින් අරතිය දුරු කර අටයි සමාපත්තීන්ගෙන්ද අටළොස් මහා විපස්සනාවන්ගෙන් ද සිව්වැදෑරුම් ආර්ය මාර්ගයෙන්ද ඒ ඒ දෙයට ප්‍රතිපක්ෂ වූ දේ (ධර්මතාවය) දුරු කර ගියාහුය. මෙසේ මේ භාග්‍යවතුන් වහන්සේද ගිය සේක. මෙසේ "එසේ ගියේනුයි" තථාගත වේ.

කෙසේ නම් "ඇති ලකුණු පරිදි පැමිණියේ නුයි" තථාගත වේද? පෘථිවී ධාතුවෙහි කර්කශ ලක්ෂණය වේ. ආපෝ ධාතුවෙහි වැගිරෙන ලක්ෂණය වේ. තේජෝ ධාතුවෙහි උණුසුම් සහගත ලක්ෂණය වේ. වායෝ ධාතුවෙහි පිම්බවීමෙහි ලක්ෂණය වේ. ආකාස ධාතුවෙහි ස්පර්ශ කළ නොහෙන ලක්ෂණය වේ. රූපයෙහි වෙනස් වීමේ ලක්ෂණය වේ. වේදනාවෙහි විඳීමේ ලක්ෂණය වේ. සංඥාවෙහි හඳුනා ගැනීමේ ලක්ෂණය වේ. සංස්කාරයන්හි සකස්කිරීම් ලක්ෂණය වේ. විඤ්ඤාණයෙහි දැන ගැනීමේ ලක්ෂණය වේ. යයි මෙසේ ස්කන්ධ පංචයේද දොළොස් ආයතනයන්ගේ ද අටළොස් ධාතූන්ගේ ද දෙවිස්සක් ඉන්ද්‍රියන්ගේ ද සත්‍ය සතරේද දොළොස් වැදෑරුම් වූ ප්‍රතීත්‍ය සමුත්පාදයේද සතර සතිපට්ඨානයේ ද සතර සම්‍යක් ප්‍රදනයේ ද සතර ඍද්ධිපාදයේද පංච බලයන්ගේ ද සප්ත බෝධ්‍යංගයේ ද ආර්ය අෂ්ටාංගික මාර්ගයේද සප්ත විශුද්ධියේ ද අමාවට බැසගත් නිර්වාණයේදැයි මෙසේ ඒ ඒ ධර්මයාගේ යම් ස්වභාව - කෘත්‍ය - ලක්ෂණයක් වේද ඒ නොවෙනස් වූ ලක්ෂණය ප්‍රඥා ස්වභාවයෙන් ලබන ලද්දේය. නොවරදවා පත් වූයේය. අවබෝධ කළේනුයි තථාගතයන් වහන්සේ මෙසේ"ඇති ලකුණු පරිදි පැමිණියේනුයි"වේ. තථාගත වේ.

සත්‍ය වූ ධර්මයන් ඇති පරිදි අවබෝධ කළේනුයි තථාගත වන සේක් නම් කෙසේ ද තථ ධර්මයෝ නම් චතුරාර්ය සත්‍යයෝය. යම් පරිද්දකින් කියන ලද ද මහණෙනි, සත්‍ය වූත් අසත්‍ය නොවූත් වෙනස් නොවන්නා වූත් ධර්මයෝ සතර දෙනකි. කවර සතරක්ද? මහණෙනි; මෙය දුක යයි යන මේ කරුණු සත්‍ය වූවකි. මෙය අසත්‍ය නොවූවකි.

මෙය වෙනස් නොවූවකි යනු විස්තරයයි. භාග්‍යවතුන් වහන්සේ ඒවා අබබෝධ කරන ලදී. එහෙයින් සත්‍ය වූ ධර්මයන් අවබෝධ කළ හෙයින් තථාගත නම් වේ. තවද ජරා මරණයෙන් ජාතිය හේතුකොටගෙන ඇති හෙයින් හටගත්, රැස් වූ අනර්ථ ඇත්තේය. සත්‍ය වූයේය. අසත්‍ය නොවූවේය. නොවෙනස් වූයේය. -පෙ- සංස්කාරයන් අවිද්‍යාව හේතුකොටගෙන ඇති හෙයින් හටගත් රැස් වූ අර්ථ ඇත්තේය. සත්‍ය වූයේ ය. අසත්‍ය නොවූයේ ය. නොවෙනස් වූයේ ය. එසේම අවිද්‍යාව සංස්කාරයන් හේතුකොටගෙන ඇත්තේය. -පෙ- ජාතිය ජරා මරණ ප්‍රත්‍ය කොට ඇත්තේය. සත්‍ය වූයේය. අසත්‍ය නොවූයේය. නොවෙනස් වූයේය. ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේ අවබෝධ කළ සේක. එහෙයින් සත්‍ය වූ ධර්මයන් අවබෝධ කළ හෙයින් තථාගත වේ. මෙහි අවබෝධ කළේ යන අර්ථ ඇත්තේ ගත ශබ්දයයි. මෙසේ සත්‍ය වූ ධර්මයන් තත් වූ පරිදි අවබෝධ කළේනුයි තථාගත වේ.

සත්‍යය දුටු බැවින් කෙසේ නම් තථාගත වේද? දෙවියන් සහිත වූ -පෙ- දෙවි මිනිසුන් සහිත වූ ප්‍රජාවගේ අප්‍රමාණ ලෝක ධාතූන්හි අප්‍රමාණ සත්ත්වයන්ගේ ඇස නම් වූ දොරටුවෙහි අභිමුඛයට පැමිණෙන්නා වූ රූපාරම්මන ඇතිද භාග්‍යවතුන් වහන්සේ ඒ සියල්ල හැම පරිද්දෙන් දනී. දකී. මෙසේ දන්නා වූ දක්නා වූ උත්වහන්සේ විසින් (ඒවා) ප්‍රිය අප්‍රිය වශයෙන් හෝ දකීම් - ඇසීම් - ස්පර්ශ කිරීම් - දැනීම් යන තන්හි ලබනු ලබන පද වශයෙන් හෝ ඒ රූපය කවරේද? රූපායතනය කවරේද යම් රූපයක් සතර මහාභූතයන් ඇසුරු කොට ඇති වර්ණයන්ගේ බැබලීම් නිදසුන් සහිතව ගැටීම් සහිතව නිල් පැහැය ඇත්තෙක. කහ පැහැය ඇත්තෙක ආදී ක්‍රමයෙන් නොයෙක් නම් වලින් තෙලෙස් වාරයෙන් හෝ දෙපණස් ක්‍රමයෙන් හෝ පවත්නේ එයට වෙයි වෙනස් නොවෙයි. මේ පිළිවෙළ සෝත (කණ) නම් වූ දොරටුව ආදී දොරටුවල අභිමුඛයට පැමිණෙන්නා වූ ශබ්ද ආදීන් කෙරෙහි, භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වදාරන ලදී. "මහනෙනි, යමක් දෙවියන් සහිත ලෝකයා විසින් -පෙ- දෙවි මිනිසුන් විසින් දක්නා ලද ද අසන ලද ස්පර්ශ කරන ලද ද පැමිණෙන ලද ද සොයන ලද ද මනසින් හැසිරෙන ලද ද එය මම දනිමි. එය මම අවබෝධ කරන ලදිමි. එය තථාගතයන් වහන්සේ විසින් දන්නා ලදී. තථාගතයන් වහන්සේ විසින් වටහා ගන්නා ලදී" යයි. මෙසේ සත්‍යය දක්නා ලද බැවින් තථාගත වේ. එහි සත්‍යය දක්නා අර්ථයෙහි තථාගත වෙයි. -පෙ- පදයාගේ හමුව දතයුතුයි.

ඇත්ත ඇති පරිදි ප්‍රකාශ කරන හෙයින් කෙසේ නම් තථාගත

වන සේක් ද? යම් රාත්‍රියකදී භාග්‍යවතුන් වහන්සේ නිරුත්තර වූ සම්මා සම්බුද්ධත්වය අවබෝධ කරන ලදද? යම් රාත්‍රියක දී නිරුපධිසේස පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන්පාන ලදද මේ අතර පන්සාළිස් වසරක් පමණ වූ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් සුත්ත ගෙය්‍ය ආදී යමක් දේශනා කරන ලදද ප්‍රකාශ කරන ලදද ඒ සියල්ල පිරිසිදුය පිරිපුන්ය. රාග - මද ආදිය මැඩලන්නේය. එක හා සමානය. සත්‍යය. අසත්‍ය නොවේ. එහෙයින් කියන ලදී. චුන්දය යම් රාත්‍රියක තථාගතයන් වහන්සේ නිරුත්තර සම්මා සම්බුද්ධත්වය අවබෝධ කරන ලද ද යම් රාත්‍රියක නිරුපධිසේස පරිනිර්වාණයෙන් පිරිනිවන්පානා සේක් ද මේ අතරදී යමක් දේශනා කරයි ද ප්‍රකාශ කරයි ද දක්වයි ද ඒ සියල්ල එසේම වේ. වෙනස් නොවේ. එහෙයින් තථාගත යයි කියනු ලැබෙයි. මෙහි "ගත" ශබ්දය ප්‍රකාශන අර්ථය ඇත්තේ වේ. මෙසේ ඇත්ත ඇති පරිදි දේශනා කරන හෙයින් තථාගත වේ. තවද ප්‍රකාශ කරනුයේ ආගදෝ වේ. වචනය යන අර්ථයි. එම අර්ථය ඇති කල්හි ඒ සියල්ල ඇති පරිද්දෙන් නොවෙනස්ව විපරීත නොවී පැමිණියේ මෙතැන්ට යැයි අර්ථයෙන් "ද" කාරයට "ත" කාරය ආදේශ කර "තථාගත" වෙයි. මෙහි පද සිද්ධිය මෙසේ දත යුතුයි.

එසේ කරන හෙයින් කෙසේ නම් තථාගත වේද? භාග්‍යවතුන් වහන්සේ වූ කලී වචනයෙහි කය තවරයි. කයෙහි වචනය තවරයි එහෙයින් යම් සේ කියයිද එසේ කරයි. යම් සේ කරයිද එසේ කියයි ද වේ. මෙසේ වූ උන්වහන්සේ ගේ වචනය යම් පරිදි වේද කයද එසේ පැවතියේය යන අර්ථයි. කය යම් පරිදි ද වචනයද එසේ ගියේනුයි තථාගත වේ. එහෙයින් කියන ලදී. "මහණෙනි තථාගතයන් වහන්සේ යමක් ප්‍රකාශ කරන්නේද එසේ කරන්නේ වෙයි. යම් සේ කරන්නේද එසේ කියන්නේ වෙයි. මෙසේ යථාවාදී තථාකාරිද යථාකාරී තථාවාදී ද වෙයි. එහෙයින් තථාගත" යයි කියනු ලැබේ යනුයි. මෙසේ "එසේ කරන හෙයින් තථාගත"වේ.

අභිභවනාර්ථයෙන් කෙසේ නම් තථාගත වේද? යම් හෙයකින් මත්තෙහි භවාග්‍රයෙහි සිට යටින් අවීචිය කෙළවර කර සරසට සියළු ලෝකධාතූන්හි සියළු සත්ත්වයන් සීලයෙන්ද සමාධියෙන් ද ප්‍රඥාවෙන් ද විමුක්තියෙන්ද විමුක්ති ඥාණ දර්ශනයෙන්ද යටපත් කරයි ද උන්වහන්සේ පිළිබඳව කිරීම් හෝ මිනීම් හෝ නොමැත. (සමාන නැත) තවද අසමානය. පමණ කළ නොහැක. නිරුත්තරය. දෙවියන්ට දෙවිය. ශක්‍රයන්ට මහා ශක්‍රයෙකි. බ්‍රහ්මයන්ට මහා බ්‍රහ්මයෙකි. සියළු සත්ත්වයන්ට උතුමෙකි.

එහෙයින් තථාගත වේ. එහෙයින් කියන ලදී. "මහණෙනි, තථාගතයන් වහන්සේ දෙවියන් සහිත ලෝකයෙහි -පෙ- මිනිසුන් අතර මැඩ පවත්වන්නෙකි. නොමැඩුනෙකි. අන් තැනක නොඳුකිය හැක්කෙකි. ලොවම තමා වසඟයෙහි පවත්වන්නෙකි. එහෙයින් තථාගත යයි කියනු ලැබේ. යනුයි. මේ එහි පද සිද්ධියයි. දේශනා විලාසයද පින් මහිමයද බෙහෙතක් මෙනි. එහෙයින් උන්වහන්සේ මහ තෙදැති වෛද්‍යවරයකු මෙන් දිව්‍යමය ඖෂධයෙන් සර්පයන් දමනය කරන්නාක් මෙන් සියළු අන්‍ය මතවාදීන්ද දෙවියන් සහිත ලෝකයාද මැඩපවත්වයි. මෙසේ සියළු ලෝකයා මුළුමනින් මැඩ පවත්වන හෙයින් කියන ලද පරිදි වූ දේශනා විලාශයෙන් ම හටගත්තා වූද පින් මහිමයෙන් හටගත්තා වූද බෙහෙත මුන්වහන්සේට වූයේනුයි වේ. "ද" කාරයට "ත" කාරය ආදේශ කර "තථාගත" යයි දතයුතුය. මෙසේ අභිභවනාර්ථයෙන් තථාගත වේ.

තවද එසේ ගියේනුයි තථාගත වේ. එහිදී තථාගතයන් වහන්සේ සියළු ලෝකය විනිශ්චය කිරීමේ විශේෂ නුවණින් අවබෝධ කළේනුයි තථාගත වේ. තථාගතයන් වහන්සේ ලොව හටගැනීම ප්‍රහාණය කිරීමේ විශේෂ නුවණින් ඉක්ම වූයේනුයි තථාගත වේ. තථාගතයන් වහන්සේ ලෝක නිරෝධය ප්‍රත්‍යක්ෂ කිරීමේ නුවණින් අවබෝධ කළේනුයි තථාගත වේ. තථාගතයන් වහන්සේ ලෝක නිරෝධගාමිනී පටිපදාවට පැමිණියේනුයි තථාගත වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය කියන ලදී. "මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් ලෝකය අවබෝධ කරන ලදී. තථාගතයන් වහන්සේ ලෝකයා හා නොයෙදුනේය. මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් ලොව හට ගැනීම අවබෝධ කරන ලද්දේය තථාගතයන් වහන්සේ ලෝක සමුදය ප්‍රහීණය කරන ලදී. මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් ලෝක නිරෝධය අවබෝධ කරන ලද්දේය. තථාගතයන් වහන්සේ ලෝක නිරෝධය සාක්ෂාත් කරන ලදී. මහණෙනි තථාගතයන් වහන්සේ විසින් ලෝක නිරෝධගාමිනී පටිපදාව අවබෝධ කරන ලදී. තථාගතයන් වහන්සේ ලෝකනිරෝධගාමිනි පටිපදව වඩන ලදී. මහණෙනි යමක් දෙවියන් සහිත ලෝකයාගේ -පෙ- ඒ සියල්ල තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලදී. එහෙයින් තථාගත යයි කියනු ලැබේ යනුයි.

වෙනත් වූ කාරණා අටකින්ද භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වන සේක. ඇති පරිදි ආවේ නුයි. තථාගත වේ. ඇති පරිදි ගියේ නුයි. තථාගත වේ. තථ වූ ධර්මයන් අවබෝධ කළේ නුයි තථාගත වේ. එසේ අවබෝධ කළේනුයි තථාගත වේ. එසේ වූයේ නුයි තථාගත වේ.

එසේ පැවතියේ නුයි තථාගථ වේ. තථ ධර්මයන් ගෙන් පැමිණියේ නුයි තථාගත වේ. එසේ ගිය හෙයින් තථාගත වේ.

කෙසේ ඇති පරිදි ආවේනුයි තථාගත වේද? යම් සේ සුමේධ තාපස නම් වූ භාග්‍යවතුන් විසින් දීපංකර බුදුරදුන්ගේ පාමුලදී

"මිනිසත් බව, ලිංග සම්පත්තිය, වාසනා ගුණය, ශාස්තෘ දැක්ම පැවිද්ද, ගුණ සම්පත්තිය, ප්‍රාර්ථනය හා කැමැත්ත ඇති බව යන අටවැදෑරුම් ධර්මයන් ගේ එකතුවෙන් ප්‍රාර්ථනාව සමෘද්ධ වේ" යනුයි.

මෙසේ කියන ලද අටවැදෑරුම් ගුණයන්ගෙන් යුක්ත වූ ප්‍රාර්ථනය සම්පාදන කරන්නාහු විසින් ලොව තරණය කළ මම දෙවියන් සහිත ලෝකයා තරණය කරවන්නෙමි. මිදුනෙමි මුදවන්නෙමි දමනය වූවෙමි දමනය කරවන්නෙමි. සන්සිඳුනෙමි. සන්සිඳුවන්නෙමි. අස්වැසුනෙමි. අස්වසවන්නෙමි. පිරිනිවුනෙමි. පිරිනිවන් පාවන්නෙමි. අවබෝධ කළෙමි අවබෝධ කරවන්නෙමි.යි මහා ප්‍රතිඥාවක් පවත්වන ලදී. මෙසේ කියන ලදී.

වීර්යවන්ත පුරුෂයෙකු ලෙස හුදකලාව සසර තරණය කිරීමෙන් මට කවර ප්‍රයෝජනයක් ද? සර්වඥතාඥානයට පත් වී දෙවියන් සහිත ලෝකයා තරණය කරවන්නෙමි.

වීර්යවන්ත පුරුෂයෙකු ලෙස මවිසින් මේ ප්‍රාර්ථනයෙන් සර්වඥතාඥානයට පත් වී බොහෝ ජනයා තරණය කරමි .

සසර නැමති සැඩ පහර සිඳ තුන් භවය පිළිබඳ ආශාව වනසා ධර්මය නමැති නැවට නැග දෙවියන් සහිත ලෝ වැස්සන් තරණය කරවන්නෙමි.

මෙහිලා අප්‍රසිද්ධ වේශයෙන් ධර්මය අබබෝධ කිරීමෙන් කවර ප්‍රයෝජනයක්ද? සර්වඥතා ඥානයට පත් වී දෙවියන් සහිත ලෝකයෙහි බුදුවන්නෙමි.

සියළු බුද්ධකාරක ධර්ම ම සමූහයට හේතූන් සොයා බැලීම ගැනීමට කාරණයන් වූ ඒ මේ ප්‍රතිඥාව නොවලහන්නා වූ ලෝකනායක වූ බෝසත් තෙමේ යම්හෙයකින් මහා කල්ප ලක්ෂයක් අධික වූ අසංඛ්‍ය කල්ප සතරක් මනාව නිරන්තරයෙන් මුළුමනින් දාන පාරමිතා ආදී සමතිසක් පාරමිතාවන් පුරා අවයව පරිත්‍යාගය කිරීම් ආදී මහා පරිත්‍යාගයන් පරිත්‍යාග කර සත්‍ය අධිෂ්ඨානාදී සතර අධිෂ්ඨානයන්

වඩා පුණ්‍යමය ඤාණ සම්භාරය සම්පූර්ණ කර පුබ්බයෝග පුබ්බචර්යා ධර්මාඛ්‍යාන ඤාතාර්ථචර්යාවන් උපරිමයට ගෙන බුද්ධිමය චර්යාව පරම නිමාවට පමුණුවා නිරුත්තර වූ සම්මා සම්බුද්ධත්වය අවබෝධ කළේය. මෙසේ උන් වහන්සේගේ මෙම ප්‍රතිඥාව එලෙසම වීය. නොවෙනස් වීය. ඒ ප්‍රාර්ථනාවේ අස්ලොමක් පමණද වෙනසක් නොමැත. ඒ එසේමැයි දීපංකර බුදුරජ, කොණ්ඩඤ්ඤ කස්සප -පෙ- කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ යැයි මේ සූවිසි බුදුවරු පිළිවෙලින් උපන්නාහූ බුදුවන්නේ යයි ප්‍රකාශ කලාහූය. මෙසේ සූවිසි බුදුවරුන්ගේ සමීපයෙහි ලබන ලද වියරණ ඇත්තේ කරන ලද ප්‍රාර්ථනා ඇති බෝධිසත්ත්වයන් විසින් ඒ මේ යමක් ලද යුත්තේද ඒ ප්‍රතිඵල ලැබම පැමිණියේ නුයි, කියන ලද පරිදි වූ මහා ප්‍රතිඥාවෙන් බුද්ධත්වයට පැමිණියේ අවබෝධ කළේනුයි මෙසේ ඇති පරිදි ආවේනුයි තථාගත වේ.

ඇති පරිදි ගියේනුයි කෙසේ නම් තථාගත වේද? යම් සේ ලෝකනාථයන් වහන්සේ මහා කරුණාවෙන් බලන්නේ මහත් වූ දුක් ගැහැටට පිළිපන් සත්ත්ව සමූහයා දැක ඔහුට අන් කිසි පිළිසරණක් නැත. මේ සසර දුකින් මිදුනු මම ම ඔහුවද මුදවන්නෙමිය උත්සාහී සිත් ඇත්තේ මහත් වූ ප්‍රාර්ථනා කළේය. එසේ කර ප්‍රාර්ථනය යම් සේද (එසේ) සියළු ලෝවැස්සන් වෙත හිතසුව සම්පාදනය සඳහා උත්සාහී බවට පැමිණියේ තමාගේ ජීවිතය පිළිබඳ අපේක්ෂාව අත් හරනා ලද්දේ අන්‍යයන්ගේ සවන් මඟට පැමිණි පමණින්ද සිත්හි තැති ගැන්ම උපදවන්නා වූ අතිශයින් දුෂ්කර වූ දුෂ්කර චර්යාවන් සම්පූර්ණ කරන්නේ (එහි හැසිරෙන්නේ), යම් සේ මහා බෝධියට ප්‍රතිපක්ෂ වූ පිරිහෙලන සුළු වූ කෙලෙස් බර වූ සසර පැවත්මට හේතු වූ (සාධක) නොවේද, තවද මතුමත්තේ අධිගමය ලබා දෙන සුළු වූයේද වෙයිද එසේ පිළිපදිනු ලබන්නේ පිළිවෙලින් සියළු බෝධිසම්භාර ධර්මයන් සම්පූර්ණ කර බුද්ධත්වයට පත් වූයේය. ඉන් අනතුරුවද ඒ මහා කරුණාවෙන්ම මෙහෙයවන ලද සිත් ඇත්තේ විවේකයෙහි ඇල්ම කෙළවර කර ඇති ශාන්ත වූ විමුක්ති සුවය අතහැර අඥාන ජනයන් බොහෝ කොට ඇති ලෝකයෙහි ඔවුන් විසින් එළඹවනු ලබන විකාරයන් ගණන් නොගෙන හික්මවිය යුතු ජනයා හික්මවීමෙන් බුද්ධ කාර්යය මුළුමනින්ම නිමවිය. එහිලා සත්ත්වයන් පිළිබඳව භාග්‍යවතුන් වහන්සේගේ මහා කරුණාවෙහි යම් සමව බැස ගැනීමේ ස්වභාවයක් වේද එය පිටතට ප්‍රකාශ වේ. බුද්ධත්වයට පත් ලෝකනාථයන්ගේ සත්ත්වයා පිළිබඳ යම් සේ මහා කරුණාවක් වේද මෙසේ බෝසතුන් වූවහුගේ ද මහා ප්‍රාර්ථනා භූමියන්හිද

සියළු තැන සැමදා එක හා සමාන වේ. එසේම ඒ මහා කරුණාව වෙනස් නොවේ. අන් පරිදි නොවේ, එහෙයින් තුන් වැදෑරුම් අවස්ථාවන්හිදී සියළු සත්වයන් කෙරෙහි සමාන වූ ඇති පරිදි වූ මහා කරුණාවෙන් සියළු ලෝ වැස්සන්ගේ හිතසුව පිණිස ගියේය. පිළිපන්නේයයි තථාගත වේ.

කෙසේ නම් තත් පරිදි වූ ධර්මයන් අවබෝධ කළේනුයි තථාගත වේද? තථ නම් වනුයේ ආර්යමාර්ග ඤාණයන්ය. ඒවා වූ කලී මෙය දුකය, මෙය දුකට හේතුවය, මෙය දුක්ඛ නිරෝධය ය, මේ දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාව යැයි මෙසේ සියළු දතයුතු ධර්ම සමූහයන්ගේ පැවැත්ම, නැවැත්ම හා ඒ දෙකට හේතු වූ සිව්සස්හි, දුක්ඛ ආර්ය සත්‍යයේ පීලනාර්ථය. හේතූන් නිසා හටගත් අර්ථය. තාපනාර්ථය විපරිනාමාර්ථය ද සමුදය ආර්ය සත්‍යයේ රුස් කිරීමේ අර්ථය හේත්වර්ථය. සංයෝගාර්ථය පළිබෝධාර්ථය ද නිරෝධ සත්‍යයේ නිස්සරණාර්ථය විවේකාර්ථය හේතූන් නිසා නොහටගත් අර්ථය අමෘතාර්ථයද මාර්ග සත්‍යයේ නෛර්යාණිකර්ථය හේත්වර්ථය දර්ශනාවර්ථය අධිපති අර්ථයදයි මේ අයුරින් ඒ හා බැඳුන කොටස් වල තත් වූ පරිදි අවබෝධය, බැඳීම් සහිත කෙලෙස් හී මුලින් උපුටා දැමීමෙන් ලබන ලද, එහිලා නුමුලාව අවබෝධ කිරීම් සංඛ්‍යාත විපරීත නොවූ අයුරින් පැවති ධර්මයන්ගේ ස්වභාවය ස්වකීය කෘත්‍යය ලක්ෂණය යන මොහුගේ නොමුලාවෙන් තත් වූද අවිතථ වූද නොවෙනස් වූද යම් ධර්මයෝ වෙත්ද ඒවා භාග්‍යවතුන් වහන්සේ අනිකෙකුගෙන් අවබෝධ කොට නොව තෙමේම අවබෝධ කරන ලදී. එහෙයින් තත් වූ ධර්මයන් අවබෝධ කළේනුයි තථාගත වේ. යම් සේ මාර්ග ඤාණයන් වේද ඒවා මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් තෙකල්හි නොනට ඤාණයන් වේද සිව් වැදෑරුම් පටිසම්භිදා ඤාණයන් ද සිවු වැදෑරුම් විසාරද ඤාණයන් ද පස් වැදෑරුම් ගති සීමාවන් පිළිබඳ ඤාණයන් ද සවැදෑරුම් අසාධාරණ ඤාණයන් ද සප්ත බෝධ්‍යංගයන් වැඩීමේ ඤාණයන් ද අටවැදෑරුම් මාර්ගාංග වැඩීමේ ඤාණයන්ද නව වැදෑරුම් මාර්ග අනුපූර්ව සමාපත්ති ඤාණයන්ද දසබල ඤාණයන් ද "තථ"භාවයෙහි ලා දත යුතුය. මේ එහි විවරණයයි. යම්කිසි අප්‍රමාණ වූ ලෝක ධාතූන්හි අප්‍රමාණ වූ සත්වයන්ගේ පහත් ආදී වූ භේදයන්ගෙන් බිඳුනා වූ අතීත ස්කන්ධ ආයතන ධාතූන්හි ස්වභාව කෘත්‍යයන් අවස්ථා විශේෂයන්, ස්කන්ධයන් හා බැඳුනා වූ නාම - ගෝත්‍රයන් දතයුත්තේ ද, ඉඳුරියබද්ධ නොවූ ඉතා සියුම් බිත්තියෙන් එපිට පටන් ඉතා දුර දේශයන් හිද රූප ධර්මයන්හිද ඒ ඒ ප්‍රත්‍ය විශේෂයන් සමඟ

හේතූන් නිසා උපන්නා වූ වර්ණය පෙනීම ගන්ධය රසය ස්පර්ශය ආදී විශේෂ වේද ඒ සියළු තන්හීම අත්තලයෙහි තබන ලද නෙල්ලි ගෙඩියක මෙන් ප්‍රත්‍යක්ෂයෙන් නොගැටුන ඤාණය භාගය්‍යතුන් වහන්සේගේ පවතී. අනාගත- වර්තමානයෙහිදී එසේම වේ යයි මෙසේ තුන් කල්හි නොගැටුන ඤාණයන් නම් වේ. යම් පරිද්දකින් කියන ලද්දේය. භාග්‍යවත් වූ බුදුරදුන්ගේ අතීතයෙහි වූ අපපටිහත ඤාණය. භාග්‍යවත් වූ බුදුරදුන්ගේ අනාගතයෙහි වූ අපපටිහත ඤාණයයි භාග්‍යවත් බුදුරදුන්ගේ වර්තමානයේ වූ අපපටිහත ඤාණයයි. ඒ මේවා ඒ ඒ තන්හි වූ ධර්මයන්ගේ ස්වභාවය ස්වකීය කෘත්‍යය ලක්‍ෂණය යන මේවායේ වෙනස් නොවූයෙන් තථ වූද අවිපරීත වූද නොවෙනස් වූද වේ. ඒවා භාග්‍යවතුන් වහන්සේ ස්වයම්භූඤාණයෙන් අවබෝධ කෙරේනුයි මෙසේ තත්පරිදි වූ ධර්මයන් ගේ අවබෝධ කළේනුයි තථාගත වේ.

එසේම අත්‍ථ පටිසම්භිදා ධම්ම පටිසම්භිදා නිරුත්ති පටිසම්භිදා පටිභාග පටිසම්භිදා යයි පටිසම්භිදා ඤාණයෝ සතරක් වෙත්. එහි විවිධ වූ අර්ථයේ සැලකීම ප්‍රකට කිරීම වෙනස් කිරීම යන මෙයට සමාර්ථ වූ අර්ථ ප්‍රභේදගත ඤාණය අත්‍ථ පටිසම්භිදාව වේ. ධර්ම ප්‍රභේදයන්ගේ සැලකීම ප්‍රකට කිරීම වෙන් කිරීම යන මෙයට සමර්ථ වූ ඤාණය ධර්මපටිසම්භිදාව වේ. නිරුක්ති (පදසිද්ධිය) ප්‍රභේදයේ සැලකීම ප්‍රකට කිරීම වෙන් කිරීම යන මෙහි සමර්ථවූ පද සිද්ධි ප්‍රකාශයෙහි වූ ඤාණය නිරුත්ති පටිසම්භිදා ඤානය වේ. වැටහීම් ප්‍රභේදයේ සැලකීම ප්‍රකට කිරීම වෙන් කිරීම යන මෙහි සමර්ථ වූ වැටහීමේ ප්‍රභේදගත වූ ඤාණය පටිභාන පටිසම්භිදා ඤාණය වේ. මෙය කියන ලද්දේ වෙයි. අර්ථයන්හි ඤාණය අත්‍ථපටිසම්භිදා ඤාණය වේ. ධර්මයෙහි ඤාණය ධර්ම පටිසම්භිදාඤාණය වේ. අර්ථ - ධර්ම - නිරුත්ති යන මෙය ප්‍රකාශනයෙහි ඤාණය නිරුත්ති පටිසම්භිදා ඤාණය වේ. වැටහීම් ඤාණයන්හි ඤාණය පටිභාණ සම්භිදා ඤාණය වේ. මෙහිද හේතූන් අනුසාරයෙන් පැමිණවිය යුතු හෙයින් ද අවබෝධ කටයුතු හෙයින්ද කෙටියෙන් හේතු - ඵලය යන අර්ථය නම් වේ. කොටස් වශයෙන් වනාහි හේතුවෙන් උපන් යමක් වේද එයද නිවාණය ද ප්‍රකාශිත අර්ථයද, විපාකයද ක්‍රියාවද්‍යි මේ ධර්මයෝ පස් දෙන "අර්ථය" වේ. ඒ අර්ථය සලකණු ලබන්නාහුට එම අර්ථයෙහි වෙන් වෙන් කොටස් හා බැඳුන ඤාණය අර්ථ පටිසම්භිදා නම් වේ. ධර්මය යනු කෙටියෙන් හේතුවයි. එය වූ කලී යම් හෙයකින්

ඒ ඒ අර්ථය ප්‍රකාශ කෙරේද පවත්වයිද පමුණුවයිද එහෙයින් ධර්මය යයි කියනු ලබයි. ප්‍රභේද වශයෙන් වනාහි එලයක් උපදවන්නා වූ යම්කිසි හේතුවක් වේද එයද, ආර්ය මාර්ගයද ප්‍රකාශිත ධර්මයද, කුසලයද, අකුසලය දැයි මේ පස් වැදෑරුම් ධර්මයෝය. ඒ ධර්මය සලකනු ලබන්නහුට ඒ ධර්මයෙහි වෙන් වෙන් කොටස්ගත වූ ඤාණය ධම්මපටිසම්භිදා ඤාණය වේ. මෙයද කියන ලද්දේ වෙයි. දුක පිළිබඳ ඤාණය අත්ථපටිසම්භිද ඤාණය වේ. දුක ඇතිවීමට හේතුවෙහි ඤාණය ධම්මපටිසම්භිද ඤාණය වේ. දුක දුරලීමෙහි ඤාණය අත්ථපටිසම්භිදා ඤාණය වේ. දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදාවෙහි ඤාණය ධම්මපටිසම්භිදා ඤාණය වේ යනුයි. තවද හේතුවෙහි ඤාණය ධම්ම පටිසම්භිදාව වේ. හේතු ඵලයෙහි ඤාණය අත්ථ පටිසම්භිද ඤාණය වේ. යම් ධර්මයෝ තුමූ හටගත්තෝ ද සිදුවූවෝ ද උපන්නෝ ද නිපන්නෝ ද පහල වූවෝද වෙත් නම් මේ ධර්මයන් පිළිබඳ ඤාණය අත්ථපටිසම්භිද ඤාණය වේ. යම් හේතුවකින් ඒ ධර්මයෝ හටගත්තෝද සිදුවූවෝ ද උපන්නෝද. නිපන්නෝද පහල වූවෝද වෙත් නම් ඒ ධර්මයන් පිළිබඳ ඤාණය ධම්ම පටිසම්භිදා ඤාණය වේ. ජරා මරණ පිළිබඳ ඤාණය අත්ථපටිසම්භිදා ඤාණය වේ. ජරා මරණ ඇති වීමට හේතුව පිළිබඳ ඤාණය ධම්ම පටිසම්භිද ඤාණය වේ. ජරා මරණ දුරු කිරීමේ ඤාණය අත්ථ පටිසම්භිද ඤාණය වේ. ජරා මරණ දුරු කිරීමෙහි ප්‍රතිපදා ඤාණය ධම්ම පටිසම්භිද ඤාණය වේ. ජාතියෙහි භවයෙහි උපාදානයෙහි තෘෂ්ණාවෙහි වේදනාවෙහි ස්පර්ශයෙහි ෂට් ආයතනයෙහි නාම රූප දෙකෙහි විඤ්ඤාණයෙහි සංස්කාරයන්හි ඤාණය අත්ථ පටිසම්භිද ඤාණය වේ. සංස්කාරයන් ඇතිවීම පිළිබඳ ඤාණය ධම්ම පටිසම්භිද ඤාණය වේ. සංස්කාරයන් දුරුකිරීමෙහි ඤාණය අත්ථපටිසම්භිද ඤාණය වේ. සංස්කාරයන් දුරු කිරීමේ ප්‍රතිපදාවෙහි ඤාණය ධම්මපටිසම්භිදා ඤාණය වේ. මහණෙනි මේ ශාසනයෙහි භික්ෂුව සූත්‍ර-ගාථා -පෙ- වේදල්ල නම් වූ ධර්මය දනිද මෙය ධම්මපටිසම්භිදා ඤාණය වේ. හෙතෙම ඒ ඒ ධර්මයාගේ ප්‍රකාශිත අර්ථය දනිද මෙය මේ ධර්මයේ ප්‍රකාශිත අර්ථයයි. මේ මේ ධර්මයේ අර්ථයයි දනිද මෙය අත්ථපටිසම්භිදා ඤාණය වේ. කුසල ධර්මයෝ නම් කවරහුද යම් කලෙක්හි කාමාවචර කුසල් සිතක් උපන්නේ වේද සොම්නස් සහගත ඤාණ සම්ප්‍රයුක්ත රූපාරම්මණයක් හෝ -පෙ- ධර්මාරම්මණයක් හෝ උපන්නේ වේද යමක් යමක් හෝ අරබයා එකල්හි ස්පර්ෂයක් වේද -පෙ- චංචල රහිත බවක් වේද මේ

ධර්මයෝ කුසල්යැයි මේ ධර්මයන්හි ඤාණය ධම්ම පටිසම්භිද ඤාණය වේ. ඔවුන්ගේ විපාකය පිළිබඳ ඤාණය අත්ථපටිසම්භිද ඤාණය වේ. මේ ආදිය විස්තර වේ. යම් හෙයකින් මේ අර්ථයෙහිද ධර්මයෙහිද ස්වභාව නිරුක්තිය සම්පාර්ථ ව්‍යවහාරය ප්‍රකාශනය යන යමක් වේද ඒ ස්වභාවය නිරුක්තිය සම්පාර්ථ ව්‍යවහාරය හා ප්‍රකාශනයෙහිලා සියළු සත්ත්වයන්ගේ මුල් භාෂාව වූ මාගධියෙහි මේ ස්වභාවය නිරුක්තිය යැයි වෙන් වෙන් වූ ඤාණය නිරුත්ති පටිසම්භිද ඤාණය වේ. යට කියන ලද ඒ ඤාණයන්හි අරමුණු කාර්ය වශයෙන් හෝ විස්තර වශයෙන් හෝ පැවති ඒ සියළුම ඤාණය අරමුණු කොට නැවත විමසා බලන්නහුට ඒ ඤාණයෙහිලා වෙන් වෙන් පරිදි වූ නුවණ පටිසම්භිදා ඤාණය වේ. මෙසේ මේ සිව් වැදෑරුම් පටිසම්භිද ඤාණයන් භාග්‍යවතුන් වහන්සේ විසින් තෙමේම අවබෝධ කරගත්තේ වේ. අර්ථ ධර්ම ආදී වූ ඒ ඒ තමා විෂයෙහි නොගැලපීම් වශයෙන් හෝ නොවෙනස් ආකාරයෙන් පැවතීම් වශයෙන් සත්‍ය වූයේ වෙයි. නොවෙනස් වූයේ වෙයි. අන් අයුරක් නොවූයේ වෙයි. මෙසේද භාග්‍යවතුන් වහන්සේ තත් පරිදි වූ ධර්මයන් අවබෝධ කළේනුයි තථාගත වේ.

එසේම ඤෙය්‍ය(දත යුතු)යයි යම් කිසිවක් වේද භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ සියල්ල දන්නා ලදී. දක්නා ලදී. අවබෝධ කරන ලදී. තෙමේම අවබෝධ කරගන්නා ලදී ඒ එසේමැයි අවබෝධ කටයුතු ධර්මයෝ අවබෝධ කටයුතු ලෙස අවබෝධ කරන ලද්දාහ. පිරිසිඳ දතයුතු ධර්මයෝ පිරිසිඳ දතයුතු ලෙස ද ප්‍රහාණය කටයුතු ධර්මයෝ ප්‍රහාණය කළයුතු ලෙසද ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කළයුතු ලෙසද වැඩිය යුතු ධර්මයෝ වැඩිය යුතු ලෙසද අවබෝධ කරන ලද්දාහ. යම්හෙයකින් උන්වහන්සේට කවර හෝ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ "මෙනම් වූ ඒ ධර්මයෝ අවබෝධ නොකරන ලදහයි" දැහැමිව (සෘජුව) අභියෝග කරන්නට සමර්ථයෙක් නැත. යම් කිසිවක් ප්‍රහීණය කළ යුත්තේ නම් ඒ සියල්ල බෝධිමූලයෙහිදීම ප්‍රහාණය කරන ලදී. නොඋපදින ස්වභාවය ඇත්තේ වීය. උන්වහන්සේට ප්‍රහාණය කළ යුතු දේ ප්‍රහාණය කිරීම සඳහා මත්තෙහි කළ යුත්තක් නැත. ඒ එසේමැයි. උන්වහන්සේ විසින් ලෝභ-දෝස-මෝහ විපිළිසර මනස්කාරයන් - ලජ්ජා නැති බව බිය නැති බව කායික මානසික අලස බව (ථීන-මිද්ධ) ක්‍රෝධය බද්ධ වෛරය -මකු බව, අනුන්ගේ දොස් දැකීම ඊර්ෂ්‍යාව - මසුරු බව - මායාව - කපටි

බව - තද බව එකටෙක කිරීම - මානය අතිමානය මදය - ප්‍රමාදය. ත්‍රිවිධ අකුසල මූලය. දුශ්චරිතය විසම සංඥාව කිළිටි සහගත විතර්කය. ප්‍රමාදයට හේතු වන කෙලෙස් සෙවීම. තෘෂ්ණාව. සිව් වැදෑරුම් විපරිත සෙවීම. ආශ්‍රවය ග්‍රන්ථය. ඕඝය. යෝගය. ගැටය තෘෂ්ණා උපාදානය. පස් වැදෑරුම් අභිනන්දනය නිවාරණය. චෛතසික හුල් සිතෙහි බැඳීම්. සවැදෑරුම් විවාද මූලයන්. සත් වැදෑරුම් අනුසයන් අටවැදෑරුම් මිථ්‍යා බව නව වැදෑරුම් ආඝාත වස්තූන් තෘෂ්ණා මූලයන් දස අකුසල කර්ම පථයන් එක් විසි අනේසනයන් දෙසැටක් දුෂ්ටින් අටසියයක් තෘෂ්ණා විචරිත ආදී ප්‍රභේද ඇති එක්දහස් පන්සියයක් කෙලෙස් වාසනා ගුණයද සමඟ ප්‍රහාණය කරන ලදී. මුලිනුපුටන ලදී. නසන ලදී. යම්හෙයකින් උන්වහන්සේට කිසියම් ශ්‍රමණයෙක් හෝ -පෙ- බ්‍රාහ්මණයෙක් හෝ මෙනම් වූ ක්ලේශයෝ ප්‍රහාණය නොකරණ ලද්දෝ යයි දැහැමිව (සෘජුව) අභියෝග කරන්නට සමර්ථයෙක් නම් නැත. භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ කර්ම- විපාක- කෙලෙස් උපවාද- ආඥා විතර්ක ආදී ප්‍රභේදගත වූ යමක් වේද ඒවා සේවනය කිරීමෙන් ඒකාන්තයෙන් අන්තරාය පිණිස යෝග්‍ය වන්නේ යයි දේශනා කරන ලද ද යම්හෙයකින් කිසියම් ශ්‍රමණයෙක් හෝ -පෙ- බ්‍රහ්මයෙක් හෝ ඒවා ඇසුරු කිරීමෙන් ඒකාන්තයෙන් අන්තරාය පිණිස යෝග්‍ය නොවන්නේ යයි අභියෝග කරන්නට සමර්ථයෙක් නැත. යම්සේ භාග්‍යවතුන් වහන්සේ විසින් සාංසාරික දුක් මුළුමනින්ම දුරලීම සඳහා ආර්ය මාර්ගය පෙරටු කර ඇති සීල සමාධි ප්‍රඥාවන්ගේ සංග්‍රහයක් කොටස් වශයෙන් සතක් වූ සත්තිස් ප්‍රභේදගත වූ නෛර්යාණික ධර්මයක් දේශනා කරන ලදද ඒ ධර්මය ඒකාන්තයෙන්ම නෛර්යාණික මාර්ගයට පිළිපන්නහුට සසර දුකින් මිදීම පිණිස වේ. යම් හෙයකින් ඒ ධර්මය කිසියම් ශ්‍රමණයෙක් හෝ -පෙ- බ්‍රාහ්මණයෙක් හෝ නෛර්යාණික ධර්මයයි. දේශිත වූ එයට නෛර්යාණික නොවේයයි දැහැමිව (සෘජුව) අභියෝග කරන්නට සමර්ථයෙක් නැත. මෙය කියන ලද්දේමැයි "විශේෂ ඥානයෙන් සියල්ල අවබෝධ කළ සම්මා සම්බුදුරදුන් විසින් මෙම ධර්මයෝ අවබෝධ කරන නොලද්දෝ යයි කිව නොහැක යනු විස්තරය වේ. මෙය මෙසේ යයි තමාගේ දැනීම ප්‍රහාණය කිරීම දේශනා විශේෂයන් අව්‍යාජ ස්වභාවයෙන් අවබෝධ කිරීමෙන් නොවෙනස් ආකාරයෙන් පැවති භාග්‍යවතුන් වහන්සේගේ චතුර් වෛසාරද ඥාණයන් අව්‍යාජ වේ. වෙනස් වන්නේ නොවේ. මෙසේද තත් වූ ධර්මයන් අවබෝධ කෙරේනුයි භාග්‍යවතුන් වහන්සේ තථාගත වේ.

නිරය ගතිය, තිරිසන් ගතිය ප්‍රේත ගතිය මිනිස් ගතිය දේව ගතියයි ගති (උපදනා තැන්) පසෙකි. ඒවා අතර සංජීව ආදී වූ අටමහා නිරයෝය. කුක්කුල ආදී වූ උසස්ද නිරයෝය. ලෝකාන්තරික නිරයෝය මේ සියල්ලම ඒකාන්තයෙන් දුක් ඇති හෙයින් සැප රහිත අර්ථයෙන් නිරයෝ වෙති. මොහුගේ කර්මය යම් පරිදි ද එසේ යා යුතු හෙයින් "ගති" නම් වන්නේනුයි නිරය ගති වේ. අබ්බුද ආදී අසූවක් නරකයෝ ද මේවායෙහිම ලා ඇතුලත් වූවෝ වෙති. තිම් නම් මත්‍සයයෝ ද කුඩා ප්‍රාණීහූද උරග පක්ෂී බලු සිවල් ආදීහූ හරහට ඇවිදින හෙයින් තිරිසන්නු නම් වෙති. බඩ සය පවස ඇත්තා වූ පරදත්තූපජීවී නිජ්ඣාම තණ්හිත ආදිහු දුක් බහුල බැවින් ප්‍රකට සුවයෙන් පහව ගියෝ බැහැර වූවෝ ප්‍රේතයෝ වෙති. එබදු සවභාව ඇත්තේනුයි "ප්‍රේතගති" වේ. කාලකඤ්ජිකා ආදී වූ අසුරයෝද මෙහිලා ඇතුලත් වූවෝ වෙති. කුඩා දිවයින් වාසීන් සමඟ දඹදිව ආදී වූ සිව්මහා දිවයින් වැස්සෝ අපාධිගත වූවන් වඩා මනයින් උසස් හෙයින් මිනිස්සු නම් වෙති. එම ස්වභාව ඇත්තේනුයි මනුස්ස ගති වේ. චතුර්මහාරාජිකයෙහි පටන් නේවසඤ්ඤා-නාසඤ්ඤායතන ගාමින් දක්වා මොවුහු සුවිසි දිව්‍ය සමූහයෝ වෙති. තමාගේ සෘද්ධිමහිමයෙන් ක්‍රීඩා කෙරෙත් සෙල්ලම් කෙරෙත් බැබළෙත්නුයි" දේව" වෙති. එම ස්වභාවය ඇත්තේනුයි "දේවගති"වේ ඒ මේ ගතිහු යම් හෙයකින් ඒ ඒ කර්මයන්ගෙන් හටගත් උප්පත්ති භව විශේෂයක් වේද ඒ ඒ විපාක ස්කන්ධයන්ගෙන් කළ හෙයින් රූපී වේ. එහි මේ නම් වූ ගතිය මේ නම් වූ කර්මයෙන් හට ගනී. ඒ කර්මයාගේ විශේෂය හේතු විශේෂයන්ගෙන් මෙසේ යැයි විපාක වශයෙන් වෙන් වූ හෙයින් මේ ගතින්හි මේ සත්වසමූහයෝ මෙසේ විපාක වශයෙන් වෙන් වූවාහුයයි. තමා පිළිබඳව මෙන් හේතු - ඵල - කොටස් පිරිසිදීම් (සීමාකොට වෙන් කිරීම) වශයෙන් මුළුමනින්ම භාග්‍යවතුන් වහන්සේගේ ඤාණය පවතී. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළහ. ශාරිපුත්‍රයෙනි. මේ ගතිහු පහක් වෙති. කවර නම් පහක්ද? නිරය- තිරිසන්- යෝනිය ප්‍රේත විෂයය. මිනිස් - දේව යනු වෙති. ශාරිපුත්‍රයෙනි, මම නිරයද දනිමි. නිරයගාමී මාර්ගයද දනිමි. නිරයගාමී ප්‍රතිපදවද දනිමි. යම් පරිදි පිළිපන්නේ කය බිඳී මරණයෙන් පසු සැප රහිත වූ දුගති සංඛ්‍යාත විපත්තිකර වූ අපායෙහි උපදී ද එයද දනිමි. ආදී වශයෙනි. භාග්‍යවතුන් වහන්සේගේ ඒ මේ ඤාණයෝ ඒ ඒ විෂයෙහි නොවෙනස් ආකාරයෙන් පවතින හෙයින් අසත්‍ය නොවන හෙයින් සත්‍ය වූයේ වෙයි. අසත්‍ය වූයේ නොවෙයි.

නොවෙනස් වූයේ වෙයි. මෙසේද භාග්‍යවතුන් වහන්සේ තථ වූ ධර්මයන් අවබෝධ කළේනුයි තථාගත වේ.

එසේම සත්ත්වයන්ගේ ශ්‍රද්ධාදියෙහි යෙදීම් අඩු වැඩි බැව් අවබෝධයෙන් ස්වල්ප වූ රජස් (කෙලෙස්) ඇති බව හා බොහෝ රජස් ඇති බැව් මෙසෙසින් සැලකීම් සංඛ්‍යාත යම් නුවණක් වීද පණස් අයුරකින් පැවති එය භාග්‍යවතුන් වහන්සේගේ "ඉන්‍ද්‍රිය පරොපරියත්ත ඤාණ"යයි මෙසේ කියන ලදී. "ශ්‍රද්ධා සහිත පුද්ගලයා අල්පරජස්ක"වේ. ශ්‍රද්ධා රහිත පුද්ගලයා මහා රජස්ක වේ යනු විස්තරයයි. යම්හෙයකින් මේ පුද්ගල තෙමේ අල්ප වූ රජස් ඇත්තේ ශාස්වතදෘෂ්ටි ඇත්තේය. මෙතෙම උච්ඡේද දෘෂ්ටි ඇත්තේය. මෙතෙමේ පිළිවෙලින් ක්‍ෂාන්තියෙහි පිහිටියේය. මෙතෙමේ සත්‍ය ඤාණයෙහි පිහිටියේය. මෙතෙමේ කාමී හැඟීම් ඇත්තේය. නික්මීමේ හැඟීම් ආදිය නැත්තේය. මෙතෙම නික්මීමේ හැඟීම් ඇත්තේය. කාමී හැඟීම් ආදිය නැත්තේය ආදී වශයෙන් ද, මොහුගේ කාමරාග අතිශයින් බලවත් විය. කෝපය එසේ නොවීය. මොහුගේ කෝපය අතිශයින්ම බලවත් විය. කාම රාගය එසේ නොවෙයි ආදී වශයෙන් ද මොහුගේ පුණ්‍යාභිසංස්කාරයෝ අධිකයහ. අපුණ්‍යාභි සංස්කාරයෝ එසේ නොවේ. ආනෙඤ්ජාභි සංස්කාරයෝද එසේ නොවේ. මොහුගේ අපුණ්‍යාභි සංස්කාරයෝ අධිකයහ. පුණ්‍යාභිසංස්කාරයෝ එසේ නොවේ. ආනෙඤ්ජාභි සංස්කාරයෝද එසේ නොවේ. මොහුගේ ආනෙඤ්ජාභි සංස්කාරයෝද අධිකයහ. පුණ්‍යාභිසංස්කාරයෝ එසේ නොවේ. අපුණ්‍යාභිසංස්කාරයෝ එසේ නොවේ. මොහුගේ කාය සුචරිතය අධිකය. මොහුගේ වචී සුචරිතය අධිකය. මොහුගේ මනෝ සුචරිතය අධිකය. මෙතෙම උසස් අධිෂ්ඨාන ඇත්තෙකි. මෙතෙම පහත් අධිෂ්ඨාන ඇත්තෙකි. මෙතෙම කර්මාවාරණයෙන් යුත් අයෙකි. මෙතෙම ක්ලේශාවරණයෙන් යුත් අයෙකි. විපාකාවරණයෙන් යුත් අයෙක් නොවේ. මෙතෙම කර්මාවරණයෙන් යුත් අයෙක් නොවේ. ක්ලේශාවරණයෙන් යුත් අයෙක් නොවේ. විපාකාවරණයෙන් ද යුත් අයෙක් නොවේ ආදී වශයෙන් ද සත්ත්වයන්ගේ සිතේ පවත්නා ස්වභාවයන්ගේ තත් වූ පරිදි පැහැදිලි කිරීමෙහි පැවති භාග්‍යවතුන් වහන්සේගේ ආසයානුසය ඤාණය වේ. "මෙහිලා තථාගතයන් වහන්සේ සත්ත්වයන්ගේ සිතේ පැවැත්ම දනී. සිතේ පවත්නා අප්‍රකට ස්වභාවයන් දනී. චරිතය දනී. අධිෂ්ඨානයද දනී. භව්‍ය අභව්‍ය සත්ත්වයන් දනී යයි ආදිය යමක් මුල්කොට කියන ලද්ද (ඒ මේ ඤාණය වේ) උඩ, යට, පෙර, පසු, ශරීරයන්ගෙන් දකුණු

- වම් ඇස කන නැහැය උරහිස අත්පස පාදයන්ගෙන් ඇඟිලි අතරතින් රෝම කූපයන්ගෙන් ද ගිනි කඳ දිය දහරා පැවැත්වීම් සංඛ්‍යාත අනිකෙකුට සාධාරණ නොවූ විවිධ වූ ඍද්ධිමය මවාපෑම් සිදු කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ යම් යමක මහා පාටිහාරිය ඤාණය වේ. "මෙහිලා තථාගතයන් වහන්සේ ශ්‍රාවකයන්ට සාධාරණ නොවූ උඩු ශරීරයෙන් ගිනි කඳක් පවත්වයි. යට කයින් දිය දහරාවක් පවත්වයි. යට කයින් ගිනි කඳක් පවත්වයි. උඩ කයින් ජල දහරාවක් පවත්වයි යයි ආදී යමක් මුල් කොට කියන ලදද (ඒ මේ ඤාණය වේ). රාග ආදී වූ ද ජාති ආදී වූ නොයෙක් දුක්ඛයන්ගෙන් උවදුරට පත් සත්ත්ව සමූහයා ඉන් බැහැර කිරීම් වශයෙන් නොයෙක් අයුරින් පැවති, භාග්‍යවතුන් වහන්සේගේ මහා කරුණාවට බැස ගැන්මට හේතු වූ යම් මහා කරුණා සමාපත්ති ඤාණයක් වේ. යම් පරිද්දකින් කියන ලදද? - තථාගතයන් වහන්සේ මහා කරුණා සමාපත්ති ඤාණය කවරීද විවිධාකාරයෙන් බලන්නා වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලාගේ මහා කරුණා ඤාණය සත්ත්වයන් වෙත බැස ගනීද ලොව හා එක්ව විසීම ගිනි ගන්නකැයි දක්නා වූ භාග්‍යවත් බුදුරදුන් වහන්සේලාගේ මහා කරුණා ඤාණය සත්ත්වයන් වෙත බැස ගනීද උත්සාහී වූ ඉදිරියට යන නොමගට පිළිපන් ලෝකයා සදාකාලික නොවන්නේ ඉදිරියට පමුණුවන්නේ වේ. රූකවරණ රහිත වූ ලෝකයා ආත්ම ප්‍රභූත්වයෙන් තොර වූයේ වේ. ලෝකයා සරණ රහිතය. ලෝකයා සියල්ල හැර යා යුතුය. ලෝකයා අසම්පූර්ණය. අතෘප්තිමත්ය. තෘෂ්ණාවෙහි දාසයෙක් වූයේ යැයි දක්නා වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලාගේ මහා කරුණා ඤාණය සත්ත්වයන් වෙත බැසගනීද රූකවරණ රහිත වූ ලොව වාසය කිරීම පිහිටක් නැත්තේය. අසරණය අසරණ වූයේය. නොසන්සුන් වූ ලෝක සන්සිදුනේ නොවේ. පීඩා සහිතය. ලොව වාසය කිරීම බොහෝ හී වලින් විදුනා ලද්දේය. අවිද්‍යාව නැමති ආවරණයෙන් වැසී ගත්තේය. කෙලෙස් නමැති මැදිරියෙහි බහාලන ලද්දේය. අවිද්‍යාවෙන් පැමිණියේය. ලෝක වාසය අන්ධ වූයේය. වෙලන ලද්දේය. නූල් රැසක් මෙන් අවුල් වූයේය. මුජු (බට වැනි තෘණ වර්ගයක්) සැවැන්න මෙන් වූයේය. සැප රහිත වූ නපුරු පැවැත්ම ඇති පහතට හෙලන්නා වූ සසර නොඉක්ම වන්නේයයි දක්නා වූ (බුදුරජාණන් වහන්සේලාගේ යම් ඤාණයක් පවතීද) (ලෝවැසි තෙමේ) අවිද්‍යාවෙන් අපිරිසිදු වූයේය. කෙලෙස් වලින් මඩ වූයේය. රාග දෝස මෝහ නැමති ගැට වලින් ගැට ගැසුනේය. තෘෂ්ණාව නැමති බැඳීම් වලින් සන්නද්ධ

වූයේය. තෘෂ්ණා නැමති දූලෙන් වෙලනා ලද්දේය. තෘෂ්ණා නැමති දිය පහරින් උසුලන්නේය. තෘෂ්ණාව නැමති සංයෝජනයන්ගෙන් යුක්ත වූයේය. තෘෂ්ණාව නැමති අනුසයන්ගෙන් විසුරුවන ලද්දේය. තෘෂ්ණාව නැමති තැවිලියෙන් තවයි. තෘෂ්ණා නැමති දවීමෙන් දවනු ලබයි. දෘෂ්ටි නැමති බැඳීම් වලින් බැඳුනේය. අෂ්ටි නැමති දූලෙන් වෙළනා ලද්දේය. දෘෂ්ටි නැමති දිය පහරින් උසුලන ලද්දේය. දෘෂ්ටි නැමති සංයෝජනයන්ගෙන් යුක්ත වූයේය. දෘෂ්ටි නැමති අනුසයන්ගෙන් විසුරුවන ලද්දේය. දෘෂ්ටි නැමති තැවිලියෙන් තවයි. දෘෂ්ටි නැමති දැවීමෙන් දවනු ලබයි. (ලෝ වැසි තෙමේ) ජාතියෙන් විසුරුවන ලද්දේය. ජරාවෙන් විසුරුවන ලද්දේය. ව්‍යාධියෙන් මඬනා ලද්දේය. මරණයෙන් පහර දෙන ලද්දේය. දුකෙහි පිහිටන ලද්දේය. තෘෂ්ණාවෙන් එල්ලන ලද්දේය. ජරා නැමති පවුරෙන් වටකරන ලද්දේය. මරණය නැමති පුඩුවෙන් වට කරන ලද්දේය. මහත් වූ බැම්මකින් බඳනා ලද්දේය. රාග මෝහ මාන දිට්ඨි කෙලෙස් දුශ්චරිත නම් වූ බැමිවලින් බඳනා ලද්දේය. මහත් වූ ගැහැටට පිළිපන්නේය. මහත් වූ පීඩාවෙන් පීඩාවට පත් වූයේය. මහත් වූ ප්‍රපාතයෙහි වැටුණේය. මහත් වූ කතරකට පිළිපන්නේය. ලොව වාසය කිරීම මහත් වූ පීඩාවකට පිවිසීමකි. මඩනා ලද්දේ වෙයි. ලොව විසීම රාග නැමති ගින්නෙන් ද දෝසය නැමති ගින්නෙන් ද මෝහය නැමති ගින්නෙන් ද ඉපදීමෙන් ජරාවට පත් වීමෙන් මරණයන්ගෙන් සෝකයන්ගෙන් වැලපීම්වලින් දුකෙන් දෝමනස්සයන්ගෙන් උපායාසයන්ගෙන් උවදුරට පත් වූයේ වෙයි. ලොව වාසය කිරීම නිරතුරුවම පිළිසරණක් නැත්තේ දඬුවමට පත් වූයේ පැවති පීඩා ඇත්තේ වද බැඳීම්වලින් බඳනා ලද්දේ එළඹ සිටි නැසීම් ඇත්තේය. ලොව වාසය කිරීම අසරණ වූයේ අතිශයින් කරුණාව ලද යුතු බවට පත් වූයේ දුකින් මැඩලූයේ බොහෝ කලක් පීඩාවට පත් වූයේ අතිශයින් පීඩාවට පත් වූයේ නිරතුරුව පවසින් පීඩාවට පත් වූයේ අන්ධ වූ ඒ ඇස් නැති වූයේ නසන ලද නෙත් ඇත්තේ නායකයෙක් නැත්තේ නොමගට පිළිපන්නේ වරදවාගත් මාර්ග ඇත්තේ මහත් වූ සැඩ පහරට පැමිණුනේ දෘෂ්ටි ගතින් මෙහෙයවන ලද්දේ ත්‍රිවිධ දුෂ්චරිතයෙන් නොමගට පිළිපන්නේ සිව්වැදෑරුම් යෝගයන්ගෙන් යොදවන ලද්දේ සිව්වැදෑරුම් ගැට වලින් ගැටලන ලද්දේ සතර උපාදානයන්ගෙන් ගනු ලබයි. පස් වැදෑරුම් ගතීන්ට නැගුනේ පස්කම් ගුණයන්ගෙන් ඇලෙයි. නීවරණ පහෙන් මඬනා ලද්දේ සවදෑරුම් විවාද මූලයන්ගෙන් වාද කරයි. සවැදෑරුම් තෘෂ්ණා

කායයන්ගෙන් ඇලෙයි. සවැදෑරුම් දෘෂ්ටීන්ගෙන් මඬනා ලද්දේ සත්වැදෑරුම් රාගාදී අනුසයයන්ගෙන් විසුරුවන ලද්දේ සත්වැදෑරුම් සංයෝජනයන්ගෙන් යුක්ත වූයේ සත්වැදෑරුම් මානයන්ගෙන් උදම් වූයේ අෂ්ට ලෝක ධර්මයන්ගෙන් පෙරළෙයි. අටවැදෑරුම් මිත්‍යාවන්ගෙන් පමුණුවනු ලබයි. අටවැදෑරුම් පුරුෂ දෝෂයන්ගෙන් දූෂණය වේ. නව වැදෑරුම් ආඝාත වස්තූන්ගෙන් ක්‍රෝධ සහගත වූයේ නවවැදෑරුම් මානයන්ගෙන් උඩඟු වූයේ නව වැදෑරුම් තෘෂ්ණාමූලික ධර්මයන්ගෙන් ඇලෙයි. දසවැදෑරුම් ක්ලේශ වස්තූන්ගෙන් කිලිටි වෙයි. දස කුසල කර්මපථයන්ගෙන් යුක්ත වූයේ දස සංයෝජනයන්ගෙන් යුක්ත වූයේ දස මිත්‍යාවන්ගෙන් යුක්ත වූයේ දස මිත්‍යාවන්ගෙන් මෙහෙයවන ලද්දේ දස වස්තුක මිත්‍යා දෘෂ්ටියෙන් යුක්ත වූයේ අටසියයක් තෘෂ්ණා ප්‍රපංචයන්ගෙන් ප්‍රමාදී වූයේ දෙසැටක් දුශ්චරිතයන්ගෙන් මඩනා ලෝකවාසී තෙමේ මඩනා ලද්දේ යයි දක්නා වූ භාග්‍යවත් බුදුරදුන් වහන්සේලාගේ මහා කරුණා ඤාණය සත්ත්වයන් කෙරෙහි බැසගනී.

මම සසර තරණය කරන ලද්දේ වෙමි. ලෝකයා තරණය කළේ නොවෙමි. මම මිදුනේ වෙමි. ලෝකයා නොමිදුනේ වෙයි. මම දැමුනේ වෙමි. ලෝකයා දැමුනේ නොවෙයි. මම සන්සිඳුනේ වෙයි. ලෝකයා සන්සිඳුනේ නොවෙයි. මම සැනසුනේ වෙමි. ලෝකයා නොසැනසුනේ වෙයි. මම පිරිනිවියේ වෙමි. ලෝකයා නොපිරිනිවියේ වෙයි. සසර තරණය කළ මම ලෝකයා තරණය කරවීමට පොහොසත් වෙමි. මිදුනා වූ මම මුදවන්නටද දැමුනා වූ මම දමනය කරන්නටද සන්සිඳුනා වූ මම සන්සිඳුවන්නටද සැනසුනා වූ මම සනසවන්නටද පිරිනිවියා වූ මම අන්‍යයන් පිරිනිවන්නටද පොහොසත් වෙමියි දක්නා වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේලා මහා කරුණා ඤාණය සත්ත්වයන් කෙරෙහි බැස ගනී යයි මෙසේ අනූ එක් ආකාරයෙන් බෙදීම කරන ලදී.

භාග්‍යවතුන් වහන්සේට යම්තාක් ධර්ම ධාතූන් පිළිබඳ යම් පමණ දතයුතුද සංස්කෘත අසංස්කෘත ආදී සියල්ල පිළිබඳව උනුන් ගැන අපේක්ෂා රහිතව හැම පරිද්දෙන් අවබෝධ කිරීමට සමර්ථ වූ කැමති වූ පමණකින් පිළිබඳ පැවැත්ම දක්නා වූ අනිකෙකුට සාධාරණ නොවූ යම් ඤාණයක් වේද (එය) හැම පරිද්දෙන්ම මුළුමනින් සංස්කෘත අසංස්කෘත යයි පිළිගැන්මට ලක් වූ යමක් වේද ඒ සත්‍යාවබෝධයෙන්

ලබා ගත් සර්වඥතා ඥානය වේ. එහි ඇවිරීමක් නොමැති හෙයින් නිසඟව පැවැත්මට හේතුකොටගෙන අනාවරණ ඤාණය යයි කියනු ලබයි. එකක්ම වූ එම ඤාණය විෂයගතව පැවතීමේ යොමුවෙන් අන්‍යයන් හා සාධාරණ නොවන බව දක්වීම් වශයෙන් දෙයාකාරයෙන්ම දක්වන ලදී. අන්පරිද්දකින් සර්වඥතා ඤාණය හා අනාවරණ ඤාණය යන මේවායේ අසාධාරණ බවද සියළු විෂයගත බවද පැමිණේ නම් එහි සුදුසු නොවේ. එසේ වූවද මේ යෙදීමෙහි, පෙළ මෙසේ වේ මැයි සියළු සංස්කෘත අසංස්කෘතයන් මුළුමනින්ම දනීනූයි සර්වඥතා ඤාණය වේ. එහි බාධාවක් නැත්තේනූයි අනාවරණ ඤාණය වේ. ඉක්මුණා වූ සියල්ල දනීනූයි සර්වඥතා ඤාණය වේ. එහි බාධාවක් නැත්තේ නූයි අනාවරණ ඤාණය වේ. අනාගතයෙහි හා වර්තමානයෙහි සියල්ල දනීනූයි සර්වඥතා ඤාණය වේ. එහි බාධාවක් නැත්තේනූයි අනාවරණ ඤාණය වේ. යනු විස්තරය වේ. මෙසේ භාග්‍යවතුන් වහන්සේගේ අසාධාරණ ඤාණ සය නොවෙනස් ආකාරයෙන් පැවැත්මෙන් යම් සේ සිය විෂයය නොගැලපෙන පරිදි නොවදාරන හෙයින් සත්‍ය වේ අසත්‍ය නොවේ - නෙවෙනස් වේ. මෙසේ ද භාග්‍යවතුන් වහන්සේ සත්‍ය වූ ධර්මයන් අවබෝධ කළේනූයි තථාගත වේ.

එසේම "මහණෙනි, මේ බෝධ්‍යංගයෝ සතක් වෙති. සති සම්බෝධි අංගය ධම්මවිචය සම්බෝධ්‍යංගය වීරිය සම්බෝධ්‍යංගය, පීති සම්බෝධ්‍යංගය පස්සද්ධි සම්බෝධ්‍යංගය සමාධි සම්බෝධ්‍යංගය උපේක්ඛා සම්බෝධ්‍යංගය යනුවෙනි. මේ ආකාරයෙන් - ලෝකොත්තර මාර්ග ක්ෂණයෙහි උපදිනු ලබන සැඟවුනු - ප්‍රකට වුන පිහිටීම් ඇති රැස් කිරීම් යන ස්වභාවයන්ගෙන් යුත් කාමසුබල්ලිකානුයෝගය. අත්තකිලමථානුයෝගය. උච්ඡේද ශාස්වත යන දෘෂ්ටීන් හා ආශා කිරීම් ආදී නොයෙක් උපද්‍රවයන්ට විරුද්ධ වූ සති ආදී වශයෙන් කොටස් වූ යම් මේ ධර්ම සමූහයක් වේද? ආර්‍යශ්‍රාවක තෙමේ යමක් කරණ කොටගෙන සත්‍ය අවබෝධ කෙරේද කෙලෙස් නින්දෙන් නැගී සිටීද චතුරාර්ය සත්‍යය අවබෝධ කෙරේද නිවනම හෝ ප්‍රත්‍යක්ෂ කෙරේද ඒ ධර්ම සමූහයා තොමෝ බෝධි යයි කියනු ලැබේ. ඒ බෝධියෙහි අංගයෝනූයි "බොජ්ඣංග"වෙති. ආර්ය ශ්‍රාවකයා හෝ යට කියන ලද ධර්ම සමූහය කරණකොටගෙන අවබෝධ කෙරේනූයි "බෝධි" යයි කියනු ලැබේ. ඒ බෝධියේ අංගයන් යනුවෙන්ද "බොජ්ඣංග" නම් වේ. මෙසේ සාමාන්‍ය

ලක්ෂණ වශයෙන් වැටහීමේ ලක්ෂණ සතිබෝධ්‍යංගය වේ. විමසීම් ලක්ෂණය ධම්ම විචය බෝධ්‍යංගය වේ. උත්සාහී ලක්ෂණය විරිය බෝධ්‍යංගය වේ. පැතිරී සිටීමේ ලක්ෂණය ප්‍රීති බෝධ්‍යංගය වේ. සන්සිඳීමේ ලක්ෂණය පස්සද්ධි බෝධ්‍යංගය වේ. නොසසල ලක්ෂණය සමාධි බෝධ්‍යංගය වේ. නුවනින් සලකා බැලීමේ ලක්ෂණය උපේක්ෂා බෝධ්‍යංගය වේ. යනුවෙනි. විශේෂ ලක්ෂණ වශයෙන්, එහි ලා සති සම්බෝධ්‍යංග නම් කවරීද? මේ ශාසනයෙහි භික්ෂුව සිහි ඇත්තේ වෙයි. උසස්ම නුවණැති බවින් යුක්ත වූයේ වෙයි. කලකට පෙර කළ දෙයද කලකට පෙර කී දෙයද සිහි කරන්නේ වෙයි. නැවත සිහි කරන්නේ වෙයි. ආදී ක්‍රමයෙන් සප්ත බෝධ්‍යංගයන් එකිනෙක සහය ලෙස එක් ඇසිල්ලක්හිදී පැවැත්මට දැකීම වශයෙන් වේ. එහි සති සම්බෝධ්‍යංගය කවරීද? ආධ්‍යාත්මික ධර්මයන්හි සිහිය ඇත. බාහිර ධර්මයන්හි සිහිය ඇතැයි ආදී ක්‍රමයෙන් ඔවුන්ගේ ගෝචර විෂයය සැලකීමෙන් පැවැත්ම දැකීමෙන් වේ. එහි සති සම්බෝධ්‍යංගය කවරීද? මේ ශාසනයෙහි භික්ෂුව විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ අත් හැරීමට මුහුකුරා යෑම කොට ඇති සති සම්බෝධ්‍යංගය වඩයි. ආදී වශයෙන් භාවනා විධිය දැකීමෙන් වේ. එහි සප්ත බෝධ්‍යංගයෝ කවරහුද? මේ ශාසනයෙහි භික්ෂුව යම් සමයයෙක්හි ලෝකෝත්තර ධ්‍යාන වඩයිද -පෙ- එකල්හි සප්ත බෝධ්‍යංගයෝ වෙති සති සම්බෝධ්‍යංගය -පෙ- උපේක්ෂා සම්බෝධ්‍යංගය යනුවෙනි. එහි සති සම්බෝධ්‍යංගය කවරීද? යම් සිහියක් -පෙ- අනුස්සතියක් ආදී වශයෙන් සානු දසයක් පිළිවෙලින් යයි මෙසේ නන් අයුරින් පැවති, භාග්‍යවතුන් වහන්සේගේ සම්බෝධ්‍යංගයන් ප්‍රකට කරවන ඤාණයන් ඒ ඒ අරුත් අසත්‍ය නොවන පරිදි දක්වන හෙයින් සත්‍ය වූයේ අසත්‍ය නොවූයේ නොවෙනස් වූයේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ සත්‍ය වූ ධර්මයන් අවබෝධ කළේනුයි තථාගත නම් වේ.

එසේම 'එහි දුක්ඛනිරෝධගාමිනි ප්‍රතිපදා ආර්ය සත්‍යය' කවරීද? මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය - කෙසේද? සම්‍යක් දෘෂ්ටිය -පෙ- සම්‍යක් සමාධිය යනුවෙනි. මේ අයුරින් සියළු කෙලෙස්වලින් මුළුමනින්ම උතුම් බවට පමුණුවන හෙයින් ද උතුම් වූ මාර්ගඵලයන් ලබා දෙන හෙයින්ද ආර්ය නම් වේ. අටවැදෑරුම් හෙයින් ද නිවන් අවබෝධ කිරීමට ඒකාන්ත කරුණු හෙයින්ද අංග අටකින් යුක්ත වේ. කෙලෙස් නසමින් යයි. නිවන් කැමැත්තන් විසින් අනුගමනය කරයි. තෙමේම නිවන සොයයිනුයි මාර්ගය වේ. මෙසේ සාමාන්‍ය ලක්ෂණ වශයෙන් වේ. මනාව දක්නා

ලක්ෂණ ඇත්නි සම්මා දිට්ඨි වේ. ඇතුලට බැස ගැනීම් ලක්ෂණ ඇත්නි සම්මා සංකප්ප වේ. මනාව අල්ලා ගැනීම් ලක්ෂණ ඇත්නි සම්මා වාචා වේ. මනාව ඉපදවීම් ලක්ෂණ ඇත්තේ සම්මා කම්මන්ත වේ. මනාව කෙලෙසුන් දුරු කරන ලක්ෂණ ඇත්තේ සම්මා ආජීව වේ. මනාව ඔසවා තැබීම් (උත්සාහී) ලක්ෂණ ඇත්තේ සම්මා වායාම වේ. මනාව වැටහීම් ලක්ෂණ ඇත්තේ සම්මා සති වේ. මනාව නොසසල බව ලක්ෂණ කොට ඇත්තේ සම්මා සමාධියයි. විශේෂ ලක්ෂණ වශයෙන් වේ. සම්මා දිට්ඨිය තෙමේ තමාට සතුරා අන් කෙලෙස් සමග මිථ්‍යා දෘෂ්ටිය දුරු කරයි. නිවන අරමුණු කරයි. එය (නිවන) වසන්නා වූ මෝහය නැසීමෙන් නුමුළාව ඒ නිවන හා බැඳුන ධර්මයන් ද දකී. එසේම සම්මා සංකප්ප ආදීහුද මිථ්‍යා සංකප්ප ආදීන් දුරු කරත්. නිවනද අරමුණු කරත්. එකට උපන් ධර්මයන්ගේ මනාව අරමුණට යොමු කිරීම, අල්වා ගැනීම, හට ගැනීම, පිරිසිදු කිරීම, උපකාරී වීම, සමීපව සිටීම, මනාව අල්ලා ගැනීමේ ආදිය ද කරත්නුයි මෙසේ කෘත්‍ය වශයෙන් වේ. සම්මා දිට්ඨිය මුල් අවස්ථාවේ දී විවිධ අවස්ථාවෙන් වෙන් වෙන්ව දුක් අරමුණු කොට මාර්ග අවස්ථාවේ දී එක් ඇසිල්ලෙන් නිවනට අරමුණු කොට කෘත්‍ය වශයෙන් දුකෙහි ඤාණයයි ආදී සතර නාමයන් ලබයි. සම්මා සංකප්ප ආදීන් ද මුල් අවස්ථාවෙහි විවිධ අවස්ථාවෙන් විවිධ අරමුණු ලබයි. මාර්ග අවස්ථාවේදී එක් ඇසිල්ලෙන් එක් අරමුණු ලබයි. ඒවා අතර සම්මා සංකප්පය නෙක්ඛම්ම සංකප්ප ආදී වූ ත්‍රිවිධ නාමයන් ලබයි. සම්මා වාචා ආදීන් මුල් අවස්ථාවේ දී බොරු කීමෙන් වැලකීම් ආදී කොටස් ඇති විරතින්ද සිතුවිලිද වී මාර්ග අවස්ථාවෙහිදී විරති සිතුවිල්ලම වේ. සම්මා වායාම - සති දෙක කෘත්‍ය වශයෙන් සම්‍යක් ප්‍රධාන - සතිපට්ඨාන වශයෙන් සතරක් සතරක් නම් ලබත්. සම්මා සමාධිය වනාහි මාර්ග ක්ෂණයෙහිද ප්‍රථම ධ්‍යානාදී වශයෙන් වෙන් වෙන් වන්නේම යයි මෙසේ මුල් අවස්ථා පසු අවස්ථාවන්හිදී පැවති කොටස් වශයෙන් දී 'මහණෙනි, භික්ෂුව මෙහිදී විවේකය ඇසුරු කල සම්මා දිට්ඨිය වඩයි' යි ආදී වශයෙන් භාවනා වශයෙන් "එහි අෂ්ටාංගික මාර්ගය කවරිද?" මෙහිදී භික්ෂුව යම්කලෙක -පෙ- දුක් සහිත ප්‍රතිපදා ඇති, ලාමක වූ අභිඤ්ඤායි ලෝකොත්තර ධ්‍යානය වඩයිද එකල්හි සම්මා දිට්ඨි, සම්මා සංකප්පයි අෂ්ටාංගික මාර්ගය වේ. ආදී වශයෙන් අසූහතර දහසක් ක්‍රම විශේෂයන්ගෙන් වේ යයි. මෙසේ නොයෙක් ආකාරයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ආර්ය මාර්ගය දනවන ඤාණයන් අර්ථය මුවහ නොකරන

හෙයින් සියල්ල සත්‍ය වූයේ වෙයි. අසත්‍ය වූයේ නොවෙයි. නොවෙනස් වූයේ වෙයි. මෙසේ ද භාග්‍යවතුන් වහන්සේ සත්‍ය වූ ධර්මයන් අවබෝධ කළේනුයි තථාගත වේ.

එසේම ප්‍රථම ධ්‍යාන සමාපත්තියෙන් නිරෝධ සමාපත්තිය යි මොවුන්ගේ අනුපිළිවෙලින් විස්තර කළයුතු අර්ථයෙන් ද සමවැදිය යුතු අර්ථයෙන්ද අනුපිළිවෙලින් විසිය යුතු සමාපත්තීන්හි පිළියෙල කිරීම ප්‍රත්‍යවේක්ෂා කිරීම් ආදී වශයෙන් සුදුසු පරිදි යෙදීම් වශයෙන් ද පැවති භාග්‍යවතුන් වහන්සේගේ ඤාණයන් ඒ අර්ථසිද්ධිය පිණිස සත්‍ය වේ. අසත්‍ය නොවේ. නොවෙනස් වේ. එසේම "මෙය මොනුට සුදුසුය. මෙය නුසුදුසු යයි" ඒ ඒ ඵලයේ කරුණු නොකරනු දැනීමද, ඒ ඒ සත්ත්වයන්ගේ අතීත ආදී වූ කොටස්වලට වෙන් වූ කර්මයන්ගෙන් යුක්ත වුවහුගේ ඒ ඒ විපාකයන් මුළුමනින්ම දැනීමද රැස් කිරීමේ අවස්ථාවෙහිදීම ඒ ඒ සත්ත්වයා පිළිබඳව මේ නිරයගාමී ප්‍රතිපදාවයි. මේ නිවන්ගාමී ප්‍රතිපදාවයි තත් වූ පරිදි ආශ්‍රම සහිත ආශ්‍රම රහිත වූවන්ගේ කර්ම විභාගයන් දැනීමද, ස්කන්ධ-ආයතනයන්ගේ අල්ලාගත්, අල්ලා නොගත් ආදී නොයෙක් ස්වභාවය ද විවිධ ස්වභාවය ද ඒ ලෝකයේ මෙනම් ධාතූන්ගේ අධික බව නිසා මේ ධර්ම සමූහයෙහි මේ විශේෂය උපදී යි ආදී වශයෙන් ධාතූන්ගේ විවිධත්වය ඇති පරිදි දැනීමද, මුළුමනින්ම සත්ත්වයන්ගේ ලාමක ආදී වූ අදහස් අධිෂ්ඨාන දැනීමද, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ තියුණු-මෘදු බව දැනීම ද කිළිටි ආදී වශයෙන් ධ්‍යාන - මිදීම් ආදී විශේෂයන් දැනීමද සත්ත්වයන්ගේ අප්‍රමාණ ජාතීන්හි ඒ හා බැඳුනු බැඳීම් සමඟ මුළුමනින්ම පෙර විසූ ස්කන්ධයන්ගේ පරම්පරාව දැනීම ද, පහත් බව ආදී වූ විස්තරයන් සහිතව මරණය හා ප්‍රතිසන්ධිය ඈන දැනීමද, මේ දුකයයි ආදී වශයෙන් යට කියන ලද පරිද්දෙන්ම චතුරාර්ය සත්‍ය දැනීමද නොවෙනස් වූයේය. භාග්‍යවතුන් වහන්සේගේ මේ දසබල ඤාණයන් නොවරදවා තෙමේම විෂය වශයෙන් අවබෝධ කිරීමෙන්ද එසේම අපේක්ෂිත අර්ථ සාධනයෙන් ද තත් වූ පරිදි පැවැත්මෙන්ද සත්‍ය වූයේය. අසත්‍ය නොවූයේ ය. නොවෙනස් වූයේ ය. මෙසේ කියන ලද්දේමැයි. මෙහිලා තථාගතයන් වහන්සේ සුදුසු දෙය සුදුසු වශයෙන්ද නුසුදුසු දෙය නුසුදුසු වශයෙන්ද දනී යනු වෙයි. මෙසේද භාග්‍යවතුන් වහන්සේ සත්‍ය වූ ධර්මයන් අවබෝධ කළේනුයි තථාගත වේ.

යම් පරිදි මොවුන්ගේ අවබෝධ කිරීම් වශයෙන් මෙසේ කියන ලද සතිපට්ඨාන - සම්‍යක් ප්‍රධානයන් ප්‍රකට කිරීමේ ඤාණයන් ආදීන්ගේ අනන්ත අප්‍රමාණ කොටස් ඇති. අනිකෙකුට සාධාරණ නොවූ ප්‍රඥා විශේෂයන්ගේ වශයෙන් භාග්‍යවතුන් වහන්සේ නිවැරදි වූ ඤාණයන් ලබන ලද්දේ අවබෝධ කරන ලද්දේනුයි තථාගත වේ. මෙසේද තථාගතයන් වහන්සේ සත්‍ය වූ ධර්මයන් අවබෝධ කළේනුයි තථාගත වේ.

කෙසේ නම් 'එසේ ගියේනුයි තථාගත' වේද? භාග්‍යවතුන් වහන්සේගේ යම් ඒ ඉපදීම වීද බුදුවීම වීද ධර්ම-විනය පැනවීම වීද අනුපාදිසේස පරිනිර්වාණය වීද එසේම කියන ලද්දේ වෙයි. ලෝකනාථයන් වහන්සේ විසින් යම් කරුණක් පතන ලද ද යමක් පවත්වන ලද ද ඒ කරුණ ඒකාන්තයෙන් සමෘද්ධ වීමෙන් අසත්‍ය නොවීමෙන් නොවෙනස් ප්‍රතිඵල පැවැත්මෙන් සත්‍ය වීය. අසත්‍ය නොවීය. නොවෙනස් වීය. එසේමැයි. මේ භාග්‍යවතුන් වහන්සේ බෝධිසත්ත්ව වූයේම බුද්ධත්වයට පදනම් වූ සමතිස් පාරමී පිරීම් ආදී කොට ඇති බුද්ධත්වය සඳහා වන හේතූන් හැම පරිද්දෙන් සම්පූර්ණ කර තුසිත පුරයෙහි සිටියේම බුද්ධ කෝලාහලය අසා එකට එකතු වූ දස දහසක් සක්වල දෙවියන් විසින් එළඹ.

'මහා වීරය, මේ ඔබට කාලයයි. මව්කුස උපදින්න. දෙවියන් සහිත ලෝකයා සසරින් එතර කරවන්නේ නිවන් පදවිය අවබෝධ කරන්න'යයි අයදින ලද්දේ උපන් පෙරනිමිති ඇත්තේ පස්මහබැලුම් බලා දැන් මම මිනිස් ජාතියෙහි ඉපිද බුදුවන්නෙමියි ඇසල පොහෝ දින ශාක්‍ය කුලයට අයත් මහාමායා දේවියගේ කුසෙහි පිළිසිඳගෙන දසමසක් දෙවී මිනිසුන් විසින් මහත් වූ රැකවරණයෙන් ආරක්ෂා කරනු ලබන්නේ වෙසක් පොහෝදින අළුයම විශිෂ්ට වූ උපතට පැමිණුනි. එතුමාගේ උපන් ඇසිල්ලෙහි පිළිසිඳ ගැනීමේ අවස්ථාවෙහිදී මෙන් දෙතිසක් පෙරනිමිති පහළ වීය. මේ දස දහසක් ලෝකධාතුව කම්පා විය. මොනවට ප්‍රකම්පා විය. වෙව්ලීය. දස දහසක් සක්වල අපමණ ආලෝකයක් පැතිරුනි. ඔහුගේ එම ඓශ්වර්යය දකිනු කැමැත්තාහු මෙන් අන්ධයෝ ඇස් ලැබූහ. බිරෝ ශබ්ද ඇසූහ. ගොලුවෝ මනාව කථා කළහ. කුදු ඇත්තෝ ඍජු ශරීර ඇත්තෝ වූහ. කොරු පයින් ගමනය ලදහ. බැමිගත වූ සියළු සත්ත්වයෝ දම්වැල් බැමි ආදියෙන් මිදුනාහුය. සියළු නිරයන්හි ගිනි

නිවුනි. ප්‍රේත ලෝකයන්හි සා-පවස් සන්සිඳුනි. තිරිසනුන්ට බියක් නොවීය. සියලු සත්ත්වයන්ගේ රාගය සන්සිඳුනි. සියළු සත්ත්වයෝ ප්‍රිය තෙපුල් ඇත්තෝ වූහ. මිහිරි ලෙස අශ්වයෝ හේසාරව කළහ. ඇත්තු ගර්ජනා කළහ. සියළු තූර්ය භාණ්ඩ සිය නාදයන් විදීය. නොගැටුනා වූම අත් ආදීන්ගේ පැළඳි නොගැටුනා වූම ආභරණයෝ මිහිරි ලෙස නාද කළහ. සියළු දිසාවෝ ඉතා ප්‍රසන්න වූහ. සත්ත්වයන්ට සැප එළවමින් මෘදු සිතල වායුව හැමීය. අකාල වර්ෂාවක් වැස්සේය. පොළොවෙන් ද ජලය මතු වී විසිරි ගලා ගියේය. පක්ෂීහු අහස් ගටන අත්හළහ. නදීහු නොගලායමින් සිටියහ. මහ මුහුදෙහි ජලය මිහිරි විය. කිළිටින් මිදුන සූර්යයා පෙනෙන කල්හිම අහස්ගත සියළු තාරකාවෝ බැබලුනාහ. අරූපාවචර දෙවියන් හැර සියළු දෙවියෝ ද සියළු නිරිසත්තුද දක්නා ලබන රූප ඇත්තෝ වූහ. ගස් පර්වත කවුළු ගල් ආදීහු ආවරණ රහිත වූවාහුය. සත්ත්වයන්ගේ චුති උත්පත්ති නොවීය. සියළු අප්‍රසන්න ගන්ධය අහිබවා දිව්‍යමය සුවඳ හැමීය. ඵල දරන්නා වූ සියළු වෘක්ෂයෝ ඵල දරන්නෝ වූහ. මහමුහුද සියළු තැන පැතුරුන පස් පැහැයෙන් යුත් පියුමින් වැසුන තලාවක් විය. ජලයේ හටගන්නා වූද පොළොවේ හටගන්නා වූද සියළු මල් පිපිණි. වෘක්ෂයන්හි කඳමල්ද ශාඛාවන්හි අතුමල්ද වැල්වල වැල්මල්ද පිපුණි. පොළොවෙහි ගල්තලාවන් බිඳ මතුමත්තෙහි සතක් සතක් වී දඬු පියුම් නම් පියුම් නික්මුණි. අහසෙහි එල්බෙන පියුම් උපනි. හාත්පස මල් වැස්සක් වැස්සේය. අහසෙහි දිව්‍යමය තූර්යයෝ වාදනය වූහ. සියළු දසදහසක් සක්වල කැටිකර විසුරුවා හළ මල් ගුලාවක් මෙන් කැටිකොට බඳනා ලද මල්කළඹක් මෙන් අලංකාරකොට සරසනලද මලසුනක් මෙන්ද එකට බැඳුන මල්මාලා ඇත්තී සැලෙන වල්විදුනාවක් වැනි වූවා මල් සුවඳින් හා සුවඳදුම් සුවඳින් සුවඳ කවන ලද්දී සෞභාග්‍යයෙන් අතිශයින් අගතැන් පැමිණියා වූවාය. ඒ පූර්වනිමිති මත්තෙහි අවබෝධ කටයුතු බොහෝ විශේෂ අධිගමයන්ට පෙරනිමිති වූයේම විය. මෙසේ නොයෙක් ආශ්චර්යයන් පහළවීමෙන් හොබනා වූ මේ උතුම් උපතක් විද යමක් පිණිස මෙතුමා විසින් සම්බුද්ධත්වය පතන ලද ද ඒ සම්බුද්ධත්වයේ ඒකාන්ත සිදුවීම එසේම විය. වෙනස් නොවීය. අන් අයුරකින් නොවීය. එසේම බුදුන් විසින් හික්මවිය යුතු අවබෝධ කටයුතු යම් ඤාති පිරිසක් වීද ඒ සියල්ලෝම භාග්‍යවතුන් වහන්සේ විසින් මුළුමනින්ම තෙමේම හික්මවන ලදහ. ශ්‍රාවකයන් විසින් හික්මවිය යුතු වූද ධර්මය විසින් හික්මවිය යුතු වූද යම් අයෙක් වූවාහුද ශ්‍රාවකාදීන් විසින් හික්මවන ලද ඔවුහු හික්මීමට යත්. පමුණුවනු ලබත් වෙයි. භාග්‍යවතුන්

වහන්සේ විසින් යමක් සඳහා සම්බුද්ධත්වය ප්‍රාර්ථනය කරන ලදද ඒ අරමුණ සඳහා ඒකාන්තයෙන් සිදුවිය යුතු සම්බුද්ධත්වය එසේම වීය. වෙනස් නොවීය. අන් අයුරකින් නොවීය. තවද යම් යම් ඤෙය්‍ය (දතයුතු) ධර්මයක් පිළිබඳව යම් යම් ස්වභාවයක් අවබෝධ කටයුතුද ඒ ඒ කරුණ අත්ලෙහි තබන ලද නෙල්ලිගෙඩියක් මෙන් ආවර්ජනා ප්‍රතිබද්ධ වූ සිය නුවණින් නොවෙනස්ව මුළුමනින්ම භාග්‍යවතුන් විසින් අවබෝධකරන ලද්දේනුයි මෙසේද සම්බුද්ධත්වය එසේ වීය. වෙනස් නොවීය. අන් පරිද්දකින් නොවීය.

එසේම ඒ ධර්මයන්ගේ එසේ දේශනා කළයුතු ආකාරයද ඒ සත්ත්වයන්ගේ සිතේ ස්වභාවය සිතේ අප්‍රකට ස්වභාවය චරිතය අධිෂ්ඨානය යන මේවා මනාව බලා ධර්මානුකූල බව නොහැර ප්‍රඥප්තිමය වූ ව්‍යවහාරය නොඉක්මවන්නා වූද හිංසනය වූ පරිදි අදහස වූ පරිදි ධර්මානුකූල පරිදි අනුශාසනා කරන්නා වූද භාග්‍යවතුන් වහන්සේ විසින් හික්මවිය යුත්තෝ හික්මවන ලදහ. ආර්යභූමියට පැමිණවිය යුත්තෝද ධර්ම, විනය පැනවීමෙන් උන්වහන්සේගේ අර්ථ සිද්ධියෙන් ද තත්වූ පරිදි පැවැත්මෙන් ද එසේම වීය. වෙනස් නොවීය. අන් පරිදි නොවීය. එසේම භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ඒ (බුද්ධත්වයට) පැමිණෙන ලදද පඨවී ආදී වූද ස්පර්ශ-වේදනාදී වූද රූපී-අරූපී ස්වභාවයන්ගේ මිදෙන ලද ද බිඳියාම ආදී ස්වභාවය නොමැති හෙයින් ලෝක සත්ත්ව ස්වභාවය ඉක්මවන ලද ද අවිද්‍ය අඳුරින් මෙන් වූ හෙයින් කිසිවෙකු විසින් බැබලවිය නොයුතු වූ ලෝක ස්වභාවයන් නොමැති හෙයින්ම ගති ආදිය ස්වභාවයන් රහිත වූ ප්‍රතිෂ්ඨා රහිත වූ අරමුණු රහිත වූ අමෘතමහා නිර්වාණ ධාතුව ස්කන්ධ සංඛ්‍යාත වූ අල්වා ගැනීම් මදකුදු නොමැති හෙයින් අනුපාදිසේසයයි කියනු ලැබේ.

'මහණෙනි, එබඳු ආයතනයක් ඇත. යම්තැනක පඨවී ධාතුව නැත්ද ආපෝ ධාතුව නැත්ද තේජෝ ධාතුව නැත්ද වායෝ ධාතුව නැත්ද ආකාසානඤ්චායතනය නොවේද විඤ්ඤාණඤ්චායතනය නොවේද? ආකිඤ්චඤ්ඤායතනය නොවේද නේවසඤ්ඤානාසඤ්ඤා - යතනය නොවේද, මෙලොව නොවේද, පරලොව නොවේද, සඳ-හිරු දෙදෙන නොවේද යයි යමක් අරබයා දේශනා කරන ලද ද මහණෙනි මම එය පැමිණීම යයි නොකියමි. යෑම යයි නොකියමි. පැවැත්ම යයි නොකියමි. චුතියයයි නොකියමි. උපත යයි නොකියමි. ප්‍රතිෂ්ඨාව යයි

නොකියමි. මෙය නොපවත්නා වූ අරමුණු රහිත වූයේම වෙයි. මෙයම දුකෙහි කෙළවර වේ. එය සියළු උපාදානස්කන්ධයන්ගේ නැතිවීමයි. සියළු සංස්කාරයන්ගේ සන්සිඳීමයි. සියළු උපධීන්ගේ දුරුකිරීමයි. සියළු දුක්ඛයන්ගේ සන්සිඳුවීමයි. සියළු ආශාවන්ගේ නැසීමයි. සියළු සසර පැවැත්මේ සිඳ දැමීමයි. අතිශයින් ශාන්ති ලක්ෂණ ඇත්තේ වේ යයි යට කියන ලද ස්වභාවය කිසිවිටෙක අසත්‍ය නොවන හෙයින් එසේ වූයේ වෙයි. වෙනස් වූයේ නොවෙයි. අන් පරිදි වූයේ නොවෙයි. මෙසේ මේ අභිජාති ආදිය එසේ වටහාගන්නා ලදී. එළඹෙන ලදී. අවබෝධ කරන ලදී. පැමිණෙන ලදී. පත්වන ලදීනුයි තථාගත වේ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ එසේ ගියේනුයි තථාගත වේ.

කෙසේ නම් එසේ වූයේනුයි තථාගත වේද? පෙර සම්බුදුවරු යම් පරිදි වූවාහුද මේ භාග්‍යවතුන් වහන්සේද එපරිදිමයයි. කවරක් කියන ලද ද? යම් පරිද්දකින් ඒ භාග්‍යවතුන් වහන්සේලා මාර්ග සීලයෙන් ද ඵල සීල සීලයෙන් ද සියළු ලෞකික ලෝකෝත්තර ශීලයෙන් ද මාර්ග සමාධියෙන් ද ඵල සමාධියෙන් ද මාර්ග ප්‍රඥාවෙන් ද ඵල ප්‍රඥාවෙන් ද සියළුම ලෞකික - ලෝකෝත්තර ප්‍රඥාවෙන් ද දිනපතා පරිහරණය කළයුතු කෝටි සූවිසි ලක්ෂයක් සමාපත්ති විහරණයන්ගෙන්ද තාවකාලික මිදීමෙන්ද යටපත් කිරීමේ මිදීමෙන් ද මුළුමනින් සිඳලීමේ විමුක්තියෙන් ද සන්සිඳුන විමුක්තියෙන් ද නිදහස් වීමේ විමුක්තියෙන් ද (මිදුනේ යයි) කෙටියෙන් ද විස්තර වශයෙන් අනන්ත අප්‍රමාණ කොටස්වලින් යුත් නොසිතිය හැකි ආනුභාවයෙන් ද සියළු සර්වඥතා ගුණයන්ගෙන්ද මේ අපගේ භාග්‍යවතුන් වහන්සේ එබඳු වූ සේක. පෙර සියළු සම්මා සම්බුදුවරුන්ගේ ආයුෂ විවිධත්වය සිරුරේ ප්‍රමාණයෙහි විවිධත්වය කුලය පිළිබඳ විවිධත්වය, දුෂ්කර ක්‍රියා පිළිබඳ විවිධත්වය බුදුරැස් පිළිබඳ විවිධත්වය යයි මේ පස්වැදෑරුම් විවිධත්වයෙන් විවිධ වේ. සීල විශුද්ධි ආදී විශුද්ධීන් පිළිබඳව විවිධත්වයක් නොමැත්තේය. සමථ, විපස්සනා ප්‍රතිපත්තියෙහි තමා විසින් අවබෝධ කළ ගුණයන්හි කිසියම් වෙන් කිරීමක් ඇත. තවද ඒ භාග්‍යවත් බුදුවරු මැදින් බිඳින ලද රුවනක් මෙන් එකිනෙක වෙනසක් නැත්තාහ. එහෙයින් පෙර සම්මා සම්බුදුවරු යම් පරිදිද මේ භාග්‍යවතුන් වහන්සේ ද එපරිදි යයි තථාගත වේ. මෙසේ එපරිදි වේනුයි තථාගත වේ. මෙහි 'ගත' ශබ්දය 'ආකාර' යන අර්ථ ඇත්තේය. එසේමැයි. ලෞකික වූවාහු ආකාරයන්ගෙන් යුත් 'ගත' ශබ්දයන් ප්‍රකාරාර්ථයෙහි ප්‍රකාශ කෙරෙත්.

කෙසේ නම් 'එසේ පැවැත්තේ'නුයි තථාගත වේද? අනිකෙකුට සාධාරණ නොවූ සෘද්ධි මහිමයෙන් යුක්ත හෙයින් ද අර්ථ ප්‍රතිසම්භිදා ඥාණයන්ගේ උසස් පාරමීන්ට පැමිණීමෙන් අනාවරණ ඥාණය ලැබීමෙන් ද භාග්‍යවතුන් වහන්සේගේ කායික පැවැත්ම ආදීන්ගේ කිසිතැනක හැපීමක් නැති හෙයින් කෑමති පරිදි පැමිණීම් - යෑම් ද කායික වාචසික පැවැත්මද මොහුට ඇත්තේනුයි තථාගත වේ. මෙසේ 'එසේ පැවැත්තේ'නුයි තථාගත වේ.

කෙසේ නම් සත්‍ය වූ ධර්මයන්ගෙන් පැමිණියේනුයි තථාගත වේද? බුද්ධත්වය සම්පූර්ණ කිරීමෙහිදී ඊට විරුද්ධ පැවතීම් සංඛ්‍යාත 'අනථ' ධර්මයන් මුන්වහන්සේට නැත්තේනුයි තථ ධර්මයන්ගෙන් පැමිණියේ වෙයි. එය මෙහි ලා තථ භාවය වේ. ආශ්චර්යමත් දාන පාරමී ආදීන්හි නොවෙනස් බව, ආදීනව, ආනිසංස ප්‍රත්‍යවේක්ෂාව ආදී ක්‍රමයෙන් පැවති ඥාණයන්ගෙන් තථාගතයන් වහන්සේ පැමිණියේ වෙයි.

තවද ක්ලේශ-අභිසංස්කාර-ප්‍රවෘත්ති සංඛ්‍යාත වූ හෝ ස්කන්ධ ප්‍රවෘත්ති සංඛ්‍යාත වූම හෝ පස්වැදෑරුම් ගතීන්හි ගිය බවක් හෝ යන බවක් මොහුට නැතැයිනුයි ආගත වේ. සෝපධිසේස - නිරුපධිසේස නිර්වාණයට පැමිණීම පිණිස සත්‍ය වූ ආර්යමාර්ග ඥාණයන්ගෙන් තෙමේම පැමිණි බව වේ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ සත්‍ය වූ ධර්මයන්ගෙන් පැමිණියේනුයි තථාගත වේ.

කෙසේ නම් එසේ ගිය බැවින් තථාගත වේද? එසේ ගිය බැවින් යනු තථාගතයන් වහන්සේට සත් භාවයෙන් ප්‍රයෝජන ඇති බැවින් යන අර්ථයි. මේ තථාගත තෙමේ කවරෙක්ද? යමක් ඇති නිසා භාග්‍යවතුන් වහන්සේ තථාගත යයි කියනු ලැබේද? සද්ධර්මයයි. ආර්යමාර්ගය වූ කලී යම් පරිද්දකින් එකට බැඳී පවත්නා වූ සමථ - විදර්ශනා බලයෙන් මුළමනින් ක්ලේශපාක්ෂික ධර්මයන් නසන්නහු විසින් මුළමනින් ප්‍රහාණය කිරීමෙන් අවබෝධ කටයුතු හෙයින් තථාගත වේ. ඵල ධර්මය යනු යම් පරිද්දකින් තමාගේ මාර්ගානුරූපී ලෙස සංසිඳුවීම් - ප්‍රහාණය කිරීම් වශයෙන් අවබෝධ කටයුතු හෙයින් තථාගත බව පැවතියේය. යනුයි. යම්බඳු වූ නිර්වාණ ධර්මය ප්‍රඥාවෙන් අවබෝධ කරන ලද ද සියළු සසර දුක් සංසිඳුවීම පිණිස සපිරේද බුදුවරුන් විසින් එසේ ගියේය. අවබෝධ කරන ලද්දේය යයි තථාගත වේ.

යම් සේ පෙර බුදුවරුන් විසින් පර්යාප්ති ධර්මය ද සූත්‍ර-ගාථා ආදී වශයෙන් පවත්වන ලද ද මුල යහපත් වූ පරිදි දේශනා කිරීම් වශයෙන් භික්මවිය යුත්තන්ගේ සිතේ ස්වභාවයන්ට සුදුසු ලෙස පවත්වන ලද ද එසේ අපගේ භාග්‍යවතුන් වහන්සේ විසින්ද පවත්වන ලදැයි තථාගත වේ. අවබෝධ කරන ලදී. දේශනා කරන ලදී. පවත්වන ලදී යයි තථාගත වේ. යම්පරිදි භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද ද එසේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයන් විසින් අවබෝධ කරන ලදී. වටහා ගන්නා ලදී යයි තථාගත වේ. මෙසේ සියළුම සද්ධර්මය තථාගත වේ. එහෙයින් දෙවියන්ට ප්‍රධාන වූ ශක්‍ර තෙමේ මෙසේ කීය.

'දෙව් මිනිසුන් විසින් පුදන ලද්දා වූ තථාගත ධර්මය නමස්කාර කරමු. යහපතක් වේවා යි යනුවෙනි. ඒ මේ දෙය ඇත්තේනුයි භාග්‍යවතුන් වහන්සේ තථාගත වේ. යම්සේ ධර්මයද මෙසේ ආර්ය සංඝයාද, යම් පරිදි තමාගේ හිත පිණිස ද අනුන්ගේ හිත පිණිස ද පිළිපන්නවුන් විසින් අතිශයින් පිරිසිදු වූ පූර්වභාගී සමථ විදර්ශනා ප්‍රතිපදාව පෙරටු කර ඒ ඒ මාර්ගයෙන් යායුතු තැනට එසේම ගියේනුයි තථාගත වේ.

යම් පරිදි භාග්‍යවතුන් වහන්සේ විසින් සත්‍යය. පටිච්ච සමුප්පාදය ආදිය දේශනා කරන ලද ද එසේ අවබෝධ කළ හෙයින් ද එසේ දේශනාකළ හෙයින් ද තථාගත වේ. එහෙයින් ශක්‍ර දෙව්රජු කියන ලදී. දෙව්මිනිසුන් විසින් පුදන ලද තථාගත සංඝයා නමස්කාර කරමු. යහපතක් වේවා යනුයි. ඒ ආර්ය සංඝයා මුන්වහන්සේට ශ්‍රාවක වූයේනුයි භාග්‍යවතුන් වහන්සේ තථාගත වේ. මෙසේ එලෙස ගිය බැවින්ම තථාගත වේ.

මෙයද තථාගතයන් වහන්සේගේ තථාගත බව දැක්වීමෙහි පිවිසීම් පමණමැයි. සර්වප්‍රකාරයෙන් වූ කලී තථාගතයන් වහන්සේම තථාගතයන් වහන්සේගේ තථාගත භාවය වර්ණනා කරන්නේය. මේ තථාගත පදවිය මහත් වූවකි. මහත් වූ ස්වභාව ඇත්තෙකි. මහත් වූ විෂයයකි. ඒ අප්‍රමාද පදයාගේ මෙනි. ත්‍රිපිටක බුද්ධ වචනයද සුදුසු පරිදි අරුත් දැකීමේ අදහසින් පටන්ගන්නා වූ ධර්මකථික තෙමේ නොතොටෙහි පිළිපන්නේ යයි කිවයුතුයි.

එහිලා මෙය කියනු ලබයි.

'ලොවැ සර්වඥ බවට පත් මහර්ෂී වූ පෙර මුනිවරු යම් පරිද්දකින් මෙහි පැමිණියාහු ද මේ ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේද එසේ පැමිණියේය. එහෙයින් පසැස් ඇත්තා වූ බුදුරදුන් තථාගත යයි කියනු ලැබෙයි.

පෙර බුදුවරු සමාධි නුවණින් කාමාදී කිළිටි මුළුමනින් දුරුකර යම් පරිද්දකින් පැමිණියාහුද ප්‍රභාවත් වූ ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේද එසේ පැමිණියේය. එහෙයින් තථාගත යයි දන්නා ලදී.

මේ ජිනෙන්‍රියන් වහන්සේ සත්‍ය වූ ධර්මයද ධාතු ආයතන ආදී ලක්ෂණය ද සත්‍යය ඒ හා සමාන ආකාරයද යන අයුරින් ස්වයම්භූ ඥානයෙන් එක්තැන් වූ සේක. (එහෙයින්) ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ තථාගත යයි කියනු ලැබේ.

සමන්ත චක්‍ෂු වූ බුදුරදුන් විසින් තත් වූ පරිදි වූ සත්‍යයන්ද එසේම ප්‍රතීත්‍ය සමුත්පාදයද මුළුමනින්ම අනිකෙකු විසින් අවබෝධ කළ නොහැකි අයුරින් ප්‍රකාශ කරන ලදී. එහෙයින් එසේ අවබෝධ කළ ජිනයන් වහන්සේ තථාගත වන සේක.

නොයෙක් කොටස්වලින් යුත් (විවිධ වූ) ලෝකධාතූන්හි රූප-ආයතනාදීන්ට ගොදුරු වූ විසිතුරු ප්‍රභේදයන්හි සත්‍ය වූම දැක්මක් ජිනයන් වහන්සේට වීය. සියල්ල දක්නා වූ භාග්‍යවතුන් වහන්සේ එහෙයින් තථාගත වේ.

ධර්මය යම්පරිද්දකින් වීද ඒ සත්‍ය වූවම දේශනා කරයි. ඊට ගැලපෙන පරිදිම තමාගේ කටයුතු කරයි. සිය ගුණයන්ගෙන් ලෝකය මැඩපවතවා සිටී. එහෙයින්ද ලෝකනායකයන් වහන්සේ තථාගත වන සේක.

(එසේම) සත්‍ය වූ ධර්මයන් මුළුමනින් සත්‍ය ලෙස අවබෝධ කර ලොව හටගැනීම පිළිබඳව දේශනා කළේය. ලොව ඉක්මවීය. ප්‍රත්‍යක්ෂයෙන්ම නිවීමට ගියේය. තථාගත තෙමේ ආර්යමාර්ගය අනුව ගියේය.

සත්‍ය වූ ධර්මයන් මුළුමනින්ම සත්‍ය ලෙස ප්‍රතිඥා කර ලෝකයාට හිත පිණිස යම්හෙයකින් පැමිණියේද ඒ නාථයන් වහන්සේ හැමකල්හි කරුණාවෙන් පිළිපන්නේය. එහෙයින් ද බුදුරදුන් තථාගත වේ.

යම් හෙයකින් විෂයාවබෝධයෙන් සත්‍ය වූ ඤාණයන් එක්තැන් වීද එසේම විශිෂ්ට වූ උපතේ පටන් ඒ කරුණු සම්පාදනය කිරීමෙන් බුදුරදුන් තථාගත වේ.

ඒ පෙර බුදුවරු යම් පරිදි වූවාහුද මේ බුදුරදුන්ද එසේ වීය. යම් අභිලාසයන් වීද එයද එසේ විය. පැවැත්ම දේශනය හා චිත්ත ස්වභාවයෙන් ද එසේ වීය. එහෙයින් අග්‍ර පුද්ගල වූ බුදුරදුන් තථාගත යයි කියනු ලැබේ.

මෙතෙමේ පූර්වයෙහි බෝධිසම්භාරයන් (පාරමිතා) අවුලට පත් කරමින් ගියේ නොවෙයි. අනාථනාථ වූ සසර කෙළවර දක්නා වූ මුන්වහන්සේට සසර ගමනක්ද නැත. එනිසා යථානුකූලව පැමිණියේ එහෙයින් තථාගත වේ.

ධර්මධර වූ මහර්ෂී වූ තථාගතයන් වහන්සේ යම් පරිද්දකින් හළයුතු කෙලෙස් මල ප්‍රහාණය කෙරේද ආර්ය මාර්ගාමී වූ ශාස්තෘන් හා එක්වූ හෙයින් ද තථාගත වේ යනුයි.

මහද්ධිකතා යනු උතුම් වූ සිත් වසඟ භාවයෙන් ද ඍද්ධිවිධයන්හි යෙදීමෙන් ධර්මානුභාවයෙන් අන් බවක් නිපදවනු සමත් බව සංඛ්‍යාත වූ මහත් වූ ඍද්ධියෙන් යුක්ත වන හෙයින් මහිද්ධිකතා යනු වේ. බොහෝ කලක් පටන් ඇති වූ ඉතා අධික දුරක සිට සතුරු වූ අපේක්ෂිතාර්ථ සාධනයට හේතු වූ මහත් කාන්ති ඇති පින් තෙදින් යුක්ත වූ බව ඇති හෙයින් මහානුභාවතා වේ. **යත්‍ර** යනු ආශ්චර්යය, ප්‍රශංසාව කුහුල සිනහව ප්‍රසාදය යන අර්ථයන්හි නිපාතයයි. එයින් යුක්ත හෙයිනි. **විජායිස්සති** යනු අනාගත කාලික වචනයකි. අර්ථය වූ කලී අතීත කාලයෙහිම වේ. මේ මෙහි අර්ථයයි. යම්බඳු වූ මෝ සුපපාවාසා තොමෝ එලෙස දුකෙහි ගිලුනී. අපහසුවට පත් වූවා භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සමාන කල්හිම සුවපත්ව නිරෝගී වූවා නිරෝගී පුතෙකු වැදුවාය යනුයි. **අත්තමනෝ** යනු සිය සිතයි. භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ප්‍රසාදයෙන් කෙලෙස් රහිත සිත් ඇත්තේ යන අර්ථයයි. කෙලෙස්වලින් මෙහෙයවන ලද සිත තමා විෂයෙහි නොපවත්වන හෙයින් සතුටු සිත් ඇත්තේ යි. එලෙස සිටින්නට නොහැක යනුයි. තවද **අත්තමනෝ** යනු ප්‍රීති සොම්නස් බැවින් ගන්නා ලද සිත් ඇත්තේ. **පමුදිතෝ** යනු සතුටින් යුක්ත වූයේ. **පීති සොමනස්ස ජාතෝ** යනු හටගත්තා වූ බලවත් ප්‍රීති සොම්නස් ඇත්තේ. **අථ** යනු පසුව අනතුරුව කිහිප දිනක් ඇවෑමෙන් **සත්ත හත්තානි**

යනු සත්දවසක් හි දිය යුතු බත්. **සඛාතනාය** යනු හෙට දවසේ පිං පිණිස. හෙට බුද්ධප්‍රමුඛ සංඝයාට දන්දීම් වශයෙන් ද ඇසුරු කිරීම් වශයෙන් ද යම් පිනක් වන්නේ ද ඒ සඳහා. 'අනතුරුව භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහ මුගලන් තෙරුන් ඇමතීය.' යනුවෙනි. කුමක් හෙයින් ඇමතීද යත්, සුප්පවාසාවගේ සැමියාගේ ප්‍රසාදය රැකීම සඳහායි. සුප්පවාසාවගේ ප්‍රසාදය රැකීම සඳහා නොවේ. සුප්පවාසාව වූ කලී නොසැලෙන ප්‍රසාද ඇත්තීම වේ. උපාසකයාගේ ප්‍රසාදය රැකීම මහමුගලන් තෙරුන්ට භාරය. එහෙයින් කීය. 'මෙතෙම ඔබගේ උපස්ථායකැ'යි යනුවෙනි.

එහි **තුයෙහෙසෝ** යනු තුයාං එසෝ යන විසන්ධිය වේ. **තිණ්ණං ධම්මානං පාටිභොගෝ** යනු මගේ සම්පත් (භෝගයන්) ආදී වූ ත්‍රිවිධ කරුණුවල හානි නොවීම පිණිස විනාශ නොවීම පිණිස ආර්ය වූ මහමුගලන් තෙරුන් **යදි පටිභාගෝ** ඉදින් ඇප වූයේ සත් දිනක් නොඉක්මවා මට දන්දීමට හැකියයි ඉදින් ආර්යයන් වහන්සේ විසින් දන්නා ලදී යයි දක්වයි. තෙරුන්වහන්සේ ද එදිනයන්හි ඔහුගේ භෝගයන්ට ද ජීවිතයටද උපද්‍රව රහිත බව දැක මෙසේ වදාළ සේක. ඇවැත්නි, භෝගයන්වද ජීවිතයටදැයි යන ඔවුන්ගේ කරුණු දෙකට ඇප වෙමි යනුවෙනි. ශ්‍රද්ධා තොමෝ ඔහුගේ සිත හා බැඳුනේ යයි ඔහුටම භාර කරමින් 'ශ්‍රද්ධාව කරණ කොටගෙන ඔබම ඇප වවයි වදාළ සේක. තවද දක්නා ලද සත්‍ය ඇති ඒ උපාසක තෙමේ ඔහුගේ ශ්‍රද්ධාවෙහි වෙනස් බවක් නැත යනුයි එසේම කියන ලදී. ඒ කරුණින් භාග්‍යවතුන් වහන්සේ විසින් පසුවද ඔබ එබඳු වූවෙක් කරන්නෙහි යයි දක්වව යයි **කියන ලදී.** උපාසක තෙමේ ද ශාස්තෘන් වහන්සේ කෙරෙහිද තෙරුන් කෙරෙහිද ගෞරවයෙන් ඒ සුප්පවාසාවගේ පිනින් යහපත කැමති වන්නේ කෝලිධීතා වූ සුප්පවාසා සත්දිනක් දන් දීම කෙරේවා. මම පසුව කරන්නෙමියි අනුදත්තේය. **සත්තඛ දාරකං** යනු උපන්දින පටන් එකොළොස් දිනයක් නොඉක්මවා ඉන්පසු සත්දිනක් බුද්ධප්‍රමුඛ භික්ෂු සමූහයා වළඳවා සත්වන දිනයෙහි සත්අවුරුදු වයස් ඇති ඒ දරුවා භාග්‍යවතුන් වහන්සේවද **භික්ෂු සංඝයාද** වැන්දවීය. **සත්තවස්සානි** යනු අවුරුදු සතක්. මෙය අත්‍යන්ත සංගොග වශයෙන් යෙදූ වචනයකි. **ලොහිත කුම්භියං වුට්ඨාති** යනු මවිකුසෙහි තමාගේ ගැබ තුළ වාසය කිරීමේ දුක අරබයා කියයි. **අඤ්ඤානි පි එවරූපානි සත්ත පුත්තානි** යනු අඤ්ඤෙපි එව රූපෙ සත්ත පුත්තෙ (මෙබඳු වූ අන් පුතුන් සත් දෙනෙකු) යයි කිවයුතු තන්හි ලිංග විපර්යාසයෙන් **කියන ලදී. එවරූපානි** යනු මෙසේ ගැබ් දැරීම් වශයෙන් සත් අවුරුදු

සත්දිනක් මුළා වූ ගැබ් ඇති බැවින් මහත් වූ දුකට පත් කරවා උපදවන්නා වූ පුත්‍රයන් යන අර්ථයයි. මෙයින් ස්ත්‍රීන්ගේ ලොල්බව නිසා පුත්‍රයන් ලැබීමෙන් අතෘප්තිමත් බව යයි දක්වයි.

එතමත්ථං විදිත්වා යනු මේ සත්දිනක් අධික කොට ඇති සත් අවුරුද්දක් ගැබ් දැරීම් ආදී වශයෙන් පැවති මහත් වූ දුක එක්වරම දැක පුත්‍රයන්ට ලොල් කිරීම් වශයෙන් යට කියන ලද කරුණ දැන. **ඉමං උදානං** යනු චිත්තසුඛයෙහි මත්වූවෙක් මනෝඥ ආකාරයෙන් ප්‍රමාදී පුද්ගලයෙකු රවටන්නාක් මෙන් රවටා තෘෂ්ණා-ආලය ප්‍රහාණය කරන්නා වූ ආකාරය දක්වන්නා වූ මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළේය.

එහි **අසාතං** යනු අමිහිරි, සුන්දර නොවන, මනෝඥ නොවන, **සාතරූපෙන** යනු මනෝඥ (ප්‍රිය) ස්වභාවයෙන්. **පිය රූපෙන** යනු ප්‍රිය කළ යුතු බැවින් - සුඛසය රූපෙන යනු සැප සහිත බැවින් මෙය කියන ලද්දේ වෙයි. යම්හෙයකින් සැප රහිත වූ අප්‍රිය වූ දුක හා සමාන වූ සංසාරගත සියළු සංස්කාර සමූහය ප්‍රහාණය නොකිරීම හා වෙනස් වීමේ ස්වභාවය නිසා නුනුවණින් මෙනෙහි කිරීමෙන් මනෝඥ මෙන් ප්‍රිය වූ ප්‍රිය පහස් ඇත්තක් මෙන් වටහාගන්නා වූ, සිහියෙන් තොර බැවින් මත් වූ පුද්ගලයා ඉක්මවා පවතී. මැඩ පවත්වයි. වසාගෙන පැතිරෙයි. එහෙයින් මේ සුප්පවාසාවටද නැවත මෙබඳු සැප රහිත අමනෝඥ වූ දුක, සැප ආදියට සුදුසු වූ පුත්‍ර සංඛ්‍යාත වස්තු සුඛයෙන් වසා පැතිරෙයි.

අටවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

2-9

නවවැන්නෙහි **පුබ්බාරාමෙ** යනු අනුරාධපුරයේ පෙරදිග කොටසෙහි උතුම් දේවියගේ විහාරය හා සමාන තැන්හි කරවන ලද්දා වූ සැවත් නුවර පිහිටි ආරාමයෙහි. **මිගාර මාතු පාසාදෙ** යනු මේ එහි අනුපිළිවෙල කථාවයි. අතීතයෙහි කල්ප සියයක් පමණ කාලයෙහි එක් උපාසිකාවක් පදුමුත්තර බුදුන් අත් එක් උවැසියක් තමාගේ අග්‍ර උපස්ථායිකා තනතුරෙහි තබනු දැක භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කර බුද්ධ ප්‍රමුඛ

ලක්ෂයක් භික්ෂූන්ට දන් දී බුදුරදුන්ට වැදහෙව අයුරක් කොට අනාගතයෙහි ඔබවහන්සේ වැනි බුදුවරයෙකුගේ අග්‍ර උපස්ථායිකාව වන්නේ නම් යයි ප්‍රාර්ථනා කළාය. ඕ තොමෝ කල්ප ලක්ෂයක් දෙවියන් අතරද මිනිසුන් අතර ද සැරි සරා අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හද්දිය නගරයෙහි මෙණ්ඩක සිටුගේ පුත් වූ ධනංජය සිටුගේ නිවසෙහි සුමනා දේවියගේ කුසෙහි පිළිසිඳ ගත්තාය. උපන් පසු ඇයට විසාඛා යයි නම් කළාහුය. යම්දිනෙක බුදුරදුන් හද්දිය නගරයට වැඩි සේක් ද එකල්හි ඇය දැරියන් පන්සියයක් සමඟ භාග්‍යවතුන් වහන්සේට පෙර ගමන් කොට පළමු දැකීමෙන් සෝවාන් වූවාය.

පසුකාලයෙහි සැවත් නුවර මිගාර සිටු පුත්‍රයා වූ පූර්ණවර්ධන කුමාරයාගේ ගෙට ගියාය. එහිදී ඇගේ මාමණ්ඩිය වූ මිගාර සිටු තෙමේ තමාට කළ උපකාර වශයෙන් මව් තනතුරෙහි තැබුවාය. එහෙයින් මිගාර මාතා යයි කියනු ලැබේ. තමාගේ මහාලතා ප්‍රසාදන නම් ආභරණය විකුණා නවකෝටියකින් භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂු සංඝයාටද වාසය පිණිස කිරියක් පමණ භූමි භාගයෙහි මතු මහලෙහි කාමර පන්සීයක, යට මහලෙහි කාමර පන්සියයකැයි කාමර දහසකින් යුත් ප්‍රාසාදයක් කරවීය. එහෙයින් "මිගාර මාතු පාසාදෙ" යයි කියන ලදී. **කොච් දෙව අත්‍ථො** යනු කිසියම් ප්‍රයෝජනයක්. **රක්ඛෙය්‍ය** යනු රජ බිසව කෙරෙහි. **පටිබද්ධො** යනු ඇළුනේ. විශාඛාවගේ නෑ නිවසකින් මැණික් මුතු ආදියෙන් කරන ලද එබදු උපකරණයක් ඇයට පඬුරු පිණිස එවන ලදී. එය නුවර දොර අභියසට පත් වූ විට අයබදු කරුවෝ එය පිළිබඳ බදු ගනු ලබන්නෝ එයට සුදුසු පරිදි නොගෙන වැඩිමනත් ගත්තාහුය. ඒ අසා විශාකා තොමෝ රජුට ඒ බව දන්වනු කැමැත්තී සුදුසු පිරිවර සමඟින් රජ මැදුරට ගියාය. එකෙනෙහි රජු මල්ලිකා දේවිය සමඟ අන්තඃපුරයට ගියේ වෙයි. විශාඛාව අවකාශයක් නොලබන්නී දන් ලබන්නෙමියි ආහාර ගනු ලබන වේලාවද ඉක්මවා සිඳුන බත් ඇත්තී වී ගියාය. මෙසේ දෙතුන් දිනක් ගොස් නමුත් අවකාශයක් නොලද්දීමය. මෙසේ රජු වෙත නොදන්වන ලද්දේ ද ඒ කරුණු විමසීමට අවකාශ ඇති කිරීමෙන් "යථා අධිප්පායං න තිරෙති" යයි කියන ලදී.

එහි යථා අධිප්පායං යනු අභිලාශයට ගැලපෙන අයුරින් **න තිරෙති** යනු නො නිමවයි. රජු අයත් අයබදු පමණක් රජුට දී ඉතිරිය විසඳාලන්නට මහෝපාසිකාවගේ අදහස වීය. ඇය රජ විසින් නොදක්නා ලද හෙයින් **තීරණය** නොවීය යනුයි. හඳ යනු අත්හැරීම් අර්ථයෙහි

නිපාතයකි. දිවා දිවසස යනු දවසෙහි දහවල්ය. මධ්‍යාහ්න වේලාවෙහි යන අර්ථයි. කිසියම් කළයුත්තක් නිසා දවසෙහි දහවල් කාලයෙහි දෙතුන් දිනක් එළඹියෙමි. භාග්‍යවතුන් වහන්සේ වෙතම එළඹී මම දැකීමෙන් වන උතුම් පින ආදිය ලැබීම වැන කරුණු හෙයින් අරුත් සහිත යයි (දක්වන්නීම) ස්වාමීනී; මම මෙම වේලාවෙහි මෙහි පැමිණියා වෙමියි මෙම කරුණ දක්වන්නී වූ මහා උපාසිකා තොමෝ **ඉධ මෙ භන්තෙ** ආදිය කීවාය. **එතමත්ථං** යනු මෙසේ අනුන් අයත් වූ අධිෂ්ඨානය සමෘද්ධ වීම සංඛ්‍යාත ප්‍රයෝජනය දැන **ඉමං උදානං** යනු මෙම අනුන් අයත් වූ පැවැත්ම ඇති අය පිළිබඳ ආදීනවයන් හා ආනිසංසයන් දක්වන්නා වූ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළේය.

එහි **සබ්බං පරවසං දුක්ඛං** යනු යම්කිසි අභිවෘද්ධියක් ප්‍රයෝජනයක් අනුන් පිළිබඳවද අනුන් අයත් ද එය තමාගේ කැමැත්තෙන් නිපදවන්නට නොහැකි නිසා දුක්ඛං දුක් එළවන්නේ වේ යයි අර්ථයි. **සබ්බං ඉස්සරියං සුඛං** යනු ඓශ්වර්යය ලෞකික හා ලෝකොත්තර යයි දෙයාකාරය. එහි රජ ඉසුරු ආදියද ලෞකික ධ්‍යාන අභිඥ ඉපදවීම වූ සිතේ ඉසුරුමත් බවද ලෞකික ඓශ්වර්යය වේ. මාර්ග ඵලාධිගමය නිරෝධ සංඛ්‍යාත ඉසුරුමත් බව ලෝකෝත්තර ඓශ්වර්යය වේ. මේවා අතර සක්විති බව අවසන් කොට ඇති මිනිසුන් අතර වූ යම් ඉසුරුමත් බවක් වේද ශක්‍ර ආදීන්ගේ ඒ ඒ දේව සමූහයා අතර අධිපති බවට හේතු වූ ඉසුරුමත් බවක් වේද, ඒ දෙක ඉදින් කර්මයේ මහිමයෙන් කැමති පරිදි ලද යුතු සැපයට හේතු වූ හෙයින් සැපයක් වේ. වෙනස් වීම් සංඛ්‍යාත දුක් ඇති හෙයින් හැම පරිද්දෙන්ම දුකක්ම වේ. අනිත්‍ය බව අවසන් කොට ඇති හෙයින් ලෞකික ධ්‍යාන ඉපදවීම සංඛ්‍යාත සිතේ ඉසුරුමත් බවද එසේමය. ලෝක ධර්මයන්ගෙන් කිසිවා නොවන හෙයින්ද නොවෙනස් වන ස්වභාව ඇති හෙයින්ද නිරෝධ ඓශ්වර්යය ඒකාන්ත සැපය වේ. මේ සියළු තන්හි අපරාධීන බැවින් යම් සිතේ සුවයක් ලබයිද එය අරමුණු කොට ශාස්තෘන් වහන්සේ "සබ්බං ඉස්සරියං සුඛං" යයි වදාළ සේක. **සාධාරණෙ විහඤ්ඤතනි** යන මෙය "සබ්බං පරවසං දුක්ඛං" යන මේ පදයට අරුත් විස්තරයයි. මේ මෙහි අර්ථය වේ. පොදු වූ ප්‍රයෝජනයක් සිද්ධ කටයුතු තන්හීදි ඔහුගේ පරාධීන බව නිසා අභිලාෂ වූ පරිදි නොනිපදවන හෙයින් මෙම සත්වයෝ නසනු ලබත් විනාශයට පැමිණෙත් වෙහෙසෙත්. **යෝගහී දුරතික්කමා** යනු යම් හෙයකින් කාම යෝග භව යෝග දිට්ඨි යෝග හා අවිද්‍යා යෝගයන් දීර්ඝ කාලයක් භාවිතා කළාහූ රැස් නොකරන ලද කුසල සම්භාරයන්ගෙන් දුරුකරන්නට නොහැකි හෙයින් ඉක්මවන්නට නොහැකි වන්නාහූ, මොවුන් අතර දිට්ඨියෝගය

පලමු මාර්ගයෙන් දුරු කළ යුතුය. කාම යෝගය තෙවන මාර්ගයෙන් දුරු කළ යුතුය. අන්‍යයන් අවසන් මාර්ගයෙන් දුරු කළ යුතුය. මෙසේ ආර්යමාර්ගයෙන් අවබෝධ කිරීම අපහසු හෙයින් මේ යෝගයෝ දුරු කිරීම අපහසු වෙත්. එහෙයින් කාම යෝග ආදී වශයෙන් කැමති දෑ නොලැබීමේ හේතුවෙන් සත්ත්වයෝ නැසෙත්. පොදු නොවූ චිත්ත ඓශ්වර්යයත් නිරෝධ ඓශ්වර්යයත් ඇතිකල්හි කිසි විටෙක විනාශයක (සිතේ කරදරයක) හටගැනීමක් නොවේ යයි යන අදහස වේ.

තවද **සබ්බං පරවසං** යනු තමාගේ අනිකෙකු හා බැඳුන හේතුවෙන් යම් පැවැත්මක් වේද ඒ සියල්ල අනිත්‍ය ස්වභාවය ඇති හෙයින් එය දුකක් වේ. "යමක් අනිත්‍යද එය දුක යයි" කියන ලදී. **සබ්බං ඉස්සරියං** යනු සියළු සංස්කෘත ධර්මයන් නිස්සරණය කිරීම් නැමති ඓශ්වර්යයට තැන් වූ හෙයින් "ඉස්සරි" යයි ලබන ලද නම් ඇති නිවන ඒ උපාධිසේස ආදී වූ කොටස් ඇති සියළු සැප 'නිවන පරම සුවයයැ'යි කියන ලදී. **සාධාරණෙ** යනු මෙසේ දුක - සැප වෙන් කළ කල්හි මේ සත්ත්වයෝ බොහෝ කොට පොදු වූ දුක් ගෙන දෙන කාරණයෙහි ගැලී නැසෙත්. **යොගාහි දුරතික්කමා** යනු යම්හෙයකින් ඔවුනු සියළු තන්හි ගිලීමට හේතු වූ කාමාදී යෝගයෝ ඉක්මවිය නොහැක්කෝ වෙති. විශාඛාවනි, එහෙයින් ඔබද අනුන් අයත් වූ ප්‍රයෝජනය ප්‍රාර්ථනා කර (එය) නොලබන්නී නැසෙන්නෙහි යයි යන අදහස යයි.

නව වන සූත්‍ර වර්ණනාව නිමියේය.

2-10

දසවැන්නෙහි **අනුපියායං** යනු මෙනම් වූ නගරයෙහි. අම්බවනෙ යනු ඒ නගරය නුදුරෙහි මල්ල රජුන්ගේ එක් අඹ වනයක් විය. එහි මල්ල රජුන් විසින් විහාරයක් කරන ලදී. එය අඹවනය යයි කියනු ලබයි. අනුපිය අඹ වනය ගොඳුරු කොට භාග්‍යවතුන් වහන්සේ එහි වාසය කරයි. එහෙයින් "අනුපියායං විහරති අම්බවනෙ" යයි කියන ලදී. **භද්දියො** යනු ඒ තෙරුන්ගේ නමයි. **කාලිගොධාය පුත්තො** යනු කාලිගෝධා නම් වූ ශාක්‍යයන් අතර යම් ශාකය රාජ දේවියක් වූවාද ඕ ආයෘ ශ්‍රාවිකා වූවා ලබන ලද මාර්ගඵල ඇත්තී දන්නා ලද සසුන් ඇත්තීද වූවාය. මේ ඇයගේ පුත්‍රයායි. ඔහුගේ පැවිදි වූ අයුරු ඛන්ධකයෙහි පැමිණියේම වේ.

හෙතෙම පැවිදි වී විදර්ශනා උපදවා නොබෝ කළකින්ම ෂට් අභිඥාලාභී වූයේය. කෙලෙස් ධුතාංග සමාදන් වී පවතී. භාග්‍යවතුන් වහන්සේ විසින් ද "මහණෙනි මාගේ ශ්‍රාවක වූ උසස් කුල ඇති භික්ෂූන් අතර යම් මේ කාලිගෝධාවගේ පුත් වූ භද්දිය තෙරුන් අග්‍රයයි අසූ මහා ශ්‍රාවකයන් අතර උසස් කුල ඇති බැව්හි අග්‍රස්ථානයේ තබන ලදී. **සුඤ්ඤාගාරගතො** යනු ගමද ගම සමීපයද සෙසු වනයද හැර යයි කියන ලදී. වනයද ගස් මුලද හැර වෙනත් පර්වත - ගල් ගුහා ආදී වූ පැවිද්දන්ට සුදුසු වාසස්ථානය ජනයාගෙන් වන ගැහැට නොමැති හෙයින් මෙහි ශූන්‍යාගාරයයි අදහස් කරන ලදී. තවද වැදි- ගොවි ආදීන්ගේ ශබ්දයන් නොමැති හෙයින් විවේකී වූ යම්කිසි ගෙයක්ද ශූන්‍යාගාරය යයි දත යුතුය. එවැනි ශූන්‍යාගාරයකට ගියේ. **අභික්ඛණං** යනු බහුලව. **උදානං උදානෙති** යනු ආයුෂ්මත් උන්වහන්සේ වනයෙහි දිවා විහරණයට එළඹියේද රාත්‍රී කාලයෙහි විසීමට එළඹියේද බොහෝසෙයින් ඵල සමාපත්ති සුවයෙන්ද නිරෝධ සමාපත්ති සුවයෙන් ද ගෙවයි. එහෙයින් ඒ සුවය අරභයා පෙර තමා විඳින ලද බිය සහිත දෑවීම් සහිත රජ සැප පිළිකුල් කොට. අහො සුඛං අහො සුඛං යයි සොම්නසින් යුත් නුවණැති බැවින් යුතුව හටගත් ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කරයි. **සුත්වාන තෙසං එතදහොසි** යනු ඒ බොහෝ භික්ෂූන්ට ඒ උදම් අනන්නා වූ ආයුෂ්මත් භද්දිය තෙරුන්ගේ "අහෝ සැපයකි අහෝ සැපයක්"යි යන ප්‍රීති වාක්‍යය අසා ඒකාන්තයෙන් නොඇලී බඹසර හැසිරෙයි යයි මෙසේ සිතුවිල්ලක් විය. ඒ පුහුදුන් භික්ෂූහු ඒ ආයුෂ්මතුන් වහන්සේගේ විවේක සුවය අරබයා කළ ප්‍රීති වාක්‍යයකැයි නොදන්නාහූ මෙසේ සිතූහ. එහෙයින් "**නිසසංසයං**"(සැක රහිතව) ආදිය කියන ලදී. **නිසසංසයං** යනු සැක රහිතව ඒකාන්තයෙන් යන අර්ථයි. "යම්හෙයකින් හෙතෙම පළමුව ගිහිගෙයි වූයේම යන පෙල කියා අනුභව කළේය යන වචන වශයෙන් ඇතැම්හු අරුත් විස්තර කරති. සෙස්සෝ "යං සා"යනුවෙන්ද කියත් **"යං ස පුබ්බෙ අගාරිය භූතසස"** යනු පෙළ වේ. එහි **යංසා** යනු යමක් වීද? සන්ධි වීම් වශයෙන් "අ" කාරය හා "ස" කාරය ලෝපය වේ. "එවං ස තෙ පුජ්ජං සා උපජ්ජි" යන තන්හි මෙනි. එහි අර්ථයඃ ආයුෂ්මත් භද්දිය තෙරුන්ට පැවිද්දෙන් පෙර ගිහිගෙයි වූවානුගේ යම් රාජ සැපයක් අනුභව කරන ලද්දේ වී නම්. **සො තමනුසසරමානො** යනු හෙතෙම දන් ඒ සැපය උකටලී වීම් වශයෙන් සිහිකරමින්. **තෙ භික්ඛු භගවන්තං එතදවොචුං** යනු උසස් කර ප්‍රකාශ කිරීමේ ස්වභාවයෙන් යුත් ඒ බොහෝ භික්ෂූහු උන්වහන්සේට අනුග්‍රහ කිරීමේ අදහසින් භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවාහුය. දොස් පැවරීම් වශයෙන් නොවේ. **අඤ්ඤතරං** යනු නම් ගොත් වශයෙන් ප්‍රසිද්ධ නැති

එක් භික්ෂූවක්. **ආමන්තෙසි** යනු ඒ භික්ෂූන් භගවනු කැමැත්තේ ඇතවීය එවං යනු වචන පිළිගැනීමෙහි මැනවයි යන අර්ථය, නැවත "එවං" යනු ප්‍රතිඥා කළ ඇසිල්ලෙහි. **අහෝ සුඛං අහො සුඛන්ති ඉම උදානං උදනෙසි** යනු ඒ භික්ෂුහු **යම් සේ කියත්ද** එය එසේම යයි තමාගේ **ප්‍රීති** වාක්‍ය ප්‍රකාශය පිළිගනී. **කිම්පන භඟං** හද්දිය යනු භාග්‍යවතුන් වහන්සේ කිමැයි විමසයි. **කිම** ඔහුගේ සිත නොදන්නේ ද? අප නොදනී. ඔහු ලවාම ඒ කරුණ කියවා ඒ භික්ෂූන් දනුවත් කරන්නට විමසයි. මෙය කියන ලදී. දන්නා වූම තථාගතයන් වහන්සේලා (ඒ ඒ කරුණු පිළිබඳව) විමසත්. දන්නා වූම තථාගතයන් වහන්සේලා නොවිමසත් යයි ආදී වශයෙනි. **අත්ථවසං** යනු කාරණයයි. **අනෙතපුරෙ** යනු කාන්තාවන් වාසය කරන නිවසට ආවරණ ස්ථාන වූ රජගෙදර ඇතුලත රජ යම් තැනක ස්නානය අනුභව කිරීම නිදීම ආදිය කරයිද? **රකඛා සුසං විහිතා** යනු රැකවරණයෙහි නිරත පුරුෂයන් විසින් රාත්‍රි කාලයෙහිද හාත්පස යෝදයෝ තබන ලදහ. **බහි අනෙත පුරෙ** යනු ආර්ථික කටයුතු සඳහා වූ ස්ථානයන් ආදී වූ ඇතුළත නගරයෙන් පිටත වූ රජ නිවසෙහි. **එවං රකඛිතො ගොපිතො සනෙතා** යනු මෙසේ රජ ගෙදර රාජධානියෙහිද රාජ්‍ය දේශයෙහි ද ඇතුළත හා පිටත බොහෝ තන්හි බොහෝ කොට සිය ගණනින් මනාව තබන ලද රැකවල් ඇත්තේ මගේම විස රහිත බව පිණිස මගේම පහසු විහරණය පිණිස ආරක්ෂා කරන ලද්දේ ගෝපණය කරන ලද්දේම ආදී පදයන් එකිනෙක වෙන් වූ වචන වේ. **හීනො** යනු අන්‍ය රාජ්‍යයන්ගෙන් බියපත් වන්නේ **උබ්බිග්ගො** යනු මුළු රාජ්‍යයෙහිද ස්වභාවයෙන්ම තැති ගැනීම් උපදවන සුළු බිය සංවේගයන්ගෙන් තැතිගන්වන ලද්දේ සසල කරන ලද්දේ මනාව තබන ලද රැකවරණ ඇති හෙයින් **උසසංකී** යනු රජුන් විසින් නිරතුරුව අවිශ්වාසයෙන් යුක්ත විය යුතුය යන ප්‍රකාශයන් සියළු තන්හි අවිශ්වාස වශයෙන් ඔවුනොවුන්ගේ කාරණා කටයුතුවල හේතූන් සැක කරනුයේ. **උත්‍රාසි** යනු සමීපව හැසිරෙන්නන් විසිනුදු නොදන්නා වූවටම මට කිසි දිනෙක අනර්ථයක් වන්නේයයි උපන්නා වූ, සිරුරු කම්පා උපදවීමට සමත් තිගැස්මෙන් තැති ගත්තේය. **උත්‍රසේතා** යනුවෙන්ද කියත්, **විහාසිං** යනු මෙබදු වී වාසය කළෙමි. **එතරහි** යනු දැන් පැවිදි වූ කලෙහි සිට. **එකො** හුදෙකළා වූයේ එයින් විවේකස්ථානය දන්වයි. අභිතො යනාදී පදයන් පෙර කී පරිදි අරුත් දත යුතුය. භය ආදියට හේතු වූ පිරිවරද එයට නිමිති වූ කෙලෙස්වලද නොවීමෙන්ම අභීත ආදිය වේ. මෙයින් චිත්ත විවේකය දක්වයි. **අපෙපාසුකෙකා** යනු සිරුර රැකීමෙහි නිරුත්සාහී වූයේ **පනනලොමො** යනු ලොමු ඩැහැ

ගැනීම් උපද්දනා වූ තැති ගැනීම් නොමැති හෙයින් නොනගින ලද ලොව් ඇත්තේ. පදයන් දෙකින්ම ස්වෛරී විහරණය දක්වයි. **පරද වුතෙනා** යනු අනුන් විසින් දෙන ලද සිවුරු ආදියෙන් පවතිනූයේ. මෙපරිද්දෙන් හැම ලෙස තෘෂ්ණා රහිත බව දැක්වීම් වශයෙන් වෙනත් බිය ඇති කරන හේතූන් රහිත බව දක්වයි. **මිගභූතෙන චෙතසා** යනු විස්වසනීය වාසය කිරීම් ඇති හෙයින් මුවකුගේ මෙන් උපන් සිත් ඇතිව. මුවා වනාහි මිනිසුන් රහිත වනයෙහි වසනුයේ විශ්වාසයෙන් යුතුව සිටී. හිඳී. හොවී. යම් තැනක කැමති පරිදි යයිද නොගැටුන හැසිරීම් ඇත්තේද මමද එසේ වාසය කරමි යයි දක්වයි.

පසේ බුදුරජ විසින් මෙය කියන ලදී.

වනයෙහි වසන්නා වූ නොබැඳුන මුවෙක් යම් සේ ගොදුරු පිණිස යම් තැනක යයි ද එලෙස නුවණැති මිණිසා ස්වෛරී බව අපේක්ෂා කරණුයේ කඟවේණෙකු මෙන් හුදකලාව හැසිරෙන්නේය.

ඉදං බො අහං භනෙත අජ්ඣවසං යනු භාග්‍යවතුන් වහන්සේ දැන් මා පිළිබඳව යම් මේ උතුම් විවේක සුවය වූ ඵල සමාපත්ති සුවයක් වේද මේ වූම කරුණ දකිනුයේ අහෝ සුඛං අහෝ සුඛං යන **ප්‍රීති** වාක්‍ය ප්‍රකාශ කලේය. **එතමත්ථං** යනු හද්දිය තෙරුන්ගේ මෙම පෘතග්ජන විෂයය ඉක්ම වූ විවේක සුවය සංඛ්‍යාත වූ කරුණ සියළු ආකාරයෙන් දැන. **ඉමං උදානං** යනු මේ හේතු සහිත වූ බිය ශෝක පහවීම් මහිමය දක්වන්නා වූ ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කළේය.

එනි යසසනතරතො නසනනි කොපා යනු යම් ආර්ය පුද්ගලයකුගේ ඇතුලතෙහි සිය සිතෙහි සිත කිළිටි කරන **චිත්ත** කෝපයෙන් හෝ රාගාදී ආඝාත වස්තූන් ආදියට කරුණු වූ වශයෙන් කොටස් වූ නොයෙක් ප්‍රභේදයන්ගෙන් යුත් කෝපයෝ **න සනනි** මාර්ගඥානයෙන් ප්‍රහීණ කළ හෙයින් විද්‍යාමාන නොවෙත්. මෙම අන්තර ශබ්දය **කිසියම්** මාද ඔබද කිම ඒ අරුතදැයි ආදී කාරණයන්හි පෙනේ. "අනත රථකෙ හිමපාත සමයේ" යන තන්හි මැද යන අරුත්හි වේ. "අනතරාව ජෙතවනං අනතරාව සාවත්ථිං" යයි ආදි තන්හි අවකාශාර්ථයෙහි වේ, "භයමනතරතොජාතං" යන ආදියෙහි සිතෙහි යන අර්ථයෙහි වේ. මෙහිද සිතෙහි යන අර්ථයෙහි දත යුතුය. **ඉති භවභතඤ්ච විතිවතෙතා** යනු යම් හෙයකින් භව යනු සම්පත්තියයි. අභව යනු විපත්තියයි. එසේම භව

යනු අභිවෘද්ධියයි. අභව යනු හානියයි. භව යනු ශාස්වත (සදකාලික) බවයි. අභව යනු උච්ඡේදයයි. භව යනු පිනයි. අභව යනු පවයි. භව යනු සුගතියයි. අභව යනු දුගතියයි. භව යනු කුඩා බවයි. අභව යනු මහත් බවයි. එහෙයින් එය සම්පත්-විපත්, අභිවෘද්ධි-හානි, ශාස්වත-උච්ඡේද, පුඤ්ඤ-පාප, සුගති-දුගති, කුඩා-මහත් වශයෙන් වූ උප්පත්ති භව වශයෙන් නන් වැදෑරුම් වූ භව - අභව බව කියයි. ආර්ය මාර්ග සතරින් යම් හට ගැනීමක් වේද ඒ ඒ ක්‍රමයෙන් එසේ යයි භව අභව බවද ඉක්මවන ලද්දේ. අතික්‍රමණය කරන ලද්දේ වෙයි. අරුත් වශයෙන් විභක්ති නියම කළ යුතුයි. **තං විගත භයං** යනු යට කියන ලද පරිදි වූ ගුණයන්ගෙන් සමන්විත වූ මෙබදු ක්‍ෂීණාශ්‍රවයා චිත්ත කෝපයන් නොමැති හෙයින් මෙසේ භව - අභව ඉක්මවීමේ හේතුවෙන්ද බියට හේතූන් පහවීමෙන් විගත භය වේ. විවේක සුවයෙන්ද අග්‍රඵල සුවයෙන් ද සුවපත් වේ. පහ වූ බිය ඇති හෙයින්මය. අසොකං. දෙවා නානානුභනති දසසනාය යනු අවබෝධ කරන ලද මාර්ගයන් හැර සියළු උත්පත්ති දෙවියෝ උත්සහ කරනු ලබන්නෝද නමුත් සිත් හසර දැකීම් වශයෙන් දසසනාය. දැකීමට **නානුභවනති** නොහැකි වෙත්. අපොහොසත් වෙත්. මිනිසුන් පිළිබඳ කියනුම කවරේද ශෛක්‍ෂයෝද පෘථග්ජනයන් මෙන් රහතුන්ගේ සිත් පැවැත්ම නොදනිත්.

දසවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

මුචලින්ද වර්ග වර්ණනාව සමාප්තයි.

3. නන්ද වග්ගය

3-1

නන්ද වර්ගයෙහි පළමු සූත්‍රයෙහි **අඤ්ඤතරෝ භික්ඛු** නම් වශයෙන් අප්‍රකට වූ එක්තරා ක්‍ෂීණාශ්‍රව භික්ෂුවක් කියවේ. හෙතෙමේ වනාහි රජගහනුවර රජගහනුවර කුලපුත්‍රයෙකි. හෙතෙම මුගලන් තෙරුන් විසින් දෙසන ලද බණ අසා සංවේගයට පත්වූයේ, සසර දොස් දැක 'ශාස්තෘන්

වහන්සේ සමීපයේ පැවිදි වී සිව්සස් කමටහන් ගෙන නොබෝ කලකින්ම විදසුන් වඩා අර්හත්වයට පත්විය. ඔහුට පසුකලකදී දුක් වූ ආබාධයක් හටගත්තේය. හෙතෙම ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් ඉවසමින් වාසය කරයි. ක්ෂීණාශ්‍රවයන්ට චෛතසික දුකක් නම් නැත. කායික දුක පමණක් පවතී. උන්වහන්සේ එක් දවසක් භාග්‍යවතුන් වහන්සේ ධර්මදේශනා කරන කල්හි ඊට නුදුරෙන් එක්තැනක සිට දුක් ඉවසමින් පර්යංකයෙන් හුන්නේය. ඒ සඳහා 'භගවතො අවිදූරෙ නිසින්නො හොති' යනුවෙන් කියන ලදී.

එහි **පල්ලංකං** යනු ඌරුබද්ධ ආසනයයි. **ආභුජිත්වා** බැඳ, **උජුකායං පණිධාය** සම්පූර්ණ ශරීරය ඍජුව තබාගනිමින්, පිටෙහි දහඅටක් වූ කොඳුඇට එකට එක සම්බන්ධ වන අයුරින් සිටින්නහුගේ සම් මස් නහර ගමන් නො කරයි. **පුරාණ කම්මං විපාකජං** පෙර කරන ලද කර්මයාගේ විපාක වශයෙන් සුව දුක් වශයෙන් ඇතිවන්නා වූ මේ ආබාධ කම්ම සමුට්ඨාන ආබාධ නම් වේ. උපක්‍රමයෙන් හට ගත් ඒවා හෝ ඍතු විපර්යාසයෙන් හටගත් ආබාධ ප්‍රතික්ෂේප කරයි. **දුක්ඛං** පෘථග්ජනයන් කෙරෙහි ඔරොත්තු නොදෙන වේදනාවයි. **තිප්පං** තියුණු, මැඩපැවැත්විය නොහැකි බලවත්. **බරං** රළු ගොරෝසු, **කටුකං** අම්හිරි, **අධිවාසෙනෙතා** ඉවසන්නේ, සහනය පවත්නේ, **සතො සම්පජානො** වේදනා දුරුකිරීම් වශයෙන්, සිහිනුවණින් යුක්ත වන්නේ, සති සම්පජඤ්ඤය වැඩීම ගැන සිතයි. අනිත්‍යය, අනිෂ්ට ආරම්මණ වශයෙන් සිතන්නේ, ඒකාන්ත වශයෙන් ඉපදීම හා බිඳීම, ඇතිවීම හා නැතිවීම, වේදනාවෙන් මිදීම, නිරෝධය වේදනාවේ අනිත්‍යතාවය සලකමින් සිහියෙන් යුක්තව, කළ යුතු දේ පිළිබඳව සිහිය ඇතිව, සියලුම කාය වේදනාවන් සිහියෙන් දරාගනිමින් විඳ ගනිමින්, තමන් විසින්ම අවබෝධ කරගනිමින් ප්‍රඥාවෙන් පෘථුල බවට යමින් එළඹ සිටි සිහියෙන් යුක්තව කායික වේදනාව තුනී කරයි. **අවිහඤ්ඤමානො** මහණෙනි, බහුශ්‍රැත නොවූ පෘථග්ජන වූ සමහරු දුක් වේදනාවන්ගෙන් යුක්ත වූයේ ශෝකවෙති. ක්ලාන්ත වෙති. හඬා වැළපෙති. විලාප දෙති. හඬති. මුළාවට පත්වෙති. කියන ලද පරිදි අන්ධ පෘථග්ජනයන් මෙන් වෙනසකට පත් නොවෙමින් හුදෙක් කර්ම විපාකයෙන් ඇති වූවක්ම බව සලකමින් ඉවසමින් සමාපත්තියට සමවදිමින් සිටී. **අද්දසා** ආයුෂ්මත් තෙමේ ඉවසමින් ක්ෂාන්තියෙන් එසේ සිටින බව දුටුයේය. **එතමත්ථං** මෙවැනි රෝගයකට වෙදකම්වලින් සහනයක් නොලැබෙන බව අවබෝධ කරගනිමින්ම, ක්ෂීණාශ්‍රවයන්ගේ ලෝකධර්මය පිළිබඳව උපක්‍රම රහිත බවම ආදී සියලු

කාරණා තේරුම් ගත් බව දැන මේ උදාන වාක්‍යය පහළ කළේය. 'ඉමං සංඛත ධම්මානං - යෙහි කෙහි ච දුක්ඛ ධම්මෙහි අවිඝාතපත්ති විභාවනං'

එහි **සබ්බ කම්ම ජහසඝානි** සියලු කර්මයන් ප්‍රහීණ කිරීම, උසස් මාර්ගය උපදින කාලයේ පටන් සියලු කුසලා කුසල කර්මයන් ප්‍රහීණ කිරීමට අසමර්ථ භාවය පහකොට, යම්සේ ආර්ය මාර්ග ඤාණය ඉපිදවීමෙන් සියලු කර්මයන් ක්ෂය කිරීමේ අර්හත්භාවයම කියයි. **භික්ඛුනෝ ක්ලේශයන් බිඳ දැමූ බැවින් භික්ෂු වේ. ඛුනමානසස පුරෙකතං රජං** අර්හත්වයට පෙර පැවතියා වූ රාග රජස් යයි නම් ලත් දුක් විපාක කර්ම විපාක ගෙන දෙන සියල්ල විද්ධවංසනය කරමින්, අර්හත්වයට පත්වීමෙන් පසුව සාධ්‍ය ක්‍රියාවන්ගේ හටගැනීමක් නො මැති නිසාවෙන් භව මූලය තණ්හාව මුළුමනින්ම සිඳ දැමීමේ ක්‍රියාව පමණක්ම වේ. **අමමසසා** රූපාදී කිසිවෙක්හි මම ය මාගේය යන මමංකාර රහිත වන නිසාම වෙදුන් විසින් ශරීරය පිළිදැගුම් කිරීම් ආදිය නිරර්ථකයයි උදාසීන භාවයෙන් සලකයි. **ඨිතසස** සතර ඕඝයන් තරණයකොට නිර්වාණය නමැති ගොඩබිමෙහි සිටියහුට, ප්‍රතිසන්ධි ග්‍රහණයක් නොමැත්තහුට, **ක්ෂීණාශ්‍රව** සංඛ්‍යාත වූ ආර්ය ධර්මයන්හි පිහිටියහුට සසරේ දිවීමක් නම් නැත. **නාදිනො** ප්‍රතිකූල දෙයෙහි අප්‍රතිකූල සංඥාවෙන් වාසය කරයි ආදී වශයෙන් කියන ලද පස්වැදෑරුම් ආර්ය ඍද්ධියෙන් අෂ්ට ලෝක ධර්මයෙහි කම්පනය වීමක් නැත්තේ ය. **අඤ්ඤාතෂ්ඨි** ජනංලපෙතවෙ තමන්ට බෙහෙත් කරවන්නැයි ජනයන් ලවා කීමෙහි කියවීමෙහි ප්‍රයෝජනයක් නැත. ශරීරයාගේ නිරපේක්ෂ භාවයම සිතයි. ඉදුණු කොලයක් වැටෙන්නාක් මෙන් තමාමැ කය බිඳී යෙත්වායි **ක්ෂීණාශ්‍රවයන්ගේ** අදහස වේ.

යම්කිසි නිමිත්තක් දක්වා ආරාධනා වශයෙන් සිටීමට **ක්ෂීණාශ්‍රවයන්ට** අවශ්‍යතාවයක් නැත. ඒ වූ කලී විඤ්ඤා ජීවීන්ට අවශ්‍යතාවයයි. ස්ථවිරයන් වහන්සේ තමාගේ රෝගයට වෙදුන් ලවා චිකිත්සා කර්ම කරවීමේ අදහසක් නොමැති බවත්, භාග්‍යවතුන්ට නුදුරේම සිටින්නෙමියි සිතමින් ඔහුගේ කාරණය අදහස ප්‍රකාශ කළේය.

පළමුවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

3-2

දෙවැන්නෙහි **නන්දො** යනු ඔහුගේ නාමයයි. ඔහු වනාහි චක්‍රවර්ති රාජ ලක්‍ෂණයන්ගෙන් යුක්ත හෙයින් මව්පියවරු, පිරිවර ජනයා, සියලු නෑ පිරිවර සතුටු කරවමින් උපන් හෙයින් නන්ද යන නාමය ලැබීය. **භගවතො භාතා** යනු භාග්‍යවතුන් වහන්සේගේ එක් පිය පුත්‍රතාවයෙන් සහෝදරත්වයයි. භාග්‍යවතුන් වහන්සේට සහෝදරයෝ නූපදිත්. එහෙයින් **මාතුච්ඡා පුත්තොයි** යූසේයි. සුලු මව් පුතු යන අර්ථයි. මහා ප්‍රජාපතී ගෝතමියගේ පුතු, **අනභිරතො** යනු නො ඇලුනේ. **බ්‍රහ්මචරියං** යනු උසස්, ශ්‍රේෂ්ඨ උතුම් චර්යාව, එක් අස්නක හිඳ අනුභවය, එක් සයනයක නිද්‍රාව, මෛථුනයෙන් වැලැක්ම, **සඤ්ඤාරෙතුං** යනු, ප්‍රථම සිතෙහි පටන් අවසන් සිත තෙක් මනාව සම්පූර්ණ කරන්ට, පවත්වන්ට, මෙහි දෙවන බ්‍රහ්මචරිය පදයෙන් මාර්ග බ්‍රහ්ම චර්යාවගේ ද සංග්‍රහය දතයුතුය.

සිකඛං පච්චකඛාය යනු උපසම්පදා ප්‍රාප්තියෙහි දී භික්‍ෂුත්වය සමග සමාදන් වන ලද ඉපදවිය යුතු බැවින් නොනිමි සිව් වැදෑරුම් වූ ද ශික්‍ෂාව ප්‍රතික්‍ෂේප කොට, අත්හැර යන අර්ථයි. **හීනාය** යනු ගිහිබව සඳහා, **ආවතිස්සාමි** යනු පෙරළෙන්නෙමි. කවර හෙයින් මොහු මෙසේ සැලකරන ලද්දෙහිද? මේ මෙහි අනුපිළිවෙළ කථාවයි.

පවත්වන ලද උතුම් දම්සක් ඇති බුදුරදහු, රජගහ නුවරට ගොස් වේළුවනයෙහි වැඩ වාසය කරනුයේ 'මට පුතු ගෙනවුත් පෙන්වුව මැනවැයි සුදොවුන් යැවූ, ලක්‍ෂයක් පිරිවර සහිත දස දූතයින්, පිරිවර සහිතව අර්හත්වයට පත් කල්හි, සියල්ලන්ට පසුව ගොස් අර්හත්වයට පත්, කාලුදායි තෙරුන් විසින් යාමට සුදුසු කල්හි දැන, මග වැනුම් වනා, උපන් බිමට යාම සඳහා ආයාචනා කරන ලදුයේ, විසිදහසක් රහතුන් පිරිවරණ ලදුයේ, කිඹුල්වත් නුවරට ගොස් ඥාතීන්ගේ එකතුවීමෙහිදී වූ පොකුරු වැස්ස, මාතෘකා කොට, වෙසතුරු දා දෙසා, දෙවන දින පිඬු පිණිස පිවිසියේ, **'උතතිට්ඨෙ නප්පම ජ්ජෙය්‍ය'** යන ගාථාවෙන් පියතුමා සෝවාන් ඵලයෙහි පිහිටුවා, නිවෙස්නට ගොස් **'ධම්මංචරෙ'** යන ගාථාවෙන් මහා ප්‍රජාපතී ගෝතමිය සෝවාන් ඵලයෙහි ද, රජු සකෘදාගාමී ඵලයෙහිද පිහිටවූ සේක. බත්කිස අවසනැ, රාහුල මව් ගුණකථනය ඇසිරිකොටැ, සඳකිඳුරු ජාතකය දෙසා, තෙවන දිනැ, නන්ද කුමරුගේ, අබිසෙස් ගෘහ

ප්‍රවේශ, විවාහ මංගල්‍යයන් පවත්නා කල්හි පිඬු පිණිස පිවිසෑ, නන්ද කුමරුගේ අතට පාත්‍රය දී, මඟුල්දම් දෙසා, හුනස්නෙන් නැගිට ආපසු වඩිනුයේ, කුමරුගේ අතින් පාත්‍රය නොගත් සේක. ඔහුට බුදුරදුන් කෙරෙහි පැවැති ගෞරවයෙන් ස්වාමීනි, ඔබගේ පාත්‍රය ගනුමැනවැයි කියන්ට නොහැකි විය. මෙසේද සිතීය. තරජපු මුදුනෙහිදී පාත්‍රය ගන්නේය. බුදුරදහු එතැන්හිදී නොගත්තේය. අනෙකා තරජපු ආරම්භක ස්ථානයෙහිදී ගන්නේයයි සිතීය. බුදුරදහු එතැන්හිදීද නොගත්තේය. අනෙකා රාජාංගනයේදී ගන්නේ යයි සිතීය. බුදුරදහු එතැන්හිදීද නොගති. කුමරු නවතිනු කැමැතියේ, නොකැමැත්තෙන් යනුයේ, ගෞරවය හේතුයෙන්, පාත්‍රය ගනු මැනවැයි කියන්ට නොහැකි වේ. මෙහිදී ගන්නේය. මෙහිදී මෙහිදී ගන්නේ යයි සිතමින් යේ. එකෙණෙහි ආර්යාවනි, බුදුරදහු නන්ද රජුන් ගෙන යේ. ඔහු ඔබගෙන් වෙන් කරන්නේ යයි ජනපද කල්‍යාණියට නිවැසියෝ කිහ. ඕ දියබිඳු වැගිරෙන, අඩක් පණා ගැසූ කෙස්වලින් යුක්තව, වේගයෙන් පහයට නැග. සීමැදුරු කවුළුවෙහි සිට. ආර්යපුත්‍රය, ඉක්මන් කොට එනු මැනවැයි කීවාය. ඇයගේ එම වචනය ඔහුගේ හෘදයෙහි හරස්ව වැටුනාක් මෙන් සිටියේය. බුදුරදහු ද ඔහුගේ අතින් පාත්‍රය නොගෙනම ඔහු විහාරයට ගෙන ගොස්, නන්ද, පැවිදි වන්නෙහිදැයි වදාළේය. හෙතෙම බුද්ධ ගෞරවයෙන් පැවිදි නොවන්නෙමියි නොකියා, එසේය පැවිදි වන්නෙමියි කීය. බුදුරදහු, එසේනම් නන්ද පැවිදි කරව් යයි කපිලවස්තු පුරයට ගොස් තෙවන දින ඔහු පැවිදි කරවීය. සත්වන දින, මව විසින් සරසා, ශ්‍රමණය මට දායාද දෙවයි කියා යවන ලද, තමා සමග පැමිණි රාහුල කුමරු පැවිදි කරවීය. දෙවන දින මහා ධර්මපාල ජාතකය දේශනාකොට, රජු අනාගාමී ඵලයෙහි පිහිටුවිය. මෙසේ බුදුරදහු, මහා ප්‍රජාපතිය සෝවාන් ඵලයෙහිද, පියරජු ත්‍රිවිධ ඵලයන්හිද, පිහිටුවා භික්ෂු සංඝයා පිරිවරන ලදුයේ, නැවත රජගහ නුවරට ගොස්, ඉක්බිති අනේපිඬු සිටුහු විසින් සැවතට පැමිණීම සඳහා ගන්නා ලද ප්‍රතිඥා ඇතියේ දෙව්රම් වෙහෙර නිමි කල්හි එහි ගොස් වාසය කළ සේක. මෙසේ බුදුරදහු, දෙව්රම වාසය කරන කල්හි, ආයුෂ්මත් නන්ද භික්ෂුව, තම නොකැමැත්තෙන් පැවිදි වූ හෙයින්, කාමයන්හි ආදීනව නොදක්නේ ජනපද කල්‍යාණිය විසින් කියන ලද වචන සිහිකරනුයේ, කළකිරුණේ, භික්ෂූන්ට තම නොඇල්ම සැල කළේය. එහෙයින් කියන ලදී. **තෙන ඛො පන සමයෙන ආයස්මා නන්දො -පෙ- හීනායාවත්තිස්සාමීති** 'එකල්හි වනාහි ආයුෂ්මත් නන්ද භික්ෂුව ගිහි බවට පර්වර්තනය වන්නෙමියි,

කවර හෙයින්, භාග්‍යවතුන් වහන්සේ ඔහු මෙසේ පැවිදි කරන ලද්දේ ද? ප්‍රථමයෙන්ම ආදීනව දක්වා, ඔහු කාමයන්ගෙන් වෙන් කරන්ට නොහැක. පැවිදි කරවා, උපායෙන් ඉන් වෙන්කොට මතු විශේෂතා උපදවන්නෙමියි, මතු මාර්ග ඵලාධිගමලාභීන් භික්මවීමෙහි භික්මවිය යුතු ජනයන් භික්මවීමෙහි දක්ෂ වූ ශාස්තෘන් වහන්සේ මෙසේ ඔහු ප්‍රථමයෙන් පැවිදි කරවූ සේක. **සාකියානි** යනු සෑදූ, **ජනපද කල්‍යාණි** යනු ෂට් ශරීර දෝෂ රහිත, පස් කලණින් යුත්, රුවින් උතුම් දනව්හි කලණ, ඕ අති දීර්ඝ (උස්) නුවූයේ, ඉතා නුස්ව (මිටි) නුවූයේ, අතිශය කෘශ නුවූයේ, අතිශය ස්ථූල නුවූයේ, අතිශය කළු නුවූයේ, අතිශය සුදු නුවූයේ, මිනිස් වර්ණ ඉක්ම ගියේ, නොපත් දිව්‍ය වර්ණ වූවාය. එහෙයින් ෂට් ශරීර දෝෂ රහිත, සිවි, මස්, නිය, ඇට, වයස් යන මෙම පංච කල්‍යාණයන්ගෙන් යුක්ත වූවාය. එහි තම ශරීරාලෝකයෙන් දස දොළොස් රියන් තැන් ආලෝකමත් කරයි. පියගු (තණහාල්) හා සම වූයේ හෝ ස්වර්ණ සම වූයේ හෝ වේ. මේ මැයගේ සිවි කළණතාවයයි. මුව කෙළවරකොට ඇති මැයගේ සිවි අත්පා ලාකඩ රසයෙන් ලාකඩ රසයෙන් පිරියම් කරන ලද්දක් මෙන් ද, රත්පබලු රත් කම්බිලියක් හා සමාන වෙති. මේ මැයගේ මංස කල්‍යාණතාවයයි. විසි නිය මාංශයෙන් නොමුත් තන්හි ලාඤා රසයෙන් පිරී ගියාක් මෙන්ද, මුත් තන්හි ක්‍ෂීර ධාරාවක් මෙන් වෙති. මේ මැයගේ නිය කලණතාවයයි. එකිනෙක මනා ස්පර්ශිත දෙතිස් දත් පිරිසිදු පබලු පෙළක් මෙන්ද, දියමන්ති පෙළක් මෙන්ද වැටහෙති. මේ මැයගේ අස්ථි කල්‍යාණතාවයයි. එකසිය විසි වර්ෂ වයස් ප්‍රමාණ වූයේ නමුත්, සොළොස් වයස් සොළොස් වර්ෂ වයස් සමාන වූයේ මෙන් හම රැළි නොවැටුණේ, මේ මැයගේ වයස් කල්‍යාණතාවයයි. මෙබඳු ස්වභාව ලක්‍ෂණයන්ගෙන් යුක්ත වූවා මනා පැහැපත් පෙනුමෙන් යුක්ත වේ. එහෙයින් ජනපද කල්‍යාණියයි යූ.සේයි.

සරා නිකඛමනතස්ස යනු අනාදරයෙහි ෂෂ්ඨී වචනයි. ගෘහයෙන් නික්මෙන්නහුගේ යන අර්ථයි. සරා නිකඛමනතංයිද කියවත්. **උපඩ්ඪුලලිඛිතෙහි කෙසෙහි** යනු මෙසේ වූයේය යන ලක්‍ෂණයෙහි කරණ වචනයි. පිරිම අඩාල කළ කේෂයන්ගෙන් උපලක්‍ෂිතවයයි අර්ථයි. අඩඪුලලිඛිතෙහි යයි ද කියවති. **උලලිඛිතං** යනු නයි පෙණයක් මෙන් සෑදූ උපකරණයන්ගෙන් කෙස් මනාසේ පිහිටුවීමයි. අඩ්ඪුකා විධානංයි ද කියවති. **අපලොකෙත්වා** යනු ආදර රස විසුරුවීම හඟවන අඩ ඇසින් සම්බන්ධ කරන්නාක් මෙන් බලා, **මං භනෙත** යනු පෙරද මා හට යයි කියා

කලකිරීමෙන් අවුල් වූ සිත් බැවින් නැවත මා හට එය කිවුයයි කීය. තුවටං යනු සීඝ්‍ර, **තමනුසසරමානො** යනු ඒ ඇයගේ වචනය. ඒ ඇයගේ ආකාර සහිත වූ හෝ වචනය සිහි කරනුයේ භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ වචනය අසා උපායෙන් ඔහුගේ රාගය සන්සිඳුවන්නෙමියි ඍද්ධි බලයෙන් ඔහු තව්තිසා භවනයට ගෙන යනුයේ අතරමග දැවුණු කෙතක, දැවුණු කණුවක් මත්තෙහි හුන් සිඳුණු කන් නාසා නගුට හිත එක් පුළුටු වැදිරියක් පෙන්වා පසුව තව්තිසා භවනය පෙන්විය. පෙළෙහි වනාහි එකෙණෙහිම ශාස්තෘන් වහන්සේ තව්තිසා භවනයට වැඩම කළාක් මෙන් යූ.සේයි. ගමනේදී වූ තොරතුරු නොකියා, තව්තිසා භවනය පිළිබඳ පමණක් යූ.සේයි. වඩනා වූ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නන්දට අතරමග එම පුලුටු වැදිරිය පෙන්විය. එසේනම් අත් දිගු කිරීම් වක් කිරීම් ආදිය කවර හෙයින් දැක්වීද? එය අතුරුදන් වීම දැක්වීමට යයි ගතයුතුය. මෙසේ ශාස්තෘන් වහන්සේ, ඔහු තව්තිසා භවනට ගෙන ගොස්, සක්දෙව් රදුන්ට උවටැන් සඳහා පැමිණි පරෙවි පා බඳු පන්සියයක් පමණ වූ දෙවඟනෝ, තමන් වහන්සේ වැඳ සිටියාහු පෙන්වා, එම පන්සියයක් පමණ වූ දිව්‍යාප්සරාවන්ගේ රූප සම්පත්තිය, ඇසිරිකොට ජනපද කල්‍යාණියගේ විශේෂතාව විවාළ සේක. එහෙයින්, අථඛො භගවා **ආයසමනතං නන්දං බාහාය ගහෙත්වා** -පෙ- **කකුට පාදානි**'යි යූ.සේයි.

එහි **බාහාය ගහෙත්වා** යනු, අතෙහි අල්වා ගත්නාක් මෙන්, භාග්‍යවතුන් වහන්සේ එකල්හි එවැනි ඍද්ධි සැකසීමක් සම්පාදනය කළ සේක. ආයුෂ්මත් නන්දයා අත් ගෙනැ භාග්‍යවතුන් වහන්සේ ගෙන යන්නාක් මෙන් විය. භාග්‍යවතුන් වහන්සේ විසින් එම ආයුෂ්මතුන්ට දෙව්ලෝ දැක්වීම ඔහුගේ කැමැත්තෙන්ම හෝ වන්නේය. ලෝක විවරණ ඍද්ධික ලෑමෙන්, හුන් අයුරින්ම ඔහුට එම දිව්‍යලෝකය පෙන්වන්නේය. ඔහුම හෝ ඍද්ධියෙන් එහි යවන්නේය. ඔහුට දිව්‍යාත්ම භාවයෙන්, මනුෂ්‍යාත්ම භාවයාගේ යම් නිහීන පිළිකුල් භාවයක් වේද? ඔහුට එය සුවසේ ග්‍රහණය සඳහා අතරතුර, එම වැදිරිය පෙන්වනු කැමැත්තේ, දෙව්ලෝ සෞභාග්‍යය ධන සම්පත්තීන්හි කිඳු බස්වා පෙන්වනු කැමැත්තේ විය. එහෙයින් ඔහු අතින් ගෙන එහි පැමිණවීය. මෙසේ ඔහුට බ්‍රහ්මචර්ය වාසයෙහි ඇල්ම වන්නේය.

කකුටපාදානි යනු රක්තවර්ණ හෙයින් පරෙවි පාද සම පාද, ඇලා සියල්ලෝම කාශ්‍යප බුදුරජුන්ගේ ශ්‍රාවකයින්ට පා ගල්වන තෙල් දානයෙන්

එබඳු සියුම් පා වූහ. **පසසසි නො** යනු දක්නහුද? **අභිරූපතරා** යනු අති විශිෂ්ට රූපත් බවින්, **දසසනීය තරා** යනු මුලු දවසම බලනවුන්ට අතෘප්තිකරණාර්ථයෙන් අතිශයින් දැකිය යුතු, **පාසාදික තරා** යනු සියලු අවයව බැබලීමෙන් හාත්පස ප්‍රසාද එළවන සුළු, කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ රාගයෙන් තෙත් වූ සිතැති ආයුෂ්මත් නන්ද තෙරුන් ලවා අප්සරාවන් බලවන ලද්දේද යත්, ඔහුගේ කෙලෙස් සුවසේ අත්හැරීමටය. යම්සේ වනාහි දක්ෂ වෙදැදුරු උත්සන්න දොසැති පුඟුලෙකුට ප්‍රතිකාර කරනුයේ, තෙල්, අරිෂ්ඨාදියෙන් පළමුව දොස් සංසිඳුවා පසුව, වමන විරේචනයන්ගෙන් මනාව දොස් ඉවත් කරවයි. මෙසේ හික්මවිය යුතු අය දමනයෙහි දක්ෂ භාග්‍යවතුන් වහන්සේ, කෙලෙස් උත්සන්න වූ ආයුෂ්මත් නන්දට දිව්‍යාප්සරාවන් පෙන්වා කෙලෙස් සංසිඳවිය. ආර්ය මාර්ග නමැති බෙහෙදින්, සේස රහිතව බැහැර කරනු කැමැතියේ යයි දතයුතුය. **පලුටඨ මක්කටී** යනු දැවී ගිය අඟපසඟ ඇති වැඳිරිය. **එවමෙව ඛො** යනු ස්වාමීනි, මෙම පන්සියයක් පමණ දිව්‍යාප්සරාවන් හා සැසඳීමෙහිදී ජනපද කල්‍යාණිය ඔබ විසින් මා හට පෙන්වන ලද, සිඳුණු කන් නාසා ඇති දැවී ගිය වැඳිරිය හා සමානය. **පඤ්චන්නං අච්ඡරා සතානං** යනු ද්විතියාර්ථයෙහි ෂෂ්ඨියි. පන්සියයක් අප්සරාවන් යන අර්ථයි. අවයව සම්බන්ධයෙහි හෝ එය ෂෂ්ඨියි. එම පන්සියයක් පමණ රූ සපුව සමානකොට යන අර්ථයි. උපනිධාය යනු සමීපයෙහි තබා සමාන කොට යන අර්ථයි. සඛ්‍යං යනු ගණනයි. **කලභාගං** යනු කලාවෙන් භාගය, එකක් සොළොස් කොටසක් කොට, ඉන් එක් කොටසක් ගෙන, සොළෙස් අයුරකට වෙන්කොට ගත් කල්හි එහි යම් එක් එක් කොටසක් වේද? එය කල භාගයයි. අදහස් කරන ලදී. එම කල භාගය තරම්වත් ප්‍රමාණයකට නොඑළඹේ යයි කියයි. **උපනිධිං** යනු මෙයට මෙය සමානයැයි උපමා භාවයෙන් ගෙන සමීපයෙහි තැබීමද, යමක් සඳහා නොඇලුනේ එම බ්‍රහ්මචර්යයෙහි හැසිරුණේ යයි පෙර කියන ලද්ද ප්‍රකටය. එය ස්පර්ශ නොකොට, එහි ඇල්ම, ආදරය හට ගැන්වීම සඳහා නන්දයෙනි, **සස්නෙහි** සිත් අලව, නන්දයෙනි සස්නෙහි සිත් අලව යනුවෙන් ආමෙණ්ඩිත වශයෙන් (දෙවරක් කිම්) යූ.සේයි. **අහං තෙ පාටිභොගො** යනු කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ, ඔහුගේ බ්‍රහ්මචර්ය වාසය කැමැති වනුයේ, අබ්‍රහ්මචර්ය වාසයට ඇපයට එළැඹියේ ද? මොහුගේ යම් අරමුණෙක්හි ඇල්ම දැඩිව වැටේද? එම ආගන්තුක අරමුණෙහි පොළඹවා පහසුවෙන් අත්හැරවීමට හැකිවේයයි ඇපයට එළැඹි සේක. **පිළිවෙළ කථා**යෙහි ස්වර්ග කථාව මෙම අර්ථයට නිදර්ශනයකි. **අසෙසාසුං** යනු කෙසේ

ඇසූහුද? භාග්‍යවතුන් වහන්සේ වනාහි, එකල්හි ආයුෂ්මත් නන්දයන් වත් දක්වා තමා දිවා වාසස්ථානයට ගිය කල්හි, උවටැනට පැමිණි භික්ෂූන්ට එපවත් කියා, යම්සේ නම්, දක්ෂ පුරුෂයෙක් මැඩුණු ඇණයක් අනෙක් ඇණයකින් පිටතට ගෙන නැවත එය අත් ආදියෙන් සොලවා ඉවත් කෙරේද? එපරිද්දෙන්ම පුරුදු කරන ලද විෂයයෙහි පැවැති ඔහුගේ රාගය ආගන්තුක විෂයයෙන් ඉවත්කොට නැවත එම බ්‍රහ්මචර්ය මාර්ගයට හේතුකොට ඉවත් කරනු කැමැතියේ, මහණෙනි, එවි නුඹලා නන්ද භික්ෂුවට බැළයෙක, විකුණා ගන්නා ලද්දෙක යන වචනයෙන් ද ව්‍යවහාර කරවි යයි අණ කළ සේක. මෙසේ භික්ෂූහු ඇසූහ.

සමහරු වනාහි, භාග්‍යවතුන් වහන්සේ, යම්සේ එම භික්ෂූහු එම කරුණ දැනගනිත්වායි එයට සුදුසු (එබඳු) ඍද්ධි ප්‍රාතිහාර්යයක් සම්පාදනය කෙළේය.

භතක වාදෙන යනු බැළයෙක යන වචනයෙන්, යමෙක් වනාහි කුළියට කටයුතු කරයිද? ඔහු කුලී කරුයයි කියයි. මේ ආයුෂ් තෙමේද, අප්සරාවන්ගේ එක්වීම හේතුකොට බඹසර සරනුයේ බැළයෙක් මෙන් වේයයි භතක වාදයෙන් යයි යූ.සේයි. **උපකකිතකවාදෙන** යනු යමෙක් කහවණු ආදීන්ගෙන් යම් යම් දේ මිලදී ගනීද? ඔහු මිලදී ගන්නා යයි කියනු ලැබේ. මේ ආයුෂ්මත් තෙමේ ද, අප්සරාවන්ගේ හේතුයෙන් තම බ්‍රහ්මචර්යය මිලට ගනියි. එහෙයින් උපකකිතක යැයි කියයි. හෙවත් බුදුරද **අණින්** අප්සරා සම්භෝග සංඛ්‍යාත කුළියට, බ්‍රහ්මචර්ය වාස සංඛ්‍යාත ජීවිතය පවත්වනුයේ, එම කුළියෙන් යැපීමෙහි ලා භාග්‍යවතුන් වහන්සේ විසින් පෝෂණය කරනු ලබන්නාක් මෙන් වේයයි භතකයැයි යූ.සේයි. අප්සරා සම්භෝග සංඛ්‍යාත විකිණීම ගතයුත්තක් කොට, භාග්‍යවතුන් වහන්සේගේ අණෙහි සිටිනුයේ, එම විකිණීමෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් මිලට ගන්නා ලද්දක් මෙන් වේයයි යූ.සේයි.

අටටියමානො යනු පෙළනු ලබනුයේ, දුක්වනු ලබනුයේ, **හරායමානො** යනු ලජ්ජාවනු ලබනුයේ, **පිගුච්ඡමානො** යනු පිළිකුලෙන් ගරහනුයේ, **එකො** යනු (මිතුයෙකු නොමැති) හුදෙකලාව, **වූපකට්ඨා** යනු වස්තු කාමයන්ගෙන් ද ක්ලේශ කාමයන්ගෙන් ද, කයින් ද සිතින්ද ඉවත් වූයේ, **අපපමත්තො** යනු කමටහන්හි සිහිය අත් නොහරිනුයේ,

ආතාපී යනු කායික චෛතසික වීර්යය නමැති අව්වෙන් තවන්නා වූ, කෙලෙස් තවයිනුයි ආතාපයි. වීර්යයයි. **පහිතත්තෝ** යනු ශරීරයෙහිද ජීවිතයෙහි ද, අනපේක්ෂතායෙන්, යොමුකරන ලදුයේ, අත්හළ ආත්මභාව ආශා ඇතියේ, නිවරොහි යොමුකරන ලද සිතැතියේ, **නචිරස්සෙව** යනු කමටහන් ආරම්භයෙහි සිට නොබෝ කලෙකින්, **යස්සත්ථාය** යනු යමක් සඳහා, **කුල පුත්තා** යනු ජාති, ආචාර වශයෙන් කුලපුත්‍රයෝ දෙවැදෑරුම්ය. මේ දෙ අයුරින්ම වන කුල පුත්‍රයෝ, **සම්මදෙව** යනු හේතුයෙන්ද, කරුණින්ද, **අගාරස්මා** යනු ගෘහයෙන්, **අනගාරියං** යනු පැවිද්දයි. කෘෂි, වණික් ආදී කර්මයන්ගෙන් ගෘහයට යහපත ගෙන දේනුයි අගාරිය නමැ. එය මෙහි නැත්තේනුයි පැවිද්ද අනගාරිය යැයි කියයි. **පබ්බජන්ති** යනු එළඹෙත්. **තදනුත්තරං** යනු ඒ නිරුත්තර වූ, **බ්‍රහ්මචරිය පරියොසානං** යනු මාර්ග බ්‍රහ්මචර්යාවගේ අවසානය වූ අර්හත් ඵලයයි. එම අර්ථය සඳහා කුල පුත්හු මෙ සස්නෙහි පැවිදි වෙත්. **දිට්ඨෙව ධම්මෙ** යනු එම අත්බැව්හිම, **සයං අභිඤ්ඤා සච්ඡිකත්වා** යනු තමා විසින්ම ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කොට, අන් හේතුවකින් දැනයයි අර්ථයි. **උපසම්පජ්ජ විහාසි** ය්නු පැමිණ, සම්පාදනය කොට හෝ වාසය කළේය. මෙසේ වාසය කරනුයේ ද 'ඛීණා ජාති -පෙ- අබ්භඤ්ඤාසි යි. මෙයින් මොහුගේ ප්‍රත්‍යවේක්ෂණ භූමිය දක්වන ලදී.

එහි **ඛීණා ජාති** යනු ඔහුගේ අතීත ජාති ක්ෂයවීමක් අදහස් නොකෙරේ. කල් ඇතිවම ක්ෂය වී ඇති හෙයිනි. අනාගත ජාතිද නොවේ. අතීතයෙහිද, වර්තමානයෙහිද නොපැමිණි හෙයින්මය. වර්තමානයද නොවේ. විද්‍යමාන හෙයිනි. මාර්ගයාගේ අභාවිත හෙයින් යම් ඒක චතු පංචවෝකාර භවයන්හි, ඒක චතු, පංචස්කන්ධ ප්‍රභේද ජාතීන් උපදින්නේය.

ඒවා මාර්ගයාගේ වඩනා ලද හෙයින් නූපදනා ස්වභාවයට පැමිණීමෙන් ක්ෂය වේ. හෙතෙම මාර්ග භාවනාවෙන් ප්‍රහීණ ක්ලේශයන් ප්‍රත්‍යවේක්ෂා කොට, කෙලෙස් අභාවයෙන්, විද්‍යමාන වූද කර්මය මත්තෙහි ප්‍රතිසන්ධි රහිත වේයයි දැනීමෙන් **අබ්භඤ්ඤාසි**, **වුසිතං** යනු වසන ලදී. මනාව වසන ලදී. නිමවන ලදැයි අර්ථයි. **බ්‍රහ්මචරියං** යනු මාර්ග බ්‍රහ්මචර්යාව, පෘථග්ජන කල්‍යාණකයා සමග සප්ත ශෛක්ෂයෝ බ්‍රහ්මචර්ය වාසය කෙරෙත් නමැ. **ක්ෂීණාශ්‍රවයෝ** වසන ලද වාසය ඇත්තාහු වෙති. එහෙයින් හෙතෙම තම බ්‍රහ්මචර්ය වාසය ප්‍රත්‍යවේක්ෂා කරනුයේ බ්‍රහ්මචර්ය වසන ලදැයි දැනගති. **කතං කරණීයං** යනු සිව්සස්හි, සිව් මාර්ගයන්ගෙන්,

විශේෂ දැනීම-ප්‍රහාණ, සාක්ෂාත්, භාවනා වශයෙන් සොළොස් ආකාර කිස නිමවන ලදී. පෘථග්ජන කල්‍යාණකාදීහුද එම කෘත්‍යය කරත් නමැ. **ක්ෂීණාශ්‍රවයෝ** කළ කෘත්‍යයෝය. එහෙයින් හෙතෙම තමා විසින් කළයුත්ත ප්‍රත්‍යවේක්ෂා කරනුයේ, 'කතං කරණීයංයි දැනගති. **නාපරං ඉත්ථත්තාය** යනු නැවත රහත්බව පිණිස මෙසේ සොළොස් කිස වැඩීමෙන් හෝ කෙලෙස් ක්ෂය කිරීමෙන් හෝ මාර්ග භාවනාවගේ කෘත්‍යයක් මට නැතැයි දැනගති. **නාපරං ඉත්ථත්තායා** යනු රහත් බවින්, මෙයින්, මේ ආකාර වර්තමාන ස්කන්ධ පැවැත්මෙන්, අනෙක් ස්කන්ධ (පැවැත්මක්) පරම්පරාවක් මට නැත. මෙම පංචස්කන්ධ විශේෂ ඥානයෙන් අවබෝධ කරන ලද්දේ. මුල් සිදී රුකක් මෙන් සිටිත්. ඒවා අවසන් සිත් නිරුද්ධ වීමෙන් දැඩිසේ ගැනීම් රහිතව ගින්නක් මෙන් නිවීයන්නාහ. නොපණවන ලද භාවයට යන්නාහු යයි දැනගති. **අඤ්ඤතරෝ** යනු (තනි වූ) එක්තරා. **අරහං** යනු භාග්‍යවතුන් වහන්සේගේ අර්හත් ශ්‍රාවකයින් අතර, අභ්‍යන්තර එක් මහා ශ්‍රාවකයෙක් විය යනු අර්ථයි. **අඤ්ඤතරා දෙවතා** යනු මාර්ගඵලාවබෝධ කළ එක් බ්‍රහ්ම දේවතා කෙනෙක්, ඕ තෙමේ අශෛක්ෂ්‍ය හෙයින් අශෛක්ෂ්‍ය විෂය දනි. ශෛක්ෂ්‍යයෝ ඒ ඒ ශෛක්ෂ්‍ය විෂයයද, පෘථග්ජනයෝද තම පෘථග්ජන විෂයයම දනිති. **අභික්කන්තාය රත්තියා** යනු රෑය ගෙවීගිය කල්හි, මැදියම් යයි අර්ථයි. **අභික්කන්ත වණ්ණා** යනු ඉතා විශිෂ්ට ශරීර වර්ණයෙන්, **කෙවලකප්පං** යනු ශේෂ රහිත භාත්පසින්, **ඔභාසෙත්වා** යනු තම පැහැයෙන් සඳ හිරු මෙන් දෙව්රම ඒකාලෝක කොට, **තෙනූපසංකමි** යනු ආයුෂ්මත් නන්දගේ අර්හත්ව ප්‍රාප්තිය දැන, ප්‍රීති සොම්නස් හට ගත්තේ, එය භාග්‍යවතුන් වහන්සේට දන්වන්නෙමියි එළැඹියේය. **ආසවානං ඛයා** යනු මෙහි වැගිරෙත්නුයි ආසවයි. චක්ෂු ද්වාරාදීන්හි පවතිත් යයි අර්ථයි. නොහොත් ගොනුහු දක්වා භවාග්‍රය දක්වා ගලන්නුයි ආසවයි. එම ධර්මයන්ද එම අවකාශයද, ඇතුලත් කොට පවතිත් යයි අර්ථයි. බොහෝකලක් පැසීම් අර්ථයෙන් ධාන්‍ය වර්ගවලින් පෙරූ මත්පැන් ආදී ආසවයන් මෙනැයි ආසවායි. 'මහණෙනි, අවිද්‍යාවගේ පූර්ව කෙළවර නොපෙනේ' යනාදී වචනයන්ගෙන් ඒවාහි බොහෝ කලක් පැසවීම් ස්වභාවය දතයුතුය. නොහොත් දික් වූ සසර දුක ගලා යෙත්. මනාව ගලායෙත්නුයි ආසවයි. මෙහි පළමු අර්ථය කෙලෙසුන් කෙරෙහි යෙදේ. පශ්චිම වචනය කර්මයෙහි ද යෙදේ. හුදෙක් කර්ම ක්ලේශයෝම ආසවයෝ නොවෙත්.

තවද, නොයෙක් ආකාර උපද්‍රවයෝ ද ආසවයි. එසේම, 'චුන්දය මම මේ භවයටම අයත් වූ ආශ්‍රවයන්ගේ සංවරය සඳහා ධර්මය දේශනා නොකරමි යන මෙහි විවාදයන්ට මුල් වූ කෙලෙස් ආසවයයි ආවේය.

යෙන දෙවූපපත්‍යස්‍ස - ගන්ධබ්බා වා විහංගමෝ
යකඛතතං යෙන ගච්ඡෙය්‍ය - මනුස්සතතඤ්ච අබ්බජෙ
තෙ තුඤ්හං ආසවා ඛීණා - විද්ධසතා විනළීකතා'ති

යමක් කරණකොට දිව්‍යෝත්පත්තිය අත් තැනක ඉපදීමට යෝග්‍යව සිටින්නාගේ ස්වභාවය පක්ෂියෙක් හෝ වන්නේද? යමක් කරණකොට යක්ෂාත්මයට, මනුෂ්‍යාත්මයට, බිජුවටින් ඉපදීමට හේතුවේද? ඔබගේ එම ආශ්‍රවයෝ ක්ෂීණයහ. විද්ධවංශනය කරන ලදහ. විනාශ කරන ලදහ.

මෙහි තෙභූමික කර්මය අවශේෂ අකුසල ධර්ම ආසවයැයි දක්වයි. 'දිට්ඨ ධම්මිකානං ආසවානං සංවරාය සම්පරායිකානං ආසවානං පටිඝාතාය යන්නෙහි අනුන් නැසීම, විපිළිසර, වධ බන්ධනාදීහු ද, අපා දුකට හේතු වූ නොයෙක් ආකාර උපද්‍රව, එම ආශ්‍රව විනයෙහි 'දිට්ඨ ධම්මිකානං ආසවානං සංවරයා, සම්පරායිකානං ආසවනා පටිඝාතාය'යි දෙවැදෑරුම්ව දක්වයි. සළායතනයෙහි 'තයෝ මෙ ආවුසො ආසවා කාමාසවො භවාසවො, අවිජ්ජාසවො'යි තෙවැදෑරුම්ව දක්වයි. අන්‍ය සූත්‍රාන්තයන්හිද එසේය. අභිධර්මයෙහි ඒවාම දෘෂ්ටි ආස්‍රවය සමග සිව් වැදෑරුම්ව දක්වයි. නිවෙදික පර්යායයෙහි 'අත්ථි භික්ඛවෙ ආසවා නිරය ගාමිනියා' යනාදි ක්‍රමයෙන් පස්වැදෑරුම්ව දක්වයි. ෂට්ක නිපාතයෙහි 'අත්ථි භික්ඛවෙ ආසවා සංවරා පහාතබ්බා' යනාදි ක්‍රමයෙන් ෂට් ආකාරයකින් දක්වයි.

සබ්බාසව පර්යායයෙහි ඒවා දර්ශනයෙන් පහකළ යුතු කෙළෙසුන් සමග සත් අයුරෙකින් දක්වයි. මෙහි වනාහි අභිධර්ම ක්‍රමයෙන් සතර ආශ්‍රවයන් දතයුත්තාහ. ඛයා යන මෙහි වනාහි 'යො ආසවානං ඛයො හෙදො පරිභෙදො' ආදීන්හි ආශ්‍රවයන්ගේ බිඳ දැමීම ආශ්‍රව ක්ෂයයැයි යූ.සේයි. 'ජානතො අහං භික්ඛවෙ පසසතො ආසවානං ඛයං වදාමි' ආදීන්හි ආශ්‍රවයන්ගේ මත්තෙහි නො ඉපැත්ම ආශ්‍රවක්ෂය යැයි යූ.සේයි.

සික්ඛාය සික්ඛ මානස්‍ස - උජුමගගානු සාරිනො
ඛයස්මිං පඨමඤ්ඤාණං - තතො අඤ්ඤා අනනතරා

ඍජු මග අනුව හැසිරෙන, ශික්ෂාවන්හි හික්මෙනහුට ක්ෂයයෙහි ප්‍රථම ඥානයද, අනතුරුව ඉන් අන්‍ය ඒවාද වේ. ආදීන්හි මාර්ගය ආශ්‍රවක්ෂය යැයි යූ.සේයි. 'ආසවක්ඛයා සමණෝ හොති' ආදීන්හි ඵලයයි.

පරවජ්ජානු පස්සිස්ස - නිච්චං උජ්ඣාන සඤ්ඤිනෝ
ආසවා තස්ස වඩ්ඪන්ති - ආරා සෝ ආසවක්ඛයා

නිතර දොස් සොයන හැඟීමෙන් යුතු, අන් වරද දකින, ඔහුට ආශ්‍රව වැඩෙත්. හෙතෙම ආශ්‍රවක්ෂයයෙන් බොහෝ දුරය ආදීන්හි නිවන දක්වයි.

මෙහි වකාහි ආශ්‍රවයන්ගේ අත්‍යන්ත ක්ෂය හෝ නොඉපැත්ම හෝ මාර්ගය හෝ ආශ්‍රවයන්ගේ ක්ෂය යැයි යූ.සේයි. **අනාසවං** යනු සංසිඳීම් වශයෙන් සර්වාකාරයෙන් ප්‍රහීණාසවතාවයයි. **චෙතෝ විමුත්තිං** යනු අර්හත්ඵල සමාධියයි. **පඤ්ඤා විමුත්තිං** යනු අර්හත් ඵල ප්‍රඥාවයි. දෙවදන් මාර්ගයෙහි මෙන් ඵලයෙහිද, සමථ විදර්ශනාවන්ගේ එකට වෙළී පවත්නා ස්වභාවය දැක්වීම සඳහායි. **ඤාණං** යනු සර්වඥතා ඤාණයයි. දේවතාවාගේ වචනය අතරතුරදීම, එසේ වීදැයි ආවර්ජනා කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේටද, නන්දයා විසින් අර්හත්වය සාක්ෂාත් කරන ලදැයි ප්‍රත්‍යවේක්ෂා ඥානය හටගනි. ඒ ආයුෂ්මත් තෙමේ යහලු භික්ෂූන් විසින් කවටකම් කරනු ලබනුයේ ඒකාන්තයෙන් මා විසින් බැෑරුම් කාර්යයක් කරන ලදී. යම්බඳු මම මෙසේ ස්වාක්ඛාත ධර්ම විනයයෙහි පැවිදිව අප්සරාවන්ගේ ප්‍රතිලාභය සඳහා ශාස්තෘන් වහන්සේ ඇපකරුවකු කළෙමියි උපන් සංවේග ඇතියේ හිරි ඔතප් පිහිටුවා, උත්සාහ කරනුයේ, ව්‍යායාම කරනුයේ අර්හත්වයට පත්ව, මම භාග්‍යවතුන් වහන්සේ එම ඇපයෙන් මුදවන්නේ ඉතා යෙහෙකැයි සිතිය. හෙතෙම භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ තම අදහස ශාස්තෘන් වහන්සේට සැළ කළේය. එහෙයින්, **අථඛෝ ආයස්මා නන්දෝ -පෙ- එතස්මා පටිස්සවායි** යූ.සේයි. එහි පටිස්සවා යනු ඇප පොරොන්දුව, අප්සරාවන්ගේ ප්‍රතිලාභය සඳහා මම ඇපවෙමියි යන පොරොන්දුවෙන්, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නුඹ විසින් අර්හත්වයෙන් සතුටට පත්වූයේ යයි යන එම කරුණ මා විසින් දැනගන්නා ලදී. දෙව්වරුද මට සැළකොට සිටියේය. එහෙයින් මම ඔබගේ අර්හත්ව ප්‍රාප්තිය සමගම මුදන ලද හෙයින් දැන් මිදවිය යුතුය. ඇප නොවෙමි. එහෙයින් 'යදෙව ඛෝ තෙ නන්ද' යනාදිය යූ.සේයි.

එහි යදෙව යනු යම් කලෙක්හිම, තෙ යනු නුඹගේ **මුතෙතා** යනු මනාව මිදුනේ, මෙය යූ.සේයි. යම්කලෙක්හි නුඹගේ සිත ආශ්‍රවයන්ගෙන් මිදුනේද? එයට අනතුරුවම මම එම ඇපයෙන් මිදුනේ වෙමි. එම ආයුෂ්මත් තෙමේද විදර්ශනා කාලයෙහිම, ඉන්‍ද්‍රිය අසංවරය නිසා ඉදින් මෙසේ මම මෙම විප්‍රකාරයට පැමිණියේ වෙමි. එයටම මනාව නිග්‍රහ කරන්නෙමියි උත්සාහවත් වූයේ, බලවත් හිරි ඔතප් ඇත්තේ, එහි කෘතාධිකාර ඇති හෙයින් ඉන්‍ද්‍රිය සංවරයෙහි උසස්ම කෙළවරට ගියේය. යූ.සේයි. ඉදින් මහණෙනි, නන්දට පෙරදිග දිසාව දර්ශනය කළයුතු වේද? සිතින් එක අරමුණක පිහිටුවා නන්ද පෙරදිග දිසාව බලයි. මෙසේ මා හට පෙරදිග දිසාව බලනකල්හි අභිධ්‍යා. දොම්නස් ආදී පාපී අකුසල ධර්ම අනුව ලුහුබඳිද, මෙසේ ඔහු එහි විමසන නුවණින් යුක්ත වූයේ වේ. මහණෙනි, ඉදින් නන්දට පැසුළුදිග -පෙ- උතුරුදිග - දකුණුදිග - උඩ - යට අනුදිසාවන් බැලිය යුතු වේද? සියල්ල සිතින් එක අරමුණක පිහිටුවා එම අනුදිසාව බලයි. මෙසේ මාගේ -පෙ- විමසන නුවණින් යුක්ත වූයේ වේ. එහෙයින්ම එම ආයුෂ්මතුන් ශාස්තෘන් වහන්සේ විසින් 'මහණෙනි, ඉන්‍ද්‍රියයන්හි රක්නා ලද ද්වාරයන් ඇති මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර, යම් මේ නන්දයෙක් වේද ඔහුම අග්‍රයැයි ඒතදග්ගයෙහි තැබීය.

එතමත්ථං විදිත්වා යනු ආයුෂ්මත් නන්දගේ සියලු ආශ්‍රවයන් ක්ෂයකොට සුව ආදීන්හි මධ්‍යස්ථතා ආදී ස්වභාවයන්ට පත්වීම් සංඛ්‍යාත අර්ථය සර්වාකාරයෙන් දැන. **ඉමං උදානං** යනු එම අර්ථය පැහැදිලි කිරීමට මෙම ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කළ සේක.

එහි **යස්ස නිත්තිණ්ණෙ පංඛෙ** යනු යම් ආර්ය පුද්ගලයෙකු විසින් ආර්ය මාර්ග නමැති ඒදණ්ඩෙන් සියලු දෘෂ්ටි මඩ වගුර ද, සසර නමැති මඩ වගුර ද තරණය කොට නිර්වාණය නමැති පරතෙරට යාමෙන් එතෙර වූයේ වේද? **මද්දිතො කාම කණ්ටකො** යනු යමෙකු විසින් සන්තානය විදින හෙයින්, කාම කටුවයැයි ලද නම් ඇති සියලු කෙලෙස් කාමය.

සියලු කාම නමැති කාම කටුව, මාර්ග ඥාන නමැති දණ්ඩෙන්, මඬනා ලද්දේ, බිඳින ලද්දේ ශේෂ රහිතව ප්‍රහීණ කරන ලද්දේ වේ. **මොහක්ඛයං අනුපපත්තෙතා** යනු මෙසේ වූ, දුක්ඛාදීන්ට විෂය වූ, සියලු මෝහයාගේ ක්ෂය කිරීමෙන්, මෝහක්ෂයයට පැමිණියේ, අර්හත් ඵලයටද,

නිර්වාණයටද පැමිණියේ, **සුඛ දුකෙඛසු න වෙධති සභිකඛු** යනු එම බුන් කෙලෙස් ඇති භික්ෂුව, ප්‍රිය අරමුණු එකතුවීමෙන් උපන් සුවයන්හිද අනිටු අරමුණු එකතුවීමෙන් උපන් දුක්ඛයන්හිද නොසැලේ. කම්පා නොවේ. ඒ හේතුයෙන් ඊට ගරු කිරීමකට නොපැමිණේ. සුව, දුක්ඛ යනු දේශනා මාත්‍රයයි. සියලු ලෝක ධර්මයන්හි නොසැලේ යයි දතයුතුය.

දෙවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

3-3

තෙවැන්නෙහි **යසොජ පමුඛානි** යන මෙහි යසොජ යනු එම තෙරුන්ගේ නාමයයි. ඔහු පූර්වාංගම කොට, පැවිදි වූ හෙයින් ද, හැසිරෙන හෙයින් ද එම පන්සියයක් භික්ෂූහු යසොජ ප්‍රමුඛ යැයි යූ.සේයි. ඔවුන්ගේ මේ පූර්වයෝගයයි.

අතීතයෙහි කාශ්‍යප දශබලධාරීන් වහන්සේගේ සස්නෙහි එක්තරා ආරණ්‍යයක භික්ෂුවක්, ආරණ්‍යයෙහි ගල මතුපිට කරන ලද, කොළ සෙවිලි ඇති කුටියක (කුඩාගෙයක) වාසය කරයි. එසමයෙහි පන්සියයක් සොරහු ගම් පැහැරීම් ආදිය කොට සොරකමින් ජීවත් වන්නාහු, සොරකමක් කොට, දනව් වැසි මිනිසුන් විසින් ලුහුබඳින ලද්දාහු. ඉන් බේරීම සඳහා පැනයන්නාහු, අරණ්‍යයට පිවිස, එහි ගතයුතු කිසිවක් හෝ පිළිසරණක් හෝ නොදක්නාහු එම භික්ෂුව, නුදුරෙහි ගලමත හුන්නහු දැක වැඳ එපවත් කියා, ස්වාමීනි, අපහට පිහිටවුව මැනැවැයි ආයාචනා කළහ. තෙරහු ඔබලාට සීලය හා සම පිළිසරණක් නැත. සියල්ලෝ පන්සිල් සමාදන් වවු යයි කීය. ඔවුහු මැනැවැයි පිළිගෙන සිල් සමාදන් වූහ. තෙරහු නුඹලා දැන් සීලයෙහි පිහිටියාහු. තව දිවි නැසෙන කල්හිද, මනස දූෂණය නොකරව් යැයි කියත් උපමා ක්‍රමය කීයේය. ඔව්හු මැනවැයි පිළිගත්හ. ඉක්බිති ඒ දනව් වැස්සෝ, එහි පැමිණියාහු, ඔබිනොබ සොයන්නාහු, එම සොරුන් දැක සියල්ලෝ ජීවිතයෙන් තොර කළහ. ඔව්හු එම දනව් වැස්සන් කෙරෙහි සිත් දූෂ්‍ය කිරීම මාත්‍රයකුදු නොකොට

නොකඩසිල් ඇත්තාහු කළුරියකොට කාමාවචර දෙවියන් කෙරෙහි උපන්හ. ඔවුනතර දෙටු සොර තෙමේ සසර ඔබිනොබ සරන්නාහු, එක් බුද්ධාන්තරයක් දෙව්ලොව කල්යවා, අප භාග්‍යවතුන්ගේ කාලයෙහි දෙව්ලොවින් සැව, දෙටු දෙව්පිත් සැවැත්නුවර දොරැ කෙවුල්ගමෙහි, පන්සියයක් කුලදෙටු කෙවුලාගේ පිත්ව උපනි. ඔහුට යසෝජ යැයි නම් කළහ. අනෙක් අයද සෙසු කෙවුලන්ගේ පුත්‍රයෝ වී උපන්හ. ඔව්හු පෙර එකට වාසය කිරීමෙන් සියල්ලෝම යහලුවන් වී වැලිකෙළියෙහි පටන් ක්‍රීඩා කරන්නාහු පිළිවෙළින් වියපත් වූහ. යසෝජ ඔවුනතර ප්‍රධානියා විය. එම සියල්ලෝම එකතු වී දැල්ගෙන, ගංගා විල් ආදීන්හි මසුන් ඇල්ලීම (බැඳීම) සඳහා හැසිරෙත්. එකල්හි එක් දිනක, අචිරවතී නදියෙහි දැල හෙලූ කල්හි රන්වන් මත්ස්‍යයෙක් දැල තුලට පිවිසියේය. එය දැක සියලුම කෙවුලෝ, අපගේ පුත්‍රයෝ මසුන් බඳනාහු රන්වන් මත්ස්‍යයෙකු බැන්දාහයි තුටු පහටු වූහ. ඉක්බිති එම පන්සියයක් යහලුවෝ, මත්ස්‍යයා නැවත බහා නැව ඔසවාගෙන ගොස් රජුට දැක්වූහ. රජු එය දැක භාග්‍යවතුන් වහන්සේ, එම මත්ස්‍යයාගේ පැහැපත් වීමේ හේතුව දන්නේයයි මත්ස්‍යයා අල්වාගෙන ගොස් භාග්‍යවතුන් වහන්සේට දැක්වීය. ශාස්තෘන් වහන්සේ මේ මත්ස්‍යයා කාශ්‍යප සම්බුදුරජාණන් වහන්සේගේ සස්නෙහි සස්න පිරිහීගෙන යන කාලසීමාවෙහි පැවිදිව, වැරදි මගට පිවිස ඒ අනුව කටයුතු කරනුයේ සස්න පිරිහෙවා නිරයෙහි උපන්නේ, එක් බුද්ධාන්තරයක් නිරයෙහි පැසී, ඉන් චුතව, අචිරවතී නදියෙහි මත්ස්‍යයෙක්ව උපන්නේ යයි වදාරා, ඔහුගේ මව්, නැගනියද, නිරයෙහි උපන් බවද, ඔහුගේ සොයුරු තෙරුන්ගේ පිරිනිව් බවද ඔහු ලවාම කියවා, මෙය අර්ථෝත්පත්ති කොට කපිල සූත්‍රයද දේශනා කළ සේක. ශාස්තෘන් වහන්සේගේ දේශනාව ශ්‍රවණයකොට, එම පන්සියයක් කෙවුල් පුත්හු සංවේගප්‍රාප්තව, බුදුරදුන්ගේ සමීපයෙහි පැවිදිව උඵසම්පදා ප්‍රාප්තව විවේක වාසයෙහි වසන්නාහු භාග්‍යවතුන් වහන්සේගේ දැක්ම පිණිස ගියහ. එහෙයින් **තෙන බොපන සමයෙන යසොජ පමුඛානි පංචමත්තානි භික්ඛු සතානි** ආදිය යූ.සේයි.

එහි **තෙධා** යනු ඔව්හු මෙහි, **නෙවාසිකෙහි** යනු හැමදා වාසය කරන අය සමග, **පටිසමෙමාදමානා** යනු නේවාසික භික්ෂූන් විසින්, ඇවැත්නි, ඉවසීම (රුචි වීම) කෙසේද? ආදි ක්‍රමයෙන් පිළිසඳර වශයෙන් සතුටුවන කථාවෙන් 'ඇවැත්නි එසේය රුචිවෙමියි ආදියෙන් නැවත සතුටුවෙමින් ඔවුන් සමග සමව පැවැති සතුටුවීමයි.

සෙනාසනානි පඤ්ඤාපය මානා යනු ආචාර්ය උපධ්‍යායාදීන්ටද තමන්ටද ලබාගන්නා ස්ථාන විමසා, එම නේවාසිකයින් විසින්, ඔවුන්ට මෙය ඔබගේ ගුරුවරයාටය, මෙය ඔබගේ උපාධ්‍යායාටය, මෙය ලැබෙයයි සෙනසුන් සංවිධානකොට තමාම එහි ගොස්, දොරකවුළු විවරකොට ඇඳ පුටු පැදුරු ආදී සියල්ල බැහැරකොට, ගසාදමා, නිසිතන්හි තැබීම් ආදී වශයෙන්, පනවනු ලබන්නාහුද, පා සිවුරු තැන්පත් කරන්නාහු, ස්වාමීනි මේ මාගේ පාත්‍රය, මේ සිවුර, මේ තලිය මේ දියකලය, මේ මාගේ සැරයටිය තබනු මැනවැයි මෙසේ ශ්‍රමණ පරිෂ්කාර මනාසේ රකින්නාහු, **උච්චා සද්දා මහා සද්දා** යනු උඩට උස්ව නැගීම් අර්ථයෙන් උස්හඬ ඇතියේ යම් ආකාර වූ ඔවුන්ගේ උස්හඬ, අ කාරයට ආකාර කොට, හාත්පස පැතිරීම් අර්ථයෙන් මහත් වූ ශබ්දයක් යම් කෙනෙකුන්ගේද එවන් මහා ශබ්ද, **කෙවට්ටා මච්ඡඤ්ඤ මච්ඡ විලොපෙ** යනු මසුන් පැහැර ගැන්මෙහි කෙවුලන් මෙනි. යම්සේ නම් කෙවුළෝ දියෙහි පෙරළෙන හෙයින්ද, මසුන් ග්‍රහණය සඳහා ක්‍රියාකරන හෙයින්ද කෙවුළන් යයි ලද නම් ඇති මත්ස්‍ය බන්ධකයෝ, මත්ස්‍ය ග්‍රහණය සඳහා ජලයෙහි දැල බාන මසුන් පිවිසියේද, නොපිවිසියේද ගන්නා ලදද, නොගන්නා ලදදැයි ආදී වශයෙන් උස්හඬ මහා හඬ වෙති. යම්සේ නම් ඔවුහු මත්ස්‍ය පැස් ආදිය තබන ලද තන්හි මහජනයා ගොස්, මට එක් මත්ස්‍යයෙක් දෙනු. මට එක් මත්ස්‍ය වැලක් (එකට ඇමුණූ) දෙනු. අසවලාට විශාල මත්ස්‍යයෙකි. මට කුඩා එකෙකි ආදිය කියා පැහැර ගැනීමෙහිදී ඒවා වැළැක්වීම් වශයෙන් උස්හඬ මහ හඬ වෙති. එම භික්ෂූහු එසේයයි දක්වයි. **තෙනෙතෙ** යනු එම ඔව්හු **කිනන්තු** යනු කුමකටද? කවර හෙයින්දැයි යන අර්ථයි. **තෙ මෙ** යනු ඒ මොව්හු, **පනාමෙමි** යනු බැහැර කරමින් (නෙරපමි) **තෙ** යනු **එම නුඹලා, න වො මම සන්තිකෙ වත්ථබ්බං** යනු නුඹලා විසින් මාගේ **සමීපයෙහි** නොවිසිය යුතුය. යම් බදු වූ නුඹලා මා වැනි බුදු කෙනෙකුන්ගේ වාසස්ථානයට පැමිණ, මෙසේ මහා ශබ්ද කරවිද, තම ස්වභාවයෙන් වසන්නාහු කිනම් යෝග්‍ය දෙයක් කරන්නහුද? නුඹලා වැන්නවුන්ට මාගේ සමීපයෙහි කෘත්‍යයක් නම් නැතැයි දක්වයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් නෙරපූ කල්හි ඔවුන් අතර, එක් භික්ෂුවක් හෝ භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේ මහ හඬ මාත්‍රයකින් අප බැහැර කරනුද හෝ අන්‍ය වූ කිසි පිළිවදනක් නොකියා බුද්ධ ගෞරවයෙන් සියල්ලෝ භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගන්නාහු එසේය ස්වාමීනියි කියා නික්මුණහ. ඔවුන්ට මෙවන් අදහසක් විය. අපි ශාස්තෘන් වහන්සේ දකින්නෙමු. ධර්මය අසන්නෙමු. ශාස්තෘන් වහන්සේ සමීපයෙහි වාසය කරන්නෙමුයි

පැමිණියාහු, මෙබඳු ගරු කටයුතු ශාස්තෘන් වහන්සේගේ **සමීපයට** අවුත් මහා ශබ්ද කළෙමු. මෙය අපගේම දෝෂයයි. එහෙයින් අප බැහැරකරන ලද්දෝ වෙමු. එහෙයින් ශාස්තෘන් වහන්සේගේ සමීපයෙහි වසන්ට, හාත්පස ප්‍රසාදවහ ස්වර්ණ වර්ණ ශරීරය දක්නට, මධුරස්වරයෙන් දේශනා කරන ලද ධර්මය ශ්‍රවණය කරන්ට නොලද්දෙමු. ඔව්හු බලවත් දොම්නස් හටගත්තෝව නික්මුණහ. **සංඝාමෙවො** යනු සුරක්ෂිත කොට, **වජ්ජි** යනු මෙබඳු නම් ඇති දනව්ව, වජ්ජි නමැති ජනපදයෙහි රාජ කුමාරවරු, ඔවුන්ගේ වාසස්ථානය, එක් ජනපදයක් වුව, අධ්‍යාහාර වශයෙන් එහෙයින් වජ්ජීසු යැයි යූ.සේයි. වග්ගුමුදා යනු මෙවන් නාමයෙන් යුත් ලෝකයාගේ පුණ්‍ය සම්මත එක් නදියක්, වත්තමුදා යැයි ද පාඨයකි. **අපඨකාමෙන** යනු කිසි ප්‍රයෝජනයක් අපේක්ෂා නොකොට, අර්ථ සිද්ධියම කැමැත්තෙන්, **හිතෙසිනා** යනු වැඩ කැමැත්තහු විසින්, කිමෙක්ද මාගේ ශ්‍රාවකයෝ සසර වෘත්ත දුකින් මිදෙන්නාහු නම් යෙහෙකැයි එම අර්ථ සංඛ්‍යාත අර්ථයෙහි හෝ එයට හේතු වූ යහපත සොයනසුළු ස්වභාවයෙන්, එයින්ම තමාගේ ශරීර විනාශය ගණන් නොගෙන දුර පෙදෙස්හි වූවන්ද එවුන්ගේ සමීපයට ගොස් හික්මවන්නේය. අනුකම්පා කරන හෙයින් **අනුකම්පකෙන** එම අනුකම්පාවම හේතුකොට අප නෙරපන ලද්දෝ වෙමු. තමාගේ වතාවත් ආදිය අපේක්ෂාවෙන් නොවේ. යමෙක් උස්හඬ කිරීම් මාත්‍රයෙකින්ම නෙරපත්ද, එවන් ධර්මයට ගරු කරන භාග්‍යවත් බුදුවරු මනා ප්‍රතිපත්තියෙන්ම පිදිය යුත්තාහ. එහෙයින් **හන්ද මයං ආවුසො තථා විහාරං කපෙම** යනු හැමතැන සිහියෙන් හා විමසන නුවණින් යුක්තව නිදොස් ස්ථිර ප්‍රතිපදාව පුරන්නාහු, ගන්නා ලද පරිදි, එය මස්තකප්‍රාප්ත කරන්නාහු, සිව් ඉරියව් විවරණ කරමින් වාසය කරමු. **යථා නො විහරතං** යනු යම්සේ අප වාසය කරන කල්හි, භගවා **අත්තමනො අසස** යනු මනා ප්‍රතිපත්ති පූජාවෙන් සිත් ගන්නා ලද්දේ වන්නේ යයි අර්ථයි.

තෙනෙවන්තරවසෙන යනු එම වස් සමය ඇතුලතදීම, මහා පවාරණය නො ඉක්මවාම, **සබ්බව තිසෙසා විජ්ජා සච්ඡාකංසු** යනු සියලුම එම පන්සියයක් භික්ෂූහු පූර්වේනිවාසානුස්මෘති ඥානය, දිව්‍ය චක්ෂු ඥානය, ආශ්‍රවක්ෂයකර ඥානය යන මෙම ත්‍රයයද, පෙර වුසූ කඳපිළිවෙල වසන, මෝහස්කන්ධාදීන්ගේ විනිවිද දක්නා අර්ථයෙන් දැක්වෙන විද්‍යාව තම තමා විසින් ප්‍රත්‍යක්ෂ කළහ. ලෞකිකාභිඥාවන්හි මෙම අභිඥා ද්වයය, ආශ්‍රවක්ෂයකර ඥානයට බොහෝ උපකාරයහ.

දිව්‍යශ්‍රොත්‍ර, චෙතොපරිය, ඉද්ධිවිධ යන ඤාණයන් එසේ නොවේ යයි දැක්වීම සඳහා, ත්‍රිවිද්‍යාවම එම භික්ෂූන්ගේ අධිගම දැක්වීම් වශයෙන් උදුරා දක්වන ලදී. එසේම වේරඤ්ජ සූත්‍රයෙහි භාග්‍යවතුන් වහන්සේ වේරඤ්ජ බ්‍රාහ්මණයාට තමාගේ අධිගමයන් දක්වනුයේ, ත්‍රිවිද්‍යාවම දැක්වූ සේක. දිව්‍යශ්‍රොත්‍ර ඥානාදීන්ගේ අවිද්‍යමානතාවය නිසා නොවේ. එසේම එම භික්ෂූන්ගේ විද්‍යමාන වූද දිව්‍යශ්‍රොත්‍ර ඥානාදිය උදුරා නොදක්වන ලදහ. එම භික්ෂූහු ෂඩභිඥාලාභීහුය. **වඟුමුදාය නදියා තීරෙ අනතරහිතා මහාවනෙ කූටාගාර සාලාය භගවතො සම්මුඛෙ පාතුරහෙසුං** යනු එම භික්ෂූන්ගේ සෘද්ධි භාවිතය කියයි. යථාභිරන්තං යනු සිත්සේ බුදුවරුන්ට වනාහි එක් ස්ථානයක වැඩවාසය කරන්නාහු, සෙවන හා දිය විපතක් හෝ අපහසු සෙනසුන් හෝ මනුෂ්‍යයින්ගේ අශ්‍රද්ධාදී භාවයන්ට එළඹ නොඇල්මක් නම් නැත. ඒවාහි සම්ප්‍රාප්තියෙන් පහසුවෙන් වාසය කරමුයි දීර්ඝකාලීන විහරණයක්ද නොමැත. යම්තැනක භාග්‍යවතුන් වහන්සේ වාසය කරන කල්හි මිනිස්සු තිසරණයන්හි හෝ පිහිටත්ද, සිල් හෝ සමාදන් වෙත්ද, පැවිදි වෙත්ද? සෝවාන් ආදී මාර්ගයන්ට පැමිණෙත්ද? ශාස්තෘන් වහන්සේ එබඳු සම්පත් ඇතිකල්හි ඔවුන්ට පිහිටවීම සඳහා වාසය කරති. එය නොමැති කල්හි ඉවත්ව යයි. එකල්හි සැවැත්නුවර කළයුතු බුද්ධ කෘත්‍යයක් නොවීය. එහෙයින්, අථඛො භගවා සාවත්‍ථියං **යථාභිරන්තං විහරිත්වා යෙන වෙසාලි තෙන චාරිකං පක්කාමි** යි යූ.සේයි.

චාරිකං චරමානො යනු දීර්ඝ ගමනක් යනුයේ, භාග්‍යවතුන් වහන්සේගේ එම චාරිකා ඉක්මන් චාරිකා, ඉක්මන් නොවූ චාරිකා වශයෙන් දෙවැදෑරුම් වේ. එහි දුර ප්‍රදේශයක වූ ද අවබෝධ කළ හැකි පුද්ගලයෙකු දැක, ඔහුට අවබෝධ කරවීම සඳහා ඉක්මන්කොට යාම තුරිත චාරිකා නමැ. එය මහා කාශ්‍යප තෙරුන්ට පෙර ගමන් යාම් ආදීන්හි දතයුත්තාහ. යම්කෙලක්හි වනාහි ගම් නියම්ගම් රාජධානි පිළිවෙළින් දිනපතා, යොදුනක් දෙයොදුනක් වශයෙන්, පිණ්ඩපාත චර්යාදියෙන් ලෝකයාට අනුග්‍රහ කරමින් වඩිද? මෙය අතුරිතචාරිකා නම්. මෙයම මෙහි අදහස් කරන ලදී. **තදවසරි** යනු එයින් පැමිණියේය. එයට හෝ පැමිණියේය. එසේ පැමිණියේය. පිවිසියේය යන අර්ථයි. **තත්‍ර** යනු එහි සුදං යනු නිපාත මාත්‍රයකි. **වෙසාලියං** යනු තෙවරක් විශාල කරන ලද හෙයින් වෙසාලි ලද නම් ඇති ලිච්ඡවි රජවරුන්ගේ නගරයෙහි, මහා වනෙ යනු මහවනය නම් ඉඹේ හටගත්, රෝපණය නොකළ සීමා නොමැති විශාල වනාන්තරයයි. කිඹුල්වත් නුවර හාත්පස ඇති මහ වනය, හිමවත සමග

ඒකාබද්ධව, සීමා රහිතව මහා සමුද්‍රය ගටා සිටී. සීමා රහිත මහත් වූ වනයනුයි **මහාවනං** යි.

කූටාගාර සාලායං යනු එම මහ වනයෙහි භාග්‍යවතුන් වහන්සේ උදෙසා කළ ආරාමයෙහි, කුළුගෙය ඇතුලත්කොට, හංස වටු වැස්මෙන් කරන ලද සර්වාකාර පරිපූර්ණ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට කරවන ලද ගඳකිළිය කූටාගාර ශාලා නමී. එම කූටාගාර ශාලායෙහි. **වඟඟුමුදාතිරියානං** යනු වග්ගු මුදාතීර වාසීන්ගේ, **චෙතසා චෙතෝ පරිච්ච** මනසිකරිත්වා යනු තම සිතින් ඔවුන්ගේ සිත පිරිසිඳ මෙනෙහි කොට අන් සිත් දන්නා නුවණින් හෝ සර්වඥතා ඥානයෙන් හෝ ඔවුන් විසින් අවබෝධ කරන ලද, විශේෂාධිගමයන් දැන යන අර්ථයි. **ආලොක ජාතාවිය** යනු හටගත් ආලෝකයක් මෙනි. අනෙක එයට පර්යාය වචනයකි. සඳ හිරු දහසකින් ආලෝකමත් වූ මෙනැයි අර්ථයි. එම යසොජ ප්‍රමුඛ පන්සියයක් භික්ෂූහු සර්වාකාරයෙන් අවිද්‍යා අඳුර විනාශ කිරීමෙන් ආලෝකමත් වූවාහු, බැබලීම් සහිත වූවාහු වෙසෙත්. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඔවුන් සිටි දිශාවට **ආලොක ජාතා විය මෙ ආනනද එසාදිසා** යනාදියෙන් ගුණ වර්ණනා කිරීම් පෙන්වීම් වශයෙන් එම භික්ෂූහු ප්‍රශංසා කරයි. එහෙයින් **යසසං දිසායං** වඟඟු මුදාතිරියා **භික්ඛු විහරන්ති** යි යූ.සේයි. අපපටිකුලා යනු නො පිළිකුල්ය. මනාපය. සිත් ඇදගන්නා සුළු යයි අර්ථයි. යම් පෙදෙසෙක සීලාදි ගුණ යුත් මහර්ෂිවරු වෙසෙත්ද? එය කිසිසේත්, උස් ඉවුරු ඇති, පහත් ඉවුරු ඇති විෂම දුර්ගයක ආකාර ඇත්තේද, එතෙකුදු වුවත් එම පෙදෙස මනෝඥය රමණීයමය යූ.සේයි.

ගාමෙවා යදිවාරඤ්ඤ - නිනෙන වා යදිවා ථලෙ
යථොරහනෙතා විහරන්ති - තං භූමිං රාමණෙය්‍යකංනන්ති

ගමෙහි හෝ නොහොත් අරණ්‍යයෙහි හෝ පහත්බිම්හි හෝ ගොඩබිම්හි හෝ යන යම්තැනක රහත්හු වෙසෙත්ද? එම භූමිය සිත් අලවන සුළුය.

පහිණෙය්‍යාසි යනු පිටත්කර යවන්නෙහි **සත්ථා ආයසමන්තානං දසසන කාමෝ** යනු එම භික්ෂූන්ගේ සමීපයට පණිවුඩකරුවකු යවන ආකාරයකි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ, යම් අර්ථයක් සඳහා එම භික්ෂූන් නෙරපා හැරියේද එම කරුණ මස්තකප්‍රාප්ත වූ බව දැක, ආරබ්ධ

වීර්යයෙන් යුතු එම භික්ෂූන්ගේ දක්නා කැමැත්ත තෙරුන්ට දැනුම් දුන්නේය. බුදුරදුන්ට මෙබඳු සිතක් විය. මම උස්හඬ මහහඬ කිරීමෙහිලා මොවුන් නෙරපන්නෙමි. එකල්හි ඔව්හු කසයෙන් පහරණු ලැබූ, යහපත් ආජානේය අශ්වයකු මෙන්, ඉන් චුතව සංවේගප්‍රාප්තව, මසිත් ගැනීම උදෙසා අරණට පිවිස උත්සාහ කරනුයේ, ව්‍යායාම කරනුයේ වහාම අර්හත්වය සාක්ෂාත් කරන්නාහ. දැන් ඔවුහු අග්‍රඵල ප්‍රාප්ත වූවහු දැක, එම අර්හත්ව ප්‍රාප්තියෙහිලා සතුටු සිතැතියේ, ඔවුන්ගේ දර්ශනය අපේක්ෂාකොට මෙසේ ධර්ම භාණ්ඩාගාරිකට අණ කළ සේක. **සෝ භික්ඛු** ආනන්ද තෙරුන් විසින් එසේ අණ කළ ෂඩභිඥාලාභී එක් භික්ෂුවක්. **පමුඛෙ** යනු හමුයෙහි, ආනෙඤ්ජ **සමාධිනා** යනු චතුර්ථධ්‍යාන පාදක අග්‍රඵල සමාධියෙන්, අරූපධ්‍යාන පාදකයෙන් යැයිද කියති. **ආනඤ්ජන සමාධිනා** යිද පාඨයි. කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ එම භික්ෂූන්ගේ පැමිණීම දැන, පිළිසඳර නොකොට සමවතටම සමවැදිනිද? තමාගේ සමවත දැන ඔවුන්ටද සමවැදීම සඳහා, පෙර නෙරපන ලද ඔවුන්ට දැන් තමා සමග සම එක්වීම දැක්ම සඳහා නොවේ. වාග් භේදයෙන් තොරව උසස් බව දැක්වීමටද, රහත්බව ප්‍රකාශ කිරීම දැක්වීම සඳහාද වේ. සමහරු, පෙර නෙරපන ලද, දැන් තමන්ගේ සමීපයට පැමිණියවුන්ට, ඉතා උතුම් සුව ඉපදවීමෙන් අන්‍යයන් හා සාධාරණ නොවූ පිළිසඳරක් කිරීම සඳහා යයි කිහු. එම ආයුෂ්මත්හුද භාග්‍යවතුන් වහන්සේගේ අදහස දැන එම සමවතටම සමවැදුනහ. එහෙයින් **කතමෙන නුඛො භගවා විහාරෙන ඒතරහි විහරති** යි ආදිය යූ.සේයි. මෙහිද රූපාවචර චතුර්ථ ධ්‍යානය කුසීතතාදි උවදුරු ස්වභාවයන්ගේ ඉතා දුර බව කරන හෙයින් (දුරුකරන හෙයින්) ඍද්ධියට මූලික හේතු වූ, නො නැමෙන ආදී සොළොස් ආකාර පිරිසිදු කරන ධර්මයන්ගෙන් යුක්ත හෙයින්, කම්පා නොවන ස්වභාවයට පත්වූ තෙමේ, කම්පා නොවන අර්ථයෙන් ආනෙඤ්ජයයි කියයි. යූ.සේයි. පහතට නොනැමුණු සිත කුසීතකම්හි කම්පා නොවේනුයි ආනෙඤ්ජංයි. ඉහළ නොනැගි සිත උද්ධච්චයෙහි කම්පා නොවේනුයි ආනෙඤ්ජංයි. නොඇලුනු සිත ව්‍යාපාදයෙහි කම්පා නොවේනුයි ආනෙඤ්ජංයි. තෘෂ්ණා දෘෂ්ටි විරහිත සිත වැරදි දෘෂ්ටියෙහි කම්පා නොවේනුයි ආනෙඤ්ජංයි. කාමයන් හා සම්බන්ධ නුවූ සිත ඡන්දරාගයෙහි කම්පා නොවේනුයි ආනෙඤ්ජංයි. මිදුණු සිත කාමරාගයෙහි කම්පා නොවේනුයි ආනෙඤ්ජංයි. වෙන්වූ සිත ක්ලේශයන්හි කම්පා නොවේනුයි ආනෙඤ්ජංයි. කෙලෙස් සීමා ඉක්මවූ සිත කෙලෙස් සීමාවන්හි කම්පා නොවේනුයි ආනෙඤ්ජංයි. ඒකත්වයට ගිය සිත නානාප්‍රකාර ක්ලේශයන්හි කම්පා නොවේනුයි

ආනෙඤ්ජංයි. ශ්‍රද්ධාවෙන් දැඩිව අල්වාගත් සිත අශ්‍රද්ධායෙහි කම්පා නොවේනුයි ආනෙඤ්ජංයි. වීර්යයෙන් අල්වාගත් සිත කුසීතතාවයෙහි කම්පා නොවේනුයි ආනෙඤ්ජංයි. සිහියෙන් දැඩිව අල්වාගත් සිත ප්‍රමාදයෙහි කම්පා නොවේනුයි ආනෙඤ්ජංයි. සිහියෙන් දැඩිසේ අල්වාගත් සිත නොසන්සුන් බැව්හි කම්පා නොවේනුයි ආනෙඤ්ජංයි. ප්‍රඥාවෙන් දැඩිසේ අල්වාගත් සිත අවිද්‍යාවෙහි කම්පා නොවේනුයි ආනෙඤ්ජංයි. ප්‍රඥා ලෝකයෙන් ආලෝකමත් සිත අවිද්‍යාඤකාරයෙහි කම්පා නොවේනුයි ආනෙඤ්ජංයි රූප විරාග භාවනා වශයෙන් පැවැති, අරමුණු විභාග වශයෙන් සිව් වැදෑරුම් වූ රූපාවචර චතුර්ථ ධ්‍යානයද, අරූපාවචර ධ්‍යානයද යන එම පස්වැදෑරුම් ධ්‍යානයන්ට ආනෙඤ්ජයයි වහරයි. එම ධ්‍යානයන් අතර යම්කිසිවක් පාදකකොට, සමවන් අර්හත්ඵල සමාධිය ආනෙඤ්ජ සමාධිය යයි පෞරාණිකයෝ කීහ.

අභිකඤනාය යනු ඉක්මගිය කල්හි, **නිකඛනෙන** යනු නික්මුණු කල්හි, පහවූ කල්හි යන අර්ථයි. **තුණ්හී අහොසි** යනු භාග්‍යවතුන් වහන්සේ ආර්ය නිශ්ශබ්දතාවයෙන් නිශ්ශබ්ද වූයේය. **උද්ධතෙ අරුණෙ** යනු අරුණ නැගි කල්හි, අරුණ නම් නැගෙනහිර දිශායෙන් සූර්යෝදයට ප්‍රථමයෙන් නැගි ආලෝකයයි. **නඳිමුඛියා** යනු රැය ගෙවී අරුණ උදා වූ හෙයින්, සූර්යාලෝකයෙන් දිවි ගෙවන සත්ත්වයින් අරුණාලෝකයෙන් සතුටු කරවන ආකාරයෙන් රැය හටගත් කල්හි, බැබලෙන කල්හි යන අර්ථයි.

තමහා සමාධිම්හා වුට්ඨහිත්වා යනු පිරිසිඳි පරිදි එම ආනෙඤ්ජ සමාධියෙන් ද, අර්හත් ඵල සමවතින් ද නැගිට, **සචෙ ඛො ත්වං ආනන්ද ජානෙය්‍යාසි** යනු භාග්‍යවතුන් වහන්සේ, මෙම භික්ෂූහු මෙතෙක් කල් මෙනම් සමවත් සුවයෙන් කල් යවත් යයි ඉදින් ආනන්ද නුඹ දන්නෙහිද? **එතතකමපි න නපපටිභාසෙය්‍යාසි** යනු ලෞකික පිළිසඳර සඳහා යම් ආකාර වූ මෙම, ස්වාමීනි, ඔබ විසින් රැය ඉක්ම ගියේ යයි ආදී ක්‍රමයෙන් තෙවරක් වැටහීම එළවන ලදි. එපමණ වූ දෙයක් ද ඔබට නො වැටහෙන්නේ ය.

ආනන්දය, යම්බඳු වූ නුඹ ශෛක්ෂ්‍ය, අශෛක්ෂ්‍ය සමවත් විහරණ නොදන්නෙහිය. එහෙයින් මවිසින් මෙම භික්ෂූන්ට ලෞකික පිළිසඳර කථා කරන්ට උත්සාහවත් භාවයට පැමිණියෙමි. මම වනාහි මෙම භික්ෂූන් සමග ලෝකෝත්තර පිළිසඳර කථාවෙන් තුන්යම් රැය කල්ගත කළෙමියි

දක්වන්නේ, අභඤ්ඤ ආනඤ්ඤ ඉමානිච පඤ්ච භික්ඛු සතානි සබ්බෙව ආනඤ්ඤ සමාධිනා නිසීදිම්හ යන්න භාග්‍යවතුන් වහන්සේ වදාළහ. **එතමත්ථංවිදිත්වා** යනු එම භික්ෂූන්ගේ තමා සමඟ ආනෙඤ්ජ සමාධියට සමවැදීමේ සම්‍යර්ථතා සංඛ්‍යාත වසීභාවය සර්වාකාරයෙන් දැන **ඉමං උදානං** එම භික්ෂූන්ගේ ශේෂ රහිත රාගාදී ප්‍රහාණ මනාව සිදුවීම් ආදී ස්වභාවය දැක්වීම සඳහා මෙම ප්‍රීති වාක්‍යය වදාළේය.

එහි **යස්සජිතෝ කාම කණ්ටකෝ** යනු කුසල් පස විඳින අර්ථයෙන් කටුවක් වූ ක්ලේශකාමය යම් ආර්ය පුද්ගලයෙකු විසින් ශේෂ රහිතව දිනන ලදද? ප්‍රහීණ කරන ලදද? එයින් ඔහුගේ සංයෝජනයන්ගේ අභාවය දක්වයි ගාමකණ්ටකයැයි ද පායයි. එහි අර්ථය සියලු වස්තු කාමය ගමෙහි කටුවක් මෙන් සිටියේ වේ. **යස්ස ජිතෝ** යනු ඔහුගේ ජය ඒ හා බැඳි ඡන්ද රාග ප්‍රහාණයෙන්ම දතයුතුය. එයින් ඔවුන්ගේ අනාගාමී මාර්ගය යූ.සේයි. **අකෙකාසොව ජිතෝ** ඒ හා සම්බන්ධයි. **වධොව බන්ධනඤ්ච** යනු මෙහිද එම ක්‍රමයමැයි. එහි ආක්‍රෝශ ජයෙන් වාග් දුශ්චරිත අභාවයයි. අනෙකෙන් කාය දුශ්චරිත අභාවය දක්වන ලදී. එයින් එයට හේතු වූ, ව්‍යාපාදයාගේ ශේෂ රහිත ප්‍රහාණයෙන් තෙවන මාර්ගය යූ.සේයි. නොහොත් ආක්‍රෝශාදී ජය වචනයෙන් තෙවන මාර්ගය යූ.සේයි. ආක්‍රෝශාදීන්ගේ අත්‍යන්ත සමනය එහි ප්‍රකාශ කරන ලදුයේ වේ. දෙ අයුරින්ම ඒවාහි විරුද්ධතා ස්වභාවය දක්වයි. **පබ්බතෝ විය සොසිතෝ අනෙජෝ** යනු එජා යනු සැලෙන කෙලෙස් උවදුරයි. සැලෙන කෙලෙසුන්ගේ හේතූන්ද, සෙසු කෙලෙසුන්ගේද අභාවයෙන් අනෙජයි. අනෙජ හෙයින්ම, සියලු කෙලෙසුන්ගෙන්ද අන්‍ය මිසදිටු වාද නමැති වාතයන්ගෙන්ද, කම්පා නොව ස්වභාවයෙන් සිටියේ තනි කළුගල් පර්වතයක් හා සමානය. **සුබ දුක්ඛසු න වෙධති සභික්ඛු** යනු ඒ බුන් කෙලෙස් ඇති භික්ෂුව, සුව දුක් නිමිත්තකොට කම්පා නොවේ යයි, යට කියන ලද අයුරින්ම අර්ථය දතයුතුය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ එම පන්සියයක් භික්ෂූන්ගේ අර්හත්වාධිගමයෙන් සුවදුක්හි නොසැලෙන ස්වභාව හටගැන්ම එක්තැන් කොට ඒක පුද්ගලාධිෂ්ඨාන උදානය උදන් ඇනූ සේක.

තෘතීය සූත්‍ර වර්ණනාව නිමියේ ය.

3-4

සිව්වැන්නෙහි **පරිමුඛං සතිං උපට්ඨපෙත්වා** යනු අරමුණට අභිමුඛව සිහිය තබා, මුව සමීපයෙහි කොට, එසේම විභංගයෙහි, ඉමම සිහිය නාසිකාග්‍රයෙහි හෝ මුව නිමිත්තෙහි හෝ එළඹ සිටියාහු මනාව එළඹ සිටියාහු වේ. එහෙයින් **පරිමුඛං සතිං උපට්ඨපෙත්වායි** කියයි. නොහොත් **පරි** යනු හාත්පසින් අල්වා ගන්නා යන අර්ථයි. **මුඛං** යනු ගෙන යන අර්ථයි. **සති** යනු වැටහීම් අර්ථයි. එහෙයින් **පරිමුඛං සතිං** යයි කියයි. මෙහි පටිසම්භිදායෙහි කියන ලද අයුරින් අර්ථය දතයුතුය. එහි මේ කෙටි අර්ථයයි. හාත්පසින් අල්වාගෙන සිහිය ගෙන යාම නියාණං යනු සිහියෙන් බැසගත යුතු අරමුණ දතයුතුය. මෙහි පළමු හා අවසන් අර්ථය සියල්ල එකට එකතු කිරීම් වශයෙනි. අනෙක සමවතින්, පූර්වභාගයෙහි එක් අරමුණක සිත පිහිටුවීම් වශයෙන් දතයුතුය. එය සිහිය යන මාතෘකාවෙන් යූ.සේයි. සති යන්න යමෙක් කායගතා සතිය පරිභෝග කෙරෙත්ද යනාදී තන්හි මෙනි. එම ධ්‍යාය යනු කිමෙක්ද? රූපාවචර චතුර්ථ ධ්‍යානය පාදක කොට සමවන් අර්හත්ඵළ ධ්‍යානයයි. කෙසේ වනාහි එය දතයුතුද? කම්පානොවන සමාධි යෝගයෙන් තෙරුන්ගේ කිසියම් විශේෂතා සහිත නිශ්චල භාවයද, කම්පා නොවන ස්වභාවයද, පර්වත උපමාවකින් ප්‍රකාශ කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ, මෙම උදානය වදාළ සේකැයි ගාථාවෙන්ම මෙම අර්ථය හැඟේ. මෙම හිදගැනීම සත්‍යාවබෝධය සඳහා නොවේ. තවද මෙය ඉහාත්ම සුව විහරණය සඳහායි. **සූකර ඛත** (උගරන් හැරූ) ලෙණෙහිදී තම බෑනා වූ දීඝනඛ පිරිවැජියාට භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කරන කල්හි මේ මහ තෙරහු චතුරාර්ය සත්‍යය ප්‍රතිවේධ කෘත්‍යය කල් ඇතිවම මස්තක ප්‍රාප්ත කළේය. **එතමත්ථං** යනු තෙරුන්ගේ අකම්ප්‍ය සමාධි යෝගයෙන්, රහත් භාවයට පැමිණීමෙහිද, කිසියම් කම්පා නොවන ස්වභාව සංඛ්‍යාත කරුණ සර්වාකාරයෙන් දැන එම කරුණ පැහැදිලි කිරීමට මෙම ප්‍රීති වාක්‍යය වදාළ සේක.

එහි **යථාපි පබ්බතෝ සෙලෝ** යනු යම්සේ එකට තද වූ තනි සෙල්මුවා ගල් පර්වතයක් පස් සහිත හෝ විවිධ දෑ (වැලි, මඩ ආදී) මිශ්‍රිත පර්වතයක් නොවේයයි අර්ථයි. **අචලෝ සුපතිට්ඨිතෝ** යනු මුල් කොටස මනාව පිහිටියේ, ප්‍රකෘති වාතයන්ගෙන්, සෙලවිය නොහැකියේ, කම්පා

නොවනුයේ වේ. එවං මොහකඛයා භික්ඛු පබබතොව නවෙධති යනු මෝහයාගේ සේස රහිත ප්‍රහාණයෙන්, මෝහ මූලික වූ, සියලු ප්‍රහීණතාවයට පත් දක්ෂ භික්ෂුව, යම්සේ එම පර්වතය ප්‍රකෘති වාතයන්ගෙන් නොසැලේද, කම්පා නොවේද, එසේම අටලෝ දහමින් නොසැලේ. කම්පා නොවේ. නිර්වාණයද, අර්හත්වයද මෝහක්ෂයයි කියයි. එහෙයින් මෝහක්ෂයයට හේතු වූ, නිර්වාණයද අර්හත්වයද අවබෝධ කළ හෙයින්, සිව් අරි සස්හි මනාව පිහිටියේ, සමවතට අසම්ප්‍රාප්ත කාලයෙහිද කියන ලද ආකාර ඇති පර්වතය මෙන් කිසිවකින් නොසැලේ. සමවතට සමවන් කාලයෙහි කියනුම කවරේද යන අදහසයි.

සිව්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

3-5

පස්වැන්නෙහි, **කායගතා සතියා** යනු කය අනුව බැලීම් වශයෙන් කය අනුව ගිය, කය අරමුණු කොට පැවැති සිහියෙන්, මෙය මෙසේ වූයේය යන ලක්ෂණයෙහි කරණ විභක්තියි. අජ්ඣත්තං යනු මෙහි අධ්‍යාත්මය නම් ස්වකීය අධ්‍යාත්මයයි. එහෙයින් තමා කෙරෙහි ආත්ම සන්තානයෙහි යන අර්ථයි. නොහොත් කමටහනට හේතු වූ කෙස් ආදී දෙතිස් කොටස් සමූහය මෙහි කය යැයි අදහස් කරන ලදී. එහෙයින් අජ්ඣත්තං යන පදයට ගෝචරාධ්‍යාත්මයැයි අර්ථය දතයුතුය. **සුපපතිට්ඨිතො** යනු ස්වකීය ආධ්‍යාත්ම වූ හෝ ගෝචරධ්‍යාත්ම වූ හෝ ශරීරයෙහි මනාව එළඹ සිටි හෙයින්, මේ කවරනම් සිහියක් යම් අධ්‍යාත්මයක මනාව එළඹ සිටියේ යයි කියන ලද්දේද? ඒ මේ භාග්‍යවතුන් වහන්සේ, මෙම කයෙහි කෙස්, ලොම් ඇත යනාදී ක්‍රමයෙන් ආධ්‍යාත්මික කෙස් ආදී වූ දෙතිස් ආකාර කය යූ.සේයි. එහි පිළිකුල් වශයෙන් මෙනෙහි කිරීම පවත්වන්නහුට, උපචාර අර්පණා වශයෙන් එළඹ සිටි සිහියක් වේද, එය කායගතා සතියයි කියයි. යම් ආකාර වූ, ආනාපන සිව් ඉරියව්, සති සම්ප්‍රජාන්‍යයන්ගේ වශයෙන්, උද්ධුමාතක විනිලක වශයෙන්ද,

මෙනෙහි කිරීම පවත්වන්නහුට, සුදුසු පරිදි, උපචාර අර්පණා වශයෙන් කයෙහි එළඹ සිටි සිහයක් වේද, එය කායගතා සතියයි කියයි. මෙහි වනාහි අධ්‍යාත්මික කායගතා සතියද, පෘථිවි ආදී සිව් ධාතූහුද සසම්භාර සංක්ෂේපාදී සතර අතරින් යම්කිසි එකකින් එක් ආකාරයකින් විභාගකොට, ඒවාහි අනිත්‍යාදි ලක්ෂණ සැලකීම් වශයෙන් එළඹ සිටි විදර්ශනා සම්ප්‍රයුක්ත සිහිය කයාගතා සතියයි අදහස් කරන ලදී. තෙරුන් වහන්සේ වනාහි එසේ විදර්ශනා කොට තම ඵල සමවතට සමවැද හුන්නේය. මෙහිද ගාථාවෙන් මෙම අර්ථය දතයුතු හෙයින් 'නචායං නිසජ්ජා' ආදිය කියන ලද ක්‍රම අනුසාරයෙන් යෙදිය යුතුය. **එතමත්ථං** යනු තෙරුන්ගේ එම සිව් ධාතු වෙන් වෙන්ව අවබෝධ කිරීම් අයුරින් කායානුපස්සනා සතිපට්ඨානයෙන් විදර්ශනාවට බැස ඵල සමවත් සමවැදීම් සංඛ්‍යාත අර්ථය දැන, **ඉමං උදානං** යනු මෙම සතිපට්ඨාන භාවනාවෙන් නිර්වාණාධිගමය දක්වන ප්‍රීති වාක්‍යය වදාළ සේක.

එහි **සති කායගතා උපට්ඨිතා** යනු පෙර කියන ලද ලක්ෂණ ඇති සිහිය, ශ්‍රද්ධාව පූර්වාංගම සමාධි, වීර්ය ප්‍රඥාවන් සුදුසු පරිදි, කෘත්‍ය නිෂ්පාදනයෙන් විරුද්ධ ධර්මයන් ප්‍රහාණ භාවයට පැමිණි හෙයින්, විරුද්ධ ධර්මයන් ප්‍රහීණ වූවාහු එයින්ම, තීක්ෂණ හා ප්‍රකට වූද, කියන ලද ආකාර ඇති ශරීරයාගේ ග්‍රහණ වශයෙන් ද, එක් අර්ථයක එක්තැන් කිරීම් වශයෙන්ද, නොවෙනස් ස්වභාවය සලකන්නාහු එළඹ සිටියේ වේ. එයින් කාය සංඛ්‍යාත සිව් ධාතූන්ගේ ද එය ආශ්‍රිත උපාදාය රූපයන්ගේද සැලකීම් වශයෙන් ප්‍රත්‍යයන් විභාගකොට ඉන් මත්තෙහි ඒවාහි, අනිත්‍යාදි ලක්ෂණ සැලකීම් වශයෙන් පැවැති ඥාන පරම්පරාව අනුව පැමිණි සිහිය දක්වයි. සති ශීර්ෂයෙන් හෝ ඒ හා සම්ප්‍රයුක්ත විශේෂ දැනුම් තුයයට ඇතුලත් ඥාන පරම්පරාවම දක්වයි. **ඡසු ඵස්සායතනෙසු සංවුතෝ** යනු කියන ලද ආකාරයෙන් කයෙහි එළඹ සිටි සිහියෙන් යුක්ත වූයේ චක්ෂුරාදීන්හි ස්පර්ශයට හේතු වූ ෂට් ද්වාරයන්හි කායානුපස්සනාවගේ නොවඩනා ලද හෙයින් ඉපැත්මට නුසුදුසු වූ අභිධ්‍යාදීන්ගේ, එය වඩනා ලද හෙයින් පැවැත්මට හේතු වලකනුයේ ඒවා වසනුයේ එහි සංවර වූයේ යයි කියයි. එයින් ඥාන සංවරය දක්වයි. **සතතං භක්ඛු සමාහිතෝ** යනු ඒ භික්ෂුව මෙසේ එළඹ සිටි සිහි ඇත්තේ, හැමතැන සංවර වූයේ පැතිර සිටි හෙයින් අරමුණෙහි සිත අත්නොහැර අනිත්‍යාදි වශයෙන් විමසා බලනුයේ විදර්ශනාවෙන් විමසා බලා, ඥානය තීක්ෂණ වූ කල්හි දක්ෂතාවය උසුලනුයේ, විදර්ශනා සමාධියෙන් පළමුව නිරතුරුව නිරන්තරයෙන්

තැන්පත් වූයේ, අනුලෝම ඥානයට අනතුරුව, ගොතුභූ ඥාන දර්ශනයෙහි පටන් **ඤඤ්ඤා නිබ්බාන මත්තනො** යනු අන්‍ය පෘථග්ජනයින්ට සිහිනෙනුදු අගෝචර හෙයින්, ආර්යයන්ට වනාහි ඒ ඒ පුද්ගලයාට ආවේනික හෙයින්, ආත්ම සමාන හෙයින්, ආත්මයයි ලද ව්‍යවහාර ඇති මාර්ගඵල ඥානයෙහි උත්කෘෂ්ඨතාවයෙන් ඒකාන්ත සුව ඵලවන අසඛඛත ධාතු සංඛ්‍යාත නිර්වාණය තමාගේ යයි යූ.සේයි. එම නිර්වාණය දැනගන්නේය. මාර්ග ඵල ඥානයන්ගෙන් ප්‍රතිවේධ කරන්නේය. සාක්ෂාත් කරන්නේ යන අර්ථයි. එයින් ආර්යයන්ගේ නිර්වාණයෙහි මිදීම් ස්වභාවය පෙන්වයි. ආර්යයෝ වනාහි සමාධි සිත පැවැති කාලයෙහිද, ඒකාන්තයෙන් ම නිර්වාණයෙහි නිමිනතාවයෙන්, නම්‍රතාවයෙන්, ප්‍රවණතාවයෙන් වෙසෙත්. මෙහිද යමෙකුට කායගතා සතිය එළඹ සිටියේද, ඒ භික්ෂුව ෂට් ස්පර්ශායතනයන්හි සංවර වූයේ, එයින්ම නිතර සමාධියට පත්වූයේ තමාගේ ප්‍රත්‍යක්ෂ කිරීමෙන් නිර්වාණය තම සන්තානයෙහි විද්‍යමාන වේයයි දැනගන්නේය. මෙසේ ගාථා පදයන්ගේ සම්බන්ධය දතයුතුය. මෙසේ කායානුපස්සනා සතිපට්ඨාන ද්වාරයෙන් අර්හත්වය තෙක් එම භික්ෂුව නික්ම යාමේ මාර්ගය ධර්මරාජයාණන් වහන්සේ පෙන්වයි. අනෙක් ක්‍රමයක්, **සති කායගතා උපට්ඨිතා** යනු එයින් කායානුපස්සනා සතිපට්ඨානය පෙන්වයි. **ඡසු ඵසසායතනෙසු සංවුතො** යනු ස්පර්ශය උත්පත්ති ස්ථානය හේතුව වූයේ ඔවුන්ට නුයි ඵස්සායතනයි. එම ස්පර්ශායතනයන්හි, ස්පර්ශ හේතු වූ, ස්පර්ශ ප්‍රත්‍යයෙන් නිපත් ෂට් චක්ෂු ස්පර්ශාදි, විඳිනු ලබන දැහි තෘෂ්ණාදීන්ගේ නොපැවැත්මෙන් සංවර වූයේ, එයින් වේදනානුපස්සනා සතිපට්ඨානය පෙන්වයි.

සතතං භික්ඛු සමාහිතො යනු නිතර, හැමදා, නිරන්තරයෙන් වික්ෂෙප අභාවයෙන් සිතේ එකඟතාවයට පත් භික්ෂුව, එම සමාධිය සර්වාකාරයෙන් සතිපට්ඨාන භාවනාවගේ මස්තකප්‍රාප්තියෙන් වේ. විමසා බලනුයේ, අතීතාදී භේද හින්න වූ, පංච උපාදානස්කන්ධයන්හි සේස රහිතව අල්වාගෙන විමසා බලයි යයි එයින් සෙසු සතිපට්ඨානයන් පෙන්වයි. **ඤඤ්ඤා නිබ්බාන මත්තනො** යනු මෙසේ සතර සතිපට්ඨාන භාවනාව මස්තකප්‍රාප්ත කොට සිටියේ බුන් කෙලෙස් ඇති භික්ෂුව තම කෙලෙස් නිවීම ප්‍රත්‍යවේක්ෂණ ඥානයෙන් තෙමේම දැන ගන්නේ යයි අර්ථයි. නොහොත් **සති කායගතා උපට්ඨිතා** යනු තමාගේ ද අන්‍යයන්ගේද ශරීරයාගේ තත් වූ පරිද්දෙන්, පිරිසිඳ දැනීම දැක්වීමෙන් තෙරුන්ගේ සිහියෙහි විශාලත්වයට පැමිණීම දක්වන ලදී. **ඡසු ඵසසායතනෙසු සංවුතො**

යනු චක්ඛුරාදී ඡට් ද්වාරයන්හි සීමාව ඉක්මවා ගිය සංවරය දැක්වීමෙන්, සන්සුන් විහරනාදී වශයෙන් තෙරුන්ගේ විමසුම් නුවණ ප්‍රකට කිරීමද, ප්‍රඥාවගේ විශාලත්වයට පත්වීමද දක්වන ලදී. **සතතං භික්ඛු සමාහිතො** යනු සමවත්හි යෙදීමේ බහුලතාවය දැක්වීමෙන් අනුපූර්ව විහාර සමාපත්තිහු දක්වන ලදහ. මෙවන් ආකාර වූ භික්ෂුව **ඡඤ්ඤා නිබ්බාණ මත්තනො** යනු කරන ලද කෘත්‍යයන් ඇති බැවින් මත්තෙහි කළයුත්තක් නොමැති හෙයින්, හුදෙක් තමාගේ ස්කන්ධයන් පැවැත්මේ හේතුව ඉතිරිව නොමැති නිර්වාණයම දැනගන්නේය. ඔහුට අනෙක් සිතිය යුත්තක් නැතැයි යන අදහසයි.

පස්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

3-6

සයවැන්නෙහි **පිළිඳිවච්ඡා** යනු පිලිඳි යන නාමයයි. වච්ඡ යනු ගොත්‍ර වශයෙන් තෙරුන් හඳුනති. වසලවාදෙන සමුදාචරති යනු එනු වසලය, ඉවත්ව යනු වසලය ආදි වශයෙන් භික්ෂූන් වසල වාදයෙන් වහරයි. අමතයි. **සමබහූලා භිකඛු** යනු බොහෝ භික්ෂූහු, ඔව්හු එසේ හැසිරෙන තෙරුන් දැක රහත්භාවයට පත්ව සිටියේ වී නමුත් පහ නුවූ පෙර අත්බැව්හි පුරුද්ද හෙයින් මෙසේ කථා කරයි යයි නොදන්නාහු මෙම තෙරහු ද්වේෂ සහගත සිතින් හැසිරේයයි සිතා, උසස්කොට කථා කරවීමේ අදහසින් ඔහු එම තත්ත්වයෙන් නැගිටුවීමට (වැළැක්වීමට) සැළකොට සිටියහ. එහෙයින් **ආයසමා හනෙත පිලිඳිවච්ඡා භිකඛු** වසල වාදෙන සමුදාචරති'යි යූ.සේයි. මෙම භික්ෂුව රහත්භාවයට පත්වූවෙකැයි හඳුනති. මෙම භික්ෂුව මෙසේ එරුෂ වචනයෙන් හැසිරේයයි පෙර පුරුද්දට අනුව එසේ හැසිරෙන්නා වූ මොහු කෙරෙහි උතුරු මිනිස්දම් නුවූයේද, ඔහුගේ ආර්යභාවය නොදන්නා වූ, නොපිළිගන්නා වූ භික්ෂූහු ඔහු පහත්කොට සලකන හැඟීමෙන් යුක්තව භාග්‍යවතුන් වහන්සේට එම කරුණ දැන්වූහයි සමහරු කීහ. භාග්‍යවතුන් වහන්සේ තෙරුන්ගේ

නිර්ද්වේෂභාවය ප්‍රකාශ කරනු කැමැතියේ, එක් භික්ෂුවක් ලවා ඔහු කැඳවා, ඔහු ඉදිරිපිට පෙර පුරුදු කිරීම් වශයෙන් මොහු එසේ හැසිරේ. එරූෂ වචන පැවසීමේ අදහසින් නොවේ යයි වදාළ සේක. එහෙයින් **අථඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමෙනතසි** ආදිය ය්‍ය.සේයි. එහි **පුඛෙඛ නිවාසං මනසිකරිත්වා** යනු ශාස්තෘන් වහන්සේ, වච්ඡයෙනි, තොප වසලවාදයෙන් භික්ෂූන් අමතයි යනු සැබෑදැයි තෙරුන් විචාරා ඔහු විසින් ස්වාමීනි එසේයයි කී කල්හි, මෙම වච්ඡයා ක්ලේශයන්ට වසඟව සිටි පුරුද්දෙන් වසල වාදය අත් නොහරී. කිමෙක්ද අතීත ආත්මභාවයන්හිද, බ්‍රාහ්මණ ජාතිකයෙක් වූයේදැයි ආවර්ජනා කරනුයේ පූර්වේනිවාසානුස්මෘති ඥානයෙන් හෝ සර්වඥතා ඥානයෙන් ඔහුගේ පෙර විසූ අතීත ජාතීන්හි, වාසය කළ ස්කන්ධ පරම්පරාව මෙනෙහිකොට **මනසිකරිත්වා** යනු අත්තල තබන ලද නෙල්ලිගෙඩියක් මෙන් ප්‍රත්‍යක්ෂ කිරීම් වශයෙන් තමා විසින් මෙනෙහි කොට, **භික්ඛු ආමෙනතසි** යනු එම භික්ෂූන්ට හැඟවීමට ආමන්ත්‍රණය කළේය. වදාළේය. එහෙයින් මා ඩො තුමෙඹ භික්ඛවෙ යනාදිය ය්‍ය.සේයි. එහි මා යනු ප්‍රතිෂේධාර්ථයෙහි නිපාතයි. තසස උජඣායිතථ යැයි මෙයින් සම්බන්ධයි. 'මා උජඣායිතථ යනු පහත් තත්ත්වයෙහිලා නොසිතව් - නොබලව් යයි අර්ථයි. **වච්ඡස්ස භික්ඛුනො** යනු පහත් කොට සැලකීම ඊර්ෂ්‍යා කිරීම, වච්ඡ භික්ෂුවට යැයි සම්ප්‍රදානයි. දැන් ඔහු පහත්කොට නොසැලකිය යුතු හේතු දක්වනුයේ **න භික්ඛවෙ වච්ඡො දොසන්තරො භික්ඛු වසලවාදෙන සමුදාචරතියි** වදාළ සේක. එහි අර්ථය මහණෙනි, මෙම වච්ඡ තෙමේ දවේෂ සහගතව ද්වේෂ සිතැතිව, ද්වේෂයෙන් ව්‍යාපාදයෙන් දූෂිත සිත් ඇතිව භික්ෂූනු වසලවාදයෙන් නොහැසිරේ. මාර්ගාධිගමයෙන්ම ඔහුගේ ව්‍යාපාදය මුලිනුපුටා දැමීය. මෙසේ ද්වේෂ ස්වභාව විරහිත වූයේද ඔහුගේ එසේ හැසිරීමට පෙර අත්බැව්හි සිදුවූ කරුණ ගෙනහැර දක්වනුයේ **වච්ඡස්ස භික්ඛවෙ** යනාදිය වදාළහ. එහි **අඛෙබාකිණ්ණානී** යනු ක්ෂත්‍රිය ආදි ජාති අතරෙහි අමිශ්‍රව **අතරක් නොමැතිව, පඤ්ච ජාතිසතානි බ්‍රාහමණකුලෙ පචචා ජාතානි** යනු වච්ඡයාගේ සියලුම ඒ උපත් පන්සියයක්ම පිළිවෙළින් බ්‍රාහ්මණ කුලයෙහිම උපන්නාහු වූහ යි අර්ථයි. **සො තසස වසලවාදො දීඝරත්තං සමුදාචිණ්ණො** යනු යමක් වත්මනැ ක්ෂීණාශ්‍රව වූයේ වී නමුත් පවත්වාගෙන යයිද, වච්ඡ භික්ෂුවගේ එම වසලවාදය, මෙම ජාතියෙහි පටන් උඩට ආරෝහන වශයෙන් ගත් කල්හි පන්සියයක් පමණ උපත්හි බ්‍රාහ්මණ ජාතිකත්වයෙන් පුරුදු කරන ලද්දේ, නිතර පවත්වන ලද්දේ විය. බ්‍රාහ්මණයෝ වනාහි උපතින් සිදු වූ මානයෙන්, මානයෙන් තද වූවාහු අන්‍යයා වසලවාදයෙන්

කතා කෙරෙති. මනාසේ පුරුදු කරන ලදැයිද කියවති. අර්ථය එයමය. **තෙන** යනු ඔහු විසින් දීර්ඝ කාලයක් එසේ පුරුදු කරන ලද බැවින්, එයින් ඔහුගේ එසේ හැසිරීමට හේතුව පෙර පුරුද්ද යයි දක්වයි. මෙම පෙර පුරුද්ද නම් කිම? යම් ආකාර වූ කෙලෙස් රහිත පුද්ගලයාගේ ද, සන්තානයෙහි අප්‍රහීණ කෙලෙසුන්ගේ හැසිරීම් හා සමාන හැසිරීමට හේතු වූ, අනාදිමත් කාලයක පටන් භාවිතා කරන ලද, කෙලෙසුන් විසින් ගෙන එන ලද දක්ෂතා මාත්‍රයක් වේද, එබඳු ස්වභාවය අධිෂ්ඨානය යැයි කියති. එය වනාහි අභිනීහාර සම්පත්තියෙන් දතයුතු වැළැක්වීම් ප්‍රහාණ වශයෙන් යම්තැනෙක්හි කෙලෙස් ප්‍රහීණ වූයේ ද, එහි භාග්‍යවතුන් වහන්සේගේ සන්තානයෙහි නොමැත. යම්තැනක වනාහි කෙලෙස් ප්‍රහීණ නොවිද? එහිලා ශ්‍රාවකයින්ගේ ද, පසේ බුදුවරුන්ගේ ද සන්තානයෙහි ඇත. එහෙයින් තථාගතයන් වහන්සේම අනාවරණ ඥාන දර්ශනයෙන් යුක්තය.

එතමත්ථං විදිත්වා යනු ඒ ආයුෂ්මත් පිලින්දිවච්ඡයන්ගේ වසලයයි කථාවෙන් හැසිරීම ඇති කල්හිද ද්වේෂ සහගත සිත්හි අභාව සංඛ්‍යාත කරුණ දැන **ඉමං උදානං** යනු ඔහුගේ අග්‍රඵල අධිගම දැක්වීම් වශයෙන් මෙම ප්‍රීති වාක්‍යය වදාළ සේක.

එහි **යම්හි න මායා වසති න මානෝ** යනු යම් ආර්ය පුද්ගලයෙක් කෙරෙහි විද්‍යමාන දොස් වැසීම් ලක්ෂණ කොට ඇත. මායා යනු ශ්‍රේෂ්ඨයෙක් වෙමියි ආදී ක්‍රමයෙන් දැඩි ග්‍රහණ වශයෙන් පැවැති ඉහළ නැගීම ලක්ෂණ කොට ඇත.

මානොපි න වසති යනු මාර්ගාධිගමයෙන් මනාව නසන ලද හෙයින් නොපවතියි. නූපදියි. **සොඛිණ ලොභෝ අමමෝ නිරාසෝ** යනු යම් රාගාදී ආකාර වශයෙන් පැවැති අරමුණු ගැනීම් ලක්ෂණ කොට ඇති ලෝභය සර්වාකාරයෙන් පහවූ හෙයින **විතලොභෝ** යි එම රූපාදී කිසිතැනෙක්හි මමය, මාගේය යන හැඟීම් තොර කිරීමෙන් **අමමෝ** යි දැඩිව අල්වා ගැනීම් රහිත වූයේ, අනාගතයේ වූද භව ආදීන්ගේ අපේක්ෂා විරහිත හෙයින්ද **නිරාසොයි. පනුන්නනකොධෝ** යනු කිපීම ලක්ෂණකොට ඇති ක්‍රෝධය අනාගාමී මාර්ගයෙන් සර්වාකාරයෙන් ප්‍රහීණ හෙයින් පනුන්නනකොධොයි. විනාශ කරන ලද ක්‍රෝධය. **අභිනිබ්බුතත්තෝ** යනු, යමෙක් මෙසේ මායා, මාන, ලෝභ, ක්‍රෝධාදීන්ගේ විනාශ කිරීමෙන්

ඒහා යෙදුන සියලු කෙලෙස් පක්ෂය මනාව ප්‍රහීණ කළ හෙයින් සර්වප්‍රකාරයෙන් ක්ලේශ පරිනිර්වාණයෙන් මනාව නිවුණු සිතැත්තේ සිසිල් වූයේ. **සො බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛු** යනු මෙබඳු එම ක්ෂීණාශ්‍රව තෙමේ සර්වප්‍රකාරයෙන් යටපත් කළ පාප හෙයින් බ්‍රාහ්මණොයි ඔහුම සමනය කළ පාප බැවින් ද, සමාන චර්යා හෙයින් ද **සමණොයි** ඔහුම සර්වාකාරයෙන් බුන් කෙලෙස් හෙයින් භික්ඛු නමැ. මහණෙනි, මේ ආකාර වූද එම වචීඡ තෙමේ කෙසේ ද්වේෂ සහගත සිතැතිව කිසි කාය කර්මාදියක් පවත්වන්නේද, හුදෙක් පෙර පුරුද්ද අප්‍රහීණ හෙයින් වසලවාදයෙන් නිතර අනෙක් අය අමතයි.

සයවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

3-7

සත්වැන්නෙහි, **සතතාහං එක පල්ලංකෙන නිසිනෙනා හොති අඤ්ඤතරං සමාධිං සමාපජ්ජිත්වා** යනු මෙහිලා සමහරු අර්හත්ඵල සමාධිය මෙහි එක්තරා සමාධිය යැයි අදහස් කරන ලදැයි කීහ. ඒ ආයුෂ්මත් තෙමේ ඉහාත්ම සුව විහරණය සඳහා බහුලව සමවතට සමවදියි. සත්දිනක් වුව ඵල සමවතින් කල්ගෙවීමට හැකියාව ඇත. එසේම භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, මම කාමයන්ගෙන් වෙන්වම - අකුසල ධර්මයන්ගෙන් වෙන්ව යම්තාක් කලක් විසීමට කැමති වෙම්ද ඒතාක් කල් ඒ ආයුරින් වාසය කරමි. මහණෙනි, කාශ්‍යපද කාමයන්ගෙන් වෙන්වම -පෙ- වාසය කරයි යනාදී ක්‍රමයෙන් නව අනුපූර්ව විහාර, ෂට් අභිඥා ප්‍රභේද වූ උතුරු මිනිස්දම්හි කාශ්‍යපද තමා හා සම සම ස්ථානයෙහි තබන ලදී. මෙහි මෙපමණක්ම නොව තෙරහු යමක ප්‍රාතිහාර්යයද කරන්නේ යයි කිවයුතුය. ධ්‍යානාදීන්හි ලා ශ්‍රාවක සාධාරණත්වය අදහස් කළ හෙයිනි. **අඤ්ඤතරං සමාධිං සමාපජ්ජිත්වා** නිරෝධයට සමවැද යයි පෞරාණිකයෝ කීහ. කෙසේ වනාහි නිරෝධ සමාපත්තිය සමාධියැයි යූ.සේද යත්, එකඟ කිරීම් අර්ථයෙන්, මෙම එකඟ කිරීම් අර්ථය කවරක්ද? මනාව පිහිටුවිය යුතු හෙයිනි. සමථ බල විදර්ශනා බල යන මෙම බල ද්වයයෙන් යුක්ත වූයේ විරුද්ධ ධර්මයන්ගෙන් අකම්පය වූයේ බලප්‍රාප්ත

වූයේ වේ. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, නිබ්බිදා, විරාග-නිරෝධ, පටිනිස්සග්ග, විවට්ටානුපස්සනා, සිව්මග ඥානයන් සිව්ඵල ඥානයන් යන මෙම සොළොස් ඥානයන්ගේ වශයෙන් සොළොස් ඥාන චර්යාවන්ගෙන්, ප්‍රථමධ්‍යාන සමාධි ආදී අෂ්ඨ සමාධීන් එකක් සේ සළකා ගන්නා ලදී. ඒවාහි උපචාර සමාධියදැයි මෙම නව සමාධීන්ගේ වශයෙන් නව සමාධි චර්යාවන්ගෙන්ද, කාය සංස්කාර, වචී සංස්කාර, චිත්ත සංස්කාරදැයි යන, මෙම ත්‍රිවිධ සංස්කාරයන්ගේ ඒ ඒ තන්හි සන්සිඳීමෙන් එසේ වසනු කැමැති කියන ලද තන්හි වසීභාවප්‍රාප්ත රහත් හෝ අනාගාමී පුද්ගලයෙකු විසින් අදහස් කරන ලද කාලය අනුව, චිත්ත චෛතසික පරම්පරාවගේ මනාකොට නොපැවැත්ම පිහිටුවිය යුතු හෙයින් එය එසේ නිශ්චල කළ යුතු හෙයින් මෙහි එක්තැන් කිරීම් යන අර්ථයි. එහෙයින් මෙම විහරණය අවික්ඛෙපාර්ථයෙන් සමාධි යැයි යූ.සේයි. එහෙයින් මෙයට සමවත් අර්ථයද කියන ලදැයි දතයුතුය. මෙම නිරෝධ සමාපත්තිය සඳහා පටිසම්භිදා මාර්ගයෙහි, ද්වි බලයන්ගෙන් යුතු, ත්‍රිවිධ සංස්කාරයන්ගේ සංසඳීමෙහි, සොළොස් ඥාන චර්යාවන්ගෙන් ද, නව සමාධි චර්යාවන්ගෙන් ද, වසීභාවයෙන් වන සංඥා නිරෝධ සමාපත්තියෙහි ඥානය කෙසේදැයි විචාරා, ද්වි බලකිනැයිද, සමථබල, විදර්ශනා බල යන එම ද්විබලයන්ගේ විස්තරය විශුද්ධි මාර්ගයෙහි නිරෝධ සමාපත්ති කථාවෙහි වර්ණනා කරන ලද්දේමය. කවර හෙයින් මෙම තෙරහු ඵලසමවතට සමනොවැද, නිරෝධ සමවතට සමවැදිනිද? සත්ත්වයින් කෙරෙහි අනුකම්පාවෙනි. මෙම මහ තෙරහු සියලුම සමාපත්තීන් පරිභෝග කරයි. සත්වානුග්‍රහයෙන් නිතර නිරෝධයට සමවදියි. එයට සමවැද නැගිටියහුට කරන ලද ස්වල්ප වූද සත්කාරය, විශේෂයෙන් මහත්ඵල මහානිසංස වේ.

වුටඨාසි යනු අර්හත්ඵල සිතෙහි පැවැත්මෙන් නැගිටියේය. නිරෝධයට සමවන් රහත් තෙමේ අර්හත් ඵලය ද අනාගාමී තෙමේ අනාගාමී ඵලයට, ඉපදවීමෙන් නැගිටියේ නම් වේ. **තෙන ඛොපන සමයෙන සකෙකා දෙවානමින්දො ආයස්මතො මහා කස්සපස්ස පිණ්ඩපාතං** දාතුකාමෙන යනු කෙසේ ඔහුට දෙනු කැමැත්ත හටගතිද යත්, යම් ඒ පන්සියයක් පමණ දේවතාවෝයි කියන ලද ඈලා සක්දෙව් රජහුගේ පරෙවි පා වැනි පා ඇති සේවිකාවන් අමතා මෙසේ කීය. මහා කාශ්‍යප ආර්යයන් වහන්සේ පෙරවරුවේ පිඬු පිණිස රජගහ නුවරට පිවිසේ.

යව් තෙරුන්ට දන් දෙව් යයි සක්දෙව් රජ විසින් පිටත්කර හරින ලද්දේ, එළඹ දිව්‍ය ආහාර පූජාකරනු කැමැතිව සිටියානු තෙරුන් විසින් ප්‍රතික්ෂේප කරන ලදුයේ දෙව්ලොවටම ගියහ.

දැන් පළමු ප්‍රතික්ෂේය සිතා කවර කලෙක හෝ ගන්නේ යයි සම්වතින් නැගිටි තෙරුන්ට දෙනු කැමැතියේ ශක්‍රයාට නොදන්වා තෙමේම අවුත් දිව බොදුන් එළවන්නියෝ, පළමු ක්‍රමයෙන්ම තෙරුන් විසින් ප්‍රතික්ෂිප්ත වූයේ දෙව්ලොව ගියෝය. ශක්‍රයා විසින් කොහි ගියහුදැයි පිළිවිසියේ එකරුණ සැළකොට, නුඹලා විසින් තෙරුන්ට පිණ්ඩපාතය දෙන ලදැයි ශක්‍රයා විසින් විවාල කල්හි බාරගන්ට අකමැති වියයිද, කුමක් කියන ලද්දෙහිද, දේවයිනි දුගියන්ට සංග්‍රහ කරන්නෙමියි වදාළේය. නුඹලා කවරාකාරයකින් ගියාහුද? දේවයිනි, මේ අයුරින්මය. ශක්‍ර තෙමේ නුඹලා වැනියවුන් තෙරුන්ට පිණ්ඩපාතය කුමක් සඳහා දෙන්නාහුදැයි තෙමේ දෙනු කැමැත්තේ, ජරාවෙන් දිරූ කැඩුණු දත් ඇති ඉදුනු කෙස් ඇති, මහලු රෙදි වියන්නෙකු වී සුජා නම් අසුර දියණියද බඳු වූම මැහැලියක් කොට එක් පෙහෙකම් වීදියක් මවා, නූල් දිගහරිමින් සිටියේය. සුජාතාවෝ තසරය පුරවයි. එහෙයින් තෙන බොපන සමයෙන සකෙකා දෙවානමින්දෝ -පෙ- තසරං පූරෙති යි යූ.සේයි. එහි නනතං විනානි යනු දිගු කළ හුය කටින්නාක් මෙන්, තසරං පූරෙති යනු යනු හරස් දණ්ඩ වඩන්නාක් මෙන්. යෙන සකකසස දෙවානමින්දසස නිවෙසනං තෙනුපසංකමි යනු තෙරුන් වහන්සේ හැඳ පෙරෙවූ පා සිවුරු ගෙන දුගී ජනයාට සංග්‍රහ කරන්නෙමියි නගරාභිමුඛවූ වැඩම කරනුයේ නගරයෙන් පිටත ශක්‍රයා විසින් මවන ලද පේෂකාර වීථියට බැස බලනුයේ, දිරා හැලුණු, ගැලවී එල්ලෙන දිරාගිය සාලාවක් දුටු සේක. එහිද එම අඹුසැමියන් කියන ලද ආකාර ඇති නූල් කැටීමේ ක්‍රියාව කරනවුන් දැක, මොවුහු මහලු කල්හිද කර්මාන්ත කරති. මෙම නගරයෙහි මොවුන්ට වඩා අන්ත දුප්පතුන් නැතැයි හඟිමි. මොවුන් විසින් දෙන ලද, පලාකොළ මාත්‍රයක් වුව ගෙන මොවුන්ට සංග්‍රහ කරන්නෙමියි සිතීය. තෙරහු ඔවුන්ගේ ගෘහාභිමුඛව වැඩම කළ සේක. ශක්‍රතෙම එසේ එන්නහු දැක, සොඳුර මාගේ ආර්යයන් වහන්සේ මෙතැනින් එයි. නුඹ ඔහු නොදක්නාක් මෙන් නිශ්ශබ්ද වී හිඳුව. දුටු කෙණෙහිම පිණ්ඩපාතය දෙන්නෙමුයි සුජාට කීය. තෙරුන් වැඩමකොට ගෙයි දොරකඩ සිටියේය. ඔව්හුද නොදක්නාහු මෙන් තම කටයුත්තම කරන්නාහු ටික වේලාවක් ගත කළහ. ඉක්බිති ශක්‍ර තෙමේ ගෙයි දොරකඩ සිටියේ එක් තෙර කෙනෙකු

මෙන් අයෙකි. පළමුව කවරහුදැයි සලකා බලවයි කීය. ස්වාමීනි, ඔබ ගොස් සලකා බලනු මැනවැයි කීවාය. හෙතෙම ගෙයින් නික්ම, තෙරුන් පසඟ පිහිටුවා වැඳ, දෙඅත්වලින්, දණහිස්හි එල්ලී කෙඳිරිගාමින් නැගිට ආර්යයන් වහන්සේ කවර තෙරහු කෙනෙක් දෝහෝයි මඳක් පසුබැස, මාගේ ඇස් දුම් දමන්නා සේ වැටහේයයි කියා නළලෙහි අත තබා උඩ බලා, අහෝ දුකකි. අපගේ ආර්ය මහා කාශ්‍යප තෙරහු බොහෝ කලෙකින් මාගේ කුටි දොරට පැමිණියේය. ගෙයි කිසිවක් ඇත්දැයි විචාලේය. සුජාතාව මඳක් ආකුල වූවාක් මෙන් අඟවා ස්වාමීනි ඇතැයි පිළිවදන් දිනි. ශක්‍රතෙමේ ස්වාමීනි රූක්ෂ හෝ ප්‍රණීතයැයි වෙනසක් නොසිතා අපට සංග්‍රහ කරන මැනවැයි පාත්‍රය ගත්තේය. තෙරුන්වහන්සේ පාත්‍රය දෙනුයේ, ජරාජීර්ණ වූ මෙම දුගී ජනයාටම මා විසින් සංග්‍රහ කළයුතුයයි සිතූ සේක. හෙතෙම ඇතුලට පිවිස, මුට්ටි බත නම් වූ බත් මුට්ටියෙන් බත් ගෙන පාත්‍රය පුරවා තෙරුන්ගේ අතෙහි තැබීය. එහෙයින් අදදසා බො සක්කො දෙවානමින්දො -පෙ- අදාසි යූ.සේයි. එහි සට්යා යනු බත් මුට්ටියෙන්, මුට්ටි බතයැයි ද පාඨයි.

මුට්ටි බත නම් දෙවියන්ගේ කිසියම් ආහාර විශේෂයකැයි එයට අර්ථ කියති. උදධරිත්වා යනු කිසියම් බඳුනෙකින් උදුරා, නොයෙක් ව්‍යඤ්ජන සහිත එම ආහාරයම පාත්‍රයෙහි බහා, තෙරුන්ගේ හස්තයෙහි තබන කලැ, දිළින්දන්ට ලැබෙන රූක්ෂාගාරයක් මෙන් පෙනුනහ. තැබූ කෙණෙහි වනාහි තමාගේ දිව්‍ය ස්වභාවයෙන්ම වීය. අනෙක සූපො යනු මුං මෑ ඇට ආදී ව්‍යංජනයන්ගෙන්ද, කැවිලි වර්ගයන්ගෙන්ද යුත් නොයෙක් ආකාර ව්‍යඤ්ජන, අනෙකබ්‍යඤ්ජනො යනු නොයෙක් ආකාර සම්බල්, සලාද, බැදුම් ආදිය. අනෙක සූපරස බ්‍යඤ්ජනො යනු නොයෙක් මුං මෑ ඇට වැනි ව්‍යඤ්ජනයන්ගෙන්ද, සම්බල්, සලාද ආදියෙන්ද, (වැල්මී ආදී) මිහිරි මුල් රසයන්ගෙන්ද මිශ්‍ර රසයන්ගෙන්ද උසස් ව්‍යඤ්ජනය නොයෙක් අග්‍රරස මැල්ලුම් හා ව්‍යඤ්ජනයන්ගෙන් යන අර්ථයි. එම පිණ්ඩපාතය තෙරුන්ගේ අත්තල තැබූ කල්හි මුළු රජගහ නුවර එම ආහාරයෙහි පැවති දිව්‍ය සුවඳින් පැතිර ගියේය. ඉක්බිති තෙරහු, මේ මිනිසා අල්පේශාක්‍ය අයෙකි. පිණ්ඩපාත භෝජනය ඉතාමත් ප්‍රණීතය. එය සක්දෙව් රජුගේ බොදුනක් වැන්න. මෙතෙම කවරෙක්දෝහෝයි සිතීය. ඉක්බිති ඔහු සක්දෙව් රදයයි දැන, කෝසිය ඔබ දුප්පතුන්ගේ සම්පත් පැහැර ගැනීමෙන් බැරෑරුම් ක්‍රියාවක් කරන ලදී. අද මට දනක් දී කිසියම් දුගියෙක් සිටු තනතුරක් ලබන්නේ යයි වදාළේය. ස්වාමීනි, මට වඩා අතිශය පරිපීඩිත

දුගියෙක් කවරෙක්ද? දිව්‍ය රාජ්‍යශ්‍රී අනුභව කරන නුඹ කෙසේ දුගියෙක් වන්නෙහිද? ස්වාමීනි, එය එසේනම් මා විසින් අබුද්ධෝත්පාද කාලයෙහි යහපත් ක්‍රියා කරන ලද්දේ වෙමි. බුද්ධෝත්පාදය පවත්නා කල්හි පුණ්‍යක්‍රියා කොට, චූලරථ, මහාරථ, අනෙකවර්ණ යන මේ තෙදෙව් පිත් මාගේ සම්පස්ථායීවූ උපන්නානු අතිශය තෙදවත්හ. මම ඒ දෙව් පිත්හු නැකැත් කෙළින්නෙමුයි සේවකයන් ගෙන ඇතුල් වීථියට බට කල්හි පැනගොස් ගෙට පිවිසෙන්නෙමි. ඔවුන්ගේ සිරුරින් නික්මෙන තෙද මාගේ සිරුර මැඩගෙන පැතිරී යයි. මාගේ සිරුරෙහි තෙද, ඔවුන්ගේ සිරුරු මැඩගෙන නොපැතිරේ. ස්වාමීනි, මට වඩා අතිශය දුගියෙක් කවරේද? එවැනි තත්ත්වයක් පැවතියේ වී නමුත් මෙතැන් පටන්, මෙබඳු වංචනික ක්‍රියා මාර්ග තුලින් මට දන් නොදෙවව. වංචනික ක්‍රියා මාර්ග තුලින් දන් දුන් කල්හි මට කුසලයක් තිබේද, නොතිබේද? ඇවැත්නි තිබේ. ස්වාමීනි, එවැනි තත්ත්වයක් තුල කුසල් කිරීම නම් මට භාරයැයි කියා තෙරුන් වැඳ සුජාව රැගෙන තෙරුන් ප්‍රදක්ෂිණා කොට අහසට පැන නැග විස්මයෙකි. කසුප් තෙරුන් කෙරෙහි සුපිහිටි දනෙකි. උතුම් දනෙකියි තෙවරක් උදන් ඇනීය. එහෙයින් **අථඛො ආයසම්මතො මහා කස්සපස්ස එතදහොසි** ආදිය යූ.සේයි.

එහි **කොසියා** යනු සක්දෙවිඳු ගොත්‍රයෙන් ආමන්ත්‍රණය කරයි. **පුඤ්ඤඤන අත්ථො** යනු පිනෙන් ප්‍රයෝජන තිබෙයයි වදන් ශේෂයයි. **වෙහාසං අබ්භුගගනට්ඨා** යනු පෘථිවියෙන් අහසට මනාව නැග ආකාසෙ **අනන්තලිකඛ** යනු අහසම සමානාර්ථ ශබ්දයෙන් අනන්තලිකඛයැයි කියති. නොහොත් අනන්තලිකඛ සංඛ්‍යාත අහසෙහි කසිණය උගුලුවාලූ අහසෙහි නොවේයයි වෙන්කොට කියයි. **අහො දානං** යන මෙහි අහො යනු ආශ්චර්යයාර්ථයෙහි නිපාතයි. සක්දෙවිඳු නිරෝධ සමවතින් නැගී සිටි මහා කාශ්‍යප ආර්යයන් වහන්සේට, සකස්කොට සියතින් ගෞරව කොට ඉවත නොදමා සුදුසු කල්හි අනුන් නොගටා සම්‍යග් දෘෂ්ටිය පෙරටුකොට, එබඳු අයුරින් මෙම මහා දිව්‍ය භෝජන දානය දිනි. එහෙයින් ක්ෂේත්‍ර **සම්පත්තිය** දිය යුතු දැහි සම්පත්තිය චිත්ත සම්පත්තිය යන මේ ත්‍රිවිධාකාර **සම්පත්ති** (සඵලතා)වන්ගෙන් යුක්ත හෙයින් මාගේ දානය ඒකාන්තයෙන් සියලු කරුණුවලින් සම්පූර්ණව පවත්වන ලදැයි ආශ්චර්ය, අද්භූත සිත් හටගත්තේ, එකල්හි තමාගේ හෘදයාභ්‍යන්තරගත වූ ප්‍රීතිය හා සොම්නස වඟුරුවනුයේ ආශ්චර්ය දානයකැයි කියා, එම දානයෙහි කියන ලද

ක්‍රමය අනුව උතුම් දානභාවයද, ක්ෂේත්‍ර සම්පත්තියට පත් බවද ප්‍රකාශ කරනුයේ **පරමදානං කස්සපෙ සුපපතිට්ඨිතං** යයි උදන් ඇනීය.

භාග්‍යවතුන් වහන්සේ විහාරයෙහි සිටියේම මෙසේ උදන් අනන්නා වූ සක්දෙවිඳුන්ගේ ශබ්දය දිවකණින් අසා, මහණෙනි, සක්දෙවිඳු උදන් අනා අහසින් යන්නහු බලව් යයි භික්ෂූන්ට වදාරා, ඔවුන් විසින් ස්වාමීනි, ඔහු විසින් කුමක් කරන ලදදැයි විචාරන ලදුයේ, මාගේ පුත්‍ර කාශ්‍යපට වංචාකොට දනක් දිනි. එයින් තුටු සිතැතිව උදන් ඇනීයයි වදාළේය. එහෙයින් **අස්සොසි බො භගවා දිබ්බාය සොතධාතුයා** ආදිය යූ.සේයි. එහි දිබ්බාය සොත ධාතුයා යනු දිව්‍ය සමාන හෙයින් දිබ්බයි. දෙවියන්ට වනාහි සූසිරි කමින් නිපන් හෙයින්, පිත්, සෙම්, රුහිරාදියෙන් බාධා රහිත මෙන්ම කිලුටෙන් මිදුන හෙයින්, දුර පෙදෙස්හි පවත්නා වූද අරමුණු ගන්ට සමත් දිව්‍ය ප්‍රසාද ශ්‍රොතධාතුව වේ. භාග්‍යවතුන් වහන්සේගේ මෙම දිව්‍ය ශ්‍රෝත ධාතුවද වීර්ය භාවනා බලයෙන් නිපන් හෙයින් ඥානමය ශ්‍රොත්‍ර ධාතුව එවැනිම යයි දිව්‍ය සමාන හෙයින් දිබ්බයි. තවද දිව්‍ය විහරණ වශයෙන් ලද හෙයින් තමාද දිව්‍ය විහරණ සන්නිශ්‍රිත හෙයින්ද දිබ්බයි. ශ්‍රවණාර්ථයෙන් ස්වභාව දැරීම් අර්ථයෙන්ද ශ්‍රොත්‍ර ධාතුයි. ශ්‍රොත්‍ර ධාතුවගේ කෘත්‍යය කිරීමෙන් ශ්‍රොත්‍ර ධාතු මෙනැවි ශ්‍රොත්‍රධාතුයි. එම දිව්‍ය ශ්‍රොත්‍ර ධාතුයෙන්, **විසුද්ධාය** යනු පිරිසිදු කිලිටි රහිත අතික්කන්ත මානුසකාය යනු මිනිස් සීමාව ඉක්මවා, ශබ්ද ශ්‍රවණයෙහිලා මානුසික මාංශ ශ්‍රොත්‍ර ධාතුව ඉක්මවා සිටි, **එතමත්ථං විදිත්වා** යනු මනා ප්‍රතිපත්තියෙන් ගුණ විශේෂයන්හි පිහිටි උසස් පුරිෂයන් දෙවිවරුද, මිනිස්සුද ඇල්ම හටගත්තාහු අතිශයින් ප්‍රිය කෙරෙත් යයි මෙම කරුණ දැන, එම කරුණ දැක්වීමට මෙම උදන් ඇනූ සේක.

එහි පිණ්ඩපාතිකංග සංඛ්‍යාත ධුතංගය සමාදන්ව එහි, සම්පූර්ණ කිරීමෙන් **පිණ්ඩපාතිකස්ස** යනු වේ. මෙම ගාථාව ආයුෂ්මත් මහ කසුප් තෙරුන් නිමිත්තකොට වදාරණ ලද්දේ නොවේද? තෙරුන් වහන්සේද සියලු ධුතවාදයන්ගේ අග්‍ර තෙළෙස් ධුතාංගධාරියෙකි. හෙතෙම කවර හෙයින් එකම ධුතංගයකින් ගුණ වර්ණන ලද්දේ වේද, අර්ථෝත්පත්ති වශයෙන් මෙම නිර්දේශයයි. නොහොත් එය දේශනා මාත්‍රයකි. මෙම දේශනා ශීර්ෂයෙන් මොහුගේ සියලු ධුතංග යූ.සේයි. නොහොත් 'යථාපි භමරෝ පුපඵං යනාදී ගාථාවෙන් යූ.සෙයින් අතිශය අල්පේච්ඡතා බැවින්ද, කුල කරුණාව බැවින්ද ඔහුගේ සියලු පිණ්ඩපාතික වත කඩනොකොට

එහි අතිශයින් පැවැති ප්‍රතිපත්තියගේ ප්‍රකාශ කිරීම සඳහා **පිණ්ඩපාතිකසසයි** යූ.සේයි. පිණ්ඩපාතිකයාට ප්‍රිය කරත් යන පදය අපේක්ෂාකොට සම්ප්‍රදාන වචනයි. එය ද්විතියාර්ථයෙහි දතයුතුය. **අතතහරස්ස** යනු අල්ප වූයේ ද, සුලභ වූයේ ද, නිරවද්‍ය වූයේදැයි මෙසේ කියන ලද, අල්ප-නිරවද්‍ය-සුලභ ස්වභාව ඇති සිව්පසයන්ගෙන් තමා පුස්නහුට, **අනඤ්ඤපොසිනො** යනු ආමිෂ සංග්‍රහයෙන් අන්‍ය ශිෂ්‍යාදීන් පුස්නට, අනුත්සාහී බැවින් අනුන් නොපුස්නා, පද ද්වයයෙන්ම ශරීරාඤ්ඤක සිවුරෙන්ද, කුස ආරක්ෂා කරන පිණ්ඩපාතයෙන්ද හැසිරෙන හෙයින්, සැහැල්ලු පැවතුම් පහසු පෝෂණය - උතුම් අල්පේච්ඡ සන්තුෂ්ටිතා පෙන්වයි. නොහොත් **අතත හරස්ස** යනු ඒකවචන භාවිතයේ කැමැත්තෙන් යුක්ත වූයේ, ආත්මභාව සංඛ්‍යාත හුදෙකලා වූව මේ ආත්මය පෝෂණය කරයි. මින් මත්තෙහි අනෙකක් නැතැයි අතතහර නමැ. එහෙයින්ම තමා විසින් අන්‍ය පෝෂණය කළයුතු අයෙකුගේ අභාව හෙයින් අනඤ්ඤපොසියි. අන්‍යයා නොපුස්නා එම ආත්ම පුස්නහුට, පද ද්වයයෙන්ම ක්ෂීණාශ්‍රව භාවයෙන් මත්තෙහි නොගැනීම් අර්ථය දක්වයි. දෙවාපිහ -පෙ- සන්තිමතො යනු එම අග්‍ර ඵලාධිගමයෙන් සියලු කෙලෙස්දාහ දැඩි දාහයන්ගේ සංසිඳීමෙන්, යටපත් වීමෙන් සන්සුන් සිහියෙහි මහත් බවට පැමිණීමෙන්, නිතිකල්, සිහියෙන් යුක්තව ක්‍රියා කරනුයේ එම සිහි ඇති භාවයෙන්, එයින්ම ප්‍රිය හා අප්‍රිය අරමුණුවල මධ්‍යස්ථ ලක්ෂණාප්‍රාප්ත ක්ෂීණාශ්‍රවයන් වහන්සේට ශක්‍රාදි දෙවිවරු ප්‍රිය කරති. ප්‍රාර්ථනා කෙරෙති. ඔහුගේ සීලාදී ගුණ විශේෂයන්හි ගරුබුහුමන් උපදවන්නාහු ආදර උපදවති. මිනිසුන් ගැන කියනුම කවරේද?

සත්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

3-8

අටවැන්නෙහි **පඡාභතතං** යනු උදෑසනම අනුභව කළ, **ඒකාසනිකංග** - බලු පඡාභත්තිකයින්ට මධ්‍යාහ්නය තුළද පසු බතමැයි. මෙහි වනාහි සාමාන්‍ය ආහාර අනුභවයෙන් පසු, පසුබතයැයි දතයුතුය. **පිණ්ඩපාත පටිකකනනානං** යනු පිණ්ඩපාතයෙන් පෙරළා පැමිණි පිණ්ඩපාතය සොයා බත් කිස නිමවීම් වශයෙන් ඉන් නැවතුනවුන්ගේ, **කරෙරි මණ්ඩල මාලෙ** යන මෙහි කරෙරි යනු ලුණුවරණ වෘක්ෂයට

නමකි. එය ගඳකිළි මණ්ඩපයත් ශාලාවත් අතරත වේ. එහෙයින් ගඳකිළියද කරෙරියි. කුඩා කුටිය යැයි කියයි. මණ්ඩපයද, ශාලාවද කරෙරි මණ්ඩල මාලයැයි කියයි. එහෙයින් ලුණුවරණ වෘක්ෂයට නුදුරෙහි කළ හිඳින ශාලා සංඛ්‍යාත මණ්ඩලමාලයෙහි, තෘණ හා කොළවලින් වසන ලද නොතෙමන ස්ථානය මණ්ඩල මාලයැයි කියති. කෝඹු ආදියෙන් කළ ලතා මණ්ඩපයද මණ්ඩල මාලයැයි අනෙකෙක් කියති. **කාලෙන කාලං** යනු කලින් කලැ - අතරින් පතර, ඒ ඒ කාලයෙහියැයි අර්ථයි. **මනාපිකෙ** යනු මන වඩන, ප්‍රිය රූපයන්හි, ප්‍රිය වූ මනෝඥ රූපයෙහි යන අර්ථයි. ප්‍රිය අප්‍රියභාවය පුද්ගල වශයෙන්ද, ද්වාර වශයෙන්ද ගතයුතුය. ඇතැමෙකුට මනෝඥ කැමැති දෑ, ඇතැමෙකුට අමනෝඥ වේ. ඇතැමෙකුට අමනෝඥ අකැමැති දෑ ඇතැමෙකුට මනෝඥ වේ. එසේම එක් ද්වාරයකට (ඉන්ද්‍රියයකට) මනෝඥ දෑ අනෙක් ඉන්ද්‍රියයට අමනෝඥ වේ. මෙහි විපාක වශයෙන් ද විනිශ්චය දතයුතුය. කුසල විපාකය ඒකාන්තයෙන් මනොඥය. අකුසල විපාකය අනිෂ්ඨමය. **චක්ඛුනා රූපෙ පසඤ්ඤං** යනු ගමට පිඬු පිණිස පිවිසියේ උපාසකයින් විසින් ගෙට ප්‍රවේශ කරවා, පූජා සත්කාර කිරීම සඳහා එළවන ලද, ආසන වියන් ආදීන්හි, නොයෙක් ආකාර සිත් අලවන විම්වලින් බබලන වර්ණ සංඛ්‍යාත ඇල්ම කළයුතු, අන්‍ය වූද, සවිඤ්ඤාණක රූපයන් කෙරෙහි ද, චක්ෂුර්ද්වාරික විඤ්ඤාණයන්ගෙන් දක්නට, **සද්දෙ** යනු එසේම ධනවත් ජනයන්ගේ ගෙට පිවිසියේ ඔවුන් විසින් යොදන ලද ගීත හා වාදනය කළ ශබ්දයන් ශ්‍රවණය කිරීමට, **ගන්ධෙ** යනු එසේම ඔවුන් විසින් පූජා සත්කාර වශයෙන් එළවන ලද, පුෂ්ප ධූම් ආදී සුවඳ ආඝ්‍රාණය කරන්ට, **රසෙ** යනු ඔවුන් විසින් දෙන ලද ආහාර පරිභෝග කිරීමෙන් නොයෙක් ආකාර අග්‍රරසයන් රසවිඳින්ට, **පොඨඵබ්බෙ** යනු මහානර්ඝ පසතුරුණු සහිත ආසනයන්හි හිඳිනා කල්හි ස්පර්ශයන් ස්පර්ශ කරන්ට, මෙසේ පංචද්වාරික ඉෂ්ටාරම්මණ ප්‍රතිලාභයන් වර්ණනාකොට, දැන් මනෝද්වාරික ඉෂ්ටාරම්මණ ප්‍රතිලාභය දක්වන්ට **සකකතො** යනාදිය යූ.සේයි. එය යට යූ.සේමය. කිමෙක්ද, පිණ්ඩපාතයේ නොයෙදෙනවුන්ට මෙම ක්‍රමය නොලැබේද? ලැබේ. ඔවුන්ටද, ආරාධනා කොට දෙනු ලබන දන්නා සලාක බත් ආදී කාර්යයක් සඳහා ගමට ගියකල්හි, මහත් සම්පත්තියෙන් යුතු උපාසකාදීහු එසේ සත්කාර සම්මාන කෙරෙත්මය. එය වනාහි අනියතය. පිණ්ඩපාතිකයන්ට වනාහි එකල්හි නිත්‍යයමය. එහි පූජා සත්කාර කරනු ලබන්නහු දැක, සත්කාර ගරුත්වයෙන්, සසරින් නිදහස් වීමේ මාර්ගයෙන් බැහැරව සිට නුනුවණින් මෙනෙහි කිරීම් වශයෙන් එම භික්ෂූහු මෙසේ කීහ. 'හන්දාවුසො

මයං පිණ්ඩපාතික හොම ආදිය එහි **හන්ද** යනු අත්හැරීම් අර්ථයෙහි නිපාතයි. **ලච්ඡාම** යනු ලබන්නෙමු. **තෙනුපසංකමි** යනු සුවදැනි ගඳකිළියෙහි වැඩහුන් සේක්, ඔවුන්ගේ එම එකට එකතු වී කථා කිරීම අසා, මෙම භික්ෂූහු මා වැනි වූ බුදු කෙනෙකුන්ගේ සස්නෙහි පැවිදිව මා සමඟ එක විහාරයෙහි වාසය කරන්නාහුද මෙසේ නුනුවණින් මෙනෙහි කිරීම් වශයෙන් කථා පවත්වති. කෙලෙස් තුනී කිරීමෙහි ක්‍රියාවල නොපවතිත්. එබැවින් ඔව්හු එයින් බැහැර කරවා කෙලෙස් තුනී කිරීමෙහි විහරණයන්හි යොදවන්නෙමියි රවුම් ශාලාවට එළැඹියේය. සෙස්ස යට කියන ලද ක්‍රමයමය. **එතමත්ථං විදිත්වා** යනු අල්පේච්ඡතා, සන්තුෂ්ටිතා, සල්ලෙඛතා වශයෙන් කෙලෙස් කම්පා කරන්ට, තෘෂ්ණාව වියලවන්ට පිළිපන්නේ යයි පිණ්ඩපාතිකයාට දෙවියෝද ප්‍රිය කරත්. ඔහුගේ ප්‍රතිපත්තියෙහිලා ඇල්ම හටගත්තාහු ප්‍රිය කෙරෙත්. මෙයින් අත් ක්‍රමයක් නැතැයි මෙම **කරුණ** දැන එම අරුත දැක්වීමට මෙම උදන් ඇනූ සේක.

එහි **නො චෙ සද්දසිලොක නිසසිතො** යනු විශ්මයකි. ආර්යයන් වහන්සේ අල්පේච්ඡය. ලද දෙයින් සතුටු වන්නෙකි. උතුම් කෙලෙස් තුනී කිරීම් කාර්යයෙහි නියුක්තව සිටී යයි අනෘයන් විසින් කීර්ති ඝෝෂා ශබ්ද සංඛ්‍යාත ශ්ලෝක තෘෂ්ණා නිශ්‍රිත නොවේයයි අර්ථයි. **සද්දො** යනු හමුයෙහි ගුණ කියන ස්තුති ඝෝෂාව. **සිලොකො** යනු තමා ඉදිරියෙහි නැති තැන ප්‍රශංසාව, පැතිරුණ කීර්තිය. සෙස්ස අතරත සූත්‍රයෙහි යූ.සේයි.

අටවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

3-9

නවවැන්නෙහි **කොනුඛො ආවුසො සිප්පං ජානාති** යනු ඇවැත්නි, අප මෙහි රැස්වූ කල්හි ජීවත්වීම නිමිතිකොට උගතයුතු හෙයින් ශිල්පයැයි ලද නම් ඇති යම්කිසි ජීවන මාර්ගයක් කවරෙක් දනීද? **කො කිං සිප්පං සික්ඛි** යනු කවරෙක් දීර්ඝ කාලයක් ශිල්ප ආචාර්ය කුලයක් ආශ්‍රයකොට, දැනීම ලැබීම් වශයෙන්ද, ප්‍රයෝග වශයෙන්ද, අශ්ව හස්ති ශිල්පයක් උගත්තේද, **කතර සිප්පං සිප්පානං අගඟං** යනු සියලු ශිල්පයන් අතර ගෘහත්වතාවය සඳහාද මහත්ඵල සඳහා ද, නිදුකින් සිදුවීම සඳහාද කවර ශිල්පයෙක් උතුම්ද? යමක් ඇසිරිකොට සුවසේ ජීවත්විය හැකියයි අදහසයි.

තත්‍රෙකච්චෙ යනු එම භික්ෂූන් අතර ඇතැම් භික්ෂූහු හස්ති ශිල්ප ගුරු කුලයෙන් පැවිදි වූවාහු වෙත්ද? **තෙ එව මාහංසු ඔව්හු මෙසේ කීහ. ඕන්** මත්තෙහිද එකච්චෙ යයි සඳහන් තන්හි එම ක්‍රමයමය. **හත්ථි සිප්පං** යනු හස්තීන්ගේ පරීක්ෂා කිරීම, දමනය-හැසිරවීම, රෝග ප්‍රතිකාරාදි ප්‍රභේද ඇති කටයුතු කළයුතුය. ඒ උදෙසා පැවැති සියලුම ශිල්ප මෙහි හස්ති ශිල්පය යැයි අදහස් කරන ලදී. **අස්සසිප්පං** යන මෙහිද එම ක්‍රමයමැයි. **රථසිප්පං** රථ ශිල්පය වනාහි ගොනුන් විසින් ඇදගෙන යනු ලබන රථයන්හි දමනය හැසිරවීම අණකිරීම් ආදී වශයෙන්ද, රථ නිමැවුම් වශයෙන්ද දතයුතුය. **ධනු සිප්පං** යනු දුන් ශිල්පය. එය ධනුර්වේදයයි කියයි. **ථරුසිප්පං**, සෙසු ආයුධ ශිල්ප. **මුද්දාසිප්පං** යනු හස්තමුද්‍රා ශිල්පයයි. **ගණනසිප්පං** හිඩැස් නොමැති ගණන් කිරීමේ ශිල්පය, **සංඛානසිප්පං** යනු එකතුකිරීම් අඩුකිරීම් වශයෙන් පිඩු වශයෙන් ගණන් කිරීමේ ශිල්පයයි.

එය යමෙකුට ප්‍රගුණ වේද, ඔහු වෘක්ෂයක් දැක මෙම වෘක්ෂයෙහි මෙපමණ කොල සංඛ්‍යාවක් ඇතැයි කියන්ට දනියි. **ලෙඛා සිප්පං** යනු නොයෙක් ආකාරයන්ගෙන් අකුරු ලිවීමේ ශිල්පයයි. නුවණ හෝ වේ. **කාවෙය්‍ය සිප්පං** යනු තම සිතිම් වශයෙන් හෝ අන්‍යයාගෙන් ලද ශ්‍රවණය වශයෙන් හෝ මෙහි මේ අර්ථයයි. මෙසේ යොදන්නෙමියි මෙසේ අර්ථ වශයෙන් හෝ කිසියම් කළයුත්තක් දැක එයට සමාන කළයුත්තක් කරන්නෙමියි ස්ථානෝත්පත්තික වැටහීම් වශයෙන් හෝ චින්තා, කවි ආදී සිව් කවින්ගේ කළයුතු කරුණු ශිල්පයයි. භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, මේ චින්තා කවි, සුතකවි, අත්ථකවි, පටිභාග කවියයි පණ්ඩිතයෝ සතරදෙනෙකියි යූ.සේයි. **ලොකායත සිප්පං** යනු ඇට සුදු බැවින් කපුටා සුදුය. කණකෙකිණි රතුය. ලේ රතුබැවිනි යන මේ ආදී ක්‍රමයෙන් පැවැති පරලෝ නිවන් ප්‍රතික්ෂේප කරන විතණ්ඩ ශිල්ප ශාස්ත්‍රයයි. **ඛත්ත විජ්ජා සිප්පං** යනු අංගෙය්‍ය, මාසුරකබාදී රාජ්‍ය පරිපාලන විද්‍යා නීති ශාස්ත්‍ර ශිල්පයයි. මේවා වනාහි දොළොස්මහා ශිල්ප නම් වේ. එහෙයින්ම ඒ ඒ තන්හි 'ශිල්පයන්ගේ අග්‍ර යයි කිය. **එතමත්ථං විදිත්වා** යනු එම සියලුම ශිල්පායතනයන්ගේ දැනුම ජීවත්වීම සඳහා බවත්, සසර වෘත දුකින් නොමිදිය හැකි බවත්, සීලාදීන්ගේම සුපරිශුද්ධතාවයෙන් සසර දුකින් නිදහස්විය හැකි බවත් ඉන් යුක්ත වූයේම භික්ෂුභාවය හැම අතින් අවබෝධ කොට අභිවෘද්ධිය සලසාගත යුතුයයි යන එම කරුණ පැහැදිලි කිරීමට මෙම උදන් ඇනූ සේක.

එහි **අසිප්පජීවී** යනු සිව් තෘෂ්ණා උපාදානයන්ගේ නැසීම්, යටපත් කිරීම් වශයෙන්, ප්‍රත්‍යය පිළිබඳ ආශාවගේ වියලවන ලද හෙයින් යම්කිසි ශිල්පයක් ආශ්‍රයකොට ජීවත්වීම නොකෙරේනුයි **අසිප්පජීවියි** එයින් ආජීව පාරිශුද්ධි ශීලය දක්වයි. **ලහු** යනු අල්ප කෘත්‍යතාවයෙන්ද, සැහැල්ලු පැවතුම් ඇති හෙයින් ද ලහුයි. බොහෝ බඩුබාහිරාදිය නොමැති බවයි. එයින් සිව් පසයෙන් සතුටුවීම ඉටුකරන පහසුවෙන් පෝෂණය කළහැකි බව පෙන්වයි. **අප්පකාමෝ** යනු දෙවියන් සහිත ලෝකයාගේ අභිවෘද්ධියම ආශා කෙරේ. කැමැති වේනුයි අප්පකාමොයි. ඉන් සත්ත්වයින්ගේ අවැඩ දුරුකිරීම ප්‍රකාශ කරන ලද හෙයින් ප්‍රාතිමෝක්ෂ සංවර සීලය දක්වයි. ප්‍රාණඝාතාදී අනර්ථ වැලැක්වීම මනාව දක්වන හෙයින්. **යතින්ද්‍රියෝ** යනු චක්ෂුරාදී ෂට් ඉන්ද්‍රියයන්ගේ අභිධ්‍යාදිය නොපැවැත්මෙන් සංයමයෙන් යුත් ඉන්ද්‍රිය ඇති. එයින් ඉන්ද්‍රිය සංවර සීලය යූ.සේයි. **සබ්බධි විප්පමුත්තෝ** යනු මෙසේ සුපිරිසිදු සීලයෙන් යුත් සිව්පසයෙහි සන්තෝෂයෙහි පිහිටියේ, ප්‍රත්‍යය සහිත නාමරූප විමසා බලා අනිත්‍යාදී වශයෙන් සංස්කාරයන් විමසා බලනුයේ විදර්ශනාවට නංවා ඉන් මත්තෙහි පිළිවෙළින් පැවැති සිව් ආර්ය මාර්ගයන්ගෙන් සංයෝජනයන්ගේ ප්‍රහීණතාවයට පත්හෙයින්, භවාදීන්හි හැමතැන මනාව මිදුනේය. **අනෙකසාරි අමමෝ නිරාසෝ** යනු එසේ හැමතැන මිදුනු හෙයින්ම ඕක යයි කියනු ලබන ෂට් ආයතනයන්හිද, තෘෂ්ණා හැසිරීමගේ අභාවයෙන් අනෙකසාරියි. රූපාදී කිසිතැනෙක්හි මමය මාගේය යන හැඟීම් අභාව හෙයින් අවමොය. සියල්ලෙන් සියල්ල බලාපොරොත්තු නොමැති හෙයින් නිරාසොයි. **නිච්චා මානං එකචරෝ සහිකඛු** යනු මේ ආකාර වූද හෙතෙම අර්හත් මාර්ග ප්‍රාප්ති සම කාලයෙහිම සේසරහිත මානය හැර, දුරුකොට මෙම භික්ෂූහු මෙන් ගණ සංගණිකාරාමතාවය නොකොට, විවේක කැමැත්තෙන් තෘෂ්ණා නමැති සහායකගේ විරහයෙන්ද, සියලු ඉරියව්හි හුදෙකලාව හැසිරෙනුයේ සියලු ආකාරයෙන් බුන් කෙලෙස් බැවින් පරමාර්ථ වශයෙන් භික්ෂු නමැ. මෙහිද 'අසිප්පජීවී' යනාදියෙන් ලෞකික ගුණ කියන ලදී. 'සබ්බධි විප්පමුත්තෝ' යනාදියෙන් ලෝකෝත්තර ගුණ කියන ලදී. එහි අසිප්පජීවී යන ආදි ධර්මය විභවයෙහි සිටියහුටමය. ශිල්පය නිසා මිථ්‍යා ආජීවයෙන් ජීවිකා කරන්නහුට නොවේ. එහෙයින් ශිල්පයන්හි සාර ග්‍රාහණය අත්හැර අධිසීලාදීන්හිම නුඹලා විසින් හික්මිය යුතුයයි දක්වයි.

නවවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

3-10

දසවැන්නෙහි **බුද්ධ චක්ඛුනා** යනු මෙහි ආසයානුසය ඤාණය හා ඉන්ද්‍රිය පරොපරියත්ත ඤාණය බුදු ඇස නමැයි දෙසූ පරිදි 'භාග්‍යවතුන් වහන්සේ බුදුඇසින් ලෝකය බලනුයේ අල්පරජස්ක, මහා රජස්ක, තීක්ෂණ ඉන්ද්‍රියයන් ඇති මෘදු ඉන්ද්‍රියයන් ඇති සත්ත්වයින් දුටු සේක යනාදියයි. **ලොකං** යනු අවකාශ ලෝකය, සංස්කාර ලෝකය, සත්ත්ව ලෝකය යැයි ලෝකත්‍රයයකි. එහි

යාවතා චන්දිම සුරියා පරිහරන්ති - දිසා භන්ති විරොචනා
තාව සහස්සධා ලොකො එත්ථ තෙ වත්තන්ති වසෙ

යම් පමණ පෙදෙසක් සඳ හිරු කැරකෙමින් ගමන් කරත්ද? බැබලීමෙන් දිසා කම්පිත වේද? මෙහි ඔබගේ වසඟය ලෝකය තුල දහස් ආකාරයකින් පවතී.

ආදීන්හි අවකාශලෝකය යූ.සේයි. එක් ලෝකයකි. සියලු සත්ත්වයෝ ආහාරයෙන් පවතින්නාහ. ලෝක ද්වයයකි. නාමය හා රූපයයි. ලෝකත්‍රයයකි. ත්‍රිවිධ වේදනාවෝ සිව්ලෝකයකි. සිව් ආහාර පංච ලෝකයකි. පංච උපාදාන ස්කන්ධ - ෂට් ලෝකයකි. ෂට් ආධ්‍යාත්මික ආයතන සප්ත ලෝකයකි සප්ත විඤ්ඤාණාස්ථිති. අෂ්ඨ ලෝකයකි. අටලෝදම් නව ලෝකයකි. නව සත්තාවාස දස ලෝකයකි. දස ආයතන දස ලෝකයකි. දොළොස් ආයතන දොලොස් ලෝකයකි. අටලොස් ධාතුහුය යනාදීන්හි සංස්කාර ලෝකයයි. 'සසසතො ලොකො අසසසතො ලොකො යනාදීන්හි සත්ත්වලෝකය යූ.සේයි. මෙහි සත්ත්වලෝකය දතයුතුය. එහි ලෝකයට අයත් වූයේනුයි විසිතුරු ආකාරයෙන් දිස්වේනුයි චක්‍රවාට සංඛ්‍යාත ලෝකය ඔකාස ලෝකයි. සංස්කාර විනාශ වේ. පලුදු වේනුයි ලෝකයි. මෙහි පින් පව් හා එහි විපාක ලෝකයට අයත් වේනුයි සත්ත්ව ලෝකයයි. ඒවා අතර, භාග්‍යවතුන් වහන්සේ මහා කරුණාවෙන් අනුකම්පා කරනුයේ, සසර දුකින් මුදවනු කැමැත්තේ සත්ත්වලෝකය බැලූ සේක. කවර සත්දිනක් ඇවෑමෙන් බැලූ සේක්ද? පළමු සත්දිනයාගේය. භාග්‍යවතුන් වහන්සේ වනාහි පළමු සප්තාහයේ කෙළවර පසුයම අවසානයෙහි,

යදාහවෙ පාතු භවනති ධම්මා - ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
විධූපයං තිට්ඨති මාරසෙනං - සූරියොව ඔභාසය මන්තලික්ඛ

යම්කලෙක්හි කෙලෙස් තවන වීර්ය ඇති ධ්‍යාන වඩන බ්‍රාහ්මණයාට, චතුරාර්ය සත්‍ය ධර්මයන් ස්ව සන්තානයෙහි පහළ වෙත්ද, එකල්හි ඔහු අහස ආලෝකමත් කරන සූර්යයා මෙන්, කෙලෙස් මරසෙනඟ විනාශ කරමින් සිටී යයි මෙම ආර්යමාර්ග ආනුභාව දක්වන උදන් අනා, මම පළමුව මෙසේ තරණයට දුෂ්කර, සසර මහ සැඩපහර, මෙම දම්නැවෙන් එතෙරවැ, නිවන් පරතෙර සිටියේ, එබැවින් දැන් ලෝකයාද එතෙර කරවන්නෙමියි ලෝකවාසීහු කවරාකාරදැයි ලෝවැස්සා බැලීමි. ඒ සඳහා, අථබො භගවා තසස සන්තානසස අවචයෙන තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා බුද්ධ චකඛුනා ලොකං වොලොකෙසියි යූ.සේයි. එහි වොලොකෙසි යනු විවිධාකාරයන්ගෙන් ලෝකය බැලූ සේක. අත්තල තැබූ, නෙල්ලි ගෙඩියක් මෙන් තම ඤාණයෙන් ප්‍රත්‍යක්ෂ කළ සේක. **අනෙකෙහි සන්තාපෙහි** ආදිය බැලූ ආකාරය දැක්වීමයි. අනෙකෙහි **සන්තාපෙහි** යනු නොයෙක් ආකාරයන්ගෙන් දුක වනාහි තැවීම්, පීඩා කිරීම් අර්ථයෙන් සන්තාපයයි කියයි. දෙසූ පරිදි දුකෙහි පීඩා කිරීම අර්ථය, ප්‍රත්‍යයකින් හටගත් අර්ථය තැවීම් අර්ථය වෙනස්වීම් අර්ථය යයි සතරාකාරයකි.

එයද, දුක්ඛ දුක්ඛාදි වශයෙන්ද, ජාති ආදී වශයෙන්ද නොයෙක් ආකාරය එහෙයින් **අනෙකෙහි සන්තාපෙහියි** යූයේයි. නොයෙක් දුක්ඛයන්ගෙන් තවනු ලබන කල්හි පීඩාකරනු ලබන කල්හි, බාධා කරනු ලබන කල්හි **පරිළාහෙහි** යනු සතැවිලියෙන් තැවෙන කල්හි, ගින්නෙන් ඉන්ධන මෙන් හාත්පස දැවෙන කල්හි, **රාගඡෙහි** යනු රාගයෙන් හටගත්, සෙස්සෙහිද එම ක්‍රමයමැයි. රාගාදීහු වනාහි යම් සන්තානයක උපදිත්ද, හාත්පස දවන්නාක් මෙන් පීඩා කරත්. එහෙයින් 'මහණෙනි, මේ රාගාග්නිය ද්වේෂාග්නිය, මෝහාග්නිය යැයි ගිනි තුනක්යි වදාළ සේක. යම්හෙයකින් ඒවා කයද සිතද කෙලෙසත්ද? එහෙයින් කෙලෙස්යයි කියති. මෙහිද **පරිඩය්හමානෙ** යන එයින් භාග්‍යවතුන් වහන්සේ රාගාදී කෙලෙසුන්ගේ පැවැත්මේ **දුක්ඛතාවයද** එයින් සත්ත්වයින්ගේ සන්තානයන් මැඩගෙන සිටීම දක්වයි. **සන්තපපමානෙ** යනු මෙයින් ඔවුන්ගේ කාලාන්තරයක් විඳි දුක්ඛතාවයද, ඉන් වන නිරන්තර උපද්‍රවතාවයද දක්වයි.

භාග්‍යවතුන් වහන්සේ වනාහි බෝ රුක් මුල නොපැරදුන පර්යංකයෙන් වැඩහුන්නේ ප්‍රථම යාමයෙහි පෙර විසූ තැන් ස්මරණය කොට, පශ්චිම යාමයෙහි ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි ඤාණය බහා කෙලෙස් මූලික සංසාර වෘත්ත දුක විශිෂ්ඨ ඥානයෙන් දැන, සංස්කාරයන් අල්වාගෙන විමසා බලනුයේ, අනුක්‍රමයෙන් විදර්ශනාව වඩා ආර්ය මාර්ගාවබෝධයෙන්, තෙමේ පහවූ විනාශ කළ කෙලෙස් ඇත්තේ, බුද්ධත්වයට පත්ව, ප්‍රත්‍යවේක්ෂණයට අනතුරුව ශේෂ රහිත කෙලෙසුන්ගේ ප්‍රහීණ කළ හෙයින් තමාගේ වෘත්ත දුක්ඛයාගේ ක්ෂය වූ බව දක්වන සියලු බුදුවරුන්ගේ අත්නොහල 'අනෙකජාති සංසාරං' යන උදන් අනා එම පර්යංකයෙන් සත්දිනක් විමුක්ති සුව විඳිමින් හුන්නේ සත්වන රාත්‍රියෙහි තෙයාමයන්හි කියන ලද ක්‍රමයෙන් ත්‍රිවිධ උදන් අනා තෙවන උදානයට අනතුරුව, බුදුඇසින් ලොව බලනුයේ, මේ සියලු සත්ත්වයින්ගේ සංසාර වෘත්ත දුක, කෙලෙස් මූලිකවය. එම කෙලෙස් නම් පැවැත්මෙහිද දුක්ය. මත්තෙහිද දුකට හේතුභූත වේ. එම කෙලෙසුන් විසින් මෙම සත්ත්වයෝ මනාව තවත් මනාව දවත් යයි දුටු සේක. එහෙයින් 'අද්දසා බො භගවා -පෙ- මොහොරෙහිපියි යූ.සේයි. **එතමත්ථං විදිත්වා** යනු එම ලෝකයාගේ කියන ලද ආකාර ඇති තැවීම් දැවීම්වලින් මඩිනු ලබන බව සර්වාකාරයෙන් දැන. **ඉමං උදානං** යනු සියලු තැවීම් දැවීම්වලින් නිවීම පැහැදිලි කිරීමට මෙම උදන් ඇනූ සේක.

එහි **අයං ලොකෝ සනතාපජාතෝ** යනු මේ සියලුම ලෝකය ජරා, රෝග මරණයන්ගෙන්ද, නොයෙක් ආකාර ව්‍යසනයන්ගෙන්ද, කෙලෙස් මැඩගෙන මතුවීම්වලින් ද හටගත් තැවීම, උපන් කායික චෛතසික දුක් මැඩ පැවැත්වීම යයි අර්ථයි. **එසසපරෙතෝ** යනු එයින්ම නොයෙක් දුක් ස්පර්ශයන්ගෙන් පීඩිත වූයේ, උපද්‍රවයට පත්වූයේ වේ. නොහොත් එසස පරෙතෝ යනු සුව ආදී සංඛ්‍යාත ත්‍රිවිධ දුක්ඛතාවන්ට ප්‍රත්‍යය වූ ෂට් ස්පර්ශයන්ගෙන් මඩනා ලදුයේ ඒ ඒ ද්වාරයන්ගෙන් ඒ ඒ අරමුණෙහි පැවැතීම් වශයෙන් පීඩාවට පත්වූයේ, **රොග වදති අත්තතෝ** යනු ස්පර්ශ හේතුවෙන් උපදනා වේදනා සංඛ්‍යාත ස්කන්ධ පංචකමය වූ රෝදුක් යථා පරිදි නොදන්නේ මම යන සංඥාවෙන් දෘෂ්ටි ග්‍රාහ වශයෙන්, මම සුවපත් වූයෙමි. මම දුප්පත් වූයෙමියි ආත්ම වශයෙන් කියයි. තමාගේ යයිද කියවති. එහි අර්ථය යම් ආකාර වූ මේ ලෝකයා **කිසියම්** දුක් ස්වභාවයකින් පෙළන ලදුයේ, නොවඩනා ලද ආතම් හෙයින් ඉවසන්ට නොහැකි වනුයේ අහෝ දුකකි. මෙබඳු දුකක් මාගේ සතුරෙකු හෝ

නොවේවායි යනාදී ක්‍රමයෙන්, විලාප කියවනුයේ හුදෙක් තම රෝගය ගැන කියයි. එහි ප්‍රහාණය සඳහා නොපිළිපදී යයි අර්ථයි. නොහොත් කියන ලද ආකාර ඇති එම දුක තත්වූ පරිද්දෙන් නොදන්නේ තෘෂ්ණා ග්‍රාහ වශයෙන් මම යන සංඥාවෙන් ආත්ම වශයෙන් කියයි. මෙය මාගේ යයි වචනය පිටකරයි. **යෙන යෙනහි මඤ්ඤති** යනු මෙසේ මේ රෝගකාරක ස්කන්ධ පංචකය ආත්ම වශයෙන් හෝ තමාගේ යයි හෝ කියන්නා වූ ලෝකයා, යම් යම් රූප වේදනාදීන්ට හේතුකාරක වූ යම් යම් ශාස්වතාදී ආකාරයෙන් තෘෂ්ණා, දෘෂ්ටි, මාන යන ත්‍රිවිධ හැඟීම්වලින් හඟියි. **තතො තං හොති අඤ්ඤථාතො** යනු ඉන් තමා විසින් පරිකල්පිත ආකාරයෙන් ඒ හැඟීම්වලට කරුණු වූ ස්කන්ධ පංචකය, අනාත්ම, අනාත්ම නියමය වශයෙන් අන් ආකාරයකින් වේ. තම වසයෙහි පවත්වන්ට නොහැකි හෙයින් මම මාගේය යන ස්වභාවය නොනිපදවයි යන අර්ථයි. නොහොත් **තතො** යනු එම ස්කන්ධ පංචකය හැඟීම් මාත්‍ර ස්වභාව හෙයින් නිත්‍යාදී වශයෙන් සිතූ දෙය අන් අයුරෙකින් අනිත්‍යාදී ස්වභාවයම වේ. හැඟීම් ස්වභාවයෙහි වෙනසක් හෝ ස්වභාව ලක්ෂණයෙහි වෙනසක් හෝ කරන්ට නොහැකිය. **අඤ්ඤථා භාවි භව සතෙතා** යනු මේ භවයෙහි වර්ධනය වන හිතසුවයන්හි ඇලුණු සත්වලෝකයා, විපරීත ප්‍රතිපත්තියෙන්, කැමැති පරිදි හැඟීමෙන් සිතනු ලබනුයේ, ඉන් වෙනස් ස්වභාවයකට අහිත දුක් ස්වභාවයකට පත්ව විනාශයටම පැමිණේ. **භවමෙවාභි නන්දති** යනු මෙසේ ඇතිකල්හිද එම හැඟීමෙන් පරිකල්පිත අවිද්‍යමාන භවයෙහි වෘද්ධිය ගැන විශේෂයෙන් සතුටු වේමය. විශේෂයෙන් කැමති වේමය. නොහොත් **අඤ්ඤථා භාවි** යනු මාගේ ආත්මය නිත්‍යයයි යනාදි හැඟීම්වලින් පරිකල්පිත ආකාරයන්ගෙන්, තෙමේ වෙනස් ආකාරයක් හා සමාන වූයේ අනිත්‍යය. අස්ථිරයයි අර්ථයි. **භවසතෙතා** යනු කාමාදී භවයන්හි භව තෘෂ්ණාවෙන් ඇලුනේ, ලග්න වූයේ - ඉතා තදින් ඇලුනේ - **භවමෙවාභි නන්දති** යනු අනිත්‍යාදී ස්වභාව ඇති භවයම නිත්‍යාදී වශයෙන්, ස්පර්ශකොට එහි තදින් ඇලීම් සංඥාව ලැබ තෘෂ්ණා, දෘෂ්ටි භව සන්තෘප්තියෙන් සන්තෘප්ත වේ. එහි නොකලකිරේ. **යදභිනන්දති තං භයං** යනු යම් වෘද්ධි සංඛ්‍යාත භවය හෝ කාමාදී භවය හෝ සතුටු වේද, එය අනිත්‍යාදී ස්වභාව හෙයින්ද, නොයෙක් ව්‍යසනයන් ලුහුබඳනා හෙයින්ද, භවයට හේතුවන හෙයින්ද අතිශය භයානකාර්ථයෙන් භයයි. **යස්ස භායති** යනු යම්හෙයකින් ජරාමරණාදියෙන් බියට පත් වේද? ජරා මරණාදී දුක් ස්ථීර හෙයින්ද, දුක් ස්වභාව හෙයින්ද දුක්ඛ දුක්ඛයයි. නොහොත් **යස්ස භායති** යනු භවයට සතුටුවීමෙන් යම් විෂයයකට

බියවේද, එය උච්ඡේද සංඛ්‍යාත විභවයයි. ඉන් බියවීමද, දුකට හේතුවන ස්වභාවයෙන් ඉපැත්ම ආදී දුක්ඛයාගේ නොඉක්මවන හෙයින්ද දුක්ය. දුක් ස්වභාවයම යයි අර්ථයි. නොහොත් **යස්ස භායති තං දුක්ඛං** යනු යම් අනිත්‍යාදියකට බිය වේදනාම නිස්සරණය නොදන්නේ එම බිය ඔහුට දුක්වේ. දුක් එළවා යයි අර්ථයි. මෙතෙකින් සංසාර වෘත්තය දක්වා දැන් (සසරට විරුද්ධ අංගය) නිවන දක්වන්ට **භව විපහාණාය ඛෝ පනිදං බ්‍රහ්මචරියං වුස්සතියි** වදාළ සේක. එහි **භව විපහාණාය** යනු කාමාදී භවයාගේ දුරුකිරීම සඳහා, ඛෝ යනු අවධාරණාර්ථයෙහි, **පන** යනු පද පූරණයෙහි නිපාතයි. **ඉදං** යනු ආසන්න ප්‍රත්‍යක්ෂ වචනයි. **බ්‍රහ්මචරියං** යනු මාර්ග බ්‍රහ්මචර්යාවයි. **වුස්සති** යනු පුරන්නේය මෙය යූ.සේයි. ඒකාන්තයෙන්ම කාමාදී භවයාගේ හටගැනීම් ප්‍රහාණයෙන් ශේෂ රහිත දුරුකිරීම් සඳහා මෙය මා විසින් සිවි අසංඛ්‍ය කල්ප ලක්ෂයකට අධික වූ, අති දුෂ්කර පිළිපැදීම් මගින් පාරමී පුරා, බෝමැඩ, ත්‍රිවිධ මාරයින්ගේ මස්තකය මර්දනය කොට අවබෝධ කරන ලද, සීලාදී ස්කන්ධත්‍රය ඇතුලත් අෂ්ටාංගික මාර්ග බ්‍රහ්මචර්යායෙහි හැසිරේ. වඩනු ලැබේනුයි මෙසේ ආර්යමාර්ගයාගේ ඒකාන්තයෙන්ම නෛර්යාණික බව පෙන්වා, දැන් අන් මාර්ගයාගේ එය නොමැති බව දක්වනුයේ **යෙහි කෙචි** ආදිය වදාළ සේක. එහි **යෙ** යනු අනියම් නිර්දේශයයි. **හි** යනු නිපාත මාත්‍රයයි. **කෙචි** යනු ඇතැම් අය පද ද්වයයෙන්ම එබඳු වාද ඇති දෘෂ්ටිගතිකයින් අනියමයෙන් හාත්පසින් ගනියි. **සමණා** යනු පැවිද්දට එළැඹි මාත්‍රයෙන් ශ්‍රමණයෝ සන්සිඳවූ පාප ඇති අය නොවේ. **බ්‍රාහ්මණා** යනු උත්පත්ති මාත්‍රයෙන් බ්‍රාහ්මණයෝ. බැහැර කරන ලද පව් ඇති අය නොවේ. වා ශබ්දය විකල්පාර්ථයෙහි. **භවෙන භවසඃ විපමොක්ඛමාහංසු** යනු ඇතැම්හු කාමභවයෙන් හෝ රූප භවයෙන් හෝ සියලු භවයන්ගෙන් මිදීම සංසාර ශුද්ධිය යැයි කීහ. කවරෙක් වනාහි එසේ කියත්ද? ඉහාත්ම නිර්වාණවාදීහුය. ඔවුනතර ඇතැම්හු, මහත් පංචකාම ගුණයන්ගෙන් සන්තෘප්තියට පත්වූයේ, ආත්මය ඉහාත්මයෙහිම උතුම් නිවීමට පත්වූයේ වේයයි කියති. සමහරු රූපාවචර ධ්‍යානයන්හි ප්‍රථමධ්‍යානයෙන් යුක්ත වූයේ -පෙ- සමහරු ද්විතීය -පෙ- තෘතීය -පෙ- චතුර්ථ ධ්‍යානයෙන් යුක්ත වූයේ ආත්මය ඉහාත්මයෙහිම උතුම් නිවීමට පැමිණියේ වේයයි කියති. දෙසූ පරිදි, මහණෙනි, මෙලොව ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මෙබඳු කියමන් ඇත්තේ වේ. මෙබඳු දෘෂ්ටි ඇත්තේ වේ. පින්වත, යම්තැනක පටන් මේ ආත්මය පංචකාම ගුණයන්ගෙන් සන්තර්පණය කරන ලද්දේයි. විස්තරයයි. ඔවුහු වනාහි සමෘද්ධියට

පත්හෙයින්, තෘප්තියට පත්වූයේ, ලේ පිපාසාවෙන් පීඩිත කුඩැල්ලා මෙන් කාමාදි සුව ලබන්නහුට තම කාමයන් සෙවීම් ආදිය නොවන්නාහුද, එය නොමැති වීමෙන් භවයාගේ අභාවයම වේ. යම් යම් භවයන්හි සිටියහුට මෙම ක්‍රමය ලැබේ. ඒ ඒ භවයෙන් සියලු භවයන්ගේ විමුක්තිය වේයයි කියති. එහෙයින් භවයෙන් භවයට මිදීම කීහයි යූ.සේයි. යම්කෙනෙකුන්ට, මෙතෙක් ප්‍රමාණ කාලයක් සසර සැරිසරා අඥානයෝ ද, පණ්ඩිතයෝ ද අවසාන භවයෙහි සිට සසරින් මිදෙත්යයි ලබ්ධියෙකි. ඔව්හුද භවයෙන් භවයාගේ විමෝක්ෂය කියන්නාහු නමැ. යූ.සේයි.

මහා කල්ප ලක්ෂයක්හුගේ ඇවෑමෙන් යම් ආකාර වූ අඥානයින්ද පණ්ඩිතයින්ද සසර ඇවිද, සැරිසරන දුක් කෙළවර කරන්නාහ. නොහොත් **භවෙන** යනු භව දෘෂ්ටියෙන්, සිදුවේ. හැමකල්හි පවත්නා අයුරින් පවතී යයි පවත්නා හෙයින් ශාස්වත දෘෂ්ටිය භව දෘෂ්ටිය යැයි කියනු ලැබේ. මෙහි භව දෘෂ්ටියම මතු පද ලෝපයෙන් භව තණ්හා ආදීන්හි මෙන් භවයැයි යූ.සේයි. භව දෘෂ්ටි වශයෙන් ද සමහරු භව විශේෂයම කෙලෙසුන්ගේ සන්සුන් පැවැත්මෙන් ආයුෂයාගේ දීර්ඝතාවයෙන්ද නිත්‍යාදි ස්වභාව වූයේ භව විමෝක්ෂයැයි හඟිත්. යම්සේ නම් බක බ්‍රහ්මයා මෙය නිත්‍යය - මෙය ස්ථිරය. මෙය ශාස්වතය. මෙය නොවෙනස්වන ස්වභාවයැයි කිවූය. සසරින් නිදහස් නොවීමෙහිලා බලපාන කරුණු පිළිබඳව සසරින් නිදහස් වීමෙහිලා සලකන ඒ ආකාර වූම විපරීත ග්‍රාහීන්ට භව විමෝක්ෂයක් නම් කෙසේ නම් ලැබේද? එහෙයින් භාග්‍යවතුන් වහන්සේ **සබ්බ තෙ අවිප්පමුත්තා භවසමානි** වදාමි යි වදාළ සේක. **විභවෙන** යනු උච්ඡේද දෘෂ්ටියෙන්, **භවසඃ නිඃසරණ මාහංසු** යනු සියලු භවයෙන් පිටවීම, නික්මීම සංසාර ශුද්ධිය යැයි වදාළහ. ඔවුන් විසින් භවයෙන් භවයාගේ මිදීම යැයි කියනවුන්ගේ වාදය අනුමත නොකරන්නාහු භවය සිදීමෙන් සසරින් ගැලවීම පිළිගත්හ.

විභවෙන යනු උච්ඡේද දෘෂ්ටියෙන්, ආත්මයද ලෝකයද නැසේ. විනාශ වන්නේය. සිඳ දමනු ලැබේ යයි පවත්නා හෙයින් උච්ඡේද දෘෂ්ටිය කියන ලද අයුරින් විභවයැයි කියයි. සත්ත්වයෝ උච්ඡේද දෘෂ්ටි වශයෙන් තදින් ඇලී ඒ ඒ තන්හි උපන්නාහු විනාශ වෙත්. උච්ඡේදවාදීහු එයම සංසාර සුද්ධිය යැයි පිළිගනිති. යූ.සේයි. පින්වත, යම්තැනක පටන් මේ ආත්මය සතරමහා භූතයන්ගෙන් හටගත්තේද -පෙ- නෙවසංඥා නාසංඥායතනයට පැමිණ වාසය කෙරේද, පින්වත මෙපමණෙකින්ම

මේ ආත්මය මනාව නසන ලද්දේ වේ. එසේම මහරජ, දුන් දෑහි විපාක නැත. පරිත්‍යාගයෙහි ඵලයක් නැත. යාග කිරීමෙන් ප්‍රයෝජන නැත. - පෙ- අඥානයෝ ද, පණ්ඩිතයෝ ද ශරීරයාගේ භේදයෙන් විනාශ වෙති. නැසෙති. මරණින් මතු නොවෙත් යයි ඔවුන්ගේද මෙසේ විකෘති ග්‍රහණයන්ගෙ භවයෙන් නික්මීමක් කොයින්ද, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ **සබ්බෙ තෙ අනිස්සටා භවසමානි** වදාමියි වදාළ සේක. ආර්ය මාර්ග භාවනාවෙන් සේසරහිතව කෙලෙස් මුලින් නොඋපුටා, කිසිදිනෙක භවයෙන් ගැලවීමේ විමුක්තිය නොහට ගනී. එසේම **තිබේද**, නොතිබේද යන අන්ත ද්වයයට වැටුණු ඒ මහණ බමුණන්ට තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් පෙරළීම් දැඟලීම් මාත්‍රයක් පමණක් විද්‍යමාන වේ. ඒ දෘෂ්ටිගතිකයෝ ප්‍රවෘත්ති හේතූන්හිද, මුලා වූවාහු ස්වකාය භූමියෙහි මනාව හාරා සිටුවන ලද විපර්යාස වූ දර්ශන නමැති ටැඹෙහි තෘෂ්ණා බන්ධනයෙන් බඳනා ලද්දාහු, සම්පටියෙන් කළ බන්ධනයෙන් බඳනා ලද බල්ලෙක් බඳනා ලද ස්ථානය අත් නොහරනා මෙනි. ඔවුන්ට මිදීමක් කෙසේ වේද? යමෙක්හු වනාහි සිව්සස් ප්‍රකට කිරීමෙන්, පැවැත්ම ආදීන්හි නුමුලාවෙන් එම අන්තද්වයයට නොපැමිණ මධ්‍යම ප්‍රතිපදාවට නැගුණේ එම භවයන්ගෙන්ම මනාව මිදීම නිදහස් වීම යයි දක්වන්නා වූ ශාස්තෘන් වහන්සේ උපධීහි යනාදිය වදාළ සේක. **උපධි** යනු ස්කන්ධ ආදී මූලිකාංග. හි යනු නිපාත මාත්‍රයයි. **පටිච්ච** යනු ආධාරකොට, ප්‍රත්‍යය කොට, **දුක්ඛං** යනු ඉපැත්ම ආදී දුක. කුමක් කියන ලදද යත්, යම්තැනක මෙම දෘෂ්ටි ගතිකයෝ මිදීම සංඥා ඇත්තාහු එහි ස්කන්ධ - කෙලෙස්, කර්ම රැස් කිරීම ආදීහු අවබෝධ කළාහු එහි දුකින් නිදහස් වීමක් කොතැනින් ලැබේද? යම්තැනක වනාහි කෙලෙස්, එහි කර්ම රැස් කිරීම හටගන්නා හෙයින්, භවයාගේ නොසිඳී පැවැත්මෙහි, අවිච්ඡේදය වේමය. වෘත්ත දුක්ඛයාගේ නොනැවත්ම හෙයිනි. එහෙයින් **උපධිහි පටිච්ච දුක්ඛමිදං සමෙහාති** යි යූ.සේයි. දැන් යමක් පරමාර්ථ වශයෙන් දුක්ඛයාගේ නිදහස් වීමක් වේද, එය දක්වන්ට **සඞ්ඛූපාදානක්ඛයා** යනු කාම, දිට්ඨි-සීලබ්බත, අත්තවාදූපාදාන යන මෙම සියලු සිව් වැදෑරුම් වූම උපාදානයන්ගේ ආර්ය මාර්ගාවබෝධයෙන් ශේෂ රහිත ප්‍රහාණයෙන් එහි දිට්ඨි, සීලබ්බත අත්තවාදූපාදාන යන මෙම ත්‍රිවිධ උපාදානයන් සෝවාන් මාර්ගයෙන් ක්ෂය වෙති. නූපදින ස්වභාවයට පැමිණෙත්. කාමූපාදානයෙහි අපාය ගමනීයත්වය ප්‍රථම මාර්ගයෙන් ද, කාමරාගයෙහි දැඩි ස්වභාවය දෙවන මාර්ගයෙන්ද, සියුම් ස්වභාවය තෙවන මාර්ගයෙන් ද, රූප රාග ප්‍රහාණය සිව්වන මාර්ගයෙන්දැයි සිව් මාර්ගයන්ගෙන් ක්ෂය වේ. නූපදනා ස්වභාවයට

පත් වේයයි දතයුතුය. නපටි දුකඛසස සමහවො යනු මෙසේ සර්වප්‍රකාරයෙන් තෘෂ්ණා දෘෂ්ටි ආදිය ක්‍ෂය කිරීමෙන් ඒ හා යෙදුන සියලු කෙලෙස් සමූහයාගේ නූපදනා හෙයින් ස්වල්පමාත්‍ර වූද වෘත්ත දුක්ඛයාගේ හටගැනීම නොමැත. මෙසේ භාග්‍යවතුන් වහන්සේ හේතුව සමග පැවැත්මද, නැවැත්මද පෙන්වා මෙම ක්‍රමය නොදන්නා වූ, මෙම සත්ත්ව ලෝකයා සංසාර වෘත්තයෙන් හිස නොඔසවයි යයි දක්වනුයේ **ලොකම්මං පසස** යයි තමාගේ බුදු ඇසින් ප්‍රත්‍යක්‍ෂ වශයෙන් විෂය ස්වභාවයට එළැඹී හෙයින් මෙම ලොව බලව යයි භාග්‍යවතුන් වහන්සේ දර්ශන ක්‍රියාවෙහි යොදවනුයේ තමාම අමතයි. **පුථූ** යනු බොහෝ, වෙන් වෙන්ව හෝ, **අවිජජාය පරෙතා** යනු දුක පිළිබඳ නොදැනීම යයි ආදී ක්‍රමයෙන් කියන ලද සිව්සස් වසා දමන අවිද්‍යාවෙන් මඬනා ලදුයේ. **භූතා** යනු කර්ම හා කෙලෙස්වලින් හටගත්තාහු, උපන්නාහු. **භූතරතා** යනු සත්ත්වයින් කෙරෙහි මව්පිය, පුත් අඹු ආදී හැඟීමෙන් අන්‍ය සත්ත්වයින් කෙරෙහි තෘෂ්ණාවෙන්, සතරමහා භූතයන්හි ඇතුලත් ස්කන්ධ පංචකයෙහි, අනිත්‍ය, අශුභ, දුක්ඛ අනාත්ම ස්වභාවයෙහි එම ස්වභාවය අවබෝධ නොකිරීමෙන් ස්ත්‍රී පුරුෂාදී කල්පනයන් වශයෙන්ද නිත්‍යාදී වශයෙන් ද ආත්ම ග්‍රාහ වශයෙන් ද ඇලුනාහු **භවා අපරිමුතතා** යනු තත් වූ පරිද්දෙන් නොදැන, තෘෂ්ණා දෘෂ්ටි ග්‍රාහයෙන් භවයෙන් සංසාරයෙන් නොමිදුනාහු, මෙහිද **ලොකම්මං** යනු ප්‍රථමයෙන් සියලුම සත්ත්වනිකාය සමානතාවයෙන් ඒකත්වයට ගෙනහැර, ඒක වචනයෙන් අනියමෙන් ග්‍රහණය දක්වා, මෙම ලෝකය, භව, යෝනි ගති සත්තාවාසාදි වශයෙන්ද, එහිද, ඒ ඒ සත්ත්ව නිකායාදී වශයෙන් ද, නොයෙක් භේද හින්න වූයේ, **මා විසින්** වෙන වෙනම බලන ලද්දේ යයි තමාගේ බුද්ධ චක්‍ෂු ඤාණයෙහි ආනුභාව ප්‍රකාශ කරන්නා වූ ශාස්තෘන් වහන්සේ නැවත වචන බිඳ, බහුවචනයෙන් නියමකොට ග්‍රහණය **පුථූ අවිජජාය පරෙතා භූතා** යනාදි ක්‍රමයෙන් දක්වයි. මෙසේද කොට **ලොකම්මං** යයි ද්විතියා වචනය කොට **අවිජ්ජාය පරෙතා** ආදී ක්‍රමයෙන් ප්‍රථමා විභක්ති බහුවචන නිර්දේශයද විරුද්ධ නොවේ. බිඳුනු වාක්‍ය හෙයිනි.

සමහරු වනාහි එක් වාක්‍ය අභිප්‍රායයෙන් 'අවිජජාය පරෙතං භූතං **භූතරතං** භවා අපරිමුතතං යිද කියවති. පැරණි පාඨය විභක්ති භේද වශයෙනි. දැන් යම් ක්‍රමයකින් භවයෙන් මිදීම වේද, එම සියල්ල, **තීර්ථකයින්ට** අවිෂය වූයේ, බුද්ධගෝචර විදර්ශනා වීථිය පෙන්වනුයේ **යෙහි කෙචි** යනාදිය වදාළහ. එහි **යෙහි කෙචි භවා** යනු කාම භව, සංඥී

භව, එකවොකාර භව ආදී බෙදීමෙන්, නොයෙක් භේද හින්න වූ, සිසිල් යයි සම්මත, හරබුන් සිසිල් රහිත, දීර්ඝායුෂ්ක හෝ වෙනත් ලක්ෂණයන්ගෙන් හෝ යුක්ත යම් භව කෙනෙක්. **සබ්බධි** යනු උඩ, යට සරස ආදී බෙදීමෙන් හැමතැන. **සබ්බත්තතාය** යනු ස්වර්ග, අපාය, මනුෂ්‍ය, දිව්‍ය ආදී ස්වභාවයෙන්. **සබ්බේතෙ** ආදීන්හි එම සියලුම, භවා භවයන්, රූප වේදනාදී ධර්ම හටගෙන නැතිවන අර්ථයෙන් **අනිච්චා** අනිත්‍යයි. හටගැනීම් විනාශ වීම් ආදියෙන් මනාව පීඩිත හෙයින් **දුක්ඛා** දුක්ය ජරාවෙන්ද මරණයෙන් ද යන දෙ අයුරෙකින් වෙනස්වන ස්වභාව හෙයින් **විපරිණාම ධම්මා** යි. ඉති ශබ්ද මුල යන අර්ථයෙහිද, ආකාරාර්ථයෙහි වේ. කිමෙක්ද, ඉන් අනුක්ත ලක්ෂණයද, සංග්‍රහකොට සිය වශයෙහි නොපවත්නා අර්ථයෙන් **අනත්තා** අනාත්මයි. වෙනස්වන ස්වභාව හෙයින්ද සිය වසයෙහි නොපවත්නා අර්ථයෙන්ද අනාත්මයැයි. **එවං** මෙසේ ලක්ෂණත්‍රය අවබෝධ කරනා කාරයෙන්, **එතං** භව සංඛ්‍යාත ස්කන්ධ පංචකය. යථාභූතං යනු වෙනස් නුවූ, **සම්මප්පඤ්ඤාය** යනු සම්‍යක් ඥානයෙන්, විදර්ශනා සහිත මාර්ග ප්‍රඥායෙන් **පස්සතෝ** විශේෂ ඥානයෙන් අවබෝධ කිරීම් වශයෙන් අවබෝධ කරන හෙයින්, භවය නිත්‍යයැයි ආදී ක්‍රමයෙන් පැවැති භවයන්හි ස්වභාවය බලන කල්හි, **තණ්හා පහීයති** යනු අග්‍ර මාර්ග ප්‍රාප්ත සම කාලයෙහිම ශේෂ රහිතව ප්‍රහීණ වේ. උච්ඡේද දෘෂ්ටිය සර්වප්‍රකාරයෙන් ප්‍රහීණ හෙයින් **විභවං** විභවය, විනාශය.

නාභිනන්දති යනු ප්‍රාර්ථනා නොකරයි. මේ ආකාර වූ එම කාම තෘෂ්ණාදී වශයෙන් යම් අටසියයක් භේද ඇති අවස්ථා බෙදීමෙන් අනන්ත භේද වූද, එම තෘෂ්ණාවන්ගේ සබ්බසො සර්වප්‍රකාරයෙන්, **තණ්හානං** ඛයා යනු එම තෘෂ්ණාව හා එකට යෙදුන සියලුම කෙලෙස් සහිත පක්ෂයෙහි, **අසෙසං** සේස රහිතව, විරාගෙන යනු ආර්ය මාර්ගයෙන් නූපදනා ආකාරයෙන් යමක් වේද, එය, **නිබ්බාණං** යනු මෙසේ තෘෂ්ණාවෙන් ප්‍රහාණ මුඛයෙන් සවුපාදිසේස නිර්වාණය දක්වා, දැන් අනුපාදිසේස නිර්වාණය දක්වනුයේ **තස්ස නිබ්බුතස්ස** යන ගාථාව වදාළ සේක.

එහි අර්ථය යම් ආකාර වූ එම භික්ෂුව තෘෂ්ණාවන්ගේ ක්ෂය කිරීමෙන්, කෙලෙස් පරිනිර්වාණයෙන් නිවුණේ කියන ලද ආකාරයෙන් බුන් කෙලෙස් ඇති රහත් භික්ෂුව. **තස්ස නිබ්බුතස්ස භික්ඛුනො අනුපාදානා** යනු දැඩිසේ ගැනීම් අභාවයෙන්, කෙලෙස්, කර්ම රැස්කිරීම් යන

මාරයන්ගේ ග්‍රහණය නොමැති හෙයින්, **පුනබ්භවො න හොති** යනු මත්තෙහි ප්‍රතිසන්ධි වශයෙන් උත්පත්ති භවයෙක් නොමැත. මෙබඳු වූද ඔහු විසින් **අභිභූතො මාරො** යනු ආර්යමාර්ග ක්ෂණයෙහිදී, ක්ලේශමාර, අභිසංස්කාර මාර, දේවපුත්‍ර මාර, අවසාන චිත්තක්ෂණයෙහිදී ස්කන්ධ මාර, මෘත්‍යුමාර යන පස්වැදෑරුම් මාරයන් මැඩපවත්වන ලදුයේ, පරාජය කරන ලදුයේ වේ. නැවත හිස ඔසවන්ට නොදීමෙන් නිෂේධ කරන ලදුයේ, යම්හෙයකින් ඔහු විසින් **විජිතො සංගාමො** මාරයන් විසින් ඒ ඒ තන්හි පවත්වන ලද, මෙසේ දිනන ලද සංග්‍රාම ඇතියේ, මනා ප්‍රියකරන සියලු අරමුණුවල විකෘති අභාවයෙන්, කෙලෙස් දුරුකළ ලක්ෂණ ප්‍රාප්ත හෙයින් **තාදි** නම් රහතන් වහන්සේ **සබ්බභවානි** යනු කියන ලද ආකාර ප්‍රභේද ඇති සියලුම භවයන්හි, **උපච්චගා** යනු ඉක්මවනුයේ යම්කිසි තැනක **නිබෙයි**. ගණන් ගැනීමකට නොඑළඹේද, ඒකාන්තයෙන් දර නොමැති ගින්න මෙන් පිරිනිවීමෙන් මත්තෙහි පුද්ගල ප්‍රඥප්තියෙන් විරහිත වූයේම වේ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මෙම මහා උදානය අනුපාදිසේස නිර්වාණ ධාතුයෙන් කුළුගන්වා නිමකළ සේක.

දසවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

තෘතීය වර්ග වර්ණනාව සමාප්තයි.

4-1

මෙසිය වර්ගයෙහි පළමුවැන්නෙහි **චාලිකා** යනු මෙනම් නගරයෙහි, එම නගරයෙහි දොරටුව පිහිටි තැන හැර හාත්පස සැලෙන මඩ වේ. එම සැලෙන මඩ ඇසිරිකොට සිටි හෙයින් බලනවුනට සෙලවෙන්නාක් මෙන් වැටහෙයි. එහෙයින් චාලිකායි කියයි. **චාලිකෙ පබ්බතෙ** යනු එම නුවරට නුදුරෙහි එක් පර්වතයක් වේ. එයද මුලුමනින් ශ්වේත වර්ණ හෙයින් මාසේ පොහොය දින බලනවුනට සෙලවෙන්නාක් මෙන් වැටහේ. එහෙයින් චාලික පර්වතයයි යන සංඛ්‍යාවට ගියේය. එහි භාග්‍යවතුන් වහන්සේට මහ විහාරයක් කරවූහ. භාග්‍යවතුන් වහන්සේ එකල්හි එම නුවර ගොදුරුගම්

කොට එම චාලික පර්වත මහ වෙහෙර වැඩ වාසය කරයි. එහෙයින් **චාලිකායං විහරති චාලිකෙ පබ්බතෙයි** යූ.සේයි. **මෙඝියො** යනු එම තෙරුන්ගේ නාමයයි. උපට්ඨාකො **හොති** යනු සේවකයා වේ.

භාග්‍යවතුන් වහන්සේට ප්‍රථම බෝධියෙහි දී උපස්ථායකයෝ අනියමින් වූහ. එක් කලෙක නාගසමාල, එක් කලෙක නාගිත, එක් කලෙක උපවාන, එක් කලෙක සුනක්ඛත්ත, එක් කලෙක චුන්ද සමනුද්දෙස (ප්‍රව්‍රජ්‍යා ශ්‍රේෂ්ඨකයා) එක් කලෙක සාගත, එක් කලෙක මේඝිය, එකල්හිද මෙඝිය තෙරුන්ම උපස්ථායක විය. එහෙයින් **තෙන ඛොපන සමයෙන** ආයස්මා මෙඝියො භගවතො උපට්ඨාකො **හොති** යි වදාළහ.

ජනතුගාමං යනු මෙවන් නමින් යුතු එම විහාරයට අයත් වෙනත් ගොදුරුගමක් ජනගාම යැයිද පාඨයි. **කිමි කාලාය** යනු කලු කෘමීන්ගේ බහුලතාවය හේතුයෙන් ලත් නමැති නදියෙහි, **ජංඝාවිහාරං** යනු බොහෝ වේලාවක් හිඳගෙන සිටීමෙන් කෙණ්ඩාවල හටගත් වෙහෙස දුරුකිරීම සඳහා ඇවිදීම, **පාසාදිකං** යනු රුක් බහුලතාවයෙන් ද සිනිඳු පත්‍ර බැවින්ද, බලනවුනට සතුට එළවයිනුයි පාසාදිකංයි, සඟ සෙවන ඇති බැවින්ද සිත්කලු භූමි භාගය බැවින්ද මනුෂ්‍යඤ්ඤංයි ඇතුලත පිවිසියවුන්ට ප්‍රීති සොම්නස් හටගන්නා අර්ථයෙන් සිත අලවයිනුයි රමණීයංයි. **අලං** යනු සෑහේ. යෝග්‍යයි අර්ථයි. **පධානභූමිකස්ස** යනු ජනශූන්‍යතාවෙන් භාවනා වඩනු කැමැතියහුට, **පධානාය** යනු භාවනා වඩනු සඳහා, **ආගච්ඡෙය්‍යාහං** යනු මම එන්නෙමි. තෙරුන් වහන්සේ වනාහි පෙර එම ස්ථානය ජාති තෙරුන් වහන්සේ වනාහි පෙර එම ස්ථානය ජාති පන්සියයක් අනුපිළිවෙළින් රජෙක් වූයේම පරිභෝග කරන ලද උයනක් විය. එහෙයින් ඔහුට දිටි පමණින්ම එහි වසන්ට සිත නැමිණි. **ආගමෙහි තාව** යනු ශාස්තෘන් වහන්සේ තෙරුන්ගේ වදන් අසා සලකා බලනුයේ මොහුගේ ඥානය මෙතෙක් මුහුකුරා නොගියේ යයි දැන ප්‍රතික්ෂේප කරනුයේ මෙසේ වදාළහ. **එකකමභාතාව** යනු මෙතෙම ගියේ වී නමුත් කටයුතු නොනිපැයෙන කල්හි, සැක නැතිව ප්‍රේම වශයෙන් නැවත පැමිණෙන්නේ යයි සිතෙහි මෘදු බව ඇතිකරලීම සඳහා මෙසේ වදාළහ.

යාව අඤ්ඤොපි කොචි භික්ඛු ආගච්ඡති යනු අන්කිසි භික්ෂුවක් මා සමීපයට යම්තාක් පැමිණේද ඒ තාක් බලාපොරොත්තු වෙවයි අර්ථයි. කිසි භික්ෂුවක් පෙනේද, ආගච්ඡතුයිද කියවති. එසේ පෙනේවා. **නත්ථි**

කිඤ්චි උත්තරිං කරණීයං යනු සිව් සත්‍යයන්හි, සිව් මාර්ගයන්ගෙන් පරිඥා ආදී සොළොස් කෘත්‍යයන්ගේ කොට නිමහෙයින්, අභිසම්බෝධිගේ හෝ අවබෝධ කළ හෙයින් ඉන් මත්තෙහි කළයුත්තක් නම් නැත.

නත්ථි කතස්සවා පතිචයෝ යනු කළ දැයෙහි යලි රැස් කැරුමෙක්ද නැත. වඩන ලද මාර්ගය නැවත නොවඩනු ලැබේ. ප්‍රහීණ වූ කෙලෙසුන්ගේ හෝ නැවත ප්‍රහාණයෙහිලා කාර්යයක් නම් නැත. **අත්ථි කතස්ස පතිචයෝ** යනු මාගේ සන්තානයෙහි නිෂ්පාදිත සීලාදී ධර්මයෙහිද ආර්ය මාර්ගයෙහිද, අවබෝධ නොකළ හෙයින් ඒ සඳහා නැවත වැඩීම සංඛ්‍යාත යළි රැස් කැරුමෙක් ඇත. කැමැති විය යුතුයයි අර්ථයි. **පධානන්ති ඛෝ මෙසිය වදමානං කින්ති වදෙය්‍යාම** යනු මහණෙනි කරමියි එය කියන ඔබට අපි අන් කුමක් නම් කියන්නෙමුද? **දිවා විහාරං නිසීදි** යනු දිවා විහරණය සඳහා හිඳගති. හිඳගතුයේද, පෙර අනුපිළිවෙළින් පන්සියයක් ආත්ම රජව, උයන්කෙළි **ක්‍රීඩා** කරමින් නොයෙක් නළුනිළි පිරිවර සහිතව හුන් විරූ මඟුල් ගල් තහවුව යම් තැනෙක්හි වීද, එම ස්ථානයෙහිම හිඳ ගත්තේය. ඉක්බිති ඔහුට හුන් කලැ පටන් ශ්‍රමණ භාවය රහිත මෙන් විය. රජ වෙස්ගන නාට්‍යය පිරිවර විසින් පිරිවරන ලදුයේ සුදු කුඩය යට මහානර්ඝ පර්යංකයක හුන්නාක් මෙන් විය. ඉක්බිති ඔහුට එම සම්පත් ආශ්වාද කරන කල්හි කාම විතර්ක පහළ විය. ඔහු එකෙණෙහිම බඩු සහිතව අල්වා ගත් සොරුන් දෙදෙනෙකු ගෙනවුත් ඉදිරිපස සිටියවුන් මෙන් දිටීය. ඔවුනතර එක් අයෙකු මැරවීමට අණකිරීම් වශයෙන් ව්‍යාපාද විතර්කය උපනි. එක් අයෙකු අත් පා විලංකු දමන ලෙස අණකිරීම් වශයෙන් විහිංසා විතර්කය උපනි. මෙසේ හෙතෙම වැල් ජාලාවකින් වැසුන රුකක් මෙන්ද, මැස්සන් ගැවසී ගත් මීයක් නසන මීමැසි ඝාතකයෙක් මෙන්ද අකුසල විතර්කයන්ගෙන් වටකරන ලදුයේ, මනාව ගැවසීගත්තේ විය. ඒ සඳහා **අථ ඛෝ ආයස්මතෝ මෙසියස්ස** ආදිය යූ.සේයි.

අච්ඡරියං වත භෝ යනු එය ගර්හා කිරීමේ ආශ්චර්යය නමැ. **යම්සේ නම් ආයුෂ්මත් ආනන්ද** තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ නිශ්ශබ්දතාවය දැක, ස්වාමීනි, ආශ්චර්යයෙක. ස්වාමීනි පෙර නොවූ විරියෙකැයි කීය. සමහරු වනාහි, එකල්හි මල්, ඵල, පත්‍රාදීන්හි ලෝභ වශයෙන් කාම විතර්කයද, ගොරෝසු ස්වර ඇති **පක්ෂි** ආදීන්ගේ ශබ්ද ශ්‍රවණයෙන් ව්‍යාපාද විතර්කයද, මැටි කැට ආදීන්ගෙන් එම සතුන්

වෙහෙසට (පීඩාවට) පත් කිරීම් අදහසින් විහිංසා **විතර්කයද, මම** මෙහිම වාසය කරන්නේ නම් යෙහෙකැයි එහි **අපේක්ෂතා වශයෙන්** කාම විතර්කයද, එහි වනයෙහි හැසිරෙනවුන් දැක සිත (දූෂ්‍ය) ද්‍රෝහී වීමෙන් ව්‍යාපාද විතර්කයද, ඔවුන් වෙහෙසට පත්කිරීමේ අදහසින් විහිංසා විතර්කයද, ඔහුට උපදිත් යයි කියති. කවරාකාරයකින් හෝ ඔහුගේ මිථ්‍යා විතර්ක ඉපැත්මම කාරණයයි. **අත්‍රාසතතා** යනු ලැගුණාහු, ගැවසී ගත්තාහු. තමා කෙරෙහිද, ගුරුවරයා කෙරෙහිදැයි ඒකවචනාර්ථයෙහි වුවද බහුවචනය පෙනේ. අත්‍රාසතෙතායි ද පාඨයි. **යෙන භගවා තෙනුපසංකමි** යනු මෙසේ වැරැදි විතර්කයන්ගෙන් ගැවසී ගත් කර්මස්ථාන රැස් කිරීමෙහි ලා යෝග්‍යතාවයක් කරන්ට නොහැකි වනුයේ දුර දක්නා භාග්‍යවතුන් වහන්සේ, මෙය දැක ඒකාන්තයෙන් වලක්වයි යයි සලකා, මෙම කරුණු දශබලධාරීන් වහන්සේට සැළ කරන්නෙමියි හුනස්නෙන් නැගිට, භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැන්හි එළැඹියේය. එළඹ ද, 'ස්වාමීනි, මෙහි මට ආදියෙන් තම පුවත් සැළ කළේය. එහි **යෙභුය්‍යෙන** යනු බහුල වශයෙන් නිතර, **පාපකා** යනු ලාමක, **අකුසලා** යනු අදක්ෂතාවයෙන් හටගත්, දුගතියට පමුණුවන අර්ථයෙන් හෝ පාපකායි. කුසල් ප්‍රතිපක්ෂ හෙයින් අකුසලායි. **විතක්කෙකා** යනු සිතා බලයි. කල්පනා කරයි. අරමුණට සිත අරමුණට යොමු කෙරේනුයි විතර්කයි. කාමය හා යුක්ත වූ විතර්කය **කාම විතක්කෙකායි.** කෙලෙස් කාම හා එකට යෙදුන, වස්තු කාම අරමුණු කොට ඇති විතර්කයයි අර්ථයි. ක්‍රෝධය හා එකට යෙදුන අදහස **බ්‍යාපාද විතක්කෙකායි** හිංසා සහගත විතර්කය **විහිංසා විතක්කෙකායි.** ඒවා අතර කාම වස්තූන්ට සතුටු වීම් වශයෙන් පැවතුණු, නෛෂ්ක්‍රම්‍යයට ප්‍රතිපක්ෂ වූයේ කාම විතර්කයයි. මෙම **සත්ත්වයෝ** නැසෙත්වා, විනාශවෙත්වා, නොවෙත්වායි සත්ත්වයින් කෙරෙහි දූෂ්‍යවීම් වශයෙන් පැවැති මෛත්‍රී ප්‍රතිපක්ෂ වූයේ ව්‍යාපාද විතර්කයි. **අත්** මැටිගල්, දඬු ආදීන්ගෙන් සත්ත්වයින් වෙහෙසට පත්කරලීමේ රුචිකතා වශයෙන් පැවැති, කරුණාවට **ප්‍රතිපක්ෂ** වූයේ විහිංසා විතර්කයයි. කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ මොහුට එහි යාම අනුදැන වදාරන ලදද යත්, සේවා ලැබ ගැන්මේ කැමැත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මට යන්ට නොදේයයි, අනුදැන නොවදාරන ලද්දේ වී නමුත් (**අනුමැතියෙන්** තොරවද) මා හැරදා යන්නේය. එයින් ඔහුට අන්‍යථාභාවයක් වන්නේය. (විපිළිසර) **එය** ඔහුට බොහෝ කලක් අවැඩ **පිණිස දුක් පිණිස** පවත්නේ යයි සිතා අනුදත්තෙමි. මෙසේ එහිලා තම පුවත් සැළකොට හුන් කල්හි භාග්‍යවතුන් වහන්සේ සත්ප්‍රාය දම් දෙසනුයේ **අපරිපකකාය මෙසිය**

චෙතො විමුත්තියා ආදිය වදාළහ. එහි **අපරිපකකාය** යනු මේරීමට නොපත්, චෙතො විමුත්තියා යනු සිත කෙලෙසුන්ගෙන් මිදීමෙහි, පූර්වභාගයෙහි තදංග වශයෙන් ද, විෂ්කම්භන වශයෙන් ද කෙලෙසුන්ගෙන් සිතෙහි විමුක්තිය වේ. පසුකලැ සමුච්ඡේද වශයෙන් ද පටිපස්සඬ්ධි වශයෙන් ද වේ. එම විමුක්තිය යට විස්තර වශයෙන් කියන ලද්දේමය. එහෙයින් එහි කියන ලද අයුරු දතයුතුය. එහි විමුක්ති මේරීම් ධර්මයන්ගෙන් සිත්හි පවත්නා අප්‍රකට කෙලෙස් ප්‍රභවයන්, මේරීමට ගිය කල්හි, ප්‍රබෝධ වූ කල්හි විදර්ශනාවෙන් මාර්ගය ගැබ් ගන්වන්නී මේරීමට යන්නී චිත්ත විමුක්තිය මේරීමට ගියේ නම් වේ. එසේ නොමැති කල්හි නොමේරුණේ නමැ. විමුක්ති මේරීම් කාරක ධර්ම කවරේද, ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ පිරිසිදු කිරීම් වශයෙන් පසලොස් ධර්ම කෙනෙක් දතයුත්තාහ.

යූ.සේයි. අශ්‍රද්ධාවත් පුද්ගලයන් දුරුකරන කල්හි, ශ්‍රද්ධාවත් පුද්ගලයින් සෙවුනා කල්හි, ඇසිරි කරනා කල්හි, ප්‍රසාදජනක සූත්‍රාන්තයන් ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි යන මෙම කාරණාත්‍රයයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය පිරිසිදු වේ. කුසීත පුද්ගලයන් දුරුකරනා කල්හි, ආරබ්ධ වීර්ය පුද්ගලයින් සෙවුනා කල්හි ආශ්‍රය කරනා කල්හි ඇසිරි කරනා කල්හි සම්‍යග් ප්‍රධන් වීර්යයන් ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි යන මෙම තෙ අයුරින් වීර්යෙන්ද්‍රිය පිරිසිදු වේ. මුලා සිහි පුද්ගලයින් දුරුකරනා කල්හි, එළඹ සිටි සිහි ඇති පුද්ගලයින් සෙවුනා කල්හි, ආශ්‍රය කරනා කල්හි, ඇසිරි කරනා කල්හි සතිපට්ඨානයන් ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි යන මෙම තෙඅයුරින් සතින්ද්‍රිය පිරිසිදු වේ. සන්සුන් නොවූ, පුද්ගලයින් දුරුකරනා කල්හි, සන්සුන් පුද්ගලයන් සෙවුනා කල්හි, ආශ්‍රය කරනා කල්හි, ඇසිරි කරනා කල්හි, ධ්‍යාන විමෝක්ෂයන් ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි යන මේ තෙඅයුරින් සමාධින්ද්‍රිය පිරිසිදු වේ. දුෂ්ප්‍රාඥ පුද්ගලයින් දුරුකරනා කල්හි නැණවත් පුද්ගලයින් සෙවුනා කල්හි, ආශ්‍රය කරනා කල්හි, ඇසිරි කරනා කල්හි, ගැඹුරු ඥාන චර්යා ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි යන මේ තෙඅයුරින් ප්‍රඥෙන්ද්‍රිය පිරිසිදු වේ. මෙසේ මේ පස්වැදෑරුම් පුද්ගලයින් දුරුකරනා කල්හි, පස්වැදෑරුම් පුද්ගලයින් සෙවුනා කල්හි, ආශ්‍රය කරන කල්හි ඇසිරි කරනා කල්හි සූත්‍රාන්ත පංචකයක් ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි යන මේ පසළොස් ආකාරයන්ගෙන් පංචෙන්ද්‍රියයන් පිරිසිදු වෙති. ශ්‍රද්ධාව පස්වැන්න වූ, විමුක්තිය මුහුකුරා යන (**සම්පූර්ණ** වන) අනෙකුත් ඉන්ද්‍රියයන් පසළොසකි. අනිත්‍ය සංඥාව, අනිත්‍යයෙහි දුකය යන සංඥාව, දුකෙහි

අනාත්ම සංඥාව, ප්‍රහාණ සංඥාව, විරාග සංඥාව යන මේ පහ ඉතා සියුම් කොටසට අයත් සංඥායි. කල්‍යාණ මිත්‍රතාවය, සීල සංවරය, මනාව කෙලෙස් තුනී කිරීම, වීර්යාරම්භය, ඉතා සියුම් ප්‍රඥාව යන මෙම පසලොස ඒවා අතර භික්මවිය යුතු අය දමනයෙහි දක්ෂ ශාස්තෘන් වහන්සේ, භික්මවිය හැකි මෙසිය තෙරුන්ගේ අදහස් වශයෙන් මෙහි කල්‍යාණ මිත්‍රාදී විමුක්තිය මුහුකුරා යන පංචධර්මයන් මුහුකුරා යාම සඳහා පවතින් යයි වදාරා ඒවා විස්තර කරනුයේ, **ඉධ මෙසිය කල්‍යාණමිත්තෙන හොති** යනාදිය වදාළහ. එහි **කල්‍යාණ මිත්තෙනා** යනු යහපත්, හඳ, සොඳුරු මිත්‍රයා ඔහුටනුයි කල්‍යාණ මිත්තෙනා. යම් සීලාදී ගුණයුත් පුද්ගලයෙක් පාපය නසනුයේ, යහපත නියම කරනුයේ වේද, එබඳු සියලු ආකාරයෙන් උපකාරී වූ, මිත්‍රයෙක් වේද, එම පුද්ගලයා කලණ මිතුරෙක්ම වේ. කියන ලද ආකාර ඇති යහපත් පුද්ගලයා සමගම සියලු ඉරියව්වන්හි සමග ගමන් කරයිද, පවතීද ඔවුන්ගෙන් වෙන් නොවේද, **ඒ කල්‍යාණ සහායොයි.** යහපත් පුද්ගලයින් කෙරෙහිම සිතින්ද කයින්ද **නිමිනතාවයේ** නම්‍රතාවයෙන්, ප්‍රවනතාවයෙන් පවතීනුයි **කල්‍යාණ සම්පවංකොයි** පදත්‍රයයෙන්ම කළණ මිතුරු ඇසුරෙහි ඇල්ම උපදවයි. ඒ මෙහි කළණ මිතුරු ලක්ෂණයයි. මෙලොව කළණ මිතුරු තෙමේ ශ්‍රද්ධාවත් වේ. සිල්වත් වේ. ඇසූපිරූ තැන් ඇත්තේ වේ. ත්‍යාගී වේ. වීර්යවත් වේ. ස්මෘතිමත් වේ. එකඟ වූ සිත් ඇතියේ වේ. නැණවත් වේ. එහි ශ්‍රද්ධා සම්පත්තියෙහිලා, තථාගතයන් වහන්සේගේ සම්බුද්ධත්වය, කර්මය හා විපාකයද විශ්වාස කරයි. එයින් සම්‍යග් සම්බුද්ධත්වයට හේතුභූත වූ සත්ත්වයින් කෙරෙහි පවත්නා හිතවත්භාවය අත් නොහරියි. සීල සම්පත්තියෙහිලා සබ්‍රම්සරුන්ට ප්‍රියමනාප වේ. සබ්‍රම්සරුන් විසින් ගරුබුහුමන් කටයුතු වේ. චෝදකයෙක් වේ. පාප ගර්හිතයෙක් වේ. වක්තෘ කෙනෙක් වේ. වදන් ඉවසන්නෙක් වේ. ඍත සම්පත්තියෙහිලා සිව්සස්, ප්‍රතීත්‍ය සමුත්පාදා දී ප්‍රතිසංයුක්ත ගැඹුරු කථාවන්ගේ කරන්නෙක් වේ. ත්‍යාග සම්පත්තියෙහිලා අල්පේච්ඡ, ලද දෙයින් සතුටුවීම විවේකයෙහි ඇලුනේ, (කුලයා සමග) නොගැටුනේ වේ. වීර්ය සම්පත්තියෙහිලා සත්ත්වයින්ගේ හිතසුව ප්‍රතිපත්තියෙහිලා ආරබ්ධ වීර්ය ඇත්තේ වේ. ස්මෘති සම්පත්තියෙහිලා එළවන ලද සිහි ඇත්තේ වේ. සමාධි සම්පත්තියෙහිලා අවික්ෂිප්ත වූයේ එකඟ වූ සිතැත්තේ වේ. ප්‍රඥා සම්පත්තියෙහිලා අවිපරීතව දැනගනී. හෙතෙම කුසල්ධම්හි සිහියෙන් ද යහපත් පැවැත්මෙන් ද යුක්ත වූයේ ප්‍රඥාවෙන් සත්ත්වයින්ගේ යහපත අයහපත තත්වාකාරයෙන් දැන, සමාධියෙන් එහි එකඟ සිත්

ඇත්තේ වී, වීර්යයෙන් සත්ත්වයින් කෙරෙහි පවත්නා වැරදි ක්‍රියාවන් වළක්වා නිවැරදි ක්‍රියාවන්හි යොදවයි. එහෙයින්

පියොච ගරු භාවනීයෝ - වත්තාච වචනක්ඛමෝ
ගම්භීරඤ්ච කථං කත්තා - නොචට්ඨානෙ නියොජයෙ'යි

යමෙක් ශීල සම්පත්තියෙන් ප්‍රිය වන්නේද, ගල් කුඩයක් මෙන් ගරු වන්නේද? ගුරු වශයෙන් සම්භාවනා කටයුතු වන්නේ ද, ආශ්‍රිතයින්ට අවවාද කරන්නේද, විචාල ප්‍රශ්න ඉවසනසුලු වූයේද, ගැඹුරු ධර්ම කියා දෙන්නේද? ස්වකීය ආශ්‍රිතයින් අස්ථානයෙහි නොයොදවන්නේ, සුදුසු තන්හිම යොදවන්නේද? ඔහු කලණ මිතුරෙකි.

අයං පයමෝ ධම්මෝ පරිපාකාය සංවත්තති යනු මෙම කල්‍යාණ මිත්‍රතාවය බ්‍රහ්මචර්ය වාසයට මූලික බව (මුල් කරුණ) වන හෙයින් සියලු කුශල ධර්මයන්ට ප්‍රධානභාවයෙන් ද මෙම පංච ධර්මයන්හි මුලදී කියන ලද හෙයින් ප්‍රථම නිරවද්‍ය ධර්මය අපිරිසිදු ශ්‍රද්ධාදීන්ගේ පිරිසිදු කිරීම වශයෙන් චෙතෝ විමුක්තිය ගේ මේරීම සඳහා පවතී. මෙහිද කල්‍යාණ මිත්‍රයාගේ බොහෝ ක්‍රියාකාරිත්වයද, ප්‍රධානතාවයද සලකා 'ස්වාමීනි, යම් මේ කල්‍යාණ මිත්‍රතාවයක් වේද, මෙය බ්‍රහ්මචර්ය වාසය සඳහා අඩක් ප්‍රයෝජනවත් වේයයි කියන්නා වූ ධර්ම භාණ්ඩාගාරික අනඳ තෙරහුට, ආනන්ද එසේ නොකියවයි දෙවරක් වළක්වා, ආනන්ද යම් ආකාර වූ කල්‍යාණ මිත්‍රතාවයක්, කල්‍යාණ සහායතාවක් වේද එය සමස්ත බ්‍රහ්මචර්යය සඳහාම ප්‍රයෝජනවත්ව පවතී යයි ආදී සූත්‍ර පදයන්හි දතයුත්තාහ. **පුනචපරං** යනු නැවත අන්‍ය ධර්ම කොටසක්. **සීලවා හොති** යනු මෙහි කවර අර්ථයෙන් සීල නම් වේද, හික්මීම් අර්ථයෙන් සීලයි. මෙම හික්මීම නම් කිම? කාය කර්මාදීන්ගේ එක්තැන් කිරීම, මනා පැවතුම් ඇතිකර ගැනීම් වශයෙන් නොවිසිරුණ භාවයයි අර්ථයි. නොහොත් ධ්‍යානාදී කුසල ධර්මයන්ට ආධාරකයක් වීම, පිහිටවීම් වශයෙන් ආධාර භාවයයි අර්ථයි. එහෙයින් සීලනය කෙරේ. සීලනය කරයිනුයි **සීලංයි** (සීලනය නම් සමාධානය හෝ උපධාරණයයි) මෙය ශබ්ද ලක්ෂණ ක්‍රමයෙන් සීල අර්ථයයි. සමහරු වනාහි ශීර්ෂාර්ථය, සීතලාර්ථය, හික්මීම් අර්ථය, සංවරාර්ථය, නිරුක්ති ක්‍රමයෙන් අර්ථ විර්ණනා කරති. ඒ මෙය සම්පූර්ණ කරන ලදුයේ, උසස් වශයෙන් සීලය ඔහුට ඇත්තේනුයි සීලවායි. සීලයෙන් යුක්ත වූයේ යයි අර්ථයි. යම්සේ සිල්වත්

වූයේ, සීල සම්පන්න වූයේ වේද, එය දක්වන්ට **පාතිමොක්ඛ සංවර සංවුතො** යනාදිය වදාළහ. එහි **පාතිමොක්ඛං** යනු ශික්ෂාපද සීලයයි. යමෙක් එය රකීද? ආරක්ෂා කරයිද? එය අපාගත වීම් ආදී දුක්වලින් ඔහු මුදවයි. මෝචනය කරයි. එහෙයින් ප්‍රාතිමෝක්ෂයයි කියයි. **හික්මවීම** සංවරයයි. කාය වචනයන්ගේ ශික්ෂාපද නොඉක්මවීමයි. ප්‍රාතිමෝක්ෂයම හික්මවූයේනුයි ප්‍රාතිමෝක්ෂ සංවරයයි. එයින් සංවර වූයේ වසන ලද කාය වාග් ඇත්තේනුයි පාතිමොක්ඛ සංවර සංවුතො නමැ. මේ එම සීලයෙහි ඔහුගේ පිහිටි බව විදහා දැක්වීමයි. **විහරති** යනු ඊට අනුරූප විහරණ යුක්තතාවය විදහා දැක්වීමයි. **ආචාර ගොචර සම්පන්නො** යනු යට ප්‍රාතිමෝක්ෂ සංවරයෙහිද මතු විශේෂාධිගමයන්ට, යෝගකාරක වූ උපකාරක ධර්ම දැක්වීමයි. **අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී** යනු ප්‍රාතිමෝක්ෂ සීලයෙන් ගිලිහී නොයන ස්වභාවය දැක්වීමයි. **සමාදාය** යනු ශික්ෂාපදයන්ගේ ශේෂ රහිතව ගැනීම දැක්වීමයි. **සික්ඛති** යනු ශික්ෂාවෙන් යුක්ත බව දැක්වීමයි. **සික්ඛාපදෙසු** යනු හික්මිය යුතු ධර්මයන් දැක්වීමයි.

වෙනත් ක්‍රමයක් :- කෙලෙසුන්ගේ බලවත් භාවයෙන්, පාප ක්‍රියාවන්හි පහසු බැවින්. පුණ්‍යක්‍රියාවන්හි දුෂ්කර බැවින්, අපායයන්හි වැටෙනසුලු වූයේනුයි පාතියි. පෘථග්ජනයා භව ආදීන්හි අනිත්‍යතායෙන් කර්ම වේගයෙන් විසිකළ ජලය උඩට ගන්නා යන්ත්‍රයක් මෙන්, අනවදානයෙන් කැරැකෙන ගමන් ස්වභාව යනුයි පාතියි. හැසිරීම් වශයෙන්, ඒ ඒ සත්ත්ව කොටස්වල ආත්මභාවයන්හි වැටෙනසුලු වූයේනුයි පාතියි. චිත්ත සන්තානය හෝ සිතම එම වැටීම්වලින් හා සසර දුකින් මුදවානුයි පාතිමොක්ඛයි. සිතෙහි මිදීමෙන් සත්ත්වයා මිදුනේ යයි කියයි. යූ.සේයි. 'සිතෙහි පිරිසිදුවෙන් පිරිසිදු වේ. තෘෂ්ණාවෙන් දැඩිකොට නොගෙන ආශ්‍රවයන්ගෙන් සිත මිදුණි. නොහොත් අවිද්‍යාදී හේතුයෙන් සසරෙහි වැටේ. යේ. පවතීනුයි පාතියි. අවිද්‍යාදී බාධක කෙලෙසුන්ගෙන්, තෘෂ්ණා සංයෝජනයන්ගෙන් යුක්තව සසර සැරිසරණ ස්ත්තවයින්ගේ යයි යූසේයි. එසේ වැටෙන්නා වූ සත්ත්වයාගේ තෘෂ්ණාදී කෙලෙසුන්ගෙන් මිදීම එයින් වේනුයි පාතිමොක්ඛායි. 'කණ්ඨඨාඨඨ කාලෙ' ආදීන්හි මෙන් සමාස සිද්ධිය දතයුතුය. නොහොත් දුක්වලින් **රකී.** දුක් විපත් විනාශ කරයිනුයි පාතියි. මෙහිලා සිත අදහස් කරයි. යූ.සේයි. **ලෝකය සිතින් ගෙන යයි. සිතින් එහා මෙහා අදින්නේය.** එසේ වැටෙන්නහුගේ මිදීම

එයින් වේනුයි පාතිමොක්ඛායි. එයින් අපා දුකෙහි සසර දුකෙහි වැටයිනුයි පාතියි. තෘෂ්ණාදි කිලිටි කරන ධර්මයන්ය. යූ.සේයි. තෘෂ්ණාව පුරුෂයා හටගන්වයි. පුරුෂයා තෘෂ්ණාව දෙවනකොට ඇත ආදිය, එම දුකින් මිදේනුයි පාතිමොක්ඛායි. නොහොත් මෙහි වැටෙයිනුයි පාතියි. ඡට් අධ්‍යාත්මික බාහිර ආයතනයන්ය. යූ.සේයි. ලෝකය සයකින් හටගත්තේය. සයකින් එක්ව විසීම (ආශ්‍රය) සයකින් කෙරේ. එයින් ආධ්‍යාත්මික බාහිරායතන සංඛ්‍යාත වැටීමෙන් මිදීමනුයි පාතිමොක්ඛායි. විපත්තිදායක වැටීම් ඔහුට ඇත්තේනුයි පාතියි. සංසාරයයි. ඉන් මිදීමනුයි පාතිමොක්ඛායි. නොහොත් සියලු ලෝකයට අධිපතිභාවයෙන් ධර්මේශ්වර භාග්‍යවතුන් වහන්සේ පතියයි කියයි. එතුමා කරුණකොට මිදේනුයි මොක්ඛායි. පතිහුගේ මෝක්ෂය එතුමා විසින් පණවන ලද්දේනුයි පතිමොක්ඛායි. පති මොකඛය මෙසේ පාතිමොකඛ විය. සියලු ගුණධර්මයන්ට එතුමා මූලික වීමේ හේතුයෙන්, උතුම් අර්ථයෙන් පති වූයේද, එතුමාණෝනුයි කියන ලද අර්ථයෙන් මෝක්ෂයනුයි පතිමොක්ඛායි. පතිමොකඛය මෙසේ පාතිමොකඛ විය. එසේම යූ.සේයි. පාති මොකඛං යනු එය ප්‍රමුඛය. එය ප්‍රධානයයි විස්තරයයි. නොහොත් පයන්නෙහි 'ප' කාරයෙහි අති යනු අත්‍යන්තාර්ථයෙහි නිපාතයි. එහෙයින් නොයෙක් ආකාරයෙන් සීමාව ඉක්මවා මුදවානුයි පාතිමොක්ඛංයි. මෙම සීලය තදංග වශයෙන් සමාධි සහිතව, ප්‍රඥා සහිතව, තෙමේ විෂ්කම්භන වශයෙන් සමුච්ඡේද වශයෙන් සීමාව ඉක්මවා නිදහස් කරයි මුදවයිනුයි පාතිමොක්ඛංයි. හිමියාගෙන් මිදේනුයි පතිමොක්ඛායි. ඒ ඒ ව්‍යතික්‍රම (ඉක්මවා යාම්) දෝෂයන්ගෙන් වෙන වෙනම මිදීමනුයි පතිමොක්ඛායි අර්ථයි. පති මොකඛයම පාති මොක්ඛංයි. මොක්ඛා යනු නිවනයි. එම මෝක්ෂයාගේ පිළිබිඹුව වූයේනුයි පති මොක්ඛායි. සීල සංවරය වනාහි සූර්යයාට අරුණෝද්ගමනය මෙන් නිර්වාණයෙහි හටගැනීමට ආධාර වූයේ සුදුසු පරිදි, කෙලෙස් නිවන හෙයින් එයට සමාන වූයේ නුයි පතිමොකඛයම පාතිමොක්ඛායි. මනාව පවතියි දුක මුදවයිනුයි පතිමොක්ඛංයි. පතිමොකඛයම පාතිමොක්ඛංයි. මෙසේ එතෙක් මෙහි පාතිමොකඛ ශබ්දයෙහි අර්ථය දතයුතුය. හික්මවයි. වසයි එය කරණ කොටගෙන යනුයි සංවරයි. ප්‍රාතිමෝක්ෂයම සංවරය වූයේ ප්‍රාතිමෝක්ෂ සංවරයයි. අර්ථ වශයෙන් වනාහි ඒ ඒ තැනින් ව්‍යතික්‍රමණය කළයුතු හෙයින් විරතීහුද, චේතනාද වේ. එම ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්ත වූයේ ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සංවර වූයේ යයි යූ.සේයි. විභංගයෙහි

යූ.සේයි. මෙම ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්ත වූයේ මනාව යුක්ත වූයේ එළැඹියේ මනාව එළැඹියේ උපන්නේ මනාව උපන්නේ යුක්ත වූයේ වේද? එහෙයින් ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සංවර වූයේ යැයි කියයි.

විහරති යනු ඉරියව් විහරණයෙන් වාසය කරයි. ඉරියව් පවත්වයි. පවතී. ආචාර ගොචර සම්පන්නෝ යනු උණගස් දීම් ආදී මිථ්‍යාජීවයාගේද, කායික නොසැලකිලිමත්කම් ආදීන්ගේ නොකිරීමෙන් සියලු ආකාරයෙන් දුරුකොට කායික වාචසික නීති නොඉක්මවීමයයි මෙසේ කියන ලද භික්ෂූන්ට යෝග්‍ය ආචාර සම්පත්තියෙන් යුක්තව, වෙසඟනන් ආදීන් ගැවසෙන නුසුදුසු ස්ථාන දුරුකොට පිණ්ඩපාත ආදී කාර්යයන්ට එළඹෙන්ට සුදුසු ස්ථාන සංඛ්‍යාත ගෝචරයෙන්ද යුක්ත හෙයින් ආචාර ගෝචරයන්ගෙන් යුක්තය. තවද යම් භික්ෂුවක් ශාස්තෘන් වහන්සේ කෙරෙහි, ගෞරව සහිත වූයේ, සැලකිලි සහිතව වූයේ, සබ්‍රහ්මචාරීන් කෙරෙහි ගෞරව සහිත වූයේ, සැලකිලි සහිත වූයේ, ලජ්ජාව හා භය යන ද්වයයෙන් යුක්ත වූයේ, මනාව හඳනා ලද්දේ, මනාව පොරවන ලද්දේ ප්‍රසාදජනක ඉදිරියට යාමෙන් ආපසු යාමෙන්, ඉදිරිය බැලීමෙන්, වටපිට බැලීමෙන්, අත් පා නැමීමෙන්, දිගහැරීමෙන් යහපත් අයුරු ඉරියව් පැවැත්මෙන් යුක්ත වූයේ ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු සහිත වූයේ, බොජුන්හි පමණ දනුයේ, නිදිවැරීමෙහි යෙදුනේ, සිහියෙන් හා මනා නුවණින් යුතු වූයේ, අල්පේච්ඡ වූයේ, ලද දැයින් තුටු වූයේ, විවේකයෙහි ඇලුනේ, ගිහියන් හා නොගැටුනේ, උසස් හැසිරීමට අදාල වත්පිළිවෙත්හි සකස්ව ක්‍රියා කරනුයේ ප්‍රීතිය බහුල වූයේ වෙසේද, මෙය ආචාර සම්පතැයි කියයි. ගෝචරය වනාහි උපනිස්සය, ආරක්ඛ, උපනිබන්ධ යැයි තෙයාකාරය. එහි යමෙක් දසකථා වස්තු ගුණයෙන් යුත්, කියන ලද ලක්ෂණයෙන් යුත් කළණ මිතුරන් ඇසිරිකොට, නො අසන ලද්ද අසයි. අසන ලද්ද පිරිසිදු කරයි. සැක දුරුකරයි. දෘෂ්ටිය ඍජු කරයි. සිත පහදයිද, යමෙක් අනුව පුහුණු වනුයේ, ශ්‍රද්ධාවෙන්, සීලයෙන්, ශ්‍රවණයෙන්, ත්‍යාගයෙන්, ප්‍රඥාවෙන් වැඩේද, මෙය යෝග්‍ය ඇසුර යයි කියයි. යම් භික්ෂුවක් ඇතුල්ගෙට පිවිසියේ, වීථියට පිලිපන්නේ යට හෙළන ලද ඇස් ඇතියේ, විය ගසක පමණ දුර බලමින්, සංවර වූයේ ඇවිදියි. ඇතෙකු, අශ්වයකු, රථයක්, පාබල හමුදාවක්, ස්ත්‍රියක, පුරුෂයෙකු, උඩ, යට, දිසානුදිසා බලමින් නොයයි. මෙය යෝග්‍ය ආරක්ෂාවයි. ලංව බඳනා ලද යෝග්‍යතාවය වනාහි සතර සතිපට්ඨානයෝය. යම්තැනක භික්ෂුව තම සිත ළංව බඳීද? භාග්‍යවතුන් වහන්සේ විසින් යූ.සේයි. භික්ෂුවට සිය පිය

උරුමයෙන් හිමි වූ යෝග්‍යතාවය කිමෙක්ද? යම් ආකාර වූ සතර සතිපට්ඨානයෙක් වේද එයයි. උපනිශ්‍රය යෝග්‍යතාවය පෙර කියන ලද හෙයින්, මෙහි අනෙක් ඒවා වශයෙන් යෝග්‍යතාවය දතයුතුය. මෙසේ කියන ලද ආකාර ඇති ආචාර **සම්පත්තියෙන්ද**, මෙම ගෝචර සම්පත්තියෙන්ද යුක්ත හෙයින් ආචාර, ගෝචර සම්පන්න වූයේ. **අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී** යනු අල්පමාත්‍ර බැවින්, ඉතා කුඩා වූද, නොදැන පත් සත් චාරිත්‍රයන්ට අයත් අකුසල සිත් ඉපැන්ම ආදී භේද ඇති දෝෂයන්හි බිය දක්නා සුලුවූයේ. **යම්කිසි** භික්ෂුවක් වනාහි පරමාණු මාත්‍ර දොසක්, යොදුන් හැටඅට දහසකට වඩා යොදුන් දහසක් උස මහාමේරු පර්වත රාජයා හා සමානව දකියි.

යමෙක් වනාහි ඉතා සැහැල්ලු දුබඛාසිත මාත්‍ර ඇවතක් පාරාජිකාවක් හා සමකොට දක්නේද, මොහුද ස්වල්පමාත්‍ර වූද වරදෙහි බිය දක්නා සුලුවූයේ නමැ. **සමාදාය සික්ඛති සික්ඛාපදෙසු** යනු ශික්ෂාපදයන්හි, හික්මිය යුතු යම්කිසිවක් වේද ඒ සියල්ලෙන් සියල්ල සර්වාකාරයෙන් සියල්ල ශේෂරහිතව මනාකොට ගෙන හික්මෙයි. පවත්වයි. සම්පූර්ණ කෙරේයයි අර්ථයි. අභිසලෙලබිකා යනු අභිශයින් කෙලෙසුන්ගේ තුනී කිරීම, ඒවාහි සියුම් බව සඳහා, ප්‍රහාණය සඳහා යෙදුනු ආකාරය, **චෙතො විවරණ සපපාය** යනු සිත වසාදමන නීවරණයන්ගේ දුර බව කිරීමෙන් සිතේ විවෘත කිරීම් සංඛ්‍යාත සමථ විදර්ශනාවන්ට සත්ප්‍රාය වූ, සමථ විදර්ශනාවම චිත්තයාගේ විවෘත කිරීමට ප්‍රකට කිරීමට සත්ප්‍රාය වූයේ උපකාරී වූයේනුයි චෙතො විවරණ සපපායායි. දැන් යම් නිර්වේදාදිය ගෙනඒමෙන් මෙම කථාව, මනාව කෙලෙස් තුනී කරන සිතෙහි ප්‍රකට කිරීමට සත්ප්‍රාය වූයේම නම් වේ. එය දක්වන්ට **ඒකන්ත නිබ්බිදාය** ආදිය යූ.සේයි. එහි **ඒකන්ත නිබ්බිදාය** යනු ඒකාන්තයෙන් සංසාර වෘත්ත දුකින් කලකිරෙනු පිණිස. **විරාගාය නිරොධාය** යනු ඒවායෙහිම නොඇල්ම සඳහා, නිරුද්ධ කිරීම සඳහා. **උපසමාය** යනු සියලු කෙලෙසුන්ගෙන් සන්සිඳීම සඳහා. **අභිඤ්ඤාය** සියලුම දතයුතු දෑ දැනගැනීම සඳහා. **සම්බොධාය** යනු සිව් මාර්ග අවබෝධය සඳහා. **නිබ්බාණාය** යනු අනුපදිසෙස නිවන පිණිස. ඒවාහි මුල තුයෙන් විදර්ශනාව යූ.සේයි. ද්වයයකින් මාර්ගය ද්වයයකින් නිර්වාණය යූ.සේයි. සමථ විදර්ශනා මුල්කොට නිර්වාණය අවසන්කොට ඇති මේ සියලු උතුරු මිනිස්දම්, දසකථා වස්තු ලාභීහුට හටගනී යයි දක්වයි. දැන් එම කථාව බෙදා දක්වනුයේ 'අපපිච්ඡකථා' ආදිය වදාළහ.

එහි **අපපිච්ඡා** යනු නොකැමැති වීම. එහි කථාව අල්පේච්ඡ කථාවයි. අල්පේච්ඡතාභාව ප්‍රතිසංයුක්ත කථාව හෝ අල්පේච්ඡ කථාවයි. මෙහිද අත්‍රිච්ඡ - පාපිච්ඡ, මහිච්ඡ, අපපිච්ඡ යයි කැමැතිවීම් වශයෙන් පුද්ගලයෝ සතර දෙනෙකි. ඔවුනතර තමා ලද ලාභය අනුව තෘප්තිමත් නුවූයේ මතු මත්තෙහි ලාභ බලාපොරොත්තු වනුයේ අත්‍රිච්ඡ නමැ. යමක් සඳහා,

චතුබ්භි අට්ඨඞ්ගමා - අට්ඨාහිව සොළස
සොළසහිව බත්තිංස - අත්‍රිච්ඡං චක්කමාසදෝ
ඉච්ඡා හසෙස පොසස්ස - චක්කං හමති මත්ථකෙ

සතරෙන් අටට, අටෙන් සොළසට, සොළසින් දෙතිසට වශයෙන් අත්‍රිච්ඡතා චක්‍රයෙන්, ආසාදිත වූයේ කැමැත්ත නැසුනා වූ, පුරුෂයාගේ මස්තකයෙහි චක්‍රය කැරකේ.

අත්‍රිච්ඡතාවය, ප්‍රමාණය ඉක්මවූ ලෝභයෙන්, ප්‍රමාණය ඉක්මවූ ලෝභ මදයෙන් යැයි ද යූ.සේයි. ලාභ, සත්කාර, කීර්ති ප්‍රශංසා බලාපොරොත්තුවෙන්, නැති ගුණ හැඟවීමේ අදහස පාපිච්ඡතාවයයි. යමක් සඳහා යූ.සේයිද? එහි නැති ගුණ පෙන්වීම කවරෙක්ද? ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා සන්නිශ්‍රිත පවිටු අදහස් ඇති පවිටු අදහසින් ගැලී, ප්‍රත්‍යය වැළැක්මෙන් හෝ, කෙළින් නොකියා කිට්ටුවෙන් කීම හෝ ඉරියව්වල හෝ මනාව තැබීම - පිහිටුවීම, මනාසේ පිහිටුවීම ආදියයි.

ඇති ගුණයන්ට ගරුබුහුමන් අපේක්ෂාවෙන්, ප්‍රතිග්‍රහණයෙහි ප්‍රමාණ නොදතුයේ **මහිච්ඡායි**. යමක් යූ.සේයිද? මෙලොව ඇතැමෙක් ශ්‍රද්ධාවත් වූයේ ජනතාව මා ශ්‍රද්ධාවත් අයෙකැයි දැනගනීවායි කැමැති වේ. සිල්වත් වූයේ ජනතාව මා සිල්වත් අයෙකැයි දැනගනීවායි කැමැති වේ ආදිය. එසේම ඔහුට වැදූ මවගේද සිත ගන්ට නොහැකි වේ. එහෙයින් එය කියයි.

අගාකඛත්තො සමුද්දොව - මහිච්ඡා චාපි පුග්ගලො
සකටෙහි පවචයෙ දෙනතු - තයො පෙතෙ අතපපියානි

ගිනි කන්ද, සමුදුර, මහත් ආශා ඇති පුද්ගලයාද යන එම තිදෙනට ගැල්වලින් ප්‍රත්‍යය දෙත්වා. එසේ දුන්නේ වී නමුත් අතෘප්තිකර වේ.

එම අත්‍රිච්ඡතාදී දෝෂයන් දුරින්ම දුරුකොට, සන්සුන් ගුණ සඟවන අදහසින්, ප්‍රතිග්‍රහණයෙහි පමණ දන්නේ අල්පේච්ඡ නමැ. හෙතෙම තමන් කෙරෙහි විද්‍යමාන වූද ගුණයන් වසනු, කැමැත්තෙන් ශ්‍රද්ධාවත් වූයේ ජනතාව මා ශ්‍රද්ධාවත් අයෙකැයි දනීවායි නොකැමැති වේ. සිල්වත් වූයේ, බහුශ්‍රැත වූයේ -පෙ- විවේකයෙහි ඇලුනේ, ආරබ්ධ වීර්ය ඇත්තේ -පෙ- එළැඹ සිටි සිහි ඇත්තේ, සමාහිත වූයේ -පෙ- ප්‍රඥාවත් වූයේ, ජනතාව මා ප්‍රඥාවත් අයෙකැයි දැනගනීවායි නොකැමති වේ. ඒ මෙය ප්‍රත්‍යය අල්පේච්ඡතාවය - ධුතංග, පර්‍යාප්ති අධිගම අල්පේච්ඡතාවයැයි සිව් වැදෑරුම්ය. එහි සිව්පසයෙහි අල්පේච්ඡ තැනැත්තේ, ප්‍රත්‍යය දායකයාද, දාන වස්තුව ද තම ශක්තියද බලා, ඉදින් දාන වස්තුව බහුල වේද, දායකයා ස්වල්පයක් දෙනු කැමැත්තේ වේද, එහිදී දායකයාගේ අදහස් සලකා ස්වල්පයක්ම ගනියි. ඉදින් දාන වස්තුව ස්වල්ප වේද, දායකයා බොහෝ දෙනු කැමැත්තේ වේද? දාන වස්තුවගේ වශයෙන් ස්වල්පයක්ම ගනියි. දාන වස්තුවද බොහෝ වූයේ, දායකයාද බොහෝ දෙනු කැමැත්තේ වේද, තමාගේ ශක්තිය දැන සුදුසු ප්‍රමාණයම ගනියි. මෙබඳු භික්ෂුව නුපන් ලාභ උපදවයි. උපන් ලාභ ස්ථාවර කරයි. දායකයන්ගේ සිත් ගනියි. ධුතංග සමාදන්ව විසීම තමා කෙරෙහි ඇති බව නොදන්වනු කැමැතියේ ධුතංගලෙපච්ඡායය. යමෙක් තමාගේ බහුශ්‍රැතභාවය දන්වන්ට නොකැමැති වේද? මේ පර්‍යාප්ති අල්පේච්ඡයාය. යමෙක් වනාහි සෝවාන් ආදීන් අතරත එක්තරා කෙනෙකුගේ තත්ත්වයට පැමිණ සබ්‍රම්සරුන්ටද, තම සෝවාන් ආදී ස්වභාවයන් දන්වන්ට නොකැමැති වේද, මේ අධිගම අල්පේච්ඡතාවයක් වේද? එය සමග සන්තෝෂය ප්‍රදර්ශනය කිරීම් ආකාරයෙන් ස්කන්ධ, අනුසස් පැහැදිලි කිරීමෙන්, එයට ප්‍රතිපක්ෂ අධික ආශා ඇති බව ආදී ප්‍රභේද ඇති ආශාචාරයෙහි (කැමැත්ත පැවැත්මෙහි) දොස් පැහැදිලි කිරීම් වශයෙන්ද පැවැති කථාව අල්පේච්ඡ කථාවයි. **සනතුට්ඨිකථා** යනු මෙහි සන්තුට්ඨි යනු තමා අයත් තමා විසින් ලද ප්‍රීතිය = සනතුට්ඨියි. නොහොත් විසම වූ ප්‍රත්‍යයන් පිළිබඳ කැමැත්ත අත්හැර සම ප්‍රීතිය සන්තුෂ්ටියයි. සන්සුන් අයුරින් පැවැති ප්‍රීතිය සන්තුෂ්ටියි. යූ.සේයි.

අතීතං නානුසොචනෙතා - නප්පජ්ජපමනාගතං
පච්චුප්පන්නෙන යාපෙනෙතා - සන්තුට්ඨොති පවුච්චති

ඉකුත් දෑ කෙරෙහි සෝක නොකරනුයේ - අනාගතයට බලාපොරොත්තු ඇතිකර නොගනිත්. වර්තමානයෙහි ලද පමණින් යැපෙනුයේ සතුටට පත්වූවෙකැයි කියනු ලැබේ.

යහපත් ආකාරයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදැන වදාල ක්‍රමවලින් ප්‍රත්‍යයන්ගෙන් සතුටුවීම - සන්තුෂ්ටියයි අර්ථ වශයේ වනාහි උස් පහත් කවරාකාර හෝ ප්‍රත්‍යයෙකින් සන්තෝෂ වීමයි. එය දොළොස් ආකාර වේ. කෙසේද යත්, සිවුරෙහි යථාලාභ සන්තෝෂය යථාබල සන්තෝෂය, යථා සාරුප්ප සන්තෝෂයයි ත්‍රිවිධය. පිණ්ඩපාතාදීන්හිද එසේය. එහි මේ ප්‍රභේද වර්ණනාවයි. මේ සස්නෙහි භික්ෂුව මනෝඥ වූ හෝ අමනෝඥ වූ සිවුරක් ලබයි. හෙතෙම එයින්ම යැපෙයි. අනෙකක් බලාපොරොත්තු නොවේ. ලදුයේද නොගනියි. මේ මොහුගේ සිවුරෙහි යථාලාභ සන්තෝෂයයි. එසේද වුවත් ප්‍රකෘතියෙන් දුර්වල වූයේ හෝ රෝගාබාධ ජරාවෙන් මැඩුනේ හෝ වේද? බර සිවුරක් පොරවනුයේ ක්ලාන්ත වේද? හෙතෙම සමාන පැවතුම් ඇති භික්ෂූන් සමග හුවමාරුකොට සැහැල්ලු සිවුරකින් යැපෙනුයේද සතුටට පත්වූයේම වේ. මේ මොහුගේ යථාබල සන්තෝෂයයි. අනෙක් භික්ෂුවක්, පටසිවුරු ආදීන්ගේ එක්තරා මහානර්ඝ සිවුරක් ලැබ මෙය පැවිදිව කලක් ගතවූ, බහුශ්‍රැත තෙරවරුන්ට සුදුසුය. මෙය ගිලන් වූ දුර්වල වූ ස්වල්ප ලාභ ලබනවුන්ට වේවායි ඔවුන්ට දී තමා කසල ගොඩවල් ආදියෙන් කඩමාලු ඇහිද, දෙපට සිවුරක් මසා හෝ ඔවුන්ගේ පැරණි සිවුරු ගෙන දරනුයේ ද තෘප්තියට පත්වූයේම වේ. මේ මොහුගේ සිවුරෙහි (සිවුර පිළිබඳ) යථා සාරුප්‍ය සන්තෝෂයයි. මෙ සස්නෙහි භික්ෂුව රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ පිඬු හෙළීමක් ලබයි. හෙතෙම එයින්ම යැපෙයි. අනෙකක් නොපතයි. ලැබෙනුයේ ද නොගනී. මේ මොහුගේ පිණ්පාතයෙහි යථාලාභ සන්තෝෂයයි. නැවතද වනාහි රූක්ෂ දෑ ප්‍රකෘතියෙන්ම අගුණය. ලෙඩට විරුද්ධ වූයේ හෝ වේ. දැඩි රෝගාබාධවලට පැමිණෙයි. එබඳු පිණ්ඩපාතය වළඳ රෝගියෙක් වේ. හෙතෙම ඒවා සමාන පැවතුම් ඇති භික්ෂුවකට දී, ඔහුගේ අතින් සත්ප්‍රාය බොදුනක් අනුභවකොට ශ්‍රමණ ධර්මය කරනුයේද සතුටු වූයේම වේ. මේ මොහුගේ පිණ්ඩපාතයෙහි යථාබල සන්තෝෂයයි. අනෙක් භික්ෂුවක් ප්‍රණීත පිණ්ඩපාතය ලබයි. හෙතෙම මෙම පිණ්ඩපාතය

පැවිදිව කලක් ගතවූවනට සුදුසු යයි සිවුරෙහි මෙන් ඔවුන්ට දී, ඔවුන්ගේ සන්තකයෙහි ඇති දැයක් ගෙන හෝ තමා විසින් පිඬු පිණිස හැසිර මිශ්‍ර ආහාරයක් පරිභෝග කරනුයේද සතුටු වූයේම වේ. මේ මොහුගේ පිණ්ඩපාතයෙහි යථා සාරුප්‍ය සන්තෝෂයයි. මෙ සස්නෙහි භික්ෂුව සිතට ප්‍රිය වූ හෝ නොවූ හෝ යටත් පිරිසෙයින් තණ කුටියකට හෝ තණ අතුරණ ලද ස්ථානයක් වූ සෙනසුනකට පැමිණෙයි. හෙතෙම එයින්ම සන්තෂ්ප වේ. නැවත අන්‍ය වඩා සුන්දර ස්ථානයකට හෝ පැමිණේද? එය නොගනී. මේ මොහුගේ සෙනසුන්හි යථාලාභ සන්තෝෂයයි. යම්තැනක වසනහුට අපහසුතා වේද, එබඳු ආබාධිත හෝ දුර්වලතා සහිත අයෙක් වේද, ඔහුට රෝගයට විරුද්ධ හෝ ස්වභාව විරුද්ධ සෙනසුනක් ලැබේද, හෙතෙම එය භික්ෂු සංඝයාට පරිත්‍යාගකොට, ඔහුගේ ආසන්නයෙහි පිහිටි සෙනසුනක වැස මහණදම් කරනුයේද සතුටුවූයේම වේ. මේ මොහුගේ සෙනසුන්හි යථාබල සන්තෝෂයයි. අනෙකෙක් ප්‍රණීත සෙනසුන් ප්‍රමාදයට හේතුවේයයි සලකා සොඳුරු සෙනසුන් ප්‍රාප්ත වූයේද නොපිළිගනී. මහා පිණැති බැවින් ලෙන්, මණ්ඩප, කූටාගාරාදී, ප්‍රණීත සෙනසුන් ලබයි. හෙතෙම ඒවා සිවුරු ආදියෙහි මෙන් චිර ප්‍රවෘජිතයින්ට ප්‍රදානය කොට යම්කිසි තැනක වසනුයේ ද සතුටට පත්වූයේම වේ. මේ මොහුගේ සෙනසුන්හි යථා සාරුප්ප සන්තෝෂයයි. මෙ සස්නෙහි භික්ෂුව රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ බෙහෙත් ලබයි. හෙතෙම එයින්ම තුටු වේ. අනෙකක් නොපතයි. ලබනුයේ ද නොගනියි. මේ මොහුගේ ගිලන්පසෙහි යථාලාභ සන්තෝෂයයි. නැවත ද වනාහි තලතෙලින් අවශ්‍යතා ඇත්තෙකු උක්පැණි ලබයිද හෙතෙම එය සහාග භික්ෂුවකට දී, ඔහුගේ අතින් තලතෙල් ගෙන බෙහෙත් කොට මහණදම් කරනුයේද සතුටු වූයේම වේ. මේ මොහුගේ ගිලන්පසෙහි යථාබල සන්තෝෂයයි. අනෙකෙක් මහ පිණැතියේ බොහෝ තලතෙල් මීපැණි උක්පැණි ආදී ප්‍රණීත බෙහෙත් ලබයි. හෙතෙම එය සිවුරු ආදිය මෙන්, චිර ප්‍රවෘජිතයින්ට දී ඔවුන්ට ගෙන එන ලද යම්කිසිවකින් බෙහෙත් කරනුයේද සතුටු වූයේම වේ. යමෙක් වනාහි එක් බඳුනක ගෝමුත්‍රද එක් බඳුනක චතු මධුරද තබා, ස්වාමීනි, කැමැති දෙයක් ගනු මැනැවැයි කියනු ලබන්නේ. ඉදින් ඔහුට ඒවා අතර කවර එකකින් වුවද රෝගය සන්සිඳේ. එහෙත් මෙම ගෝමුත්‍රය නම් බුද්ධාදී උතුමන් විසින් 'පූතිමූත්‍ර බෙහෙත ඇසුරුකොට පැවිද්ද පවතී. නුඹලා එම බෙහෙත පිළිබඳව (බෙහෙත සාදාගැනීම පාවිච්චිය) දිවි ඇති තෙක් උත්සාහ කටයුතු යයි වර්ණනා කරන ලද වචන සිහිකරනුයේ චතුමධුර, ප්‍රතික්ෂෙප කොට, ගෝමුත්‍රයෙන් බෙහෙත් කරනුයේ අතිශය

සතුටට පත්වූයේම වේ. මේ මොහුගේ ගිලන්පසෙහි යථාසාරුප්‍ය සන්තෝෂයයි. මෙවන් ප්‍රභේද ඇති සියලු සන්තෝෂයන් සතුටයැයි කියයි. එහෙයින් අර්ථ වශයෙන් වනාහි ලැබෙන හොඳ නරක කවර ආකාරයේ ප්‍රත්‍යයකින් වුව සතුටුවීම යැයි යූ.සේයි. එම සන්තෝෂය පැහැදිලි කිරීම් ක්‍රම සමග අනුසස් පැහැදිලි කිරීම් වශයෙන්, එයට විරුද්ධ අත්‍රිච්ඡතාදී භේද ඇති, ආශාවෙන් මඬනා ලද්දහුගේ ආදීනව දැක්වීම් වශයෙන් ද පැවැති කථාව සන්තුෂ්ටි කථායි. මින් මත්තෙහි කථාවන්හිද එම ක්‍රමයමැයි. විශේෂතා මාත්‍රයක්ම කියමු.

පවිවෙක කථා යන මෙහි කාය, චිත්ත, උපධි යැයි විවේකත්‍රයයෙකි. ඒවා අතර එක් පුද්ගලයෙකු සිටී. හිඳී. සයනය කරයි. ගමෙහි පිඬු පිණිස හැසිරේ. ආපසු එයි. සක්මන් අදිටයි. හැසිරේ. වාසය කරයි යයි මෙසේ සියලු ඉරියව්හි, සියලු කෘත්‍යයන්හි, සමූහයා සමග එකට විසීමේ ආශාව අත්හැර විවේක වාසය කාය විවේක නමැ. අටසමවත් චිත්ත විවේක නමැ. නිර්වාණය උපධි විවේක නමැ. යූ.සේයි. කෙලෙස්වලින් දුරු වූවන්ට කාය විවේකයද, නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුනවුන්ට චිත්ත විවේකයද, පිරිසිදු සිත් ඇති උතුම් පාරිශුද්ධතාවයන්ට පත්වූ උපධි රහිත, ලෞකික දැයින් වෙන් වූවන්ට උපධි විවේකයද වේ. විවේකයම පවිවේකයයි. විවේක ප්‍රතිසංයුක්ත කථාව පවිවේක කථාවයි.

අසංසඟ කථා යන මෙහි ශ්‍රවණ, දර්ශන, සමුල්ලපන, සම්භෝග කාය යැයි සංසර්ග පහකි. ඒවා අතර මෙ සස්නෙහි ඇතැම් භික්ෂුවක්, අසවල් නම් ගමෙහි හෝ නියම්ගමෙහි හෝ මනා රූ ඇති දැකුම්කළු, උතුම් රූප සෞන්දර්යයෙන් යුතු ස්ත්‍රියක් සිටියයි අසයි. හෙතෙම එය අසා, ගිලාබසී. පසුබසී. බඹසර (දරන්ට) නොකඩකොට පවත්වන්ට නොහැකි වේ. ශික්ෂා ප්‍රතික්ෂේප කොට ගිහිබවට පෙරළේ. මෙසේ විසභාග අරමුණු වශයෙන් උපන් කෙලෙස් සංවාසය ශ්‍රවණ සංසර්ග නමැ. භික්ෂුව ශ්‍රවණය නොකෙරේමය. තවද ඔහු තෙමේම මනා රූ ඇති, දැකුම්කළු, උතුම් රූප සෞන්දර්යයෙන් යුතු ස්ත්‍රියක් දකියි. හෙතෙම ඇය දිටි සැණින් ගිලා බසී. පස බසී. බඹසර (දරන්ට) නොකඩකොට පවත්වන්ට නොහැකි වේ. ශික්ෂා ප්‍රතික්ෂේප කොට ගිහි බවට පෙරළේ. මෙසේ විෂභාග අරමුණු දැකීමෙන් උපන් කෙලෙස් සංවාසය දර්ශන සංසර්ග නමැ. දැක ඔවුනොවුන් අල්ලාප සල්ලාප වශයෙන් උපන් කෙලෙස් සංවාසය සතුටු කථා සංවාසය නමැ. එකට එකතුව සිනාසීම් ආදියද

ඒවා සමගම සංග්‍රහ කෙරේ. තමා සතු යම්කිසිවක් කිසියම් ස්ත්‍රියකට දී හෝ නොදී, ඇය විසින් දෙන ලද කිසියම් වටිනා දැයක් පරිභෝග කිරීම වශයෙන් උපන් කෙලෙස් සංවාසය එක්ව කටයුතු කිරීමේ සංසර්ගය නමැ. මා ගමක ගේ අත්ගැනීම් වශයෙන් උපන් කෙලෙස් සංවාසය කාර්ය සංසර්ග නමැ. යම් ආකාර වූ මෙතෙමේ සමග ශෝකවන, සමග සතුටුවන සුවපත් අය අතර සුවපත්ව, දුකට පත් අය අතර දුක් ප්‍රාප්තව වැඩකටයුතු හටගත් කල්හි තමා එහි ප්‍රධානියා වශයෙන් උද්යෝගීව ක්‍රියාකාරී වෙයි යයි කියන ලද අනුලොම් නුවූ සංසර්ගයක් වූ ගිහියන් හා එක්ව වාසය කරයි. මෙවන් අනුලොම් නුවූ ගිහි සංසර්ගයද, කෙලෙස් හටගැන්මට හේතුකාරණා වූ සබ්‍රම්සරුන් සමග වන සංසර්ගයද ගැන්මට හේතුකාරණා වූ සබ්‍රම්සරුන් සමග වන සංසර්ගයද යන එම සියල්ල දුරුකොට, යම් ආකාර වූ, සසරෙහි අස්ථිරතාවයද සංවේගයද, සංස්කාර සහිත දැහි තියුණු භය සංඥාවද, ශරීරයෙහි පිළිකුල් සංඥාවද, සියලු අකුසලයන්හි පිළිකුල පෙරටු කොටැති හිරිඔතප්ප, සියලු ක්‍රියාවන්හි සිහිය විමසන නුවණ ද යන සියල්ල පිහිටුවා, නෙලුම්පත දියබිඳක් මෙන් හැමතැන නොඇලීම් ස්වභාවයක් වේද? මෙය සියලු සංසර්ග ප්‍රතිපක්ෂ හෙයින් අසංසගයි. ඒ හා යෙදුන කථා අසංසගග කථායි. **විරියාරම්භ කථා** යන මෙහි වීරයාගේ ස්වභාවය හෝ ක්‍රියාවනුයි වීර්යයයි. ක්‍රමානුකූලව ගමන් කළයුතු පැවැත්විය යුතු වූයේනුයි වීර්යයයි. වීර්යයද ඒකාන්තයෙන් අකුසල්දම්හි දුරුලීම සඳහා ද කුසල් දම්හි ඉපැත්ම සඳහාද ආධාර වන ආරම්භයකි. මෙය කායික චෛතසික යැයි දෙයාකාරය. ආරම්භ ධාතු නික්කම ධාතු පරක්කම ධාතුයැයි තෙයාකාරය. සම්‍යප්‍රධන් වීර්ය වශයෙන් සිව්වැදෑරුම්ය. යම් භික්ෂුවකට ගමන් කිරීමෙහිදී යම් ක්ලේශයක් උපන්නෙහිද, එම සියල්ලම සිටගෙන සිටින අවස්ථාවට පැමිණෙන්ට ඉඩ නොදෙයි. සිටීමෙහිදී උපන් ක්ලේශය හිඳ ගැනීමට, හිඳීමෙහි උපන් ක්ලේශය සයනාවස්ථාවට පැමිණෙන්ට ඉඩ නොදෙයි. ඒ ඒ තන්හිදීම, එළවෙකුගේ පා අනුව සැකසූ දණ්ඩෙන් කළු සර්පයෙකු මැඩ අල්වා ගන්නාක් මෙන්ද හිස එසවීමට නොදී වීර්ය බලයෙන් නිග්‍රහ කරයි. මෙසේ ඔහුගේ ආරබ්ධ වීර්යයාගේ වශයෙන් දතයුතුය. ඒ හා එකට යෙදුන කථා **වීර්යාරම්භ** කථායි. **සීලකථා** යනාදීන්හි සීලය, ලෞකික, ලෝකොත්තර වශයෙන් දෙයාකාරය. එහි ලෞකිකය. ප්‍රාතිමෝක්ෂ සංවර ආදී සිව් පිරිසිදු සීලයයි. ලෝකෝත්තරය මාර්ග සීලය හා ඵල සීලයයි. එසේම විදර්ශනාවට පාදක වූ සහ උපචාරයෙන් අටසමවත් ලෞකික **සමාධි** නමැ. මෙහි මාර්ග සම්ප්‍රයුක්ත වූයේ ලෝකෝත්තර **සමාධි** නමැ.

එසේම **පඤ්ඤාපි** ප්‍රඥාවද, ලෞකික වූයේ සුතමය - චින්තාමය - ධ්‍යාන සම්ප්‍රයුක්ත විදර්ශනා ඥානයද වේ. මෙහි විශේෂයෙන් විදර්ශනා ප්‍රඥාවද, ලෝකෝත්තර මාර්ග ප්‍රඥාවද, ඵල ප්‍රඥාවද ගතයුතුය. **විමුත්ති** යනු ආර්යඵල විමුක්තියද, නිර්වාණයද වේ. අනෙක් අය තදංග විෂ්කම්භන, සමුච්ඡේද විමුක්තීන්ගේ වශයෙන්ද මෙහි අර්ථ වර්ණනා කරති. **විමුත්තිඤාණ දස්සනමපි** යනු එකුන් විසිවැදැරුම් ප්‍රත්‍යවේක්ෂණ ඤාණයෝය. මෙසේ මේ සීලාදීන් සමග පෙන්වීම් ආකාරයෙන් නොයෙක් ආකාර ස්කන්ධ අනුසස් පැහැදිල කිරීම් වශයෙන්ද, එයට විරුද්ධ දුශ්ශීල්‍යාදීන්ගේ දොස් පැහැදිලි කිරීම් වශයෙන් ද පැවැති කථාවද, ඒ හා බැඳි කථා ද සීලාදි කථා නමැ. මෙහිද 'තමාද අල්පේච්ඡ වේ. අනෙකාට අල්පේච්ඡ කථා කරනුයේ කවරාකාර වූ හෝ සිවුරකින් සතුටු වූයේ වේ. කවරාකාර වූ සිවුරකින් සතුටුවීමෙහි ගුණ කියන්නේද වේ යනාදී වචනයෙන්ද තෙමේ අල්පේච්ඡතාදී ගුණයෙන් යුක්ත වූයේ අන්‍යයාද ඒ සඳහා හිතාධ්‍යාශයෙන් යෙදවිය යුතුය. එබඳු කථා මෙහි මනාව කෙලෙස් තුනී කිරීම් ආදී වශයෙන් වෙසෙසා කියන ලදුයේ අල්පේච්ඡකථා ආදිය යැයි දතයුතුය. කාරකයාගේ වශයෙන්ම කථාව විශේෂයෙන් අදහස් කරන ලද අර්ථය සිදුකරයි.

එසේම කියයි. මේසිය එය කල්‍යාණමිත්‍ර භික්ෂුවට කැමති විය යුතුය. -පෙ- අපහසුවකින් තොරව ලබන අයෙකියි, **එවරූපියා** යනු මෙබඳු වූ කියන ලද අයුරු, **නිකාමලාභී** යනු කැමැති පරිදි ලබන රුචි පරිදි ලබන, හැමකල්හි මෙම කථා අසන්ට, විචාරන්ට සුවසේ ලබනුයේ, අකිච්ඡලාභී යනු නිදුකින් ලබනුයේ **අකසිරලාභී** යනු මහත් සේ ලබන, ආරද්ධ විරියෝ යනු එසවූ වීර්ය ඇති, **අකුසලානං ධම්මානං පහානාය** යනු අදක්ෂතාවයෙන් හටගත් යන අර්ථයෙන් වූ අකුසල පාප ධර්මයන්ගේ දුරුකිරීම සඳහා, **කුසලානං ධම්මානං** යනු පිළිකුල් දෑ සොලවන ආදී අර්ථයෙන් ද, නිරවද්‍යාර්ථයෙන්ද, කුසලයන්ගේ විදර්ශනාවන්ගේ හා මාර්ගඵල ධර්මයන්ගේ, **උපසම්පදාය** යනු සපයාගැනීම සඳහා, තම සන්තානයෙහි උපදවා ගැනීම සඳහා, **ථාමවා** යනු බලවත් උත්සාහ සංඛ්‍යාත වීර්ය බලයෙන් යුක්ත වූයේ, **දළ්හ පරක්කමෝ** යනු ස්ථිර බලය - නොලිහිල් වීර්යය, **අනික්ඛිත්තධුරෝ** යනු බහා නොහෙළන ලද වීර්ය ඇතියේ, නොපසුබස්නා වීර්යයෙන්, **පඤ්ඤවා** යනු විදර්ශනා ප්‍රඥායෙන් ප්‍රඥාවත් වූයේ, **උදයත්ථ ගාමිනියා** යනු පංච ස්කන්ධයන්ගේ හටගැන්මද නැස්මද අවබෝධ කරනුයේ, **අරියාය** යනු විෂ්කම්භන වශයෙන්

කෙලෙසුන්ගෙන් දුරස්ථව දුරෙහි පිහිටි නිදොස් වූ, **නිබ්බධිකාය** යනු තියුණු අවබෝධයට අයත්, **සම්මා දුක්ඛක්ඛය ගාමිනියා** යනු සංසාර වෘත්ත දුක ක්ෂය කරන හෙයින් දුක්ඛයාගේ ක්ෂයයැයි ලද නම් ඇති, ආර්ය මාර්ගයෙහි යහපත් හේතුයෙන් ක්‍රමයෙන් යනුයේ, මෙම පංච ධර්මයන්හි, **සීල**යද, වීර්යයද ප්‍රඥාවද, යෝගීහුගේ ආධ්‍යාත්මික අංග වේ. අනෙක් ද්වයය සෙසු සිව් ආකාරය කැමැති වේ. මෙහි කලණ මිතුරාගේම බොහෝ උපකාරවත් බව දක්වන්නා වූ, ශාස්තෘන් වහන්සේ මෙඝිය එය කලණ මිතුරු ඇසුරැති භික්ෂුව විසින්ම කැමැති විය යුතුයැයි ආදියෙන් දේශනය වඩයි. එහි **පටිකංඛං** යනු ඒකාන්තයෙන් කැමැති විය යුතුය. එක්නාත්යෙන් වන්නේ යයි අර්ථයි. **යං** යනු ක්‍රියා පරාමර්ශනයයි මෙය යූ.සේයි. **සීලවා භවිස්සති** යනු යම් ඒ කලන මිතුරු භික්ෂුවක් සිල්වත් බැව්හි වීම සීල සම්පන්නතාවයයි. එම භික්ෂුවගේ සිල්වත්භාවය හෙයින්ද, එය ඔහුට කැමතිවිය යුතුය. ඒකාන්තයෙන් වන්නේය. ඒකාන්තයෙන්ම ඔහුගේ එහි යෙදීමෙනැයි අදහසයි. **පාතිමොක්ඛ සංවර සංවුතෝ විහරිස්සති** යනාදීන්හිද එම ක්‍රමයමැයි මෙසේ භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සහිත ලෝකයෙහි උතුම් කලන මිතුරු සංඛ්‍යාත තම වදන් නොසලකා වනලැහැබට පිවිස එබඳු විකෘති ආකාරයකට පත් ඇවැත් මෙඝියට කලක මිතුරුතා ආදියෙන් සියලු සාසනික ධ්‍යාන, මාර්ග, නිර්වාණ ආදී සම්පත් සැදෙන අයුරු පෙන්වා, දැන් එහි ඇල්ම හටගත් ඔහුට, පෙරයම් කාම විතර්කාදියෙන් උවදුරට පත් හෙයින් කමටහන් ප්‍රමාදයට ඍජු විරුද්ධ වූ භාවනා ක්‍රමයක් ප්‍රකාශකොට ඉන් මත්තෙහි අර්හත්වයට කමටහන් දෙසනුයේ **තෙනව පන මෙඝිය භික්ඛුනා ඉමෙසු පඤ්චසු ධම්මෙසු පතිට්ඨාය චත්තාරෝ ධම්මා උත්තරිං භාවෙතබ්බා** යනාදිය වදාළහ. එහි **තෙන** යනු මෙසේ කලන මිතුරු ආශ්‍රය සහිත, කියන ලද ආකාර ඇති සීලාදී ගුණයෙන් යුතු යමෙකු විසින්, එහෙයින් **ඉමෙසු පඤ්චසු ධම්මෙසු පතිට්ඨාය** යැයි වදාළහ. **උත්තරිං** යනු අරඹන ලද තරුණ විදර්ශනාවෙහිදී ඉදින් රාගාදී උවදුරු උපදින්නාහුද? ඒවාහි පිරිසිදු කිරීම සඳහා ඉන් මත්තෙහි, **චත්තාරෝ ධම්මා භාවෙතබ්බා** යනු ඉපදවිය යුත්තාහ. වැඩිය යුත්තාහ. **අසුභා** යනු එකොලොස් අශුභ කමටහන් අතර, සුදුසු පරිදි, යම්කිසි අශුභ භාවනාවක, **රාගස්ස පහානාය** යනු කාමරාගයාගේ දුරැලීම සඳහා මෙය ඇල්වී කපන්නාගේ උපමාවෙන් දතයුතුය. එක් පුරුෂයෙක් දෑකැත්ත ගෙන අගසිට ඇල්කෙතෙහි ඇල් වී කපයි. ඉක්බිති ඔහුගේ වැට බිඳ ගවයෝ ඇතුල් වූහ. හෙතෙම දෑකැත්ත පසෙක තබා, කෝටුවක් ගෙන එම මාර්ගයෙන්ම ගවයින් බැහැරකොට

වැට ප්‍රකෘතිමත් කොට නැවත දැකැත්ත ගෙනා ඇල්වී කැපීය. එහි ඇල් කෙත මෙන් බුදුසසුන දතයුතුය. ඇල් වී කපන්නා මෙන් යෝගාවචරයාද, දැකැත්ත මෙන් ප්‍රඥාවද, ගොයම් කපන කාලය මෙන් විදර්ශනාවෙහි කටයුතු කරන කාලයද, කෝටුව මෙන් අසුභ කමටහන ද, වැට මෙන් සංවරයද, වැට බිඳ ගවයින්ගේ පිවිසීම මෙන් වහා නුවණින් නොසැලකීමෙන් ප්‍රමාදයට පැමිණ රාගයෙහි ඉපැත්මයි. දැකැත්ත පසෙක තබා, කෝටුව ගෙන පිවිසි මගින්ම ගවයින් බැහැරකොට වැට නැවත ප්‍රකෘතිමත් කොට, සිටි ස්ථානයෙහි සිට ඇල් කැපීම මෙන් අසුභ කමටහනින් රාගය මැඩපවත්වා, නැවත විදර්ශනා ක්‍රියා අරඹන කාලයයි. මේ මෙහි උපමා උපමේය සංසන්දනයයි. මෙසේ වූ භාවනා ක්‍රමය සඳහා රාග ප්‍රහාණය සඳහා අසුභ (භාවනා) වැඩිය යුතුයයි යූ.සේයි. **මෙත්තා** යනු මෛත්‍රී කමටහනයි. **බ්‍යාපාදස්ස පහානාය** යනු කියන ලද අයුරින්ම උපන් කෝපය දුරුකිරීම සඳහා, **ආනාපාන සති** යනු සොළොස්වස්තුක ආනාපාන සතිය. **විතක්කූ පවෙච්ඡදාය** යනු කියන ලද අයුරින්ම උපන් විතර්කයන්ගේ සිඳ දැමීම සඳහා **අසම්මාන සමුග්ඝාතාය** යනු මම වෙමියි උපදින නව වැදෑරුම් මාන මුලුමනින් සිඳලීම සඳහා, **අනිච්ච සඤ්ඤිනෝ** යනු පැවත විනාසයට පත්වන හෙයින්, හටගැනීම් විනාශවීම් ස්වභාවයන්ට අයත්, ලෙහෙසියෙන් බිඳී යන හෙයින් තාවකාලික වශයෙන් නිත්‍යය යන්න ප්‍රතික්ෂේප කරන හෙයින්, සියලු සංස්කාර අනිත්‍යයැයි පැවති අනිත්‍යය අනුව නුවණින් බැලීම් වශයෙන් අනිත්‍ය සංඥා ඇත්තහුට, **අනත්ත සඤ්ඤා සණ්ඨාති** යනු අසාර හෙයින් ද, සිය වසඟයෙහි නො පවත්නා හෙයින්ද, ස්වකීය නොවූ හෙයින්ද, හිස් වූයේ, ගතයුත්තක් නොමැති හෙයින්ද, හරයක් නොමැති හෙයින්ද, ශූන්‍ය හෙයින්ද සියලු ස්වභාව ධර්මයන් අනාත්මයැයි මෙසේ පවත්නා, අනාත්මානුපස්සනා සංඛ්‍යාත අනාත්ම සංඥාව සිතෙහි පිහිටයි. ඉතා දැඩිව පිහිටයි. අනිත්‍ය ලක්ෂණය දිටි කල්හි අනාත්ම ලක්ෂණය දිටියේම වේ. ත්‍රිවිධ ලක්ෂණයන්හි එකක් දිටිකල්හි අනෙක් ද්වයය දිටියේම වේ. එහෙයින් **අනිච්ච සඤ්ඤිනෝ මෙසිය අනත්ත සඤ්ඤා සණ්ඨාති** යි යූ.සේයි. අනාත්ම ලක්ෂණය මනාව දිටි කල්හි මම වෙමියි උපදිනු ලබන මැනීම මුලිනුපුටා දමන ලද්දේම වේයයි වදාළ සේක. **අනත්තසඤ්ඤී අසම්මාන සමුග්ඝාතං පාපුණාතියි. දිට්ඨෙව ධම්මෙ නිබ්බානං** යනු ඉහාත්මයෙහිම මෙම ආත්ම භාවයෙහිදීම පැවතීම් විරහිත නිර්වාණයට පැමිණේ. මෙහි මේ සංක්ෂේපයයි. විස්තර වශයෙන් වනාහි අසුභ ආදී භාවනා ක්‍රම විශුද්ධි මාර්ගයෙහි කියන ලද

ක්‍රමයෙන් ගතයුතුය. **එතමත්ථං විදිත්වා** යනු එම ආයුෂ්මත් මේසියගේ මිථ්‍යා විතර්ක නමැති සොරුන් විසින් කුසල් නමැති භාණ්ඩ විනාශ කිරීම සංඛ්‍යාත අර්ථය දැන, **ඉමං උදානං** යනු මෙම කාම විතර්කාදීන්ගේ දුරු නොකිරීමෙහි ආදීනවද, දුරුකිරීමෙහි අනුසස්ද දැක්වීමට මෙම උදන් ඇනූ සේක.

එහි **බුද්ධා** යනු නීච, ලාමක, **විතක්කා** යනු, කාම විතර්කාදී පාප විතර්කත්‍රයය. සියලු විතර්කයන්ගෙන් අධම (නීච) බැවින් මෙහි කුඩා යැයි යූ.සේයි. 'නව බුද්ධං සමාචරේ' ආදීන්හි මෙනි. **සුබුමා** යනු සියුම් විතර්කාදීහු අදහස් කරන ලදී. ඤාති විතර්ක - ජනපද විතර්ක - අමර විතර්ක, අන් අය කෙරෙහි පවත්නා අනුකම්පා ප්‍රතිසංයුක්ත විතර්ක ලාභ සත්කාර ගුවර්ණනා ප්‍රතිසංයුක්ත විතර්ක, අනවඤ්ඤතති ප්‍රතිසංයුක්ත වූ හෝ විතර්කදැයි යන එම විතර්ක කාම විතර්කාදීන් මෙන් දරුණු නොවෙතියි දළ ස්වභාව නොමැති හෙයින් සියුම්යැයි යූ.සේයි. **අනුගතා** සිතින් අනුවර්ත වූවාහු, විතර්කයන් උපදනා කල්හි සිත ඒ හා අනුගියාහුම වෙයි. එම අරමුණට මනාකොට නංවන හෙයින්. අනුගගතායිද පෙලයි. අනුව සිටියේයයි අර්ථයි. **මනසෝ උබ්බිලාපා** යනු සිතෙහි මතුවීම් ඇතිකරන. **එතෙ අවිඳ්‍වා මනසෝ විතක්කෙකතී** යනු එම කාම විතර්කාදී වූ මනෝ විතර්කයන්, ආශ්වාද ආදීනව නිඃසරණ වශයෙන්, ඤාත, තීරණ, ප්‍රහාණ යන පරිඥාවන්ගෙන් තත්වාකාරයෙන් නොදන්නේ, නුරා **නුරං ධාවති භනත චිත්තෙතා** යනු ප්‍රහීණ නොවූ මිථ්‍යා විතර්ක හෙයින්, ස්ථිරව නොපිහිටි සිතැත්තේ කිසිකලෙක රූපයන්හිද, කිසිකලෙක ශබ්දයන්හිදැයි ආදි වශයෙන් ඒ ඒ අරමුණෙහි ආශ්වාදාදි වශයෙන් ඔබිනොබ **ධාවති** දුවයි. කැරකේ. නොහොත් නුරා නුරං **ධාවති භනත චිත්තෙතා** යනු සම්පූර්ණයෙන් දැන නොගත් විතර්ක හෙයින් ඒ නිමිත්තින් අවිද්‍යා තෘෂ්ණාදීන්ගේ වශයෙන් කැරකෙනු ලබන සිතැතියේ මෙලෝ පරලෝ වශයෙන් තදින් ගැනීම් බැහැර තැබීම්වලින් ඔබිනොබ දුවයි. හැසිරේයයි අර්ථයි. **එතෙව විඳ්‍වා මනසෝ විතක්කෙකති** යනු එම කියන ලද ප්‍රභේද ඇති කාම විතර්කාදී මනෝ විතර්කයන් ආශ්වාදාදි වශයෙන් තත්වූ පරිදි දන්නේ, **ආතාපියෝ** යනු වීරියවත් වූයේ. **සංවරති** යනු වසයි. **සතිමා** යනු සිහියෙන් යුක්ත වූයේ, **අනුගගතෙ** යනු දුලබ වශයෙන් නූපන් මෙය යූ.සේයි. එම කියන ලද ආකාර ඇති කාමවිතර්කාදී මනෝ විතර්කයන්, සිතෙහි මතුවීම්වලට හේතුවන බැවින්, සිතෙහි කාම

විතර්කාදීන් මතුවන කල්හි නැණවතා විදර්ශනා ප්‍රඥා සහිත මාර්ග ප්‍රඥාවෙන් මනාකොට දන්නේ, එයට සහාය වූ, සම්‍යග් ව්‍යායාම, සති ආදීන්ගේ විද්‍යමාන හෙයින් තෙලෙස් තවන වීර්යයෙන් යුක්ත වූ, සිහි ඇති ඔවුහු ආර්ය මාර්ග භාවනාවෙහි ඉපැත්මට සුදුසු තත්ත්වයක් නොමැති කල්හි අනුගතෙ මාර්ගක්ෂණයෙහි නුපන් කල්හිම, **සංවරති** යනු ඤාණ සංවර වශයෙන් වසයි. පැමිණෙන ගමන් මාර්ගය සිඳලයි. මෙසේ වූයේද, සිව්සස් අවබෝධයෙන් අවබෝධ කරගත් ආර්ය ශ්‍රාවකයා අර්හත්වාධිගමයෙන් **අසෙසං** යනු එම කාමවිතර්කයන් ශේෂ රහිතව පජහාසි මුල් සිඳලීය. මෙහි අනුගතෙයි ද කියවති. එහි අර්ථය යට යූ.සේයි.

ප්‍රථම සූත්‍ර වර්ණනාව නිමියේ ය.

4-2

දෙවැන්නෙහි කුසිනාරායං යනු කුසිනාරා නම් මල්ල රජවරුන්ගේ නගරයෙහි, **උපවත්තනෙ මලලානං සාලවනෙ** යනු අනුරාධපුරයට ථූපාරාමය යම්සේද? එසේම කුසිනාරාවෙහි උයන දකුණු-බස්නාහිර දිසාවෙහි වේ. යම්සේ ථූපාරාමයෙහි දකුණු දොරින් නුවරට පිවිසෙන මාර්ගය නැගෙනහිර අභිමුඛව ගොස් උතුරෙන් නවතියි. මෙසේ සල්ගස් පෙළ නැගෙනහිර දිසාභිමුඛව ගොස් උතුරින් නැවතින. එහෙයින් උපවර්තනයයි කියයි. ඒ උපවර්තන නම් මල්ල රජවරුන්ගේ සල්වනයෙහි, **අරඤ්ඤ කුටිකායං** යනු සල්ගස් පෙළට නුදුරෙහි වෘක්ෂ හා පඳුරුවලින් වැසුන කරන ලද කුඩා කුටියෙහි, ඒ සඳහා අරඤ්ඤ කුටිකායං විහරතියි යූ.සේයි. එම භික්ෂූහු වැටහීම් විරහිත වූවාහු හැරදමන ලද වීර්ය ඇත්තාහු. ප්‍රමාද විහාරීහුය. එහෙයින් **උදධතා** ආදිය යූ.සේයි. එහි නොසන්සුන් බව බහුල හෙයින්, නොසන්සුන් සිතැති හෙයින් නොසන්සුන් වූවාහු, හිස් බැවින් මානය නළයක් මෙනැයි තළයි. මාන සංඛ්‍යාත උස්ව නැගි නළ ඔවුන්ටනුයි උනනළායි. උස්ව නැගි හිස් මානය යැයි අර්ථයි.

පා සිවුරු සැරසීම් ආදී වූ චපල බැවින් යුක්ත වූ හෙයින්ද බහුලව යෙදුන හෙයින් **චපලායි**. එරුස වචන හෙයින් මුඛයෙන් රළු වූයේනුයි **මුඛරායි. තිරිසන්** කථා බහුල බැවින් පැතිරුණි. ව්‍යාකුල වචන ඔවුන්ටනුයි **විකිණණ වාචායි.** මුළා වූවාහු හට සිහි ඔවුන්ටනුයි **මුට්ඨස්සතිනොයි. සිහි** විරහිත වූවාහු ප්‍රමාද විහාරීහුයයි අර්ථයි. සියල්ලෙන් සියල්ල විමසන නුවණ අභාවයෙන් **අසම්පජානායි.** තන පුඩුව වරක් ඉරීම තරම් කාලයක් සිත එකඟ කිරීමෙහි යෙදීමක් නොමැති හෙයින් සමාහිත නොවූයේනුයි **අසමාහිතායි.** ලොල් ස්වභාව හෙයින් කම්පිත මුවන් හා සමාන ස්වභාව හෙයින් **විබභනත චිත්තායි** මනස සවැනි කොට ඇති ඉන්ද්‍රියයන්ගේ අසංවරණයෙන් අසංවර ඉන්ද්‍රියතාව හෙයින් **පාකතින්ද්‍රියායි. එතමත්ථං විදිත්වා** යනු එම භික්ෂූන්ගේ උදධච්ච ආදී වශයෙන් ප්‍රමාද විහරණය දැන, **ඉමං උදානං** යනු මෙම ප්‍රමාද විහරණයෙහිද, අප්‍රමාද විහරණයෙහිද, පිළිවෙළින් ආදීනව හා ආනිසංස පැහැදිලි කිරීමට උදන් ඇනූ සේක. එහි **අරකඛිතෙන** යනු සිහිය නමැති ආරක්ෂාව අභාවයෙන් නොරක්නා ලද. **කායෙන** යනු ඇට විඤ්ඤාණ කයින්, චක්ෂුර් විඤ්ඤාණයෙන් රූපයක් දැක, එහි නිමිති අනුව්‍යංජන ගැනීම් වශයෙන්, විඤ්ඤාණ ද්වාරයාගේ අභිධාවී වශයෙන් පවත්නා තත්ත්වයන්හිදී, සිහියෙන් නො රක්නා හෙයින්, ශ්‍රොත විඤ්ඤාණාදීන්හිද එම ක්‍රමයමැයි. මෙසේ ඇට විඤ්ඤාණ කායයාගේ නොරක්නා ලද බව සදහා වදාළහ. **අරකඛිතෙන කායෙන** යැයි. සමහරු වනාහි කායෙන යැයි අර්ථ කියති. ඒවාටද කියන ලද ක්‍රමයෙන්ම අර්ථ යෙදීම ඇතිකල්හි යෙදෙන්නේය. අනෙක් අය **අරකඛිතෙන චිත්තෙන** යැයි කියති. ඒවාටද කියන ලද ක්‍රමයම අර්ථයි. **මිච්ඡා දිට්ඨිගතෙන** යනු ශාස්වතාදී මිථ්‍යාදෘෂ්ටීන්හි පිහිටුවීම් වශයන්, **ථීනමිද්ධාභි භූතෙන** යනු සිතෙහි අකර්මණ්‍යතා ලක්ෂණය වූ ථීනයෙන්ද, කයෙහි අකර්මණ්‍යතා ලක්ෂණය වූ මිද්ධයෙන්ද වසා පැහිර සිටීමෙන්, එම කයින් සිතින් යයි සම්බන්ධයයි. **වසං මාරස්ස ගච්ඡති** යනු ක්ලේශ මාරාදී වූ සියලුම මාරයින්ට සිතැඟි පරිදි කටයුතු කළහැකි තත්ත්වයට එළැඹේ. ඔවුන්ගේ විෂය පථය නොඉක්මවතියි අර්ථයි. මෙම ගාථාවෙන් භාග්‍යවතුන් යම්කෙනෙක් සිහිය නමැති ආරක්ෂකයාගේ අභාවයෙන් සර්වප්‍රකාරයෙන් නොරක්නා ලද සිතැතියේ, මනා නුවණින් මෙනෙහි කිරීමට හේතු වූ ප්‍රඥාවගේ අභාවයෙන් නුනුවණින් කිඳුබැසීම් වශයෙන් අනිත්‍යයෙහි නිත්‍යයැයි ආදී වශයෙන් විපරීතග්‍රාහී වූයේ, එයින්ම කුසල් ක්‍රියාවන්හි, වීර්ය ඇරඹීම් අභාවයෙන් කුසීතකමින් මඬනා ලදුයේ සංසාර

වෘත්ත දුකින් හිස නොඔසවන්නාහුයයි ප්‍රමාදීව වාසය කරන එම භික්ෂූන්ට ගර්හා කරන නියායෙන්, සංසාර වෘත්තය පෙන්වා, දැන් සසරින් වෙන්වීම පෙන්වන්ට **තසමා රක්ඛිත චිත්තසස** යන දෙවන ගාථාව වදාළ සේක. එහි **තසමා රක්ඛිත චිත්තසස** යනු යම්හෙයකින් නොරක්නා ලද සිතැතියේ මාරයාට සිතැඟි පරිදි කටයුතු කළ හැකි බවට පත්ව සසරෙහිම සැරිසරයි. එනිසා සිහිය නමැති සංවරයෙන් මනස සවැනි කොටැති, ඉඳුරියයන්ගේ රැක්මෙන් වැස්මෙන්, රක්නා ලද සිතැතියේ වන්නේය. සිත රක්නා ලද කල්හි ඉඳුරියයන් රක්නා ලද්දාහුම වෙති. **සම්මා සංකප්ප ගොචරෝ** යනු මිථ්‍යා සංකල්ප ගොදුරු කොටැත්තේ නුනුවණින් කල්පනාකොට නොයෙක් ආකාර වූ මිථ්‍යා දර්ශනයන් ගනු ලබන්නේ, මිථ්‍යා දෘෂ්ටිය හා අනුගත සිතින් යුක්ත වූයේ මාරයාට සිතැඟි පරිදි කටයුතු කළහැකි වේ. එහෙයින් නුවණින් මෙනෙහි කිරීමෙන් කටයුතු කරනුයේ නෛෂ්ක්‍රම්‍ය සංකල්පාදී, සම්‍යක් සංකල්ප ගොදුරු කොටැත්තේ වන්නේය. ධ්‍යානාදිය හා **සම්ප්‍රයුක්ත** සම්‍යක් සංකල්පම තම සිතෙහි පවත්නා තැන කරන්නේය. **සම්මා දිට්ඨි** පුරෙක්ඛරෝ යනු සම්‍යක් සංකල්ප ගොදුරු කොටැත්තේ, කම්පා කළ මිථ්‍යා දර්ශන ඇතියේ, ප්‍රථමයෙන්ම කර්මය ස්වකීය කොටැති බැව්හි ලක්ෂණද ඉන්පසු යථාභූත ඤාණ ලක්ෂණයද සම්‍යග් දෘෂ්ටිය පෙරටුකොට පූර්වාංගම කොට පෙර කියන ලද ක්‍රමයෙන්ම සීල සමාධි සම්ප්‍රයුක්ත විදර්ශනාව අරඹා සංස්කාර සම්මශ්‍රණය කරනුයේ **ඤාණ උදයබ්බයං** පංච උපාදානස්කන්ධයන්හි සමපණස් ආකාරයන්ගෙන් ඉපැත්ම හා නිරුද්ධවීම විභාගකොට උදයව්‍යය ඥානය අවබෝධකොට ඉන් මත්තෙහි භංගානුපස්සනාදී වශයෙන් විදර්ශනාව ඔසවා අනුක්‍රමයෙන් ආර්යමාර්ගය ගනුයේ අග මඟින්, **ථීනමිද්ධාභිභූ භික්ඛු සබ්බා දුගතියෝ ජහෙ** යනු මෙසේ හෙතෙම යට මාර්ගයන්ගෙන් නැසිය යුතු කෙලෙසුන් ප්‍රථමයෙන්ම ප්‍රහීණ හෙයින් දෘෂ්ටි විප්‍රයුක්ත ලෝභ සහගත චිත්තෝත්පාදයන්හි උපදනා ලබන ථීනමිද්ධාදීන්ගේ නැසීම අර්හත් මාර්ගාවබෝධයෙන් මනාව නසන හෙයින් ඒ හා යෙදුන මානාදීන්ගේද ප්‍රහීණ හෙයින් සර්වප්‍රකාරයෙන් හට කෙලෙස් ඇති ක්ෂීණාශ්‍රව භික්ෂුව ත්‍රිවිධ දුගති සංඛ්‍යාත සියලුම උත්පත්ති ස්ථාන සිදිනා ලද භව මුල් ඇති හෙයින් **ජහෙ** දුරු කරන්නේය. ඒවාහි පසුකොටසෙහි නිවනෙහි පිහිටන්නේයයි අර්ථයි.

දෙවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

4-3

තෙවැන්නෙහි, **කොසලෙසු** යනු කොසොල් නම් දනව් වැසි රජකුමරුවෝ ඔවුන්ගේ නිවාසස්ථානය වූ එක් දනව්වක් වුව කොසලයැයි කියයි. එම කොසොල් දනව්වෙහි, **චාරිකං චරති** යනු අතුරිත චාරිකා වශයෙන් දනවු සැරියෙහි සරයි. **මහතා** යනු ගුණ මහත්වයෙන්ද, නොපිරිසිඳ සංඛ්‍යා හෙයින් සංඛ්‍යා මහත්වයෙන්ද, මහත් වූ, **භික්ඛු සංඝෙන** යනු දෘෂ්ටි, සීල, ශ්‍රමණ භාවය යන කරුණුවලින් එක්වූ ශ්‍රමණ සමූහයා සමග, **සද්ධිං** යනු එකට එකතුව, **මඟඟා ඔකකමම** යනු මාර්ගයෙන් ඉවත්ව, **අඤ්ඤතරං රුක්ඛමූලං** යනු ඍණ කොළ අතු රිකිලිවලින් වැසුන සෙවනැති රුක්මූලෙක්හි සමීපයෙහි, **අඤ්ඤතරෝ ගොපාලකෝ** යනු එක්තරා ගවයන් රකින්නෙක්, නමින් නන්ද නමැ, හෙතෙම වනාහි ආඪ්‍යය. මහා ධනවතෙකි. මහා භෝග ඇත්තෙකි. කෙණිය ජටිල තෙම පැවිදි වෙසින් යම්සේද? මෙසේ අනේපිඬු සිටුහුගේ ගවරැල රකිනුයේ ගෝපාලකත්වයෙන් මහ උවදුරු බැහැර කරනුයේ තම පවුල රකියි. හෙතෙම කලින් කල පස්ගෝරස ගෙන, මහ සිටුහුගේ සමීපයට අවුත් භාරදී ශාස්තෘන් වහන්සේගේ සමීපයට ගොස් ශාස්තෘන් වහන්සේ බලයි. දහම් අසයි. තමන් වසන තැනට ඒම සඳහා ශාස්තෘන් වහන්සේට යාඥා කරයි. ශාස්තෘන් වහන්සේ ඔහුගේ නුවණ මුහුකුරා යාම බලාපොරොත්තු වනුයේ පසුකලෙකැ මහත් වූ භික්ෂු සංඝයා පිරිවරන ලදුයේ, ජනපද චාරිකාවෙහි හැසිරෙනුයේ, දැන් ඔහුගේ නුවණ මුහුකුරා ගියේයැයි දැන ඔහු වසන තැනට නුදුරෙහි මාර්ගයෙන් ඉවත්ව ඔහුගේ පැමිණීම බලාපොරොත්තු වෙමින් එක්තරා රුක්මූලක වැඩහුන් සේක. නන්දද, ශාස්තෘන් වහන්සේ වනාහි, දනව් සැරි සරනුයේ මෙතැනින් වැඩමවතියි අසා තුටු පහටු වූයේ වේගයෙන් ගොස් ශාස්තෘන් වහන්සේ කරා එළැඹ වැඳ කරන ලද පිළිසඳර ඇත්තේ එකත්පසෙකැ හුනි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දම් දෙසූ සේක. හෙතෙම සෝවාන් පෙලෙහි පිහිටා භාග්‍යවතුන් වහන්සේට ආරාධනාකොට සත්දිනක් කිරිබත් දන් දුනි. සත්වන දිනැ භාග්‍යවතුන් වහන්සේ අනුමෙවෙනි කොට වැඩමකළ සේක. එහෙයින් 'එකත්පස්හි හුන්නා වූ එම ගොපල්ලාට භාග්‍යවතුන් වහන්සේ දැහැමි කථායෙන් විස්තර කළ සේක. -පෙ- හුනස්නෙන් නැගිට වැඩම කළ සේකැයි යූ.සේයි. එහි **සඳ්සෙසසි** යනු මෙම ධර්ම කුසල්ය. මෙම ධර්ම අකුසල් යැයි යනාදී ක්‍රමයෙන් කුසලාදී ධර්මයන්ද, කර්ම විපාකයන්ද, මෙලෝ පරලෝ ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්වනුයේ පිළිවෙළින්

කරන දේශනාවසානයෙහි සිව් අරිසසුන් මනාව දැක්වූ සේක. **සමාදපෙසි** යනු සත්‍යාවබෝධය සඳහා මෙනම් ධර්ම තමා කෙරෙහි උපදවාගත යුතුයයි සීලාදී ධර්මයන් මනාව ගන්වා ඒවාහි ඔහු පිහිට වූ සේක. **සමුත්තෙජෙසා** යනු එම ධර්ම සමාදන් වූවාහු, ක්‍රමයෙන් වඩනු ලබන්නාහු මනාව තෙදවත් කළ සේක. **සම්පහංසෙසි** යනු භාවනාවට පෙර හා පසු විශේෂ ස්වභාව දැක්වීමෙන් සිත ප්‍රමෝදයට පත්කරලීම් වශයෙන් මනාව සතුටු කළ සේක. තවද මෙහි සාවද්‍ය - අනවද්‍ය ධර්මයන්හිද දුක්ඛාදීන්හිද මුළාව දුරුකිරීමෙන් මනාකොට පෙන්වීමයි. මුළාව දුරුකිරීමෙන් මනා ප්‍රතිපත්තියෙහි සමාදන් කරවීමයි. සිතෙහි අලස බවට පැමිණීම දුරලීමෙන් උත්තේජනය කරවීමයි. යහපත් ප්‍රතිපත්ති ඉටුවීමෙන් ප්‍රමෝදයට පත්වීම දතයුතුය. මෙසේ හෙතෙම භාග්‍යවතුන් වහන්සේගේ උසස් බවට පමුණුවන ධර්මදේශනාවෙන් සෝවාන් ඵලයෙහි පිහිටියේය. **අධිවාසෙසි** යනු ඔහු විසින් දිටි සත්‍යයෙන් ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මාගේ භික්ෂාව ඉවසා වදාරණ සේක්වා යනාදියෙන් ආරාධනා කරන ලදුයේ කායාංග වාචාංග නොසොලවමින් සිතින්ම ඉවසා වදාළ සේක. එහෙයින් තුෂ්ණීම්භාවයෙනැයි කීය. **අපෙපාදක පායාසං** යනු දිය රහිත කිරිබත්, පටියාදාපෙත්වා යනු සම්පාදනය කොට, පිළියෙල කොට, **නවඤ්ච සපපිං** යනු වෙඬරු ගෙන එවේලෙහිම දියාරු කළ ඉතා පිරිසිදු ගිතෙල් පිළියෙළ කරවා, **සහත්‍ථා** යනු ආදර හටගත්තේ සියතින්ම වළඳවනුයේ, සන්තපෙපසියු පිළියෙළ කළ බොදුන වැළඳවීය. **සම්පවාරෙසි** යනු සෑහේ යයි වචනයෙන් ප්‍රතික්ෂෙප කරවීය. **භුත්තාවිං** යනු කරන ලද බත්කිස ඇති, **ඔනීත පත්තපාණිං** යනු පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇතියේ, ධොතපත්තපාණි යැයි ද පාඨයි සෝදන ලද පාත්‍රය හා අත යන අර්ථයි. **නීචං** යනු උස් නුවූ, අස්නක් ගෙන අස්නෙහිම හිඳීම ආර්යදේශ වාසීන්ගේ චාරිත්‍රයයි. හෙතෙම වනාහි ශාස්තෘන් වහන්සේගේ සමීපයෙහි උපචාර වශයෙන්, පනවන ලද, දැව පුවරු ආසනයට සමීපයෙහි හිඳගති. **ධම්මියා කථාය** ආදියෙහි සත්වන දිනයෙහි කළ අනුමෝදනාව සඳහා යූ.සේයි. හෙතෙම වනාහි සත්දිනක් භාග්‍යවතුන් වහන්සේ ද, භික්ෂු සංඝයාද එහි වාසය කරවා මහදන් පැවැත්වීය. සත්වන දිනයෙහි දිය නුමුසු කිරිබත් දානයක් දුන්නේය. ශාස්තෘන් වහන්සේ ඔහුට එම අත්බැව්හි මතු මාර්ග සඳහා නුවණ මුහුකුරා නොගිය හෙයින් අනුමෝදනාව පමණක් කොට වැඩි සේක. **සීමනතරිතාය** යනු සීමාව අතරෙහි, ඒ ගමට අතර ගම්වාසීහු එක් විලක් නිසා ඔහු සමග කලහ කළහ. හෙතෙම ඔව්හු අභිබවා එම විල ගත්තේය. ඔහු සමග ක්‍රෝධ බැඳි එක් පුරුෂයෙක් ශාස්තෘන් වහන්සේ

ළඟට පත් ඔහු ගෙන දුරක් ගොස්, නවතුව උපාසකයැයි කී කල්හි, බුදුන් වැඳ ප්‍රදක්ෂිණා කොට, බික්සගනද, ඇඳිලි බැඳ දර්ශන සීමාව ඉක්මවීම සමග දසනිය එකතුකොට බබලන ඇඳිලි සිරසෙහි ඔසවා, ආපසු හැරී, දෙගම් අතර වන පෙදෙස්හි තනිව යන්නහු හීයෙන් විද මැරිය. එහෙයින් **'අචිර පකකනතසස** -පෙ- චොරො **මාරෙසියි** යූ.සේයි. කිසියම් කටයුත්තක් සඳහා නැවතී පසුව යන භික්ෂූහු එසේ මළ ඔහු දැක භාග්‍යවතුන් වහන්සේට එකරුණ සැළ කළහ. ඒ සඳහා 'අථඛො සම්බහුලා භිකඛූ' ආදිය යූ.සේයි. **එතමත්ථං විදිත්වා** යනු දෘෂ්ටි සම්පන්න ආර්යශ්‍රාවක නන්ද මරන්නා වූ පුරුෂයා විසින් කල්පයක් විපාක දෙන බොහෝ වූ ආනන්තරිය අකුසලයක් රැස් කරන ලදී. සොරුන් විසින් ද සතුරන් විසින් ද යමක් කළයුතුද? එයටද වඩා ගොරතර දැයක් වරදවා පිහිටුවන ලද සිත මෙම සත්ත්වයින්ට කෙරේයයි මෙම අර්ථය දැන, එම අර්ථය පැහැදිලි කිරීමට මෙම උදන් ඇතූ සේක.

එහි **දිසො දිසං** යනු කෙළසන්නෙක් කෙළසන්නෙකුට, සොරෙක් සොරෙකුට, දැක යයි වචනය ගතයුතුය. **යනතං කයිරා** යනු ඔහුට යම් අන්‍ය ව්‍යසනයක් කරන්නේ නම් දෙවන පදයෙහිද එම ක්‍රමයමැයි. මෙය යූ.සේයි. එක් අයෙක් එක් අයෙකුට මිත්‍රද්‍රෝහී සොරෙක් වූයේ අඹුදරු-කෙත්වතු ගවමහිෂාදීන් කෙරෙහි අපරාධ කරනුයේ (නසන්නේ) යමෙකුට අපරාධ කෙරේද? ඔහුට එසේම තමා කෙරෙහි අපරාධ කරන්නා වූ සොරහු දැක, සතුරෙක් හෝ කිසියම් කරුණකින් බද්ධ වෛරී සතුරෙකු දැක, තමාගේ කර්කශතාවයෙන් ද දාරුණ්‍යයෙන් ද ඔහුට අන්‍යව්‍යසනයක් කරන්නේය. අඹුදරුවන් හෝ පීඩාවට පත් කරන්නේය. ක්ෂේත්‍රාදිය හෝ විනාශ කරන්නේය. ජීවිතයෙන් හෝ තොර කරන්නේය. දස අකුසල කර්මපථයන්හි වරදවා තබන ලද හෙයින්, **මිචඡා පණිහිතං චිතතං පාපියොනං තතො කරෙ** යනු ඉන් ඒ පුරුෂයා පාපතරයෙකු කරන්නේය. කියන ලද ආකාර ඇති, කෙළෙසන්නෙක් කෙළෙසන්නෙකුට හෝ සොරෙක් සොරෙකුට හෝ මෙම අත් බැව්හිම පමණක් දුකක් හෝ උපදවන්නේය. ජීවිතය හෝ ක්ෂය කරන්නේය. මෙම අකුසල කර්මපථයන්හි වරදවා තබන ලද **සිත** ඉහාත්ම භාවයෙහි අන්‍ය ව්‍යසනයකට පමුණුවයි. ආත්මභාව ලක්ෂ ගණන්හිදී ද සිව් අපායන්හි දමා ඔහුගේ හිස ඔසවන්ට නොදෙයි.

තෙවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

4-4

සිව්වැන්නෙහි **කපොත කන්දරායං** යනු මෙනම් විහාරයෙහි එම පර්වත කඳුරෙහි පෙර බොහෝ පරෙවියෝ විසූහ. එහෙයින් එය නිමිතිකොට කපොත කන්දරා යැයි කියයි. පසුකල්හි එහි කළ විහාරයද කපොත කන්දර යනුවෙන්ම ප්‍රකට විය. එහෙයින් කපොත කන්දරා යැයි මෙනම් ඇති විහාරයෙහි. **ජුණ්හාය රත්තියා** යනු ශුක්ල පක්ෂ රාත්‍රියෙහි, **නවොරොපිතෙහි කෙසෙහි** යනු අලුත බූ ගෑ හිසකෙසින් යුතුව, එය ඉත්ථම්භූත ලක්ෂණයෙහි කරණ වචනයි. **අඛෙහාකාසෙ** යනු යම්තැනක මත්තෙහි වැස්මක් හෝ වටරවුමක් නැත්ද? එවන් ආකාසාංගණයෙහි එහි ආයුෂ්මත් සැරියුත් හිමි රන්වන්ය. ආයුෂ්මත් මහ මුගලන් හිමි නිලුපුල් වර්ණයි. මේ මහ තෙරවරු දෙනමම උසස් බ්‍රාහ්මණ ජාතිකයෝය. ඒකාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමිතා පුරන ලද්දාහු ෂට් අභිඥා සහිත ප්‍රතිසම්භිදාප්‍රාප්ත, සියලු සමවත්ලාභී මහරහත්හුය. සත්සැටක් ශ්‍රාවක පාරමී ඥානයන්ගේ මස්තකප්‍රාප්ත වූවාහුය. එම කපොත කන්ද විහාරය මනාව හොබවන්නාක් මෙන්, එක් රන් ගුහාවකට පිවිසි සිංහයින් දෙදෙනෙකු මෙන් ද එක් අතපය දිගහැර ඇඟ ප්‍රාණවත් කරන (ව්‍යායාම) එක් බිමකට අවතීර්ණ ව්‍යාඝ්‍රයින් දෙදෙනෙකු මෙන්ද එක් මනාව මල් පිපුණ සල් වනයකට පිවිසි සද්දන්ත දෙ ඇත් රජහු මෙන් ද එක් ඉඹුල් වනයකට පිවිසි ගුරුළු රජහු දෙදෙනෙකු මෙන් ද එක් මිනිස් වාහන යානයකට නැගි වෙසමුනි රජවරු දෙදෙනෙක් මෙන්ද, එක් පාණ්ඩු කම්බල ශෛලාසනයක මනාව හිඳගත් සක්දෙව් රජහු දෙදෙනෙකු මෙන්ද, එක් විමනක් තුලටවත් හාරිත නම් මහ බඹුන් දෙදෙනෙකු මෙන්ද එක් ගගන ස්ථානයක සිටි චන්ද්‍ර මණ්ඩල ද්වයයක් මෙන් ද, දෙහිරු මඬලක් මෙන් ද බැබලුනහ. ඔවුනතර ආයුෂ්මත් මහ මුගලන් තෙරහු නිහඬව හුන්නේය. ආයුෂ්මත් සැරියුත් තෙරහු සමවතට සමවැදිනි. එහෙයින් **අඤ්ඤතරං සමාධිං සමාපජ්ජිත්‍වායි** යූ.සේයි. එහි **අඤ්ඤතරං සමාධිං** යනු උපේක්ෂා බ්‍රහ්මවිහාර සමාපත්තියයි. සමහරු සංඥාවේදයිත නිරෝධ සමවතයැයිද යෙති. අනෙකුත් අය අරූප ධ්‍යාන පාදක ඵල සමවතැයි කීහු. මෙම ත්‍රිවිධ සමවත්හුම කය රැක්මට සමත් සමවත්හුය. එහි නිරෝධ සමවතෙහි සමාධි පිළිවෙළෙහි හටගැන්ම යට යූ.සේමය. පසුව කියන ලද අරූප පාදක ඵල සමවතම ඇදුරෝ වනති. **උත්තරාය දිසාය දක්ඛිණං දිසං ගච්ඡනති** යනු උතුරු දිසායෙහි යක්ෂ සමාගමට ගොස් තම භවනයට යන්ට දකුණු දෙසට යති. **පටිහාති මං** යනු මට වැටහේ. (හැඟේ) පටි

ශබ්ද යෝගයෙන් **ෂෂ්ඨ්‍යර්ථයෙහි ද්විතියා** වචනයි. මොහුගේ හිසෙහි පහරක් දෙන්ට මාගේ (මට) සිතක් උපදීයයි අර්ථයි. හෙතෙම වනාහි පෙර ජාතියෙහි තෙරුන් කෙරෙහි බඳනා ලද ක්‍රෝධ ඇත්තෙකි. එහෙයින් තෙරුන් දැක දූෂිත සිතැති මොහුට මෙබඳු සිතක් විය. අනෙකා වනාහි නුවණැති ස්වභාව ඇතියෙකි. එහෙයින් ඔහු වළක්වනුයේ **අලං සම්ම** ආදිය කීහ. එහි මා **ආසාදෙසි** යනු නොගටව, පහර නොදෙවයි යූ.සේයි. **උළාරෝ** යනු උදාර, උතුම් සීලාදී ගුණයන්ගෙන් යුත්, **අනාදියිත්වා** යනු සැලකිලි නොකොට, ඔහුගේ එම වචනය පිළිනොගෙන ඔහුගේ වචනය පිළිනොගන්නේ ඔහු ගණන් නොගන්නේ නම් වේ. එහෙයින් එම යක්‍ෂයා ගණන් නොගෙන (බස නොතකා) යයි යූ.සේයි. **සීසෙ පහාරං අදාසි** යනු සියලු ශක්තියෙන් උත්සාහ උපදවා අහසේ සිටියේම හිසෙහි පහරක් දුන්නේය. හිස්මුදුනෙහි අතමිට මොළවා පහර ගැසීම කළේයයි අර්ථයි. **තාව මහා** යනු ශක්ති මහත්වයෙන් එපමණ මහත් වූ ප්‍රහාරයක් විය. **පහාරෝ අහොසි තෙන පහාරෙන** යනු එම ප්‍රහාරය කිරීම හේතුවෙන්, **සත්ත රතනං** යනු මධ්‍යම ප්‍රමාණ පුරුෂයකුගේ රියනින් සත්රියනක්, **සෝ** යනු එම යක්‍ෂයා, **නාගං** යනු හස්ති නාගයෙක් (ඇතෙක්) **ඔසාදෙය්‍ය** යනු පෘථිවියෙහි කිඳවන්නේය. ගිල්වන්නේය. ඇතුල් කරන්නේය. සුණු විසුණු කරන්නේ යයි අර්ථයි. **අඩ්ඩඨ්ඨම රතනං** යනු අඩකින් අටවැන්න **සම්පූර්ණ** කෙරේනුයි අඩ්ඩඨ්ඨමානියි. අටවැන්න අඩක් වූ රියන් ප්‍රමාණය එයටනුයි අඩ්ඩඨ්ඨමානියි. අටවැන්න අඩක් වූ රියන් ප්‍රමාණය එයටනුයි අඩ්ඩඨ්ඨමරතනයි. ඒ අඩ්ඩඨ්ඨම රතනය (සත් රියන් වියන) මහනතං **පබ්බත කූටං** යනු කෙලාසකූට ප්‍රමාණ මහත් ගිරිකුළක්, පදාලෙය්‍ය යනු වළං කැබලි ආකාරයෙන් බිඳින්නේය. පොළොවට ඇතුල් කරන්නේය. තවද පළා දමන්නේ යයි **සම්බන්ධයි**. එකෙණෙහිම ඔහුගේ ශරීරයෙහි මහා දැවිල්ලක් හටගති. හෙතෙම වේදනාවෙන් පෙළුණේ අහසෙහි සිටින්ට නොහැකි වනුයේ බිම වැටුණි. එකෙණෙහිම යොදුන් එක් ලක්‍ෂ හැට අටදාහක් අධිකකොට ඇති උසින් යුතු මහාමේරු පර්වත රාජයානන්ද දරන්නා වූ සිව් නහුතාධික දෙලක්‍ෂයක් යොදුන් ඝණකම ඇති මහා පෘථිවිය එම පාපී සත්ත්වයා දරන්ට නොහැකි වන්නාක් මෙන් සිදුරක් හටගති. අවීචියෙන් ගිනිදැල් පැන නැග හඬන්නා වූම ඔහු වෙළා ගති. හෙතෙම විලාප නගමින් වැටුණි. එහෙයින් 'එකල්හි එම යක්‍ෂයා දැවෙමි. දැවෙමියි කියමින් එතැන්හිදීම අවීචි මහ නිරයෙහි වැටුනියි' යූ.සේයි. **එහි අවරොසි** යනු වැටුණි. කිමෙක්ද ඔහු යක්‍ෂාත්ම භාවයෙන්ම නිරයට එළැඹියෙහිද? නොඑළැඹිණි. එහි යම් දිට්ඨධම්ම වේදනිය පාපකර්මයක්

වීද? එහි බලයෙන් යක්ෂාත්ම භාවයෙහි මහත් දුකක් අනුභව කළේය. යම් ආකාර වූ දෙවන ආත්මයේ අනිවාර්යයෙන් විපාක දෙන උපපජ්ජවේදනීය කර්මයක් වේද, එය කරණකොට චුතියට අනතුරුව නිරයෙහි උපනි. තෙරුන් වහන්සේට වනාහි සමවත් බෙලෙන් සන්සිඳුවන ලද ශරීර හෙයින් කිසි විකෘතියක් නොවීය. සමවතින් නො නැගිටි කල්හි යක්ෂයා පහර දිනි. එසේ පහරන්නහු දිවැසින් දැක මහ මුගලන් තෙරහු දම් සෙනෙවි සැරියුත් හිමි වෙත එළැඹියේය. එළැඹෙන කල්හිම දම්සෙනෙවි සැරියුත් හිමි සමවතින් නැගිටියේය. ඉක්බිති මහ මුගලන් තෙරහු ඔහුගෙන් එම පරිභවය පිළිබඳව විමසීය. හෙතෙම ඔහුට ප්‍රකාශ කළේය. එහෙයින් අඳසා බො ආයසමා මාහ මොග්ගල්ලානො -පෙ- අපිච මෙ සීසං ථොකං දුක්ඛංයි යූ.සේයි. එහි **ථොකං දුක්ඛං** ස්වල්පයක් ස්වල්පමාත්‍ර මත්ද්‍රව්‍ය ශරීරගත වූ කලෙක මෙන් මාගේ හිස දුකට පත්විය. ස්වල්ප වේදනාවක් විය යනු අර්ථයි. දුක පැවති හෙයින් හිස දුකට පත්විණැයි යූ.සේයි. හිසෙහි මඳක් දුක් වේදනාවක් ඇතිවිය. සමවත් බලයෙන් උපස්ථම්භ ලද තෙරුන්ගේ ශරීරයෙහි තුළ නොපෙනෙන දුක සමවතින් නැගිට බොහෝ වේලාවක් ගත නුවූ හෙයින් දැනිනි. එම සමාධිය හා නිශ්‍රිත හෙයින් නින්දට එළැඹියහුට මදුරු දෂ්ට ආදියෙන් හටගත් වේදනාව පිබිදියහුට මඳක් ප්‍රකට වේ. මහ බලැති යක්ෂයා විසින් සියලු ශක්තිය යොදවා පහර දුන් කල්හි ශරීරයෙහි වෙනසක් නම් නැත්තේදැයි, ආශ්චර්ය, අද්භූත සිතක් හටගත් ආයුෂ්මත් මහ මුගලන් තෙරණුවන් විසින්, ඇවැත්නි සාරිපුත්‍රය, ආශ්චර්යයෙකියි ආදි වශයෙන් දම්සෙනෙවි සැරියුත් තෙරහුගේ මහානුභාවතාවය දක්වන ලදී. ඔහු ද, ඇවැත්නි මොග්ගල්ලානය ආශ්චර්යයෙකැයි ආදී ක්‍රමයෙන් ඍද්ධින්හි ආනුභාව මහත් බැව් ප්‍රකාශ කිරීම් පෙන්වන ආකාරයෙන්, තමගේ ඊර්ෂ්‍යා මාත්සර්ය අහංකාර ආදී අපද්‍රව්‍යයන්ගේ මනාව ප්‍රහීණ කළ බව පෙන්වයි. **පංසු පිසාචකමපි න පසසාම** යනු කසල ගොඩවල් ආදීන්හි හැසිරෙන කුඩා ප්‍රේතයෙකුද නොදකිමු. මෙසේ අධිගම අල්පේච්ඡතාවන්ගේ අග්‍ර වූ මහතෙරහු එකල්හි අනාවර්ජනය හේතුවෙන් ඔවුන්ගේ නොදැක්ම සඳහා කියයි. 'එතරහි'යි එහෙයින්ම කීහ. භාග්‍යවතුන් වහන්සේ වනාහි වේළුවනයෙහි වැඩසිටි සේක්, දෘගඝ්වවන්ගේ මෙම කථා සල්ලාපය දිව කණින් ඇසූ සේක. එහෙයින් **අසෙසාසි** බො භගවා ආදිය යූ.සේයි. එය කියන ලද අර්ථමය. **එතමත්ථං විදිත්වා** යනු එම ආයුෂ්මත් සැරියුත් තෙරුන්ගේ සමවත් බහුලව එළැඹීමද, ඍද්ධ්‍යානුභාවයෙහි මහත් බැව්ද

දැන, ඉමං උදානං යනු ඔහුගේ දුක සැපෙහි නොසැලෙන බවට පත්වීම දැක්වීමට මෙම උදන් ඇනූ සේක.

එහි යසස සෙලූපමං චිතතං ඨිතං නානුපකම්පති යනු යම් **ක්ෂීණාශ්‍රවයෙකුගේ** සිත, එකට ඝන වූ (තනි) ගල් පර්වතයකට උපමා වූයේ සියලු කම්පනයන්ගේ අභාව හෙයින් වසී භාවප්‍රාප්තව සිටියේ, සියලුම අටලෝ ධර්මයන්ගෙන් **නානුපකම්පති** කම්පා නොවේ. දැන් මෙහි කරුණු සහිතව කම්පා නොවන ආකාරය දක්වන්ට **විරතතං** ආදිය යූ.සේයි. එහි **විරතතං රජනීයෙසු** යනු විරාග සංඛ්‍යාත ආර්ය මාර්ගයෙන් ඇල්ම කළයුතු රාගෝත්පත්තියට හේතුකාරණා වූ සියලු තෙභූමික ධර්මයන්හි නොඇලුනේ, එහි සර්වප්‍රකාරයෙන් සිඳ දමන ලද ඇල්මයයි අර්ථයි. කොපනෙය්‍යෙ යනු නැවත ගැටුම් ඇතිකරන සියලුම ක්‍රෝධ වස්තුවෙහි, **න කුපපති** යනු දූෂ්‍ය නොවේ. වෙනසකට නොපැමිණේ. **යසෙසවං භාවිත චිතතං** යනු කියන ලද ආකාර ඇති යම් ආර්ය පුද්ගලයෙකුගේ සිත මෙසේ කියන ලද ක්‍රමයෙන් උසස් යෝග්‍යතාවය එළවන හෙයින් වඩනා ලදද? කුතො නං දුකඛමෙසසති යනු එම උතුම් පුද්ගලයා කරා සත්ත්ව වශයෙන් හෝ සංස්කාර වශයෙන් හෝ කෙසේනම් දුකක් එළැඹෙන්නේ ද? එවැන්නහුට නොමැත යන අර්ථයි.

සිව්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

4-5

පස්වැන්නෙහි **කොසම්බියං** යනු කුසුම්බ නමැති ඍෂිවරයා විසින් වසන ලද තන්හි මවන ලද හෙයින්, කොසම්බි යැයි මෙසේ ලද නමැති නගරයෙහි.

සොෂිතාරාමෙ යනු සොෂිත සිටුහු විසින් කරවන ලද අරමහි, **භගවා ආකිණෙණා විහරති** යනු භාග්‍යවතුන් වහන්සේ තදබදයෙන් පීඩාවට පත්ව වැඩවසන සේක. කිමෙක්ද භාග්‍යවතුන් වහන්සේට පීඩාවක් හෝ ආශ්‍රයක් තිබේද? නැත. භාග්‍යවතුන් වහන්සේගේ අකමැත්තෙන් එළඹෙන්ට

කිසිවෙකුට නොහැකිය. භාග්‍යවත් බුදුවරු හැමතැන නොතැවරුණු හෙයිනි. සත්ත්වයින් කෙරෙහි හිතවත් භාවයෙන් අනුකම්පා උපදවා, මිදුනේ මුදවන්නෙමියි යන ප්‍රතිඥානුරූපව සිව් ඕඝයන්ගෙන් එතෙරවීම සඳහා අටපිරිස්වලට තම සමීපයට එළැඹීම ඉවසයි. තමන් වහන්සේද මහා කරුණාවෙන් මනාව උත්සාහවත් වූයේ කල් දැන එහි වැඩම කරවති. මෙය සියලු බුදුවරුන්ට පුරුදු ක්‍රියාවකි. මේ මෙහි ආකීර්ණ විහරණයැයි අදහස් කරන ලදී. මෙහි වනාහි කොසඹෑ නුවර කළහ හටගත් භික්ෂූන්ට ශාස්තෘන් වහන්සේ, දීඝිතිස්ස කොසොල් රජුගේ වස්තුව ගෙනහැර දක්වා 'නහි වෙරෙන වෙරානි සම්මන්තීය කුදාචනං', වෛරයෙන් වෛරය කිසිකලෙක නොසන්සිඳේ ආදියෙන් අවවාද දුන් සේක. එදින ඔවුන්ගේ කලහය කරන්නාහුම රැය පහන් විය. භාග්‍යවතුන් වහන්සේ දෙවන දිනයෙහිද එම වස්තුවම වදාළ සේක. එදිනද ඔවුන්ගේ කළහය කරන්නාහුම රැය පහන් විය. තෙවන දිනයෙහිද භාග්‍යවතුන් වහන්සේ එම වස්තුවම වදාළ සේක. ඉක්බිති එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ, අල්පෝත්සාහීව, ඉහාත්ම සුව විහරණයෙහි අනුයුක්තව වාසය කරන සේක්වා. අප එම කලහ කිරීමෙන්, කලහයෙන්, කෝලාහලයෙන්, විවාදයෙන් ප්‍රසිද්ධියට පත්වන්නෙමුයි මෙසේ කීවේය.

ශාස්තෘන් වහන්සේ, මෙම හිස් පුරුෂයෝ මඬනා ලද සිතැත්තාහුය. දැන් මොවුන්ට සත්‍යය හැඟවීමට නොහැක. මෙහි හැඟවිය යුත්තක් (අවබෝධ කරවිය යුත්තක්) නැත. මම නුදෙකලා චාරිකා වාසයෙහි වසන්නේ නම් ඉතා යෙහෙකි. මෙසේ මෙම භික්ෂූහු කලහයෙන් පහත් වන්නාහු යයි සිතූ සේක. මෙසේ එම කලහකාරක භික්ෂූන් සමග එක් වෙහෙරෙහි වාසය තුළ හික්මවිය යුතු කිසිවක් නොමැති හෙයින් උපාසකාදීන්ගේ එළැඹීමද සම්බාධක විහාරයැයි සලකා, යූ.සේයි. **තෙන බොපන සමයෙන භගවා ආකිණ්ණා විහරති** ආදිය. එහි **දුකඛං** යනු සුව නොවේ. සිත් ඇඳබැඳ නොගත් හෙයින් මනාප නොවේ යන අර්ථයි. එහෙයින් **න ඵාසු විහාරාමි** යි යූ.සේයි. චූපකථෝ යනු කෙලෙස්වලින් දුරු වූයේ - දූරීභූත වූයේ, එසේ සිතා භාග්‍යවතුන් වහන්සේ උදෑසනම සිරුර පිළිදැගුම්කොට කොසඹෑ නුවර පිඬු පිණිස හැසිර, කිසිවෙක් නොඅමතා නුදෙකලාව, දෙවැන්නෙක් නොමැතිව ගොස් කොසොල් රටැ පාරිලෙය්‍යක වනලැහැබෙහි සොඳුරු සල්රුක මුල විසූ සේක. එහෙයින් **අථඛෝ භගවා පුබ්බණ්හ සමයං** -පෙ- **භද්දසාලමූලෙයි** යූ.සේයි.

එහි **සාමං** යනු තෙමේ. **සංසාමෙත්වා** යනු තැන්පත් කොට, **පත්තචීවර මාදාය** යනු මෙහිද ආසන්න පදය ගෙන යෙදිය යුතුය. **උපඣාකෙ** යනු **කොසඹෑ** නුවර වැසි ඝෝසිත සිටු ආදී වූ, උපස්ථායකින්ද, විහාරයෙහිද අග්‍රෝපස්ථායක **ආයුෂ්මත් අනඳ** තෙරුන්ද නො අමතා, මෙසේ ශාස්තෘන් වහන්සේ වැඩමකළ **කල්හි** පන්සියයක් භික්ෂූහු, ඇවැත් ආනන්දයෙනි, ශාස්තෘන් වහන්සේ හුදෙකලාවම වැඩි සේක. අපි පසුපස්සේ යන්නෙමුයි ආයුෂ්මත් අනඳ තෙරුන්ට කීහ. ඇවැත්නි, යම්කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ තෙමේ සෙනසුන තැන්පත්කොට පාසිවුරු ගෙන නො අමතා, උපස්ථායකයින් බික්සඟ නොබලා දෙවැන්නෙක් නොමැතිව වැඩම කෙරේද, එකල්හි තනිව හැසිරෙන්ට කැමැත්ත භාග්‍යවතුන් වහන්සේගේ අදහසයි. (උසස් තත්ත්වයට පැමිණි) ශ්‍රාවකයෙක් විසින් නම් කළයුතු වන්නේ ශාස්තෘන් වහන්සේගේ අදහසට අනුව පිලිපැදීමයි. එසේ පිලිපැදිය යුතුය. එහෙයින් මෙම දිනවල භාග්‍යවතුන් වහන්සේ අනුගමනය නොකළ යුතුයයි වැලැක්වීය. තෙමේද අනුව නොගියේය. **අනුපුබ්බන** යනු අනුක්‍රමයෙන්, ගම් නියමගම් පිළිවෙළින් චාරිකාවෙහි හැසිරෙනුයේ පළමුව හුදෙකලාව වසන භික්ෂුවක් බලන්නෙමියි බාලකලොණකාරාමයට වැඩමකොට එහි භගු තෙරුන්ට මුළු සවස්වරුවද, තුන්යම් රාත්‍රියද හුදෙකලා වාසයෙහි අනුසස් වදාරා, දෙවන දින ඔහු පසුගමන් යන ශ්‍රමණයෙක්ව පිඬු පිණිස හැසිර ඔහු එහිම නතර කරවා සමගි විසුමක වසන තෙකුලපුතුන් දකින්නෙමියි ප්‍රාචීන වංශ මිගදායට වැඩමකොට, ඔවුන්ට, මුළු රැය පුරා, සමගි විසුමෙහි අනුසස් වදාරා, ඔවුහු එහිම නතර කරවා හුදෙකලාවම පාරිලෙය්‍ය ගමට සම්ප්‍රාප්ත වූ සේක. පාරිලෙය්‍ය ගම්වාසීහු පෙරගමන්කොට භාග්‍යවතුන් වහන්සේට **දන් දී පාරිලෙය්‍ය** ගමට නුදුරෙහි (රාජ්‍ය) **රක්ෂිත** නම් වනලැහැබක් තිබේ. එහි භාග්‍යවතුන් වහන්සේට පන්සලක් කරවා, මෙහි භාග්‍යවතුන් වහන්සේට වසන සේක්වායි ආයාචනා කොට වාසය කරවූහ. **භඳ්දසාලෝ** යනු එහි **එක්** මන වඩන **සිත්කලු** සල්රුකෙකි. භාග්‍යවතුන් වහන්සේ එගම **ඇසිරිකොටු** වනලැහැබ්හි පන්සල ආසන්නයෙහි එම රුක් මුලැ වාසය කළ සේක. **එහෙයින් පාරිලෙය්‍යකෙ විහරති රක්ඛිත වන සණ්ඩ භද්දසාල මූලෙයි යූ.සේයි. හත්ථිනාගො** යනු මහ ඇතා රැලේ ප්‍රධානියා, **හත්ථි කලභෙහි** යනු ඇත් නාමිබන්, **හත්ථිවණ්ණපොහි** යනු කිරි බොන ළපටි ඇත්පොව්වන්, **යම්කෙනෙක් හිංකායැයි ද කියති. ඡ්ඣානගගානි** යන ඉදිරියෙන් ඉදිරියෙන් යන එම ඇත් ආදීන් විසින් සුන් අග ඇති කා ඉතිරි වූ **කනු** හා සමාන තෘණ කයි. **බහගෙහා භගහං** යනු ඒ ඇත් රජු විසින් උස් තැන්වලින් බිඳ

බිඳ හෙළන ලද. **අසස සාඛා භංගං** යනු ඔහු සතු බිඳින ලද අතු උන් කති. ආවිලානි යනු ඔව්හු පළමුව බැස පානය කරන කල්හි කැළඹුණු හෙයින්, කැළඹුණු මඩ මිශ්‍රිත දිය බොයි. **මගාහා** යනු කොටින් ඔගාහං යනුද පාලියි. **අසස** යනු ඇත් රජුගේ. **උපනිසංසනතියො** යනු ගැටෙන්නියෝ. ගැටෙනු ලබන්නේ ද තම උදාරභාවයෙන් නොකිපේ. එහෙයින් ඇලා ඌ ගටත්මය. **යූථා** යනු ඇත්රළෙහි, **යෙන භගවා තෙනුපසංකමි** යන එම ඇත්රජු රළෙහි විසීමෙහි කළකිරුණේ එම වන ලැහැබට පිවිසියේ එහි භාග්‍යවතුන් වහන්සේ දැක, කළ දහසකින් නිවන ලද උෂ්ණයක් මෙන් නිවුනේව පසන් සිතැතියේ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි සිටියේය. එතැන් පටන් වත් ශීර්ෂයෙහි සිට සොඳුරු සල්රුකෙහි හා පන්සලෙහි හාත්පස නිල් තණපැලෑටි නැතිකොට අතු ඉතිවලින් අතුගායි. භාග්‍යවතුන් වහන්සේට මුවදෝනා පැන් දෙයි. ස්නානෝදක ගෙන එයි. දැහැටි දඬු දෙයි. කැලයෙන් මිහිරි ඵල (පළතුරු) ගෙනවුත් ශාස්තෘන් වහන්සේට පිළිගන්වයි. ශාස්තෘන් වහන්සේ ඒවා පරිභෝග කරයි. එහෙයින් **තතුසුදං සො නත්ථීනාගො යසමිං පදෙසෙ භගවා විහරති. තං පදෙසං අපපහරිතං කරොති. සොණ්ඩායව භගවතො පානීයං පරිභොජනීය උපට්ඨපෙතියි** යූ.සේයි. සොඬින් දර ගෙනවුත් එකිනෙක ගටා ගිනි උපදවා, දර දල්වා එහි ගල්කැබලි තවා, ඒවා දඬුවලින් පෙරලා සොඬින් දිය පිරුණු තන්හි දමා, දිය රත් වූ බැව් දැන භාග්‍යවතුන් වහන්සේගේ සමීපයට එළඹ සිටියි. භාග්‍යවතුන් වහන්සේ ඇත් රජු මාගේ දිය නෑම කැමැති වේයයි එහි ගොස් ස්නාන කෘත්‍යය කරයි. දිය පානයෙහිද එම ක්‍රමයමැයි. එය සීතල හටගත්විට එළවයි. ඒ සඳහා **සොණ්ඩාය පානීයං පරිභොජනීයං උපට්ඨපෙතියි** යූ.සේයි. **අථඛො භගවතො රහොගතස්ස** ආදිය මහ නා රජුන් දෙදෙනාගේ විවේක සුව ප්‍රත්‍යවේක්ෂා දර්ශනයයි. එය කියන ලද අර්ථමය.

අතතනොව පවිවෙකං විදිත්වා යනු කිසිවෙකුගේ අනාකීර්ණ භවයෙන් ලද කාය විවේකය දැන අනෙක් විවේක වනාහි භාග්‍යවතුන් වහන්සේට හැමකල්හිම විද්‍යමාන වෙත්මය. **ඉමං උදානං** යනු මෙම තමාගේ හා ඇත් රජුගේ ද විවේක ඇල්මෙහි සමාන අදහස් ඇති බව දැක්වීමට උදන් ඇනූ සේක. මේ එහි සංක්ෂේපාර්ථයයි. **එතං ඊසාදනතස්ස** රිය ඉස් වැනි දත් ඇති ඇත්රජුගේ සිත, **නාගෙන** යන බුද්ධ නා රජුගේ සිත හා සම වේ. සැසඳේ. කෙසේ සමවේද යත්, **යදෙකො රමති වනෙ** යනු බුද්ධ නා රජු 'මම වනාහි පෙර ආකීර්ණව විසුයෙමියි පළමු ආකීර්ණ

විහරණය පිළිකුල් කොට විවේක වඩනු ලබනුයේ දැන් යම්සේ එකෝ දෙවැන්නෙක් නැතිව **වනෙ අරණ්‍යයෙහි රමති සිත්** අලවයි. මෙසේ මෙම ඇත් රජුද පෙර තම ඇතුන් ආදීන්ගෙන් ආකීර්ණ විහරණය ප්‍රතික්ෂේප කොට විවේකය වඩනු ලබන්නේ, දැන් නුදෙකලාව, දෙවැන්නෙක් නොමැතිව වනයෙහි, අරණ්‍යයෙහි සිත් අලවයි. සතුටු වෙයි. එහෙයින් ඇත්රජුගේ **චිත්තං නාගෙන සමෙති** සිත බුද්ධ නාගයාගේ සිත හා සම වේයයි කොට එක් ස්වභාව ඇල්ම එක් සමාන වේයයි අර්ථයි.

පස්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

4-6

සවැන්නෙහි පිණ්ඩෝල භාරද්වාජ යනු බත් පිඬු සිඟනුයේ, සොයමින් පැවිදි වූයේ නුයි පිණ්ඩොලොයි. හෙතෙම වනාහි පිරිහී ගිය භෝග ඇති බ්‍රාහ්මණයෙක්ව බික් සඟනට දෙන මහත් වූ ලාභ සත්කාර දැක බත් පිඬු සඳහා ගිහිගෙන් නික්ම පැවිදි වූයේ වේ. හෙතෙම විශාල ඉබි හෝ කැස්බ පොත්තෙන් සෑදූ පාත්‍රයක් ගෙන හැසිරේ. එම පාත්‍රය පුරවා කෑද බොයි. බත් අනුභව කරයි. කැවුම් හා කැවිලි ද කයි. ඉක්බිති ඔහුගේ මෙම ස්වභාවය බුදුරදුන්ට සැල කළහ. ශාස්තෘන් වහන්සේ ඔහුට පාත්‍ර පසුම්බියක් නො අනුදත් සේක. ඇඳ යට පාත්‍රය යටිකුරු කොට තබයි. හෙතෙම තබනුයේ ද ගටමින්ම නමා තබයි. ගනුයේද ගටමින්ම ඇද ගනියි. එයද කල්ගතවන කල්හි ගැටීමෙන් ගෙවී ගොස් නැලියක් පමණ බත් ගන්නා ප්‍රමාණයට පත්විය. **ඉක්බිති** ශාස්තෘන් වහන්සේට සැල කළහ. **ඉක්බිති** ශාස්තෘන් වහන්සේ ඔහුට පාත්‍ර පසුම්බියක් අනුදැන වදාළ සේක. තෙරුන් වහන්සේ **පසුකලැ** ඉන්‍ද්‍රිය භාවනාව වඩනුයේ අග්‍රඵලය වූ අර්හත්වයෙහි පිහිටියේය. හෙතෙම මෙසේ පෙර ආමිෂය සොයමින් පිඬු පිණිස යේනුයි පිඬොල නම් විය. ගෝත්‍රයෙන් වනාහි භාරද්වාජ යන දෙක එකතුකොට **පිඬොල භාරද්වාජ** යැයි කියයි. **ආරඤ්ඤකෝ** යනු ග්‍රාමාන්ත සෙනසුන් ප්‍රතික්ෂේපයෙන් අරණ්‍යයෙහි විසීම වන්නේනුයි **ආරඤ්ඤකොයි**. ආරණ්‍යක ධුතංගය සමාදන්ව පවතින්නහුට එය නාමයයි. **එසේම** භික්ෂා සංඛ්‍යාත වූ ආමිෂ පිණ්ඩයන්ගේ වැටීම පිණ්ඩපාතයයි. අනුන් විසින් දෙන ලද පිණ්ඩයන්ගේ පාත්‍රයෙහි

වැටීමයයි අර්ථයි. පිණ්ඩපාතය සිඟයි. ඒ ඒ කුලවලට එළඹෙමින් සොයතියි **පිණ්ඩපාතිකොයි.** පිඬුවල වැටෙන්ට හෝ හැසිරෙන්ට වන ක්‍රියාව ඔහුටනුයි පිණ්ඩපාතියි. පිණ්ඩපාතීව පිඬපාතිකොයි. කසල ගොඩවල් ආදීන්හි පස් මතුයෙහි සිටි හෙයින් උස්ව උස්ව නැගි අර්ථයෙන් පංසුකුලංයි. පස් මෙන් පිළිකුල් බවට පත්වේ. යේනුයි පංසුකුලංයි. පංසුකුලයාගේ දැරීම හෝ පංසුකුලය හෝ වන ස්වභාවය ඔහුටනුයි **පංසුකුලිකොයි.** දෙපට සිවුර - උතුරු සලුව, අඳනය සංඛ්‍යාත චීවරත්‍රයය තිචීවරංයි. තිචීවර ධාරණය හෝ තිචීවර ස්වභාවය ඔහුටනුයි **තෙචීවරිකොයි.** අපපිච්ඡා ආදීන්ගේ අර්ථය යට යූ.සේයි. ධුතවාදෝ යනු කම්පා කළ කෙලෙස් ඇති පුද්ගලයා ධුතයැයි කියයි. කෙලෙස් කම්පා කරන ක්‍රියාව හෝ එහි ධුතයක් ඇත. ධුතවාදයක් නැත. ධුතයක් නැත. ධුතවාදයක් ඇත. ධුතයක්ද නැත. ධුතවාදයක්ද නැත. ධුතයක්ද ඇත. ධුතවාදයක්ද ඇත. යන මෙම චතුෂ්කය දතයුතුය. ඒවා අතර යමෙක් තෙමේ ධුත ධර්මයන් සමාදන්ව (සිටී.) පවතී. අන්‍යයා ඒ සඳහා සමාදන් නො කරවයි. (නො යොදවයි) මේ පළමුවැන්නයි. යමෙක් තෙමේ ධුත ධර්මයන් සමාදන්ව නො පවතී. අන්‍යයා ඒ සඳහා යොදවයි. මේ දෙවැන්නයි. යමෙක් දෙ අයුරින්ම තොරද මේ තෙවැන්නාය. යමෙක් දෙ අයුරින්ම යුක්තද මේ සිව්වැන්නාය. ආයුෂ්මත් පිඬොල භාරද්වාජ හිමිපාණන් මෙබඳු ආකාර වේ. එහෙයින් ධුතවාදී යැයි යූ.සේයි. එක් දෙයක් ගැනීමෙන් ඒ හා සමානව යෙදෙන අනෙක් සියල්ලම ගැනීම වශයෙන් මෙම නිර්දේශයයි.

රූපං යන්න මෙනි. අධිචිත්ත මනුයුත්තෙතා යනු මෙහි අටසමවත් සම්ප්‍රයෝගයෙන්, අර්හත් ඵල සමවත් සම්ප්‍රයෝගයෙන් හෝ සිතෙහි අධිචිත්ත භාවය දතයුතුය. මෙහි අර්හත් ඵල සිතයි. ඒ ඒ සමවත්හි සමාධියම අධිචිත්තයයි මෙහි වනාහි අර්හත්ඵල සමාධිය දතයුතුය. සමහරු වනාහි 'මහණෙනි, අධි චිත්තයෙහි යෙදුන භික්ෂුව විසින් කලින් කල නිමිති ත්‍රයයක් මෙනෙහි කළ යුතුය' එම අධිචිත්ත සූත්‍රයෙහි මෙන් සමථ විදර්ශනා චිත්තය අධිචිත්ත යැයි මෙහි අදහස් කරන ලදැයි කියති. එය නොමනාය. පළමු අර්ථයම ගතයුතුය. **එතමත්ථං විදිත්වා** යනු එම ආයුෂ්මත් පිඬොල භාරද්වාජ තෙරුන්ගේ පරිෂ්කාරාධිෂ්ඨාන සම්ප්‍රදා සම්පන්නතාවය, අධි චිත්තයෙහි යෙදීම් සංඛ්‍යාත අර්ථය සර්වප්‍රකාරයෙන් දැන මෙසේ අධි චිත්තයෙහි යෙදීම් සංඛ්‍යාත අර්ථය සර්වාකාරයෙන් දැන මෙසේ අධි චිත්තයෙහි යෙදීම මාගේ සස්නයැයි දක්වනුයේ මෙම උදන් ඇනූ සේක.

එහි **අනුපවාදෝ** යනු වචනයෙන් කිසිවෙකුට උපවාද නොකිරීමද, **අනුපඝාතෝ** යනු කයින් කිසිවෙකුට පීඩා නොකිරීමද, පාතිමොක්ඛා යන මෙහි පාතිමොක්ඛ යන පදයට අර්ථය යට නොයෙක් ආකාරයෙන් යූ.සේයි.

එම ප්‍රාතිමෝක්ෂයෙහි, සත්වැදෑරුම් ආපත්ති ස්කන්ධයන්ගේ නොඉක්මවීම් ලක්ෂණය සංවරයයි. **සංවරොයි මතතඤ්ඤූතා** යනු ප්‍රතිග්‍රහණ, පරිභෝග වශයෙන් පමණ දැනීමයි. **පන්තඤ්ඤව සයනාසනං** යනු ජනශූන්‍ය ගැටුම් විරහිත සෙනසුන්, **අධිචිත්තෙව ආයොගෙ** යනු අෂ්ඨ සමාපත්තීන්ගේ අධිගමය සඳහා භාවනාවෙහි යෙදීමයි. වෙනත් ක්‍රමයක් අනුපවාදෝ යනු කෙනෙකුට විනාශකාරී වචන නොකීමයි. එයින් සියලුම වාචසික සීලය ඇතුලත් කරයි. **අනුපඝාතෝ** යනු කයින් කිසිවෙකු නැසීමට අන්‍යයා වෙහෙසීමට ක්‍රියා නොකිරීමයි. ඉන් සියලුම කායික සීලය සංග්‍රහකරයි. යම් ආකාර වූ මේ ද්වයය වනාහි බුදුවරුන්ගේ සාසනයන්ට ඇතුලත් වේ. එය දැක්වීමට 'පාතිමොක්ඛව සංවරෝ'යි යූ.සේයි. ව ශබ්දය නිපාත මාත්‍රයකි. **පාතිමොක්ඛව සංවරෝ** යනු විනාශකාරී වචන නොකියනුයේ, අනුන් නසන ක්‍රියා නොකරනුයේ **ප්‍රාතිමෝක්ෂ** සංවරයෙන් සංවර වූයේ යයි අර්ථයි. නොහොත් පාතිමොක්ඛ යනු හේත්වර්ථයෙහි සත්තමීයි. ප්‍රාතිමෝක්ෂයෙහි නිශ්‍රය වූ සංවරයයි. එය කිමෙක්ද? විනාශකාරී වචන නොකීම, කයින් අන්‍යයෙකු පීඩාවට පත් නොකිරීම, විශේෂයෙන් උපසම්පදා වේලාවෙහි ප්‍රාතිමෝක්ෂ සීලය **සමාදන්** වූයේ **නම්** වේ. එම ප්‍රාතිමෝක්ෂ සීලයෙහි පිහිටියහුට ඉන් **මත්තෙහි** උපවාද, උපඝාතයන්ගේ **නොකිරීම්** වශයෙන් සංවරය වේ. එය අනුපවාද, අනුපඝාත යැයි යූ.සේයි. නොහොත් ප්‍රාතිමෝක්ෂයෙහි, නිපදවිය යුත්තෙහි යයි සත්තමීයි. යම්සේ සිතෙහි නොසන්සුන්කම නුනුවණින් මෙනෙහි කිරීම ආසන්න කරුණුයි එම ප්‍රාතිමෝක්ෂයෙන් අනුපවාදය, **අනුපඝාතය සම්පූර්ණ** කරගත යුතුය. අනුපවාදය - අනුපඝාතය ප්‍රාතිමෝක්ෂ සංවරයෙහි සංග්‍රහ කරන ලද්දේම යැයි අර්ථයි. **සංවරොව** යන මෙයින් වනාහි සති, ඥාන-ඛන්ති, වීර්යය යන මෙම සංවර **සතරෙහි** ග්‍රහණයයි. මෙම සංවර චතුෂ්කය ප්‍රාතිමෝක්ෂ සංවර සාධකයි. **මතතඤ්ඤූතාව භතතසමිං** යනු සෙවීම, පිළිගැනීම, පරිභෝග වියදම වශයෙන් භෝජනයෙහි ප්‍රමාණය දැනීම, **පන්තඤ්ඤව සයනාසනං** යනු භාවනාවට යෝග්‍ය අරණ්‍ය, රුක්මුල් ආදී ජනයාගෙන් තොර සෙනසුන. **අධිචිත්තෙව ආයොගෙ** යනු සියලු සිත්වලට අධික හෙයින්ද, උතුම්

හෙයින්ද, අධිචිත්ත සංඛ්‍යාත අර්හත්ඵල සිතෙහි සාධනය සඳහා එහි නිෂ්පාදනය සඳහා සමථ විදර්ශනා භාවනා වශයෙන් උත්සාහය. **එතං බුද්ධාන සාසනං** යනු එම අන්‍යයාට උපවාද නොකිරීම, කායික පීඩා නොකිරීම යන ප්‍රාතිමෝක්ෂ සංවරය පර්යේෂණ, ප්‍රතිග්‍රහණ, මාත්‍රඥතා විවේක වාසය කියන ලද ආකාර ඇති අධි චිත්තානුයෝගයද බුදුවරුන්ගේ සාසනයයි. අවවාදයයි. අනුසාසනාවයැයි අර්ථයි. මෙසේ මෙයින් ත්‍රිවිධ ශික්ෂාව කියන ලදැයි දතයුත්තාහ.

සවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

4-7

සත්වැන්නෙහි පෙර නොකියන ලද්දක් නැත. ගාථාවෙහි **අධිචෙතසෝ** යන අධි චිත්තවත් භාවයෙන්, සියලු සිත්වලට අධික වූ (උසස් වූ) අර්හත්ඵල චිත්තයෙන් යුක්ත වූවහුට යන අර්ථයි. **අපපමජ්ජතෝ** යනු ප්‍රමාද නොවීමෙන් අප්‍රමාදයෙන් නිරවද්‍ය ධර්මයන්හි නිතර ක්‍රියා කිරීමෙන් යුක්ත වූවහුට යැයි යූ.සේයි. මුනිනො යනු යමෙක් දෙලොව අවබෝධ කරයිද, එහෙයින් ඔහු මුනි යයි කියයි. මෙසේ දෙලොව අවබෝධ කිරීමෙන් හෝ, ඤාණයට 'මොන' යයි කියයි. ඒ අර්හත්ඵලය ප්‍රඥා සංඛ්‍යාත ඤාණයෙන් යුක්ත වූ හෙයින් **ක්ෂීණාශ්‍රවයන් වහන්සේ** මුනි නමැ. එම මුනිහුගේ. **මොනපථෙසු සික්ඛතො** යනු අර්හත් ඤාණ සංඛ්‍යාත මෝනයාගේ මාර්ගයන්හි සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන්හි, ත්‍රිවිධ ශික්ෂාවන්හි හෝ හික්මෙන, මෙය ද පූර්වභාග **ප්‍රතිපදාව** සඳහා යූ.සේයි. රහතන් වහන්සේ නිමකරන ලද ශික්ෂා ඇත්තේය. එහෙයින් මෙසේ හික්මෙන මෙම ශික්ෂාවෙන් මුනිභාවයට පත් මුනිහුගේ යැයි මෙසේ මෙහි අර්ථ දතයුතුය. යම්හෙයකින් එයම වේද? එහෙයින් යට මාර්ගඵල චිත්තයන්ගේ වශයෙන් **අධිචෙතසොයි** චතුස්සත්‍ය අවබෝධ ප්‍රතිපත්තියෙහි අප්‍රමාද වීම් වශයෙන් **අපපමජ්ජතොයි.** මාර්ග ඥානය හා යුක්ත වීමෙන් **මුනිනොයි** මෙසේ එම තෙපදයන්ගේ අර්ථය යෙදේමය. නොහොත් අප්‍රමාදීව හික්මෙන්නහුටයැයි, ප්‍රධාන හේතු අර්ථතාවය දතයුතුය. අප්‍රමාදී වන හේතුවද හික්මෙන හේතුවද අධිචෙතසයි. **සොකා න භවන්ති තාදිනො** යනු එබඳු ක්ෂීණාශ්‍රව මුනිහුගේ අභ්‍යන්තරයෙහි

ඉෂ්ඨ වියොගාදී වස්තුක වූ සෝක වීම් සිත් තැවුල් නොවෙත්. නොහොත් **තාදිනො** යනු අටලෝ දහමින් නොසැලෙන ලක්ෂණයෙන් යුක්ත වූ මෙබඳු මුනිහුට සෝක හට නොගනිත් මේ මෙහි අර්ථයයි. **උපසන්තස්ස** යනු රාගාදීන්ගේ අත්‍යන්ත ව්‍යුපසමනයෙන් සන්සුන් වූ, සදා **සති** මතො යනු සිහියෙහි මහත් බවට පැමිණීමෙන් හැමකල්හි සිහියෙන් තොර නොවූවහුට, මෙහිද මුනිනො අධිචෙතසො යන මෙයින් අධි චිත්ත ශික්ෂාවද, අප්පමජ්ජතො යන එයින් අධිසීල ශික්ෂාවද, මුනිනො මොන පථෙසු සික්ඛතො යන ඒවායින් අධිප්‍රඥා ශික්ෂාවද, මුනිනොයි යන එයින් අධිප්‍රඥා ශික්ෂාවද, මොන පථෙසු සික්ඛතො යන එයින් එම ලෝකෝත්තර ශික්ෂාවන්ගේ පූර්වභාග ප්‍රතිපදාවද, සොකා නභවනති යන ආදීන්ගෙන් ශික්ෂා සම්පූර්ණ කිරීමෙහි අනුසස් ප්‍රකාශ කරන ලදැයි දතයුතුය. සෙස්ස යූ.සේමය.

සත්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

4-8

අටවැන්නෙහි, **සක්කතො** ආදී පදයන්ගේ අර්ථය යට වර්ණනා කරන ලද්දේමය. **අසහමානා** යනු නොඉසන්නාහු ඊර්ෂ්‍යා කරන්නාහු යයි අර්ථයි. **භික්ෂු** සංඝයාටද ලැබෙන සත්කාර නොඉසන්නාහු යයි **සම්බන්ධයයි. සුන්දරී** යනු ඇයගේ නාමයයි. ඕ වනාහි එකල්හි සියලු **පරිබ්‍රාජිකාවන්** අතර මනා රූ ඇතියේ, දර්ශනීය, ප්‍රසාදජනක උතුම් රූප සෞන්දර්යයෙන් යුක්ත වූවාය. එහෙයින්ම ඕ සුන්දරී යැයි ප්‍රකට විය. ඕද නොඉක්මවන ලද යෞවනයෙන් යුක්ත වූවා අසංවර හැසිරීම්ද වේ. එහෙයින් එම සුන්දරී පරිබ්‍රාජිකාව පච්චම්හි යෙදවූහ. එම අන්‍ය තීර්ථකයින් විසින් බුද්ධෝත්පාදයෙහි පටන් තට ලාභසත්කාර වූවාහු, යට අක්‍රෝශ සූත්‍ර වර්ණනායෙහි සඳහන් වූ ක්‍රමයෙන් භාග්‍යවතුන් වහන්සේටද, භික්ෂු සංඝයාටද මහත් අප්‍රමාණ ලාභසත්කාර පවත්වනු දැක, ඊර්ෂ්‍යාවෙන් මඩනා ලද්දාහු එක්ව, අප ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ උපන් කල පටන් නටුයේ වෙමු. නැසුනු (හීන) ලාභ සත්කාරිකයෝ වෙමු. කිසිවෙක් අපගේ අස්ථිත්වයද නොදනියි. කවර හේතුවකින් ලෝකයා ශ්‍රමණ

ගෞතමයන් කෙරෙහි විශේෂ ප්‍රසන්නතාවයකින් යුක්තව මහත් වූ සත්කාර සම්මා එළවයිදැයි එක්ව සාකච්ඡා කළහ. එහිදී එක් අයෙක් මෙසේ කීය. උසස් කුලානුයුක්ත, කඩ නුවූ, මහා සම්මත පරම්පරාවෙන් උපන්නේය. අනෙකෙක් උපතෙහිදී ඔහුට නොයෙක් ආශ්චර්යයන් පහළ වූහයිද අනෙකෙක් කාලදෙවල වැන්දවීමට එළවන ලද ඔහුගේ පාද පෙරලී කාලදේවලගේ ජටාවෙහි පිහිටියේ යැයි ද, අනෙකෙක් වප්මගුල් කල දඹගස් සෙවනෙහි නිදිකරවන ලද්දහුට - මධ්‍යාහ්නය ඉක්මගිය කල්හිද දඹ සෙවන නොපෙරළී සිටියේ යැයි ද අනෙකෙක් මනා රූ ඇතියේ, දර්ශනීය ප්‍රසාදජනක රූ සපුවෙන් යුක්ත යැයිද අනෙකෙක් ජරාවෙන් දිරාගිය, රෝගී, මළ, ප්‍රව්‍රජ්ජිත සංඛ්‍යාත නිමිති දැක සංවේගප්‍රාප්තව ලැබීමට නියමිත (අප්‍රමාණ වූ) චක්‍රවර්ති රාජ්‍යය හැර පැවිදි වූයේ යයිද කීය. මෙසේ අප්‍රමාණ කාලයක් රැස්කරන ලද වෙනත් අයෙකුට සාධාරණ නුවූ භාග්‍යවතුන් වහන්සේගේ පුණ්‍ය සම්භාරය, ඉහළම පාරමිතා ප්‍රාප්තිය, උපමා රහිත කෙලෙස් තුනී කිරීමේ ප්‍රතිපදාව, ඉතා උතුම් ඥානය, කෙලෙස් ප්‍රහාණ සම්පත්තිය ආදී බුද්ධානුභාව නොදන්නාහු තමා විසින් දිටි පරිදි ඇසූ පරිදි ඒ ඒ කරුණින් භාග්‍යවතුන් වහන්සේට බුහුමන් කිරීම වර්ණනා කොට, බුහුමන් නොකරන කරුණු නොදක්නාහු කවර නම් වූ කරුණකින් අප ශ්‍රමණ ගෞතමයන් වහන්සේට අයසක් උපදවා ලාභ සත්කාර නසන්නෙමුදැයි සාකච්ඡා කළහ. ඔවුනතර එක් සියුම් කල්පනාවෙන් යුක්තයෙක්, පින්වත, මේ සත්ත්ව ලෝකයෙහි මාගම් සුවයෙහි නොඇලුනු සත්ත්වයෙක් නම් නැත. මේ ශ්‍රමණ ගෞතම තෙමේද මනා රූ ඇත්තේය. දෙවියෙක් හා සම වූයේ තරුණය. තමා හා සම රුවැති මාගමක් ලැබ සිත් අලවන්නේය. තවද, සිතේ නො අලවයි නම් ජනතාවට වනාහි සැක ඇතිවන්නේය. එසේනම් අපි සුන්දරී පරිබ්‍රාජිකාව, යම්සේ ශ්‍රමණ ගෞතමයන්ගේ අපකීර්තිය පෘථුවිය පුරා පැතිරෙන්නේද? එසේ පිටත්කර යවමු. ගෞතම තෙමේ අපකීර්තියෙන් උපද්‍රවයට පත්වූයේ හිස ඔසවන්ට නොහැකි වනුයේ කොතැනකට හෝ පලා යන්නේ යයි සියල්ලෝම ඒකමතිකව එසේ යවන්ට සුන්දරියගේ සමීපයට ගියහ. ඕ ඔවුන් දැක නුඹලා කුමක් සඳහා එකතුව ආවහුදැයි කීවාය. තීර්ථකයෝ කථා නොකරන්නාහු ආරාම කෙළවර වැසුණු පෙදෙසක හිඳගත්හ. ඕ එහි ගොස් නැවැත නැවැත ආමන්ත්‍රණය කරන්නී ප්‍රතිවචන නොලැබ, කිමෙක්ද මා ඔබලාට අපරාධයක් කරන ලද්දේද? කවර හෙයින් මට පිළිවදන් නොදෙව්දැයි කීවාය. කිමෙක්ද නුඹ අප වෙහෙසනු ලබන කල්හි මධ්‍යස්ථ වන්නෙහිද? කවරෙක් නුඹලා

වෙහෙසයිද, කිමෙක්ද ශ්‍රමණ ගෞතමයන් වහන්සේ අප වෙහෙසවා තට ලාභ සත්කාරකයින් කොට හැසිරෙන්නහු නොදක්නෙහිදැයි කීය. එහිදී මා විසින් කුමක් කළයුතුදැයි කී කල්හි එසේනම් නුඹ නිතර ජේතවන සමීපයට ගොස් මහජනයාට මේ මේ ආකාරයෙන් කියවයි කීහ. ඕ ද මැනැවැයි පිළිගත්තාය. එහෙයින් **අඤ්ඤතිත්ථියා පරිබ්බාජිකා භගවතො සක්කාරං අසහමානා** යනාදිය ගූ.සේයි. එහි **උසභසි** යනු හැකි වෙහිද? **අත්ථං** යනු හිතවත් කෘත්‍යයක් හෝ, **කපාභං** යනු කිමෙක්ද මම, එම තීර්ථකයෝ ඇයගේ ඥාතිත්වයක් නොමැති වූයේ නමුදු, ප්‍රවෘජ්‍යා සම්බන්ධ මාත්‍රයෙන් ඇය තම වසඟයට ගන්ට ඥාතීහු මෙන්ව, **උසභසිඤ්ඤං භගිනි ඤාතීනං අත්ථං කාතුංයි** කීහ. ඕ ද වැලක පැටලුන මුවෙකු මෙන්, පාදයන්හි ලග්න වූයේ මාගේ ජීවිතය ඥාතීන්ගේ යහපත උදෙසා පරිත්‍යාග කරන ලද්දෙමියි කීවාය. **තෙනහි** යනු නුඹ මාගේ ජීවිතය ද නුඹලාගේ ප්‍රයෝජනය සඳහා පරිත්‍යාග කරන ලද්දෙමියි කියන්නෙහිය. නුඹද ප්‍රථම වයසෙහි සිටියෙහි මනා රූ ඇති අති දර්ශනීය බවට පැමිණියෙහිය. එහෙයින් යම්සේ නුඹ හේතුකොට ශ්‍රමණ ගෞතමයාට අයසක් උපදින්නේද, එසේ කරවයි කියා නිතර දෙවිරමට යව යයි යෙදවූහ. ඕද දැරියක් කියත් දත්පෙළින් මල්වැල් ක්‍රීඩාව ක්‍රීඩා කරනු කැමැතියේ මෙන්ද, බිඳිනු මදැති සැඩ ඇතෙක් පරාමර්ශනය කරන්නාක් මෙන්ද නළලින් මාරයා ගන්නාක් මෙන්, තීර්ථකයින්ගේ වචන පිළිගෙන, මල් ගඳ විලවුන් බුලත් එනසාල්, කරාබුනැටි ආදිය ගෙන, ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනා ශ්‍රවණය කොට මහජනයා නගරයට පිවිසෙන කල්හි ජේතවන අභිමුඛව යන්නී කොහි යෙහිදැයි විමසූ කල්හි ශ්‍රමණ ගෞතමයන් සමීපයටය. මම ඔහු සමග එක ගඳකිළියෙහි වසමියි කියා, එක්තරා තීර්ථකාරාමයක වාසයකොට උදෑසනම දෙවිරම් මගට බැස නුවර අභිමුඛව එන්නී කිමෙක්ද සුන්දරිය, කොහි ගියෙහිදැයි විචාරන ලද්දී, ශ්‍රමණ ගෞතමයන් සමග එක ගඳකිළියෙහි වැස ඔහු කෙලෙස් රතියෙන් රමණය කරවා පැමිණියෙමියි කියයි. එහෙයින් එවං අයපාති බො **සුන්දරී පරිබ්බාජිකා තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං පටිසුත්වා අභික්කමණං ජෙතවනං අගාමාසියි** ගූ.සේයි.

තීර්ථකයෝ කිහිප දිනක් ඇවෑමෙන් ධූර්තයන්ට කහවණු දී යව් සුන්දරිය මරා ශ්‍රමණ ගෞතමයන්ගේ ගඳකිළිය නුදුරෙහි මල් කසලගොඩ අතරෙහි හාරා දමා එව් යයි කීහ. ඔව්හු එසේ කළහ. ඉක්බිති තීර්ථකයෝ සුන්දරිය නොදක්නෙමුයි කෝලාහල කොට, රජුට දන්වා, නුඹලා කොතැන

සැක කරව්දැයි රජු කී කල්හි මේ දිනවල දෙව්රම වාසය කරයි. එහි ඇයගේ ප්‍රවෘත්තියක් නොදනිමුයි කීහ. එසේනම් යව්. ඇය එහි සොයව් යයි රජු විසින් අනුදන්නා ලද්දාහු තම උපස්ථායකයින් ගෙන දෙව්රමැ ගොස් සොයන්නාක් මෙන් ව මල් කසල කළඹා ඇයගේ සිරුර ඇදක නංවා නුවරට ප්‍රවේශ කරවා, ශ්‍රමණ ගෞතමයාගේ ශ්‍රාවකයෝ, තම ශාස්තෘවරයා විසින් කළ පාපකර්මය වසන්නෙමුයි සුන්දරිය මරා, මල් කසල අතරෙහි බහා තැබූහයි රජුට සැල කළහ. රජුද පරීක්ෂණයකින් තොරවම, එසේනම් යව්, නුවර ඇවිදිව් යයි කීය. ඔවුහු නුවර වීථීන්හි බලව්, ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයින්ගේ ක්‍රියාවකැයි ආදිය කියමින් හැසිර නැවත රජුගේ නිවහන් දොරටු ගියහ. රජු සුන්දරියගේ සිරුර අමු සොහොනෙහි අට්ටාලයක නංවා රැක්විය. ආර්ය ශ්‍රාවකයෝ හැර සැවැත් වැසියෝ, බොහෝ සෙයින්, ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ගේ ක්‍රියාව බලව් ආදිය කියා ඇතුල් නුවරද, නුවරින් පිටතද භික්ෂූන්ට ආක්‍රොශ කරමින් හැසිරුණහ. එහෙයින්, **යදා තෙ අඤ්ඤිංසු අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා වොදිට්ඨා බො සුන්දරී** යනාදිය යූ.සේයි. එහි අඤ්ඤිංසු යනු දැනගත්හ. **වොදිට්ඨා** යනු බහුලව දුටහ. දෙව්රමට යන්නීද ආපසු එන්නීද විශේෂයෙන් දුටුවාහු බහුලව දුටහ යන අර්ථයි. **පරිබාකුපෙ** යනු දිග වළෙකැ (දිය අගලක) **යා සා මහාරාජ සුන්දරී** යනු මහරජ යම් ආකාර වූ ඕ මෙම නගරයෙහි රූපයෙන් සුන්දර බැවින් සුන්දරි යැයි ප්‍රකට, මනාසේ දත් පරිබ්‍රාජිකාවකි. **සා නො න දිස්සති** යනු ඕ අපගේ ඇස මෙන්ද, ප්‍රිය කළ යුතුය. දැන් නොදක්නේය. **යථා නිකඛිත්තං** යන පුරුෂයන් අණ කරවා මල් කසල අතර තමා විසින් යම්සේ තබන ලදද? **යථා නිබ්බතංයිද** පාඨයි. පෘථිවියෙහි සාරන ලද අයුරෙනැයි අර්ථයි. **රථියාය රථියං** යනු වීථියෙන් වීථිය, වීථි යනු විනිවිද යන වීථියි. **සිංඝාටක** යනු තුන්මංසල, **අලජ්ජිනො** ලජ්ජා නොමැති, පව් පිළිකුල් නොකරන්නාහුයි අර්ථයි. **දුස්සීලා** යනු සිල් නොමැති, **පාපධම්මා** යනු ලාමක ස්වභාව ඇති, පහත් හැසිරීම් ඇති. මුසාවාදිනො යනු දුස්සීල වූවාහු අපි සිල්වන්තයෝ වෙමුයි මුසා තෙපලන හෙයින් බොරු කියන්නා වූ, **අබ්‍රහ්මචාරිනො** යනු මෛථුන ප්‍රතිසේවනයෙන් ශ්‍රේෂ්ඨ නුවූ ක්‍රියාවන්හි හැසිරෙන, ඉමෙහි නාම යනු පිළිකුල් කරමින් කියති. **ධම්මචාරිනො** යනු කුසල්දම්හි හැසිරෙන, **සමචාරිනො** යනු කාය කර්මාදියෙහි සම හැසිරුම් ඇති **කල්‍යාණ ධම්මා** යනු සුන්දර ස්වභාව, පිළින දෙන්නාහ නමැ'යි සම්බන්ධයි. මෙහි නාම ශබ්දයෝගයෙන් පිළින දෙන්නාහයි අනාගත කාලවචනයි. **සාමඤ්ඤං** යනු සංසිඳවූ පව් හෙයින් ශ්‍රමණභාවය, **බ්‍රහ්මඤ්ඤං** යනු බහා තැබූ පව්හෙයි විශිෂ්ඨ භාවයයි.

කුතො යනු කවර කරුණෙකින්, අපගතා යනු පහ වූ, ගිලිහී ගිය, පුරිසකිච්චං යනු මෙවුන්දම් සෙවුම සඳහා කියයි. එකල්හි භික්ෂූනු එපවත් බුදුරදුන්ට සැලකළහ. ශාස්තෘන් වහන්සේ, මහණෙනි එසේනම් නුඹලාද ඒ මිනිසුන් මේ ගාථාවෙන් ආපසු චෝදනා කරව්යැයි කියා අභූතවාදී යන ගාථාව වදාළහ. ඒ සඳහා **අථඛො සමබහුලා -පෙ- නිහීනකම්මා මනුජා පරත්තායි** යූ.සේයි. එහි **නෙසො භික්ඛවෙ සද්ධෝ චිරං භවිස්සති** යන ශාස්තෘන් වහන්සේ සත්දින අපකීර්ති ඉපැත්ම සර්වඥතා ඥානයෙන් දැන භික්ෂූනු අස්වසනුයේ මෙය වදාළහ. ගාථාවෙහි **අභූතවාදී** අන්‍යයාගේ දොසක් නොදැකම මුසාවාදයක් කොට නුවූ දෙයින්, අසත්‍යයෙන් අනෙකාට දෝෂාරෝපනය කරනුයේ යොචාපි කඤ්චා යනු යමෙක් පාපකර්මයක් කොට මම එය නොකරමියි කීය. පෙවව සමාභවතති යනු එම දෙදෙනම මින් පරලොව ගොස් නිරයට පැමිණීමෙන් ගතියෙන් සම වෙත්. ගතියම වනාහි ඔවුන්ගේ ආයුෂ පිරිසිඳින ලද්දාහුය. බොහෝ පව්කම් කොට නොපිරිසිඳි ආයුෂ ඇතිව නිරයෙහි පැසේ. ස්වල්පයක් පව්කොට ස්වල්ප මාත්‍ර වූ කලක් පැසේ. එම දෙදෙනාගේම කර්මය ලාමකමය. එහෙයින් **නිහීන කම්මා මනුජා පරත්ථ** යැයි යූ.සේයි. පරත්ථ යන පදයට පෙරටුව **පෙච** යන පදයෙන් සම්බන්ධයි. පරලෝවිහි, පරලෙව්හි පහත් ක්‍රියාවන් කළ ඔව්හු මෙයින් ගොස් පරලෙව්හිදී සම වෙත්යයි අර්ථයි. **පරියාපුණිත්වා** යනු ඉගෙන **අකාරකා** යනු අපරාධ නොකරන්නෝ **නයිමෙහි කතං** යනු මෙසේ ඔවුන්ට අදහස් විය. යම් ආකාර වූ අන්‍ය තීර්ථකයෝ උද්ඝෝෂණය කොට මුළු නුවර ඇවිද්දාහුද? මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයින් විසින් ඒකාන්තයෙන් එම පාපකර්මය නොකරන ලදී.

අප මොවුන් කෙරෙහි මෙබඳු අසභ්‍ය එරුෂ වචනයන්ගෙන් දෝෂාරෝපණය කරන කල්හිද කිසි වෙනසක් නොදක්වති. ඉවසීම හා සුරතභාවය අත් නොහරත්. හුදෙක් **අභූතවාදී නිරයං උපපති**'යි ධර්මයම දෙන්නාහු දිවුරත්මය. මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ අප නොසලකා දෝෂාරෝපණය කරනවුන් කෙරෙහි දිවුරති. පෝෂණය කරන්නවුන් මෙන් කියති. මොව්හු තමන්ගේ නොකළ බැව් අවබෝධ කරන්ට අපට දිවිරීම කරති. එම මනුෂ්‍යයන්ට භාග්‍යවතුන් වහන්සේ විසින් දේශිත ගාථාව ශ්‍රවණ අතරතුරදීම බයාදුකම බැසගත්තේය. සංවේගය උපනි. මෙය අප විසින් ප්‍රත්‍යක්ෂව නොදක්නා ලද්දෙමු. අසන ලද්ද නම් එසේද වේ. අන්‍යාකාරයකින්ද වේ. එම අන් තොටුවෝ මොවුන්ට අනර්ථකාමීහුය. අහිතකාමීහුය. එහෙයින් ඔවුන් සඳහා ශ්‍රමණයෝ දුර්ජනයෝයි. යන

මෙය අප විසින් නොකිව යුතුය. ඔව්හු ඉන්පසු ඉන් වැළකුණහ. රජුද යම් අය විසින් සුන්දරිය මරණ ලද්දේ ද, ඔවුන්ගේ දැනගැනීම සඳහා රාජපුරුෂයින් අණ කළේය. ඉක්බිති එම ධූර්තයෝ එම කහවණුවලින් සුරාපානය කරන්නාහු ඔවුනොවුන් කලහ කළහ. ඔවුනතර එකෙක් එකෙකුට නුඹ සුන්දරිය එක පහරින් මරා, මල් කසල අතර දමා ඉන් ලද කහවණුවලින් සුරා පානය කරහි. එසේ වේවා වේවායි කීවේය. රාජ පුරුෂයෝ එය අසා එම ධූර්තයන් ගෙන රජුට දැක්වූහ. රජු, නුඹලා විසින් ඕ මරන ලදැයි එම ධූර්තයන් විමසීය. එසේය දේවයිනි. කවරහු විසින් මරවන ලද්දේද? දේවයිනි, අන් තොටුවන් විසිනි. රජු තීර්ථකයින් කැඳවා එම කරුණ එසේයයි ප්‍රතිග්‍රහණය කරවා මෙම සුන්දරිය ශ්‍රමණ ගෞතමයන්ට නුගුණ එළවනු කැමැති අප විසින් මරවන ලද්දේය. ගෞතමයන් වහන්සේගේ හෝ ගෞතම ශ්‍රාවකයන්ගේ දොසක් නොමැත. අපගේම දෝෂයැයි මෙසේ කියමින් නුවර සරහුයි අණ කළේය. ඔව්හු එසේ කළහ. මහජනයා මනාව ඇදහිය. තීර්ථකයින්ට නින්දා කළහ. තීර්ථකයෝ මිනිස් වධ දණ්ඩනවලට පැමිණියහ. එතැන්පටන් බුදුරදුන්ටද, බික් සඟනටද අතිශයින් සත්කාර සම්මාන විය. භික්ෂූහු ආශ්චර්ය, අද්භූත සිත් හටගත්තාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ තම ප්‍රීතිය දැනුම් දුන්හ. එහෙයින් අථඛෝ සම්බහුලා භික්ඛූ -පෙ- අනතරහිතෝ භනෙත සෝ සඳ්දායි යූ.සේයි. කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ තීර්ථකයන්ගේ මෙම කාර්යය භික්ෂූන් නොදැන්වූයෙහිද? ආර්යයන්ට දැන්වීමෙන් ප්‍රයෝජනයක් නැත. පෘථග්ජනයන් අතර යම්කෙනෙක් පිළි නොගන්නාහු නම්, එය ඔවුන්ට බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස පවතින්නේ යයි දැනුම් නුදුන්නේය. තවද යම් අනාගතයෙහි මෙබඳු වස්තුවක ප්‍රකාශ කිරීමක් බුදුවරුන් පුරුදුකොට නැත. අන්‍යයා උදෙසාම භාග්‍යවතුන් වහන්සේ කිලුටු සහිත පක්ෂය පැහැදිලි කරයි. කළ අවකාශ ඇති කර්මයද නවතන්ට නොහැකි යයි අසත්‍ය දොස් නැගීම හා ඒ නිමිති කොට හටගන්නා තත්වයන්හිදී භාග්‍යවතුන් වහන්සේ මධ්‍යස්ථ වෙමින් වැඩහුන් සේක. එහෙයින් යූ.සේයි.

න අන්තලික්ඛෙ නසමුද්ද මජ්ඣෙ - න පබ්බතානං විවරං පවිසස
න විජ්ජති සෝ ජගතිපදෙසෝ - යත්ථට්ඨිතෝ න මුච්චෙය්‍ය පාප කම්මාති

යම්තැනක සිට කල පාප කර්මයෙන් මිදෙන්නේ ද? එබඳු තැනක් අහසෙහිද නැත. සමුද්‍රයෙහිද නැත. පර්වත කුහරයකට පිවිසද නැත.

මෙලෙස පාප කර්ම විපාකයෙන් මගහැර සැඟවී යාමට සුදුසු තැනක් ලෝකයෙහි විද්‍යමාන නොවේ.

එතමත්ථං විදිත්වා යනු මෙම ස්ථාන සිදීම් වශයෙන් අඥාන ජනයන් විසින් පවත්වන ලද, නොමනාව කියන ලද වචන ක්ෂාන්ති බලයෙන් යුක්ත ප්‍රාඥයාට ඉවසීම දුෂ්කර නැතැයි මෙම කරුණ හැම අතින් දැන **ඉමං උදානං** යනු ඉවසීම් බල ප්‍රකට කිරීමට උදන් ඇනූ සේක.

එහි **තුදනති** වාචාහි ජනා අසංයතා සරෙහි සංගාම ගතංව කුඤ්ජරං යනු කායික සංවරාදීන්හි කවරාකාර වූ සංවරයක අභාවයෙන්. අසංයතා යනු නොහික්මුණු අඥාන ජනයා. **සරෙහි** යනු ඊතලවලින් **සංගාමගතං** යනු යුදවන්. **කුඤ්ජරංව** ඇත්රජුට සතුරු යෝධයෝ මෙන් වචන නමැති ඊතලවලින් මෙන් **තුදනති** විදිත්. මේ ඔවුන්ගේ ස්වභාවයයි. **සුභාෂාන වාක්‍යං එරුසං උදීරතං** අධිවාසයෙ **භික්ඛු අදුට්ඨචිත්තො** යනු එය වනාහි එම අඥාන ජනයන් විසින් කියන ලද මර්මස්ථාන ගැටීම් වශයෙන් පවත්වන ලද, **එරුසං** වාක්‍යං නුවූ වචනය වූ වචනයක් ලෙසින් නිරවුල් කරනුයේ, මාගේ **කියත්** උපමා අවවාදය සිහි කරනුයේ මඳකුදු දූෂිත නොවූ සිතැතියේව සසර ස්වභාවය එය යැයි සසර බිය දක්නාසුලු **භික්ෂුව අධිවාසයෙ** යනු ඉවසීම් ඉවසීමෙහි සිට ඉවසන්නේයයි අර්ථයි මෙහි කීහ. එම ක්‍රියාව කිමෙක්ද? අප්‍රමාණ කාලයක් සකස්ව රැස්කරන ලද පුණ්‍ය **සම්භාර**යක් ඇති ශාස්තෘන් වහන්සේ මෙසේ දරුණු අභූත දෝෂාරෝපණයකට පැමිණිනිද? කියනු ලැබේ. ඒ මේ භාග්‍යවතුන් වහන්සේ බෝසත් වූයේ **අතීත** ජාතියෙහි මුතාලි **නම්** ධූර්තව පාප ජන ආශ්‍රයට පත්වූයේ නුනුවණින් මෙනෙහි කිරීම් බහුලව හැසිරේ. හෙතෙම එක් දිනයක සුරභි නමැති පසේ බුදුරදුන් නගරයෙහි පිඬු පිණිස පිවිසීමට සිවුරු පොරවන්නහු දිටිය. එසමයෙහි එක්තරා ස්ත්‍රියක් එතුමාණන් නුදුරෙහි යයි. ධූර්ත තෙමේ මේ ශ්‍රමණ තෙමේ අබ්‍රහ්මචාරී යැයි දෝෂරෝපණය කළේය. හෙතෙම එම පාපකර්මයෙන් බොහෝ වර්ෂ දහස් ගණනක් නිරයෙහි පැසී එම කර්මයෙහි ඉතිරි විපාක වශයෙන් බුද්ධත්වයට පත්වද සුන්දරිය හේතුකොට දෝෂාරෝපණයට පැමිණුනි. එය යම්සේද, මෙසේ චිංචිමානවිකාදී විකෘතිකාරක ස්ත්‍රීන්ගේ, භාග්‍යවතුන් වහන්සේට දෝෂාරෝපණාදී, දුක් නිපන්නාහු ඒ සියල්ල පෙර කරන ලද කර්මයාගේ අවශේෂ විපාක වශයෙන් යම් කර්ම කෙනෙක් වේද ඒවා **පිලොතිකානිය** කියත්. අපදානයෙහි යූ.සේයි.

අනොතත්ත සරාසන්නෙ - රමණීයෙ සිලාතලෙ
නානාරතන පජ්ජොතෙ - නානා ගන්ධ වනන්තරෙ

නොයෙක් රත්නයන්ගෙන් බබලන, නොයෙක් සුවඳැති අනවතප්ත විල ආසන්නයෙහි සිත්කලු ගල් තලාවෙක්හි.

මහතා භික්ඛු සංඝෙන - උපෙතෙ ලොක නායකෙ
ආසිනෙ බ්‍යාකරී තත්ථ - පුබ්බ කම්මානි අත්තනො

මහ බික්සඟ විසින්, පිරිවරන ලද ලෝක නායකයාණන් වහන්සේ වැඩහුනුයේ, එහිදී තමාගේ පූර්වකර්මය ප්‍රකාශ කළ සේක.

සුනාථ භික්ඛවො මයහං - යං කම්මං පකතං මයා
පිලොතිකස්ස කම්මස්ස - බුද්ධත්තෙපි විපච්චති

මහණෙනි, පිලොතික කර්මයෙහි විපාක බුද්ධත්වයෙහිද විපාක දේ. මවිසින් එබඳු වූ යම් කර්මයක් කරන ලද ද එය අසව්.

මුනාලි නා මහං ධුත්තෙ - පුබ්බ අඤ්ඤාය ජාතියා
පච්චෙක බුද්ධං සුරහිං - අබභාචික්ඛිං අදූසක

මම පෙර අප්‍රකට (ශුද්‍ර වැනි) ජාතියෙහි මුනාලි නම් ධූර්තයෙක් වීමි. අන් අයෙකු දූෂණය නොකරන සුරහි නම් පසේ බුදුරදුන්ට අසත්‍ය දෝෂාරෝපණය කළෙමි.

තෙන කම්ම විපාකෙන - නිරයෙ සංසරිං චිරං
බහු වස්ස සහස්සානි - දුක්ඛං වෙදෙමි වෙදනං

එම කර්මයෙහි විපාකයෙන් බොහෝ කලක් නිරයෙහි සැරිසැරීමි. බොහෝ දහස් ගණන් අවුරුදු දුක් වේදනා වින්දෙමි.

තෙන කම්මාවසෙසෙන - ඉධ පච්ඡිමකෙ භවෙ
අබභක්ඛානං මයා ලද්ධං - සුන්දරිකාය කාරණා

එම කර්මයෙහි අවශේෂ විපාක වශයෙන් මේ අන්තිම භවයෙහි සුන්දරිකාව කරණකොට මා විසින් අසත්‍ය දෝෂාරෝපණ ලබන ලදී.

සබ්බාභිභුස්ස බුද්ධස්ස - නන්දෝ නාමාසි සාවකෝ
නං අබ්භක්ඛාය නිරයෙ - චිරං සංසරිතං මයා

සබ්බාභිභූ බුදුරදුන්ගේ නන්ද නම් ශ්‍රාවකයෙක් වීමි. එතුමන්ට අසත්‍ය දෝෂාරෝපණ කොට, මවිසින් බොහෝ කලක් නිරයෙහි සැරිසරන ලද්දේ වෙමි

දස වස්ස සහස්සානි - නිරයෙ සංසරිං චිරං
මනුස්සදෙහං පත්වාහං - අබ්භක්ඛානං බහුං ලභිං

අවුරුදු දස දහසක් පමණ දීර්ඝ කාලයක් නිරයෙහි සැරිසැරීමි. මා මනුෂ්‍යත්වයට පත්ව එහි විපාක වශයෙන් අසත්‍ය චෝදනා බොහෝකොට ලදිමි.

තෙන කම්මාවසෙසෙන - චිඤ්චමානවිකා මමං
අබ්භක්ඛාසි අහූතෙන - ජනකායස්ස අග්ගතෝ

එම කර්ම ශේෂයෙන් චිංච මානවිකා තොමෝ ජන සමූහයා ඉදිරියෙහිදී මට අසත්‍ය දෝෂාරෝපණයක් කළේය.

බ්‍රාහ්මණෝ සුතවා ආසිං - අහං සක්කත පූජිතෝ
මහාවනෙ පඤ්චසතෙ - මන්තෙ වාචෙසිං මාණවේ

මම බොහෝ දෙන විසින් සත්කාර කරණ ලද්දා වූ, පුදන ලද්දා වූ ශ්‍රැතවත් බමුණෙක් වීමි. මහ වනයෙහි පන්සියයක් මානවකයනට මන්ත්‍ර උගන්වමි.

තථාගතෝ ඉසි හිමෝ - පඤ්චා භිඤ්ඤා මහිද්ධිකෝ
තඤ්චාහං ආගතං දිස්වා - අබ්භා චික්ඛිං අදූසකං

මහත් ඍද්ධි ඇති, පඤ්ඤාභිඥාලාභී වූ භීම ඍෂිතෙම එහි පැමිණියේය. මා එසේ පැමිණි ඔහු දැක, අනෙකා දූෂණය නොකරන ඔහුට අසත්‍ය දෝෂාරෝපණය කළෙමි.

තතොහං අවචං සිසෙ - කාමභොගී අයං ඉසී
මයාහමපි භාසමානස්ස - අනුමොදිංසු මාණවා

ඉක්බිති මම ශිෂ්‍යයන් හට මේ ඍෂිතෙම කාම භෝගියෙකැයි කිවෙමි. මානවකයෝ මාගේ කියමනට එකඟ වූහ.

තතො මානවකා සබ්බෙ - හිකඛමානො කුලෙ කුලෙ
මහා ජනස්ස ආහංසු - කාමභොගී අයං ඉසී

ඉක්බිති සියලු මානවකයෝ, කුලගෙයක් ගෙයක් පාසා පිඬු සිඟා වඩින එතුමන්ට, මේ ඍෂිතෙම කාම භෝගියෙකැයි මහජනයාට කීහ.

තෙන කම්ම විපාකෙන - පඤ්ච භික්ඛු සතා ඉමෙ
අඛහකඛානං ලභුං සබ්බෙ - සුන්දරිකාය කාරණා

එම කර්ම විපාකයෙන් මෙ හැම පන්සියයක් භික්ෂූහු සුන්දරිකා පරිබ්‍රාජිකාව හේතුකොට අසත්‍ය දෝෂාරෝපන ලැබූහ.

වෙමාතුභාතිකං පුබ්බෙ - ධනහෙතු හනිං අහං
පකඛිපිං ගිරි දුගගසම්ං - සිලායච අඵසසසිං

පෙර මම එක පියෙකුට දාව දෙමවු කුසින් උපන් (වෙමාතික) සොයුරු ධන හේතුයෙන් නැසීමි. ගිරි දුර්ගයක හෙළීමි. ගලකින්ද තැළීමි.

තෙන කම්ම විපාකෙන - දෙවදතෙතා සිලං බිපි
අංගුට්ඨං එසසයී පාදෙ - මම පාසන සකඛරා

එම කර්ම විපාකයෙන් දෙවිදතු ගලක් හෙළීය. ගල් පතුරක් මාගේ පා ඇඟිල්ල තැළීය.

පුරෙහං දාරකොහුත්වා කීළමානො මහා පථේ
පච්චෙක බුද්ධං දිසවාන - මග්ගෙ සංකලිකං දහිං

පෙර මම දරුවෙක්ව මහ මග ක්‍රීඩා කරමින් සිටියේ, පසේබුදුවරයෙක් දැක ගල් කැබැල්ලක් විසි කළෙමි.

තෙන කම්මවිපාකෙන - ඉධ පච්ඡිමකෙ භවෙ
අදුටඨං මං දෙවදතෙතා - අහිචොරෙ පයොජයී

එම කර්ම විපාකයෙන් මේ අන්තිම භවයෙහි දෙවිදත් තෙමේ මට ද්වේෂ කරන ලදී. දුනුවායන් යෙදවීය.

හත්ථාරොහො පුරෙ ආසිං - පච්චෙක මුනි මුත්තමං
පිණ්ඩාය විචරන්තං තං - ආසාදෙසිං ගජෙනහං

මම පෙර හස්ත්‍යාරෝහකයෙක් වීමි. පිඬු පිණිස හැසිරෙන උතුම් පසේබුදුරද නමක් දැක ඇතා ලවා උන්වහන්සේට හිරිහැර කරවීමි.

තෙන කම්ම විපාකෙන - හනෙන්තා නාලාගිරි ගජො
ගිරිබ්බජෙ පුරවරෙ - දාරුණො සමුපාගමී

එම කර්ම විපාකයෙන් ගිරිබ්බජ නම් පුරවරයෙහිදී මත් වූ දරුණු නාලාගිරි ඇතු මා වෙත එළැඹියේය.

රාජාහං බත්තියො ආසිං - සත්තියා පුරිසං හනිං
තෙන කම්ම විපාකෙන - නිරයෙ පච්චහං භුසං

මම පෙර ක්ෂත්‍රිය රජෙක් වීමි. උල් ආයුධයකින් මිනිසෙක් මැරීමි. එම කර්ම විපාකයෙන්, බොහෝ කලක් නිරයෙහි පැසුනෙමි.

කම්මුනො තස්ස සෙසෙන - සොදානි සකලං මම
පාදෙ ඡවිං විනාසෙසි - නහි කම්මං විනස්සති

එම කර්මයෙහි ශේෂ විපාකයෙන්, මෙකල මාගේ පාදයෙහි සිවිය සියල්ල විනාශ විය. කර්මය විනාශ නොවන්නේය.

අහං කෙවට්ට ගාමසම්මිං - අහු කෙවට්ට දාරකො
මච්ඡකෙ ඝාතිනෙ දිසවා - ජනයිං සොමනසඝං

මම කෙවුල් ගමක කෙවුල් දරුවෙක් වීමි. මම ඝාතනය කරන ලද මසුන් දැක සොම්නස ඉපදවීමි.

තෙන කම්මවිපාකෙන - සීස දුකඛං අහූ මම
සකඛාච සබෙබ ඤාතිඝිංසු - යදාහනි විඛූඩහො

එම කර්ම විපාකයෙන් මගේ හිසෙහි දුක් වේදනාවක් විය. යම්කලෙක විඛූඩභ ජන සංහාරයක් කලේද, සියලුම ශාක්‍යයෝ එකල්හි නැසූහ.

ථුසසසඝාහං පාවචනෙ - සාවකෙ පරිභාසයිං
යවං ඛාදථ භුඤජථ - මාච භුඤජථ සාලියො

ථුස්ස බුදුරදුන්ගේ සස්නෙහි ශ්‍රාවකයින්ට යව. කවු, අනුභව කරව්, ඇල්හාල් බත් අනුභව නොකරව් යයි නින්දා කළෙමි.

තෙන කම්ම විපාකෙන - තෙමාසං ඛාදිතං යවං
නිමනතිතො බ්‍රාහමණෙන - වෙරඤජාය වසිං තදා

බමුණෙකු විසින් කරණ ලද, ආරාධනය අනුව වෙරඤජාවෙහි විසීමි. එම කර්ම විපාකයෙන් තෙමසක් යව අනුභව කළෙමි.

නිඛබුදෙ වතත මානමහි - මලලයුදධං නියොජයිං
තෙන කම්ම විපාකෙන - පිටඨි දුකඛං අහූ මම

යුද්ධයක් නොපවත්නා කල්හි, මල්ල යුද්ධය යෙදවීමි. එම කර්ම විපාකයෙන් මාගේ පිටෙහි දුක් වේදනාවක් විය.

තිකිචඡකො අහං ආසිං - සෙටඨි පුතතං විරෙචයිං
තෙන කම්ම විපාකෙන - හොති පකඛන්දිකා මම

මම පෙර වෙදෙක් වීමි. (ධනාශාවෙන්) සිටු පුතෙක් විරේක කරවීමි. එම කර්මයෙන් මට ලේ අතීසාර රෝගය වැළඳුනි.

අවචාහං ජෝතිපාලෝ - කසසපං සුගතං තදා
කුතොනු බොධි මුණ්ඩසස - බොධි පරම දුලලභා

ජෝතිපාල නම් මානවකයකු වූ මම, එකල්හි කාශ්‍යප බුදුරජාණන් වහන්සේට, මුණ්ඩයාට සමෙබාධි ඥානයක් කොයින්ද? සමෙබාධි ඥානය ඉතා දුර්ලභයැයි කීමි.

තෙන කමම විපාකෙන - අකරිං දුකකරං බහුං
ඡබබසසානුරුවෙලායං - තතො බොධිං අපාප්‍රණිං

එම කර්ම විපාකයෙන්, උරුවෙලායෙහි සාවුරුද්දක්, බොහෝ දුෂ්කර ක්‍රියා කළෙමි. ඉන්පසු සම්බෝධියට පැමිණියෙමි.

නාහං එතෙන මගෙඝන - පාපුණිං බොධි මුත්තමං
කුමමගෙඝන ගවෙසිසසං - පුබබ කමෙමන වාරිතො

පෙර කර්මයෙන් වලක්වන ලදුයේ, නොමගින් උතුම් බෝධිය සොයන්නෙමි, මම ඒ මාර්ගයෙන් උතුම් බුද්ධත්වයට නොපැමිණියෙමි.

පුඤඤපාප පරිකඛීණෝ - සබබ සනතාප වජජිතෝ
අසොකෝ අනුපායාසෝ - නිබබායිසස මනාසවෝ

පින් පව් ක්‍ෂය කරන ලදුයේ, සියලු තැවීම් බැහැර කරන ලදුයේ ශෝක රහිත වූයේ, උපායාස රහිත වූයේ ආශ්‍රව රහිත වූයේ පිරිනිවෙන්නෙමි.

එවං ජිනෝ වියාකාසි භිකඛු සංඝසස අගගතෝ
සබබාභිඤඤා බලපපතතෝ - අනොතතෙත මහාසරෙ

සියලු අභිඥා බලයට පත් ස්ර්වඥයන් වහන්සේ අනවතප්ත මහවිල් තෙරෙහිදී, භික්‍ෂු සංඝයා හමුයෙහි මෙය ප්‍රකාශ කළ සේක.

අටවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

4-9

නවවැන්නෙහි **උපසෙනසස** යන මෙහි උපසෙන යනු එම තෙරුන්ගේ නාමයයි. වංගන්ත බමුණුගේ පුත් බැවින් වංගන්ත පුතුයැයි ද වහරති. ආයුෂ්මත් සැරියුත් තෙරුන්ගේ බාල සොයුරු වූ මේ තෙර වනාහි, සස්නෙහි පැවිදිව ශික්ෂාපද නොපැණුවූ කලැ උපසපන් දෙවස්වැ, උපාධ්‍යාය වී එක් භික්ෂුවක් උපසම්පදාකොට, ඔහු සමග භාග්‍යවතුන් වහන්සේට උපස්ථානයට ගියේය. භාග්‍යවතුන් වහන්සේ විසින් එම භික්ෂුවගේ එක්ව වසන බැව් විචාරා බන්ධකයෙහි ආක්‍රමයෙන්, හිස් පුරුෂය, නුඹ යම් ආකාර වූ සමූහයා සමග බැඳීම් සංඛ්‍යාත බහුලතාවයට ඉතා ඉක්මනින් පෙරළිනි යයි මනාව ගර්හා කරන ලදුයේ කසයෙන් පහර ලද ආජානේය අශ්වයෙකු මෙන් සංවේගයට පත් මනසින් යුතුව යම් ආකාර වූ මම දැන් පිරිස නිසා භාග්‍යවතුන් වහන්සේ විසින් ගර්හා කරන ලද්දේ වෙමි. පිරිස නිසාම ප්‍රසංසාහර්ය වන්නෙමි යයි උත්සාහවත් වූයේ සියලු ධුත ධර්මයන් සමාදන්ව පවත්නේ විදර්ශනා අරඹා නොබෝ කලෙකින්ම ෂඩභිඥා සිව්පිළිසිඹියා ප්‍රාප්ත මහා ක්ෂීණාශ්‍රවයෙක්ව, තම ඇසිරි කරනවුන් ධුතාංගධරයින්ම කොට, ඔවුන් සමග භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ, සප්ත ශික්ෂාපදයෙහි සඳහන් ක්‍රමයෙන් 'උපසේන නුඹගේ මේ පිරිස ප්‍රසාදජනකයයි, පිරිස් වශයෙන්, භාග්‍යවතුන් වහන්සේගේ හමුයෙන් ලද ප්‍රශංසා ඇතියේ, 'මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර, යම් මේ වගගනත පුත්‍ර උපසේන කෙනෙක් වේද? හැම ආකාර සතුට ගෙන දෙන්නවුන් අතර ඔහුම අග්‍රය. එතදග්‍රස්ථානයෙහි තබන ලද අසූමහ ශ්‍රාවකයන් අතර ඇතුලත් වූයේ වේ. හෙතෙම එක් දිනක් පසුබත පිණ්ඩපාතයෙන් ඉවත්වූයේ (වැළැකුගේ) අතවැස්සන් තම තමන්ගේ දිවා ස්ථානයන්ට ගිය කල්හි දිය කලයෙන් දිය ගෙන පා සෝදා ශරීරාංග සිසිල්කොට සම්කඩ අතුරා දිවා ස්ථානයෙහි දිවා විහරණ සඳහා හුන්නේ තම ගුණයන් සිහි කළේය. ඔහුට ඒවා නොයෙක් සියදහස් ගණන් ඊයක් පසු ඊයක් මෙන් වැටහුනි. හෙතෙම, ඒ බුදුරදුන්ගේ ශ්‍රාවකයෙක් මෙබඳු ගුණ ඇතිවූයෙහි නම් එම ශාස්තෘන් වහන්සේගේ ගුණ කෙබඳු විය හැකිදැයි භාග්‍යවතුන් වහන්සේගේ ගුණ අභිමුවව මෙනෙහි කිරීම යැවීය. එහෙයින් ඔහුට එම ඤාණබල අනුරූපව නොයෙක් කෝටි ගණන් වැටහිනි. හෙතෙම මාගේ ශාස්තෘන් වහන්සේ මෙබඳු සීලයකින් යුක්තය. මෙබඳු යහපත් පැවැත්මෙන් යුක්තය. මෙබඳු ප්‍රඥායෙන් යුක්තය. මෙබඳු

මිදීම්වලින් යුක්තය. ආදියෙන්ද, මේ ආකාරයෙන්ද ඒ භාග්‍යවතුන් වහන්සේ **අර්හත්ය. සම්‍යක්** සම්බුද්ධයහ යන ආදියෙන් ද ශාස්තෘන් වහන්සේගේ **ගුණ ප්‍රකට කිරීම්** ආකාරයෙන් සිහිකොට ඉක්බිති 'මනාව කියන ලද්දේය යන ආදියෙන් ධර්මයෙහිද, 'මනාව පිළිපන්නේය යන ආදියෙන් ආර්ය සංඝයාගේ ද ගුණ සිහි කළේය. මෙසේ මහතෙරහු තෙරුවන් ගුණයන්හි නොයෙක් ආකාර වෙනස්කම් ප්‍රකට වූ කල්හි තමා ප්‍රමුදිත වූයේ මහත් ප්‍රීති සොම්නසක් මනා සේ විඳිමින් හුන්නේය. එකරුණ දැක්වීමට **ආයසමතො උපසෙනසස වගගනත පුනතසස රහො ගතසස** ආදිය යූ.සේයි.

එහි **රහොගතසස** යනු රහසිගත වූවහුට පටිසලලීනසස යනු හුදෙකලා වූවහුට, **එවං චෙතසො පරිවිතකෙකා උදපාදි** යනු මෙසේ දැන් කියනු ලබන ආකාර ඇති සිතට විතර්කයක් උපනි. **ලාභාවත** මේ යනු යම් ආකාර වූ මෙම මනුෂ්‍යත්වය, බුද්ධෝත්පාදය, ශ්‍රද්ධාව බෝධාදීහු විශ්මයෙකි. ඒකාන්තයෙන් මවිසින් ඒවා ලබන ලද්දෙමි. **සුලදධං වත** මෙ යනු **මවිසින්** භාග්‍යවතුන් වහන්සේගේ සස්නෙහි පැවිදි උපසම්පදා, තෙරුවන් ඇසුරු කිරීම් ආදියෙන් යම්කිසිවක් ලබන ලදද? විශ්මයෙකි. එය මා විසින් ඒකාන්තයෙන් මනාසේ ලබන ලදී. එහිලා **සතථාව** මෙ ආදියෙන් කරුණ **කීවේය.** එහි මෙලෝ පරලෝ පරමාර්ථයන්ගෙන් සුදුසු පරිදි සත්ත්වයින්ට අනුශාසනා කෙරේනුයි **සතථායි,** පෙර පින් ඇති බව ආදී කාරණයන්ගෙන් **භගවායි.** කෙලෙසුන් කෙරෙන් දුර හෙයින්ද, සංසාර **චක්‍රයෙහි දැතිරෝද නැසූ** හෙයින්ද, කෙලෙස් සතුරන්ගේ නැසීම කළ හෙයින්ද, **ප්‍රත්‍යය** ආදීන්ට සුදුසු හෙයින්ද, පව් **කිරීමෙහි** රහස් නොමැති හෙයින්ද **අරහංයි,** මනාව තෙමේම සියලු ධර්මයන් අවබෝධ කළ හෙයින් **සමමා සමබුදධොයි** මේ මෙහි සංක්ෂේපයයි. විස්තරය වනාහි විසුද්ධි මාර්ගයෙහි බුද්ධානුස්මෘති නිර්දේශයෙන් ගතයුතුය. **සවාකඛාතෙ** යනු මනාසේ (කියන ලද) දෙසන ලද, ඒකාන්තයෙන් **සසරින් නිදහස** දෙන ලෙස දේශිත, **ධම්ම විනයෙ** යනු බුදු වදන්හි, එය වනාහි අවවාදය පරිදි පිළිපදිනවුනට සසර දුක්හි වැටීමෙන් වළක්වා දැරීමෙන්ද, රාගාදී කෙලෙස් **නික්මවන හෙයින්ද** ධර්මවිනය යයි කියයි. **සබ්‍රහමචාරයො** යනු ශ්‍රේෂ්ඨාර්ථයෙන් බ්‍රහ්ම සංඛ්‍යාත භාග්‍යවතුන් වහන්සේගේ සාසන ආර්යමාර්ග **සත්‍යයෙහි** සමව හැසිරෙත්. පිළිපදින්නුයි **සබ්‍රහමචාරයොයි. සීලවනතො** යනු මාර්ග සීල ඵල සීල වශයෙන් සිල්වත්හ.

කල්‍යාණ ධම්මා යනු සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්ති ඥාන දර්ශනාදී යහපත්, සුන්දර ධර්ම ඔවුන්ට ඇත්තේනුයි කල්‍යාණ ධම්මායි එයින් සංඝයාගේ මනා ප්‍රතිපත්තිය පෙන්වයි. **සීලෙසු චමහි පරිපූරකාරී** යනු මම ද පැවිදිව තිරිසන් කථා කියන, කාය දෘඪතා බහුලව නොවිසීමි. තවද ප්‍රාතිමෝක්ෂ සංවර ආදී සිව්වැදෑරුම් වූද සීලය, කඩනුවූ, සිදුරු නුවූ, පුල්ලි නැති, කබර රහිත, දාසත්වයෙන් තොර, නුවණැත්තන් විසින් ප්‍රශංසා කරන ලද කෙලෙස් ස්පර්ශ රහිත කොට සම්පූර්ණ කරනුයේ ආර්ය මාර්ගයටම පිවිසිනැයි කියයි. ඉන් තමාගේ යට ඵලද්වයයෙහි සම්පත්තිය දක්වයි. සෝවාන් සකෘදාගාමීහු වනාහි සීලයන්හි පරිපූරකාරීහුය. **සාහිතො චමහි එකඟ චිත්තො** යනු උපචාර අර්පණා භේදයෙන් සමාධියෙහි සර්වාකාරයෙන් අවික්ෂිප්ත සිතැත්තේ සමාහිත වූයේ වෙමි. මෙම සමාධියෙහි සම්පූර්ණ කිරීම් වචනයෙන් තමාගේ තෘතිය ඵල සම්පත්තිය පෙන්වයි. අනාගාමීහු වනාහි සමාධියෙහි පරිපූරකාරීහුය. **අරහාචමහි බිණාසවො** යනු කාමාශ්‍රවාදීන්ගේ සර්වප්‍රකාරයෙන් ක්ෂීණ හෙයින් ක්ෂීණාශ්‍රව නම් වේ. එයින්ම භව සංයෝජන ක්ෂය කරන ලද හෙයින් දෙවියන් සහිත ලෝකයෙහි අග්‍ර දක්ෂිණෙය්‍යතාවයෙන් අර්හත් නම් වෙමි. එයින් තමාගේ කළයුත්ත කළ බව දක්වයි. මහිද්ධිකො චමහි මහානුභාවො යනු අධිෂ්ඨාන විකුර්වණ ආදී ඍද්ධීන්හි මහත් වසී භාවයෙන් යුක්ත වූ හෙයින් මහත් ඍද්ධි ඇත්තේ උදාර වූ පුණ්‍යානුභාවයෙහිද ගුණානුභාව **සම්පත්තියෙන්ද** මහානුභාව වෙමි. එයින් හෙතෙම තමාගේ ලෞකික අභිඥා නව අනුපූර්ව විහාර සමවත් යෝගය දක්වයි. ආර්යයෝ අභිඥාවන්හි වසීභාවයෙන් කැමැති දැයක් නිෂ්පාදනයෙන් මහා ඍද්ධි ඇත්තෝ වෙති. පූර්ව උපනිශ්‍රය සම්පත්තියෙන් ද නොයෙක් විහාර සමාපත්තීන්ගෙන්ද පිරිසිදු කරන ලද සන්තාන හෙයින් මහානුභාව වෙති. **භඳ්දකං මෙ ජීවිතං** යනු මෙසේ විවිධාකාර සීලාදී ගුණ යුක්ත වූ මාගේ යම් ආකාර වූ මෙම කය දරයිද? ඒතාක් සත්ත්වයින් හිතසුවයම වඩයි. පුණ්‍යක්ෂේත්‍ර භාවයෙන් මාගේ ජීවිතයද යහපත්ය. **සුන්දරය. භඳ්දකං මරණං** යනු ඉදින් වනාහි මෙම ආධ්‍යාත්මික ස්කන්ධ පංචකය මෙම ක්ෂණයෙහිම දර නැති ගින්නක් මෙන් නිවී යයිද? එම ප්‍රතිසන්ධි රහිත පරිනිර්වාණ සංඛ්‍යාත මරණයද මට සොඳුරු යැයි දෙතන්හිම අකම්පය භාවය දක්වයි. මෙසේ මහ තෙරහු ප්‍රහීණ නුවූ සොම්නස් අධික ප්‍රීති ස්වභාවය උත්සන්න හෙයින් එම උදාර සොම්නස් ධර්ම බුහුමනින් ධර්ම ප්‍රීති මනාව විඳීමෙන් මනාව කල්පනා කළේය. එය ශාස්තෘන් ගදකිළියෙහි වැඩහුන්නේම සර්වඥතා

ඥානයෙන් දැන ජීවිතයෙහිද මරණයෙහිද ඔහුගේ නොසැලෙන පැහැදිලි කිරීමට මෙම උදන් ඇතු සේක. එහෙයින් **අථඛො භගවා ඉමං උදානං උදානෙසි** යි යූ.සේයි. එහි **යංජීවිතං නතපති** යනු ක්ෂීණාශ්‍රව පුද්ගලයා ජීවිතයෙහි මතු ස්කන්ධ පැවැත්මෙහි මුලුමනින්ම නොමැති හෙයින් **න තපති** නොපෙළයි. වත්මන් ජීවිතයද සියලු ආකාරයෙන් ප්‍රත්‍යයෙන් හටගත් ස්වභාව හෙයින් සිහිය හා ප්‍රඥාවගේ මහත්භාවයට පැමිණීමෙහිදී හැමතැන සිහිය හා විමසන නුවණ එක්වීමෙන් නොපෙළයි. යම් ආකාර වූ අන්ධ පෘථග්ජන තෙමේ පාපී ජන සේවනයෙන් නුනුවණින් මෙනෙහි කිරීම් බහුල වූයේ, කළ අකුසල් හා නොකල කුසල් ඇතියේ හෙතෙම මවිසින්, යහපතක් නොකරන ලදැයි ආදී ක්‍රමයෙන් විපිලිසරයෙන් තැවේනුයි ඔහුගේ එම ජීවිතය තැවෙයි නමැ. අනෙක් අය වනාහි නොකරන ලද පව් ඇත්තේ, කරන ලද පිනැත්තේ සප්ත ශෛක්ෂ්‍යයන් හෝ කලණ පුහුදුනා සමග එකතුව කළ පිනැතියේ, තැවෙන ධර්ම දුරුලීමෙන්, නොතැවෙන ධර්මයන්ගේ යුක්ත වූයේ පශ්චාත්තාපයෙන් නොතැවෙත්තුයි ඔවුන්ගේ ජීවිත නොතැවෙති. ක්ෂීණාශ්‍රවයන් පිළිබඳව කිවයුත්තක්ම නැතැයි ප්‍රවෘත්ති දුක්ඛයාගේ වශයෙන් අර්ථ වර්ණනාව කරන ලදී. **මරණෙන තසොචති** යනු සෝක නොකරයි. අනාගාමී මාර්ගයෙන්ම සෝකය මුලිනුපුටාලන ලද හෙයින් මරණ සංඛ්‍යාත අන්තයෙහි, කෙළවර මරණ සමීපයෙහි හෝ **සචෙ දිට්ඨ පදො ධීරො සොකමජඣගා සොචති** හෙතෙම දුක්ඛාදී සිව් ධර්ම පදයන්ගේද නිර්වාණයාගේද දිටි හෙයින් දිට්ඨපදොයි. ධෛර්යයෙන් යුක්ත හෙයින් **ක්ෂීණාශ්‍රවයන් වහන්සේ ධීරොයි.** සෝක කරන ස්වභාව හෙයින් සෝකයැයි ලද නම් **ඇති**, පහ වූ රාග ඇති සත්ත්වයින්ට, සෝකයට හේතුවන ලෝක ධර්මයන්ගේ මධ්‍යයෙහි සිට ද සෝක නොකරයි. දැන් ඔහුගේ සර්වාකාරයෙන් සෝක හේතූන්ගේ අභාවය දක්වන්ට **උභින්නං භව තණ්හානං** යන ආදිය වදාළහ. එහි යමෙකු ගේ භව තෘෂ්ණාව සර්වප්‍රකාරයෙන් අග මගින් සිඳින ලදද? සෙසු කෙලෙසුන්ගේද ශේෂ රහිතව ව්‍යුපසමනයෙන් සන්සුන් සිතැති එම භික්ෂුවගේ, **විකඛිණො ජාති සංසාරො** යන ජාතිය මුල්කොටැති

බන්ධානං පටිපාටි - ධාතු ආයතනානිච
අබ්බොච්ඡිනනං වත්තමානං - සංසාරොති පවුච්චති

ස්කන්ධ, ධාතු, ආයතනයන්ගේ පිළිවෙළින් නොසිඳී පැවැත්ම සංසාරයැයි කියනු ලැබේ.

කියන ලද ආකාර ඇති සංසාරය විශේෂයෙන් ක්‍ෂය කරන ලදී. එහෙයින් **නත්ථි තසස පුනබ්භවොයි.** එබඳු ස්වභාව ඇති එම ආර්ය පුද්ගලයාට මතු පුනර්භවයක් නැත. එහෙයින් ඔහුට උත්පත්ති සංසාරය ක්ෂීණය. කවර හෙයින් වනාහි පුනර්භවය නැත්ද? සිඳින ලද භව තෘෂ්ණා සන්හුන් සිත් ඇත්තේ වේද? එහෙයින් යැයි ආපසු හැරී කිවයුතුය. නොහොත් සසර ඉපැත්ම ක්‍ෂය වූයේය. එහෙයින්ම ඔහුට පුනර්භවයක් නැතැයි අර්ථය යෙදිය යුතුය.

නවවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

4-10

දසවැන්නෙහි **අතතනො උපසමං** යන ශ්‍රාවක පාරමී මස්තකප්‍රාප්තියට හේතු වූ අග්‍ර මාර්ගයෙන් තමාගේ ශේෂ රහිත කෙලෙස් සංසිඳවීමයි. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ නොසන්සිඳවන ලද කෙලෙසුන් ඇති සත්ත්වයින්ගේ රාගාදී කෙලෙසුන්ගෙන් හටගත් තැවීම්, දාහ, දැවීම් ආදී දුකට හේතු වූ ක්ලේෂාභිසංස්කාර නිමිත්තද, ජාති, ජරා, ව්‍යාධි, මරණ, සෝක, පරිදේව ආදී දුක්ද, ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දැක අතීත අනාගතයෙන්හිද ඒවායි සංසාර වෘත්ත මූලික දුක මනාව තුලනය කොට, කරුණා කරනුයේ තමාද පෘථග්ජන කාලයෙහි, අනුභව කරන ලද කෙලෙස් නිමිත්ත හෝ අනල්ප වූ දුකද සිහිකොට, මෙවන් මහ දුකකට හේතු වූ කෙලෙස් දැන් මට මනාව ප්‍රහීණ වූයේ යයි තම කෙලෙස් සන්සිඳුම නිතර ප්‍රත්‍යවේක්‍ෂා කරයි. ප්‍රත්‍යවේක්‍ෂා කරනුයේද, මෙම මෙතෙක් කෙලෙස් සෝවාන් මාර්ගයෙන් සන්සිඳවන ලදී. මෙතෙක් සකෘදාගාමී මාර්ගයෙන්, මෙතෙක් අනාගාමී මාර්ගයෙන්, මෙතෙක් අර්හත් මාර්ගයෙන් සන්සිඳවන ලදැයි ඒ ඒ මාර්ග ඤාණයන්ගෙන් - සීමා වශයෙන් කෙලෙසුන්ගේ සන්සිඳවන ලද බැව් ප්‍රත්‍යවේක්‍ෂා කරයි. එහෙයින් **අතතනො උපසමං පචචවෙකඛමානොයි** යූ.සේයි. වෙනත් තෙර කෙනෙක්

අර්හත් ඵල සමවතට සමවැද, එය ප්‍රත්‍යවේක්ෂා කොට ඒකාන්තයෙන් මෙහි මේ ශාන්ත ප්‍රණීත භාවය අත්‍යන්තයෙන් ශාන්ත හෙයින්, අසංඛත ධාතුයෙන් ආරම්මණ වශයෙන් තෙමේ ද මනාව කෙලෙස් සන්සිඳවූයේ යැයි මෙසේ නිතර සන්සිඳීම ප්‍රත්‍යවේක්ෂා කෙරේයයි කියයි. අන්‍යයන් වනාහි ශේෂ රහිත කෙලෙසුන්ගේ සන්සිඳීමෙන් කෙළවර හටගත් අග්‍රඵලයම සන්සිඳීම නම් වේ. එය ප්‍රත්‍යවේක්ෂා කරමින් හුන්නේ යයි කියයි. **එමෙතඤ්** විදිත්වා යනු යම් මේ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ගේ දිලිසෙන ප්‍රඥතාදීන්ට හේතු වූ ශ්‍රාවකයින් අතර, අනෙකෙකුට සාධාරණ නොවූ, කෙලෙස් ප්‍රහාණය හෝ අග්‍රඵලය හෝ සන්සිඳීම පිළිවෙළින් යූ.සේයි. එහි ප්‍රත්‍යවේක්ෂා සංඛ්‍යාත අර්ථය සර්වාකාරයෙන් දැන එහි අනුසස් දැක්වීමට මෙ උදන් ඇතූ සේක.

එහි **උපසන්ත සන්ත චිත්තසස** යනු උපශාන්ත වූම සන්සුන් සිත ඔහුටනුයි උපසන්ත සන්ත චිත්තෝයි. සමවත් විෂ්කම්භනයෙන් සන්සුන් කෙලෙස් හෙයින් උපසන්ත චිත්තංයි. සර්වප්‍රකාරයෙන් සන්සුන් ශාන්ත භාවයැයි නොකියයි. එම සන්සුන් භාවයෙහි සීමාව ඉක්ම නොගිය බැවිනි. අග මගින් එසේ නොවේ. ඔහු විසින් අත්‍යන්තයෙන්ම කෙලෙසුන්ගේ නැසූ හෙයින් රහත්හුගේ සිත නැවත කෙලෙසුන්ගේ සන්සිඳවිය යුතු නොමැති හෙයින්, සමථ විදර්ශනා යට මාර්ගයන්ගෙන් සන්සුන් කෙලෙස්ව අත්‍යන්ත ශාන්ත භාවයෙන්ම සන්සුන් ශාන්ත යැයි කියයි. එහෙයින් සන්සුන් වූයේම වී සන්සුන් සිත ඔහුටනුයි උපසන්ත සන්ත චිත්තෝයි. ව්‍යුපසමනය උපශාන්ත යැයි කියයි. අත්‍යන්ත ව්‍යුපසමනයෙන් ශාන්ත සිතට යැයි අර්ථයි. තවද සියලු ක්ෂීණාශ්‍රවයන්ට ශේෂ රහිත කෙලෙස් සන්සිඳීම් ඇති කල්හිද, ශ්‍රාවක පාරමී ඥානයාගේ මස්තකප්‍රාප්තියට හේතු වූ, ශ්‍රාවකයින් තර අන්‍යයන් හා සාධාරණ නුවූ දම් සෙනෙවිහුගේ කෙලෙස් සංසිඳවීමෙහිලා විශේෂ සහිතතාවයන් දැක්වීමට උපසන්ත සන්ත චිත්තයැයි ශාස්තෘන් වහන්සේ උපශාන්ත ශබ්දයෙන් වෙසෙසා වදාළ සේක. එහි මේ අර්ථයි. බොහෝ සේ බලවත් සන්සුන් බව උපශාන්තයි. එම උපසමයෙන්, සංයමයෙන් සන්සුන් හෝ වූ සන්සුන් බව සන්සුන් ශාන්තයි. එබඳු සිතක් ඔහුට නුයි සියල්ල පළමු පරිදියි. එසේම එය භාග්‍යවතුන් වහන්සේ විසින්, මහණෙනි සැරියුත් තෙමේ මහා ප්‍රාඥය. බැබලෙන ප්‍රාඥය. පැතිර සිටි ප්‍රාඥය. ධාවන ප්‍රාඥය. තීක්ෂණ ප්‍රාඥය. විනිවිද යන ප්‍රාඥයයි ආදී නොයෙක් ක්‍රමයෙන් වර්ණනා කරන ලදී. ස්තුති කරන ලදී. **නෙතතිච්ඡිතනසස** යනු භව තෘෂ්ණාව

නෙත්ති යැයි කියයි. සංසාරයාගේ ගෙනයන හෙයින් එම ගෙනයාම සිදින ලද්දේ ඔහුගේනුයි නෙතතඡිතෙනායි. එම තෘෂ්ණාව සිදින ලද්දහුගේ ප්‍රහීණ තෘෂ්ණා ඇතියහුගේ යයි අර්ථයි. **මුතෙතා මාර බන්ධනා** යනු හෙතෙම මේ ආකාර වූ, ක්ෂය කරන ලද බව බැඳුම් ඇතියේ සියලු මාර බන්ධනයන්ගෙන් මිදුනේ, ඔහුට මාර බන්ධනයන්ගෙන් මිදීම සඳහා කළයුතු දෙයක් නොමැත. එහෙයින් දම්සෙනෙවි තම සන්සිඳීම ප්‍රත්‍යවේක්ෂා කරයි. සෙස්ස කියන ලද ආකාරමය.

දසවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

සිව්වන වර්ග වර්ණනාව සමාප්තයි.

5-1

මහා වර්ගයෙහි පළමුවැන්නෙහි **මලලිකාය දෙවියා සද්ධිං** යනු තමාගේ අගමෙහෙසිය වූ මල්ලිකා සමග **උපරිපාසාද වරගතො** යනු විශාල ප්‍රාසාදයෙහි මතු මහලට ගියේ, **කොචඞ්ඛෙඣා අත්තනා පියතරො** යනු තාමට වඩා ප්‍රියකරන අන්කිසි කෙනෙක්, **අත්ථිනුඛො නෙ** යනු කිමෙක්ද, නුඹගේ එවැනි ප්‍රියකරන කෙනෙක් ඇත්දැයි දේවියගෙන් විචාරයි. කවර හෙයින් විචාරයිද? මැය වනාහි සැවැත්නුවර දුගී මල්කරුවෙකුගේ දියණියකි. එක්දිනක් වෙළඳසලින් කැවුමක් ගෙන මල් අරමට ගොස් කන්නෙමියි යන්නී විරුද්ධ මාර්ගයෙහි බික්සඟන පිරිවරන ලද භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස හැසිරීමට පිවිසෙන්නහු දැක පසන් සිතැත්තී එය භාග්‍යවතුන් වහන්සේට දුන්නාය. ශාස්තෘන් වහන්සේ එතැන වැඩසිටිනා ආකාරයක් දැක්වූ සේක. අනඳ තෙරහු සිවුරක් පණවා දිනි. භාග්‍යවතුන් වහන්සේ එහි හිඳ එම කැවුම අනුභව කොට මුව සෝදා සිනහ පහළ කළ සේක. තෙරහු ස්වාමීනි, මැයගේ දානයෙහි කවර විපාකයක් වන්නේදැයි විමසීය. ආනන්දය, අද ඇය තථාගතයන්

වහන්සේට ප්‍රථම භෝජනය දුන්නේය. අදම කොසොල් රජුගේ ප්‍රියමනාප අගමෙහෙසිය වන්නේ යයි වදාළ සේක. එදිනම රජු කාසි ග්‍රාමයෙහි බෑනා සමග යුදකොට පැරැදී පැන පැමිණියේ, නගරයට පිවිසෙනුයේ සෙබල සමූහයාගේ පැමිණීම බලාපොරොත්තු වන්නෙමියි එම මල් අරමට පිවිසියේය. ඕ පැමිණි රජු දැක ඔහුට වත්පිළිවෙත් කළාය. රජු ඇයගේ වත් කෙරෙහි පැහැදී පියා කැඳවා මහත් ඓශ්වර්යය දී ඇය අන්තඃපුරයෙන් ඉවත්කරවා අග මෙහෙසුන් තනතුරෙහි තැබීය. නැවත එක්දිනක් රජු මවිසින් මැයට මහත් ඓශ්වර්යය දෙන ලදී. නුඹට කවරෙක් ප්‍රියදැයි මැයගෙන් විචාරන්නෙම් නම් ඉතා යෙහෙකැයි සිතිය. ඕ මහරජ, ඔබ ප්‍රිය යැයි කියා නැවත මගෙන් විචාරන්නේය. ඉක්බිති මම ඇයට මටද ඔබම ප්‍රිය යැයි කියන්නෙමියි මෙසේ ඔහු ඔවුනොවුන් අතර විශ්වාසය ඇතිකරලීම සඳහා සතුටුවිය යුත්තක් කරනුයේ විචාළේය. දේවිය වනාහි නුවණැතිය. බුද්ධෝපස්ථායිකාවකි. සංඝෝපස්ථායිකාවකි. මෙම ප්‍රශ්නය රජුගේ මුහුණ බලා නොකිව යුත්තේ යයි සිතා තත්වාකාරයෙන්ම කියන්නී, **නහී බොා මෙ මහාරාජ කොා චඤ්ඤා අත්තනා පියතරොා**ති අන් කෙනෙකුට වඩා මම මට ම ප්‍රිය කරමි යි කීවාය. කියාද තමා විසින් ප්‍රකාශිත අර්ථය උපායෙන් රජුට ප්‍රත්‍යක්ෂ කරවනු කැමැත්තී, **තුයහං පන මහාරාජ අත්තඤ්ඤා කොචි අත්තනා පියතරොා** යි. යම්සේ රජු ඇයගෙන් විමසන ලද ද? එසේම රජු විචාලාය. රජුද ඇගේ ස්වභාව ලක්ෂණයෙන් කියන ලද හෙයින් නවතින්ට නොහැකි වනුයේ, තෙමේද ස්වභාව ලක්ෂණයෙන්ම කියනුයේ යම්සේ දේවිය ප්‍රකාශ කලේද? එසේම ප්‍රකාශ කළේය. ප්‍රකාශකොටද මෝඩ ස්වභාව හෙයින්, මම පෘථුවීශ්වර රජෙක්මි. මහත් පෘථුවි මණ්ඩලය දිනා වාසය කරමි. මට වඩා අන් පියකරු අනෙකෙක් නොදකිමියි කීම මට යෝග්‍යය. මැය වනාහි පහත් කුල වූවා වසලියෙකැ. මවිසින් උස්තැන තබන ලදී. ස්වාමී වූ මා එසේ ප්‍රිය නොකරයි. තමාම ප්‍රියයැයි මා හමුවෙහි කියයි. මැය ඒකාන්තයෙන් කර්කශක යැයි නොසතුටට පත්ව නුඹට තෙරුවන් නම් වඩා ප්‍රිය නොවේදැයි චෝදනා කළේය. දේවිය, දේවයන් වහන්ස, මම තමාගේ සගමොක් සුවයන්ට හිතවත් වන්නී මනාව ප්‍රිය කරමි. එහෙයින් තමාම මට වඩාත් ප්‍රිය යැයි කීවාය. මේ මුළු ලෝකයම තමාගේ අර්ථ සිද්ධියම සලකා අනෙකාට ප්‍රිය කරයි. පුතෙකු ප්‍රාර්ථනා කරනුයේද මොහු මා දිරූ කල්හි පෝෂණය කරන්නේ යැයි අපේක්ෂා කරයි. දියණිය මාගේ කුලය වඩන්නේ යැයිද, භාර්යාව මාගේ පාදයන් සේවනය කරන්නේයැයිද අනෙකුත් ඥාති, මිත්‍ර බන්ධූන් ඒ ඒ කෘත්‍යය වශයෙන්

මෙසේ ආත්මාර්ථයම බලන්නා වූ ලෝකයා අන්‍යයාට ප්‍රිය කරයි. මෙය දේවියගේ අදහසයි. ඉක්බිති රජු මෙසේ සිතීය. මේ මල්ලිකාව දක්ෂය. නුවණැතිය. නිපුණය. මට තමාම වඩා ප්‍රිය යැයි කියයි. මටද තමාම වඩා ප්‍රිය වී වැටහේ. එහෙයින් මම මෙකරුණ ශාස්තෘන් වහන්සේට සැළ කරන්නෙමි. යම්සේ ශාස්තෘන් වහන්සේ මට ප්‍රකාශ කරන්නේද, එසේ එය දරන්නෙමි. මෙසේද සිතා ශාස්තෘන් වහන්සේ සමීපයට එළඹ මෙ කරුණ සැළ කලේය. එහෙයින් **අථඛො රාජා පසෙනදි කොසලො** -පෙ- **පියතරොනි** යි යූ.සේයි. **එතමත්ථං විදිත්වා** යනු ලෝකයෙහි සියලු සත්ත්වයින්ට තමාම තමාට වඩා ප්‍රියයැයි රජු විසින් කියන ලද එම කරුණ සර්වප්‍රකාරයෙන් දැන එම කරුණ පැහැදිලි කිරීමට මෙසේ උදන් ඇතූ සේක.

එහි, **සබ්බාදිසා අනුපරිගම්ම චෙතසා** යනු සියලුම දස දිශාවන් ශේෂ රහිතව සෙවීම් වශයෙන් සිතින් අනුව ගොස්, **නෙවඤ්ඤා පියතර මත්තානා ක්වචි** යනු තමාට වඩා අතිශයින් ප්‍රිය අන් කිසි පුරුෂයෙක් සම්පූර්ණ උත්සාහයෙන් සොයනුයේ **ක්වචි** කිසිතැනෙක, සියලු දිශාවන්හි නො ලබන්නේ ය. **එවං පියො පුථු අත්තා පරෙසං** යනු මෙසේ කිසිවෙකුට තමාට වඩා ප්‍රිය වූවෙකු නොලැබීම් වශයෙන් පුථු වෙන් වෙන්ව ඒ ඒ සත්ත්වයින්ට තමා ප්‍රිය වේ. **තස්මා න හිංසෙ පරං අත්තකාමො** යනු මෙසේ සියලුම සත්ත්වයෝ තමාට ප්‍රිය කරයි. තම සුව කැමැති වූයේ, දුක් පිළිකුල් කරනුයේ එහෙයින් තමාට කැමැතියේ තම හිතසුව කැමැති වනුයේ, අන්‍ය සත්ත්වයා යටත් පිරිසෙයින් කුරුකුහුඹියෙක් **තරම්වත්** නොසලකයි. **න හිංස** - නොපෙලන්නේය. නොනසන්නේය. **අත්වලින්**, මැටිකැට ලීදඬු ආදීන්ගෙන් ද නොවෙහෙසන්නේ ය. යමෙකුට වනාහි තමා විසින් කළ දුක් පීඩාවෙහි, එය ඉන් සංක්‍රමණය වන්නාක් මෙන් කාලයක් ගතවීමෙහිදී තමා කෙරෙහි දිස්වන්නේය. මෙය වනාහි කර්මයන්ගේ ස්වභාවයයි.

ප්‍රථම සූත්‍ර වර්ණනාව නිමියේ ය.

5-2

දෙවැන්නෙහි **අචඡරියං හනෙත** යන මෙයද මේසිය සූත්‍රයෙහි මෙන් ගර්හා කිරීම් ආශ්චර්ය වශයෙන් යයි දතයුතුය. **යාව අපපායුකා** යනු **යම් පමණ** අල්පායුෂ්ක ඉතා ස්වල්ප ජීවිතයයි. අර්ථයි. **සත්තාහජාතො** යන උපන් සත් දවසෙහි සත්දින උපන් - එම සත්දිනෙහි උපන්, උපන් සත්වන දිනයෙහි යැයි අර්ථයි. **තුසිතං කායං උපපජ්ජි** යනු තුසිත දිව්‍ය නිකායෙහි ප්‍රතිසන්ධි ග්‍රහණ වශයෙන් පැමිණියේය. එක් දිනක් තෙරුන් වහන්සේ පසුබත දිවා ස්ථානයෙහි හුන්නේ, ලක්ෂණ අනුව්‍යඤ්ජනයන්ගෙන් ප්‍රතිමණ්ඩිත සෞභාග්‍යයට පත් දර්ශානුත්තරිය වූ, භාග්‍යවතුන් වහන්සේගේ රූපකාය ශ්‍රීය මෙනෙහිකොට විශ්මයෙකි. බුදුවරුන්ගේ රූප කාය සම්පත්තිය දැකුම්කළුයි. හාත්පස ප්‍රසාදාවහය. මනහරයැයි මහත් ප්‍රීති සොම්නසක් මනාව විඳිනුයේ, වැදූ මවට නම් විරූපී වූද පුත්‍රයා සුරූපී වූයේ ප්‍රියමනාප වේ. ඉදින් වනාහි බුදුරදුන්ගේ මව මහමායා දේවිය ජීවත් වන්නේ නම්, භාග්‍යවතුන් වහන්සේගේ රූප දර්ශනයෙහිලා කවරාකාර වූ ප්‍රීති සොම්නසක් උපදින්නේද? භාග්‍යවතුන් වහන්සේ උපන් සත්දිනකින් යම්බඳු වූ මහමායා දේවිය කළුරිය කළාය. ඇයට එය මහා හානියකැයි සිතීය. මෙසේ සිතා භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ, තමාගේ සිතිවිල්ල සැළ කරනුයේ ඇගේ කළුරිය කිරීමට ගරහනුයේ **අචඡරියං හනෙත** යනාදිය කීය. සමහරු වනාහි කීහ. මහා ප්‍රජාපති ගෝතමිය භාග්‍යවතුන් වහන්සේගෙන් මහත් උත්සාහයෙන් පැවිද්ද යාඥා කරන ලද්දේ වී නමුත් ප්‍රතික්ෂේප කරන ලදී. මවිසින් උපායෙන් යාඥා කරන ලදුයේ භාග්‍යවතුන් වහන්සේ අෂ්ටගරුධර්ම පිළිගැනීම් වශයෙන් ඇයට පැවිද්ද ද, උපසම්පදාවද අනුදැන වදාළ සේක. ඕ එම ධර්මයන් පිළිගෙන ලබන ලද ප්‍රව්‍රජ්‍යා උපසම්පදා ඇත්තේ, තෙවන පිරිස ජනිතකොට සිටිවන පිරිසට ප්‍රත්‍යය වූයේය. ඉදින් වනාහි භාග්‍යවතුන් වහන්සේගේ මව මහමායා දේවිය ජීවත් වන්නේද? මෙසේ මෙම ක්ෂත්‍රිය සොහොයුරියන් දෙදෙන එක්ව මෙම සස්න හොබවන්නේය. භාග්‍යවතුන් වහන්සේද මාතෘ බුහුමනින් මාගමට සස්නෙහි පැවිද්ද ද උපසම්පදාවද පහසුවෙන්ම අනුමත කරන්නේය. ඇයගේ අල්පායුෂ්කතාවයෙන් මෙය ඉතා දුකසේ නිපනැයි මෙම අදහසින්, තෙරහු භාග්‍යවතුන් වහන්සේගේ හමුයෙහි, ස්වාමීනි ආශ්චර්යයැයි ආදිය කීහ. එය පිළිගත නොහැකිය. භාග්‍යවතුන් වහන්සේ වනාහි තම සස්නෙහි පැවිද්ද අනුමත කරනුයේ (කැමැති වනුයේ) බරකොට කැමැති වේ. විරකල් පැවැත්මේ කැමැත්ත නිසා සැහැල්ලු නොකරයි. අනෙක් අය කීහ. දශබල, චතුර් වෛශාරද්‍යාදී වූ අන්‍යයන් හා සාධාරණ නුවූ අනන්ත

අපරිමාණ බුදුගුණ, තෙරුන් මෙතෙහි කොට, යම් තැනැත්තියක් ලෝකයෙහි අග්‍ර පුද්ගල ශාස්තෘන් වහන්සේ දසමසක් කුසින් පරිහරණය කළේද, මෙය නම් තෙද බලයකි. එම බුද්ධ මාතාව කිසිවෙකුගේ රැකීම කරන්නියක් වන්නීය ය යන මෙය අයෝග්‍යතාවයකි. කුමක් හෙයින්ද? යම් ආකාර වූ භාග්‍යවතුන් වහන්සේගේ උපන් සත්වන දිනයෙහිදී මව කළුරිය කරයිද, කළුරිය කරන ලදුයේද තුසිත දෙව්ලොව උපදීය යන මෙය ශාස්තෘ ගුණයට යෝග්‍යය. ආශ්චර්ය, අද්භූත සිත් හටගත්තේ වී එම තමාගේ විශ්මයෝත්පාදය භාග්‍යවතුන් වහන්සේට සැළ කරනුයේ 'ස්වාමීනි, ආශ්චර්යයැයි ආදිය කීය. ශාස්තෘන් වහන්සේ වනාහි, බෝසතුන් ඉපිද සත්දිනකින් මවගේ කළුරිය කිරීම ස්වභාව සිද්ධියකි. එම ධර්මතාවය පැහැදිලිව දක්වනුයේ, **එවමෙතං ආනන්ද** ආදිය වදාළහ. මේ එම ධර්මතාවයයි. සියලු බෝසත්වරු පාරමී පුරා තුෂිත දෙව්ලොව ඉපිද, එහි ආයුෂ ඇතිතෙක් සිට ආයුෂ කෙළවර දසදහසක් සක්වල දෙව්වරු විසින් රැස්ව බුදුබව සඳහා මිනිස්ලොව ප්‍රතිසන්ධි ග්‍රහණයට ඇරයුම් කරන ලදුයේ, කාල, දීප-දේශ-කුල මෙන්ම මවගේ ආයුෂ ප්‍රමාණයද බලා ප්‍රතිසන්ධි ගනිති. මේ භාග්‍යවතුන් වහන්සේද බෝසත් වූයේ, එසේම තුෂිත පුරයෙහි සිටියේ පස්මහ බැලුම් බලනුයේ, සත්දිනක් අධික දසමස් ප්‍රමාණ වූ මවගේ ආයු ප්‍රමාණය පිරිසිඳ බලා, මේ මට ප්‍රතිසන්ධි ග්‍රහණයට් කාලයයි. දැන් උපදින්ට සුදුසුයයි දැනම ප්‍රතිසන්ධි ගත්තේය. එහෙයින් සියලු බෝසතුන්ගේ පුරුදු කරන ලද, මනාව පුරුදු කරන ලද වශයෙන්ම දතයුතුය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ **අපපායුකාහි ආනන්ද බොධිසත්ත මාතරෝ හොනති** ආදිය වදාළහ. **කාලං කරොනති** යනු කියන ලද ආකාර ඇති ආයුෂ ක්ෂයයෙන්ම කළුරිය කරති. වැරූ හේතුයෙන් නොවේ. අන්තිම ආත්ම භාවයන්හි බෝසත්වරුන් විසින් වාසය කරන ලද ස්ථාන චෛත්‍ය ගෘහයක් හා සමාන වේ. අන්‍යයන්ගේ පරිභෝගයට සුදුසු නොවේ. බෝසත් මව ඉවත්කොට අනෙකෙකුට අග මෙහෙසුන් තනතුරෙහි තබන්ට නොහැක. බෝසත් මවගේ ආයුෂ එපමණම වේ. එහෙයින් එකල්හි කළුරිය කෙරෙත්. මෙම කරුණම සඳහා මහ බෝසත්වරු පස්මහ බැලුම් කරති. කවර වයසකදී කළුරිය කෙරෙත්ද, මධ්‍යම වයසෙහිදීය. ප්‍රථම වයස්හිදී සත්ත්වයින්ගේ ආත්ම භාවයෙහි ඇල්ම බලවත් වේ. එහෙයින් එකල්හි හටගත් ගැබ් ඇති ස්ත්‍රීහු බොහෝ සෙයින් ගැබ රක්නට නොහැකි වෙති. ගැබ්ගත්තේ වී නමුදු බොහෝ ආබාධ ෙ මධ්‍යම වයස්හි දෙකොටසක් ඉක්ම තෙවන කොටසෙහි වස්තුව පැහැදිලි වේ. පිරිසිදු වස්තුවෙහි උපන් දරුවෝ නිරෝගි වෙති. එහෙයින් බෝසත්

මව්වරු ප්‍රථම වයස්හි සම්පත් අනුභව කොට, මධ්‍යම වයසෙහි තෙවන කොටසෙහි දරුවන් ප්‍රසූතකොට කළුරිය කෙරෙත්.

එතමත්ථං විදිත්වා යනු එම බෝසත් මවගේ ද අන්‍ය සියලු සත්ත්වයින්ගේ ද, ආත්මභාවයන්හි ආයුෂයෙහි මරණ කෙළවරතාවය දැන, එම කරුණ පැහැදිලි කිරීම් වශයෙන් නිරවද්‍ය ප්‍රතිපත්තියෙහි උත්සාහ දැක්වීමට මෙ උදන් ඇනූ සේක. එහි **යෙ කෙචි** යනු අනියම් නිර්දේශයයි. **භූතා** යනු උපන්නාහු (**සත්ත්වයෝ**) **භවිසඝනති** යනු අනාගතයෙහි උපදින්නාහ. වා ශබ්දය විකල්පාර්ථයෙහිය. අපි ශබ්දය **එක්කිරීම්** අර්ථයෙහිය. ඉන් උපදිනු ලබන අයද ඇතුලත් කෙරේ. මෙතෙකින් අතීතාදි වශයෙන් ප්‍රතිසන්ධීන්ට ඇතුලත් සත්ත්වයින් හාත්පසින් ගනු ලැබේ. තවද ගැබෙහි හොවින සත්ත්වයෝ, ගැබින් නික්මුණ කාලයෙහි පටන් උපන්නාහු නමැ, ඉන් පෙර වන්නාහු නමැ. සංසේදජ ඔපපාතිකයෝ ප්‍රතිසන්ධි සිතෙන් මත්තෙහි උපන්නාහු නමැ. සියල්ලෝම වර්තමාන භව වශයෙන් උපන්නාහු නමි. මතු පුනර්භව වශයෙන් වන්නාහු නමි. ක්ෂීණාශ්‍රවයෝ උපන්නාහු නමි. ඔව්හු උපන්නාහුම නැවත නොවන්නාහ. එයින් අන්‍යයෝ වන්නාහු නමැ. **සබ්බෙ ගමිසඝනි පහාය දෙහං** යනු කියන ලද ආකාර භේද ඇති සියලු භව, යෝනි ගති, විඤ්ඤාණට්ඨිති, සත්තාවාසාදි වශයෙන් නොයෙක් භේද හින්න වූ සත්ත්වයෝ දේහය, තම ශරීරය **පහාය** හැරදමා පරලොව යන්නාහ. අශෛක්ෂ්‍යයෝ වනාහි නිවනට යෙති. මෙහි කිසි චුත නොවන ධර්මයක් නම් නැතැයි පෙන්වයි. **තං සබ්බං ඤානිං කුසලෝ විදිත්වා** යනු සියලු සත්ත්වයාට **විපත**, හානිය, **මරණය** යන සියල්ල ගෙනදෙන බවත්, එම සත්ත්වයාගේ හානිය, විනාශය බිඳෙනසුළු ගතිය, දක්ෂ, පණ්ඩිත ස්වභාව ඇති තැනැත්තේ, මරණානුස්මෘති වශයෙන් හෝ අනිත්‍යතා මනසිකාර වශයෙන් හෝ දැන, **ආතාපියො බ්‍රහ්මචරියං චරෙය්‍ය** යනු විදර්ශනායෙහි ක්‍රියා කරනුයේ කෙලෙස් තැවීම් සංඛ්‍යාත වීර්යයෙන් යුක්ත හෙයින් ආතාපියොයි චතුර්විධ සම්‍යක් ප්‍රධාන වශයෙන් ආරබධ වීර්ය ඇත්තේ ශේෂ රහිත මරණය ඉක්මවන උපායෙහි, මාර්ග බ්‍රහ්ම චර්යාවෙහි හැසිරෙන්නේය. පිළිපදින්නේ යයි අර්ථයි.

ද්විතීය සූත්‍ර වර්ණනාව නිමියේ ය.

5-3

තෙවැන්නෙහි, **රාජගහෙ සුපපබුද්ධො නාම කුඩ්ඨී අහොසි** යනු රජගහ නුවර සුප්‍රබුද්ධ නම් පුරුෂයෙකු වූයේය. ඔහු කුෂ්ට රෝගයෙන් දැඩිසේ විරූපී වූ ශරීර ඇත්තේය. **මනුසස දළිද්දො** යනු රජගහනුවර යම්තාක් මිනිස්සු සිටිත්ද? ඔවුනතර සියල්ලන්ටම වඩා අතිශය දිළින්දෙකි. හෙතෙම කසල ගොඩවල් වැටවල් ආදීන්හි මිනිසුන් විසින් ඉවත දමන ලද රෙදිකඩවල් මසා අඳියි. කබලක් ගෙන ගෙන් ගෙට ගොස් ලද, බතෙක් ඉවත් කරන කැඳවතුර ඉඳුල්බත් හේතුකොට ජීවත් වේ. එයද පෙර කරන ලද කර්ම හේතුවෙන් ඇතිතාක් නොලබයි. එහෙයින් දිළිඳු මිනිසෙකැයි යූ.සේයි. **මනුසස කපණො** යනු මනුෂ්‍යයින් අතර අතිශය දිළිඳු බවට පත්, **මනුසස වරාකො** යනු මිනිසුන්ගේ පිළිකුලට හා නින්දාවට පත් හෙයින් අතිශයින් දීන වූ. **මහතියා පරිසාය** යනු මහත් භික්ෂු පිරිසක් විසින්ද, උපාසක පිරිසක් විසින්ද, එක් දිනක වනාහි භාග්‍යවතුන් වහන්සේ මහ බික්සඟ පිරිවරන ලදුයේ රජගහනුවර පිඬු පිණිස පිවිස භික්ෂූන්ට පිණ්ඩපාත සුලභකොට පසුබත පිණ්ඩපාතයෙන් වැළකුනේ භික්ෂූන් කිහිප නමක් පිරිවරන ලදුව යම්කෙනෙකුන් විසින් දානය දෙන ලදද? එම උපාසකයන්ගේද සෙසු භික්ෂූන්ගේද පැමිණීම බලාපොරොත්තු වනුයේ නගරාභ්‍යන්තරයෙහිම එක්තරා මනහර පෙදෙසක සිටියේය. එකෙණෙහිම භික්ෂූහු ඒ ඒ තැනින් අවුත් භාග්‍යවතුන් වහන්සේ මනාසේ පිරිවැරූහ. උපාසකවරුද අනුමෝදනාවද අසා වැඳ නවතින්නෙමුයි භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹුනහ. විශාල ජනතා එකතුවක් විය. භාග්‍යවතුන් වහන්සේ හිඳිනා කාරයක් දැක්විය. එකෙණෙහිම බුදුරදුන්ට සුදුසු අසුනක් පැණවූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, අසූ අනු ව්‍යඤ්ජනයන්ගෙන් ප්‍රතිමණ්ඩිත, දෙතිස්මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් බබලන, බඹයක් පමණ වටරවුමෙහි බබලන, නිල්, කහ, රතු, සුදු, මදටිය (මිශ්‍ර) ප්‍රභාශ්වර වශයෙන් වූ, ෂට්වර්ණ බුද්ධරශ්මීන් විහිදුවමින්, රූපකායශ්‍රීයෙන් එම මුලු පෙදෙසම බබලුවමින් තාරා සමූහයා විසින් පිරිවරන ලද පුන්සඳක් මෙන් බික්සඟ පිරිවැරුනේ පනවන ලද, **එතුම්** බුද්ධාසනයෙහි වැඩහිඳ හිරියල් තලයක හුන් කේශර සිංහයෙක් සිංහ නාදය නාදකරන්නාක් මෙන් කොවුල් නද වැනි මිහිරි උතුම් ස්වරයෙන් දම් දෙසයි. භික්ෂූහු ද වනාහි අල්පේච්ඡ වූවාහු ලද දෙයින් සතුටු වූවාහු, විවේකයෙහි ඇලුනාහු ගිහියන් හා නොගැටුනාහු, පටන්ගත් වීර්ය ඇත්තාහු හළ ආත්ම තෘෂ්ණාව ඇත්තේ, චෝදක වූවාහු පාපයට ගරහන්නාහු අන්‍යයාට උපදෙස් දෙන්නාහු,

අන්‍යයාගේ වචන ඉවසන්නාහු සීල, සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්ති ඥාන දර්ශන සම්පන්න වූවාහු කලුවන් පංශුකූල සිවුර පොරවා, මනාසේ සන්නද්ධ කළ ගඳුතෙක් බඳු භාග්‍යවතුන් වහන්සේ පිරිවරා කන්යොමා දහම් අසති. උපාසකයෝ ද පිරිසිදු වස්ත්‍ර හැන්දාහු, පිරිසිදු උතුරුසළුවලින් යුක්ත වූවාහු පෙරවරු මහදන් පවත්වා සුවඳ මල් ආදියෙන් බුදුරදුන් පුදා, වැඳ බික්සඟනට යටහත් පහත් බව දක්වා භාග්‍යවතුන් වහන්සේද බික්සඟනද පිරිවරා සන්සුන් අත්පා ඇතියේ කන් යොමන ලදුයේ සකස්ව දම් අසති. එහෙයින් **තෙන ඛොපන සමයෙන භගවා මහතියා පරිසාය පරිවුතො ධම්මං දෙසෙනෙතා නිසිනෙනාහොතියි** යූ.සේයි. සුප්‍රබුද්ධ වනාහි සාගිනි දුබලතාවයෙන් පෙලුනේ අහර සොයමින් හැසිරෙනුයේ ඇතුල් වීථියට බටුයේ දුරදීම ඒ මහජන හමුව දැක මේ මහජන සමූහය රැස්වූයේ කවර කරුණකින්ද? ඒකාන්තයෙන්ම මෙහි භෝජන දෙනු ලැබෙයයි හඟිමි. මෙහි ගිය කල්හි කිසියම් කෑයුත්තක් (කැවිලි) හෝ බිඳිය යුත්තක් හෝ ඒකාන්තයෙන්ම ලබන්ට හැකියයි හටගත් රුචිකත්වය ඇත්තේ එහි ගොස් පැහැදීම ඇතිකරන, පැහැදීම ගෙනදෙන උතුම් සන්සිඳීමට පත් දැමුණු, රක්නා ලද සන්සුන් ඉඳුරන් ඇති, ඉතා සන්සුන් එම පිරිස පිරිවරන ලදුයේ ධර්මය දේශනා කරන භාග්‍යවතුන් වහන්සේ දිටිය. දැක, පෙර ආත්මයන් හා යුක්ත වූ මේරුණු උපනිශ්‍රය සම්පත්තියෙන් ප්‍රබුද්ධ කරනු ලැබූයේ මම දහම් ශ්‍රවණය කරන්නේ නම් යෙහෙකැයි පිරිස් කෙළවර හිඳගති. ඒ සඳහා අද්දසා ඛො සුපපබුද්ධා කුටඨ -පෙ- **තතොව එකමනතං නිසීදි. අහමපි ධම්මං සොසසාමීතියි** යූ.සේයි. සබබාවනතං යනු සියල්ල ඇතුලත්, හීන, මධ්‍යම, ප්‍රණීත ආදී සියලු පුද්ගලයන් **සම්පූර්ණයෙන්**, එහි කිසිවෙකුත් අත්නොහැර, සබබනතංයිද කියවති. **චෙතසා** යනු බුදු ඇස හා යෙදුනු සිතින්, මෙහි චිත්ත ශීර්ෂයෙන් ඤාණය නිර්දිෂ්ටය. එහෙයින් ආසයානුසය ඤාණයෙන්ද, ඉන්ද්‍රිය පරෝ පරියත්ති ඤාණයෙන්දැයි අර්ථයි. **චෙතො පරිචච මනසා කාසි** යනු එම පිරිසෙහි සිත් වෙන වෙනම පිරිසිද මෙනෙහි කළේය. ඔව්හු බැලීය. **භබබො ධම්මං විඤඤාතුං** යනු මාර්ගඵල ධර්මය අවබෝධ කරන්ට සමත්ය. උපනිශ්‍රය **සම්පන්නයැයි** අර්ථයි. **එතදහොසි** යනු මෙම සුප්‍රබුද්ධ තෙමේ කිසිසේත් තගර සිබී පසේබුදුන්ට අපරාධකොට මෙබඳුව උපන්නේය. ඔහුගේ මාර්ගඵල **සඳහා** හේතුසම්පත් පස්වලින් වැසුන රන් නිකක් (රන් කලං 25 බර) **මෙන්** හෘදයාබ්‍යාපන්තරයෙහිම බබලයි. එහෙයින් පහසුවෙන් අවබෝධ කල හැකියයි යන මෙය විය. එහෙයින් **අයං ඛො ඉධ භබබා**

ධම්මං විඤ්ඤාතුං යි යූ.සේයි. **ආනුපුබ්බිකථං** යනු දානයට අනතුරු සීලය, සීලයට අනතුරු ස්වර්ගය, ස්වර්ගයට අනතුරු මාර්ගයැයි මෙසේ අනුපිළිවෙළ කථාවයි. භාග්‍යවතුන් වහන්සේ වනාහි ප්‍රථමයෙන් හේතුව සමඟ ස්වර්ගය පෙන්වා, ඉක්බිති සත්ත්වයින් එහි ඇල්මෙන් වෙන් කරන්ට නොයෙක් ක්‍රමයන්ගෙන් ආදීනව ප්‍රකාශ කොට, ආදීනව වශයෙන් සංවේගප්‍රාප්ත හෘදය ඇත්තවුන්ට නෛෂ්ක්‍රම්‍යය ගුණ පැහැදිලි කිරීම් පරමාර්ථයෙන්ම සසරින් වෙන්වීම පෙන්වයි. **දානකථං** යනු මෙම දානය නම් සුවයන්ට නිධානයකි. සම්පත්තීන්ට මූලකි. භෝගයන්ට ප්‍රතිෂ්ඨාවකි. මෙලෝ පරලෝහි විසමත්‍වයට පත් 'සත්ත්වයින්ට ආරක්ෂාවකි. රක්ෂා ස්ථානයකි. ප්‍රතිෂ්ඨාවකි. පිහිටකොට ඇත දානය හා සමාන උපකාරයක්, පිහිටීමක්, එල්බගැනීමක්, ආරක්ෂාවක්, රක්ෂාස්ථානයක්, පිහිටක්, පිහිටකොට ඇත්තක් නැත. මෙය උපකාරක අර්ථයෙන් රත්නමය සිංහාසනයක් සමානය. ප්‍රතිෂ්ඨා (පිහිටීම්) අර්ථයෙන් මහා පෘථුවිය හා සමානය. එල්බීම් අර්ථයෙන් එල්බෙන වැලක් හා සමානය. දුකින් එතෙර කිරීම් අර්ථයෙන් නැවක් හා සමානය. සනසන අර්ථයෙන් යුද්ධයෙහි දක්ෂයෙකු මෙනි. බියෙන් ආරක්ෂා වීම් අර්ථයෙන් මනාව තැනූ තාප්පවලින් වටකළ නගරයක් මෙනි. මසුරුමල ආදීන්ගෙන් නොතැවරුණු අර්ථයෙන් මහනෙල් මලක් හා සමානය. මසුරුමලාදීන්ගේ මනාකොට දැවීම් අර්ථයෙන් ගින්නක් හා සමානය. ඒවාහි දැවීම් අර්ථයෙන් ගින්නක් හා සමානය.

ළංවීමට අපහසු අර්ථයෙන් සර්පයෙක් හා සමානය. තැතිගැනීම් නැති අර්ථයෙන් සිංහයෙක් හා සමානය. බලවත් අර්ථයෙන් හස්තියෙකි. උතුම් මංගල සම්මත අර්ථයෙන් සුදු වෘෂභයෙකි. ක්ෂේම භූමියට පමුණුවන අර්ථයෙන් වළාහක අශ්වරාජයෙකි. දානය වනාහි ලොව රාජ්‍යශ්‍රීය ගෙන දේ. සක්විති සම්පත් දේ. ශක්‍ර සම්පත්තිය, මාර සම්පත්තිය, බ්‍රහ්ම සම්පත්තිය, ශ්‍රාවක පාරමී ඥානය, පසේබුදු ඥානය, සම්‍යක් සම්බෝධි ඥානය ගෙනදේ යයි මේ ආදී දානය හා සම්බන්ධ කථා. දන් දෙන්නේ සිල් සමාදන් වන්ට හැකි වේ. එහෙයින් දාන කථාවට අනතුරුව සීල කථාව කියයි. **සීල කථං** යනු එම සීලය නම් සත්ත්වයින්ට උපකාරයකි. පිහිටීමකි. එල්බ ගැනීමකි. ආරක්ෂාවකි. රක්ෂා ස්ථානයකි. පිහිටකි. පිහිටකොට ඇත්තකි. මෙලෝ පරලෝ සම්පත්තීන්ට සීලය හා සමාන උපකාරයක්, පිහිටීමක්, එල්බ ගැනීමක්, ආරක්ෂාවක්, රක්ෂා ස්ථානයක්, පිහිටක්, පිහිට කොට ඇත්තක් නැත. සීලය හා සමාන අලංකාරයක්, සීල පුෂ්පය නමැති පුෂ්පයක්, සීල සුවඳ නමැති සුවඳක් නැත. සීලාලංකාරයෙන්

අලංකෘත, සිල් කුසුම පැලඳූ සිල් සුවඳ ආලේප කරන ලදුයේ, (ඔහු දෙස) දෙවියන් සහිත ලෝකයා බලනුයේ තෘප්තියට නොයයි මේ ආදීන්ගෙන් සිල්ගුණ හා යෙදුන කථාව. මෙම සීලය හේතුවෙන් මෙම ස්වර්ගය ලැබෙයයි දක්වන්ට සීලයට අනතුරුව ස්වර්ග කථාව කියයි. **සගගකථං** යනු ස්වර්ගය නම් මනොඥය. සිත් අලවන සුළුය. මන වඩන්නේය. මෙහි නිතරම ක්‍රීඩාය. නිතර සම්පත් ලබත්. චාතුර්මහා රාජික දෙව්වරු අවුරුදු අනූලක්‍ෂයක් දිව සුව, දිවසම්පත් ලබත්. තව්තිසා දෙව්වරු අවුරුදු තුන්කෝටි හැටලක්‍ෂයක්ය යන මේ ආදී ස්වර්ග ගුණ හා බැඳි කථාව. ස්වර්ග සම්පත්තිය දෙසන්නා වූ බුදුවරුන්ගේ මුව නොපොහොනේයි. එය, මහණෙනි මම නොයෙක් ක්‍රමයන්ගෙන් ස්වර්ග කථාව දෙසන්නෙමියි ආදිය යූ.සේයි. මෙසේ හේතු සමග ස්වර්ග කථාවෙහි පොළඹවා නැවත ඇතෙකු අලංකාර කොට, උගේ සොඬය සිඳ දමන්නාක් මෙන්, මෙම ස්වර්ගයද අනිත්‍යය. අස්ථිරය. මෙහි ඡන්දරාගයක් නොකටයුතුයැයි දැක්වීම සඳහා 'කාමයෝ අල්ප ආශ්වාදයහ. බොහෝ දුක්ය. බොහෝ බලවත් යිත්තැවුල්ය. මෙහි දොස් බොහෝ යයි ආදී ක්‍රමයෙන් කාමයන්ගේ ආදීනව, ලාමක බවද කෙලෙස් සහිත බවද දේශනා කරයි. එහි **ආදීනවං** යනු දොස් - **ඔකාරං** යනු ලාමක ස්වභාවය ශ්‍රේෂ්ඨ නුවූවන් විසින් සේවනය කළයුතුය. ශ්‍රේෂ්ඨයන් විසින් සේවනය නොකටයුතුය. පහත් ස්වභාවයැයි අර්ථයි. **සංකිලෙසං** යනු ඒවා කරණකොට සත්ත්වයින් සසරෙහි කිලිටිවීමයි. එහෙයින්ම 'පින්වත්නි, ඒකාන්තයෙන් සත්ත්වයෝ කිලිටිවෙති'යි යූ.සේයි. මෙසේ කාමාදීනවයෙන් තර්ජනයකොට නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ප්‍රකාශකළ සේක. ප්‍රව්‍රජ්‍යාවෙහි ද ධ්‍යානාදීන්හිද ගුණ දැක්වීය. වර්ණනා කළේය. **කලල චිත්තං** යනාදීන්හි කලල චිත්තං යනු කර්මක්‍ෂම සිත යට පවත්වන ලද, දේශනාවෙන් අශ්‍රද්ධාදී චිත්ත දෝෂයන්ගේ පහවූ හෙයින් මතු දේශනාවට උපකාර වන බවට පැමිණීමෙන් කර්මක්‍ෂම වූ සිත. කර්මක්‍ෂම සිත යයි අර්ථයි. මිථ්‍යාදෘෂ්ටි මාන ආදී කෙලෙස් පහවීමෙන් **මුදුචිත්තං** ය. කාමච්ඡන්දාදිය පහවීමෙන් **විනීවරණ චිත්තං** යි, යහපත් ප්‍රතිපත්තියෙහි යෙදීමෙන් මහත් ප්‍රීති ප්‍රමෝද්‍ය යෙදීමෙන් **උදගචිත්තං** යි, තුටු පහටු සම්පත්තියෙන් **පසනන චිත්තං** යි 'යම්කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ දත්සේක්දැයි සම්බන්ධයි නොහොත්, **කලලචිත්තං** යනු කාමාශා පහවීමෙන් නිරෝගී සිත **මුදුචිත්තං** යනු ව්‍යාපාදය පහවීමෙන් නිරෝගී සිත **මුදුචිත්තං** යනු ව්‍යාපාදය පහවීමෙන් මෛත්‍රී වශයෙන් තදනුවූ සිත. **විනීවරණ චිත්තං** යනු උද්ධච්ච කුක්කුච්ච පහවීමෙන් අවික්ෂිප්ත වන හෙයින් වසන ලද සිත. **උදගචිත්තං** යනු ථීනමිද්ධ

පහවීමෙන් මනාව එසවීම් වශයෙන් නොහැකිලුනු සිත, **පසන්න චිත්තං** යනු විචිකිච්ඡාවගේ පහවීමෙන් මනා ප්‍රතිපත්තියෙහි යෙදුන සිත, **අථ** යනු පසුව **සාමුක්කංසිකා** යනු තෙමේ උසස් බවට පත්වූයේ, තමා විසින් ඔසවා ගන්නා ලද, තමා තුලම හටගත් ඥානයෙන්, තෙමේම දක්නා ලද, අන්‍යයන්ට අසාධාරණයැයි අර්ථයි. එය කිමෙක්ද යත්, ආර්ය සත්‍යය දේශනාවයි. එහෙයින්ම දුක්ඛං, සමුදයං නිරොධං, මග්ගංයි වදාළ සේක. මෙය වනාහි සත්‍යයන්ගේ ස්වභාව තත්ත්වයයි. එහෙයින්, මෙතැන්හි ආර්ය සත්‍යයන් කිවයුත්තාහ. ඒවා සර්වප්‍රකාරයෙන් විස්තර වශයෙන් විසුද්ධි මාර්ගයෙහි යූ.සේයි. එහි යූ.සෙයින් දතයුත්තාහ. **සෙය්‍යථාපි** යනාදී ක්‍රමයෙන් උපමා වශයෙන් සුප්‍රබුද්ධගේ කෙලෙස් ප්‍රහානයද ආර්ය මාර්ගෝත්පාදනයද පෙන්වයි. **අපගත කාලකං** යනු පහවූ කළු බව, **සම්මදෙව** යනු මනාකොට **රජනං** යනු නිල්, කහ, රතු, මදටිය ආදී සායම් වර්ග **රජනං** යනු නිල්, කහ, රතු, මදටිය ආදී සායම් වර්ග. **පටිගණ්හෙය්‍ය** යනු පිළිගන්නේය. ප්‍රභාෂ්වර වන්නේය. **තස්මිං යෙව ආසනෙ** යනු එම හිඳීමෙහිම, එයින් ඔහුගේ වහා විදර්ශනාවට එළැඹීමද, **තීක්ඛණ** ප්‍රාඥතාවද, සුව ප්‍රතිපදා වහා අභිඥා ප්‍රාප්තියද දක්වන ලද්දේ වෙති. **විරජං විතමලං** අපා ගතවන රාග දූවිලි ආදීන්ගේ අභාවයෙන් කෙලෙස් නොමැති. ශේෂ රහිතව දෘෂ්ටි විචිකිච්ඡා මල පහවීමෙන් පහවූ මල ඇති, ප්‍රථම මාර්ගයෙන් නැසිය යුතු කෙලෙස් දූවිලි අභාවයෙන් හෝ පහවූ මල ඇති, පස්වැදෑරුම් දුසිල් මල ඉවත්වීමෙන් පහවූ මල, **ධම්මචක්ඛු** යනු සෝවාන් මාර්ගය අදහස් කරන ලදී. එහි උපදින ආකාරය දැක්වීමට **යං කිඤ්චි සමුදයං ධම්මං සබ්බන්තං නිරොධ ධම්මං** යි යූ.සේයි. එය වනාහි නිරෝධ අරමුණුකොට කෘත්‍යය වශයෙන් මෙසේ සංඛත ධර්මයන් ප්‍රතිවේධ කරනුයේ උපදී. එහි මේ උපමා සංසන්දනයයි. වස්ත්‍රය මෙන් සිත දතයුතුය. වස්ත්‍රයට පිටතින් පැමිණෙන අපද්‍රව්‍යවලින් කිලිටිවීම් ස්වභාවය මෙන් සිතට රාගාදී අපද්‍රව්‍යයන්ගෙන් මනාව කිලිටිවීම් ස්වභාවයයි. සෝදන පුවරුව මෙන් අනුපිළිවෙළ කථාවයි. ශ්‍රද්ධාව ජලය වැනිය. දියෙහි තෙම තෙමා ගොම හා කරමැටිවලින් වර්ණ ගැන්වීමෙහි, මැඩ වස්ත්‍රයෙහි සේදීම් ක්‍රියාවෙහි යෙදීම මෙන් ශ්‍රද්ධා ජලයෙන් තෙමා, සති සමාධි ප්‍රඥාවන්ගෙන් දොස් ලිහිල්කොට, ශ්‍රද්ධාදී ආකාරයෙන් සිත පිරිසිදු කිරීමෙහිලා වීර්යාරම්භය, එම සංයෝගයෙන් වස්ත්‍රයෙහි කළුබව පහවීම මෙන් වීර්යාරම්භයෙන් කෙලෙස් යටපත් කිරීමයි. පාට වර්ග මෙන් ආර්ය මාර්ගයයි. එම පිරිසිදු වස්ත්‍රයෙහි ප්‍රභාෂ්වර භාවය මෙන් යටපත් කරන ලද කෙලෙස් සහිත සිතෙහි මාර්ගයෙන් පිරිසිදු කිරීමයි. මෙසේ

සුප්‍රබුද්ධ තෙමේ පිරිස් කෙළවර සිටියේ දම් දෙසීම අසා සෝවාන් ඵලයට පත්ව තමා ලද ගුණය ශාස්තෘන් වහන්සේට සැළකරනු කැමැතියේ පිරිස මැදට බැසගන්ට නොහැකිව මහජනයා ශාස්තෘන් වහන්සේ වැඳ පසුපස ගොස් නැවැති කල, භාග්‍යවතුන් වහන්සේ විහාරයට ගිය කල්හි තෙමේද විහාරයට ගියේය. එකෙණෙහි සක්දෙව් රජ, මේ සුප්‍රබුද්ධ කුෂ්ඨි තෙමේ තමා විසින් ශාස්තෘ ශාසනයෙහි ලද ගුණය ප්‍රකට කරනු කැමැත්තේ යයි දැන, ඔහු විමසන්නෙමියි ගොස් අහසෙහි සිටියේ, සුප්‍රබුද්ධය. නුඹ දිළිඳු මිනිසෙකි. මිනිස් කාලකණ්ණියෙකි. මිනිස් අසරණයෙකි. මම නුඹට ප්‍රමාණාතික්‍රාන්ත ධනය දෙන්නෙමි. බුදුන් බුදුන් නොවේ. ධර්මය ධර්මය නොවේ. සංඝයා සංඝයා නොවේ. මට බුදුන්ගෙන් කම් නැත. ධර්මයෙන් කම් නැත. සංඝයාගෙන් කම් නැතැයි කියවයි යන මෙය කීවේය. ඉක්බිති හෙතෙම නුඹ කවරෙක්දැයි ඔහුගෙන් විමසීය. මම සක්දෙව්රජ වෙමි. අදබාල නිර්ප්‍රලජ්ජිය, නුඹ මා සමග කථා කරන්ට නුසුදුසුය. යම් ආකාර වූ නුඹ මෙසේ නොකිව යුත්තක් කියන්නෙහිය. තවද නුඹ මා හට දුගියෙකි. දිළින්දෙකි. කාලකණ්ණියෙකියි කුමක් හෙයින් කියහිද? මම ලෝකනාථයාණන් වහන්සේගේ ඖරස පුතෙකු නොවේද, මම දුගියෙක් නොවෙමි. දිළින්දෙක් නොවෙමි. කාලකණ්ණියෙක් නොවෙමි. තවද උතුම් සුවයෙන් සුවයට පත්වූයේ වෙමි. තවද මහ ධනවතෙක් වෙමියි කියා මෙසේ ද කීවේය.

සද්ධා ධනං සීලධනං - හිරි ඔත්තප්පියං ධනං
සුත ධනඤ්ච චාගොච - පඤ්ඤා මෙ සත්තමං ධනං

යස්ස එතෙ ධනා අත්ථි - ඉත්ථියා පුරිසස්සවා
අදළිද්දොති තං ආහු - අමොඝං තස්ස ජීවිතංනති

ශ්‍රද්ධාව, සීලය, පාපයෙහි ලජ්ජාවීම, බියවීම ඇසූ පිරූ තැන් ඇති බව - ත්‍යාගය හා ප්‍රඥාව සත්වැන්න වූ මෙම ධනයන් යම් ස්ත්‍රියකට හෝ පුරුෂයෙකුට තිබේද ඔහු දිළින්දෙක් නොවේයයි කීහ. ඔහුගේ දිවිය නොඅසිස්ය.

මට මෙම සප්ත ආර්ය ධනයන් තිබේ. යමෙකුට මෙම ධනයන් ඇත්ද? බුදුවරුන් විසින් හෝ පසේ බුදුවරුන් විසින් දිළින්දෝ යයි නොකියත්මය. ශක්‍ර තෙම ඔහුගේ කථාව අසා ඔහු අතරමග අත්හැර

ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස්, සියලුම එම කීම්, හා පිළිවඳන් සැළ කලේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට ශක්‍රය, ශක්‍රාදීන් සියයකින් හෝ දහසකින් හෝ සුප්‍රබුද්ධ කුෂ්ටියා ලවා බුදුන් බුදුන් නොවේය. ධර්මය ධර්මය නොවේය. සංඝයා සංඝයා නොවේයයි කියවන්ට නොහැකියයි වදාළේය. සුප්‍රබුද්ධ කුෂ්ටියාද ශාස්තෘන් වහන්සේ, සමීපයට ගොස් ශාස්තෘන් වහන්සේ සමග කරන ලද පිළිසඳර ඇතියේ තමා ලද ගුණ සැළ කලේය. එහෙයින් **අථඛො සුප්පබුද්ධො කුට්ඨී දිට්ඨ ධම්මො පත්තධම්මොයි** ආදිය යූ.සේයි. එහි **දිට්ඨ ධම්මො** යනු දක්නා ලද ආර්ය සත්‍යය ධර්මය ඔහු විසිනුයි දිට්ඨ ධම්මොයි සෙසු පදයන්හිද එම ක්‍රමයමැයි. එහි දිට්ඨ ධම්මො යන මෙහි ධම්ම ශබ්දය සමාන වචනයෙහිය. දර්ශනය නම් ඥාන දර්ශනයෙන් අනෙකක්ද ඇතැයි එය නැවැත්වීමට පැමිණි ධර්මයයි යූ.සේයි. පැමිණි ධර්මයෙහිද ඥාන සම්පත්තියෙන් අනෙකක්ද විද්‍යමාන වේයයි ඉන් වෙසෙසා දැක්වීමට දන්නා ලද ධර්මයැයි යූ.සේයි.

ඒ මේ දන්නා ලද ධර්මතාවය ධර්මයන්හි එක් කොටසකින්ද වේයයි අවශේෂ දෙයක් නැති වශයෙන් (සියල්ල ඇතුලත් වනසේ) එය දැක්වීමට **පරියොගාළ්හ ධම්මො** යි යූ.සේයි. එයින් එහි කියන ලද ආකාර ඇති සත්‍යාධිගමයම දක්වන ලදී. මාර්ග ඥානය වනාහි තනිව අවබෝධ වීම් වශයෙන් විශේෂ දැනීම ආදී කෘත්‍යය සිදුකරමින් අවශේෂ දෙයක් නැති ලෙසද දතයුතු ධර්මය හාත්පසින් බැසගත්තේ නම් වේ. ඉන් අන්‍ය ඥානයක් නොවේ. එහෙයින් දක්නා ලද ආර්ය ධර්මය ඔහු විසිනුයි දිට්ඨ ධම්මොයි යූ.සේයි. එහෙයින්ම **තිණ්ණ විචිකිච්ඡො** යි ආදිය යූ.සේයි. එහි සොර කතරක් සදිසි සොළොස් වස්තුක වූද අෂ්ඨ වස්තුක වූද විචිකිච්ඡාව ඔහු විසින් තරණය කරන ලද්දේනුයි **තිණ්ණ විචිකිච්ඡො** යි. එයින්ම ප්‍රවෘත්ති ආදීන්හි එසේ වූයේද? නොවූයෙහිදැයි මෙසේ පවත්වන ලද පහවූ සිඳිනා ලද සැකය ඔහුටනුයි **විගතකථං කථොයි.** සාවද්‍යකර පාපධර්මයන්ගේ ප්‍රහීණ කළ හෙයින් එයට ප්‍රතිපක්ෂ වූ, **සීලාදී** ගුණයන්හිද මනාව පිහිටි හෙයින් විශාරදත්වයට, විශාරද බවට ව්‍යක්ත භාවයට පැමිණියේනුයි **වෙසාරජ්ජප්පත්තොයි.** ඔහුට අනෙකෙක් උපකාර නොකරයි. අන්‍යයාගේ ශ්‍රද්ධාවෙන් මෙම ශාස්තෘ ශාසනයෙහි නොපවතීනුයි **අපරපච්චයො** යි. අභික්කන්තං ආදීන්හි මෙම අභික්කන්ත ශබ්දය ක්ෂය-සුන්දර, මන වඩන අනුමෝදනා ආදී නොයෙක් අර්ථයන් හි පෙනේ.

මෙහි වනාහි අනුමෝදනායෙහි දතයුතුය. එනිසාම එය ප්‍රසාද වශයෙන්ද, ප්‍රශංසා වශයෙන්ද දෙවරක් යූ.සේයි. ස්වාමීනි, මැනව මැනවැයි යූ.සේයි. **අභික්කන්තං** යනු ඉතා සිත් අලවන, අතිශයින් ශ්‍රේෂ්ඨ, ඉතා මන වඩන, ඉතා සොඳුරුය යන අර්ථයි. එහි එක් අභික්කන්ත ශබ්දයකින් භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට තුති කරයි. එක් පදයකින් තම ප්‍රසාදයයි. මේ මෙහි අදහසයි.

ස්වාමීනි, ඉතා ශ්‍රේෂ්ඨයි. යම් මේ භාග්‍යවතුන් වහන්සේගේ දහම් දෙසීමට පැමිණ මාගේ ප්‍රසාදයයි. භාග්‍යවතුන් වහන්සේගේම හෝ වචනය ඉතා ශ්‍රේෂ්ඨයි. දොස් නසන හෙයින් අතිශයින් සිත් අලවයි. යහගුණ අවබෝධ වන හෙයින්ද, එසේම ශ්‍රද්ධාව වඩන හෙයින්ද, නුවණ උපදවන හෙයින්ද අර්ථ සහිත හෙයින්ද, අක්ෂර සහිත හෙයින්ද, නොගැඹුරු පද හෙයින්ද, ගැඹුරු අර්ථ හෙයින්ද, කණිසුඛ හෙයින්ද සිත සතුටු කරන හෙයින්ද, තමා උසස් කොට නොසලකන හෙයින්ද, අනුන් පහකොට නොසලකන හෙයින්ද, කරුණාවෙන් සිසිල් හෙයින්ද, ශ්වේත ප්‍රඥා හෙයින්ද, ශ්‍රවණ සුව හෙයින්ද විමසනු ලබනුයේ යහපත පිණිස පවතී යයි මේ ආදී ක්‍රමයෙන් ස්තුති කරනුයේ පද ද්වයයක් කීවේය. ඉන් මත්තෙහිද උපමා සතරකින් දේශනාවම වර්ණනා කරයි. එහි **නික්කුජ්ජිතං** යනු යටිකුරු කර තබන ලද, යට මුව වූයේ හෝ. **උක්කුජ්ජෙය්‍ය** මුහුණත උඩට කරන්නේය. **පටිච්ඡන්නං** යනු තෘණ හා කොල ආදියෙන් වසන ලද **විවරෙය්‍ය** යනු විවෘත කරන්නේය. **මූළ්හස්ස** යනු දිසා මුළා වූවහුට, **මග්ගං ආචික්ඛෙය්‍ය** යනු අත් ගෙන එය මාර්ග යැයි මුළා වූවහුට, මගං **ආචික්ඛෙය්‍ය** යනු අත් ගෙන එය මාර්ග යැයි මාර්ගය පෙන්වන්නේය. **අන්ධකාරෙ** යනු අංග සතරෙකින් යුත්, මේ පදාර්ථයයි. මේ අදහස් කළ යෙදීම, **යම්සේ නම් කිසිවෙක්** යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේද, මෙසේ සද්ධර්මයට විරුද්ධ අසත් ධර්මයෙහි පිහිටි මා අසත් ධර්මයෙන් නැගිටුවන්නහු විසින් යම්සේ වැසුණු යමක් මතු කරන්නේද? මෙසේ කාශ්‍යප බුදුරදුන්ගේ සාසන අතුරුදන් වීමේ පටන්, මිසදිටු ග්‍රහණයෙන් වැසුණු සස්න විවර කරන්නහු විසින් යම්සේ මංමුළා වූවෙකුට මාර්ගය කියන්නේද? මෙසේ නොමගට වැරදි මාර්ගයට පිළිපන්නහුට සගමොක් මාර්ගය ප්‍රකට කරන්නහු විසින්, යම්සේ අඳුරෙහි තෙල් පහනක් දරන්නේද? මොහඳුරෙහි නිමග්න වූ මා හට බුද්ධාදී රත්න රූපයන් නොදක්නේ එය වසන්නා වූ, මොහන්ධකාරය විද්ධංවංශනය කරන දේශනා නමැති දැරීමෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයන්ගෙන් දේශනා

කරන ලද හෙයින්, නොයෙක් ක්‍රමයන්ගෙන් ධර්මය ප්‍රකාශ කරන ලදී. මෙසේ දේශනාවට ස්තුතිකොට, එම දේශනාවෙන් තෙරුවන්හි ප්‍රසන්න සිත් ඇත්තේ ප්‍රසන්න අයුරක් කරනුයේ **එසාහං** ආදිය කීය. එහි **එසාහං** යනු ඒ මම, **භගවන්තං සරණං ගච්ඡාමි** යනු භාග්‍යවතුන් වහන්සේ මට පිහිටය. පිහිටකොට ඇත්තේය. පව නසන ලද්දේය. යහපත මවන ලදී. දනිමි අවබෝධ කරමියි යන මෙම අදහසින් භාග්‍යවතුන් වහන්සේ සරණ යමි. යම්කිසි ආකාර වූ ධාතූන්ගේ පැවතීම් අර්ථයක් වේද? බුද්ධියද ඒවායි අර්ථයයි. ධම්මං යනු අවබෝධ කළ මාර්ගයෙහි සාක්ෂාත් නිරෝධයෙහි අවවාද කළ පරිදි පිළිපදිනුයේ සිව් අපායයන්හි නොවැටෙනවුන්ට දරයිනුයි ධර්ම නමැ. එය ආර්ය මාර්ගයද නිර්වාණයද වේ. යූ.සේයි. 'මහණෙනි, ප්‍රත්‍යයෙන් හටගත් යම්තාක් ධර්ම වේද? ආර්ය අෂ්ඨාංගික මාර්ගය ඒවා අතර අග්‍රයයි කියනු ලැබේ. මහණෙනි, ප්‍රත්‍යයෙන් හටගත් හෝ ප්‍රත්‍යයෙන් හටනොගත් යම්තාක් ධර්ම වේද, විරාගය (නොඇල්ම) ඒවා අතර අග්‍රයයි කියනු ලැබේ. හුදෙක් ආර්යමාර්ගය හා නිවනද පමණක් නොවේ. තවද වනාහි ආර්යඵලයන් සමග පර්යාප්ති ධර්මයද වේ. යූ.සේයි.

රාග විරාග මනෙජ මසොකං - ධම්ම ම සංඛත මපපටිකූලං
මධුරම්මං පගුණං සුවිභත්තං - ධම්මම්මං සරණත්ථමුපෙමි

ඇල්ම දුරුකළ, තෘෂ්ණා නැති, සෝක නොමැති, ප්‍රත්‍යයෙන් හට නොගත්, පිළිකුල් නුවූ, මිහිරි වූ, ප්‍රගුණ වූ, මනාව බෙදිය හැකි මෙම ධර්මය පිහිට සඳහා එළැඹෙමි.

මෙහි වනාහි **රාගවිරාග** යනු මාර්ගය යූ.සේයි. **අනෙජමසොකං** යනු ඵලයයි. අසංඛත යනු නිර්වාණයයි. **අපපටිකූලං මධුර ම්මං පගුණං සුවිභත්තං** යනු පර්යාප්ති ධර්මය යූ.සේයි. භික්ඛු සංඝං යනු දෘෂ්ටි, සීල සමානතාවයෙන් එක්වූ අෂ්ට ආර්ය පුද්ගල සමූහයයි. මෙතෙකින් සුප්‍රබුද්ධ සරණාගමනත්‍රයය ප්‍රකාශ කරයි. **උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං** යනු එය අද මුල් දින කොට, අජ්ජදග්ගෙයිද පාඨයි. එහි ද කාරය පද සන්ධි කරයි. අද අග කොටයැයි අර්ථයි.

ප්‍රාණයෙන් යුක්තව යම්තාක් මාගේ ජීවිතය පවතීද? ඒතාක් අනන්‍ය ශාස්තෘක යුක්තව සරණාගමනත්‍රයයෙන් සරණ ගියේ රත්නත්‍රයට

එළැඹෙන හෙයින් උපාසකයෙකු කැපකරුවෙකු සේ භාග්‍යවතුන් වහන්සේ මා සලකන සේක්වා. දැනගන්නා සේක්වායි අර්ථයි. මොහුගේ සරණාගමනය ආර්යමාර්ගාධිගමනයෙන්ම නිපන්නේය. අදහස ප්‍රකට කරනුයේ මෙසේ කීවේය. **භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා** යනු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සිතෙන් සතුටුව එම සතුටු වූ බව ප්‍රකාශ කරනුයේ කියන ලද ආකාරයෙන් වචනයෙන් අනුමෝදන්ව, **අභිවාදෙත්වා පදක්ඛිණා කත්වා පක්කාමි** යන ඒ භාග්‍යවතුන් වහන්සේට පසඟ පිහිටුවීමෙන් වැඳ, තෙවරක් ප්‍රදක්ෂිණාකොට ශාස්තෘ ගුණයෙහි නිමින සිතැතියේ, දර්ශන සීමාව ඉක්මවන තෙක් භාග්‍යවතුන් වහන්සේම බලමින් දෙඅත් ඔසවා නමස්කාර කරමින් ගියේය. යනුයේම කුෂ්ඨ රෝගයෙන් මැඩීමෙන් සිදිනා ලද අත් පා ඇඟිලි ඇත්තේ, අපවිත්‍ර දෑ පිරුණු ශරීරතිව, උතුරා යන සැරව ඇත්තේ, කැසීමෙන් අතිශය පීඩාවට පත් වූයේ, අපවිත්‍ර දුර්ගන්ධ ඉතාමත් පිළිකුල් වූයේ, දකින තැනැත්තාගේ උපරිම කරුණාවට පාත්‍ර වූයේ, මෙම ශරීර, අත්‍යන්තයෙන් ශාන්ත වූ ප්‍රණීතතම ආර්ය ධර්මයට ආධාර වන්ට නුසුදුසු යයි උපන් ප්‍රවාහයක්මෙන් ස්වර්ගය සඳහා බලපවත්නා පුණ්‍ය කර්මයෙන් ඉඩ ලබාදෙන ලද අල්පායුෂ්ක සංවර්තනික රැස්කරන ලද උපච්ඡේදක පාපකර්මයෙන් දොස් නගන්නාක් මෙන් ළදරු වසුපැටවෙකුගේ දෙනක් විසින් බිම හෙළා මරන ලදී. එහෙයින් අථඛො අච්ර පක්කනතං සුපපබුද්ධං කුධ්‍යිං ගාවි තරුණ වච්ඡා ධෙනු අධිපාතෙත්වා ජීවිතා වොරොපෙසියි යූ.සේයි. මොහු අතීත ආත්මයකදී එක් සිටු පුතෙක්ව ඉපිද තම යහලු සිටු පුතුන් තිදෙනෙකු සමග ක්‍රීඩා කරනුයේ එක් නුවර ප්‍රකට රූප සුන්දරියක් වූ ගණිකාවක් උයනට ගෙනගොස් දිවාකලැ සැප අනුභවකොට හිරු අස්තයට ගියකල්හි සුප්‍රබුද්ධ අතෙක් යහලුවන්ට මෙය කීවේය. මැයගේ අතෙහි කහවණු දහසකි. බොහෝ ස්වර්ණද වටිනා පළඳනාද විද්‍යමාන වෙති. මෙම වනයෙහි අන් කිසිවෙක් නැත. රැය ඇරඹිනි. එහෙයින් අප මැය මරා සියලු ධනය ගෙන යමුයි. එම සතරදෙනම ඒකමතික වී ඇය මැරීමට උපක්‍රම කළහ. ඕ ඔවුන් විසින් මරනු ලබන කල්හි මෙම නිර්ලජ්ජී, අකරුණාවන්තයෝ මා සමග කෙලෙස් සහවය කොටු නිරපරාධී මා හුදෙක් ධන ලෝභයෙන් මරත්. මොවුනු මා එක්වරක් මරති. මම යක්ෂණියක්ව නොයෙක් සියදහස් ගණන් වාර මොවුන් මරන්ට සමත් වන්නෙමි යෙහෙකැයි ප්‍රාර්ථනාකොට කළුරිය කළාය. ඔවුනතර එක් අයෙක් පුක්කුසාති නම් කුලපුතු විය. එක් අයෙක් බාහිර දාරුවීරියයි. එක් අයෙක් තම්බදාඨික චෝර ඝාතකයාය. එක් අයෙක් සුපපබුද්ධ කුෂ්ඨියාය. මෙසේ

මේ සිව්දෙන නොයෙක් ආත්මභාව සිය ගණනකදී ඕ යක්ෂ යෝනියෙහි උපන්නී, ගව දෙනක් මෙන් වෙස්වලා ජීවිතයෙන් තොර කළේය. ඔවුහුද එම කර්මයෙහි විපාක වශයෙන් අතරතුර මරණයන්ට පැමිණියහ. මෙසේ සුපබුද්ධ කුෂ්ඨියාට ක්ෂණික මරණය වූයේය. එහෙයින් **අථඛො අචිර පකකනතං** -පෙ- **වොරොපසේ** යි යූ.සේයි. ඉක්බිති බොහෝ භික්ෂූහු ඔහුගේ කළුරිය කිරීම භාග්‍යවතුන් වහන්සේට සැළකොට **මරණින්** මතු ජීවිතය (පරලොව) පිළිබඳ විමසූහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළ සේක. එහෙයින් අථඛො **සමබහුලා භික්ඛු** ආදිය යූ.සේයි. එහි **තිණණං සංයොජනානං පරික්ඛයා** යනු සකකාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබබත පරාමාස යන මෙම ත්‍රිවිධ භව බන්ධනයන්ගේ විනාශ කිරීම් වශයෙන් ප්‍රහාණයෙන් සොතාපනෙනා යනු ස්‍රොත්‍ර සංඛ්‍යාත ආර්ය මාර්ගයට මුලපටන් පහතට බැස්වූ යූ.සේයි. ස්‍රොත්‍ර ස්‍රොත යයි ඇවැත් සාරිපුත්‍රය, මෙය කියයි. ඇවැත්නි, ස්‍රොත්‍රය කවරක් හෝ වේද? මෙම ආර්ය අෂ්ඨාංගික මාර්ගයම වේ ආදියයි. **අවිනිපාත ධමෙමා** යනු නපුරු සේ වැටීම විනිපාතයි. මොහුට නපුරු සේ වැටීමක් නොවේනුයි අවිනිපාත ධර්මයි. සිව් අපායයන්හි ඉපදීම් වශයෙන් නොවැටෙන ස්වභාවයයි අර්ථයි. **නියතො** යනු නිවැරදි ස්වභාව නියමයෙන් නියම වූයේ සමෙබාධි පරායනො යනු මතු මාර්ගත්‍රයය සංඛ්‍යාත මනා අවබෝධය සඳහා මත්තෙහි මාර්ගය වන්නේය. පිහිටට පිළිසරණට ඒකාන්තයෙන් පැමිණිය යුතුයයි **සමෙබාධි** පරායනොයි එයින් ඔහුගේ පිහිට කිමෙක්ද මරණින් මත්තෙහි කිනම් තත්ත්වයක්දැයි විමසීමෙහිලා, සුප්‍රබුද්ධගේ උපදනා තැන යහපත්මය. පාපී නොවේයයි මෙම අර්ථය දක්වන ලදී. ඔහු විසින් උත්පත්තියකට සම්ප්‍රාප්ත නොවන ලදී. එය විමර්ශන අනුසන්ධි වශයෙන් ප්‍රකාශ කරනු කැමැති ධර්මරාජයාණන් වහන්සේ මෙපමණක්ම වදාළ සේක. මා විසින් මෙතෙක් දේශනා කළ කල්හි, මෙම පිරිසෙහිම පූර්වාපර සන්ධි ගැලපීමෙහි දක්ෂ එක් භික්ෂුවක් සුප්‍රබුද්ධගේ කුෂ්ඨ ස්වභාවය දිළිඳුභාවය නිමිති කොට කරුණු විමසන්නේ යයි භාග්‍යවතුන් වහන්සේ දකියි. ඉක්බිති මම ඔහුට එකරුණ එම විමසීම් අනුසන්ධි වශයෙන් ප්‍රකාශකොට දෙසුම නිමවන්නෙමි. එහෙයින් කීහ. **එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු** ආදිය. එහි හෙතු යනු අසාධාරණ කරුණයි. සාධාරණය වනාහි ප්‍රත්‍යය වේ. මේ ඒවායි විශේෂයයි. **යෙන** යනු යම් හේතුවකින්ද ප්‍රත්‍යයකින්ද **භූත පුබබං** යනු පෙර හටගත්, අතීත කාලයෙහි හටගත්, එය දැක්වීමට සුපබුද්ධො යනාදිය යූ.සේයි. කෙදින වූයේද යත්, අතීතයේ තථාගතයන් වහන්සේ නූපන් කල්හි බරණැස ආසන්නයෙහි එක් ගමක කුලදුවක් කෙතක් රකියි.

ඕ එක් පසේබුදුවරයෙක් දැක පහන් සිතැත්තී එතුමන් වහන්සේට විළඳ පන්සියයක් සමග එක් නෙලුම්මලක් දී පන්සියයක් පුතුන් පැතුවාය. එකෙණෙහිම පන්සියයක් මුව වැද්දෝ පසේබුදුරජාණන් වහන්සේට මිහිරි මස් දන් දී, ඇයගේ පුතුන් වන්නෙමු. නුඹ විසින් පැමිණි විශේෂතා ලබන්නෙමුයි ප්‍රාර්ථනා කළහ. ඕ යම්තාක් ආයුෂද ඒතාක් සිට දෙව්ලොව උපන්නී ඉන් චුත වූවා එක් ස්වාභාවික විලක පියුම්ගැබක උපන්නීය. එක් තවුසෙක් ඇය දැක පෝෂණය කළේය. ඇය හැසිරෙන කල්හි පියවර ඔසවන ඔසවන කල්හි නෙලුම් මල් නැගී සිටිත්. (මතු වෙත්) එක් වනයෙහි සරන්නෙකු මෙය දැක බරණැස් රජුට සැළ කළේය. රජු ඇය ගෙන්වා අගමෙහෙසිය කළේය. ඇයගේ කුසෙහි ගැබක් පිහිටියේය. මහ පදුම කුමරු ඇයගේ කුස්හි විසී. සෙස්සෝ ගැබ්මල ආශ්‍රිතව උපන්හ. වියපත් ඔව්හු උයනෙහි පියුම්විලෙහි ක්‍රීඩා කරන්නාහු, එක් එක් නෙලුම් මලෙහි හිඳ මුහුකුරා ගිය නුවණ ඇත්තාහු සංස්කාරයන් හි ක්ෂය - ව්‍යය පිහිටුවා ප්‍රත්‍යෙක බෝධියට පැමිණුනහ.

ඔවුන්ගේ ප්‍රකාශ කරන ගාථාව මෙසේ වූයේය.

බඹර සමූහයා විසින් ගැවැසී ගත් මනාව පිපුණු නෙලුම් මල් හා කොළවලින් ගැවැසී ගත් විල ක්ෂය-ව්‍යය වශයෙන් අනිත්‍යතාව දැන කඟවේනෙකු මෙන් තනිව හැසිරෙන්නේය.

මෙසේ ප්‍රත්‍යෙක බෝධිය අවබෝධ කළ කල්හි එම පන්සියයක් පසේබුදුවරුන් අතර, ඇතුලත් වූ තගරසිඛී නම් පසේබුදුරද, ගන්ධමාදන පර්වතයෙහි නන්දමූලක ගුහායෙහි සතියක් නිරෝධ සමවතට සමවැද සත්දිනක් ඇවෑමෙන් නිරෝධයෙන් නැගී සිටියේ අහසින් අවුත් ඉසිගිලි පර්වතයෙහි බැස පෙරවරු හැඳ පොරවා පාසිවුරු ගෙන රජගහ නුවර පිඬු පිණිස පිවිසියේය. එම කාලයෙහිත් රජගහ නුවර එක් සිටු පුත්‍රයෙක් මහත් පිරිවරින් උයන් ක්‍රීඩා සඳහා නුවරින් නික්මෙනුයේ, තගරසිඛී පසේබුදුන් දැක මෙම හිස් මුඩුකළ කසාවත් හඳින්නා කවරෙක්ද, කුෂ්ඨයෙක් වන්නේ යයි සිතමි. එසේම කුෂ්ඨයා සිවුරකින් සිරුර පොරොවා යේයැයි කාරා දමා නිගරුකොට ගියේය. ඒ සඳහා යූ.සේයි. **සුපබුදධාකුටඨී ඉමසමිං යෙව රාජගහෙ** -පෙ- **පකකාමියි.** එහි **කධායං** යනු මේ කවරෙක්ද, පරිභව කිරීම් වශයෙන් කියයි. පෙලෙහි කොඛායංයි යෙදේ. **කුටඨී** යනු

කුෂ්ඨයක් නැත්තෙක් වූ ම එම පසේබුදුන්ට සිටුතුමා කුෂ්ඨ රෝග අක්‍රෝශ වස්තුව පමුණුවමින් කියයි. **කුටීී චිවරෙන** යනු කුෂ්ඨීන්ගේ සිවුරෙන්, බොහෝසෙයින් කුෂ්ඨයාට ඇටමැසි, මදුරු-සර්ප දෂ්ට වැළැක්ම සඳහාද, පිටතට පෙනෙන රෝග වැසීම සඳහාද කවරාකාර වූ හෝ දිරූ රෙදිකඩක් ගෙන පොරවයි. මොහුද මෙසේ යයි දක්වයි. පංශුකූල සිවුරු දරණ හෙයින් වැහැරුණු නොයෙක් වර්ණභාවයෙන් කුෂ්ඨ ශරීරයක් හා සමයයි පිළිකුල් කරනුයේ 'කුෂ්ඨ සිවුරෙන්' යයි කීය. **නිටයුහිත්වා** යනු කෙල හෙළා, **අප සවයං කරිත්වා** යනු නුවණැත්තෝ එවන් පසේබුදුවරයෙක් දැක වැඳ ප්‍රදක්ෂිණා කරති. මොහු වනාහි මෝඩයෙකු බැවින් ඔහුගේ පරිභවය නිගරු ලෙසින් කොට තමාගේ නිගරු පක්ෂයෙහි කොට, අපබාමතොයිද පාඨයි. **තසස කම්මසස** යනු තගරසිබී පසේබුදුන් කෙරෙහි මෙම කුෂ්ඨයා කවරෙක්දැයි පිළිකුල් කොට කෙළ හලා නිගරු කිරීම් වශයෙන් පැවැති පාප කර්මයට **නිරයෙ පචචිත්ථ** යනු නිරා ගින්නෙන් දැවිණි. නිරාගින්නෙන් පැසී - පචචිත්ථා නිරයගිනායිද කියවති. **තසෙසව කම්මසස විපාකාවසෙසෙන** යනු යම් කර්මයකින් හෙතෙම නිරයෙහි ප්‍රතිසන්ධි ගති එම කර්මය මිනිස්ලෝවහි විපාක නොදේ. ඔහුගේ යම් ආකාර වූ නානා ක්ෂණික චේතනාවන් වේද එදින පසේබුදුන් කෙරෙහි නොමනා පිළිපැදීම් වශයෙන් පැවැති අපරාපරිය වේදනීය වූයේ, එම අපරාපරිය වේදනීය පුණ්‍යකර්මයෙන් මිනිසුන් අතර ත්‍රිහේතුක ප්‍රතිසන්ධියෙන් දෙන ලද ප්‍රවෘත්තියෙහිදී, කුෂ්ඨභාවයටද දිළිඳු බවටද උතුම් කාරුණිකත්වයටද පැමිණවිය. ඒ සඳහා කර්ම සමානතා වශයෙන් එම කර්මයෙහිම ශේෂ විපාක වශයෙන් යැයි යූ.සේයි. අන් වශයෙහිද ලෝකයෙහි එම ව්‍යවහාරය දක්නා ලදී. මෙතෙකින් **කොනු බො භනෙත** හෙතු යනු එම භික්ෂුව විසින් විචාරන ලද ප්‍රශ්නය විසඳ දැන් ඔහුට, **කා ගතිකො අභිසමපරායොයි** පෙර භික්ෂූන් විසින් විචාරන ලද ප්‍රශ්න විසඳන්ට **සො තථාගතපපවෙදිතං ධමම විනයං** යනාදිය යූ.සේයි. එහි **තථාගතපපවෙදිතං** යනු තථාගත භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද කියන ලද ප්‍රකාශ කරන ලදනුයි තථාගතපප වෙදිතංයි. **ආගමම** යනු ලබා, නිසා, දැන. තථාගතපපවෙදිතෙ ධම්මවිනයෙයිද පාඨයි. **සඳධං සමාදියි** යනු භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයහ. භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය මනාකොට දේශනා කරන ලදී. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා මනාව පිළිපන්නේ යයි රත්නත්‍රය හා ආශ්‍රිත පූර්වභාග ශ්‍රද්ධාවද, ලෝකෝත්තර ශ්‍රද්ධාවදැයි දෙයාකාර වූද ශ්‍රද්ධාව මනාව ගනියි. යම්සේ නැවත නොගත යුතු වේද, මෙසේ භවයෙහි

ක්‍ෂයය තෙක් ගත්තේය. තම සිත් සතන්හි ඉපදවී යයි අර්ථයි. **සීලං සමාධි** යි යන ආදීන්හිද එම ක්‍රමයමැයි. **සීලං** යනු පූර්වභාග සීලය සමග මාර්ග සීලයද ඵල සීලයද, **සුතං** යනු පර්‍යාප්ති බහුශ්‍රැතත්වය, ප්‍රතිවේධ බහුශ්‍රැතත්වය දැයි දෙයාකාර වූද ශ්‍රැතය. පර්‍යාප්ති ධර්මයද ධර්මශ්‍රවණ කල්හි සත්‍යය ප්‍රතිවේධය සඳහා ශ්‍රාවකයින් විසින්, ලද ආකාර අනුව අසන ලද පුරුදු කරන ලද, මනසින් විමසා බලන ලද, දෘෂ්ටියෙන් මනාව අවබෝධ කරන ලද්දාහු වෙති. **චාගං** යනු ප්‍රථම මාර්ගයෙන් නැසිය යුතු ක්ලේෂාභි සංස්කාරයන්ගේ අත්හැරීම් සංඛ්‍යාත ත්‍යාගය. යමක් කරණකොටා ආර්ය ශ්‍රාවකයෝ දිය යුතු දෑහි පිරිසිදු අත් ඇත්තේ අත්හැරීමෙහි ඇලුනාහු මුදාහළ ත්‍යාග වෙත්ද? **පඤ්ඤං** යනු විදර්ශනා ප්‍රඥාවෙන් යුත් මාර්ග ප්‍රඥාවද ඵල ප්‍රඥාවද වේ. **කායස්‍ස භෙදා තණ්හාදීන් විසින් තමාගේ යයි ගන්නා ලද ස්කන්ධ අත්හැරීමෙන්, පරම්මරණා** යනු ඉන් අනතුරුව හටගත් ග්‍රහණයයි. නොහොත් කායසඝභෙදා යනු **ජීවිතේන්ද්‍රියයාගේ සිඳීමෙන්**, පරම්මරණා යනු චුතියෙන් මත්තෙහි, **සුගතිං සගගං ලොකං** යනු පදත්‍රයයෙන්ම දිව්‍යලෝකයම කියයි. එය වනාහි **සම්පත්තීන්ගෙන්** හොබනා හෙයින් සුන්දර උත්පත්ති ස්ථානනුයි සුගතියි. රූපාදී විශේෂයන්ගෙන් මනාව අග්‍රනුයි **සගෙහායි**. හැමකල්හි මෙහි සුවයම ලෝකයට අයත් වේ. විනාශවේනුයි ලෝකයයි කියයි. **උපපන්නෙහා** යනු ප්‍රතිග්‍රහණ වශයෙන් එළැඹියේ, **සහව්‍යතං** යනු සමාන ස්වභාවයට, වචනාර්ථය වනාහි සමග තිබේ. පවතියි. වාසය කරයිනුයි හෝ සහබ්‍රහ්මයි. සමග සිටියි. සමග වේ හෝ එහි ස්වභාවය සහව්‍යතාවය **අභිරොචති** යනු **ඉක්මවා**, යටපත්කොට හෝ බබලයි. මනාව බබලයි. **වණ්ණෙන** යනු **රූසපුවෙන්, යසසා** යනු පිරිවරින්, හෙතෙම අශුචි තැවරුණු දිරාගිය මැටි බඳුනක් අත්හැර, නොයෙක් රත්නයන්ගෙන් විසිතුරු වූ ප්‍රභාශ්වර රැස් ජාලාවකින් වෙලූ පිරිසිදු ජම්බුනදියෙහි හටගත් රනින් කරන ලද භාජනයක් ගන්නාක් මෙන් කියන ලද ආකාර ඇති සිරුර මෙහි හැරදමා එක් චිත්ත ක්‍ෂණයකින් කියන ලද ආකාර ඇති උපන් ආත්ම භාවය මහත් පිරිවර සමග ලබයි. **එකමත්තං විදිත්වා** යනු එම පාපයන්ගේ අත් නොහැරීමෙහි ආදීනවද, අත්හැරීමෙහි අනුසස්ද සර්වාකාරයෙන් දැන එම කරුණ පැහැදිලි කිරීමට මෙ උදන් ඇනු සේක. එහි මේ සංක්ෂේපාර්ථයයි. **යම්සේ** ඇස් ඇති පුරුෂයෙක් **පරකකමෙ** කායික වීර්යයෙහි, **විජ්ජමානෙ** ශරීරය ඇතිකල්හි, **විසමානීච** යනු කඳුහෙල් පවත්නා ස්ථාන හා සැඩබවින් යුත් විෂම, ඇත්, අස්, සර්ප, බලු, ගව රූපාදීන්, **පරිවජ්ජයෙ** මෙසේ **ජීවලොකසමිං** මෙම සත්ත්වලෝකයෙහි **පණ්ඩිතො** යනු නැණවත් පුරුෂයා

ඒ ප්‍රාඥතාවයෙන් තමාගේ හිතසුව දන්නේ **පාපානි** යනු ලාමක දුශ්චරිත දුරුකරන්නේය. මෙසේ මෙම සුප්‍රබුද්ධ තෙමේ තගරසිඛී පසේ බුදුරදුන් කෙරෙහි පාපකර්මය දුරු නොකොට මහත් ව්‍යසනයකට පැමිණියේය. මෙසේ පැමිණෙන්නේ යයි අදහසයි. යම්සේ සුප්‍රබුද්ධ කුෂ්ඨයා මාගේ ධර්මදේශනයට පැමිණ, දැන් සංවේගප්‍රාප්තව පව් දුරු කරනුයේ උදාර විශේෂයක් අවබෝධ කළේය. මෙසේ අනෙක් අයද උදාර විශේෂයන්ට පැමිණීමට කැමැති වන්නේ නම් පව් දුරුකරන්නේ යයි (දුරුකළ යුතුයැයි) අදහසයි.

තෙවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

5-4

සිව්වැන්නෙහි කුමාරකා යනු තරුණ පුද්ගලයෝ, යම් කෙනෙක් මනා කියමන්, නොමනා කියමන්හි අර්ථය දනිත්ද? ඔවුහු මෙහි කුමාරක යැයි අදහස් කරන ලදහ. සත්ත්වයෝ උපන්දින පටන් පසළොස් වස් දක්වා කුමාරයෝ බාලයෝ නමින් වහරති. ඉන් මත්තෙහි විසිවස් දක්වා යෞවනයෝය. **මච්ඡකෙ බාධෙනති** යනු මාර්ගය සමීපයෙහි එක් විලක ග්‍රීෂ්ම කාලයෙහි දිය ක්ෂය වූ කල්හි පහත් තන්හි එම දිය ඉස, පිස කන්නෙමුයි කුඩා මසුන් අල්වා ගනිති. එසේම මරති. **තෙනූපසංකම්** යනු මාර්ගයෙන් මඳක් විල ඉක්මවා සිටියේ. එහෙයින් එළැඹියේයැයි කියයි. එම කුමාරවරු තමන් කෙරෙහි විශ්වාසය හටගැන්වීමට එළැඹියේය. **භායථ වො** යන මෙහි වො යනු නිපාත මාත්‍රයකි. **දුක්ඛසස** යනු පංචම්‍යාර්ථයෙහි ෂෂ්ඨියි. දුක කෙරෙන් යයි (දුකින්) අර්ථයි. **අපපියං වො** දුක්ඛං යනු කිමෙක්ද, නුඔලාගේ ශරීරයෙහි උපදනා දුක අප්‍රිය හෝ අමනොඥදැයි විචාරයි. **එතමත්ථං විදිත්වා** යනු මෙම සත්ත්වයෝ තමාගේ දුක් නො ඉසන්නාහුම වී දුකට හේතුවන කරුණුවල පිළිපදනාහු තමාගේ එම දුක කැමැති වන්නාහු නම් වෙතියි යන මෙම කරුණ සර්වාකාරයෙන් දැන. **ඉමං උදානං** යනු මෙම පාප ක්‍රියාවන්හි වැළැක්මටද ආදීනව පැහැදිලි කිරීමටද උදන් ඇනූ සේක. එහි අර්ථය : ඔබලාගේ මේ සියල්ලම අපාගත වීමට හේතුයි. සුගතියක් ලද විටද අල්පායුෂ්කතාවය, මනුෂ්‍ය

දුර්භාග්‍යතාදී භේද ඇති දුක් ඇතිකරයි. අපිය‍ං යනු ඉදින් නුඹලාට අප්‍රිය යමක් ලැබේද ඉන් බියවව්. **ආවිවා** අන්‍යයන්ට ප්‍රකට භාව වශයෙන් නොවැසුණු ලෙස කොට කියන් වචනයෙන් හෝ ප්‍රාණඝාතාදී ප්‍රභේද, **යදිවාරහො** අප්‍රකට භාව වශයෙන් වැසුණු ලෙස කොට මනෝද්වාරයෙහිම අභිධ්‍යාදී ප්‍රභේද වූ ස්වල්පමාත්‍ර වූද **පාපකං** ලාමක කර්මයක්. **මාකත්‍ථ** යනු නොකරව්. තවද වනාහි එම පාපකර්මය දැන් කරව්ද? මත්තෙහි හෝ **කරන්නහුද**? නිරයාදී සිව් අපායන්හිද මනුෂ්‍ය ලෝකයන්හිද එයට හේතු වූ දුක් මෙහි හෝ එහෙන් මෙහෙන් හෝ පැන යන්නා වූ ලුහුබඳින්නේ නැතැයි යන අදහසින් **උපෙච්ච** යනු දැන පලායන්නා වූද නුඹලාට ඉන් **මුත්තිං** මිදීමක් නැත. උත්පත්ති, කාල, ආදී ප්‍රත්‍යයන් එක්වූ කල්හි පැසේම යයි දක්වයි. පලායනෙතයිද කියවති. කියන ලද ආකාරයෙන් යම්කිසි තැනක යෑමෙහි, ආපසු ඒමෙහි වේයයි අර්ථයි. මෙම අර්ථය අහසෙහි නොවේය. මුහුද මැදද නොවේය -පෙ- පාප කර්මයෙන් යන මෙම ගාථාවෙන් දැක්විය යුතුය.

සිව්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

5-5

පස්වැන්නෙහි **තදහු** යනු එම දිනයෙහි, උපොසථෙ යන මෙහි වසත්නුයි උපොසථොයි. සීලයෙන් හෝ ආහාර නොගැනීමෙන් යුක්තව වෙසෙත් යයි අර්ථයි. මෙම උපොසථ ශබ්දය 'අංග අටකින් යුක්ත උපෝසථය වාසය කරමියි ආදී තන්හි - සීලයෙහි ආයේය. උපොසථය හෝ පවාරණය හෝ ආදීන්හි පාමොක් උදෙසීමාදී විනය කර්මයෙහි, ගෝපාලක උපොසථය, නිඝණ්ඨ උපොසථය ආදීන්හි උපවාසයෙහි උපොසථ නාරජු ආදීන්හි ප්‍රඥප්තියෙහි, අද පසලොස්වක පොහොයයි ආදී තන්හි දිනයෙහි, මෙහිද දිනයෙහිම දතයුතුය. එහෙයින් තදහුපොසථෙ යනු එම උපොසථ දිනය වූ, දිනයෙහි යයි අර්ථයි. **නිසිනෙහා** හොති යනු මහ බික්ඝඟ පිරිවරන ලදුයේ අවවාද ප්‍රාතිමෝක්ෂය උදෙසන්ට වැඩහුන්නේ වේ. **භිඳ**, භික්ෂූන්ගේ සිත් බලනුයේ එක් දුසිල් භික්ෂුවක් දැක, ඉදින් මම මෙම පුද්ගලයා මෙහි හුන්නේම පාමොක් උදෙසන්නෙමි නම් මොහුගේ හිස්මුදුන සත්කඩකට පැලෙන්නේ යයි ඔහු කෙරෙහි අනුකම්පාවෙන් නිහඬව වූ සේක. මෙහිද **උදධතං අරුණං** යනු

අරුණෝද්ගමනයට පැමිණ, 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ප්‍රාතිමෝක්ෂය උදෙසන සේක්වා'යි තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගෙන් පාමොක් උදෙසීම යාඥා කළේය. එකල්හි 'මහණෙනි අනුපෝසථයන්හි උපෝසථය නොකටයුතුයැයි ශික්ෂාපද (යාගේ) නොපණවන ලද හෙයින් 'ආනන්දය, පිරිස අපිරිසිදු යයි' තෙවරක් තෙරුන් විසින් පාමොක් උදෙසීමට යාඥා කරන ලද්දේ වී නමුත් නොදෙසීමට හේතු දෙසනුයේ අසවල් පුද්ගලයා අපිරිසිදුයයි නොවදාරා, ආනන්දය පිරිස අපිරිසිදුයැයි වදාළේය. කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ තුන්යම් රැයක් එසේ කල්ගත කෙළෙහිද? එතැන් පටන් අවවාද ප්‍රාතිමෝක්ෂය නොදෙසනු කැමැත්තේ එහි හේතුව ප්‍රකට කිරීමටය. **අඥසා** යනු කෙසේ දුටුයෙහිද? තම චෙතෝ පරියඥානයෙන්, එම පිරිසෙහි භික්ෂූන්ගේ සිත් මනාව දන්නේ එම හිස් පුරුෂයාගේ දුසිල් සිත දුටු සේක. සිත දුටු කල්හි ඒ හා සමග යුත් පුද්ගලයා දුටුයේ නම් වේ. එහෙයින් **අදදසා** බො ආයසමා මහා මොගගල්ලානො **තං පුගගලං දුසසීලං** යි ආදිය යූ.සේයි. අනාගතයෙහි සත්දිනක් පවත්නා අන්‍යයන්ගේ සිත් චෙතොපරිය ඥානලාභියා දැනගනී. **අතීතයෙහිද** මෙසේය. **දුසසීලං** සිල් නොමැති. සිල් විරහිත යයි අර්ථයි. **පාපධමමං** යනු දුසිල් හෙයින්ම පහත් අදහස් ස්වභාවය බැවින් ලාමක ස්වභාවයයි. **අසුචිං** යනු අපිරිසිදු කාය කර්මාදීන්ගෙන් යුක්ත වූ හෙයින් පිරිසිදු නොවේ. **සංකසසර සමාචාරං** යනු කිසියම් නොගැලපෙන දෙයක් දැක මෙය මොහු විසින් කරන ලද්දේ වන්නේ යයි මෙසේ අන්‍යයාගේ නියත සැකයෙන් සැකයෙන් සිහි කළ යුතු හැසිරීම්, නොහොත් කිසියම් කළයුතු දෙයක් සාකච්ඡා කරන කල්හි, භික්ෂුවක් දැක කිමෙක්දෝ හෝ මොව්හු මවිසින් **කළ ක්‍රියාවක්** දැක සාකච්ඡා කෙරෙත් යයි තමා කෙරෙහිම සැකයෙන් සිහි කළයුතු හැසිරීම්, ලජ්ජා විය යුතු හෙයින්ද සඟවා තැබීමට හේතුවන හෙයින්ද, වැසුණු කර්ම එයටනුයි **පටිචඡනන කමමනෙනා** යි. එය පිළිකුල් ශ්‍රමණ වෙස් දරන ලද හෙයින් ශ්‍රමණයෙක් නොවේනුයි **අසසමණං** යි. සිටිටු ගැනීම් ආදියෙහිදී, කෙතෙක් සමනහුදැයි ගණන් **කිරීමෙහිදී**, මමද ශ්‍රමණයෙක් වෙමියි මිථ්‍යා ප්‍රතිඥාවෙන් ශ්‍රමණ ප්‍රතිඥාව, ශ්‍රේෂ්ඨ නුවූ චරිතයෙන් අබ්‍රහ්මචාරියි. අනෙක් සබ්‍රහ්මචාරීහු, මනාව හැඳ, මනාව පොරවා, මනා පාත්‍ර දරමින්, ගම් නියම්ගම්හි පිඬු පිණිස හැසිර ජීවිකාව ගතකරන්නහු දැක, අබ්‍රහ්මචාරී වූයේම, තෙමේද එවැනි ආකාරයෙන්, පිළිපදිනුයේ උපොසථාදීන්හිද, දෘෂ්‍යමාන වනුයේ, මම ද **බ්‍රහ්මචාරී** යැයි ප්‍රතිඥා දෙන්නාක් මෙන් වේයයි බ්‍රහ්මචාරී පටිඤඤංයි. **කුණු** වූ කර්මයෙන්

සීල විපත්තියෙහි ඇතුලට මනාව පිවිසි හෙයින් **අනෙකානුතීං** යි. ඔට් ද්වාරයන්ගෙන් රාගාදී කෙලෙස් වර්ෂාවෙන් තෙත්වූ හෙයින් **අවසසුතංයි** හටගත් රාගාදී කසල හෙයින් සිල්වන්තයින් විසින් හැරදැමිය යුතු හෙයින්ද **කසම්බුජාතං** යි. **මඤ්ඤ භික්ඛු සංඝස්ස නිසිනනං** යනු සංඝයාට ඇතුලත් වූවෙකු මෙන් බික් සඟ ඇතුලත හුන්නේ, **දිට්ඨොසි** යනු මොහු වනාහි ප්‍රකෘති තත්ත්වයෙන් නුවූයේ යයි භාග්‍යවතුන් වහන්සේ විසින් දක්නා ලද්දේ විය. යම්හෙයකින් දක්නා ලද්දේ ද, එහෙයින් නැත. **නෙ** තොපට භික්ෂූන් සමග එක්ව විනයකර්මාදී එක්වීමක් නැත. එම සංවාසය තොපට නැද්ද, එහෙයින් ඇවැත්නි නැගිටුවයි මෙසේ මෙහි පද යෙදීම දතයුත්තාහ. **තතියම්පි සො පුගලො තුණ්හී අහොසි** යනු නොයෙක් වර කියාද, තෙරහු තෙමේම කළකිරුනේ ඉවත්ව යන්නේ යයි හෝ දැන් මොවුන්ගේ ප්‍රතිපත්තිය දැනගන්නෙමියි හෝ අදහසින් නිශ්ශබ්ද වූයේය. බාහායං ගහෙත්වා යනු භාග්‍යවතුන් වහන්සේ විසින්ද, මා විසින්ද තත්වූ පරිද්දෙන් දක්නා ලද්දෙ, තෙවනවර දක්වා නැගිටුවයි කියන ලද්දේ නොනැගිටියි. දැන් මොහුගේ ඇද දමන කාලයයි සංඝයාට උපොසථන්තරායක් නොවේවායි අතින් ගති. එසේ ගෙන, **බහි ද්වාර කොට්ඨකා නික්ඛාමෙත්වා** යනු ශාලාවේ දොරටුවෙන් පිටතට නික්මවා, බහි යනු නික්මවන ලද ස්ථාන දැක්වීමයි. නොහොත් බහිද්වාර කොට්ඨකා යනු පිටත දොරටුවෙන්ද නික්මවා, ඇතුල් දොරටුවෙන් නොවේ. මෙසේ දෙයාකාරයෙන්ම විහාරයෙන් පිටතට කොට යන අර්ථයි. **සු චි සටකං දත්වා** යනු අගුල් හිද්ද, මත්තෙහි සටිකාවද වසා, මනාව වසායයි අර්ථයි. **යාවබාහාගහණාපි නාමා** යනු මෙයින්, ආනන්දය පිරිස අපිරිසිදු යයි වචනය අසා හෝ ඔහු විසින් ඉවත්ව යා යුතු වන්නේය. මෙසේ ඉවත්ව නොගොස්, අතින් අල්වාගන්නා තෙක් එම හිස් පුරුෂයා බලාපොරොත්තු වන්නේය. මෙය ආශ්චර්යයෙකැයි පෙන්වයි. මෙයද ගර්හා කිරීමේ ආශ්චර්යයැයි දතයුතුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙසේ සිතිය. දැන් භික්ෂු සංඝයා අතර අර්බුදයක් හට ගත්තේය. අපිරිසිදු පුද්ගලයෝ උපොසථයට පැමිණෙති. තථාගතවරු අපිරිසිදු පිරිස සමග ප්‍රාතිමෝක්ෂය නො උදිසත්. නො උදිසන්නේ බික්සඟනගේ උපොසථය සිදී යන්නේය. මම මෙතැන් පටන් භික්ෂූන්ටම ප්‍රාතිමෝක්ෂය දෙසීම අනුදන්නෙමි නම් ඉතා මැනවැයි සිතා භික්ෂූන්ටම පාමොක් දෙසීම අනුදැන වදාළ සේක. එහෙයින් අථ බො භගවා -පෙ- **පාතිමොක්ඛං උද්දිසෙය්‍යාථ** යයි වදාළ සේක. එහි **නදානාහං** යනු දැන් මම **උපොසථං න කරිස්සාමි පාතිමොක්ඛං න උද්දිසිස්සාමියි** වෙන වෙනම න කාරයෙන් සම්බන්ධ කළ යුතුය. ආණා

ප්‍රාතිමෝක්ෂය - ඕවාද ප්‍රාතිමෝක්ෂයැයි ප්‍රාතිමෝක්ෂය දෙවැදෑරුම්ය. ඒවා අතර, 'සුණාතු මෙ භන්තෙ' ආදිකොට ඇත්තේ ආණා ප්‍රාතිමෝක්ෂයයි. එය ශ්‍රාවකයෝම උදෙසති. බුදුවරු නොවේ. මෙය අඩමසක් පාසා උදෙසනු ලැබේ. 'බහූහී පරමං -පෙ- සබ්බ පාපස්ස අකරණං -පෙ- අනුපවාදෝ අනුපඝාතෝ -පෙ- එතං බුද්ධාන සාසනං යන මෙම ගාථාත්‍රයය ඔවාද (අවවාද) ප්‍රාතිමෝක්ෂය නමැ. එය බුදුවරුම උදෙසත්. ශ්‍රාවකයෝ නොවේ. මෙම ප්‍රාතිමෝක්ෂ උදෙසීමම දීර්ඝායුෂ්ක බුදුවරුන්ගේ ජීවමාන කල්හි ෂට් වර්ෂයන්ගේ ඇවෑමෙන් උදෙසත්. අල්පායුෂ්ක බුදුවරුන්ගේ වනාහි ප්‍රථම බෝධියෙහිදීමය. අනෙක් අය ඉන් මත්තෙහිය.

එයද වනාහි භික්ෂූන්ම උදෙසති. බුදුවරු නොවේ. එහෙයින් අපගේ භාග්‍යවතුන් වහන්සේද විසිවසක් පමණ අවවාද ප්‍රාතිමෝක්ෂය උදෙසා මෙම අන්තරාව දැක ඉන් මත්තෙහි නොඋදෙසීය. අටයානං යනු නොකරුණෙකි. අනවකාසෝ යනු එයටම පර්යාය වචනයකි. කරුණ යම්සේ සිටීද, (තිබේද?) එහි ඵලය එයට අයත් පැවතුම් හෙයින් යාන යැයි කියයි. මෙසේ අනවකාසයැයි කියයි. යං යනු ක්‍රියා ස්පර්ශයයි. එය යට කියන ලද අයුරින් යෙදිය යුතුය. **'අටයීමෙ භික්ඛවෙ මහා සමුද්දෙ'** යන්නෙහි අනුසන්ධි කවරේද? යම් ආකාර වූ මෙම අපිරිසිදු පිරිසෙහි ප්‍රාතිමෝක්ෂයෙහි නොදෙසීම යූ.සේයිද? එය මෙම ධර්ම විනයෙහි ආශ්චර්ය, අද්භූත ස්වභාවයකැයි එය අනෙක් සප්ත ආශ්චර්ය, අද්භූත ධර්මයන් සමග බෙදා දක්වනු කැමැත්තේ ප්‍රථමයෙන් එහි උපමා ස්වභාවයෙන් මහා සමුද්‍රයෙහි අෂ්ඨ ආශ්චර්ය, අද්භූත ධර්මයන් දක්වන්නා වූ ශාස්තෘන් වහන්සේ 'මහණෙනි, මෙම අට මහා සමුද්‍රයෙහි යැයි යනාදිය වදාළහ. **අසුරා** යනු ප්‍රකෘති දෙවිවරු මෙන් දක්ෂ නොවෙත්. නොදිලිසෙත්. නොබබලත්නුයි අසුරයි.

දෙවිවරු ඔවුන්ට ප්‍රතිපක්ෂ වූයේනුයි අසුරයි. සුරනම් වේපචිත්ති පහාරාදීහුය. ඔවුන්ගේ භවනය මහමෙර යට භාගයෙහි වේ. ඔව්හු එහි පිවිසෙන්නාහු, නික්මෙන්නාහු, මහමෙර පාමුල මණ්ඩප ආදිය මවා, ක්‍රීඩා කරන්නාහුම සිත් අලවත්. එහි ඔවුන්ගේ ඇල්මෙහි මෙම ගුණ දැක වදාළ සේක. **යෙ දිසවා දිසවා අසුරා මහා සමුද්දෙ අභිරමන්ති** යනු එහි අභිරමන්ති යනු කම්සැප විඳිත්. ඔවුනොවුන්ට අනුග්‍රහ කෙරෙමින් වෙසෙත් යයි අර්ථයි. **අනුපුබ්බ නිනෙනා** යන ආදී සියල්ල අනුපිළිවෙළින් ගැඹුරුභාවයටම පර්යාය වචනයන්ය. **නායිතකෙනෙව පපාතො** යනු

සිඳුන ඉවුරක් නොවේ. මහා සාගරයක් මෙන් මුලසිට ක්‍රමයෙන් ප්‍රපාතය. එය තෙර දෙස පටන් එකඟුල්-දෑඟුල්-වියත්-රියන්-සත්රියන් 140 රියන් දුර, අඩගව්, ගව්, යොදුන් ආදී වශයෙන් ගැඹුරුවී යනුයේ මහමෙර පාමුල අසූහතර දහසක් යොදුන් ගැඹුරු වී සිටියේ යයි දක්වයි. **ධීත ධම්මෝ** යනු ස්ථිති ස්වභාව ඇත්තේ සිටීම් ස්වභාව. **න මතෙන කුණපෙන සංවසති** යනු යම්කිසි ඇත් අශ්වාදීන්ගේ මෘත ශරීර සමග නොවසයි. **තීරං පාපෙති** යනු තෙරට ඉවත්කරයි. **ථලං උසසාදෙති** යනු අතින් ගන්නාක් මෙන් රළ පහරින් ගොඩබිමෙහි දමයි. ගංගා යමුනා යනු අනවතප්ත විලෙහි දකුණු මුවින් නික්මුණු නදිය ජලධාරා පහක් බවට පත්ව පැවැති තන්හි ගංගා යයි ආදී වශයෙන් පස් අයුරක් විය. මේ එම නදීන්ගේ මුලපටන් උත්පත්ති කථාවයි. මෙම දඹදිව යොදුන් දසදහසක් ප්‍රමාණ ඇත්තේය. එහි භාරදහසක් ප්‍රමාණ ප්‍රදේශය ජලයෙන් වසාගෙන පැතිර සිටියේ සමුද්‍රය යන සංඛ්‍යාවට ගියේය. තුන්දහසක් යොදුන් ප්‍රමාණයෙහි මිනිස්සු වාසය කරති. තුන් දහසක් යොදුන් ප්‍රමාණ සීමාවෙහි හිමවත පිහිටියේය. උසින් යොදුන් පන්සියයක් ප්‍රමාණ අසූහාර දහසක් පර්වතවලින් යුක්තය. හාත්පස ගලාබසින පන්සියයක් නදීන්ගෙන් විසිතුරු වූ, යම්තැනෙක්හි දිගින්ද පළලින්ද ගැඹුරින්ද පණස්යොදුන් ප්‍රමාණ වූ, යොදුන් එකසිය පණහක් වටවූ අනවතප්ත විල, කණ්ණමුණ්ඩ විල රථකාර විල - ඡද්දන්ත විල, කුනාල විල, මන්දාකිනී විල සිංහ ප්‍රපාත විලයැයි සප්ත මහා විල් පිහිටියහ. ඒවා අතර අනවතප්ත විල, සුදර්ශන, චිත්‍රකූට, කාලකූට ගන්ධමාදන, කෛලාස කූටයයි යන මෙම පර්වත කූටයන්ගෙන් වටකරන ලද්දේය. එහි සුදර්ශන කූටය ස්වර්ණමය වූයේ, යොදුන් තුන්සියයක් උස්වූයේ ඇතුළත කපුටුමුව සටහන් ඇත්තේ එම විලම වසා සිටියේය. චිත්‍රකූටය සත්රුවන්මය කාලකූටය අජනමය - ගන්ධමාදන කූට මැසිරිගල්මය, ඇතුලත මුං ඇට වර්ණය. මුල් සුවඳ, හර සුවඳ, ඵල සුවඳ, පොතු සුවඳ, පතුරු සුවඳ රස සුවඳ, මල්සුවඳ, ගෙඩිසුවඳ, පත්‍ර සුවඳ, පතුරු සුවඳ, රස සුවඳ, මල් සුවඳ, ගෙඩි සුවඳ, පත්‍ර සුවඳ, සුවඳ සුවඳද යන මෙම දසවැදෑරුම් සුවඳ වර්ගයන්ගෙන් උත්සන්න වූයේ නොයෙක් ආකාර ඖෂධයන්ගෙන් වැසුන කළුවර. පස පොහෝදින දැල්වන ලද්දාක් මෙන් අඟුරු දැල්වෙමින් සිටී. කෛලාසකූට පර්වතය රිදී මුවාය. ඒ සියල්ලම සුදර්ශන කූටය හා සමාන උස හා සටහන් ඇතියේ එම විල වසා සිටියහ. එහි දේවානුභාවයෙන්ද· නාගානුභාවයෙන්ද වැසී වසී. ගංගා ගලති. එම සියලුම දිය අනවතප්ත විලටම පිවිසේ. සඳ හිරු

දකුණින් හෝ උතුරින් හෝ යන්නාහු පර්වත අතරින් පහි ආලෝක කරති. සෘජුව යාමක් නොකරති. එහෙයින් මෙයට අනෝතත්ත යන ව්‍යවහාරය හටගති. එහි රත්නමය මනොඥ හිනිමං වැනි ගල්තලාවන්ද, මස් කැසුබුවන්, නිර්මල පුවරු සමාන නිර්මල දිය, එය පරිභෝග කරන සත්ත්වයින්ගේ සත්ත්වයින්ගේ කර්මයෙන් හටගත්තා වූම ස්නාන තොටුපලද වෙති. යම්තැනක බුදු පසේබුදුවරු, සෘද්ධිමත් ශ්‍රාවකවරු-සෘෂිහු ස්නානාදීන් කෙරෙත්ද? දිව්‍ය යක්‍ෂාදීහුද ජලක්‍රීඩා කෙරෙත්ද එහි සිව් පාර්ශ්වයන්හි සිහ මුව, ඇස් මුව, අස් මුව, වෘෂභ මුව යන සිව් දිය නික්මයන මුව වෙත්ද? යම් ස්ථානයන්ගෙන් සිව් නදීහු ගලත්ද? සිහ මුවෙන් නික්මෙන නදීතෙර බොහෝ කොට කේශර සිංහයෝ සිටිති. එසේ ඇත්මුවාදීන්හි ඇත්, අස්, වෘෂභාදීහු වෙති. පෙරදිගින් නික්මුන නදිය අනවතප්ත විල තෙවරක් ප්‍රදක්‍ෂිණා කොට අනෙක් තෙනදීන්ට නොබැස පැසුළු හිමවතින්ම නොමිනිස් පෙදෙසට ගොස් මහා සමුද්‍රයට පිවිසේ. පැසුළු දිගින්ද, උතුරු දිගින්ද නික්මුණු නදීහුද එසේම ප්‍රදක්‍ෂිණා කොට පැසුළු හිමවතින් හා උතුරු හිමවතින්ම නොමිනිස් පෙදෙසට ගොස් මහා සමුද්‍රයට පිවිසෙත්. දකුණු දෙසින් නික්මුණු නදිය වනාහි එය තෙවරක් ප්‍රදක්‍ෂිණා කොට දකුණින් සෘජුව ගල් මතුපිටින්ම සැටයොදුනක් ගොස් පර්වතයට පහරා නැගිට හාත්පසින් තෙගවු පමණ වූ දිය දහරාවක්ව අහසින් සැටයොදුනක් ගොස් තියග්ගල නම් ගලෙහි වැටුනේ ගල දිහ දහරා වේගයෙන් බිඳුනේ එහි පණස්යොදුන් ප්‍රමාණ තියගල නම් මහ පොකුණක් හට ගති. පොකුණෙහි ඉවුර බිඳ ගලට පිවිස සැටයොදුනක් ගොස් වින්ධ්‍යා නම් තිරිසන් පර්වතයට පහරා අත්තලැ පසැඟිලි සමාන ධාරා පහක්ව පවතියි. එය තෙවරක් අනවතප්ත විල ප්‍රදක්‍ෂිණාකොට ගියතන්හි, ආවර්ත ගංගාවයැයි කියයි. සෘජුව ගල මත්තෙන් සැටයොදුනක් ගිය තැන කෘෂ්ණ ගඟයි. අහසින් සැටයොදුනක් ගිය තැන අනස ගඟයි. තියගල පහන්හි පණස් යොදුන් අවකාශයෙහි සිටියේ තියගල පොකුණෙහි ඉවුර බිඳ ගලට පිවිස සැටයොදුනක් ගියතැන සණ ගඟයි. උමගින් සැටයොදුනක් ගිය තැන උමං ගඟයි කියයි. වින්ධ්‍යා නම් තිරිසන් පර්වතය පහරා ධාරා පඤ්චකයක්ව පැවැති තන්හි, ගංගා, යමුනා, අචිරවති, සරභූ, මහී යැයි පස් ආකාරයකට ශාඛා ගියහ. මෙසේ එම පංචමහා නදීහු හිමවතින් පවතිත් යයි දතයුත්තාහ. එහි **නදී** යනාදිය ගොත්‍රයයි. ගංගා යමුනා ආදිය නාමයයි. **සවනතියො** යනු යම්කිසි ගලන්නා වූ හෝ යන්නා වූ මහා නදීහු හෝ කුඩා නදීහු **අපෙනති** යනු ඇලෙත්. පැමිණෙත්.

ධාරායා දිය දහරාවයි. **පූරනතං** පිරුණු බව, මහ මුහුදෙහි මේ ධර්මතාවයයි. මෙකලැ මඳ වැසි හටගති දැල් කෙමන් ආදිය ගෙන මස් කැසුබුවන් අල්වා ගන්නෙමුයි හෝ මෙකලැ වැසි ඉතා මහති. සිටින්ට සමතලා ගලක් හෝ නොලබන්නෙමුයි හෝ කියන්ට නොහැකිය. ප්‍රථම කල්පික කාලයෙහි පටන් යම් ආකාර වූ වැස්සක් වැස මහමෙර සීමාව ගටා දිය පැවතිනිද, ඉන් එකඟුල් මාත්‍ර වූද දිය යට නොබසී. උඩට නොයයි. **එක රසො** යනු මිශ්‍ර නුවූ රසය, **මුත්තා** යනු කුඩා මහත්, රවුම් දිග ආදී නොයෙක් ආකාර මුතු. **මණී** යනු රතු නිල් ආදී නොයෙක් ආකාර මැණික්, **වෙළුරියො** යනු වෛදූර්ය මැණික්, උණමල් හා මහරි මල්වල වර්ණ හා සටහන් වශයෙන් නොයෙක් ආකාර වේ. **සංඛො** යනු දක්ෂිණාවර්ත, කුවජික, ධමන, සංඛ ආදී නොයෙක් ආකාර භේද සහිතයි. **සිලා** යනු ශ්වේත, කලු-මුංවර්ණ ආදී භේද වශයෙන් නොයෙක් ආකාරය. **පවාළං** යනු කුඩා මහත් මද රත් සන රත් ආදී භේද වශයෙන් නොයෙක් ආකාරය. **ලොහිතංබ** යනු පද්මරාගාදි භේදයෙන් නොයෙක් ආකාරය. **මසාරගල්ලං** යනු මැසිරිගල්, මිශ්‍ර වර්ණයෙන් යුත් ස්ඵටික මාණික්‍යය, මහතං භූතානං යනු විශාල සත්ත්වයින්ට, තිමි තිමිංගලාදිකා යනු මත්ස්‍ය ජාතීහු තෙවර්ගයකි. තිමි මත්ස්‍යයා ගිලීමට සමත්වූයේ, තිමිංගලායි. තිමි හා තිමිංගල ගිලීමට සමත් වූයේ තිමිර පිංගලයැයි කියති. නාගා යනු දියරැළි මතුපිට වසන්නා වූද විමානයන්හි සිටින්නා වූද නාගයෝ, **එවමෙවඛො** යනු කිසිසේත් ශාස්තෘන් වහන්සේ මෙම ධර්මවිනයයෙහි, සොළොස් ආකාරයකින්ද, දෙතිස් ආකාරයකින්ද එයට අධිකවද, ආශ්චර්ය, අද්භූත ධර්මයන් බෙදා දක්වන්ට හැකි වේ. එකල උපමා භාවයෙන් ගත් අර්ථයන්ට අනුරූප වශයෙන් උපමා කරනු ලබන එම කරුණු අටම පමණක් බෙදා දක්වනුයේ **එවමෙව** බො **භික්ඛවෙ ඉමසමිං ධම්මවිනයෙ අච්ඡරියඛභූත ධම්මා** යන ආදිය වදාළහ. එහි අනුපුබ්බ **සික්ඛාය** යනු ත්‍රිවිධ ශික්ෂා ගන්නා ලදී. **අනුපුබ්බ සික්ඛාය** යනු ත්‍රිවිධ ශික්ෂා ගන්නා ලදී. **අනුපුබ්බකිරියාය** යනු තෙළෙස් ධුතංග ධර්ම, **අනුපුබ්බ පටිපදාය** යනු සප්ත අනුපස්සනා, අටළොස් මහා විදර්ශනා අටතිස් අරමුණු බෙදීම්, සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ද ගන්නා ලදී. **න ආයතකෙනෙව අඤ්ඤා පටිවෙධො** යනු මැඩියාගේ උඩට පැන යන ගමන මෙන් මුලදීම සිල් පිරීම් ආදිය නොකොට අර්හත්ව ප්‍රතිවේධයක් නම් නැත. පිළිවෙළින් **සීල** සමාධි ප්‍රඥාවන් සම්පූර්ණකොට, අර්හත්වෝත්පත්තිය වේයයි අර්ථයි. **මම සාවකා** යනු සෝවාන් ආර්ය පුද්ගලයන් සඳහා කියයි. **න සංවසති** යනු උපොසථ කර්මාදී වශයෙන් එක්ව විසීම නොකරයි. **උකඛපති** යනු

ඉවත් කරයි. ආරකාවා යනු දුරදීම, **න තෙන නිබ්බාන ධාතුයා ඌනත්තංවා පූරත්තංවා** යනු බුදුවරු නූපදනා මහා කල්ප අසංඛ්‍යයන්හිද, එක් සත්ත්වයෙකු හෝ පිරිනිවුමට නොහැකි වේ. එකල්හිද නිර්වාණ ධාතුව හිස්යැයි කියන්ට නොහැකිය. බුද්ධෝත්පාද කාලයෙහි එක් එක් හමුවීම්හිදී අසංඛ්‍ය ගණන් සත්ත්වයෝ නිර්වාණය ලබාගනිති. එකල්හි නිර්වාණ ධාතුව පරිපූර්ණයැයි කියන්ට නොහැක. **විමුත්තිරසෝ** යනු කෙලෙසුන්ගෙන් මිදීම් රසය සියලුම සසුන් සම්පත් යම්තාක් වේද, එම සියල්ලම උපාදාන රහිතව කෙලෙසුන්ගෙන් සිතෙහි විමුක්තියෙන් වේ. රතනානි යනු ඇල්ම හටගන්වන අර්ථයෙන් රත්න නමැ. සතිපට්ඨානාදීහු වඩනු ලබනුයේ පූර්වභාගයෙහිද, අනල්ප වූ ප්‍රීති ප්‍රමෝද්‍ය හටගනිත්. පසුකල්හි කියනුම කවරේද? යූ.සේයි.

යතො යතො සම්මසති - ඛන්ධානං උදයබ්බයං
ලහති පීතිපාමොජ්ජං අමතං තං විජානතං

යම් යම් තැනක පටන්, ස්කන්ධයන්ගේ හටගැනීම හා විනාශය මෙනෙහි කරයිද, ඉන් ප්‍රීති ප්‍රමෝද්‍යය ලබයි. එය අමෘතය දනී.

ලෞකික රත්න හේතුකොට හටගන්නා ප්‍රීති ප්‍රමෝද්‍ය වනාහි, ස්කන්ධ සම්මශ්‍රණයෙන් හටගන්නා ප්‍රීති ප්‍රමෝද්‍යයෙන් කල භාගයක්වත් නොවටියයි යන මෙම අර්ථය යට දක්වන ලද්දේමය. තවද,

චිතතී කතං මහඝඤංච - අතුලං දුල්ලභ දස්සනං
අනොම සත්ත පරිභොගං - රතනානති පවුච්චති

ගරු කරන ලද, මහාර්ඝ (ඉතා වටිනා) සමකල හැකි දැයක් නොමැති, දැක්මට දුලබ, උසස් අය පරිභෝග කරන දෑ රත්නයැයි කියයි.

යම්හෙයකින් ගරුකිරීම් ආදී භාවයෙන් රත්න නම් වේද? සතිපට්ඨානාදීන්ටම සත්‍ය වශයෙන් රත්න භාවය යෙදේ. එය බෝධිපාක්ෂික ධර්මයන්ගේ ආනුභාවයයි. යම් ආකාර වූ ශ්‍රාවකයෝ ශ්‍රාවක පාරමී ඥානයට, ප්‍රත්‍යෙක බුදුවරු ප්‍රත්‍යෙක බුද්ධත්වයට, සම්‍යක් සම්බුදුවරු සම්‍යක් සම්බෝධිය අවබෝධ කරත්ද, ආසන්න කරුණු හෙයින්ද, පරම්පරා කරුණු හෙයින්ද, දානාදීහු උපනිශ්‍රය යැයි මෙසේ ඇල්ම ඇතිකරවන

අර්ථයෙන්, ගරුකරන ලද ආදී අර්ථයෙන් රත්නභාවය බෝධිපාක්ෂික ධර්මයන්ගේ උසස්භාවයයි. එහෙයින් **තත්‍රිමානි රතනානි සෙය්‍යථීදං චත්තාරෝ සතිපට්ඨානා** ආදිය එහි අරමුණෙහි ඇතුලට වැද වැටහීම් අර්ථයෙන් පට්ඨානයි. සිහියම පිහිටවූයේ සතිපට්ඨානයි. කායාදී වශයෙන් ආරම්මණයාගේ සතරාකාර හෙයින්, **චත්තාරෝ සතිපට්ඨානායි** යූ.සේයි. එසේම කාය, වේදනා, චිත්ත, ධර්මයන්හි සුභ, සුව, නිත්‍ය, ආත්ම සංඥාවන්ගේ ප්‍රහාණයෙන් අසුභ, දුක්, අනිත්‍ය, අනාත්මයන්ගේ වශයෙන් ගැනීමෙන් වනාහි එම කායානුපස්සනා ආදිභාවය බෙදන ලදී. එයින් බලවත් සේ උත්සාහ කරත්. තෙමේ හෝ මනාව උත්සාහ කරයි. ප්‍රශස්ත වූ සුන්දර වූ හෝ උත්සාහ යනුයි. **සම්මප්පධානං** යි. පුද්ගලයාගේ හෝ මනාව කෙලෙස් තැවීම්භාවය කරන හෙයින් සම්මප්පධානංයි. එය වීර්යයට විශේෂ නාමයකි. එයද, නූපන් අකුසල ධර්මයන්ගේ අනුත්පාදය සඳහාද, උපන් අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය සඳහාද, නූපන් කුසල ධර්මයන්ගේ ඉපදවීම සඳහාද, උපන් කුසල ධර්මයන්ගේ වැඩීම වශයෙන්ද සතරාකාරයෙන් කියන ලද සතර සම්‍යක් ප්‍රධන් වීර්යයන්, සමෘද්ධ වේනුයි **ඉද්ධියි** සමෘද්ධ වේ. සම්පාදනය වේයයි අර්ථයි. එයින් සත්ත්වයෝ සමෘද්ධ වේ. සමෘද්ධ වූවාහු වෘද්ධියට පත්වූවාහු, උසස් බවට ගියාහු වෙත්යයි ඉද්ධියි. මෙසේ පළමු අර්ථයෙන් ඍද්ධියම පාද වූයේ ඉද්ධිපාදොයි ඍද්ධි කොට්‍යාශයය යන අර්ථයි. දෙවන අර්ථයෙන් ඍද්ධියගේ පාදය, පිහිට අධිගම උපා යනුයි ඉද්ධිපාදොයි. එහෙයින් මතු මත්තෙහි විශේෂයයි කියනු ලබන ඍද්ධියට ප්‍රාප්ත වෙති. පැමිණෙති. ඒ මෙම ඍද්ධිපාදය ඡන්දාදී සතර අධිපති ධර්මයන්හි වීර්යය ප්‍රධානකොට උපදිනු ලැබෙයයි **චත්තාරෝ ඉද්ධිපාදායි.** එහෙයින් යූ.සේයි. **පඤ්චින්ද්‍රියානි** යනු ශ්‍රද්ධාදී පංච ඉන්‍ද්‍රියයන්, එහි අශ්‍රද්ධාව මැඩපවත්වා සිතේ ස්ථිරත්ව ලක්‍ෂණයෙහි අධිපතිත්වය කෙරේනුයි ශ්‍රද්ධා ඉන්‍ද්‍රියයයි. කුසීතකම මැඩපවත්වා උත්සාහ ලක්‍ෂණයෙහි, ප්‍රමාදය මැඩපවත්වා වැටහීම් ලක්‍ෂණයෙහි, වික්ෂේපය මැඩපවත්වා අවික්ෂේප ලක්‍ෂණයෙහි, නොදැන්ම මැඩපවත්වන දර්ශන ලක්‍ෂණයෙහි ප්‍රධානාර්ථය කෙරේනුයි ප්‍රඥා ඉන්‍ද්‍රියයයි. ඒවාම අශ්‍රද්ධාදීන්ගෙන් අනිභභවනීය හෙයින් කම්පා නොවීම් අර්ථයෙන් ඒ හා සම්ප්‍රයුක්ත ධර්මයන්හි ස්ථිර භාවයෙන් බලයැයි දතයුත්තාහ. **සත්ත බොජ්ඣංගා** යනු බෝධියගේ හෝ බෝධියට හෝ කරුණුනුයි බොජ්ඣංගායි. යම් ආකාර වූ එම ධර්ම සාමාග්‍රිය ලෝකෝත්තර මාර්ගක්‍ෂණයෙහි උපදී. ඉන් මැලිබව, නොසන්සුන්කම ආදීන්ට ආධාර වූ, කම්සුව - ආත්මය වෙහෙසට පත්කිරීම, උච්ඡේද,

ශාස්වත අභිනිවේසාදී නොයෙක් උපද්‍රවයන්ට ප්‍රතිපක්ෂ වූ, සති, ධම්මවිචය, වීරිය, පීති, පස්සද්ධි, සමාධි, උපේක්ඛා සංඛ්‍යාත ධර්ම සාමාග්‍රියයෙන් ආර්ය ශ්‍රාවකයා අවබෝධ කරයි. කෙලෙස් නිද්‍රාවෙන් නැගිටියි. චතුරාර්ය සත්‍යයන් හෝ අවබෝධ කරයි. නිර්වාණයම හෝ සාක්ෂාත් කෙරේනුයි බෝධියයි කියති. එම ධර්ම සාමාග්‍රී සංඛ්‍යාත බෝධියෙහි අංග වූයේනුයි බොජ්ඣංගායි. ධ්‍යානාංග, මාර්ගාදීහු මෙනි. මෙම කියන ලද ආකාර ඇති ධර්ම සාමාග්‍රියයෙන් අවබෝධ කෙරේයයි සලකා ආර්ය ශ්‍රාවක තෙම බෝධියයි කියයි. එම බෝධියගේ අංගනුයි බොජ්ඣංගායි. සෙනංග - රථංග මෙනි. එහෙයින් පෞරාණිකයෝ, අවබෝධ කරන පුද්ගලයාගේ අංගනුයි බොජ්ඣංගයි. බෝධිය සඳහා පවතින්නුය. බොජ්ඣංගායි ආදී ක්‍රමයෙන්ද බොජ්ඣංගයන්ගේ බොජ්ඣංගාර්ථය දතයුතුය. **අරියෝ** අට්ඨංගිකෝ මග්ගෝ යනු ඒ ඒ මාර්ගයන්ගෙන් නැසිය යුතු කෙලෙසුන්ගෙන් දුර හෙයින්ද ආර්යභාවය ඇතිකරන හෙයින්ද, ආර්යඵල ලබාදෙන හෙයින්ද ආර්යයි, සම්‍යග් දෘෂ්ටි අට අංගයන් වන්නේනුයි හෝ අට අංගයන්ම හෝ අට්ඨංගිකයි. කෙලෙස් මරමින් යේ නිර්වාණාර්ථිකයින් විසින් සොයනු ලැබේ. තෙමේ හෝ සොයයිනුයි මග්ගෝයි. මෙසේ එම සතිපට්ඨානාදීන්ගේ අර්ථ විභාගය දතයුතුය. **සොතාපත්තඵලත්ථාය** යනු මාර්ග සංඛ්‍යාත ශ්‍රෝතුසිට පැමිණ සිටියේ ශ්‍රෝතාපත්ති ඵල ස්ථයැයි අර්ථයි. **සොතාපත්තිඵල සච්ඡිකිරියාය** පටිපන්නෝ යනු ශ්‍රෝතාපත්ති ඵලය තමහට ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා පිළිපදිනුයේ ප්‍රථම මාර්ගස්ථයා, හෙතෙම අෂ්ඨමකයැයි කියයි. **සකදාගාමී** යන මෙලොවට එක්වරක් පමණක් ප්‍රතිසන්ධි ග්‍රහණ වශයෙන් පැමිණෙන සුලු, දෙවන ඵලස්ථයා. **අනාගාමී** යනු ප්‍රතිසන්ධි ග්‍රහණ වශයෙන් කාමලෝකයට නොපැමිණෙන සුලු තෙවන ඵලස්ථයා යම් ආකාර වූ සද්ධානුසාරී, ධම්මානුසාරී, එකබීජ යයි සෙස්ස කියන ලද ක්‍රමයමය. **එතමත්ථං විදිත්වා** යනු එම තම සස්තෙහි මළ කුණපයක් හා සමාන දුසිල් පුගුලෙකු සමග එක්ව විසීම් භාව සංඛ්‍යාත අර්ථය දැන. **ඉමං උදානං** යනු මෙම එක්ව විසීමට නුසුදුසු හා එක්ව විසීමට සුදුසු පුද්ගල බෙදා දැක්වීමේ කරුණු මනාව දැක්වීමට උදන් ඇනු සේක. එහි **ඡන්න මති වස්සති** යනු ඇවතට පැමිණ සඟවනුයේ අනෙක් නව ඇවතකට පැමිණේ. ඉන්මතු, ඉන් මතුයයි මෙසේ ඇවැත් වැස්සක්, කෙලෙස් වැස්සක් අභිශයින් වසියි. **විවටංනාති වස්සති** යනු ඇවැතට පැමිණියේ නොසඟවා හැසිරෙනුයේ සබ්‍රම්සරුන්ට ප්‍රකාශ කරනුයේ ධර්මානුකූලව විනයානුකූලව, ප්‍රතිකර්ම කරනුයේ, දෙසනුයේ, නැගිටිනුයේ අන්‍ය ආපත්තීන්ට

නොපැමිණේ. ඔහුට එය ප්‍රකට වූයේ නැවත ඇවැත් කෙලෙස් වර්ෂාවක් නොවසී. එය යම්හෙයකින් එසේ වේද, එහෙයින් **ඡන්නං** වසන ලද ඇවත **විවරෙථ** ප්‍රකාශ කරව්. **එවං තං නාති වසසතං** යනු මෙසේ ඇතිකල්හි එම ඇවතට පැමිණෙන, පැමිණි පුද්ගලයා ආත්මභාවය මනාව විද, කෙලෙස් වැසි වැසීමෙන් නොවසියි. නොතෙමෙයි. මෙසේ කෙලෙසුන්ගෙන් තෙත් නුවූයේ, පිරිසිදු සිල් ඇත්තේ, සමාහිතව විදර්ශනා පිහිටුවා මෙනෙහි කරනුයේ අනුක්‍රමයෙන් නිර්වාණයට පැමිණේයයි අදහසයි.

පස්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

5-6

සවැන්නෙහි **අවන්තීසු** යනු අවන්ති රටෙහි, කුරරඝරෙ යන මෙනම් නගරයෙහි, **පභාතෙ පබ්බතෙ**, ප්‍රභාත නම් (පවත්ත) පර්වතයෙහි, **සොණො උපාසකො කුටිකණ්ණො** යනු නමින් සෝණනම් තිසරණ ගමනයෙන් උපාසක බැව් දැනුම්දීමෙන් උපාසක වූ, කෝටියක් අගනා පළඳනාවක් දැරීමෙන් කෝටිකණ්ණ යැයි කිවයුතු, කුටිකණ්ණ යැයි ප්‍රකට ළදරු කුමරෙකු වූ සෝණයැයි අදහසයි. මෙතෙම ආයුෂ්මත් මහා කච්චාන තෙරුන්ගේ සමීපයෙහි දහම් අසා සස්නෙහි මනා ප්‍රසන්නතාවයට පත්වූයේ තිසරණයෙහිද, සරණ සිල්හිද පිහිටියේ පපාප පර්වතයෙහි සෙවන හා දිය යුත් තැනෙක විහාරයක් කරවා, තෙරුන් එහි වස්වා සිව්පසයෙන් උවටැන් කරයි. එහෙයින් **ආයසමතො මහා කච්චායනස්ස උපට්ඨාකො හොතියි** යූ.සේයි. හෙතෙම කලින් කල තෙරුන්ගේ උවටැනට යයි. තෙරහු ඔහුට දම් දෙසයි. සංවේග බහුලව ධර්මචරියාවන්හි උත්සාහවත්ව නොවෙසේ. හෙතෙම එක් දිනක් ගැල් සමග වෙළඳම සඳහා උදේනි නුවරට යන්නේ අතරමග කැලයෙහි ගැල් නැවැති කලැ රැයෙහි අනෙක් ජනතා පීඩා බියෙන් එක්පසක ඔවුන්ගෙන් ඉවත්ව නිද්‍රොපගත විය. ගැල් සාත්තුව ඉතා අලුයම නැගිට පිටත්ව ගියහ. එකෙකු හෝ සෝණ පිබිදවූයේ නැත. සියල්ලෝම ඔහු සිහි නොකොට ගියහ. හෙතෙම රැය පහන්වූ කල්හි පිබිද නැගිට කිසිවෙකු නොදක්නේ වෙළඳ පිරිස විසින්ම ගියමග

ගෙන වහ වහා යනුයේ එක් නුග ගසක් කරා එළැඹියෝය. එහි එක් මහා විකෘති, විරූපී දර්ශනයක් වූ, ඇවිදින්නා වූ පුරුෂයෙකු තම ඇටවලින් මිදුනු තම මස් තෙමේම කන්නහු දිටිය. දැක නුඹ කවරෙක්දැයි විමසීය. ස්වාමිනි, ප්‍රේතයෙක් වෙමි. කුමක් හෙයින් මෙසේ කෙරෙහිද? තම පූර්වකර්මයෙනි. එම කර්මය කිමෙක්ද? මම පෙර භාරුකච්ඡනුවර වැසි කුට වෙළෙන්දෙක්ව අන් සත්තකය වංචාකොට කෑවෙමි. සමණහු පිඬු පිණිස එළැඹි කල්හි නුඹලාගේ මස් කවියයි අපහාස කළෙමි. එ කම්හි දැන් මෙදුක් අනුභව කරමි. එය අසා සොණ අතිශයින් සංවේගප්‍රාප්ත විය. ඉන් ඔබ්බට යනුයේ මුවින් වැගිරෙන කලු ලේ සහිත ප්‍රේත දරු දෙදෙනෙක් දැක එසේම විචාලේය. ඔව්හුද එසේම තම කර්මය කීහ. ඔවුහු වනාහි භාරුකච්ඡ නුවර ළදරු කල්හි භාණ්ඩ වෙළඳමෙන් ජීවිකාව කරන්නාහු තම මව රහත්හු ආරාධනා කොට අනුභව කරවන්නී, ගෙට ගොස් අප සතු දෑ කවර හෙයින් ශ්‍රමණයන්ට දෙන්නෙහිද? නුඹ විසින් දෙන ලද බොජුන් අනුභව කරන ශ්‍රමණයන්ගේ මුවින් කළු ලේ වැගිරේවායි පරිභව කෙළෙමු. එම කර්මයෙන් නිරයෙහි පැසී, එහි සේසවිපාක වශයෙන් ප්‍රේත යෝනියෙහි ඉපිද එකල සිට මෙම දුක අනුභව කරමුයි කීහ. එයද අසා සෝණ අතිශයින් සංවේගයට පත්වූයේ විය. හෙතෙම උදේනි නුවරට ගොස්, එම කටයුතු අවසන්කොට, කුලගෙට ආපසු අවුත් තෙරුන් කරා එළැඹැ කළ පිළිසඳර ඇතියේ තෙරුන්ට එකරුණ සැළ කළේය. තෙරහුද ඔහුගේ ප්‍රවෘත්තිය අසා, ආදීනව හා අනුසස් විස්තර කරමින් දම් දෙසූය. හෙතෙම තෙරුන් වැඳ රෑ කෑම අනුභව කොට නින්දට එළැඹියේය. මදක් නිදා පිබිද ඇඳ මතුපිට හිඳ, ධර්මය ඇසූ පරිද්දෙන් මෙනෙහි කරන්ට පටන්ගති. ඔහුට එම ධර්මය මෙනෙහි කරන කල්හි, එම ප්‍රේතාත්මභාවයන් මෙනෙහි කරන කල්හි සසර දුක අතිශය භයානකව වැටහිණ. පැවිද්දට සිත නැමිණි. හෙතෙම පහන් වූ කලැ සිරුර පිළිදැගුම්කොට තෙරුන් කරා එළැඹ තම අදහස සැළකොට පැවිද්ද ඉල්වීය. එහෙයින් **'අථඛො සොණස්ස උපාසකස්ස කුටිකණ්ණස්ස රහොගතස්ස -පෙ- පබ්බාජෙතු මං භන්තෙ අය්‍යා මහා කච්චානොත** යූ.සේයි. එහි යථා යථා ආදී පදයන්ගේ මේ සංක්ෂේපාර්ථයි. යම් යම් ආකාරයකින් ආර්ය මහා **කච්චාන** තෙරහු ධර්මය දෙසයිද, කියයිද, පණවයිද, පිහිටුවයිද? **විවරණය** කරයිද? බෙදා දක්වයිද? නොගැඹුරු කෙරේද? **ප්‍රකාශ කෙරේද? ඒ ඒ** අයුරින් මවිසින් පරීක්ෂා කරන කල්හි, මෙසේ සිත් වේ. **යම් ආකාර** වූ එම ශික්ෂාත්‍රය සංඛ්‍යාත බ්‍රහ්මචර්යයෙහි එක්දිනක් හෝ අඛණ්ඩ කොට අවසන් සිත පැමිණවිය යුතු හෙයින්

එකනත පරිපුණ්ණං යනු එක් දිනක් හෝ කෙලෙස් මලින් පිරිසිදුකොට අවසන් සිත පැමිණවිය යුතු හෙයින් **එකනත පරිසුද්ධං සංබලිඛිතං** යනු ලියවන ලද හක් ගෙඩියක් සමාන වූහෝ, සෝදන ලද හක් ගෙඩියක් හා සමාන වූයේ, හැසිරිය යුතුය. මෙය පහසු නොවේ. **අගාරං අජ්ඣාවසතා** යනු ගිහිගෙය මැද වසන්නහු විසින් **එකනත පරිපුණ්ණං** -පෙ- **චරිතුං යන්නූනාහං** යනු කෙස් හා රැවුල් ඔහාය ඉවත්කොට, කහට රස පොවන ලද, **කාසායානි** බඹසර සරනවුන්ට සුදුසු වූ, **වත්ථානි අච්ඡාදෙත්වා** යනු හැඳ මෙන්ම පොරවා. **අගාරස්මා** ගිහිගෙන් නික්ම, **අනගාරියං පබ්බජෙය්‍යං** යනු ගිහිගෙට හිත වූ කෘෂි වණික් ආදී ක්‍රියා අගාරිය යැයි කියයි. එයද ප්‍රව්‍රජ්‍යාවෙහි නැත. එහෙයින් ප්‍රව්‍රජ්‍යාව අනගාරිය නමැ. එහි අනාගාර්ය ප්‍රව්‍රජ්‍යාවෙහි **පබ්බජෙය්‍යං** එළැඹෙන්නේ නම්, පිළිපදින්නේ නම් යයි අර්ථයි. මෙසේ තමා විසින් රහසින් සිතන ලද්ද, සෝණ උපාසක තෙමේ තෙරුන්ට සැළකොට එය පිළිපදිනු කැමැතියේ **පබ්බාජෙථ මං භන්තෙ අය්‍යා මහා කච්චානොයි කීහ.** තෙරහු නුවණ මේරීම කෙසේදැයි සලකා බලා නුවණ මුහුකුරා යාම බලාපොරොත්තු වනුයේ **දුකරංඛො** යන ප්‍රව්‍රජ්‍යාවෙහි කැමැත්ත වැළැක්වීය. එහි **එක භත්තං** යනු ඒකභක්තිකයෙක් වේ. රාත්‍රී භෝජනයෙන් වෙන්වූයේ, නොකල්හි භෝජනයෙන් වෙන්වූයේ වේ. මෙසේ කියන ලද නොකල් බිඳීමෙන් වැලැක්ම සඳහා **කියයි. එකසෙය්‍යං** යනු දෙවැන්නෙක් රහිත සයනය. මෙහිද සයන ශීර්ෂයෙන් 'එකෙක් සිටියි. එකෙක් යයි. එකෙක් හිඳියි ආදී ක්‍රමයෙන් කියන **ලද** සිව් ඉරියාපථයන්හි කාය විවේකය දක්වයි. නුදෙකලා වී සයන මාත්‍රය නොවේ. **බ්‍රහ්මචරියං** යනු මෛථුන විරති බ්‍රහ්මචර්යයයි. ශික්ෂාත්‍රයයෙහි යෙදීම් සංඛ්‍යාත සාසන බ්‍රහ්මචර්යය හෝ වේ. **ඉංඝ** යනු චෝදනාර්ථයෙහි නිපාතයි. **තත්‍රෙව** යනු ගෘහයෙහිම, **බුද්ධසාසනං අනුයුඤ්ජ** නිත්‍ය සීල උපොසථ සීලාදී භේද වූ, පංචාංග - අෂ්ඨාංග දසංග සීල හා එයට සුදුසු සමාධි ප්‍රඥා භාවනායෙහිම යෙදෙව. එය වනාහි උපාසකයා විසින් පූර්වභාගයෙහි යෙදිය යුතු බුදුසසුන් නමැ. එහෙයින් **කාලයුත්තං එකභත්තං එකසෙය්‍යං බ්‍රහ්මචරියං** යි වදාළහ. එහි **කාලයුත්තං** යනු තුදුස්වක, පසලොස්වක, අටවක (අමතර නිවාඩු දිනයන්හි) පුරාණ උත්සව පවත්වන කාල සීමාවන්හි ඇතුලත් කාලයෙන් යුත් කියන ලද කාලයෙහි හෝ නුඹට එසේ යෙදීම යෝග්‍යයයි. සුදුසුයි. හැකිවන්නේය. හැමකල්හි පැවිදි නොවිය යුතුයයි අර්ථයි. **ඤාණයාගේ** නොමේරූ හෙයින්, ඔහුට කාමයන් ප්‍රහාණය දුෂ්කර හෙයින්ද මනා **ප්‍රතිපත්තියෙහි** යෙදවීම කරවීමට කියයි. ප්‍රව්‍රජ්‍යා කැමැත්ත වැළැක්වීමට නොවේ. **පබ්බජ්ජාහි සංබාරො** යනු

පැවිදිවීමට පටන්ගැන්ම, උත්සාහය **පටිපස්සම්භි** යනු ඉන්ද්‍රියයන්ගේ නොමේරූ බැවින්, සංවේගයෙහිද ඉතා **තීක්ෂණ** භාවයක් නුවූ හෙයින් සන්සිඳිණ. කෙසේ හෝ සන්සිඳිණ. තෙරුන් විසින් කියන ලද ක්‍රම අනුව සිටිනුයේ, කලින් කල තෙරුන් කරා එළැඹ, ඇසුරු කරනුයේ දහම් අසයි. ඔහුට කියන ලද ක්‍රමයෙන්ම දෙවනුවද පැවිද්ද සඳහා සිතක් උපනි. එය තෙරුන්ට සැළ කළේය. දෙවනුවද තෙරුන් එය ප්‍රතික්ෂේප කළේය. තෙවන නුවණ මුනුකුරා ගිය බව දැන දැන් ඔහු පැවිදි කරන්ට කාලය යැයි සලකා තෙරහු ඔහු පැවිදි කළේය. පැවිදි වූවහු වනාහි තෙවසරක් ඉක්මවා (උපසම්පදා විනය කර්මයට අවශ්‍ය) ගණය සොයා උපසම්පදා කරවිය. ඒ සඳහා **දුතියම්පි ඛො සොණො -පෙ- උපසම්පාදෙසියි** යූ.සේයි. එහි **අපපහිකඛුකො** යනු ස්වල්ප භික්ෂූහු. එකල්හි භික්ෂූහු බොහෝසෙයින් මධ්‍යම දේශයෙහිම විසූහ. එහෙයින් එහි කිහිප දෙනෙක්ම වූහ. ඔවුනුද එක් නියම්ගමක එකෙකි. එක් නියම්ගමක දෙදෙනෙකියි මෙසේ වෙන් වෙන්ව විසූහ. **කිච්ඡෙන** යනු දුකින්, **කසිරෙන** යනු ආයාසයෙන්, **තතො තතො** යනු ඒ ඒ ගම් නියම්ගම් ආදියෙන් තෙරුන් විසින්, භික්ෂූන් කිහිප දෙනෙකු ගෙනවුත්, අනෙක් අය ගෙන එනු ලබන කල්හි පෙර ගෙන එන ලද්දවුන් කිසියම් කළයුතු දෙයක් සඳහා පිටත්ව ගියහ. ටික කලක් බලාපොරොත්තුවී නැවැත ඔවුන් ගෙන එනු ලබන කල්හි අනෙක් අය ගියහ. මෙසේ නැවත නැවත ගෙන ඒමෙන් එක්වීමෙන් ප්‍රමාදව වූයේය. තෙරහුද එකල්හි තනිව වස්තේ විය. **දසවගගං භික්ඛු සංඝං සන්නිපාතෙත්වා** යනු එකල්හි භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රත්‍යන්ත දේශයෙහිද දස වාර්ගික සඟනගෙන් උපසම්පදාව අනුදැන වදාළ සේක. මෙය හේතුකොට තෙරුන් විසින් අයදින ලදුයේ පස් වග සඟනගෙන් ප්‍රත්‍යන්ත දෙස්හි උපසම්පදාව අනුදැන වදාළේය. එහෙයින් **තිණ්ණං වස්සානං -පෙ- සන්නිපාතෙවොයි** යූ.සේයි. **වස්සං ඵුසාපස්ස** යනු උපසපන්වැ පළමු වස එළැඹ, වස් වැස නිමවූයේ, **ඊදිසො ඊදිසො චාති** යනු මෙබඳු වූ නාමකාය රූපකාය සම්පත්තියෙන් යුක්ත වූයේයැයි **සුතො සෙව මෙ සො භගවා න ඛො සො භගවා සම්මුඛා දිට්ඨො** යනු ඉන් පෘථග්ජන භාවය සඳහා, මෙසේ ආයුෂ්මත් සොණ භාග්‍යවතුන් වහන්සේ දක්නා කැමැති වූයේ යැයිද පසුකල්හි වනාහි ශාස්තෘන් වහන්සේ සමග එක් ගඳකිළියෙහි වැස ඉතා අලුයම් කල්හි ආරධනා ලැබූයේ සොළොස්, අෂ්ඨක වර්ගයන් ශාස්තෘන් වහන්සේ හමුයෙහි මනාසේ මෙනෙහි කොට, මෙනෙහි කොට සියල්ල සිතින් එක් අරමුණක පිහිටුවා, අර්ථ, ධර්ම ප්‍රතිසංවේදීව, දෙසනුයේ

ධර්ම ස්පර්ශයෙන් හටගත් ප්‍රමොද්‍යාදී සුවයෙන් තැන්පත් වූයේ, හඬ නගා කීම් අවසානයෙහි විදර්ශනා පිහිටුවා සංස්කාරයන් සම්මර්ශනය කරනුයේ පිළිවෙළින් අර්හත්වයට පැමිණියේය. මේ සඳහාම මොහුට භාග්‍යවතුන් වහන්සේ සමග එක් ගඳකිළියෙහි වාසය අරඹන ලදැයි කියති. සමහරු වනාහි මවිසින් ඒ භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි නොදක්නා ලද්දෙමියි මෙම රූපකාය දර්ශනය සඳහාම කියන ලදැයි කීහ. ආයුෂ්මත් සෝණ පැවිදිවම තෙරුන් හමුයෙහි කමටහන් ගෙන උත්සාහ කරනුයේ ව්‍යායාම කරනුයේ, අනුපසම්පන්නවම සෝවාන් වී, උපසපන්වැ උපාසකවරුද සෝවාන් වෙති. මමද සෝවාන්මි. මෙහි විශේෂය කිමෙක්දැයි මතු මාර්ග සඳහා විදර්ශනා වඩා වස්කාලය තුළදීම ඡට අභිඥාලාභියෙක්ව විශුද්ධි පවාරණයෙන් පවාරණය කළේය. ආර්ය සත්‍යය දර්ශනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ධර්මකාය දිටියේ නම් වේ. යූ.සේයි. වක්කලිය යමෙක් වනාහි ධර්මය දකීද, හෙතෙම මා දකියි. යමෙක් මා දකීද, හෙතෙම ධර්මය දකී. එහෙයින් මොහුගේ ධර්මකාය දර්ශනය මුලදීම සිදුවිය. පවාරණය කොට රූපකාය දක්නා කැමැත්තේ වීය. ඉදින් මා උපාධ්‍යාය තෙමේ අනුදනීදැයිද පාඨයි. **භනෙන** යනු ස්වාමීනි එසේම ඇවැත්නි සෝණය මැනැවි. මැනැවි ඇවැත්නි සෝණය, නුඹ යවයිද පාඨයි. ඇවැත්නි, නොමැනවැයි සමහර පොත්වල නැත. එසේම ඇවැත්නි යන්නද, ඇවැත්නි සෝණ යැයි යන්නද නැත. භික්ෂූන් අතර භාග්‍යවතුන් වහන්සේගේ ජීවමාන කල්හි ආවුසො වාදයම පුරුදුකොට ඇත. **භගවනතං පාසාදිකං** යනාදී පදවල අර්ථය යට යූ.සේයි. **කච්චි භික්ඛු ඛමනීයං** යනු භික්ෂුව මේ නුඹගේ සිව්සක්, නව දොරටු සහිත ශරීර යන්ත්‍රය කිමෙක්ද, ඉවසිය හැකිද? දරන්ට ඉවසන්ට පරිහරණය කරන්ට හැකිද? කිමෙක්ද දුක්බර මැඩ නොපවත්වයිද, **කච්චි යාපනීයං** යනු කිමෙක්ද, එම කෘත්‍ය ඇතිකල්හිද, යැපෙන්ට පවත්නට හැකිද, කිසි අනතුරක් නොමැතිදැයි දක්වයි. **කච්චිසි අපපකිලමථෙන** යනු ආයාසයකින් තොරව මෙතෙක් දීර්ඝ මාර්ගය කෙසේ පැමිණියෙහිද? **එතදහොසි** බුදුවරුන්ගේ කලක් පුරුදු කරන ලද කටයුතු සරන්නා වූ ආයුෂ්මත් ආනන්දට එම **යසසඩො මං භගවා** යමෙකු සඳහා භාග්‍යවතුන් වහන්සේ මට යනාදියෙන් දැන් කියනු ලබන දෑ සිතෙහි පුරුදු කරන ලද්දේ විය. **එකවිහාරෙ** යනු එක් ගඳකිළියෙහි, ගඳකිළිය වනාහි මෙහි විහාරයැයි අදහස් කරන ලදී. **වත්‍තුං** යනු විසුමට, **නිසජ්ජාය වීතිනාමෙසවා** යනු මෙහි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සොණගේ සමවත් සමවැදීමෙන් පිළිසඳර කරනුයේ ශ්‍රාවක සාධාරණ සියලු සමවත් අනුලෝම-ප්‍රතිලෝම වශයෙන්

සමවදිනුයේ රාත්‍රී බොහෝ ගණනක් -පෙ- වෙහෙරට පිවිසියේය. එහෙයින් ආයුෂ්මත් සෝණද භාග්‍යවතුන් වහන්සේගේ අදහස් දැන එයට ගැලපෙන එම සියලු සමවත් සමවදිනුයේ රාත්‍රී බොහෝ ගණනක් -පෙ- විහාරයට පිවිසියේයයි සමහරු කියති. පිවිසද භාග්‍යවතුන් වහන්සේගේ අනුදැන්මෙන් සිවුර මුවහකොටද භාග්‍යවතුන් වහන්සේගේ පා පස හිඳීමෙන් කල්ගත කළේය. **අජ්ඣෙසී** යනු අණ කළේය. **පටිභාතු තං භික්ඛු ධම්මො භාසිතුං** යනු භික්ෂුව නුඹට ධර්මය දෙසන්ට වැටහේවා. නුවණ මතුවී ඒවා. අසන ලද පරිදි, හදාරන ලද පරිදි කියවයි අර්ථයි. **සොළස අධික වගිකානි** යනු අෂ්ඨක වර්ගයට ඇතුලත් කාමසූත්‍රාදී සොළොස් සූත්‍රයන්, **සරෙන අහණි** යනු සූත්‍රය උසුරුවා හඬනගා කීය. හඬනගා හා කීම් වශයෙන් කියේයයි අර්ථයි. **සරභඤ්ඤ පරියොසානෙ** යනු උසුරුවීම් අවසානැ, **සුගහිතානි** යනු මනාව ඉගෙන ගන්නා ලද, **සුමනසිකතානි** යනු මනාව මෙනෙහි කරන ලද, ඇතැමෙක් උගන්නා කලැ මනාව උගෙනද පසුව සජ්ඣායනා වශයෙන් මෙනෙහි කරන කල්හි ව්‍යඤ්ජනාක්ෂර හෝ නොමනාව නංවයි. පද, පසු නැසීම් හෝ කරයි. මෙතෙමේ එසේ නොවේ. මෙයින් මනාව උගත් පරිදි මෙනෙහි කරන ලද බව දක්වයි. එයින් **සුමනසිකතානියි** යූ.සේයි. මනාසේ මෙනෙහි කරන ලදුයේ **සූපධාරිතානි** යනු අර්ථ වශයෙන් මනාව විමසා බලන ලදුයේ, අර්ථයෙහි මනාව විමසා බැලූ කල්හි පාලි ධර්මය උසුරුවන්ට හැකිය. **කල්‍යාණි යාසි වාචාය සමනනාගතො** යනු ලිහිල් හා ශබ්ද නගා කියවීම් ආදීන්ගේ නියමය පරිදි වචනයෙන් වටකුරු වූ, පද ව්‍යඤ්ජනයන්ගෙන් පිරුණු පුරවැසියන්ගේ වචනයෙන් (නාගරික) යුක්ත වූයේ විය. **විසසටඨාය** යනු විමුක්ත වූ, මෙයින් මොහුගේ වචන මුදාහැරීම දක්වයි. **අනෙළගලාය** එළා යනු දෝසයයි. එය නොවැගිරේනුයි අනෙළගලායි. එම නිදොස් බැවිනැයි අර්ථයි. නොහොත් අනෙළගලාය යනු නිදොස් බැවින්ද, නොවැගිරීමෙන්ද, නිදොස් බැවින් නොගිලිහුන පද ව්‍යඤ්ජනයන්ගෙන්, නොපිරිහුන පද ව්‍යඤ්ජනයන්ගෙන් යැයි අර්ථයි. එසේම භාග්‍යවතුන් වහන්සේ ඔහු 'මහණෙනි, යහපත් දේ කථාකරන මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර යම් ආකාර වූ සෝණ කුටිකණ්ණ භික්ෂුව වේද ඔහුම අග්‍රයයි එතදග්‍රස්ථානයෙහි තැබීය. **අත්ථස්ස විඤ්ඤාපනියා** යනු අදහස් කරන ලද පරිදි අර්ථය හඟවන්ට සමත් වූ, **කති වසෙසා** යනු මධ්‍යම වයසෙහි තෙවන කොටසෙහි සිටියේ, ශක්ති සම්පන්න වූයේද අන්‍යයන්ට වඩා පැවිදි වී බොහෝකලක් ගතවූ ලෙසින් වැටහේ. එකරුණින්

භාග්‍යවතුන් වහන්සේ විමසයි. සමහරු වනාහි එය නොකරුණි. මෙසේ ඇතිකල්හි **සමාධි** සුව අනුභව කරන්ට සුදුසුය. මෙතෙක් කලක් කවර හෙයින් පමාවට පැමිණියෙහිදැයි, නැවත එහි යෙදවීමට ශාස්තෘන් වහන්සේ කෙතෙක් වස්දැයි ඔහුගෙන් විමසා වදාළේයැයි කියති. එහෙයින්ම **කිසස ත්වං භික්ඛු එවං චිරං අකාසියි** කිහ. එහි **කිසස** යනු කවර කරුණකින්ද, **එවං චිරං අකාසි** යන මෙසේ කල්ගත කෙළෙහිද? එකරුණින් මෙසේ බොහෝකලක් පැවිද්දට නොළඹ ගිහිගෙය මැද විසීදැයි අර්ථයි. **චිර දිටෙඨා මෙ** යනු බොහෝ කලෙකින් මවිසින් දක්නා ලදී. කාමෙසු යනු කෙලෙස් කාමයන්හිද වස්තුකාමයන්හිද, ආදීනවො යනු දොසයි. අපිච යනු කාමාදීනවයන් කිසියම් අයුරෙකින් දක්නා ලදුයේද එතෙක් මට ගෘහවාසයෙන් නික්මෙන්ට නොහැකි විය. කවර හෙයින්ද, **සම්බාධො ඝරාවාසො** යනු ලොකු කුඩා කළ යුතු කෘත්‍යයන්හි හටගන්නා ලද්දේ වේ. අක්‍රිය අභාවයද, (ක්‍රියාකාරී වීම).

එහෙයින් **බහුකිචෙචා බහුකරණීයො** යැයි කිහ. එමෙතං විදිත්වා යනු කාමයන්හි තත් වූ පරිදි ආදීනව දක්නාසුළු වූයේ සිත කල්ගත වීද නොපිහිටයි. ඒකාන්තයෙන් නෙළුම්පතෙහි දියබිඳුවක් මෙන් ඉවතට පෙරලේම යයි එකරුණ හැම අතින් දැන. **ඉමං උදානං** යනු පැවැත්ම නැවැත්ම මනාකොට දන්නේ පැවැත්මෙහි ඒ ඒ නිමිත්තෙහි කිසිකලෙකත් නොඇලේ යයි මෙකරුණ දැක්වීමට මෙ උදන් ඇනූ සේක.

එහි **දිසවා ආදීනවං ලොකෙ** යනු සියලු සංස්කාර ලෝකයෙහි අනිත්‍ය දුක්, පෙරළෙන සුළුයැයි ආදී ක්‍රමයෙන් ආදීනවයද, දෝෂයද ප්‍රඥායෙන් දැක, එයින් විදර්ශනා වාරය කියන ලදී. **ඤත්වා ධම්මං නිරූපධිං** යනු සියලු උපධීන් අත්හළ හෙයින්, උපධි රහිත නිර්වාණ ධර්මය තත්වාකාරයෙන් දැන නිස්සරණ සංඛ්‍යාත නිවන පැහැදිලිකොට ස්වභාව වශයෙන් මාර්ග ඥානයෙන් ප්‍රතිවේධකොට, **දිසවා, ඤත්වා** යන මෙම පදයන්ට 'ගිතෙල් බී ශක්තිමත් වේ' සිංහයෙකු දැක බිය වේ. ප්‍රඥායෙන් දැක ආශ්‍රව මනාව ක්‍ෂය වූවාහු වෙති. ආදීන්හි මෙන් හේත්වර්ථය දතයුතුය. **අරියො නරමනි පාපෙ** යනු කෙලෙසුන්ගෙන් දුර වූ හෙයින්ද, ආර්ය සත්පුරුෂ තෙමේ ස්වල්පමාත්‍ර වූද පාපයෙහි නො ඇලේ. කවර හෙයින්ද, **පාපෙ න රමති සුචි** යනු සුපිරිසිදු කායික හැසිරීම් හෙයින් පිරිසිදු පුද්ගලයා රාජහංසයෙකු මෙන් අපවිත්‍ර තන්හි පාපයෙහි කිළිටි ස්වභාවයෙහි

නො ඇලේ. සතුටු නොවේ. **පාපො නරමති සුචිං** යනුද පාඨයි. එහි අර්ථය පාපී පාප පුද්ගලයා පිරිසිදු නිරවද්‍ය පිරිසිදු ධර්මයන්හි නොඇලේ. ඒකාන්තයෙන් ගම්ඵරු ආදීන් මෙන් අපවිත්‍ර තැන්හි, අපවිත්‍ර කිලිටි සහිත ධර්මයෙහිම ඇලේයයි ප්‍රතිපක්ෂ වශයෙන් දේශනය පෙරළයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ උදන් ඇනූ කල්හි ආයුෂ්මත් සෝණ අස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ උපාධ්‍යායන්ගේ වචනයෙන් ප්‍රත්‍යන්ත දේශයෙහි පංචවර්ගික සංඝයාගෙන් උපසම්පදාදී පංචවස්තූන් ඉල්වීය. භාග්‍යවතුන් වහන්සේද ඒවා අනුදැන වදාළේ යයි ඒ සියල්ල බන්ධකයෙහි ආ ක්‍රමයෙන් දතයුතුය.

සයවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

5.7

සත්වැන්නෙහි රේවත යනු එම තෙරුන්ගේ නාමයයි. හෙතෙම සස්නෙහි පැවිදිව ලබන ලද උපසම්පදා ඇතියේ සිල්වත් වූයේ, යහපත් ගුණ ධර්මයන්ගෙන් යුක්තව වාසය කරයි. මුංඇට අකැපය. මුංඇට පරිභෝග කරන්ට අකැපය. උක්හකුරු අකැපය යන ආදියෙන් විනය කුකුස් සංඛ්‍යාත සැක බහුල වේ. එහෙයින් කංඛා රේවතයැයි ප්‍රකට විය. හෙතෙම පසුකලැ ශාස්තෘන් වහන්සේ සමීපයෙහි කමටහන් ගෙන උත්සාහ කරනුයේ ව්‍යායාම කරනුයේ ඡට අභිඥාවන් සාක්ෂාත් කොට ධ්‍යාන සුවයෙන්ද, ඵල සුවයෙන්ද කල්යවයි. බොහෝසෙයින් තමා විසින් අවබෝධ කළ ආර්යමාර්ගය ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරයි. එහෙයින් **අත්තනො කංඛා විතරණ විසුදධිං පචච වෙකඛමානෙයි** යූ.සේයි. මාර්ග ප්‍රඥාව මම අතීත දීර්ඝකාලය තුළ වූයෙමිද, ආදී ක්‍රමයෙන් පැවති සොළොස් වස්තුක, බුදුන් කෙරෙහි සැක කරයි. -පෙ- ප්‍රත්‍යයෙන් හටගත් ධර්මයන්හි සැක කෙරේයයි මෙසේ කියන ලද අෂ්ඨ වස්තුක සැකයන්ගේ, අනෙක්වා ගැන කියනුම කවරේද? ශේෂ රහිතව සියලු සැකයන්ගේ මනාව තරණය කරණ හෙයින් ඉක්මවන හෙයින් අනෙකුත් තමා විසින් ප්‍රහාණය කළයුතු කෙලෙසුන්ගෙන් අත්‍යන්තයෙන් පිරිසිදු වන හෙයින්

කංඛා විතරණ විශුද්ධිය යැයි මෙහි අදහස් කරන ලදී. එය වනාහි මේ ආයුෂ්මත් තෙමේ බොහෝකලක් සැක ප්‍රකෘතික හෙයින් ඒකාන්තයෙන් මම මෙම කර්මයට පැමිණ මාගේ සැක ශේෂ රහිතව ප්‍රහීණ වූයේ යැයි ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරමින් හුන්නේය. ප්‍රත්‍යය සහිත නාමරූප දර්ශනය අනිත්‍යයැයි කළ හෙයින් එම කංඛාවිතරණයෙහි. **එතමත්ථං විදිත්වා** යනු එම ආර්යමාර්ගයෙහි ශේෂ රහිත කංඛාවිතරණ සංඛ්‍යාත අර්ථය දැන එම අර්ථය දැක්වීමට මෙඳදන් ඇනූ සේක.

එහි **යාකොචි කංඛා ඉධවා හුරංවා** යනු මෙහි මෙම වත්මන් අත්බැව්හි මම වෙමිද, නොවෙමිදැයි ආදියෙන් පරලොව හෝ අතීත අනාගත ආත්මභාවයන්හි මම අතීත කාලයෙහි වූයෙමිද, ආදී ක්‍රමයෙන් උපදනා සැකයයි. **සකවෙදියාවා පරවෙදියාවා** යනු එයම කියන ලද ක්‍රමයෙන්ම ස්වකීය ආත්මභාවයෙහි අරමුණු වශයෙන් ලැබිය යුතු හෙයින් පැවැත්මෙහි **සකවෙදියායි.** අන්‍යයන්ගේ ආත්මභාවයන්හි ලැබිය යුතු හෙයින්, බුද්ධ වූයෙහිද, නොවූයෙහිදැයි ආදී ක්‍රමයෙන් යම් ප්‍රධාන උතුමෙක් කෙරෙහි ලැබිය යුතු හෙයින් - පරවෙදියායි. යම්කිසි **කංඛා විචිකිච්ඡායි. ඣායිනො නා පජහන්ති සබ්බා ආතාපිනො බ්‍රහ්මචරියං චරනෙනා** යනු යම් අරමුණු ගැන නිතර නිතර සිතමින් ධ්‍යාන වඩන ධ්‍යායීහු විදර්ශනාව ඔසවා සිව්ආකාර සම්‍යග් ප්‍රධාන පරිපූර්ණ කිරීමෙහි කෙලෙස් තවන වීර්යයෙන් යුක්තවූයේ මාර්ග බ්‍රහ්මචර්යයෙහි හැසිරෙන්නාහු, අවබෝධ කරන්නාහු, ශ්‍රද්ධානුසාරී ආදී ප්‍රභේදයෙන් යුත් ප්‍රථම මාර්ගස්ථ පුද්ගලයෝ එම සියලුම සැකයන් දුරුකරති. මාර්ගක්ෂණයෙහි උදුරා විනාශ කරති. ඉන් මත්තෙහි ප්‍රහීණ වූයේ නම් වෙති. මෙයින් අන්‍ය වූ ඒවා අත්‍යන්ත ප්‍රහාණයක් නම් නැතැයි අදහසයි. මෙසේ භාග්‍යවතුන් ධ්‍යාන මුඛයෙන් ආයුෂ්මත් කංඛා රේවතයන්ට ධ්‍යාන ශීර්ෂයෙන් ආර්යමාර්ගාධිගමය පිළිබඳව ස්තුති කරනුයේ ස්තුති කිරීම් වශයෙන් උදන් ඇනූ සේක. එහෙයින්ම ඔහු 'මහණෙනි, ධ්‍යානලාභී මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර යම් ආකාර වූ කංඛා රේවතයෙක් වේද, ඔහුම අග්‍රය. ශ්‍රේෂ්ඨය. ධ්‍යාන භාවයෙන් එතදග්‍ර ස්ථානයෙහි තැබීය.

සත්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

5-8

අටවැන්නෙහි **ආයසමනතං ආනඤ්ං එතදවොච** යනු ඉදිරියෙහි යොදවා, නාලාගිරි ඇතු පිටත්කොට යවා ගලක් පෙරළා, භාග්‍යවතුන් වහන්සේට අනර්ථයක් කරන්ට නොහැකි වනුයේ, සංඝයා භේද කොට, වර්ග භේදය කරන්නෙමියි අදහසින් එය 'අජ්ජතග්ගෙ' ආදී වචනය කීය. **අඤ්ඤත්‍රෙව භගවතා** යනු භාග්‍යවතුන් වහන්සේගෙන් තොරවම එක්ව විසීමක් නොකොට යැයි අර්ථයි. **අඤ්ඤත්‍රෙව භික්ඛු සංඝං** යනු බික්ඛු සඟනගෙන් තොරවම, **උපොසථං කරිසසාමි සංඝකම්මානි ච** යනු භාග්‍යවතුන් වහන්සේගේ අවවාද පිළිපදින බික්සඟ වෙන්කොට මා හා අනුවර්තනය වන භික්ෂු සංඝයා සමග මා හට විශේෂයෙන් අයත් වූ උපොසථයද, සංඝ කර්මයන්ද කරන්නෙමියි අර්ථයි. **දෙවදතෙතා සංඝං භින්දිසසති** යනු දෙවිදතු විසින් භේදකාරී සියල්ලන්ට කරුණු කියා පිළියෙළ කළ හෙයින් ඒකාන්තයෙන්ම දෙවිදතු අද සංඝයා බිඳින්නේය. දෙකඩ කරන්නේය. ධම්මා අධම්මා යනාදී අටලොස් භේදකර වස්තූන් අතර, යම්කිසි එක් වස්තුවක් ඉදිරිපත්කොට එකරුණින් මෙය ගනිව්. මෙය රුචි කරව් යැයි හඟවා, සලාක ගන්ට සලස්වා, වෙන්ව සඟකම් කළ කල්හි සංඝයා බිඳුනේ වේ. යූ.සේයි. උපාලිය, කර්මයෙන්, උදෙසීමෙන් ව්‍යවහාර කරමින්, ශ්‍රවණය කරවීමෙන්, සලාක ගැනීමෙන් යන කරුණු පංචකයෙන් සංඝයා බිඳේ. එහි කම්මෙන යනු අපලෝකන කර්මාදී සිව් කර්මයන් අතර, එක්තරා කර්මයකින්, **උද්දෙසෙන** යනු පස්වැදෑරුම් පාමොක් උදෙසීම් අතර එක්තරා උදෙසීමකින්, **වොහරනෙතා** යනු ඒ ඒ ආපත්තීන්හිදී අධර්මය ධර්මයැයි ආදී අටලොස් භේදකර වස්තූන් දක්වනුයේ, **අනුසාවණෙන** යනු මාගේ උසස් කුලයෙන් පැවිදි වූ බවද, බහුශ්‍රැත බවද නුඹලා නොදන්නහුද, මා වැන්නෙක් නම් ධර්මවිරෝධී විනය විරෝධී දෘෂ්ටියක් ගන්නේ යයි කිමෙක්ද, නුඹලාට සිතක් හෝ උපදවන්ට සුදුසුද, කිමෙක්ද මා අපායෙන් (අපා දුකින්) බිය නොවන්නෙම්ද, ආදී ක්‍රමයෙන් කන් මුල වාග් භේද කොට ශ්‍රවණය කරවීම **සලාක ගාහෙන** යනු මෙසේ ශ්‍රවණය කරවා ඔවුන්ගේ සිත්වලට ධෛර්ය දී හැරී නොඑන ස්වභාවයක් කොට මෙම සලාකය ගනිව්යයි සලාක ගැන්වීමෙන්, මෙහිද එක කර්මයක් හෝ උදෙසීමක් ප්‍රමාණවත්ය. ව්‍යවහාරය, අනුශ්‍රාවණ, සලාක ගැන්වීම පූර්වභාගයෙහිය. අටලොස් වස්තු දැක්වීම් වශයෙන් වනාහි ව්‍යවහාර කරන්නහු විසින් එහි ඇල්ම හටගැන්වීම සඳහා අනුශ්‍රවණය කරවා සලාක

ගන්නා ලදුයේද සංඝයා නොබිඳුනේම වේ. යම්කලෙක්හි වනාහි සතරදෙනෙක් හෝ ඉන් අතිරේක ප්‍රමාණයක් හෝ සලාක ගන්වා **ආවේණික** හෝ උදෙසීම් කර්මයක් කෙරෙත්ද, එකල්හි සංඝයා බිඳුණේ නම් වේ. දෙවිදත්ද සංඝභේදයට අවශ්‍ය සියල්ල නිපදවා ඒකාන්තයෙන්ම අද ඔහුට **ආවේණික**, පොහොයද සංඝ කර්මයද කරන්නෙමියි සිතා 'අද පටන්' ආදී වචන කීවේය. එහෙයින් භාග්‍යවතුන් වහන්ස, අද දෙවිදත් සංඝයා බිඳින්නේ යයි කීය. භේදකර සියලු කරුණු පිළියෙල කළ හෙයින් යයි යම්හෙයකින් කීහුද එහෙයිනි. **එතමත්ථං විදිත්වා** යනු එම අවීචි මහ නිරයෝත්පත්තියට හේතුව කල්පස්ථායි සුවකළ නොහැකි දෙවිදත් විසින් නිපදවනු ලබන සංඝභේද කර්මය සර්වාකාරයෙන් දැන, **ඉමං උදානං** යනු කුසල් අකුසල්හි ක්‍රමානුකූලව, සත්පුරුෂ අසත්පුරුෂ සමාන-අසමාන ප්‍රතිපත්ති වශයෙන් යහපත් කුසල්යැයි මෙම කරුණ පැහැදිලි කිරීමට මෙඳදන් ඇනූ සේක.

එහි සූකරං සාධුනා සාධු යනු තමාගේ අන්‍යයාගේද යහපත සිදු කෙරේනුයි **සාධුයි**. මනාව පිළිපන්නේ, එම යහපත් සැරියුත් ආදී ශ්‍රාවකයන් සමගද පසේබුදු, සම්‍යක් සම්බුදු, අනෙක් ලෞකික යහපත් පුද්ගලයන් සමගද ඇසුර යහපත්ය. සුන්දරය. සිත්කලුය. තමාගේද, අනෙකාගේද, හිතසුව ඵළවන දෑ කිරීම පහසුය. සුවසේ කරන්ට හැකිය. **සාධු පාපෙන දුක්කරං** යනු කියන ලද ලක්‍ෂණ ඇති යහපත පාපී දෙවිදතු ආදී පුග්ගලන් විසින් කරන්ට දුෂ්කරය. කරන්ට නොහැකිය. ඔහු එය කරන්ට නොහැකිය යන අර්ථයි. **පාපං පාපෙන සූකරං** යනු අයහපත් පාපය තමාටද, අන්‍යයාටද අනර්ථ ඵළවනුයේ, පාපයෙන් කියන ලද ආකාර ඇති පාපී පුද්ගලයා විසින් කිරීම පහසුය. සුවසේ කරන්ට හැකිවන්නේය. **පාපමරියෙහි දුක්කරං** යනු බුද්ධාදී ආර්යයන් විසින් වනාහි එම පාපය කිරීම දුෂ්කරය. හටගැන්ම දුෂ්කරය. හෙය නැසීමම ඔවුන්ගේ යයි ශාස්තෘන් වහන්සේ දක්වන සේක.

අටවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

5-9

නවවැන්නෙහි, **මාණවකා** යනු තරුණයෝ, ප්‍රථම යෞවනයෙහි සිටි බමුණු කුමාරවරු මෙහි අදහස් කරන ලදී. **තෙවධායමානා** යනු කවටකම් කරන ස්වභාව වචන සඳහා යූ.සේයි. අන්‍යයන්ට කවටකම් කරන්නාහු හිංසා කරති. එබඳු ස්වභාව වචන කියන සුලුයයි අර්ථයි. එහි මේ වචනාර්ථයි. හිංසාව වධයයි. එය කියන්නුයි වධයමානායි කිවයුතු කල්හි දීර්ඝ කොට වධායමානායි යූ.සේයි. නොහොත් වෙහෙසීමෙහි හිංසනයෙහි මෙන් තමා හැසිරේයයි වධායමානායි. ඉන් එබඳු ස්වභාව හෙයින් වධායමානරූපායි යූ.සේයි. සඳදායමානරූපායිද පාඨයි. උස් ශබ්ද, මහා ශබ්ද කරන්නාහුයිද අර්ථයි. **භගවතො අවිදූරෙ අතික්කමනති** යනු භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රවණ විෂයයෙහි මුවට නැගුණු ඒ ඒ දෑ කියමින් ඉක්ම යති. එතමත්ථං විදිත්වා යනු එම ඔවුන්ගේ වචනයෙහි නොහික්මුණු බව දැන එඅරුත් දැක්වීමට ධර්ම සංවේග වශයෙන් මෙඋදන් ඇතුළු සේක.

එහි **පරිමුට්ඨා** යනු අඥාන, මුළා සිහි ඇති. **පණ්ඩිතාභාසා** යනු පණ්ඩිත ප්‍රතිරූපක වූ, අන් කවරහු දනිත්ද, අපම මෙහි දනිමුයි ඒ ඒ කරුණෙහි තමන්ම දන්නහු කොට හැසිරෙන හෙයින්, වාචා ගෝචර භාණිතො යනු යම් කෙනෙකුන්ට වචනයම ගොදුරු වූයේ විෂය වූයේ වේද? මුබාරූඪ වූවක්ම කියන සුළුය. කථා කරන වචනයෙහි අර්ථය පිරිසිඳ නොදත්තේ කථා වස්තු මාත්‍රයෙහිම පිහිටා කථා කරන්නාහු වෙති. නොහොත් කථා කිරීමට අගෝචර, ආර්යයන්ගේ කථාවට විෂය නොවූ මුසාවාද කථා කෙරෙත්නුයි වාචා ගෝචර භාණිතොයි, නොහොත් ගොචරභාණිනො යන මෙහි ආකාරයට හ්‍රස්වභාවය කරන ලදී. වාචා ගෝචර වූවෝ සතිපට්ඨාන ගෝචරව කථා කරන්නාහු නොවෙති. කෙසේ කියන්නෝ **යාවිඤ්ඤනි මුබායාමං** යනු යම් පමණ තමාගේ මුව ඇරීම වේද, යම්තාක් මුව ප්‍රසාරණය කැමැති වෙත්ද, ඒ තාක් ප්‍රසාරණය කොට කථා කරන්නාහු අනෙක් අය කෙරෙහි ගෞරවයෙන්, තමහට අවිෂය වූයේ ද මුව හැකිලීම නොකරත් යයි අර්ථයි. නොහොත් වචනය ගෝචර වූයේම වී කථා කරන්නහුට තෙමේ නොදැන පද ප්‍රාප්තිකයෝම වී කියන්නෝ (කථා කරන්නෝ) යයි අර්ථයි. එයින්ම මුව ඇරීම යම්තාක් කැමැති වෙත්ද? යම් වචනයකින් ශ්‍රවණය කරවිය යුතුද, එය නොසිතා

තම මුව ප්‍රසාරණ මාත්‍රය යම්තාක් වේද, ඒතාක් කැමැති වෙත්යයි අර්ථයි. **යෙන නීතා නතං විදූ** යනු යමක් කරණකොටගෙන සිහි මුළා වීම් ආදියෙන් නිර්ලජ්ජිභාවයටද, පණ්ඩිතමානී භාවයටද, ගෙන යන ලද්දාහු අපිම මෙසේ කථාකරමුයි එය එසේ තමහට කියන්නහුගේ කරුණ පණ්ඩිත නුවූ - මෝඩයෝ අදක්ෂයෝ නොදනිත් යයි අර්ථයි.

නවවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

5-10

දසවැන්නෙහි **චූලපන්ථකෝ** යනු මහාපන්ථක තෙරුන්ගේ බාල සොහොවුරු හෙයින්ද, මාර්ගයෙහි උපන් හෙයින්ද, ළදරුකල්හි ලද භාවිතයෙන්, පසුකල්හිද, මේ ආයුෂ්මත් තෙමේ චූලපන්ථකයැයිම ප්‍රකට විය. ගුණ විශේෂයන්ගෙන් වනාහි ෂට් අභිඥා හා විශේෂ විභාගයට පත් ප්‍රතිසම්භිදා ඇතියේ 'මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර මනෝමය ශරීර නිර්මාණය කරන්නවුන් අතර යම් ආකාර වූ චුල්ලපන්ථකයෙක් වේද, ඵල සමවත් සමවැදීම්හි දක්ෂයින් අතර යම් ආකාර වූ චුල්ලපන්ථකයෙක් වේද ඔහුම අග්‍රය. දෙතන්හි භාග්‍යවතුන් වහන්සේ එතදග්‍රස්ථානයෙහි තබන ලදුයේ අසූමහ ශ්‍රාවකාභ්‍යන්තරගත විය. හෙතෙම එක් දිනක් පසුබත්හි **පිණ්ඩපාතයෙන්** ඉවත් වූයේ තම දිවාස්ථානයෙහි දිවා විහරණ සඳහා හුන්නේ නොයෙක් සමාපත්තීන්ගෙන් දිවා භාගය කල්යවා සවස්කල්හි උපාසකයින් ධර්මශ්‍රවණයට නොපැමිණි කල්හිම වෙහෙර මැදට පිවිස භාග්‍යවතුන් වහන්සේ ගඳකිළියෙහි වැඩහුන් කල්හි භාග්‍යවතුන් වහන්සේගේ උවටැන් සඳහා එළඹෙන්ට තවම නොකල්යයි ගඳකිළි ඉදිරියෙහි එක්පසෙක පර්යංකයක් බැඳ හුන්නේය. **එහෙයින් තෙන බොපන සමයෙන ආයසමා චූලපන්ථකෝ භගවතෝ අවිදූරෙ නිසින්නෝ හොති. පල්ලංකං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වායි** යූ.සේයි. හෙතෙම එකල්හි කාලය බෙදීම

කොට සමවතට සමවැද හුන්නේය. **එතමත්ථං විදිත්වා** යනු එම ආයුෂ්මත් චූලපන්ථකගේ කාය චිත්තයන්ගේ, මනාව පිහිටුවන ලද බැව් සංඛ්‍යාත අර්ථය දැන, **ඉමං උදානං** යනු අන්‍ය වූ ද යම් සත්සුන් සියලු ඉරියව්හි එළැඹ සිටි සිහි ඇති තැන්පත්, එම භික්ෂුවගේ උපාදාන රහිත නිවන කෙළවර කොට ඇති විශේෂාධිගමයෙහි පහළවීම දැක්වීමට මෙ උදන් ඇනූ සේක. එහි **යීතෙන කායෙන** යනු කායද්වාරික අසංවරයාගේ ප්‍රහාණයෙන් නොකිරීමෙන් මනාව තබන ලද, පිරිසිදු කරන ලද ශරීරයෙන්, එසේම චක්‍ෂු ආදී ඉන්ද්‍රියයන්ගේ ආශ්වාද වින්දන තොර බව කිරීමෙන් මනාව තබන ලද පංචද්වාරික කයින්. අසංවර අත් පා ශරීර කුකුස් ආදීන්ගේ අභාවයෙන් නොවෙවුලමින් සිටියා වූ කරජකයෙන්දැයි, සංක්‍ෂේපයෙන් සියලුම ශරීරයෙන් වෙනස්වීමක් නොමැති නිශ්චල භාවයෙන්, එයින් ඔහුගේ සීල පාරිශුද්ධිය දක්වන ලදී. මෙය මෙසේ වූයේය යන ලක්‍ෂණයෙහි කරන විභක්තියි. **යීතෙන චෙතසා** යනු සිතෙහි ස්ථිති දැක්වීමෙන් සමාධි සම්පත දක්වයි. සමාධිය සිතෙහි සිටීමයයි කියයි. එහෙයින් සමථ වශයෙන් හෝ විදර්ශනා වශයෙන් එකඟබව ඇතිකල්හි සිත අරමුණෙහි එකඟබවට පැමිණීමෙන් සිටියේ නම් වේ. අන් අයුරෙකින් නොවේ. මෙම කියන ලද ආකාර ඇති කාය චිත්තයන්ගේ තැබීම, තැන්පත් කිරීම සියලු කල්හි සියලු ඉරියව්හි කැමැති විය යුතුයැයි දක්වනුයේ **නිධ්‍යං නිසිනෙනා උදවා සයානොයි** කියේය. එහි වා ශබ්දය අනියමාර්ථයෙහිය. එයින් සිටිනුයේ හිඳිනුයේ, සයනය කරනුයේ හෝ එයින් අන්‍ය ඉරියව්වක් හෝයි මෙම අර්ථය දක්වන ලද්දේ වේයයිද, සක්මන් කරන්නනුගේද ඉරියව්ව මෙහි ඇතුලත් කරන ලදැයි දතයුතුය. **එතං සතිං භික්ඛු අධිට්ඨහානො** යනු කල් ඇතිවම පිරිසිදු හැසිරීම් ඇති, කයෙහි හා සිතෙහි නොමනා කාමුක ස්වභාව සන්සිඳීමෙන් කයෙහි හා සිතෙහි දාහ නැතිකොට, ලබන ලද නිරවද්‍ය සුව නිශ්චයෙන් කය හා සිත සන්සිඳීම් වශයෙන්, සිත සැහැල්ලු මෘදු කර්මණ්‍යභාවයට පත්කොට මනාව තබනුයේ එක්තැන් කරනුයේ කමටහන් මනාව වඩයි. මස්තක ප්‍රාප්තියද කරයි. එම කමටහන්හි යෙදීමෙන් ආදි මධ්‍ය පර්යවසානයන්හි බොහෝ උපකාර වූ සිහිය, භික්ෂුව ස්ථිර ලෙස පිහිටුවනුයේ, සිල් පිරිසිදු කිරීම මුල්කොට, විශේෂාධිගමය තෙක් ඒ සඳහා එහි සිත ස්ථිර ලෙස පිහිටුවයි යනු අර්ථයි. ලභෙථ පුබ්බාපරියං විසෙසං යනු හෙතෙම මෙසේ සිහියෙන් රැකි සිත් ඇතියේ කමටහන් මතු මතු වඩන්නේ වැඩිදියුණු කරනුයේ පෙර පසු, පෙර පසුවත් බවට පත් කළේ, පෙර පසු කොටසින් පැවැති, උදාර, අති උදාර ආදී භේදයන් ලබන්නේය. එහි පූර්වාපර

විශේෂය දෙවැදෑරුම්ය. සමථ හා විදර්ශනා වශයෙනි. ඔවුනතර සමථ වශයෙන් නිමිත්ත හටගැන්මෙහි පටන්, නේවසඤ්ඤා නාසඤ්ඤායතනය තෙක් වසීභාවයක් වේද, ඒ තාක් පැවැති භාවනා විශේෂය පෙර අපර විශේෂයයි. විදර්ශනා වශයෙන් රූප ප්‍රමුඛතාවයෙන් සිත පිහිටුවන්නහුට රූපධර්ම පරිග්‍රහණයෙන් ද, අනෙකාට ධර්ම පරිග්‍රහණයේ පටන් අර්හත්වාධිගමය තෙක්, එතෙක් පැවැති භාවනා විශේෂය පෙර පසු විශේෂයයි. මෙම අර්ථයම මෙහි අදහස් කරන ලදී. **ලද්ධාන පුබ්බාපරියං විසෙසං** යනු පෙර පසු විශේෂයෙහි ඉහළම පාරමී ප්‍රාප්ත අර්හත්වය ලැබ, **අදසසනං මච්චුරාජස්ස ගච්ඡේ** යනු ජීවිතයාගේ නැසීම් වශයෙන් සියලු සත්ත්වයින් මැඩලනු ලබන හෙයින් මෘත්‍යුරාජ සංඛ්‍යාත මරණයට විෂයභූත වූ, භවත්‍රයය ඉක්මවන හෙයින් නොදැක්මට, අගෝචරත්වයට යන්නේය. මෙම වර්ගයෙහි යමක් නොකියන ලදද, එය යට කියන ලද ක්‍රමයමය.

දසවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

මහා වර්ග වර්ණනාව සමාප්තයි.

6-1

සවන ජාත්‍යන්ධ වර්ගයෙහි, පළමුවැන්නෙහි වෙසාලියං යනු යට කියන ලද ක්‍රමයමය. **වෙසාලියං පිණ්ඩාය පාවිසි** කෙදින පිවිසියෙහිද, උක්කාචේලයෙන් නික්ම විසල් නුවරට ගියකල්හි, එහි භාග්‍යවතුන් වහන්සේ බෙලුව ගමෙහි වස් වැස ඉන් නික්ම පිළිවෙළින් සැවතට පත්ව දෙව්රම්හි වාසය කළ සේක. එකල්හි දම්සෙනෙවි තම ආයු සංස්කාරයන් බලා **සත්දිනක්ම පමණක්** පවතින්නේ යයි දැන භාග්‍යවතුන් වහන්සේ අනුදන්වා (අනුමත කරවා) නාලක ගමට ගොස් එහිදී සිය මව සෝවාන් ඵලයෙහි පිරිනිවන් පෑහ. ශාස්තෘන් වහන්සේ චුන්ද විසින් ගෙන එන ලද පිහිටුවා සැරියුත් තෙරුන්ගේ ශාරීරික ධාතූන් ගෙන ධාතු චෛත්‍යයක් කරවා මහ **බික්ෂු** සඟ පිරිවැරුනේ රජගහ නුවරට වැඩම කළ සේක. එහි ගිය කල්හි ආයුෂ්මත් මහ මුගලන් තෙරහු පිරිනිවියේය. භාග්‍යවතුන් වහන්සේ

ඔහුගේද ශාරීරික ධාතූන් ගෙන චෛත්‍යයක් කරවා, රජගහ නුවරින් නික්ම පිළිවෙළින් උක්කාචේලයට වැඩම කළ සේක. එහි ගං ඉවුරෙහි බික් සඟ පිරිවරන ලදුයේ වැඩහිඳ අග සව්වන්ගේ පිරිනිවීම හා සබැඳි සූත්‍රයක් දෙසා, උක්කාචේලයෙන් නික්ම විසල් නුවරට වැඩම කළ සේක. මෙසේ වැඩමකළ භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරවූ පාසිවුරු ගෙන විසල්නුවරට පිඬු පිණිස පිවිසියේ යැයි කියයි. එහෙයින් උක්කාචේලයෙන් නික්ම විසල් නුවර ගියකලැයි යූ.සේයි. **නිසීදනං** යනු මෙහි සම්කඩ අදහස් කරන ලදී. **චාපාල චෙතියං** යනු පෙර චාපාල නම් යක්ෂයා විසූ තැන චාපාල චෙතියැයි පැණුනහ. එහි භාග්‍යවතුන් වහන්සේට කළ විහාරයද එම ව්‍යවහාරය අනුව චාපාල චේතියැයි කියති. **උදෙනං චෙතියං** යන මේ ආදීන්හිද එම ක්‍රමයමය. **සත්තම්බං** යනු කිකී නම් කසී රජහුගේ දියණියන් වූ සත්කුමරියෝ සංවේගප්‍රාප්තව රජගහ නුවරින් නික්ම යම්තැනක ප්‍රධන් වීර්යය ප්‍රධන් කළහුද? එම ස්ථානය සත්තම්බ චෙතිය යැයි කියති. **බහු පුත්තං** යනු උඩින් පහළට ඇදෙන බොහෝ මුල් ඇති එක් නුගරුකෙකි. එහි අධිගෘහිත දේවතාවාගෙන් බොහෝ මිනිස්සු පුතුන් පතති. එන් පටන් එතැන බහුපුත්තචෙතියංයි පැණුනහ. **සාරන්දදං** යනු සාරන්ද නම් යකු වුසූ තැනයි. මෙසේ එම සියල්ලම බුද්ධෝත්පාදයෙන් පෙර දේවතාධිගෘහිතයැයි චෛත්‍ය ව්‍යවහාරයෙන් ව්‍යවහාර කරන ලද්දාහුය. මෙහි විසල්හි භූමිභාග සම්පත්තියෙන්ද, පුද්ගල සම්පත්තියෙන්ද සුලභ ප්‍රත්‍යතාවයෙන්ද රමණීය බව දතයුතුය. විහාරස්ථානයන්ට වනාහි නගරයෙන් ඉතා දුර නුවූ බැවින්ද, ඉතා ආසන්න නුවූ හෙයින්ද, ගමනාගමන සම්පතින්ද, ජනාකීර්ණ නුවූ තැනක විහාරය පිහිටි හෙයින්ද, විශාල වෘක්ෂයන්ගේ සෙවන හා ළිංපොකුණු ආදි ජල සම්පත්තියෙන්ද විවේකයට සුදුසු බැවින්ද යන කරුණුවලින් රමණීයත්වය දතයුත්තාහ. **චතාරෝ ඉද්ධිපාදා** යන මෙහි ඍද්ධිපාදයාගේ අර්ථයට යූ.සේමය. **භාවිතා** යනු වඩන ලද්දාහු, **බහුලීකතා** යනු නැවැත නැවැත කරන ලද. **යානීකතා** යනු ගමන් කළහැකි තත්ත්වයේ යානයක් මෙන් කළ, **වත්ථුකතා** යනු පිහිටීම් අර්ථයෙන් වස්තුවක් මෙන් කළ, **අනුට්ඨිතා** යනු නොනැගිටි, **පරිචිතා** යනු භාත්පසින් රැස්කළ මනාව වඩනා ලද, **සුසමාරද්ධා** යනු මනාව අරඹන ලද ඉතා යහපත් අයුරු නිපදවන ලදහ. මෙසේ අනියමින් කියා නැවැත නියමකොට දක්වන්ට **තථාගතස්ස ඛො** යනාදිය වදාළහ. මෙහිද **කප්පං** යනු **ආයුකප්පං** ආයුෂ්කල්පයයි. **තිට්ඨෙය්‍ය** යනු එකල්හි මිනිසුන්ගේ ආයුෂ්ප්‍රමාණය යම් පමණද, එය සම්පූර්ණකොට සිටින්නේය. දරන්නේය. **කප්පාවසෙසංවා** යනු ස්වල්ප වූ හෝ, හීයේ‍යාවා යනු කියන

ලද වර්ෂ සියයෙන් අතිරේක වශයෙන් හෝ, මහා සිවතෙරුන් වනාහි, බුදුවරුන්ට නොතන්හි ගර්ජනයක් නම් නැත. යම්සේ වනාහි බේලුව ගමෙහිදී හටගත් මාරාන්තික වේදනාව දසමසක් මැඩපැවැත්වූ සේක. මෙසේ නැවත නැවත සමවතට සමවැද දසවස බැගින් මැඩ පවත්වා මෙම භද්‍ර කල්පයම සිටින්නේද, කවර හෙයින් එසේ නොසිටියෙහිද, තෘෂ්ණාදීන් විසින් ගන්නා ලද ශරීරය නම් කැඩුම් බිඳුම් ආදියෙන් පෙළයි. (මධ්‍යයි.) බුදුවරු වනාහි කැඩුම් බිඳුම් ආදියට නොපත්ව පැසුළු ආයුෂ කොටසෙහි බොහෝ ජනයාට ත්‍රියමනාප කාලයෙහිම පිරිනිවෙත්. අග්‍රශ්‍රාවක මහා ශ්‍රාවකයින් පිරිනිවි කල්හි පිරිවර රහිතව හුදෙකලාවම හෝ ළඳරු සාමණේර පිරිවැරීමෙන් සිටිය යුතු වෙයි. ඉක්බිති විශ්මයෙකි. මේ බුදුවරුන්ගේ පිරිසදැයි පහත්කොට සැලකිය යුතු තත්ත්වයට පැමිණෙන්නේය. එහෙයින් නොසිටියේ යැයි කීවේය. මෙසේ කි කල්හිද අසූවෙන් ආයුෂ් කල්පය නිගමනය කොට ඇතැයි සැලකේ. මෙයම අටුවායෙහි නියමිතය. **ඔළාරිකෙ නිමිත්තෙ** යනු දළ සංඥා ඉපැත්මෙහි, එය දළ සංඥා උත්පාදනයයි. **තිට්ඨතු භගවා කප්පං** යනු මුළු කල්පය සිටින සේක්වා. යම් ආකාර වූ සිටීමේ යාඥාව, **යස්ස කස්සචි ආනඤ්ජසමාධිස්ස චතුන්නං වසීභාවානං චතස්සන්නංරෝ ඉද්ධිපාදා භාවිතා** යනාදියෙන් ක්ෂීණාශ්‍රව භාවයෙන් තමාගේ සිව් ඍද්ධිපාද වැඩීම් ආනුභාවයෙන් කල්පයක් සිටින්ට සමත් බව දැක්වීම ප්‍රකට වචනයෙන් බබලවයි. වචන ක්‍රමය අත්හැර ඍජුවම තම අදහස් පැහැදිලි කිරීම කරන ලදී.

බහුජන හිතාය යනු මහජනයාට හිතසුව සඳහා. බහුජනසුඛාය යනු බොහෝ ජනයාට සුව සඳහා. ලෝකානුකම්පාය යනු සත්ත්ව ලෝකයාට අනුකම්පා හේතුයෙන් කවර සත්ත්ව ලෝකයාටද, යමෙක් භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාව ශ්‍රවණයකොට ධර්මය ප්‍රතිවේධ කරයි. අමාපැන් පානය කරයි. ඒ භාග්‍යවතුන් වහන්සේගේ දම්සක් පැවතුම් සූත්‍ර දේශනායෙන් අඤ්ඤාකොණ්ඩඤ්ඤ ප්‍රමුඛ අටලොස් කෙළක් බ්‍රහ්මයෝ ධර්මය ප්‍රතිවේධ කළහ. මෙසේ සුභද්‍ර පරිව්‍රාජක හික්මවීම තෙක් දහම් ප්‍රතිවේධ කළ සත්ත්වයින්ගේ ගණන් කිරීමක් නැත. (ගණන් කළ නොහැක) මහාසමය සූත්‍රය, මංගල සූත්‍රය, චූලරාහුලෝවාද සූත්‍රය සමචිත්ත සූත්‍රය යන මෙම සිව් සූත්‍රයන්ගේ දේශනා කාලයෙහි, සිව්සස් නව ලොවුතුරුදම් අවබෝධයට සත්ත්වයින්ගේ ගණන් පිරිසිදීමෙක් නැත. එම ප්‍රාමාණාතික්‍රාන්ත සත්ව ලෝකයාට අනුකම්පාවෙන් භාග්‍යවතුන් වහන්සේගේ සිටීම වේ. මෙසේ අනාගතයෙහිද වන්නේ යයි අදහසින්

කියයි. දෙව මනුසසානං යනු හුදෙක් දෙවි මිනිසුන්ටම පමණක් නොවේ. අවශේෂ නාග සුපර්ණාදීන්ටද වැඩ පිණිස, හිත පිණිස, සුව පිණිස භාග්‍යවතුන් වහන්සේගේ සිටීම වේ. සහේතුක ප්‍රතිසන්ධික, මාර්ග ඵල සාක්ෂාත් කිරීමෙහි භව්‍ය පුද්ගලයන් දැක්වීමට මෙසේ යූ.සේයි. එහෙයින් අන්‍යයන්ගේද වැඩ සඳහා, හිත සඳහා, සුව සඳහා භාග්‍යවතුන් වහන්සේ වැඩසිටීවායි අර්ථයි. **අත්‍ථාය** යනු මෙලොව සම්පත් සඳහා. **හිතාය** යනු පරලෝ සැපතට හේතුවූ හිත සඳහා, **සුඛාය** යනු නිර්වාණධාතු සුව සඳහා, පළමු හිතසුව ග්‍රහණය සර්ව සාධාරණ වශයෙන් දතයුතුය. **යථාතං මාරෙන පරියුට්ඨිත චිත්තො** යනු මෙහි **තං** යනු නිපාත මාත්‍රයකි. යම්සේ මාරයා විසින් මඬනා ලද සිතැත්තේ, වසා පැතිර සිටි සිතැත්තේ, අන්‍ය කවර හෝ පෘථග්ජනයෙකු එය අවබෝධ කරන්ට නොහැකි වන්නේය. එපරිද්දෙන් අවබෝධ කරන්ට නොහැකි විය යයි අර්ථයි. මාරයා වනාහි යමෙකුගේ කිසියම් විපර්යාසයන් අප්‍රහීනද, ඔහුගේ සිත මැඩපවත්වයි. යමෙකුගේ වනාහි සර්වප්‍රකාරයෙන් දොලොස් විපර්යාස අප්‍රහීණද, ඔහු ගැන කිවයුත්තක්ම නැත. තෙරුන්ගේ විපර්යාස චතුෂ්කයක් අප්‍රහීණය. එහෙයින් ඔහුගේ සිත මැඩපැවැත්වීය. ඔහු වනාහි සිත මැඩපැවැත්වීම කරනුයේ කුමක් කෙරේද? බිය එළවන රූපාරම්මණයක් හෝ දක්වයි. ශබ්දාරම්මණයක් හෝ ශ්‍රවණයකරවයි එයින් සත්ත්වයෝ එය දැක හෝ ශ්‍රවණය කොට හෝ සිහිය අත්හැර ඉවත්කළ මුහුණු ඇත්තාහු වෙති. ඔවුන්ගේ මුවින් අත ප්‍රවේශකොට හෘදය මඩියි. ඉන් විසඥව සිටිත්. මොහු වනාහි තෙරුන්ගේ මුවින් අත පිවිසවන්ට කිමෙක්ද හැකිවන්නෙහිද? බියකරු අරමුණක් දැක්වීය. තෙරහු එය දැක ආලෝක නිමිත්ත අවබෝධ නොකළේය. දන්නේම භාග්‍යවතුන් වහන්සේ කුමක් සඳහා තෙවන වර දක්වා ආමන්ත්‍රණය කළ සේක්ද? මත්තෙහි 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සිටින සේක්වායි ඉල්වාසිටි කල්හි එය නුඹගේම අයහපත් ක්‍රියාවකි. එය නුඹගේම අපරාධයකැයි දෝෂාරෝපනයෙන් සෝකය තුනී කිරීම සඳහාය. මේ තෙමේ මා කෙරෙහි අතිශයින් සිනිඳු හෘදය ඇතියේ හෙතෙම මත්තෙහි භූමි චලන කාරණයද **ආයු සංස්කාර** අත්හැරීමද අසා, මාගේ චිරස්ථායිත්වය සඳහා යදින්නේය. මම ඔහුට කුමක් හේතුකොට නුඹ පළමුකොටම, නොයැදිදැයි ඔහුගේම හිසෙහි දොස් හෙළන්නෙමි. සත්ත්වයෝද තමාගේ අපරාධයෙන් එසේ පීඩාවට පත් නොවෙති. එහෙයින් ඔහුගේ සෝකය තුනීවන්නේය. **ගච්ඡ ත්වං ආනන්‍ද** යනු යම්හෙයකින් දිවා විහරණය සඳහා මෙහි පැමිණියෙහිද, එහෙයින් ආනන්දය නුඹ කැමති තැනකට දිවා විහරණය සඳහා යව.

එහෙයින් **යසසදානි කාලං මඤ්ඤසි මාරො පාපිමායි** කීයේය. මෙහි සත්ත්වයින් අනර්ථයෙහි යොදවමින් මරයිනුයි **මාරොයි. පාපිමා** යනු ඔහුටම පර්‍යාය වචනයයි. ඔහු වනාහි පාපධර්මයෙන් යුක්ත හෙයින් පාපිමා යැයි කියයි. **භාසිතා බො පනෙසා** යනු මොනු වනාහි භාග්‍යවතුන් වහන්සේ බෝමැඩ සත් සතියක් ඉක්මවා අජපාල නුගරුකමුල වසන කල්හි තම දූවරු අවුත්, අදහස් නැස්මට පත්ව ගියකල්හි මොනුට මෙම උපාය ඇතැයි සිතා අවුත්, භාග්‍යවතුන් වහන්ස, ඔබ විසින් යම් කරුණක් සඳහා පාරමීන් පුරන ලදද? ඔබගේ එම අර්ථය පැමිණියේය. (මුදුන්පත් විය.) සර්වඥතා ඥානය ප්‍රතිවේධ කරන ලදී. ඔබට ලෝකයෙහි හැසිරීමෙන් (විසීමෙන්) කවර ප්‍රයෝජනයෙක්දැයි කියා ස්වාමිනි, දැන් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පාන සේක්වායි යාඥා කළේය. භාග්‍යවතුන් වහන්සේද ඔහුට මා ඒ තාක් නොවෙමියි ආදිය වදාරා ප්‍රතික්ෂේප කළේය. ඒ සඳහා **'භාසිතා බො පණ'** ආදිය වදාළහ. එහි **වියතතා** යනු ආර්ය මාර්ගාධිගම වශයෙන් දක්ෂ වූ, **විනීතා** යනු කෙලෙස් විනාශ කිරීමෙන් විනීත වූ, **විසාරදා** යනු කාමාදීන්හි ඇලීම් ආතිකරන දෘෂ්ටි විචිකිච්ඡා ආදීන්ගේ ප්‍රහාණයෙන් නිපුණ වූ, බහුසසුතා යනු ත්‍රිපිටක වශයෙන් බොහෝ වූවක් අසන ලද්දේ ඔවුන්ටනුයි බහුසසුතායි. එම ධර්මයම දරත්නුයි ධම්මධරායි. නොහොත් බහුසසුතා යනු පර්‍යාප්ති බහුශ්‍රැතතාවයද, ප්‍රතිවෙධ බහුශ්‍රැතතාවයද වේ. ධම්මධරා යනු පර්‍යාප්ති ධර්මයන්ගේද ප්‍රතිවේධ ධර්මයන්ගේද ධාරණය කරන හෙයින් ධම්මධරායි. මෙසේද මෙහි අර්ථය දතයුතුය. **ධම්මානුධම්ම පටිපනනා** යනු ආර්ය ධර්මයෙහි පරිපූර්ණත්වය සඳහා වන නීති පද්ධතිය වූ විදර්ශනා ධර්මයට පිළිපන්, **සාමීචි පටිපනනා** යනු ඤාණ දර්ශන විශුද්ධියට සුදුසු වූ විශුද්ධි පරම්පරා ප්‍රතිපදාවට පිළිපන්, **අනුධම්ම චාරිනො** යනු මනාව කෙළෙස් තුනී කිරීම සඳහා එම ප්‍රතිපදාවට අනුරූප අල්පේච්ඡතාදී ධර්මයෙහි හැසිරෙන සුළු, **සකං ආචරියකං** යනු තම ආචාර්යවාදය. **ආචිකඛිසසනති** යනු මුලසිට කියන්නාහ. තමා උගත් ක්‍රමයෙන් අන්‍යයාට උගන්වන්නාහයි අර්ථයි. **දෙසෙසසනති** යනු කියවන්නාහ. පාලි ධර්මය අවබෝධ කරවන්නාහුයයි අර්ථයි. **පඤ්ඤාපෙසසනති** යනු දැනුවත් කරන්නාහ. ප්‍රකාශ කරන්නාහයි අර්ථයි. **පටඨපෙසසනති** යනු පිළිවෙළින් තබන්නාහ. **විවරිසසනති** විවර කරන්නාහ. **විභජිසසනති** මනාකොට බෙදීම කරන්නාහ. **උතතානී කරිසසනති** යනු නොපැහැදිලි ගැඹුරු දේ පැහැදිලි, ප්‍රකට කරන්නාහ. **සහධම්මෙන** යනු හේතු සහිත, කරුණු සහිත වචනයෙන්, **සපපාටිහාරියං** යනු නෛර්‍යාණික වනතෙක් කොට, **ධම්මං දෙසෙසසනති** යනු අවබෝධ

කරවන්නාහ. ප්‍රකාශ කරන්නාහයි අර්ථයි. මෙහිද **පඤ්ඤාපෙසසනති** යනාදී ෂට් පදයන්ගෙන් **ෂට්** අර්ථපද දක්වන ලද්දාහ. මූල දෙපදයන්ගෙන් ෂට් ව්‍යඤ්ජන පදයන්ය. මෙපමණෙකින් ත්‍රිපිටක බුද්ධ වචනය මනාව වර්ණනා කිරීම් ක්‍රමයෙන් සංග්‍රහ කොට දක්වන ලදුයේ වේ. නෙත්තිප්‍රකරණයෙහි සියලු ව්‍යඤ්ජනද, අර්ථයදැයි වශයෙන් වූ දොළොස් පද සූත්‍රාන්තයි. **බ්‍රහ්මචරියං** යනු ශික්ෂාත්‍රයය සංගෘහිත සමස්ත සාසන බ්‍රහ්මචර්යාව, ඉද්ධං යනු ධ්‍යානෝත්පාද වශයෙන් සමෘද්ධ වූ. **ඵීතං** යනු අභිඥා සම්පත්ති වශයෙන් සියලු මලින් පිරුණේ වෘද්ධිප්‍රාප්ත වූයේ වේ. **විත්ථාරිකං** යනු පැතිරුණේ, ඒ ඒ දිශා භාගයන්හි පිහිටීම් වශයෙන් **බාහුජඤ්ඤං** යනු මහජනයා විසින් අවබෝධ කිරීම් වශයෙන් බොහෝ දෙනෙකු විසින් දන්නා ලද අවබෝධ කළ, **පුථුභූතං** යනු සියලු ආකාර වශයෙන් මහත්බවට පැමිණි. කෙසේද යත් යම්තාක් මිනිසුන් විසින්, **සුපපකාසිතං** යනු යම්තාක් ඤාණවන්ත ස්වභාව ඇති දෙවිවරු හා මිනිස්සු සිටිත්ද, ඒ සියල්ලන් විසින් මනාව ප්‍රකාශ කරන ලදැයි අර්ථයි. **අපෙපාසසුකෙකා** යනු නිරුත්සාහ හා සැඟවුණු වීර්ය වනු මැනවි. පවිට, නුඹ වනාහි සත් සතිය ඉක්මවූ තැන් පටන්, ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, පිරිනිවෙන සේක්වා. සුගතයන් වහන්ස, දැන් පිරිනිවෙන සේක්වායි කෑගසමින් ඇවිද්දාහුය. අද පටන් පහ වූ උත්සාහ වෙව. මාගේ පරිනිර්වාණය සඳහා උත්සාහ නොකරවයි කියයි. **සතො සම්පජානො ආයු සංඛාරං ඔසසජි** යනු සිහිය මනාව පිහිටුවීම කොට නුවණින් පිරිසිඳ ආයු සංස්කාරය අත්හළේය. දුරු කළේය. භාග්‍යවතුන් වහන්සේ අතින් මැටි කැටයක් හැරදමන්නාක් මෙන් ආයු සංස්කාරය හැරදැමුයේ නොවේ. තෙමසක් පමණම සමවත් සමවැද ඉන් මතුයෙහි සම නොවදින්නෙමියි සිතක් ඉපදවීය. ඒ සඳහා (ඔසසජි) හැර දැම්මේය යන්න යූ.සේයි. උසසජ්ජි යනුවෙන් ද පාඨයි. කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ කල්පයක් හෝ කල්පාවශේෂයක් සිටින්ට සමත් වූයේ. එතෙක් කල් නොසිට පිරිනිවීම සඳහා මාරයාගේ ඉල්වීමෙන් ආයු සංස්කාරය හැර දැම්මේද? භාග්‍යවතුන් වහන්සේ මාරයාගේ ආයාචනයෙන් ආයු සංස්කාරය හැර නොදැම්මේය. තෙරුන්ගේ යාචනයෙන්ද හැර නොදමන්නේය. තෙමසින් මතු බුදුරදුන් විසින් හික්මවිය යුතු අයගේ අභාවයෙන් ආයු සංස්කාරය හැරදැම්මේය. හික්මවිය යුතු අයගේ හික්මවීම යම්තාක් වේද, ඒතාක් කල් සිටීම භාග්‍යවත් බුදුවරුන්ගේ සිරිතයි. ඔවුහු නොමැති කල්හි හික්මවන්නවුන් කවර හේතුවක් උදෙසා සිටිත්. ඉදින් මාරයාගේ යාචනයෙන් පිරිනිවන් පාන්නේද? බොහෝ කලකට පෙරම පිරිනිවන් පාන්නේය. බෝමැඩෙහිදීද මාරයා විසින්

යාඥාකරන ලදී. නිමිත්ත හා ආලෝකකරණයද, තෙරුන් සෝකය තුනී කිරීම සඳහා යැයි මම අර්ථය යූ.සේයි. තවද බුද්ධබල දැක්වීම සඳහාද නිමිත්ත හා ආලෝකකරණයද වේ.

මෙසේ භාග්‍යවත් බුදුවරු මහානුභාවයහ. සිටිනුයේද තම රූපයෙන්ම සිටිත්. පිරිනිවෙන්නහුද තමාගේ කැමැත්තෙන්ම පිරිනිවෙත්. **මහා භූම්චාලෝ** යනු මහා පෘථිවි කම්පනයක්, එකල්හි වනාහි දසදහසක් ලෝදාකම්පා විය. **හිංසනකෝ** යනු බියජනක, දෙව දුන්දුභියොව එලිංසු යනු දිව්‍යබෙර නාද කළහ. වැස්ස වියලි ගර්ජනයක් ගර්ජනා කළේය. අකල් විදුලිය නික්මුනි. ක්ෂණික වැස්සක් වැස්සේයයි යූ.සේයි. **එතමත්ථං විදිත්වා** යනු එම සංස්කාරයන්ගේ විසංස්කාර විශේෂ සංඛ්‍යාත අර්ථය සර්වාකාරයෙන් දැන, **ඉමං උදානං** යනු ශේෂ රහිතව සංස්කාරයන් අත්හැර තමාගේ සංස්කාරයන්ගේ වෙන්වීම් සංඛ්‍යාත ගමන දැක්වීමට උදන් ඇනූ සේක. මාරයා විසින් පසුපස ලුහුබැඳ, ස්වාමීනි පිරිනිවෙනු මැනව, පිරිනිවෙනු මැනවැයි හිරිහැර කරන ලදුයේ බියෙන් භාග්‍යවතුන් වහන්සේ ආයු සංස්කාරය අත්හළේ යයි කිසිවෙක් නම් කියන්නේද? එයට අවකාශයක් නොවේවා. බියපත් වූවහුට උදානයක් නම් නැතැයි ප්‍රීතියෙන් මුදාහළ උදන් ඇනූසේකැයි අටුවාවන්හි යූ.සේයි. ඉන් තෙමසක් පමණ වූම බුදුකිසෙහි නිපදනා හෙයින්, මෙසේ බොහෝ කලක් මවිසින් පරිභෝග කරන ලද මෙම දුක්බර නොබෝ කලෙකින්ම බහා තබනු ලැබෙයයි දක්නා කල්හි පිරිනිවන් ගුණ ප්‍රත්‍යවේක්ෂා කරන එතුමාණන්ට මහත් ප්‍රීති සොම්නසක් උපනි. එම ප්‍රීති වේගයෙන් උදන් ඇනියයි යෙදුනා මෙනි. ඒකාන්තයෙන්ම විසංස්කාර නිමින නිර්වාණාධ්‍යාශය ඇති ශාස්තෘන් වහන්සේ විසින් මහා කරුණාවෙන් බලහත්කාරයෙන් මෙන් සත්ත්වහිත පිණිස ලෝකයෙහි පිරිසිදු බව තබන ලදී. එසේම දිනපතා සූවිසිකෝටි ලක්ෂ සංඛ්‍යාත සමවත් පරිභෝග කරයි. එතුමාණෝ දැන් මහා කරුණා සමාපත්තියෙන් නිපන් හෙයින් නිර්වාණාභිමුඛව අනල්ප ප්‍රීති සොම්නස් විඳියි. එහෙයින්ම භාග්‍යවතුන් වහන්සේගේ කෙලෙස් පිරිනිවන් දිනයෙහි මෙන් ස්කන්ධ පරිනිර්වාණ දිනයෙහිද ශරීරාලෝකය විශේෂයෙන් මනාව ප්‍රසන්න පිරිසිදු, ප්‍රභාශ්වර වූයේය. ගාරාවෙහි බලු, සිවල් ආදීන්ටද, ප්‍රත්‍යක්ෂ භාවයෙන් සමාන වූයේ පිරිසිදින ලද්දේ නුයි - තුලංයි. කාමාවචර කර්මයයි. සමාන නුවූයේ අතුලජය. ඔහුට සම අන්‍ය ලෞකික කර්මයක් නැත්තේනුයි අතුල්‍යයි. මහද්ගත කර්මයයි. කාමාවචර හෝ රූපාවචර තුල්‍යයි. අරූපාවචර අතුල්‍යයි.

අල්ප විපාක හෝ තුල්‍යයයි. බොහෝ විපාක ඇත්තේ අතුල්‍යයි. **සම්භවං** යනු භවගැන්මට හේතු වූ, උපත් ජනනය කරයි යන අර්ථයි. **භව සංඛාරං** යනු පුනර්භව හේතු රැස්කිරීමයි. **ඔසඤ්ඤි** යනු අත්හළේය. **මුනි** යනු බුද්ධමුනියි. **අජ්ඣත්තරතෝ** යනු ඒ ස්වකීය අධ්‍යාත්මයෙහි ඇලුනේ, සමාහිතෝ යනු උපචාර අර්පණා සමාධි වශයෙන් සමාහිත වූයේ, **අභින්දි කවචමිව** යනු සන්නාහයක් මෙන් සිඳලිය. **අත්තසම්භවං** යනු තමා කෙරෙහි හටගත් කෙලෙස් සමූහය, මෙය යූ.සේයි. විපාක සහිතාර්ථයෙන් ඉපැත්ම භවයක් පාසා රැස්කිරීම් අර්ථයෙන් භව සංස්කාරයැයි ලද නම් ඇති, තුල්‍ය අතුල්‍ය සංඛ්‍යාත ලෞකික කර්මය ද හැර දැමීය. යුදබිමෙහි මහා යෝධයෙන් යුද සන්නාහය බිඳ දමන්නාක් මෙන් තමා කෙරෙහි හටගත් කෙලෙස්ද අධ්‍යාත්මයෙහි ඇලුනේ, සමාහිත වී බිඳ දැමීය. නොහොත් තුලං යනු තුලනය කරනුයේ, තීරණය කරනුයේ, **අතුලං සම්භවං** නිර්වාණයද භවයද, භවසංඛාරං යනු භවගාමී කර්මයයි. **ඔසඤ්ඤි මුනි** යනු පංචස්කන්ධ අනිත්‍යහ. පංචස්කන්ධයන්ගේ නිරෝධය නිර්වාණය නිත්‍යයයි ආදී ක්‍රමයෙන් තුලනය කරනුයේ බුද්ධමුනි තෙම භවයෙහි ආදීනවද, නිර්වාණයෙහි අනුසස්ද දැක, එම ස්කන්ධයන්ට මූලික හේතුව වූ භව සංස්කාර කර්මය 'කර්මක්ෂය සඳහා පවතී'යයි මෙසේ කියන ලද කර්මක්ෂය කර ආර්ය මාර්ගයෙන් හැර දැම්මේය. කෙසේද යත්, අජ්ඣත්තරතෝ සමාහිතෝ අභින්දි කවචමිව අත්ත සම්භවං හෙතෙම විදර්ශනා වශයෙන් අධ්‍යාත්මයෙහි ඇලුනේ සමථ වශයෙන් සමාහිතයැයි මෙසේ පූර්ව භාගයෙහි පටන් සමථ විදර්ශනා බලයෙන් සන්නාහයක් මෙන් ආත්මභාවය හාත්පසින් වෙලාසිටි තමා කෙරෙහි හටගත් හෙයින් ආත්ම සම්භව යැයි ලද නම් ඇති සියලු කෙලෙස් දැල බින්දේය. කෙලෙස් අභාවයෙන්ම කර්මය අප්‍රතිසන්ධික හෙයින් හැරදමන ලද්දේ නම් වේ. මෙසේ කෙලෙස් ප්‍රහාණයෙන් කර්මය දුරු කළේය. මෙසේ බෝධි මූලයෙහිදීම හරනා ලද භව සංස්කාර ඇති භාග්‍යවතුන් වහන්සේ බාධා මිශ්‍රිත දිරාගිය ගැලක් මෙන්, සමවත් බාධා මිශ්‍රිත ආත්මභාවය යැපෙනුයේද, මින් තෙමසකින් මත්තෙහි සමවත් බාධා එයට නොදෙමියි චිත්තෝත්පාද වශයෙන් ආයු සංස්කාරය හළේය.

ප්‍රථම සූත්‍ර වර්ණනාව නිමියේ ය.

6-2

දෙවැන්නෙහි, **බහිඳ්වාර කොට්ඨකෙ** යනු ප්‍රාසාද දොර කොටුවට පිටත, විහාර දොරකොටුවෙහි නොවේ. එම පහය ලෝහ පහයක් මෙන් භාත්පස සිව් දොරකොටු පිරිවරන ලදුයේ පවුරෙන් වටකරන ලද්දේය. ඒවා අතර නැගෙනහිර දොර කොටුයෙහි පිටත පහ සෙවනෙහි නැගෙනහිර ලෝදා බලමින් පනවන ලද උතුම් බුද්ධාසනයෙහි වැඩහුන්නේ වේ. **ජටිලා** යනු ගෙතුණු හිසකෙස් ඇතියහු, තවුස් වෙස්ධාරීහු, **නිගණ්ඨා** යනු ශ්වේත වස්ත්‍ර හැඳි නිර්ග්‍රන්ථ (කෙලෙස් ගැට නැති) රූපධාරීහුද, **එකසාටකා** යනු ඒකසාටක නිගණ්ඨයන් මෙන්, එක් දිරූ රෙදිකඩක් අතෙහි බැඳ එහි එක් කෙළවරකින් ශරීරයෙහි ඉදිරිපස වසා සරණාහු, **පරූළ්හ කච්ඡනඛ ලොමා** යනු වැඩුණු කිසිලි ලොම්ද, වැඩුණු නියද, වැඩුණු සෙසු ලොම්ද, කිසිලි ආදීන්හු දිග ලොම් දිග නිය යයි අර්ථයි. **බාරිං විවිධ මාදාය** යනු විවිධාකාර උර - නානාප්‍රකාර පැවිදි පිරිකර පොදි රැගෙන, **අවිදූරෙ අනිකකමනති** යනු විහාරයට නුදුරු මගින් නුවරට පිවිසෙති. **රාජාහං භනෙත පසෙනදි කොසලො** යනු ස්වාමීනි, මම ප්‍රසේනජිත කොසොල් රජ වෙමි. මාගේ ඔබතුමන් දන්නහුද? කවර හෙයින් වනාහි රජු ලොවැ අග්‍ර පුද්ගලයාගේ සමීපයෙහි හුන්නේ මෙබඳු නග්න ගොතු නිශ්‍රිතයින්ට ඇදිලි බැඳීද? සංග්‍රහ කිරීම සඳහාය ඔහුට මෙසේද අදහසක් විය. ඒ මම මෙපමණ තරම් දෙයක් නොකරන්නෙම් නම්, අප අඹුදරුවන් අත්හැර මොහුගේ වැඩ සඳහා දුබොදුන් දුශ්සයනයන් අනුභව කරමු. මේ තෙමේ අපට සමීප වීම් මාත්‍රයක් හෝ නොකරයි. එය කළ කල්හි අප නීව පැවතුම් ඇත්තෝ යයි ජනයා ගණන් නොගෙන නිසිමග පිළිපන් ප්‍රව්‍රාජිතයෝම යයි හඳුනන්නාහ. කිමෙක්ද මොහුගේ ස්වාභාවික තත්ත්වය කියමුයි, තමා විසින් දුටු, ඇසූ දෙය වසා දමා නොකියන්නාහුද? එසේ කළ කල්හි නොසඟවා කියන්නාහ. තවද ශාස්තෘන් වහන්සේගේ අදහස දැනගැනීම සඳහාද මෙසේ කළේය. රජුද භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹෙනුයේ ද ටික කලක් සම්‍යක් සම්බෝධිය නොඇදහිය. එහෙයින් ඔහුට මෙබඳු සිතක් විය. මවිසින් මොවුන්ට ගෞරව කිරීම්කොට මොව්හු රහතුන් යයි කී කල්හි, ඉදින් භාග්‍යවතුන් වහන්සේ සියල්ල දනිද, නොඅනු දන්නේය. ඉදින් මා හා එකඟ වී එය අනුමත කරන්නේද? ඔහුට සර්වඥතාවයක් කොයින්දැයි මෙසේ හෙතෙම ශාස්තෘන් වහන්සේගේ අදහස් දැනගැනීම සඳහා එසේ කළේය. භාග්‍යවතුන් වහන්සේ වනාහි සෘජුවම මොව්හු ශ්‍රමණයෝ

නොවේ. නීච පැවතුම් ඇත්තෝ යයි කී කල්හි ඉදින් රජු අදහාද? මහජනයා වනාහි එකරුණ නොදන්නේ නොඅදහන්නේය. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ, රජුට තම කථාව ශ්‍රවණය කෙරේයයි **යම්කිසි** කටට ආවක් කියයි යයි කියන්නේය. එය ඔහුට බොහෝකලක් අහිත පිණිස දුක් පිණිස පවත්නේය. රජුගේද සැඟවුණ ක්‍රියාව ප්‍රකට කරන ලදුයේ වන්නේය. රජු තෙමේම ඔවුන්ට අවවාද දෙන බව කියන්නේ යයි දැන **දුජ්ඣානං බො එතං** ආදිය වදාළහ. එහි **පුත්ත සම්බාධ සයනං** යනු පුත්‍රයන්ගෙන් හටගන්නා පීඩා සහිත සයනය, මෙහිද පුත්‍ර ශීර්ෂයෙන් අඹුවගේ ග්‍රහණයද වේ. අඹුදරුවන් කෙරෙහි සත්‍යයක් මෙන් පෙනෙන ඔවුන් කෙරෙහි පවත්නා රාගාදී හේතුවෙන් සෝකයෙන් මැඩීම් ආදී සිතෙහි කිළිටිවීම් ආදිය දක්වයි. **කාම භොගිනො** යන මෙයින් රාගයෙන් සිත මැඩ පැවැත්වීම, දෙකරුණින්ම වික්ෂිප්ත චිත්තතාවය දක්වයි. **කායික චඤ්ඤනං** යනු සියුම් සඳුන්, කසී වස්ත්‍රද සඳුන්ද යන අර්ථයි. **මාලා ගන්ධ විලෙපනං** යනු වර්ණ හා සුවඳ සඳහා මල් ද සුවඳවත් භාවය සඳහා සුවඳ ද, හම වර්ණවත් කිරීම සඳහා විලවුන් දරන්නහු විසින්, **ජාතරූප රජතං** යනු රන් රිදී හා ඉතිරි ධනය **සාදියනෙතන** යනු පිළිගන්නහු විසින් සියල්ලෙන්ම කාමයන්හි අතිශයින් ගිජුබවම ප්‍රකාශ කරයි. **සංවාසෙන** යනු සමග විසීමෙන්, **සීලං** වෙදිතබ්බං යනු මොහු සිල්වතෙකියි හෝ මොහු දුසිලෙකැයි හෝ එක්ව වසන්නහු විසින්, එක් තැනක සමග වසන්නහු විසින් දතයුතුය. **තංච බො දීඝෙන අද්ධුනා** යනු එම සීලයද දීර්ඝ කාලයකින් දතයුතුය. ස්වල්ප දිනකින්, කිහිප දිනකින් නොවේ. හික්මුණු ආකාරයද, වැසූ ඉඳුරියන්ගේ ආකාරයද වී දක්වන්ට හැකිය. **මනසිකරොතා නො අමනසිකරොතා** යනු එයද මොහුගේ සීලය පරීක්ෂා කරන්නෙමියි මෙනෙහි කරන්නහු විසින්, පරීක්ෂා කරන්නහු විසින් දැනගන්ට හැකිය. එසේ නොකරන්නහු විසින් නොවේ. **පඤ්ඤවතා** යනු එයද නුවණැති ප්‍රඥා සහිතයෙකු විසින්මය. අඥය, වනාහි මෙනෙහි කරනුයේ දැනගන්ට නොහැකි වේ. **සංවොහාරෙන** යනු කථා කරන්නහු විසින්

යොහි කොචි මනුසෙසසු - වොහාරං උපජීවති
එවං වාසෙට්ඨ ජානාහි - වාණිජෝ සො න බ්‍රාහ්මණොති

මිනිසුන් අතර, යම්කිසිවෙක් වෙළඳමෙන් ජීවත් වේද, වාසෙට්ඨය, ඔහු වෙළෙන්දෙකියි මෙසේ දනුව. ඔහු බ්‍රාහ්මණයෙක් නොවේ.

මෙහිද වාණිජ්‍යය වොහාර නමැ. සිව් ආර්ය වොහාර යන මෙහි චේතනාවයි. **සංඛා සඤ්ඤා පඤ්ඤතති** වොහාර යන තැන ප්‍රඥප්තියයි. වොහාර **මත්තෙන** සෝ වොහරෙය්‍ය යන මෙහි කථා ව්‍යවහාරයයි. මෙහිද එයම අදහස් කරන ලදී. ඇතැමෙකුගේ හමුයෙහි කථා අසමුයෙහි කථාව හා සම නොවේ. අසමුයෙහි කථා හමුයෙහි කථාවටද, එසේම පෙර කථා පසුකථාවටද පසුකථාව පෙර කථාවටද සම නොවේ. හෙතෙම කථා කරනුයේම එම පුද්ගලයා අපවිත්‍ර පුද්ගලයෙකැයි දැනගන්ට හැකිය. පිරිසිදු සිල්වත්හුගේ වනාහි පෙරකථාව පසුකථාවෙන්ද පසුකථාව පෙරකථාවෙන්ද, හමුයෙහි කියන ලද්ද නොහමුයෙහි කියන ලද්දේන්, නොහමුයෙහි කියන ලද්ද හමුයෙහි කියන ලද්දෙන්ද සම වේ. එහෙයින් කථා කරන්නහුගෙන් පිරිසිදු බව දැනගන්ට හැකියැයි ප්‍රකාශ කරනුයේ **සංවොහාරෙන සොචෙය්‍යං** වෙදිතබ්බංයි වදාළහ. **ඨාමෝ** යනු ඤාණ ශක්තිය යමෙකුට වනාහි ඤාණ ශක්තියක් නොමැතිද? හෙතෙම උපද්‍රවයන් හටගත් කල්හි, ගතයුතු දේද, අත්හළ යුතු දේද යන කිසිවක් නොදක්නේ දොර රහිත ගෘහයට පිවිසුනෙකු මෙන් හැසිරේ. එහෙයින් **ආපදාසුඛො මහාරාජ ඨාමෝ වෙදිතබ්බොයි** වදාළහ. **සාකච්ඡා** යනු එකතුව කථා කිරීමයි. දුෂ්ප්‍රාඥයාගේ කථාව වනාහි දියෙහි හෙලන ලද මැටි කැටයක් මෙන් ඉල්පී නොයේ. පැණවත්හුගේ කථාව කරන කල්හි වැටහීම අනතුරුව වේ. දිය කැළඹෙන අවස්ථාවෙහිදී මත්ස්‍යයා කුඩාද මහත්දැයි හැඟේ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ රජුට සෘජුවම ඔව්හු මෙනම් අයයැයි නොකියා, රහතුන්ගේද, නොරහතුන්ගේද දැනගන්නා ක්‍රමය ප්‍රකාශ කළ සේක. රජු එය අසා භාග්‍යවතුන් වහන්සේගේ සර්වඥතාවයෙන්ද, දේශනා විලාසයෙන්ද අතිශයින් ප්‍රසාදයට පත්වූයේ, **අච්ඡරියං හනෙතයි** ස්වාමීනි, ඉතා ආශ්චර්යයෙකැයි ආදියෙන් තම ප්‍රසාදය ප්‍රකාශකොට දැන් ඔටුන් පිළිබඳ තත් වූ පරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේට සැළ කරනුයේ, **එතෙ හනෙත මම පුරිසා චොරා** යනාදිය කීයේය. එහි **චොරා** යනු ප්‍රව්‍රජිත නොවූයේම ප්‍රව්‍රජිත ස්වරූපයෙන් රටවැසියාගේ, පිණ්ඩාහාරය අනුභව කරන්නාහු සඟවන ලද ක්‍රියා ඇති හෙයින්, **ඔචරකා** හට හැසිරෙන්නාහු, සොරු වනාහි කඳු මුදුනින් හැසිරෙන්නාහුද, යට හැසිරෙන්නාහුමය. පහත් ක්‍රියා හෙයිනි. නොහොත් ඔචරකා යනු චර පුරුෂයෝය. **ඔචරිච්චා** යනු හැසිර විමසා, ඒ ඒ දේශයන්හි ඒ ඒ ප්‍රවෘත්ති දැනයයි අර්ථයි. **ඔසාදිස්සාමි** යනු පිළිපදින්නෙමි. කරන්නෙමියි අර්ථයි. **රජෝ ජල්ලං** යනු දුහුවිලිද මලකඩද, **පවාහෙච්චා** යනු මනාව සෝදා හැරීම් වශයෙන් ඉවත්කොට, **කප්පිත කෙසමස්සු** යනු අලංකාර ශාස්ත්‍රයෙහි කියන ලද

ආකාරයෙන් කරණවෑමියන් ලවා සිඳින ලද කෙහෙ රවුළු ඇත්තේ කාමගුරොහි කාම කොටස්වලින්, කාමබන්ධනයන්ගෙන් **සමපපිතා** යනු මනාව ඇතුලට වැදුණු, ඇලුණු, **සමංගිභූතා** යනු එක්වූවාහු, **පරිචරිසසනත** යනු ඉන්ද්‍රියයන් හාත්පස හසුරුවන්නාහ. **ක්‍රීඩා** කරවන්නාහ. **එතමතථං විදිතවා** යනු එය එම රාජපුරුෂයන්ගේ, තම උදර කාරණයෙන් පැවිදි වෙසින් ලෝවැස්සා වංචා කිරීම් සංඛ්‍යාත අර්ථය දැන. **ඉමං උදානං** යනු මෙම අන්‍යයාට යටත්වීම, අනෙකා වංචා කිරීම ප්‍රතික්ෂේපය දැක්වීමට උදන් ඇනූ සේක. එහි **න** වායමෙය්‍ය දූත ක්‍රියා, පහත් පැවතුම් ක්‍රියා ආදී සියලුම පාපකර්මයන්හි මොව්හු රාජපුරුෂයෝ මෙන් පැවිදි වූයේ එම ක්‍රියා සඳහා ව්‍යායාම නොකරන්නේය. ව්‍යායාම උත්සාහ නොකරන්නේය. හැමතන්හි යම්කිසි තැනක ව්‍යායාම නොකොට අල්පමාත්‍ර වූද, පුණ්‍යකර්මයන්හිම ව්‍යායාම කරන්නේ යයි (කරනු මැනවැයි) අදහසයි. **නාඤඤසස පුරිසො සියා** යනු ප්‍රවෘජිත ස්වරූපයෙන් අන් පුගුලෙකුගේ සේවක පුරුෂයකු නොවන්නේය. කුමක් හෙයින්ද යත්, මෙබඳු වූ නීච පැවතුම් ඇති පවිකම් කළයුතු හෙයිනි. **නාඤඤං නිසසාය පීවෙය්‍ය** යනු අන් පුද්ගලයෙකුගේ ඓශ්වර්ය හේතුවෙන් ඔහු හා බද්ධවම සුවදුක් ලබමියි මෙවන් සිත්ව ජීවිතය නොපවත්වන්නේය. තමහට තමා ආලෝකයක්ව, තමා හට තමා පිළිසරණක්ව අන්‍ය සරණක් නොමැති වන්නේය. නොහොත් අනර්ථ එළවන හෙයින් නීච පැවතුම් යයි ලද නම් ඇති අන්‍ය අකුසල කර්මයක් හේතුකොට ජීවත් නොවන්නේය. **ධමෙමන න වාණිජජං චරෙ** යනු ධන ආදිය සඳහා ධර්මය නොදෙසන්නේය. යමෙක් ධන ආදී හේතුවෙන් අන්‍යයාට ධර්මය දේශනා කරයිද, හෙතෙම ධර්මයෙන් වෙළඳම් කරයි නමැ. මෙසේ ධර්මයෙන් නොහැසිරෙන්නේය. නොහොත් ධනාදිය සඳහා කොසොල් රජුගේ පුරුෂයන් මෙන් හීන චර පුරුෂ ආදී ක්‍රියා කරනුයේ අන්‍යයන් විසින් සැක නොකරන ස්වභාවයෙන්, ප්‍රවෘජ්‍යා ආකාර සමාදන්වීම් ආදියෙහි උත්සාහ නොකරනුයේ දැහැමින් වෙළඳම් කරයි නමැ. යමෙක් මෙලොව පිරිසිදු බඹසර සරනුයේද එක්තරා දේව නිකායක් බලාපොරොත්තුවෙන් බඹසර හැසිරේද, ඔහුද දැහැමින් වෙළඳම් කරයි නමැ. මෙසේ ධර්මයෙන් වෙළඳමෙහි නොහැසිරෙන්නේය. නොකරන්නේ යයි (නොකළ යුතුයයි) අර්ථයි.

දෙවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

6-3

තෙවැන්නෙහි **අතතනෝ අනෙකෙ පාපකෙ අකුසලෙ ධම්මෙ පහීනෙ** යනු ලෝභ, ද්වේෂ, මෝහ විකෘති මෙනෙහි කිරීම්, පවට ලජ්ජා නොවීම, පවට බිය නොවීම, ක්‍රෝධය, වෛරය, ගුණමකු බව, දුශ්චකම, ඊර්ෂ්‍යාව, මසුරුකම, මායාව, කපටිකම, කණුවක් මෙන් සිටීම, එකටෙක කිරීම, මානය, අතිමානය, මත්වීම, ප්‍රමාදය, තෘෂ්ණා, අවිද්‍යා, ත්‍රිවිධ අකුසල මූලයන්, දුශ්චරිත, කිලිටිකර ධර්මයන්ට මුල්වූ විකෘති සංඥා, විතර්ක, ප්‍රමාද, චතුර්විධ විපර්යාසයන්, ආශ්‍රව, ඕඝ, යෝග, ඡන්දයෙන් අගතියට යාම, තෘෂ්ණා උපාදාන පංචවිධ චෙතොඛිලයන්, පස්වැදෑරුම් චිත්ත විනිබන්ධයන් නීවරණයන්ට සතුටුවීම, ෂට් විවාද මූලයන්, ෂට් තෘෂ්ණා කායයන්, සප්තානුසයන් අෂ්ඨ මිථ්‍යත්වයන්, නව තෘෂ්ණා මූලකයන්, දශ අකුසල කර්මපථයන්, දෙසැටක් දෘෂ්ටිගතයන් අටසියයක් තෘෂ්ණා විචරිතාදී ප්‍රභේදයන්, තම සතන්හි අනාදිමත් කල්පටන් පවත්නා යෙළඳහස් පන්සියයක් කෙලෙස් ඒ හා යෙදුනා වූ නොයෙක් පාපී ලාමක, අදක්ෂතාවයෙන් හටගත් යන අර්ථයෙන් වූ අකුසල ධර්මයන් සේස රහිතව අතීත ප්‍රවණතා සහිතව, බෝමැඩදීම ප්‍රහීණ කරන ලදුයේ ආර්ය මාර්ගයෙන් මොනවට සිඳින ලදුයේ ප්‍රත්‍යවේක්ෂා කරනුයේ මාගේ මෙම කෙලෙස්ද ප්‍රහීණය. මෙම කෙලෙස් ද ප්‍රහීණයැයි වචනයක් පාසා මනාව බැලීමෙන් ප්‍රත්‍යවේක්ෂා කරමින් භාග්‍යවතුන් වහන්සේ වැඩහුන්නේ වේ. **අනෙකෙ පිව කුසලෙ** ධම්මෙ යනු සීල, සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්ති ඥාන දර්ශන, සිව්සීවටන්, සිව් සම්මප්පධන්, සිව් ඍද්ධිපාද සිව් ආර්ය මාර්ග, සිව්ඵලයන් සිව්පිළිසිඹියා, සිව්යෝනි පිරිසිඳ දන්නා ඥානය, සිව් ආර්ය වංශයන් සිව් වෛසාරද්‍ය ඥානයන්, පස් ප්‍රධානියංග, පංචාංගික සම්‍යක් සමාධිය, පංචංගික සම්‍යක් සමාධිය, පංචෙන්ද්‍රියයන්, පංචබලයන්, පංච නිස්සරණීය ධාතූන්, පංච විමුක්තායතනයන්, පංච විමුක්ති පරිපාචනීය සංඥාවන්, ෂට් අනුස්සතියානයන්, ෂට් ජාගරයන්, ෂට් නිස්සරණ ධාතූන්, ෂට් සප්ත විහාරයන්, ෂට් අනුත්තරියයන්, ෂට් නිර්වේධභාගි ප්‍රඥාව, ෂට් අභිඥාවන්, ෂට් අසාධාරණ ඥානයන් සප්ත අපරිහානිය ධර්මයන් සප්ත ආර්ය ධනයන්, සප්ත බොජ්ඣංගයන්, සප්ත සත්පුරුෂ ධර්මයන්, සප්ත නිජර වස්තූන්, සප්ත සංඥාවන්, සප්ත දක්ෂිණාර්හ පුද්ගල දේශනාවන්, සප්ත ක්ෂීණාශ්‍රව බල දේශනාවන්, අෂ්ඨ ප්‍රඥා ප්‍රතිලාභ හේතු දේශනාවන්, අෂ්ඨ සම්මතයන්, අෂ්ඨ ලෝකධර්ම ඉක්මවීම, අෂ්ට සාරම්භ වස්තූන්, අෂ්ඨාක්ෂණ දේශනාවන්, අෂ්ඨමහා පුරුෂ විතර්ක, අෂ්ඨ අභිභායතනයන්,

අෂ්ඨ විමෝක්ෂයන්, නව යෝනිසෝ මනසිකාර මූලක ධර්මයන්, නව පාරිශුද්ධි පධානියංගයන්, නව සත්තාවාස දේශනාවන්, නව ආඝාත පටිවිනයන්, නව සංඥාවන්, නව නානත්තයන්, නව අනුපුබ්බ විහාර දේශනාවන්, නව නාථකරණ ධර්මයන්, දස කසිණායතනයන්, දස කුසල කර්මපථයන්, දස ආර්යවාසයන්, දස අශෛක්ෂ්‍ය ධර්මයන්, දස තථාගත බලයන්, එකොළොස් මෙත්තානිසංස දොළොස් ප්‍රත්‍යතාවයන්, තෙළෙස් ධුතංග ගුණයන්, තුදුස් බුද්ධඥානයන්, පසළොස් විමුක්ති පරිපාචනීය ධර්මයන්, සොළොස් ආකාර ආනාපාන සතිය, සොළොස් අමෘත පරියාය ධර්ම, සතළොස් චිත්තක්ෂණ ඥානය, අටළොස් මහා විදර්ශනාව, අටලොස් බුද්ධ ධර්මයන්, එකුන්විසි ප්‍රත්‍යවේක්ෂා ඥානයන්, සිව්සාලිස් ඥාන වස්තූන්, පණස් උදයව්‍යය ඥානයන්, පණහකට වැඩි කුසල් දම්, සත් සැත්තෑවක් ඥාන වස්තූන් විසිහතර කෝටි ලක්ෂයක් සමවත්, මහාප්‍රඥා වජ්‍රඥානයන්, අනන්ත නය සමන්තපට්ඨාන විෂය වූ ප්‍රත්‍යවේක්ෂණ දේශනා ඥානයන්, එසේම අනන්ත ලෝකධාතූන්හි අනන්ත සත්ත්වයින්ගේ, ආසය අනුසයයන් පැහැදිලි කරන ඥානයන්දැයි යන මේ ආදී වූ නොයෙක් තම කුසල්හි නිරවද්‍ය ධර්මයන් කෙළවරක් නොමැති කල්, පාරමී භාවිතයෙන්ද, මාර්ග භාවනාවෙන්ද පරිපූර්ණත්වයට වෘද්ධියට ගියකල්හි මේ ආකාර වූ නිරවද්‍ය ධර්මයන් මා කෙරෙහි විද්‍යමාන වෙත්. මෙම නිරවද්‍ය ධර්මයන්ද මා කෙරෙහි විද්‍යමාන වෙතියි කැමැති වීම් වශයෙන් මෙනෙහි කිරීම් අභිමුව බුදුගුණ වර්ග වශයෙන්, රාශි රාශි වශයෙන් ප්‍රත්‍යවේක්ෂා කරමින් හුන්නේ වේ. එයද වනාහි සියල්ල ඇතුලත් වන ලෙසින් සියල්ල ඇතුලත් නොවන ලෙසින් නොවේ. සියලු බුද්ධ ගුණයන් පදයක් පාසා ශේෂරහිතව මෙනෙහි කරන්නට භාග්‍යවතුන් වහන්සේ විසින්ද නොහැකිය. එය අනන්ත අපරිමාන හෙයිනි. යූ.සේයි.

බුද්ධොපි බුද්ධසස භණෙය්‍ය වණණං -
කපපමපිචෙ අඤඤමභාසමානො
බීයෙථ කපෙපා චිරදීඝ මනතරෙ -
වණෙණ නබීයෙථ තථාගතසසානි

බුදුරදහුද, වෙන අන් දැයක් නොකියමින් කල්පයක් වුව බුදුගුණ පමණක් කියන්නේද? (දෙසන්නේද) එම ගුණකථනය දීර්ඝ කාලයක් අතරතුර කරගෙන යද්දී කල්පය ක්ෂය වන්නේය. තථාගතයන් වහන්සේගේ ගුණ ක්ෂය නොවන්නේය.

අනෙකක්ද යූ.සේයි.

අසංඛෙය්‍යානි නාමානි - සගුණෙන මහෙසිනො
ගුණෙන නාමං උද්ධරෙය්‍ය - අපි නාමං සහසසතො

ගුණයෙන් නාමයන් උදුරා දක්වන්නේ නම්, නාමයන් දහසකින්ද නොහැකිය. මහර්ෂීන් වහන්සේගේ ගුණයන් සහිත නාමයන් අසංඛෙය්‍යයි. (සංඛ්‍යාවක් නොමැත.)

එකල්හි භාග්‍යවතුන් වහන්සේ පසුබත පිණ්ඩපාතයෙන් පෙරළා වැඩම කළේ, වෙහෙරට පිවිස ගඳකිළිය ඉදිරිපිට සිට, භික්ෂූන් වත් දක්වා ගියකල්හි මහ ගඳකිළියට පිවිස පණවන ලද උතුම් බුද්ධාසනයෙහි වැඩහුන්නේ තමාගේ අතීත ජාති විෂයකොට ඥානය යැවීය. ඉක්බිති එතුමන් වහන්සේට ඒවා නිරතුරුව හියෙන් විදින ලද ඊතල මෙන් අනන්ත අප්‍රමාණ භේදව වැටහුනහ. එතුමාණෝ මෙබඳු නම් මහ දුක් කඳකට මුල් වූයේ මෙම කෙලෙසුන් යයි කෙලෙස් විෂයයෙහි නුවණ හැසිරවීම යවා, ඒවා ප්‍රහාණ මුඛයෙන් පද අනුව ප්‍රත්‍යවේක්ෂාකොට ඒකාන්තයෙන් මාගේ මෙම කෙලෙස් ශේෂ රහිතව මනාව ප්‍රහීණ වූයේ යයි ද නැවත ඒවාහි ප්‍රහාණ ආකාරය ආකාර සහිතව පිරිවර සහිතව, උදෙසීම් සහිතව ආර්යමාර්ගය ප්‍රත්‍යවේක්ෂා කරනුයේ අනන්තාපරිමාණ භේද වූ තමාගේ සීලාදී නිරවද්‍ය ධර්මයන් මෙනෙහි කළ සේක. එහෙයින් **තෙන බොපන සමයෙන භගවා අතතනො අනෙකෙ පාපකෙ අකුසලෙ ධමෙම පහීනෙ පචචවෙකඛමානො නිසිනෙනාහොති අනෙකෙව කුසලෙ ධමෙම පහීනෙ පචචවෙකඛමානො නිසිනෙනාහොති අනෙකෙව කුසලෙ ධමෙම භාවනා පාරිපූරි කතෙ** යයි යූ.සේයි. මෙසේ ප්‍රත්‍යවේක්ෂා කොට උපන් ප්‍රීති සොම්නස් උදෙසීමක් වූ මෙ උදන් ඇනූ සේක.

එහි **අනු පුබෙබ** යනු අර්හත්මාර්ග ඥානොත්පත්තියෙන් පෙර සියලුම රාගාදී කෙලෙස් සමූහය මාගේ සන්තානයෙහි වීය. මෙම කෙලෙස් සමූහයෙහි කිසියම් ක්ලේශයක් නුවූයේයයි යන්නක් නැත. **තදා** නානු යනු එකල්හි ආර්ය මාර්ගක්ෂණයෙහි එම කෙලෙස් සමූහය නුවූයේය. එහි ඉතා කුඩා වූද ක්ලේශයක් අග්‍ර මාර්ග ක්ෂණයෙහි අප්‍රහීණ වූයේ නම් නැත. තතො නානු යනුවෙන්ද කියවති. අර්හත් මාර්ගක්ෂණයෙන් පසුනොවී යයි අර්ථයි. **නානු පුබෙබ** යනු යම් ආකාර වූ මෙම මාර්ග අප්‍රමාණ නිරවද්‍ය ධර්මයන් වත්මනැ භාවනාවෙන් සම්පූර්ණත්වයට ගියේ ලැබේ. එයද ආර්යමාර්ග ක්ෂණයෙන් පෙර නොවීය. **තදා** අනු යනු යම්කලෙක්හි

වනාහි මට ආර්යමාර්ග ඥානය හටගත්තෙහිද, එකල්හි මා හට සියලුම නිරවද්‍ය ධර්ම වූයේය. අග්‍ර මාර්ගාධිගමයෙන් වනාහි සියලු සර්වඥ ගුණ හස්තප්‍රාප්ත වූයේ මෙන් වෙති. **නචාහු නව භවිසසති නචෙතරහි විජ්ජති** යනු යම් ආකාර වූ එම නිරවද්‍ය ධර්මය වූ ආර්යමාර්ගය මා හට බෝමැඩෙහිදී, උපන්නේද? යමක් කරනකොට සියලු කෙලෙස් සමූහය ශේෂ රහිතව ප්‍රහීණ වූයේද? එය යම්සේ මාගේ මාර්ගක්ෂණයෙන් පෙර නොවීය. මෙසේ තමා විසින් ප්‍රහාණය කළයුතු කෙලෙස් අභාවයෙන් ඒවා කෙලෙසුන් මෙන් නොවන්නේය. අනාගතයෙහි නූපදින්නේය. දැන් වත්මනු විද්‍යමාන නොවේ. තමා විසින් කළයුතු කෘත්‍යයන් අභාව හෙයින් නොලබයි. ආර්ය මාර්ගය නොයෙක් වාරයක් නොපවතියි. එහෙයින් 'පරතෙර දෙගුණව නොයෙක් යයි වදාළේය. භාග්‍යවතුන් වහන්සේ ආර්ය මාර්ගයෙන් තම සන්තානයෙහි ශේෂ රහිතව ප්‍රහීණ අකුසල ධර්මයන් වැඩීමෙන් පූර්ණත්වයට ගියකල්හි අප්‍රමාණ නිරවද්‍ය ධර්මයන්ද ප්‍රත්‍යවේක්ෂා කරනුයේ, තමා කෙරෙහි එළවාගත් ප්‍රීතිවේගයෙන් මුදාහල උදන් ඇනූ සේක. පළමු ගාථාවේ පළමු වෛසාරද්‍ය ද්වයයම කියන ලදී. පශ්චිම ද්වයය සම්‍යක් සම්බෝධියෙහිදී, ප්‍රකාශ කරන ලද හෙයින් ප්‍රකාශ කරන ලදුයේම වේ.

තෙවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

6.4

සිව්වැන්නෙහි, **නානා තිත්ථියා සමණ බ්‍රාහ්මණ පරිබ්බාජකා** යන මෙහි එය කරණකොට සංසාර නමැති සැඩ පහර තරණය කෙරෙන්නුයි තිත්ථංයි. නිර්වාණ මාර්ගයි. මෙහි වනාහි විපරීත විපර්යාස වශයෙන් දෘෂ්ටි ගතිකයින් විසින් එසේ ගන්නා ලද දෘෂ්ටි තීර්ථයයි අදහස් කරන ලදී. එම ශාස්වතාදී නොයෙක් ආකාර තීර්ථයෙහි නියුතු - නොයෙක් තීර්ථකයෝ, නග්න, නිසණ්ඨාදී ශ්‍රමණයෝද කඨ කලාපාදී බ්‍රාහ්මණයෝද, පොක්බරසාති ආදී පරිබ්‍රාජකයෝද, ශ්‍රමණ, බ්‍රාහ්මණ පරිබ්‍රාජකයෝයි. නොයෙක් තීර්ථකයෝම එම සමණ බ්‍රාහ්මණ පරිබ්‍රාජකයෝයි. ආත්මයද, ලෝකයද ශාස්වතයැයි ආදී ක්‍රමයෙන් දකිති. එය කරණකොටගෙන තෙමේ හෝ දකියි. එසේ දර්ශන මාත්‍රයම හෝ දෘෂ්ටියි. වැරදි ඇලීම්වලට

එය විශේෂ නාමයකි. ශාස්වතාදී වශයෙන් නොයෙක් ආකාර දෘෂ්ටීහු ඔවුන්ටනුයි **නානා දිට්ඨිකායි.** ශාස්වතාදී වශයෙන්ම ඉවසීම **ඛන්තියි. කැමැතිවීම රුචි යි.** අර්ථ වශයෙන් වනාහි ආත්මයද ලෝකයද ශාස්වතයැයි ආදී ක්‍රමයෙන් පැවැති චිත්ත විපර්යාසය, හැඟීම් විපර්යාසයද එසේ වූ නොයෙක් ක්‍ෂාන්තීහු ඔවුන්ටනුයි **නානා ඛන්තිකායි.** විවිධ රුචීහු ඔවුන්ටනුයි **නානා රුචිකායි.** දෘෂ්ටි ගතිකයෝ වනාහි පූර්ව භාගයෙහි ඒ ඒ අයුරින් සිත රුචි කරවා ක්‍ෂමා කරවා පසුව, මෙයම **සත්‍යය** අනෙක්වා **හිස්යයි** සිත පිහිටුවති. නොහොත් අනිත්‍යය නිත්‍යය යන ආදි වශයෙන් ඒ ඒ දර්ශන වශයෙන් දෘෂ්ටියි. ඉවසීම් වශයෙන් ක්‍ෂාන්තියි. රුචි කිරීම් වශයෙන් රුචියි. මෙසේ පදත්‍රයයෙන්ම දෘෂ්ටියම යූ.සේයි. නානා දිට්ඨි **නිසසය** නිසසිතා යනු ශාස්වතාදී ඔට කල්පන වශයෙන් විවිධාකාර වූ දෘෂ්ටියට හේතුකාරණ වූ දෘෂ්ටි සංඛ්‍යාත වූම නිශ්‍රය නිශ්‍රිත වූවාහු ඇලුනාහු, තැවරුනාහු, එළැඹියාහු අත්නොහැර සිටියේ යයි අර්ථයි. දෘෂ්ටීහුම දෘෂ්ටිගතිකයින්ට ඇලීම් ආකාරයෙන් නිශ්‍රය වෙති. **සනත** යනු තිබේ. විද්‍යමාන වෙති. ලබත්. **එකෙ** යනු ඇතැම්හු. සමණ බ්‍රාහ්මණා යනු ප්‍රවෘජ්‍යාවට එළැඹීමෙන් ශ්‍රමණයෝ. උපතින් බමුණෝ හෝ ලෝකයා විසින් ශ්‍රමණයැයි හෝ බ්‍රාහ්මණ යැයි හෝ මෙසේ ගන්නා ලද, **එවං වාදිනො** යනු මෙසේ දැන් කිවයුතු ආකාරයෙන්ම කියත්නුයි **එවං වාදිනොයි** දැන් කිවයුතු ආකාරයෙන් පවත්නා දෘෂ්ටි ඔවුන්ටනුයි **එවං දිට්ඨිනො යි.** එහි දෙවැන්නෙන් දෘෂ්ටි ගතිකයින්ගේ වැරදි දෘෂ්ටි පිහිටුවීම දක්වන ලදී. පළමුවැන්නෙන් ඔවුන්ගේ පිහිටුවීමෙහිදී පිහිටුවීම් ප්‍රදේශ වශයෙන් ව්‍යවහාරයයි. **සස්සතො** ලොකො **ඉදමෙව සච්චං මොඝමඤ්ඤං** යන මෙහි **ලොකො** යනු ආත්මයයි. එය වනාහි දෘෂ්ටිගතිකයින් විසින් ලෝකයට අයත් සේ සලකයි. මෙහි පින් පව් හා එහි විපාක තෙමේ හෝ කාරකාදී භාවයෙන් යොදවන්නවුන් විසින් ලෝකයට ඇතුලත් කෙරේනුයි ලෝකයයි අදහස් කරන ලදී. ඒ මෙම ලෝකය ශාස්වතය. අමරය. නිත්‍යය. ස්ථිරය. යම් ආකාර වූ අපගේ දර්ශනයක් වේද, මෙයම සත්‍යය. වෙනස් නොවේ. අනෙක් දෑ වනාහි අශාස්වතයැයි ආදි කොටස් දැක්වීම හිස්ය. මිථ්‍යාය යන අර්ථයි. එම සතරින්ම ශාස්වත වාදය දක්වන ලද්දේ වෙති. **අසසසතො** යනු ශාස්වත නොවූයේ අනිත්‍යය තිර නොවේ. චුත වන ස්වභාව ඇත්තේය යන අර්ථයි. අශාශ්වතැයි ශාස්වත අභාව ප්‍රතික්ෂේපයෙන්ම නැවත නොඉපදී ම දක්වන ලදැයි **සත්වැදෑරුම් වූද, උච්ඡේද** වාදය දක්වන ලද්දේ වෙති. **අනතවා** යනු කෙළවර සහිත රවුම් පිරිසිදි ප්‍රමාණය, සියල්ල ඉවත් කළේයයි අර්ථයි. ඉන් පාද ප්‍රමාණ,

ඇඟිලි ප්‍රමාණ යව ප්‍රමාණ, පරමාණු ප්‍රමාණ ආත්මයැයි දක්වන ලද්දේ වෙති. **න අනතවා** යනු කෙළවර රහිත වූයේ සියල්ල ඇතුලත් වූයේ යයි අර්ථයි. ඉන් කපිල, කණාද[1] ආදී වාදයන් දක්වන ලදුයේ වේ. **තංජීවං තං සරීරං** යනු යම් ආකාර ශරීරයක් වේද එයම ජීව සංඛ්‍යාත වස්තුවයි. යම් ජීව සංඛ්‍යාත වස්තුවක් වේද, එයම ශරීරයැයි ද, ජීවයද ශරීරයද දෙකක් නොවන සේ බලයි. ඉන් ආජීවකයන්ගේ මෙන් රූපය ආත්මයැයි යන මේ වාදය දක්වන ලද්දේ වේ. **අඤ්ඤං ජීවං අඤ්ඤං ශරීරං** යනු මෙයින් ආත්මය අරූපී යයි යන මේ වාදය දක්වන ලද්දේ වේ. **තථාගතො පරමමරණා** යන මෙහි **තථාගතො** යනු ආත්මයයි. එය වනාහි දෘෂ්ටිගතික තෙමේ කාරක වේදිකාදි සංඛ්‍යාත, නිත්‍ය-තිර ආදී සංඛ්‍යාත හෝ එබඳු ස්වභාවයට ගියේනුයි තථාගතයි ව්‍යවහාර කරයි. හෙතෙම මෙහි මරණයෙන් ශරීරයාගේ භේදයෙන් මත්තෙහි ඉහළ වේ. **හොති තිබේ.** විද්‍යමාන වේයයි අර්ථයි. ඉන් ශාස්වත ග්‍රාහී මුඛයෙන් සොළොස් සංඥී වාදයන්ද, අට අසංඥීවාදයන්ද අටවැදෑරුම් නෙවසංඥී නාසංඥී වාදයන්ද දක්වන ලද්දේ වෙති. **නහොති** යනු නොමැත. නොලබයි. එයින් උච්ඡේදවාද දක්වන ලද්දේ වේ. **හොතිව න හොති** යනු තිබේද, නොතිබේද යන එයින් ඇතැම් ශාස්වත වාදයන්ද, සප්තසංඥී වාදයන්ද දක්වන ලද්දේ වේ. **නෙව හොති න නහොති** යන මෙයින් අමරා වික්ෂෙපවාදය දක්වන ලද්දේ වේ. මෙම දෘෂ්ටිගතිකයෝ නන්දෙසින් අවුත් සැවැත්නුවර වසන්නාහු, එක්කලෙක (දිනක) සමය ප්‍රවාදකයින් රැස්ව තම තමන්ගේ වාද දැඩිව ගෙන අන් වාද ගරහන්නාහු විවාදාවතීර්ණ වූහ. එහෙයින් තෙ භඬනජාතා ආදිය යූ.සේයි. එහි **භඬනං** භඬනය නම් කලහයෙහි පූර්ව භාගයයි. **භඬන ජාතා** යනු හටගත් පූර්වභාග කලහය, කලහයම හෝ මිහිරි හඬෙහි නසන බැවින් කලහය දතයුතුය. ඔවුනොවුන්ට විරුද්ධ වාදයට පැමිණියාහුයි. **විවාදපන්නා** යි. මර්මස්ථාන ගටනා හෙයින් මුඛයම ආයුධයක් වූයේනුයි **මුඛසත්ති** යි. එරැස වචනයි. එලය ආසන්න වශයෙන් ගෙන කාරණයද කාරණය ආසන්න වශයෙන් ගෙන එලයද ව්‍යවහාර කෙරේ. එය යම්සේ බුද්ධෝත්පාදය සුවගෙන දේ. පවිකම් විඳින ලදී. එම මුව නමැති ආයුධවලින් විදින්නාහු වාසය කෙරෙත්. **එදිසො ධම්මො** යනු ලෝකය ශාස්වතයයි යම්සේ මා විසින් යූ.සේයිද? එබඳු අවිපරීත ස්වභාවය. **නෙදිසො ධම්මො** යනු ලෝකය අශාශ්වාතයැයි නුඹ විසින් යූ.සේයිද? එබඳු ආකාර ධර්මයක් නොවේ. සෙසු පදයන්හි මෙසේ යෙදිය

---

[1] කපිල - කණාද ආදී වාද යන්නෙන් සාඛ්‍ය දර්ශනයත්, වෛශෙෂික දර්ශනයත් අදහස් කෙරේ.

යුතුය. එම තීර්ථකයින්ගේ විවාදය මුලු නුවර ප්‍රකට විය. ඉක්බිති භික්ෂූහු සැවතට පිඬු පිණිස පිවිසියාහු එය අසා මෙම කථාවෙන් යමක් කීමට අවස්ථාවක් තිබේද? අපි මෙපුවත භාග්‍යවතුන් වහන්සේට සැල කරන්නේ නම් ඉතා යෙහෙකියි ඒකාන්තයෙන්ම එය ඇසිරිකොට ඉතා සියුම් ධර්ම දේශනාවක් ලබන්නෙමුයි පසුබත ධර්මදේශනා කල්හි භාග්‍යවතුන් වහන්සේට එකරුණ සැළ කළහ. එහෙයින් **අථඛො සමබහුලා භිකඛු** ආදිය යූ.සේයි. එය අසා භාග්‍යවතුන් වහන්සේ අන්‍ය තීර්ථකයන්ගේ ධර්මයෙහි අස්වාභාවික විශේෂ දැනුම ප්‍රකාශ කරනුයේ **අඤඤකිත්ථියා භිකඛවෙ** යනාදිය වදාළහ.

එහි අන්ධා යනු පැණැස විරහිත වීමෙන් අන්ධ වූවාහු එහෙයින් **අචකඛුකායි**. ප්‍රඥාව මෙහි චක්ෂුයයි අදහස් කරන ලදී. එහෙයින් **අපථං නජානනති** ආදිය යූ.සේයි. එහි **අපථං න ජානනති** යනු මෙලෝ අර්ථය පරලෝ අර්ථය නොදනිත්. මෙලෝ පරලෝ වෘද්ධිය අභිවෘද්ධිය අවබෝධ නොකරත්. පරමාර්ථ නිර්වාණය ගැන කවර කථාද? යම් අයවලුන් විසින් ප්‍රවෘත්ති මාත්‍රයෙහිද මුළා වූවහුද? ඔවුහු කෙසේ නැවැත්ම දැනගන්නාහුද? යම්තැනක පටන් ඔව්හු අර්ථය නොදනිත්ද? එතැන්පටන් ඔව්හු අනර්ථයද නොදනිත්. යම්හෙයකින් ධර්මය නො දනිත්ද? අධර්මයද නොදනිත්. ඔවුන් විසින් විපර්යාස ග්‍රාහයෙන් දැහැමි ක්‍රියාද අකුසල්ද කරත්. දහම් ක්‍රියාද කුසල්ද කරත්. නුදෙක් ධර්මාධර්මයන්හි පමණක් නොව, තවද එහි විපාකයන්හිද මුළා වූවාහුය. එසේම ඔව්හු කර්මයද විපාකය කොට වහරති. විපාකයද කර්මය කොට වහරත්. එසේම **ධම්මං** ස්වභාව ධර්මයද නොදනිත්. **අධම්මං** අස්වභාව ධර්මය කොටද, අස්වභාව ධර්මය ස්වභාව ධර්මය කොටද ප්‍රකාශ කරත්. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තීර්ථකයින්ගේ මෝහ දෘෂ්ටි ප්‍රතිලාභ භාවයෙන් ප්‍රඥා චක්ෂුසෙහි විකලත්වයෙන් අඳ බව දක්වා දැන් එම අර්ථය ජාත්‍යන්ධ උපමාවෙන් ප්‍රකාශ කරන්ට **භූත පුබබං භිකඛවෙ** යනාදිය වදාළහ. එහි **භූත** පුබබං යනු පෙර වූවක්, අතීත කාලයෙහි හටගත්තක්, **අඤඤතරො රාජා අහොසි** පුරාණ කාලයෙහි හටගත්තක්, **අඤඤතරො රාජා අහොසි** පුරාණ කාලයෙහි නාම ගෝත්‍රයන්ගෙන් අප්‍රකට එක් රජෙක් ලෝකයෙහි වූයේය. **සො රාජා අඤඤතරං පුරිසං ආමනෙතසි** එම රජුගේ සෞභාග්‍යත්වයට පත් සියලු අංගයන්ගෙන් **සම්පූර්ණ** තමාගේ මෙහෙකරු උපස්ථානයට පැමිණියහු දැක පින්වත, ඒකාන්තයෙන් ඇත් යානය දර්ශනීය යයි මෙබඳු සිතෙක් විය. එසමයෙහි එක් ජාත්‍යන්ධයෙක් රාජාංගනයෙන් එයි. දැක රජු මෙසේ

සිතිය. මෙම ඇඩයෝ යම් ආකාර වූ මෙබඳු දර්ශනීය දැයක් නොලබත්ද, එය මහා විපතකි. මම මෙම සැවැත්නුවර යම් පමණ ජාත්‍යන්ධයෝ සිටිත්ද, එම සියල්ලෝ රැස්කරවා එක් එක් කොටසක් අතින් ස්පර්ශ කරවා ඔවුන්ගේ වචන අසන්නේ නම් ඉතා යෙහෙකැයි සිතිය. කෙළිලොල් රජු එක් පුරුෂයෙකු ලවා සියලු ජාත්‍යන්ධයින් රැස්කරවා එම පුරුෂයාට, යම්සේ එක් එක් ජාත්‍යන්ධයා හිස් ආදී ඇතුගේ එක් එක්ම වූ ශරීරාංගයක් ස්පර්ශකොට මවිසින් ඇතු දක්නා ලද්දේ යයි සංඥා කරයිද එසේ කරවයි සංඥා දුන්නේය. ඒ පුරුෂ තෙම එසේ කළේය. ඉක්බිති රජු එම අන්ධයින්ගෙන් කොල, ඇතු කෙබඳුදැයි වෙන වෙනම විචාලේය. ඔව්හු දුටු දුටු අවයවයම ඇතු ලෙස කොට කියන්නාහු ඇතු එබඳුය. ඇතු මෙබඳු නොවේයයි ඔවුනොවුන් කළහ කරන්නාහු අත් ආදියෙන් උපක්‍රම කොට රජාංගනයෙහි මහත් කෝලාහලයක් කළහ. රජු පිරිවර ජනයා සහිතව ඔවුන්ගේ එම විකාරය දැක සතුටින් බිඳී යන හෘදයෙන් හටගත් මහ සිනහවක් සිනාසීය. එහෙයින් අථඛො භිකඛවෙ සො රාජා -පෙ- අනතමනො අහොසියි යූ.සේයි. එහි අමෙහා යන ඇමතීමයි. යාවතිකා යනු යම්පමණ ජචචන්ධා යනු උපතින් අඳ, උපතෙහි පටන් ඇස් රහිත, එකඡඣං යනු එක්ව හඬෙ, යනු නිගරුවෙන් ඇමතීමයි. හත්ථිං දසෙසහි යනු කියන ලද ආකාර ඇතු හොවවා දක්වව. ඇතාද මනාව හික්මවන ලද හෙයින් නොසැලී වැදහොත්තේය. දිටඨා නොහත්ථි යනු අතින් ස්පර්ශ මාත්‍ර දර්ශනය කොට කීහ. එම පුරුෂයා විසින් හිස ස්පර්ශ කරවා ඇතු එබඳු යයි හඳුනාගත් බැවින් ඇතු එබඳු වූයේම යැයි හඳුනන්නා වූ ජාත්‍යන්ධයෝ, දේවයන් වහන්ස, කළයක හැඩරුව යම් ආකාර වේද? ඇතු එබඳු යයි කීහ. කුමෙහා යනු කළයයි යන අර්ථයි. බිලෝ යනු ඇත්දත් කොක්ක, සොණ්ඩා අත, නංගලීසා යනු නගුලෙහි ඒරියා කඳ. කායො යනු සිරුර, කොටඨා යනු බඩ. පාදා යනු කෙණ්ඩ, ථූණා යනු ටැඹ, නංගුටඨං යනු වලිගයෙහි මතු පෙදෙස, වාලධි යනු වලිගයෙහි අග පෙදෙස. මුටඨීහි සංයුඤඤිංසු මිටි බැඳ පහර දුන්හ. මිටින් මාරණාන්තික පහර දුන්හ. අතතමනො අහොසි යනු කෙළිලොල් හෙයින් එම රජු ජාත්‍යන්ධයන්ගේ කළහයෙන් සතුටු සිතැත්තේ හාස්‍යයෙන් ගන්නා ලද සිතැත්තේ වීය. එවමෙව ඛො යනු උපමා සංසන්දන යයි. එහි අර්ථය. මහණෙනි, එම ජාත්‍යන්ධයෝ යම්සේ ඇස් රහිත වූවාහු ශේෂ රහිතව ඇතු නොදැක එක් කොටසක් දැකීමෙන්, තමා විසින් දිටි අවයව මාත්‍රය ඇතුය යන සංඥාවෙන් අනෙකේ අය විසින් දක්නා ලද්ද නොඅනු දන්නාහු ඔවුනොවුන් විවාදයට පැමිණියාහු කලහ කළහ. එපරිද්දෙන්ම

මෙම අන්‍ය තීර්ථකයෝ සත්කායයෙහි රූපවේදනාදී එක් කොටසක් තමාගේ දෘෂ්ටි දර්ශනයෙන් දිටි පරිදි ආත්මයයි හඟින්නාහු එයට ශාස්වතාදී භාවය ආරෝපනය කොට මෙයම සත්‍යයි අනෙක්වා හිස්යයි සිත පිහිටුවා ඔවුනොවුන් විවාද කරත්. තත් වූ පරිදි වැඩ අවැඩ දහම් අදහම් නොදනිත්. විවාද කරත්. තත් වූ පරිදි වැඩ අවැඩ දහම් අදහම් නොදනිත්. එහෙයින් අන්ධ වූවාහු, අචක්ෂුක වූවාහු ජාත්‍යන්ධයින්ට සමානය. **එතමත්ථං විදිත්වා** යනු එම තීර්ථකයින්ගේ ධර්ම ස්වභාව තත්වාකාරයෙන් නොදන්නාහු, නොදක්නාහු, ඇතු කෙරෙහි අයථා දර්ශනයෙන් වරදවා සිත පිහිටුවා, විවාදයට බට ජාත්‍යන්ධයෝ මෙනැයි, සර්වප්‍රකාරයෙන් දැන එකරුණ පැහැදිලි කිරීමට මෙ උදන් ඇනූ සේක.

එහි ඉමෙසු කිර සජ්ජනති එකෙ සමණ බ්‍රාහ්මණා යනු මෙලොව ඇතැම්හු පැවිද්දට එළැඹීමෙන් ශ්‍රමණයෝය. ජාති මාතුයෙන් බ්‍රාහ්මණයෝය. ලෝකය ශාස්වතැයි ආදී ක්‍රමයන්ගෙන් පැවැති මෙම අසාර දෘෂ්ටීන්හිම, දෘෂ්ටියෙහි සතුටුවීම් වශතයන්, මෙසේ අනිත්‍ය, දුක්ඛ, වෙනස්වීම් ස්වභාව ඇති මෙම රූපාදී උපාදාන ස්කන්ධයන්හි, තෘෂ්ණාවෙන් සතුටුවීම්, දෘෂ්ටියෙන් සතුටුවීම් වශයෙන් එය මාගේ යයි ආදී ක්‍රමයෙන් **සජ්ජනති කිර** යනු විශ්මයෙකි. එය මුළාවකැයි දක්වයි. කිර ශබ්දය අකමැත්ත හැඟවීම් අර්ථයෙහිය. එයින් එහි කරුණු සහිත බවම දක්වයි. හුදෙක් ඇලෙන්නාහු නොවෙත්මය. ඉක්බිති **විගයහ නං විවදන්ති** යනු නුඹ මෙම ධර්මවිනය නොදන්නෙහිය. මම මෙම ධර්මවිනය දනිමියි ආදියෙන් කලහයට හේතුවන කථාවන්හි යෙදීම් වශයෙන් කලහකොට විවාද කෙරෙත්. විවාදයට පැමිණෙත්. **නං** යනු මෙහි නිපාත මාත්‍රයයි. නොහොත් **විගයහනං** යනු එම දෘෂ්ටි නිශ්‍රිතය සත්කාය දෘෂ්ටියම හෝ විසදෘශ දර්ශන හෙයින් ශාස්වතාදී වශයෙන් ඔවුනොවුන් විරුද්ධව ගෙන විවාද කෙරෙත්. විශේෂයෙන් කියති. තමා විසින්ම හෝ දන්නා ලද දෑ අති ශ්‍රේෂ්ඨයයි වෙනස් නොකොට සිත පිහිටුවා වහරති. **කුමක් මෙන්ද යත්, ඡාන එකංග දසසිනො** යනු යම් එම ජාත්‍යන්ධ ජනතාව ඇතුගේ එක් එක් අංග දක්නේ යම් යම් අංගයක් ස්පර්ශකොට දන්නා ලදුයේද, එය එම හස්තියාම යැයි ගෙන ඔවුනොවුන් කලහකොට විවාද කළහ. මෙම කරුණ එසේ යයි අර්ථයි. මෙහි ඉති ශබ්දයෙන් ලොප් කරන ලද්ද නිර්දිෂ්ට යයි දතයුතුය.

සිව්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

6-5

පස්වැන්නෙහි, **සස්සතෝ අත්තාච ලොකොච** යනු රූපාදීන් අතර එක්තරා එකක්, ආත්මයැයිද, ලෝකය යැයිද සංග්‍රහකොට එය ශාස්වතය. නිත්‍යයැයි ද, අනෙක්වාද එසේ ගන්නාහු වහරත්. යම්සේ වනාහි රූපය ආත්මයැයි ද ලෝකය යැයි ද, ශාස්වත යැයි ද තමා ද ලෝකය ද පණවත්. එසේම, වේදනාව, සංඥාව, සංස්කාරයන්, විඤ්ඤාණය ආත්මය යැයි ද ලෝකය යැයි ද පණවත්. නොහොත් **අත්තා** යනු මම යන හැඟීමයි. **ලොකො** යනු මගේය යන හැඟීමයි. යමක් තමාට අයත් යයි කියයි ද එයයි. තෙමේ ආත්මයැයි සලකා හෝ අනෙකා ලෝකයැයි කියා හෝ සැලකීම, පංච උපාදාන ස්කන්ධයන්හි එක් ස්කන්ධයක් ආත්මයැයි අනෙක්වා ලෝකය යැයි ද, සවිඤ්ඤාණක ස්කන්ධ පැවැත්ම ආත්මයැයි කියා හෝ අවිඤ්ඤාණක ස්කන්ධ පැවැත්ම ලෝකය යැයි කියාද, මෙසේ ආත්මයැයි, ලෝකය යැයි යන්න තම දැක්ම පරිදි, දොයාකාරයෙන් ගෙන, එම ද්වයය නිත්‍යය. තිරය ශාස්වතයැයි සිත පිහිටුවා වහරත්. ඉන් සිව් ශාස්වත වාද දක්වන ලදහ. **අසස්සතෝ** යනු සත්වැදෑරුම් උච්ඡේද වාද දක්වන ලදහ. **සස්සතොච අසස්සතොච** යනු ඇතැමෙක් ලෝකයද, ආත්මයද ශාස්වත යැයි ද ඇතැමෙක් අශාස්වතයැයිද මෙසේ ශාස්වතද, අශාස්වත දැයි අර්ථයි. නොහොත් එයම ආත්මයද ලෝකයද, ආත්ම භංග දෘෂ්ටිකයින්ගේ මෙන් ශාස්වතද අශාස්වතද වන්නේය. ශාස්වතයැයි යන මෙහි අර්ථය මෙසේ දතයුතුය. සබබථා යන මෙයින් ඇතැම් ශාස්වත වාදය දක්වන ලදී. **නෙව සස්සතෝ නාසස්සතෝ** මෙයින් අමරා වික්ෂෙපවාදය දක්වන ලදී. ඔවුහු විසින් ශාස්වත වාදයෙහිද අශාස්වත වාදයෙහිද දොස් දැක, ආත්මයද ලෝකයද ශාස්වත නොවේය. අශාස්වත නොවේයයි වික්ෂේප කරන්නාහු හැසිරෙති. **සයංකතෝ** යනු තමා විසින් කරන ලද, යම්සේ ඒ ඒ සත්ත්වයින්ගේ ආත්මයද, තමාගේ ධර්මයට අනුව කටයුතු කොට සුවදුක් විඳියි. මෙසේ තමා විසින් තමාටද, ඔහුටද පරිභෝග කළයුතු පළිබෝධ සංඛ්‍යාත කිසිවක් නොමැති ලෝකයක් කරයි. **අභිනිම්මිණාති** යනු ආත්ම ලබ්ධිය මෙන් මෙයද ඔවුන්ගේ ලබ්ධියයි. **පරකතෝ** යනු අන්‍යයා විසින් කරන ලද, අර්ථ වශයෙන් වනාහි අන්‍යයා විසින්, ඊශ්වර දෙවියා විසින්, පුරුෂයෙක් විසින් බ්‍රහ්මයා විසින්, කාලය විසින්, ප්‍රකෘතියෙන් හෝ ආත්මයද, ලෝකයද කරන ලදී. නිර්මිත යැයි අර්ථයි. **සයංකතෝ පරකතෝ වා** යනු ආත්මයද

ලෝකයද නිර්මාණය කරන්නා වූ ඊශ්වරාදීහු හුදෙක් තෙමේම නිර්මාණය නොකරත්. තවද, ඒ ඒ සත්ත්වයින්ගේ ධර්මාධර්මයන්ද කරුණු නොකරුණුද ලැබ නිර්මාණය කරති. එහෙයින් ආත්මයද ලෝකයද තමා විසින් කරන ලදුයේද අනෙකා විසින් කරන ලදුයේ යැයිද ඇතැමුන්ගේ ලබ්ධියයි. **අසයංකාරෝ අපරංකාරෝ** යනු එයට ස්වයංකාරයක් නැත්තේනුයි අසයංකාරයි. එයට අන්‍යකාරකයක් නැත්තේනුයි අපරංකාරොයි. අනුනාසිකාගමනය කොට අපරංකාරොයි යූ.සේයි. මෙතෙමේ දෙතැන්හිම දොස් දැක ද්වයයම පිළිකෙව් කරයි. එසේ කල්හි කෙසේ උපන්නේදැයි කියයි. අධිචව සමුප්පනෙනා යනු කැමැත්ත පරිදි හටගත්, කිසි හේතුවකින් තොරව හටගත්තේනුයි අධිචව සමුප්පන්නවාදය දක්වන ලදී. ඉන් අහේතුක වාදයද සංග්‍රහ කරන ලදුයේ වේ. දෘෂ්ටි ගතිකයෝ සුවදුක් ආත්මය මෙන්ද, එයට වැඩි වූද ස්වල්ප වූද සියල්ල ශාස්වතාදී වශයෙන් පිහිටුවා වහරති. ඔවුන්ගේ එම වාදය දක්වන්ට, **සනෙතකෙ සමණ බ්‍රාහ්මණ** ආදිය යූ.සේයි. එය යූ.සේමය. **එතමත්ථං විදිත්වා** යනු මෙහි ජාත්‍යන්ධොපමාවෙන් නොපැමිණි හෙයින් එය හැර යට කියන ලද ක්‍රමයෙන්ම අර්ථය යෙදිය යුතුය. එහි ගාථායෙහි **අනතරාව විසීදනති - අපපඤ්ඤාව තමොගධං** මේ විශේෂයයි. මෙසේ දෘෂ්ටිගතයන්හි, දෘෂ්ටි නිශ්‍රයයන්හි ගැටෙන්නා වූ දෘෂ්ටිගතිකයෝ කාමොඝාදී වූ සතර ඕඝයන්ගේ හෝ සංසාර මහා ඕඝයාගේම අතරත - මධ්‍යයෙහිම, යම් ආකාර වූ ඔවුන්ගේ වාද අභාවයෙන් පිහිටීම් අර්ථයෙන් හෝ බැසගැනීම් සංඛ්‍යාත නිර්වාණය හෝ එය අවබෝධයට උපාය වූ ආර්ය මාර්ගය හෝ යන මෙයින් එකකට හෝ නොපැමිණම අවබෝධ නොකරම ගිලාබසියි. ගැලෙයි. එයින් මෙහි බසිත්. පිහිටත්නුයි ඔගධයි. ආර්ය මාර්ගයද නිර්වාණයද වේ. මෙහි ඔගාධයන් හ්‍රස්වකොට ඔගධං යි යූ.සේයි. තං+ඔගධං - තමොගධංයි පද බෙදීමයි.

පස්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

6-6

සවැන්නෙහි සියල්ල යට කියන ලද ක්‍රමයමය. **ඉමං උදානං** යන මෙහි දෘෂ්ටි, තෘෂ්ණා මානයන්හි දොස් දැක ඒවා දුරදීම අත්හැර සංස්කාරයන් තත්වාකාරයෙන් දක්නේද එහි ආදීනව නොවන ආකාරයෙන් දක්වන ලද හෙයින්, වැරදි අයුරින් සිත පිහිටවූ තත්වාකාරයෙන් නොදක්නහුට, ක්‍රමානුකූලව සසරින් ඉක්මවා යාම්, නොඉක්මවා යාම් ආදිය දැක්වීමට මෙ උදන් ඇනූ සේකැයි අර්ථය යෙදිය යුතුය. එහි **අහංකාර පසුතා අයං පජා** යනු ආත්මයද, ලෝකයද ස්වයංකෘත යැයි මෙසේ කියන ලද, මවිසින් කරන ලදැයි එසේ පැවැති දෘෂ්ටියෙහි **පසුතා** අනුයුක්ත වූවාහු, **අයංපහි** යනු මිථ්‍යාවන්හි සිත පිහිටුවා ගත් සත්ත්ව සමූහය **පරංකාරූප සංහිතා** යනු අන්‍ය ඊශ්වරාදීහු සියල්ල කරයි යයි මෙසේ පැවති කාරකයා අනෙකා ලෙස පවත්නා දෘෂ්ටිනිශ්‍රිත ඒ හා යෙදුනේනුයි පරංකාර උපසංහිතායි. **එතදෙකෙ නාබභඤ්ඤිංසු** යනු එම දෘෂ්ටි ද්වයය ඇතැම් මහණ බමුණෝ දොස් දක්නාහුවී නොඅනුදත්හ. කෙසේද? සිහිය ස්වයංකාර වූයේ ක්‍රියා කරනුයේ සත්ත්වයින්ට යහපතක්ම විය යුතුය. අනිෂ්ඨයෙන් නොවිය යුතුය. කිසිවෙකුත් තම දුක නොකැමැති වේ. නොකැමැති තත්ත්වයන්ද සිදුවේ. එහෙයින් සයංකාරය නොමැනවි. පරංකාරයෙහිද ඉදින් ඊශ්වර හේතුක වේද, ඒ මෙම ඊශ්වරයා ආත්මාර්ථය හෝ පරාර්ථය කරන්නේය. එහි ඉදින් ආත්මාර්ථය සඳහා වනවිට, නොසිදුවූ දෑ ඉටුවන හෙයින් තමා විසින් නොකළ කෘත්‍යය වන්නේය. නොහොත් පරාර්ථයෙහි සියල්ලන්ගේ හිතසුවයම නිපැයෙන්නේ ය. අහිතක්, දුකක් නො නිපැයේ. එහෙයින් ඊශ්වර වශයෙන් පරංකාරය සිදුවේ යයිද, තවද ඊශ්වර සංඛ්‍යාත අනෙකක් නිරපේක්ෂ වූයේ, නිත්‍යයෙන්ම කරුණු පැවැත්මෙහි වන්නේය. කර්මයෙන් උපත් නොවන්නේය. කරුණු සන්නිශ්‍රිත හෙයින් සියල්ලම එක තැනක ඉපදිය යුතුය. ඉක්බිති ඔහුට අන්‍ය වූද සමග කරන කරුණක් කැමැති වේද, එයම වේවා. ඊශ්වරගෙන් කවර ප්‍රයෝජනද, නොනිමි හැකියාවෙන් පරිකල්පිතයෙන් ඊශ්වර හේතුක පරංකාරය සිදු නොවේද? මෙසේ මැවුම්කරු පුරිස, ප්‍රකෘති, බ්‍රහ්මකාල ආදී හේතුවෙන් සිදු නොවේ. ඒවාහිද සිදුනොවූ හෙයින් කියන ලද දොස් නොඉක්මවන හෙයින්ද වේ. එහෙයින් **එතදෙකෙ නාබභඤ්ඤංසුයි යූ.සේයි.** කියන ලද පරිදි - සයංකාර, පරංකාරයන් නොඅනුදන්නවුන්ද, ආත්මයද, ලෝකයද හේතුවක් නොමැතිව හටගත්තේ යයි පණවත්. **ඔව්හුද නනං**

සලලනති අඳසුං යනු හේතුවක් නොමැතිව හටගත්තේ යයි කියන්නෝද වැරදි සිත පිහිටුවා ගැනීම් නොඉක්මවනුයේ තත්වාකාරයෙන් නොදන්නාහු එම දෘෂ්ටිගතය ඒ ඒ තන්හි දුක් උපදවන හෙයින් විදීම් අර්ථයෙන් හුලෙකැයි නොදුටුහ. **එතඤ්ච සලලං පටිගච්ච පස්සතො** යනු ආරබ්ධ විදර්ශක යමෙක් වනාහි, පස්වැදෑරුම් වූම උපාදානස්කන්ධයන්හි අනිත්‍යය වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන් මනාසේ දකීද, හෙතෙම **එතඤ්ච** තෙවැදෑරුම් විපරීත දර්ශනයද, අන්‍ය වූද සියලු වැරදි සිත පිහිටුවා ගැනීමද, ඒවාට නිශ්‍රය වූ පංච උපාදානස්කන්ධයන්ද විදින හෙයින්ද, දුකසේ උදුරා දැමිය යුතු හෙයින්ද හුලෙකැයිද, **පටිගච්ච** කල් ඇතිවම විදර්ශනා ප්‍රඥායෙන් බලයි. මෙසේ දක්නහුට ආර්යමාර්ග ක්ෂණයෙහි ඒකාන්තයෙන්ම **අහංකරොමීති න තස්සහොති** යම්සේ තමාගේ කාරකභාවය ඔහුට නොවැටහේ. මෙසේ **පරො කරොතීති න තස්ස හොති** හුදෙක් අනිත්‍ය සංඛ්‍යාත ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මමාත්‍රයම වේ. මෙතෙකින් සර්වප්‍රකාරයෙන්ම දෘෂ්ටිමාන අභාවය දක්වන ලදී. එයින්ම අර්හත්ව ප්‍රාප්තියෙන් සංසාර සමතික්‍රමණය ප්‍රකාශ කරන ලද්දේ වේ. යමෙක් දෘෂ්ටිගතයෙහි ඇලුනේ වේද, හෙතෙම සංසාරයෙන් හිස ඔසවන්ට නොහැකි වේයයි එය දක්වන්ට **මානුපෙතා** යන ගාථාව වදාළහ. එහි මානුපෙතා අයං පජා යනු මේ සියලුම දෘෂ්ටිගතික සංඛ්‍යාත ප්‍රජාව සත්ව සමූහය මාගේ දෘෂ්ටිය යහපතැයි මාගේ ග්‍රහණය සුන්දරයි තම ග්‍රහණය දැඩිව ගැනීම් ලක්ෂණ මැනීමෙන් යුක්ත වූවාහු සමන්වාගත වූවාහුය. **මානගතා මාන විනිබන්ධා** යනු එයින්ම මතුමත්තෙහි උපදින ඔහු විසින් යම්සේ ඔහු එම දෘෂ්ටිය අත්නොහරියි ද, මෙසේ තම සන්තානය ඇලුණු හෙයින් බැඳුණු හෙයින් මාන නමැති ගෙතුම්, මාන නමැති බැඳුම් ඇත්තාහ. **දිට්ඨීසු සාරමහ කථා සංසාරං නාතිවත්තති** යනු මෙයම සත්‍යය. අනෙක්වා හිස්යැයි තමා උසස් තත්ත්වයෙහිලා සැලකීම්. අනෙකා පහත්කොට සැලකීම් වශයෙන් තමාගේ දෘෂ්ටීන්හි සිත පිහිටුවාගැනීම් වශයෙන් අනෙකාගේ දෘෂ්ටීන්හි, එකටෙක කිරීම් කථාව, විරෝධ කථාව, සසර ඇසිරිකොට සිටිනවුන්ට අවිද්‍යා තෘෂ්ණාවන්ගේ අප්‍රහාණයෙන් සසර නොඉක්මවයි යනු අර්ථයි.

සවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

6-7

සත්වැන්නෙහි සුභූති යන එම තෙරුන්ගේ නාමයයි. එම ආයුෂ්මත් තෙමේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ පාමුල කරන ලද ප්‍රාර්ථනා ඇත්තේ, කල්ප ලක්ෂයක්, රැස්කරන ලද පින් රැසක් ඇත්තේ, මෙම බුද්ධෝත්පාද කාලයෙහි මහත් සම්පත් ඇති, මහත් කුලයෙක උපන්නේ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාව ශ්‍රවණයකොට, සංවේගප්‍රාප්ත වූයේ, ගිහිගෙන් නික්ම පැවිදිව කරන ලද ප්‍රාර්ථනා ඇති හෙයින් උත්සාහ කරනුයේ, ව්‍යායාම කරනුයේ, නොබෝ කලෙකින්ම ෂට් අභිඥා හටගති. බ්‍රහ්මවිහාර භාවනායෙහි උසස් තත්ත්වයට පත්වීමෙන් 'මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර යම් මේ සුභූති නමැත්තෙකු වේද, අරණ්‍ය විහාරීන් අතර ඔහුම අග්‍රයයි, අරණ්‍ය විහරණයෙහිලා භාග්‍යවතුන් වහන්සේ විසින් එතදග්‍රස්ථානයෙහි තබන ලදී. හෙතෙම එක් දිනක් සවස් කලැ, දිවා විහරණස්ථානයෙන් වෙහෙර මලුවට, අවතීර්ණ වූයේ, සිව් පිරිස් මැද, භාග්‍යවතුන් වහන්සේ දම් දෙසන්නහු දැක, දේශනාවසානයෙහි නැගිට වඳින්නෙමියි කල්පිරිසිඳ (ඉටා) භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි එක්තරා රුක්මුලෙකැ හුන්නේ ඵල සමවතට සමවනි. එහෙයින්, **තෙන ඛො පන** ආයස්මා සුභූති -පෙ- **සමාපජ්ජිත්වායි** යූ.සේයි. එහි ද්විතීය ධ්‍යානයෙහි පටන් සියලු රූපාවචර සමාධිද, අරූපාවචර සමාධි ද, අවිතර්ක සමාධිද වේ. මෙහි වනාහි චතුර්ථධ්‍යානය පාදකකොට ඇති අර්හත්ඵල සමාධිය අවිතර්ක සමාධිය යැයි අදහස් කරන ලදී. ද්විතීයධ්‍යානාදීන්හි මිථ්‍යා විතර්කය ප්‍රහීණය. අත්‍යන්ත ප්‍රහාණ අභාව හෙයින් මෙතෙක් මනාව ප්‍රහීණ වූයේ නොවේ. නැවත ප්‍රහාණ කෘත්‍යයක අභාව හෙයින් ආර්ය මාර්ගයෙන් ප්‍රහීණ වූයේම වේ. එහෙයින් ආර්යමාර්ග කෙළවර වූ අර්හත් ඵල සමාධිය සියලු මිථ්‍යා විතර්කයන්ගේ ප්‍රහාණ කෙළවරෙහි හටගත් හෙයින් විශේෂයෙන් අවිතර්ක සමාධිය යැයි කිවයුතු බවට යෝග්‍ය වේ. චතුර්ථධ්‍යාන පාදකත්වය ගැන කියනුම කවරේද? එහෙයින් මෙහි වනාහි චතුර්ථධ්‍යාන පාදක අර්හත්ඵල සමාධිය අවිතර්ක සමාධියයැයි අදහස් කරන ලදී. **එතමත්ථං විදිත්වා** යනු ආයුෂ්මත් සුභූතිගේ එම සියලු මිථ්‍යා විතර්ක සියලු කෙලෙස් ප්‍රහාණ සංඛ්‍යාත අර්ථය සර්වාකාරයෙන් දැන එකරුණ දැක්වීමට මෙළඳන් ඇනු සේක. එහි **යස්ස විතක්කා විධූපිතා** යනු යම් ආර්ය පුද්ගලයෙකු විසින් හෝ යම් ආර්ය පුද්ගලයෙකුගේ කාම විතර්කාදී සියලුම මිථ්‍යා විතර්ක විනාශකරන ලද්දාහු, ආර්ය මාර්ග ඥානයෙන් තවන ලද්දාහු සිඳින ලද්දාහු වෙත්ද? **අජ්ඣත්තං සුවිකප්පිතා**

අසෙසා යනු **ස්වකීය** ආධ්‍යාත්ම සංඛ්‍යාත, තම සන්තානයෙහි, නොඉපැත්මට සුදුසු ලෙසින්, මනාව කල්පිත කළ, ශේෂ රහිතව මනාව කල්පිත කළ, ශේෂ රහිතව මනාව සිඳින ලදැයි අර්ථයි. **තං සංගං අතිච්ච අරූපසඤ්ඤී** යන මෙහි තං යනු නිපාත මාත්‍රයයි. නොහොත් තං ශබ්දය හේත්වර්ථයෙහි වේ. යම්හෙයකින් මිථ්‍යා විතර්කය ශේෂ රහිතව සිඳින ලද ද එහෙයින් රාග බැඳීම් ආදී පස්වැදෑරුම් බැඳීම්, සියලුම කෙලෙස් බැඳීම් හෝ ඉක්මවා ඉක්මවීම් හේතුයෙන් රූප අභාවයෙන්, වෙනස්වීම් සංඛ්‍යාත විකෘතිය, එහි නොමැති හෙයින්, විකාර රහිත භාව හේතුවෙන් හෝ අරූප යැයි ලද නම් ඇති නිර්වාණය අරමුණුකොට පැවැති මාර්ගඵල සංඥාවන්හි අරූප සංඥීවැ. **චතුයොගාතිගතො** යනු කාම, භව, දිට්ඨි, අවිජ්ජා සිව් යෝගයන්, සුදුසු පරිදි, සිව් මාර්ගයන්ගෙන් ඉක්මවා ගියේ, **න ජාතුමෙති** යනු මකාරය පද සන්ධි කරයි. ඒකාන්තයෙන් පුනර්භවයට නොඑයි. මතුයෙහි නැවත භවයක ඉපැත්ම ඔහුට නැත යන අර්ථයි. **නජාතිමෙතියි ද කියවති.** අර්ථය එයමය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සුභූතිගේ අර්හත්ඵල සමවත් විහරණයද, අනුපාදිසෙස නිර්වාණයද අරබයා ප්‍රීති වේගයෙන් මුදාහරින ලදුයේ මෙ උදන් ඇනූ සේක.

සත්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

6-8

අටවැන්නෙහි **දෙපූගා** යනු කණ්ඩායම් දෙකක්, අඤ්ඤතරිස්සා **ගණිකාය** යනු එක්තරා නගරසෝභිනියක් කෙරෙහි, **සාරත්තා** යනු තදින් ඇලුණාහු, **පටිබද්ධචිත්තා** යනු කෙලෙස් වශයෙන් බැඳුණු සිතැතියේ, රජගහ නුවර එක්තරා උත්සව දිනයෙක බොහෝ ධූර්ත පුරුෂයෝ සමූහ (කණ්ඩායම් වශයෙන්) බන්ධනයෙන් හැසිරෙන්නාහු එකිනෙකාට එක් එක් වෙසඟනක් බැගින් ගෙනවුත් උයනට පිවිස සැණකෙළි කෙළියහ. නැවත වෙනත් සැණකෙළි දිනෙකැ අනෙක් ධූර්ත සමූහයක්, එසේම සැණකෙළි කෙළිනු කැමැතියේ, වෙසඟනුන් ගෙන එන්නාහු, පළමු ධූර්තයන් විසින්, පෙර ගෙන එන ලද, එක් වෙසඟනක් ගෙන එන්නී,

අනෙක් අය දැය දැක මෝ අපටද අයත් යයි කීහ. ඔව්හු ද එසේම කීහ. මෙසේ අපට අයත්ය. අපට අයත් යැයි ඩබර වර්ධනය කොට අත්වලින් පහරදීම් ආදිය කළහ. එහෙයින් **තෙන ඛො පන සමයෙන රාජගහෙ** දෙව පූගායි ආදිය යූ.සේයි. එහි උපකකමනති යනු පහරති. **මරණමපි** නිගචඡනති යනු බලවත් උපක්‍රමයන්ගෙන් මරණයට එළැඹෙති. අනෙක් අය වනාහි **මරණ මතතං** යනු මරණය ප්‍රමාණ දුකට පැමිණෙති. **එතමතථං විදිතවා** යනු එම කාමයන්හි ගිජුබව, විවාදමූලික සියලු අනර්ථයන්ට මූලයැයි සර්වාකාරයෙන් දැන. **ඉමං උදානං** යනු අන්ත ද්වයයෙහිද, මධ්‍යම ප්‍රතිපදාවෙහිද ආදීනව හා අනුසස් පැහැදිලි කිරීමට මෙ උදන් ඇතූ සේක.

එහි **යඤඤ පතතං** යනු යම් ආකාර වූ අභිමුඛප්‍රාප්ත රූපාදී පංචකාම ගුණ සමූහයෙහිලා - කාමයන්හි දොසක් නැත යන දෘෂ්ටිය පෙරටුකොට හෝ පෙරටු නොකොට වත්මනැ ලැබ අනුභව කරනු ලබන. **යඤඤ පතතබබං** යනු කාමගුණ සමූහයම 'කාමයෝ අනුභව, කටයුත්තාහ. කාමයෝ පරිභෝග කටයුත්තාහ. කාමයෝ සේවනය කළයුත්තාහ. කාමයෝ නැවත නැවත සේවනය කළයුත්තාහ. යමෙක් කාමයන් පරිභෝග කරයිද? ඔහු ලොව වඩයි. යමෙක් ලෝකය වර්ධනය කරයිද? ඔහු බොහෝ පින් රැස්කරයි යයි දෘෂ්ටිය ඇසුරුකොට එය අත්නොහැර කරන ලද කර්මයෙන් අනාගතයෙහි පැමිණිය යුතුය. අනුභව කළයුතුය. **උභයමෙතං රජානුකිණණං** යනු මෙම පැමිණි හා පැමිණිය යුතු යන ද්වයය රාග රජස් ආදීන්ගෙන් විසුරුවන ලද්දේය. වස්තුව පැමිණි කල්හි අනුභව කරනුයේ රාජ රජසින් ගැවසී ගත්තේ වේ. ඔහුගේ කිලිටි සිතට ඵලයන් මතු පැමිණි කල්හි දොම්නස් **ඉපැත්මෙහි** දොම්නස් රජසින් ගැවසී ගත්තේ වේ. කවරෙකුට වනාහි එම රජස් විසුරුවන ලද්දේ දැයි කීයේය.

ආතුරසසානුසිකඛතො යනු කාම ප්‍රාර්ථනා වශයෙන් ක්ලේශාතුරයාට ඔහුගේ ඵලයෙන් ද, දුක්ඛාතුරයාගේ දෙඅයුරින්මද, වැඩිදියුණු කරන අභිලාෂයෙන් ක්ලේශඵලයන්හි අනුව හික්මෙනුයේ, එසේම **යඤඤ පතතං** යනු නිර්වස්ත්‍ර වෘත ආදී වශයෙන් රෝගප්‍රාප්තව ආත්මය මනාකොට තැවීම, **යඤඤ පතතබබං** යනු යම් ආකාර වූ මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වීම් හේතුවෙන් අපායයන්හි පැමිණිය යුතු ඵල, **උභයමෙතං රජානුකිණණං** යනු එම ද්වයයම දුක් රජස්වලින් ගැවසී ගත්තේය. **ආතුරසස** යනු

ශාරීරික පීඩනයෙන් දුකින් පීඩා වූවහුට, අනුසිකඛතො යනු මිථ්‍යාදෘෂ්ටිය එහි සමාදන්වන පුද්ගලයන් ද අනුව හික්මෙනුයේ වේ. **සිකඛාසාරා** යනු යම් කෙනෙකුන් විසින් සමාදන් වූ පරිදි, සීලව්‍රතාදී සංඛ්‍යාත ශික්ෂාව සාර වශයෙන් ගෙන මෙයින් සංසාරයෙහි ශුද්ධිය වේයයි ඔව්හු කීහ. එහෙයින් **සීලබ්බතං ජීවිතං බ්‍රහ්ම චරියං උපට්ඨානං සාරායි** යූ.සේයි. එහි යමක් නොකරමියි නිශ්චලව සිටීද එය සීලයයි. විෂබොජුන් දුක් සහිත හැසිරීම් වෘත නමැ, සාක භක්ෂක ජීවිතය ද වාතයට අයත්ය. මෛථුනයෙන් වැළැක්ම බ්‍රහ්මචර්යායි. ඒවා අනුව සිටීම එළඹ සිටීමයි. අමනුෂ්‍යයින්ට බත්පිඬු දීම්, එම භූමිවල ගොම මැටි ගෑම ආදී වශයෙන්, ස්කන්ධ ශිව ආදී දෙවිවරුන්ට ආවතේව කිරීම් වශයනේ එළැඹීම -

මෙසේ එම කියන ලද ආකාර ඇති සීලාදියෙන් සංසාර ශුද්ධිය වේයයි, ඒවා හර වශයෙන් ගෙන සිටි මහණ බමුණෝ සික්ඛාසාරා සීලබ්බතං ජීවිතං බ්‍රහ්මචරියං උපට්ඨානං සාරායි දතයුත්තාහ. අයමෙකො **අනෙතා** යනු මේ සීලබ්බත පරාමාස වශයෙන්, අත්තකිලමථානුයෝග සංඛ්‍යාත මධ්‍යම ප්‍රතිපදාවෙහි වැරදි මාර්ගය වූ ලාමකාර්ථයෙන් ද වූ එක් අන්තයක් අයං **දුතියෝ අනෙතා** යනු මේ කාම සුඛල්ලිකානු යෝගය කාමයන්හි හෙළීම් වශයෙන් ප්‍රාප්ති සංඛ්‍යාත දෙවන අන්තය. **ඉවෙවතො උභො අනෙතා** යනු කාම සුඛල්ලිකානු යෝගය - අත්තකිලමථානුයෝගයද යන මෙම දෙඅන්තයන්, ඒවාද වනාහි වත්මනැ පැමිණි හා මතු පැමිණිය යුතු වූද, කෙලෙස් දුක් රජස් ගැවසී ගත්තේ කාමගුණයන්හි තමා තැවීමෙහි ද, එකට ඇලුණු කෙලෙස් දුකින්, මැඩුන ඒ අනුව හික්මෙන, තෙමේද, තමා කෙලෙස් දුකින් පීඩා වූවන් සමග පිළිපැදිය යුතු හෙයින් ලාමක වූ වැරදි මාර්ගය වූයේ නුයි අන්තයි. කටසි වඩ්ඪනා යනු අන්ධ පෘථග්ජනයින් විසින් කැමැති විය යුතු අර්ථයෙන් 'කටසි' සංඛ්‍යාත තෘෂ්ණා, අවිද්‍යාවන්ගේ අභිවෘද්ධිය ඇතිකරන්නාහු, **කටසියො දිට්ඨි වඩ්ඪනති** යනු එම කටසීහු නොයෙක් ආකාර වූ දෘෂ්ටි වඩත්. වස්තුකාමයන්හි ආශ්වාද අනුව බලනවුනට වනාහි ඒවා අත්හරින්ට නොහැකි වනුයේ තෘෂ්ණා අවිද්‍යා එකට ක්‍රියා කිරීම කරුණ ලැබ 'නත්ථි දිනනං' ආදියෙන් නාස්තික දෘෂ්ටිය, අක්‍රිය දෘෂ්ටිය, අහේතුක දෘෂ්ටියද ගන්වත්. ආත්ම තාපනයෙහි නියුක්ත වූවහුට අවිද්‍යා තෘෂ්ණා යන සමග ක්‍රියාකරන කරුණ ලැබ, සීලයෙන් ශුද්ධිය, වාතයෙන් ශුද්ධිය ආදියෙන් ආත්ම ශුද්ධිය කීමෙන් සීලබ්බත පරාමාස දෘෂ්ටිය ගන්වත්. සක්කාය දෘෂ්ටියෙන් වනාහි ඒවාට ප්‍රත්‍යයභාවය ප්‍රකට වූයේමය. මෙසේ අන්ත

ද්වයය හේතුකොට තෘෂ්ණා අවිද්‍යාවන්ගේ හා දෘෂ්ටීන්ගේ වැඩීම් ස්වභාවය දතයුත්තාහ. සමහරු වනාහි 'කටසි' යනු පංචස්කන්ධයන්ට විශේෂ නාමයකැයි කියති. ඒවාට යම්තැනක පටන් එම අන්තද්වයයෙන් සංසාර ශුද්ධිය නොවේද? එතැන් පටන් එම උපාදානස්කන්ධයන් වර්ධනය වේයයි අදහසයි. අනෙක් අය වනාහි කටසිවඩ්ඩ යන පදයට භවයෙන් භවය නැවත නැවත ජරා මරණයන්ගෙන් සොහොන් වැඩීම යයි කියති. එම අන්ත ද්වයයන් සංසාර ශුද්ධියට හේතුභාවය හා අභාවය යූ.සේයි. කටසියෙන් වර්ධනය කරන බව කිවයුතුය. **එතෙ තෙ උභො අනෙත අනභිඤ්ඤාය** යනු ඒවා කියන ලද අයුරු අන්ත ද්වයයම නොදැන, මෙම අන්ත හා ඒවාද මෙසේ ගන්නා ලද්දාහු, මෙසේ කරන ලද්දාහු, මෙබඳු උපදනා තැන් ඇත්තාහු, මෙසේ මරණින් මතු කාලය යැයිද, මෙසේ නොදැනීමේ හේතු - නොදැනීමේ කරුණු' ප්‍රඥාවෙන් දැක ඔහුගේ ආශ්‍රව ක්ෂය වූයේය' ආදීන්හි මෙන් එයට හේතු අර්ථතාවය දතයුත්තාහ. **ඔලීයනති එකෙ** යනු ඇතමෙක් කම්සුවයෙහි යෙදීම් වශයෙන් හැකිලීමට පැමිණෙති. **අතිධාවනති එකෙ** යනු ඇතැමෙක් සිය කය පෙළීම් වශයෙන් ඉක්මවති. කම් සුවයෙහි යෙදුනවුන් වීර්ය නොකරන හෙයින් කුසීතකම් වශයෙන් මනා ප්‍රතිපත්තියෙන් හැකිලීමට පැමිණි හෙයින් හැකිලෙති නමැ. ආත්මයන් තැවීමෙහි අනුයුක්තිකයෝ වනාහි කුසීතතාවය අත්හැර උපාය රහිතව, වීර්යාරම්භ කරන්නාහු, මනා ප්‍රතිපත්තියෙහි ඉක්මවන හෙයින් අතිධාවනය කෙරෙත් නමැ. එම ද්වයයම එහි ආදීනව නොදක්නා හෙයිනි. එහෙයින් **උභො අනෙත මලීයනති එතෙ අතිධාවනති එකෙ** යි යූ.සේයි. එහි තෘෂ්ණාභිනන්දන වශයෙන් හැකිලෙති. දෘෂ්ටි අභිනන්දන වශයෙන් අතිධාවනය කෙරෙත් යයි දතයුතුය. නොහොත් ඇතමෙක් ශාස්වතයෙහි සිත පිහිටුවීම් වශයෙන් හැකිලෙති. ඇතමෙක් උච්ඡේදයෙහි සිත පිහිටුවීම් වශයෙන් අතිධාවනය කෙරෙති. ඇතමෙක් ගවසීලාදී වශයෙන් ආත්මය තැවීමෙහි යෙදුනාහු මම මෙම සීලයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්යයෙන් හෝ දෙවියෙක් හෝ අප්‍රකට දෙවියෙක් වන්නෙමි. එහි නිත්‍ය, ස්ථිර, වෙනස්වන සුළු, ශාස්වතය හා සමව එසේම සිටින්නෙමියි ශාස්වත දර්ශනයෙහි මනාව බැසගත්තාහු සසර හැකිලෙත් නමැ. කම් සුවයෙහි යෙදුනු ඇතමෙක් යම්කිසිවක් කොට ඉන්ද්‍රියයන් සන්තර්පණය කරනු කැමැත්තාහු, ලෝකායතිකයින් මෙන් එයට අදාල, උච්ඡේද දර්ශනයෙහි සිත පිහිටුවන්නාහු උපාය රහිතව වෘත්ත ඡේදය සොයන හෙයින් ඉක්මවා දුවති නමැ. මෙසේ ශාස්වත උච්ඡේද වශයෙන් ද, හැකිළීම්, අතිධාවනයන්

දතයුත්තාහ. යෙවඛො තෙ අභිඤ්ඤාය යනු යම් ආකාර වූ ආර්ය පුද්ගලයෝ වෙත්ද ඔව්හු, දෙ අන්තයෙහි කියන ලද පරිදි මෙම අන්ත, මෙසේ ගන්නා ලද්දාහු, මෙසේ කරන ලද්දාහු මෙසේ උත්පත්ති ඇත්තාහු, මරණින් මතු මෙසේ යයි අති විශිෂ්ය ඥානයෙන්, විදර්ශනා සහිත මාර්ග ප්‍රඥාවෙන් දැන මධ්‍යම ප්‍රතිපදාවට මනාව පිළිපන්නාහු, එම මනා ප්‍රතිපත්තියෙන් **තතුව** නාහෙසුං යනු එම අන්තද්වයයෙහි නොවැටුනාහුය. එම අන්ත ද්වයය අත්හළහයි අර්ථයි. **තෙනබ අමඤ්ඤිංසු** යනු ඔව්හු එම අන්තද්වයය ප්‍රහාණයෙන් මාගේ මෙම අන්ත ද්වයය ප්‍රහාණ වූයේය. මම අන්ත ද්වයය ප්‍රහාණය කළෙමි. මෙම අන්ත ද්වයය ප්‍රහාණයෙන් මම ශ්‍රේෂ්යයැයි ආදී ක්‍රමයෙන් තෘෂ්ණා දෘෂ්ටි මාන මැණීම් වශයෙන් හැඟීම් ඇති නොකළහ. සියලු මඤ්ඤවාන් මනාව ප්‍රහීණ කළ හෙයිනි. මෙහිද මාර්ගඵලයෙහි පිහිටි ආර්ය පුද්ගලයන් සඳහා **තතුව නාහෙසුං තෙ නව අමඤ්ඤිංසු** අතීත කාල වශයෙන් මෙම දේශනාව පවත්වන ලදී. මාර්ගක්ෂණයෙහි වනාහි අභිප්‍රේතාර්ථයෙහි වර්තමාන කාල වශයෙන් කිවයුතු වන්නේය. **වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය** යනු යම් කෙනෙක් ප්‍රහීණ සියලු මඤ්ඤනා සහිත උතුම් පුරුෂයෝ, උපාදාන රහිතව පිරිනිවි ඔවුන්ගේ කර්ම විපාක ක්ලේශ වශයෙන් පැනවීමට ත්‍රිවිධ වූම වෘත්තය නැත. වත්මන කඳ බිඳුමෙන් මතු, දර රහිත ගින්නක් මෙන් පණවන්නට කිසිවක් නොමැත යන ස්වභාවයටම යෙත්යයි අර්ථයි.

අටවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

6-9

නවවැන්නෙහි **රත්තන්ධකාර තිමිසායං** යනු රාත්‍රී අන්ධකාරයෙහි මහ ගනඳුරෙහි, රාත්‍රියෙහි ද යම් පසළොස්වක සඳරැසින් බබලන රැය අන්ධකාර විරහිත වේ. අන්ධකාරයද වලාකුල් මීදුම් ආදී උපක්ලේශ විරහිතව, වැසි වස්නා කල්හි, ගනඳුර නොමැති කල්හි අඳුරයැයි නොකිව යුතුය. මහ ගනඳුර 'තිමිසා'යි කියයි. මෙය වනාහි අමාවක රැය, වැසි වලා පටලයෙන් වැසුනේ වේ. එහෙයින් **රත්තන්ධකාර තිමිසායං**'යි යූ.සේයි.

අඳුරු රැයෙහි ගනඳුරෙහි යැයි අර්ථයි. **අබ්භොකාසෙ** යනු නොවැසුන අවකාශයෙහි වෙහෙර මලුවෙහි, **තෙලපදීපෙසු ඣායමානෙසු** යනු තෙල් පහන් දැල්වෙන කල්හි, භාග්‍යවතුන් වහන්සේගේ අවට විහිදෙන ආලෝකය ප්‍රකෘතියෙන්, බඹයක් පමණ ප්‍රදේශයක පතුරුවා, සඳහිරු ආලෝකය මැඩ සන බුද්ධාලෝකයක් විහිදුවන්නේ නොවේද? අඳුර විනාශකොට සිටියි. ශරීරාලෝකයද, නිල් කහ ආදී වශයෙන් ෂට් වර්ණ සන බුද්ධ රශ්මීන් විහිදුවා ප්‍රකෘතියෙන්ම හාත්පස අසූරියනක් ප්‍රදේශය බබලවමින් සිටියි. මෙසේ බුද්ධාලෝකයෙන්ම ඒකාලෝක වූ කල්හි භාග්‍යවතුන් වහන්සේගේ වැඩහුන් ප්‍රදේශය පහන් දැල්වීම් කරණයෙහි කිසක් නොමැතිද? සත්‍යයකි. කිසක් නැත. එසේද වුවත්, පුණ්‍යාර්ථී උපාසකවරු භාග්‍යවතුන් වහන්සේටද භික්ෂු සංඝයාටද, පූජා කිරීම සඳහා දිනපතා තෙල් පහන් ගෙනැවිත් තබත්. එසේම සාමඤ්ඤඵලයෙහි ද 'එම මණ්ඩල මාලයෙහි පහන් පිළිස්සෙති. රත්තන්ධකාර තිමිසායං යන මෙයද එම රැයෙහි ස්වභාවය වර්ණනා කිරීම සඳහා යූ.සේයි. භාග්‍යවතුන් වහන්සේගේ වැඩහුන් අවකාශය අඳුරු භාවයෙන් මඩින්නේ නොමැත. එකල්හිද උපාසකවරුන් විසින් පූජා කිරීම සඳහාම පහන් දල්වන ලද්දාහු වෙති. එදිනයෙහිද සැවැත්නුවර වැසි බොහෝ උපාසකවරු, උදෑසනම සිරුර පිළිදැගුම් කොට, වෙහෙරට ගොස් පොහොය අටසිල් සමාදන්ව, බුදුපාමොක් බික්සඟනට ආරාධනාකොට, නුවරට පිවිස මහදන් පවත්වා භාග්‍යවතුන් වහන්සේද බික්සඟනද අනුව ගොස් නැවතී තම තමන්ගේ නිවෙස්වලට ගොස් තෙමේද අනුභවකොට පිරිසිදු වස්ත්‍ර හඳින ලද්දාහු පිරිසිදු උතුරුසළුවලින් ද යුක්තව, සුවඳ මල් ආදිය ගත් අතැතිව වෙහෙරට ගොස් භාග්‍යවතුන් වහන්සේට පූජාකොට සමහරු සිත්ගන්නා භික්ෂූන් ඇසුරු කරන්නාහු. සමහරු නුවණින් මෙනෙහි කරන්නාහු දිවාකාලය ඉක්මවූහ. ඔව්හු සවස්කල්හි භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි දහම් ශ්‍රවණය කොට, ශාස්තෘන් වහන්සේ දම්සබා මණ්ඩපයට සම්ප්‍රාප්ත වූ කල්හි, ගඳකිළි සමීපයෙහි අබ්‍යාවකාශයෙහි පනවන ලද, උතුම් බුද්ධාසනයෙහි වැඩහුන්නේ බික්සඟනද, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ ආශ්‍රය කරන කල්හි උපොසථ විශෝධනය සඳහාද නුවණින් මෙනෙහි කිරීම් විශේෂ වර්ධනය සඳහාද නුවරට නොගොස් විහාරයෙහිම වසනු කැමැත්තාහු නතරවූහ. ඉක්බිති ඔව්හු භාග්‍යවතුන් වහන්සේටද බික්සඟනටද පූජා කිරීම සඳහා බොහෝ තෙල් පහන් නංවා, ශාස්තෘන් වහන්සේ කරා එළැඹ වැඳ, බික්සඟනටද, ඇදිලි බැඳ වැඳ, භික්ෂූන් කෙළවර හුන්නාහු,

ස්වාමිනි, මෙම **තීර්ථකයෝ** විවිධාකාර දෘෂ්ටිගතයන්හි සිත පිහිටුවා වහරමින් හැසිරෙත්. එසේ වහරන්නාහුද, කිසිකලෙක්හි ශාස්වතයද, කිසිකලෙක්හි උච්ඡේද ආදීන් අතරෙහි එක්තරා එකකදැයි මෙසේ, එක් දෘෂ්ටියකම නොසිට අලුත් අලුත් දෘෂ්ටිගතයන්හි, මෙයම සත්‍යය. අනෙක්වා හිස්යයි දැඩිව ගෙන උමතු වූවන් ලෙසින් සිටිත්. එසේ සිත පිහිටුවා ගත්තවුන්ගේ උපදනා තැන කෙබඳුද, මරණින් මත්තෙහි කෙසේදැයි කථාවක් හටගැන්වූහ. එවේලෙහි බොහෝ පලඟැටියන් වැටෙන්නාහු ම තෙල් පහන්හි වැටෙත්. එහෙයින් **තෙන බොපන සමයෙන සම්බහුලා අධිපාතකා** ආදිය යූ.සේයි. එහි **අධිපතකා** යනු පලඟැටියන්ය. සලභ යැයි ද කියති. උන් පහන් දැල්ලට පනින හෙයින් අධිපාතකායි අදහස් කරන ලදී. **ආපාත පරිපාතං** යනු ඉදිරියට වටේට වැටී වැටී, පෙරළී, පෙරළී ඉදිරියෙහි වැටීමද, පෙරළී වැටීමද කොට යයි අර්ථයි. ආපාතෙ පරිපාතංයිද සමහරු කියවති. පහන ඉදිරියෙහි තමාගේ ඉදිරි ගමනෙහි ඇතිකල්හි පෙරළී, පෙරළී යයි අර්ථයි. අනයං යනු අවැඩ, දුක, ව්‍යසනං යනු විනාසයයි. ප්‍රථම පදයෙන් උන්ගේ මරණ මාත්‍ර දුක ද, පශ්චිම පදයෙන් මරණඤයද දක්වයි. එඡා සමහර ප්‍රාණීහු වැටෙන්නා හාම මළහ. සමහර ප්‍රාණීහු මරණ මාත්‍ර දුකට පැමිණියහ. **එතමත්ථං විදිත්වා** යනු මෙසේ තම යහපත නොදන්නා වූ පළඟැටි ප්‍රාණීන්ගේ ආත්මෝපක්‍රම වශයෙන් නිරර්ථක ව්‍යසන ප්‍රාප්තිය දැන, දෘෂ්ටිගතිකයින්ට උන්ට මෙන් දෘෂ්ටීන්හි සිත පිහිටුවීම් වශයෙන් අවැඩ ව්‍යසන ප්‍රාප්තිය දැක්වීමට මෙ උදන් ඇතු සේක. එහි **උපාතිධාවනති න සාරමෙනති** යනු සීල, සමාධි, ප්‍රඥා විමුක්ති ආදි ප්‍රභේද සාරයට නොඑති. සිව්සස් අවබෝධ කිරීම් වශයෙන් අවබෝධ නොකෙරෙත්. විමුක්ති අභිලාෂයෙන් එම උපාය සහිත සාරයෙහි සිටින්නේම ඒ හා යුක්ත වූයේ මෙන් වීද, දෘෂ්ටි විපර්යාසයෙන් අතිධාවනය කෙරෙති. ඉක්මවා යෙති. පංච උපාදාන ස්කන්ධයන්හි නිත්‍ය, සුඛ, සුව, ආත්මයැයි සිත පිහිටුවා ගනිත් යන අර්ථයයි. **නවං නවං බන්ධනං බෘහයනති** යනු එසේ ගන්නාහුද තෘෂ්ණා දෘෂ්ටි සංඛ්‍යාත නව්‍ය නව්‍ය බන්ධනයන් වර්ධනය කෙරෙත්. **පතනති පජ්ජාත මිවාධිපාතා දිථෙ සුතෙ ඉති හෙකෙ නිවිධා** යනු මෙසේ තෘෂ්ණා දෘෂ්ටි බන්ධනයන්ගෙන් බැඳුන හෙයින් ඇතැම් මහණ බමුණෝ තමා විසින් චක්ෂුර් විඤ්ඤාණයෙන් දිටි දෘෂ්ටි දර්ශනයෙන් හෝ දක්නා ලද්දෙහි පරම්පරාගත කථා උපලබ්ධ මාත්‍රයෙන්ම්ද, ශ්‍රවණයෙහි මෙසේය. ඒකාන්තයෙන් එය එසේයයි බැස ගත්තාහු දෘෂ්ටියෙහි සිත පිහිටුවීම්

වශයෙන් ශාස්වතයැයි ආදී ක්‍රමයෙන් සිත පිහිටුවා ගත්තාහු, ඒකාන්තයෙන් යහපත පිණිස පවත්නා සසරින් ගැලවීම නොදන්නාහු, රාගාදී එකොළොස් ගිනිවලින් ඇවිලුනු භවත්‍රයය සංඛ්‍යාත අඟුරුවලෙහිම මෙම පලඟැටියන් මෙන් මෙම පහනෙහි වැටෙත්. ඉන් හිස ඔසවන්ට නොහැකි වෙත්.

නවවන සූත්‍ර වර්ණනාව නිමි.

6-10

දසවැන්නෙහි යාවකීවං යනු යම්තාක් කල්, **යතො** යම්කලෙක්හි, යම්කලෙකැ පටන්, **එවමෙතං ආනන්ද** ආනන්දය, තථාගතයන් වහන්සේ උපන් කල්හි, තථාගතයන් වහන්සේට හෝ තථාගත ශ්‍රාවකයින්ට හෝ අන්‍යයාගෙන් ලාභසත්කාර මනාව වැඩේ. තීර්ථකයෝ වනාහි තෙද රහිත, පහ වූ ආලෝකයෙන් යුක්ත වූයේ පහ වූ ලාභ සත්කාර ඇත්තාහු වෙති. ඔබතුමන් විසින් යමක් කියන ලදද? එය එසේය. එහි වෙනස් බවක් නොවේ. සක්විතිට චක්‍රරත්නයාගේ පහළවීමෙන් ලෝකයා චක්‍රරත්නය අතැර අන්තන්හි පූජා සත්කාර සම්මාන නොපවත්වයි. මුළු ලෝවැස්සා, චක්‍රරත්නයම සියල්ල සිදුවන අර්ථයෙන් සත්කාර කරයි. ගරු කරයි. ගෞරව කරයි. පූජා කරයි. මෙසේ සංසාර වෘත්තානුගත පුන්‍ය මාත්‍රයෙහි විපාකය එතරම් මහත් ආනුභාව ඇත්තේය. සංසාර විවර්තානුගත (නිවනට අදාල) පුණ්‍යඵලයට උපකාර වන අනන්ත අප්‍රමාණ ගුණ සමූහයක් දරන්නා වූ බුද්ධ රත්නයෙහි ධර්ම රත්නයෙහි සංඝරත්නයෙහි ආනුභාව ගැන කියනුම කවරේද? භාග්‍යවතුන් වහන්සේ වනාහි සම්‍යක් සම්බෝධියට පත්ව පවත්වන ලද උතුම් දම්සක් ඇතියේ ලොවැ එක්සැටක් රහත්හු හටගත් කල්හි, රහතුන් සැටනම ජනපද චාරිකායෙහි, පිටත්කොට යවා, උරුවෙලාවට සම්ප්‍රාප්තව උරුවෙල් කසුප් ප්‍රමුඛ සහස් ජටිලයන් අර්හත්වයෙහි පිහිටුවා, ඔවුන් විසින් පිරිවරන ලදුයේ, උක් වන උයනෙහි හිඳ බිම්සර ප්‍රමුඛ අංග මගධවාසී දොළොස්

නහුතයක් සස්නෙහි ඇතුලත්කොට, යම්කලෙක්හි රජගහ නුවර වැඩවාසය කළසේක්ද, එතැන් පටන් භාග්‍යවතුන් වහන්සේටද, භික්ෂු සංඝයාටද, යම් යම් ආකාරයෙන් මතු මත්තෙහි ලාභසත්කාර මනාව වැඩේ. ඒ ඒ ආකාරයෙන් සියලු තීර්ථකයින්ගේ ලාභසත්කාර පිරිහේමය. ඉක්බිති එක්දිනක් ආයුෂ්මත් ආනන්ද තෙරහු දිවාස්ථානයෙහි හුන්නේ භාග්‍යවතුන් වහන්සේගේද ආර්ය සංඝයාගේ ද යහපත් ප්‍රතිපත්තිය ප්‍රත්‍යවේක්ෂා කොට ප්‍රීතිසොමනස් හටගත්තේ, තීර්ථකයින්ගේ කෙසේදෝහෝයි ඔවුන්ගේ ප්‍රතිපත්ති ආවර්ජනය කළේය. ඉක්බිති ඔහුට ඔවුන්ගේ දුෂ්ප්‍රතිපත්තීන්ම හැම අයුරින්ම වැටහින. මෙසේ මහානුභාව ඇති, පිනට මූලාධාර වූ, ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් ද ඉහළම ප්‍රමාණයේ පාරමිතාවන්ට පත්, භාග්‍යවතුන් වහන්සේද ආර්ය සංඝයාද ජීවමාන කල්හි, කෙසේනම් මෙම අන් තොටුවෝ මෙසේ දුෂ්ප්‍රතිපන්නව, නොකළ පින් ඇත්තාහු, නීච පැවතුම් ඇත්තාහු, ලාභීන්ව, සත්කාර කරන ලද්දාහු වන්නාහුදැයි තීර්ථකයන්ගේ ලාභසත්කාර හානිය හේතුකොට, කාරුණ්‍යතාවයක් උපදවා, ඉක්බිති තමාගේ සිතිවිල්ල **යාවකීවඤ්ච භනෙත** යනාදියෙන් භාග්‍යවතුන් වහන්සේට සැළ කළේය. භාග්‍යවතුන් වහන්සේද නුඹ විසින් වැරදි සිතිවිල්ලක් සිතන ලදැයි නොවදාරා, රන් මිහිඟු බෙරයක් සමාන ශ්‍රීවය උඩට ඔසවා, මනාසේ සුපිපි නෙලුම් මලක් බඳු සශ්‍රීක, මහමුව මනා ප්‍රසන්නාකාරයක් කොට, ආනන්දය එය එසේමයැයි තුටු පහටුකොට, **යාව කීවඤ්ච** ආදියෙන් ඔහුගේ වචනය සතුටුව පිළිගත් සේක. එහෙයින් අථ ඛො ආයස්මා ආනන්දො -පෙ- **භික්ඛු සංඝොච** යි යූ.සේයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එම අර්ථෝත්පත්තියෙහිලා, අතීතයෙහි මා නූපන් කල්හි, ඇතැම් පහත් ජනයා බුහුමන් ලැබ මාගේ උපතෙහි පටන් නට ලාභසත්කාර වූහයි බාවේරු ජාතකය වදාළ සේක. **එතමත්ථං විදිත්වා** යනු දෘෂ්ටි ගතිකයින්ගේ සත්කාර සම්මානය යම්තාක් කල් සම්‍යක් සම්බුදුවරු ලොව නූපදිත්ද ඒතාක් කල් පවතී. එම බුදුවරුන්ගේ උපතෙහි පටන් ඔව්හු නට ලාභසත්කාර ඇත්තාහු ආලෝක රහිත වූවාහු තෙද රහිත වූවාහු වෙති. දුෂ්ප්‍රතිපත්තියෙන් දුකින්ද නොමිදෙත් යයි එම කරුණ සර්වාකාරයෙන් දැන එකරුණ දැක්වීමට මෙ උදන් ඇතූ සේක.

එහි **ඔභාසති තාව සො කිමි** යනු කෝදැයි කෘමියා ඒ තාක් බබළයි. බබළයි. බැබළේ. **යාව න උදෙති පභංකරො** යනු සිව්මහ දිවයින්, ඒකක්ෂණයෙහි, ආලෝක කරණයෙන් පභංකරයැයි ලද නම් ඇති සූර්යයා

උඩට මතු නොවේද? උදා නොවේද? සූර්යයා උඩට මතුනොවූ කල්හි ලද අවකාශ ඇති කදෝපැණිහු පෙරළෙමින් කටු සහිත ගෙඩි මෙන් අඳුරෙහි බබලත්. **වෙරොචනමහි උගතෙ හතපපභො හොති න චාපි භාසති** යනු, හාත්පස අඳුර මැඩපවත්වා රශ්මි දහස් ගණනින් බබලන ආලෝකමත් භාවයෙන් වෙරොචන නාමයෙන් යුත් හිරු නැගි කල්හි කදෝපැණි තෙම නට ප්‍රභා ඇතියේ, තෙද රහිත වූයේ කළු වූයේ වේ. අඳුරු රැයෙහි මෙන් නොබබලයි. දිප්තිමත් නොවේ. **එවං ඔභාසිත මෙව තිත්ථියානං** යනු යම්සේ එම කදෝපැණියා විසින් සූර්යෝද්ගමනයට පෙර බබලවන ලද්දේ වේ. මෙසේ තර්ක කොට, චිත්ක කොට, සිතිවිලි මාත්‍රයෙන් දෘෂ්ටීන්ගේ ග්‍රහණය කරන හෙයින් තාර්කිකයෝ යැයි ලද නාමයන්ගෙන් යුත් තීර්ථකයින් විසින්, බබලවන ලද, තම ආගම් තෙදින් බබලවා ඉටාගත් යමක් වේද, එය යම්තාක් ලෝකයෙහි සම්‍යක් සම්බුදුවරු ලොවැ නූපදිත්ද? ඒ තාක් පවතී. **න තකකිකා සුඡඣනති නවාපි සාවකා** යනු යම්කලෙක්හි සම්‍යක් සම්බුදුවරු ලොව උපදිත්ද? එකල්හි දෘෂ්ටිගතිකයෝ පිරිසිදු නොවෙත්. නොහොබිත්. ඔවුන්ගේ ශ්‍රාවකයෝද නොහොබිත්. ඒකාන්තයෙන් පහවූ සෝභා ඇත්තේ රැයෙහි විදින ලද හී මෙන් නොපෙනෙත්මය. තවද යම්තාක් සම්‍යක් සම්බුදුවරු ලොවැ නූපදිත්ද, එකෙණෙහිම තීර්ථකයින්ගේ බැබලීම තම සමයෙන් බැබළීමයි. ඉන් මත්තෙහි නොවේ. එහෙයින් තාර්කිකයෝ පිරිසිදු නොවෙත්. ඔවුන්ගේ ශ්‍රාවකයෝ ද නොවෙති. ඔවුන් විසින් නොමනාව කියන ලද ධර්ම විනයෙන්, මනා ප්‍රතිපත්ති රහිත වූවාහු, සසරින් පිරිසිදු නොවෙත්. අනෙර්යාණික සාසනය හෙයිනි. එහෙයින් **දුඤ්ඨයී න දුකඛා පමුචචරෙයි** වදාළහ. තාර්කිකයෝ වනාහි අයෝග්‍ය ලබ්ධිතාවය හෙයින් නරක දෘෂ්ටි හෙයින් මිථ්‍යා දෘෂ්ටියෙහි පිහිටි දෘෂ්ටි හෙයින් විකෘති දර්ශන හෙයින් දෘෂ්ටිය අත්නොහැර සසර දුකින් කිසිකලෙකත් නොමිදෙත්.

දසවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

ජාත්‍යන්ධ වර්ග වර්ණනාව සමාප්තයි.

7-1

චූල වර්ගයෙහි පළමුවැන්නෙහි **ලකුණ්ටක භද්දියං** යන මෙහි භද්දිය යනු එම ආයුෂ්මතුන්ගේ නාමයයි. සිරුර මිටි බැවින් ලකුණ්ටක භද්දිය යැයි ඔහු හඳුනත්. හෙතෙම වනාහි සැවැත්නුවර වාසී මහත් ධන ඇති, මහාභෝග ඇති රූපයෙන්, නින්දා ලද, දුර්වර්ණ, අයහපත් පෙනුමක් ඇති, මිටි කුලපුත්‍රයෙකි. හෙතෙම එක්දිනක් ශාස්තෘන් වහන්සේ දෙවිරම වැඩ වාසය කරන කල්හි උවසුවන් සමග වෙහෙරට ගොස් ධර්මදේශනා ශ්‍රවණයකොට ලද ශ්‍රද්ධා ඇතියේ පැවිදිව ලද උපසම්පදා ඇතියේ ශාස්තෘන් වහන්සේ හමුයෙහි කමටහන් ගෙන විදර්ශනාවට ක්‍රියා කරනුයේ සෝවාන් ඵලයට පැමිණියේය. එකල්හි **ශෛක්ෂ්‍ය භික්ෂූහු** බොහෝසෙයින් ආයුෂ්මත් සැරියුත් තෙරුන් කරා එළැඹ, මතු මාර්ග සඳහා කමටහන් ඉල්වති. දම් දෙසුම් ඉල්වති. ප්‍රශ්න විචාරති. හෙතෙම ඔවුන්ගේ අදහස් පුරවනුයේ කමටහන් කියයි. දම් දෙසයි. පැණ විසඳයි. ඔව්හු උත්සාහ කරන්නාහු ව්‍යායාම කරන්නාහු ඇතැමෙක් සකෘදාගාමී ඵලයද, ඇතමෙක් අනාගාමී ඵලයද, ඇතැමෙක් අර්හත්වයද, ඇතැමෙක් ත්‍රිවිද්‍යාවද, ඇතැමෙක් ෂට් අභිඥාවන්ද, ඇතැමෙක් සිව් පිළිසිඹියාවන්ද අවබෝධ කරති. ඔවුනු දැක ලකුණ්ටක භද්දියද ශෛක්ෂ්‍ය සමාන වූයේ කල්දැන, තම සිත්හි යෝග්‍යතාවයද, කෙලෙස් තුනී කිරීමේ තත්වයන්ද, ප්‍රත්‍යවේක්ෂා කොට, දම්සෙනෙවි කරා එළැඹ කරන ලද පිළිසඳර ඇත්තේ, සතුටු වනුයේ ධර්මදේශනය සඳහා යාඥා කළේය. ඔහුද මොහුගේ අදහසට අනුරූප ධර්ම කථාවක් දේශනා කළේය. එහෙයින් **තෙන බොපන සමයෙන ආයස්මා සාරිපුත්තෙනා ආයස්මන්තං ලකුණ්ටක භද්දියං අනෙකපරියායෙන ධම්මියා කථාය සන්දස්සෙතියි** ආදිය යූ.සේයි. එහි අනෙක පරියායෙන යනු මේ කරුණින් ද පංච ස්කන්ධයන් අනිත්‍යයි. මේ කරුණින් ද දුක්ඛ. මේ කරුණින් ද අනාත්මයැයි මෙසේ නොයෙක් කාරණයන්ගෙන්, **ධම්මියා කථාය** යනු පංච උපාදාන **ස්කන්ධයන්ගේ** හටගැනීම්, විනාශවීම් ආදිය ප්‍රකාශ කිරීමෙහිලා පැවැති දැහැමි කථාවෙන්, **සන්දස්සෙතියි** යනු එම අනිත්‍යාදී ලක්ෂණයන්ම උදයව්‍යයාදී වශයෙන් මනාව දක්වයි. අතින් ගෙන මෙන් ප්‍රත්‍යක්ෂයෙන් දක්වයි. **සමාදපෙති** යනු එහි ලක්ෂණාරම්මණික විදර්ශනාව මනාව ගනී. **යම්සේ** වීරි වීරි ප්‍රතිපන්නව පවතීද? එසේ ගන්වයි. **සමුත්තෙජෙති** යනු ආරබ්ධ විදර්ශනාවෙන් සංස්කාරයන්ගේ උදයව්‍යයන් වැටහෙන කල්හි සුදුසු කල්හි පග්‍රහ නිග්‍රහ මනාව බැලීමෙන්

බොජ්ඣංගයන් අනුව පැවැත්මෙන් භාවනාව මධ්‍යම වීථියට බස්වා යමිසේ විදර්ශනා ඥානය මනා ප්‍රසන්නව පවතීද, එසේ ඉන්ද්‍රියයන්ගේ ප්‍රකටභාවය කිරීමෙන් විදර්ශනා සිත මනාව උත්තේජනය කරයි. ප්‍රකට කිරීම් වශයෙන් පිරිසිදු කරයි. **සම්පහංසෙති** යනු එසේ පවත්වාගෙන යනු ලබන, විදර්ශනාවගේ සමව පැවැති වැඩීම් වශයෙන් ද, මතු ලැබිය යුතු භාවනා බලයෙන් ද සිත මනාව තුටුපහටු කරයි. ලද ආශ්වාද වශයෙන්ම හෝ මනාව සතුටු කරයි. **අනුපාදාය ආසවෙහි චිත්තං විමුචචි** යනු යම් යම් අයුරෙකින් දම්සෙනෙවි දම් දෙසයිද? ඒ ඒ ආකාරයෙන්, සත්‍ය ලක්ෂණය විදර්ශනා කරන තෙරුන්ට දේශනානුභාවයෙන් තමාගේද උපනිශ්‍රය සම්පත්තියෙන් ඥානයාගේ මේරීමට ගියහෙයින් දේශනානුසාරයෙන් ඥානයන් අනුව පවත්නා කල්හි කාමාසවාදීන් අතරෙහි කිසි ආශ්‍රවයක් නොගෙන මාර්ග පිළිවෙළින්ම ශේෂ රහිතව කෙලෙසුන්ගෙන් සිත මිදුණි. අර්හත් ඵලය සාක්ෂාත් කරන ලදැයි අර්ථයි. **එතමත්ථං විදිත්වා** යනු ආයුෂ්මත් ලකුණ්ටක භද්දියගේ එම අර්හත්වය සැළකිරීම් සංඛ්‍යාත අර්ථය සියලු ආකාරයෙන් දැන එකරුණ දැක්වීමට මෙ උදන් ඇනූ සේක.

එහි **උද්ධං** යනු රූප ලෝකයෙහිද, අරූප ලෝකයෙහිද **අධො** යනු යට කාමලෝකයෙහි, **සබ්බධි** යනු සියලුම සංස්කාරයන්හි, **විප්පමුත්තෙනා** යනු පූර්වභාගයෙහි විෂ්කම්භන විමුක්තියෙන් ද, අපරභාගයෙහි සමුච්ඡේද, පටිප්පසසද්ධි යන විමුක්තීන්ගෙන් සර්වප්‍රකාරයෙන් මිදුනේ, මෙහිද **උද්ධං විප්පමුත්තෙනා** යනු ඉන් පස්වැදෑරුම් උද්ධම්භාගිය සංයෝජනයන්ගේ ප්‍රහාණය දක්වයි. **අධො විප්පමුත්තෙනා** යනු ඉන් පස්වැදෑරුම් ඕරම්භාගිය සංයෝජන ප්‍රහාණය දක්වයි. **සබ්බධි විප්පමුත්තෙනා** යනු ඉන් ඉතිරි සියලුම අකුසල ප්‍රහාණය දක්වයි. නොහොත් **උද්ධං** යනු අනාගත කාල ග්‍රහණයයි. **අධො** යනු අතීත කාල ග්‍රහණයයි. ද්විග්‍රහණයෙන්ම ඒ හා යෙදුන හෙයින් වත්මන් කල ගන්නා ලද්දේ වේ. එහි අනාගත කාල ග්‍රහණයෙන් අනාගත ස්කන්ධ ආයතන ධාතූන් ගන්නා ලදහ. සෙසු පදයන්හි ද එම ක්‍රමයමැයි. **සබ්බධි** යනු කාම භේදාදී සියලුම භවයන්හි, මෙය යූ.සේයි. අනාගත, අතීත, වර්තමාන යැයි මෙසේ කාලත්‍රයයෙන් සංගෘහිත සියලුම භවයන්ගෙන් මනාව මිදුණේ, **අයමහමසම්මි අනානුපසසී** යනු යමෙක් මෙසේ මනාව මිදුනේ වේද, ඔහු රූප වේදනාදීන්හි මෙම් මම නොවෙමියි දෘෂ්ටිමාන මඤ්ඤනා වශයෙන් මෙසේ නොබලයි. ඔහුට එසේ මිණුම් කරණයක් නැත යයි අදහසයි. නොහොත් අයමහමසම්මි අනානුපස්සී

යනු මෙය කියන ලද ආකාර ඇති විමුක්තියෙහි අවබෝධය ලබන උපාය මාර්ගය දැක්වීමයි. කාලත්‍රයය සංගෘහිත තෙභූමික සංස්කාරයන්හි එය මාගේය එය මම වෙමි. එය මාගේ ආත්මයැයි පවත්නා ස්වභාව වූ හැඟීම්හි ස්ථිරව නොපිහිටීම් කොට එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවේයයි මෙසේ උපදනා වූ යම් පූර්වභාග චුටියානගාමිනී විදර්ශනාවක් වේද, එය විමුක්තියෙහි ආසන්න කාරණයයි. **එවං විමුත්තෙතා උදකාරි ඕඝං අතිණ්ණපුබ්බං අපුනබ්භවාය** යනු මෙසේ දස සංයෝජනයන්ගෙන්ද සියලු අකුසලයන්ගෙන්ද සර්වාකාරයෙන් මිදුන රහත් තෙමේ ආර්යමාර්ගාධිගමනයෙන් පෙර, සිහිනෙනුදු එතර නුවූවිරූ, කාම, භව, දිට්ඨී, අවිද්‍යා යන සිව්වැදෑරුම් ඕඝයද, සසර මහෝඝයම හෝ පුනර්භව නොවීම සඳහා අනුපාදිශේෂ නිර්වාණය සඳහා තරණය කළේය. එතෙර වූයේය. එතෙරව පරතෙර සිටියේයයි අර්ථයි.

ප්‍රථම සූත්‍ර වර්ණනාව නිමියේ ය.

7-2

දෙවැන්නෙහි, **සෙකඛං මඤ්ඤමානෝ** යනු මෙතෙමේ ශෛක්ෂ්‍යයැයි හඟිමින් එහි මේ වචනාර්ථයයි. හික්මේනුයි සෙකෙඛායි. කුමක් හික්මේද? අධි චිත්තයද, අධි ප්‍රඥාවද වේ. නොහොත් හික්මීම ශික්ෂායි. එය ඔහුගේ සීල යනුයි සෙකෙඛායි. හෙතෙම සම්පූර්ණ නොවූ ශික්ෂා හෙයින්, එහි අධික ලෙස යෙදුණු හෙයින්ද ඒකාන්තයෙන් හික්මෙන ස්වභාව යනුයි, නොනිමි ශික්ෂා හෙයින් අශෛක්ෂයෙක් මෙන් එහි සන්සිඳුණු ශික්ෂා ඇත්තේ, අත්හළ ශික්ෂා ඇත්තේ නොවේ. බොහෝ ජනයා මෙන් එහි නො ඇලුනේ නොවේ. නොහොත් ආර්ය උපතෙහි ත්‍රිශික්ෂාවන්හි උපදනා ලදුයේ එහි හෝ චේනුයි ශෛක්ෂ්‍යයි. **සීයෝ සොමත්තාය** යනු ප්‍රමාණයෙන් මත්තෙහි, ප්‍රමාණය ඉක්මවා, ඉතා අධිකයි යන අර්ථයි. ආයුෂ්මත් ලකුණ්ටක භද්දිය පළමු සූත්‍රයෙහි කියන ලද ක්‍රමයෙන් ප්‍රථම අවවාදයෙන් හුන් අයුරින්ම ආශ්වක්ෂයයට පැමිණියේය. දම්සෙනෙවි ඔහුගේ එම අර්හත්ව ප්‍රාප්තිය අනාවර්ජනයෙන් නොදැන

ශෛක්ෂ්‍යයෙක්මයැයි හඟිනුයේ ස්වල්පයක් යාඥා කරන ලදුයේ බොහෝවක් දෙන්නා වූ උදාර පුරුෂයෙකු මෙන් වඩ වඩා නොයෙක් ක්‍රමයෙන් ආශ්‍රවක්ෂය සඳහා ධර්මය දේශනා කෙරේමය. ආයුෂ්මත් ලකුණ්ටක භද්දිය තෙමේද, මම දැන් කරන ලද කෘත්‍ය ඇත්තේ වෙමි. මෙම අවවාදයෙන් කවර ප්‍රයෝජනදැයි නොසිතා සඳහම් ගෞරවයෙන් පෙර මෙන් සකස්ව ශ්‍රවණය කෙරේමය. භාග්‍යවතුන් වහන්සේ එය දැක ගඳකිළියෙහි වැඩහුන්නේම, යම්සේ දම්සෙනෙවි ඔහුගේ ක්ලේශක්ෂය දනිද, බුද්ධානුභාවයෙන් එසේකොට මෙ උදන් ඇනූ සේක. එහෙයින් තෙන බොපන සමයෙන යන ආදිය යූ.සේයි. එහි යමක් කිවයුතුද, එය අනතුරු සූත්‍රයෙහි යූ.සේමය. **අවෙජ්ඣ** වටටං යනු ශේෂ රහිතව කෙලෙස්වට සින්දේය. කෙලෙස් වට සිඳි කල්හි කම් වටද සිඳින ලද්දේමය. **නිරාසං** යනු තෘෂ්ණාව ආසායයි කියයි. මෙහි ආසාව නැත්තේනුයි නිරාසංයි. නිර්වාණයයි. එම නිරාශාවට විශේෂයෙන් ගියේ අවබෝධ කළේනුයි බ්‍යාගායි. අග්‍ර මාර්ගයාගේ අවබෝධ කරන ලද හෙයින් නැවත අවබෝධ කිරීමෙන් තොර හෙයින් අවබෝධ කරන ලදැයි අර්ථයි. තෘෂ්ණාව දුක් හටගැනීමෙහි හේතුව වූයේ එහි ප්‍රහාණයෙන් ප්‍රහීණ නුවූ ක්ලේශයක් නම් නැත. ඔහුගේ එම තෘෂ්ණා ප්‍රහාණය විශේෂයෙන් දක්වනුයේ **විසුකඛා සරිතා න සන්දති** යි වදාළහ. එහි අර්ථය සිව්වන හිරුගේ පහළවීමෙන් මහ ගංගා වියැලෙන්නාක් මෙන් සිව්වන මාර්ග ඥානෝත්පාදයෙන් ශේෂ රහිතව **විසුකඛා** තෘෂ්ණා නදිය වියලවන ලදී. නදිය **න සන්දති** මෙතැන් සිට නොපවතියි. තෘෂ්ණාව වනාහි ගඟයැයි කියයි. යම්සේ වනාහි ගංගාවන්හි තෙත් ගති සමාන සොම්නස් සත්ත්වයාට වෙති. තෘෂ්ණා ගඟ ආදීන්හිද යෙදේ. **ඡීනනං** වටටං **න** වටටති යනු මෙසේ කෙලෙස්වට සිඳීමෙන් සිඳින ලද වට ඇත්තේ නූපදනා ස්වභාවයට විපාක නොදෙන ස්වභාවයට, පැමිණවීමෙන් සිඳින ලද, කම්වට නොවටයි. නොපවතියි. **එසෙවනෙතා දුකඛස්ස** යනු සර්වප්‍රකාරයෙන් කෙලෙස් වෘත්ත අභාවයෙන් කර්ම වෘත්තයාගේ නොපැවැත්ම, හෙතෙම මත්තෙහි විපාක වෘත්තයාගේ ඒකාන්තයෙන්ම අනුත්පාදයම සියලු සංසාර, වෘත්තයාගේ අන්තය චක්‍රිය චලනතාවයේ වෙන් කිරීමයි.

දෙවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

7-3

තෙවැන්නෙහි **කාමෙසු** යනු වස්තුකාමයන්හි, **අතිවෙලං** වේලාව ඉක්මවා **සත්තා** යනු නුනුවණින් මෙනෙහි කිරීම් බහුල හෙයින් විද්‍යමාන වූද, ආදීනව නොබලා, ආශ්වාදයම සිහිකොට ඇලීම් වශයෙන් සත්ත්වයෝ ඇලුනාහු, ලග්න වූවාහු යයි අර්ථයි. **රත්තා** යනු වර්ණ ජාතිවලින් වස්තුයක් මෙන්, සිතෙහි චෙතස් ස්වභාව කිරීමෙන් ඡන්දරාගයෙන් ඇලුනාහු මනාව ඇලුනාහු, **ගිද්ධා** යනු සකස් කිරීම් ස්වභාවයෙන් දැඩි ලෝභ කිරීමෙන් ගිජු වූවාහු, බලවත් ඇල්මට පැමිණියාහු, **ගථිතා** යනු ගොතන ලද්දක් මෙන්, මිදීම දුෂ්කරභාවයෙන් එහි බැඳුනාහු, **මුච්ඡිතා** යනු කෙලෙස් වශයෙන් විසඥ වූවාහු මෙන්, අන් කෘත්‍යයක් නොමැති සේ මුළා වූවාහු මෝහයට පැමිණියාහු, **අජ්ඣොපන්නා** යනු අන්‍යයන්ට සාධාරණ නොවන මෙන් කොට ගිල නිමකොට සිටියාහු, **සම්මත්තකජාතා** යනු කාමයන්හි හෙළීම් ස්වභාවයට පැමිණෙන්නාහු අල්පසුව වේදනාවෙන්, ඉතා මත්වූවාහු මනාව මත්වූවාහුය. සම්මොදක ජාතායිද පායයි. උපන් සතුටින්, උපන් මහත් සතුටින් යැයි අර්ථයි. සියලුම පදයන්ගෙන් ඔවුන්ගේ තෘෂ්ණාවෙන් විපතට පත් භාවයම කියයි. මෙහිද පළමුව කාමයන්හි යැයි කියා, නැවතද කාමයන්හි යැයි කීම එම සත්ත්වයින්ගේ එහි අධික ලෙස යෙදුණු බව දැක්වීම සඳහාය. ඉන් සියලු ඉරියව්හි කාමගුණයන්ගෙන් යුක්තව එකල්හි වාසය කළහයි දක්වයි. එකල්හි ආර්යශ්‍රාවකයින් හැර සියලු සැවැත්වාසීහු උත්සවයක් දැනුම් දී සම්පත් ඇති අයුරින් ක්‍රීඩා භූමිය පිළියෙලකොට අනුභව කරන්නාහු - පානය කරන්නාහු ප්‍රකටවද රහසින්ද කාමයන් අනුභව කරන්නාහු, ඉන්ද්‍රියයන් පිනවන්නාහු කාමයන්හි හෙළීමට පැමිණියහ. භික්ෂූහු සැවත පිඬු පිණිස සරන්නාහු ඒ ඒ ගෘහයන්හි, මල් හෝ පලතුරු වතු උයන් ආදීන්හිද මිනිසුන් උත්සවයක්, දැනුම් දී කාම නිම්නව, එසේ පිළිපදිනවුන් දැක වෙහෙරට ගොස් මෘදු මොලොක් දම් දෙසුමක් ලබන්නෙමුයි භාග්‍යවතුන් වහන්සේට එකරුණ සැළ කළහ. එහෙයින් **අථඛො සම්බහුලා භික්ඛූ** -පෙ- **කාමෙසු විහරන්තියි** යූ.සේයි. **එතමත්ථං විදිත්වා** යනු එම සිත්කලු මත්පැන් බීමේ උත්සවයට සෑදූ මණ්ඩපයන්හි, මහත් දාහ ඇතිකරන, නොයෙක් අනර්ථයන් ලුහුබඳනා, භයානක, ඉවසිය නොහැකි, කටුක විපාක ගෙනදෙන කාමයන්හි ආදීනව නොදක්නා සුළු ඒ මිනිසුන්ගේ කාමාදීනව සර්වප්‍රකාරයෙන් දැන කාමයන්ගේද, කෙලෙසුන්ගේද, ආදීනව පැහැදිලි කිරීමට මෙ උදන් ඇනුසේක. එහි **කාමෙසු සත්තා** යනු කාමවස්තූන්හි ක්ලේශකාම වශයෙන්

සිත් ඇලවූවාහු, මත්වූවාහු, ඇලුනාහු, පැටලුනාහු, එල්බුනාහු, **එක්වුනාහු, කාමෙසු සංගා** යනු එම කාම නමැති ශාස්ත්‍රයෙන්, වස්තුකාමයන්හි රාග නමැති බැම්මෙන්ද දෘෂ්ටි, මාන, ද්වේෂ, අවිද්‍යා යන බැම්වලින්ද, ඇලුනාහු තෘෂ්ණාවෙන් බැඳුනාහු, **සංයොජනෙ වජ්ජ ම පසස මානා** යනු **කම්වට**, විපාක වට වශයෙන් භවාදීන්හි හෝ භවාන්තරාදීන්හි **සත්ත්වයා** දුක්ඛයන්හි යොදවන හෙයින් බඳවන හෙයින් සංයෝජන නමැ. එම කාමරාගාදී කෙලෙස් සමූහය සංයෝජනීය ධර්මයන්හි ආශ්වාද අනුව බලන හෙයින් සංසාර වෘත්ත දුකට මූලික භවාදී දෝෂයන්හි ආදීනව නොදක්නාහු, **නහි ජාතු සංයොජන සංග සතතා ඔඝං තරෙයුං විපුලං මහනතං** යනු මෙසේ දොස් නොදක්නා ස්වභාවයෙන්, සංයෝජන ස්වභාව වූ බැම්වල සංයෝජන සංඛ්‍යාත වූ බැම්වලින්, ඒවාට විෂය වූ, ත්‍රෛභූමික ධර්මයන්හි සත්ත්වයෝ, මහත් සේ ගොදුරුවන හෙයින්ද, කෙළවරක් නොමැති කාලය හෙයින් ද, මහත් සේ පැතිරුණු හෙයින් ද, මහත් වූ කාමාදී ඕස හෝ, සංසාර ඕඝයම හෝ කිසිකලෙකත් තරණය නොකරන්නාහුය. ඒකාන්තයෙන්ම එම ඕඝයාගේ පරතෙරට නොයන්නාහු යයි අර්ථයි.

තෙවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

7-4

සිව්වැන්නෙහි **අන්ධිකතා** යනු කාමයෝ නම් අන්ධනු වූ අයද අන්ධ කෙරෙත්. දෙසූ පරිදි,

ලුද්ධා අත්ථං න ජානාති - ලුද්ධා ධම්මං න පසසති
අන්ධනතමං තදාහොති - යං ලොභෝ සහතෙ නරංනති

ලෝභියා යහපත නොදනියි. ලෝභියා ධර්මය නොදකියි. යම් පුද්ගලයෙකු ලෝභය ඉවසයිද එකල්හි අඳුර හා අන්ධභාවය වේ.

එහෙයින් කාමයෙන් අන්ධ නුවූ අය අන්ධ **කරන** ලද්දේනුයි අන්ධිකතායි. සෙස්ස අනතුරු සූත්‍රයෙහි යූ.සේමැයි. එහි **මිනිසුන්**ගේ

පැවැත්ම භික්ෂූන් විසින් දැක භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ. මෙහි භාග්‍යවතුන් වහන්සේ තමන්ම දක්නා ලදී යන මෙයම විශේෂයයි. ශාස්තෘන් වහන්සේ සැවතින් නික්ම දෙවිරමට වැඩම කරනුයේ අතරමග අචිරවතී නදියෙහි මත්ස්‍ය බන්ධකයන් විසින් අටවන ලද, කෙමිනට පිවිස ඉන් පිටවීමට නොහැකි බොහෝ මසුන් දිටි සේක. ඉන් මද වේලාවකට පසු එක් කිරිබොන වස්සෙක් ගවහඬ කොට ලුහුබැඳ, තනකිරි පිපෑසාවෙන් ශ්‍රීවය දිගුකොට මවගේ කලවා අතරත මුව එළවන්නහු දුටු සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වෙහෙරට පිවිස පා ගල්වා, පණවන ලද උතුම් බුද්ධාසනයෙහි වැඩ හුන්නේ, පශ්චිම වස්තු ද්වයය, පළමුවැන්නට උපමා භාවයෙන් ගෙන මෙ උදන් ඇනූ සේක. එහි **කාමඩා** යනු වස්තුකාමයන්හි ක්ලේශකාමයෙන් අන්ධ වූවාහු, ඇස් නොපෙනෙන සේ කළාහු, **ජාල සඤ්ඡනනා** යනු අන්‍ය ආත්මභාවයන්හි ස්වකීය ආත්මභාවයන්හිද, අධ්‍යාත්මික බාහිර ආයතනයන්හිද, ඒ හා ආශ්‍රිත ධර්මයන්හිද අතීත ආදී වශයෙන් භේද භින්න වූ, යට මතු වශයෙන් ඔබිනොබ ඉපැත්මෙන් ඇතුලත් භවයන්ට, අනර්ථ ගෙනඑනුයේම දැලක් වූ තෘෂ්ණාවෙහි සියුම් සිදුරු සහිත දැලෙන් පිරිවරන ලද, දියවිල වැසුනාහු, ගැටගැසුනාහු වසා පැතිර සිටියාහු වෙති. **තණ්හා ඡදන ඡාදිතා** යනු විලෙහි දිය දියසෙවෙල්වලින් වසා තබන ලද්දාක් මෙන් තෘෂ්ණාවෙන් වසන ලදුයේ, පද ද්වයයෙන්ම කාමච්ඡන්ද නීවරණයෙන් වලක්වන ලද කුසල් සිතෙහි වැලැක්ම දක්වයි. **පමත්ත බන්ධුනා බද්ධා** යනු කෙලෙස් මාරයා විසින්ද දේවපුත්‍ර මාරයා විසින්ද බඳනා ලද යම්තැනක පටන් ක්ලේශමාරයා විසින් බඳනා ලදුයේද, එතැන් පටන් දේවපුත්‍ර මාරයා විසින්ද බඳනා ලදුයේ නම් වෙති. යූ.සේයි.

අනතලික්ඛවරෝ පාසෝ - යායං චරති මානසෝ
තෙන තං බාධයිස්සාමි - න මෙ සමණ මොක්ඛසීති

අහසෙහි සරණ යම් මළපුවුවක් මනසෙහි සරයිද? ඉන් ඔබ පෙළන්නෙමි. ශ්‍රමණය ඔබ මාගෙන් නොමිදෙන්නෙහිය.

නමුචි, කණ්හ, පමත්තබන්ධු යන ත්‍රයය මාරයාගේ නාමයන්ය. දේවපුත්‍ර මාරයා වනාහි, ක්ලේශ මාරයා මෙන් අනර්ථයෙන් පමා වූ සත්ත්වයින් බන්ධනය කෙරේත්‍රයි පමත්තබන්ධුයි. පමත්ත බන්ධනෙ බද්ධාතියි කියවති. එහි බන්ධනෙ යනු කාමගුණ බන්ධනයෙහි යයි අර්ථයි.

බද්ධා යනු සන්ධි නොකල කුමක් මෙන්ද යත්, **මචඡාව කුම්නා මුඛෙ** යනු මත්ස්‍ය බන්ධකයා විසින් අටවන ලද, කෙමිනෙහි මුවින් පිවිසි මත්ස්‍යයෝ ඉන් බැඳුනාහු මරණයට එති. පැමිණෙති. එපරිද්දෙන්ම මාරයා විසින් අටවන ලද කාමගුණ බන්ධනයෙන් බන්ධනයට පත් මෙම සත්ත්වයෝ ජරා මරණයට පැමිණෙත්. **වචෙඡා බිර පකොව මාතරං** යනු යම්සේ කිරිබොන තරුණ වසුපැටියෙක් තම මව අනුව එයි. අනුව යේ. අනෙකෙක් එසේ නොඑයි. මෙසේ මාර බන්ධනයෙන් බැඳුනා වූ සත්ත්වයෝ සසර කැරකෙන්නාහු මරණයටම අනුව එති. අනුව යෙති. අජර වූ අමෘත නිර්වාණයට නොයෙතියි අදහසයි.

සිව්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

7-5

පස්වැන්නෙහි, සමඛහුලානං භික්ඛූනං පිටඨිතො පිටඨිතො යනු ආයුෂ්මත් ලකුණ්ටක භද්දිය තෙරහු එක් දිනක් බොහෝ භික්ෂූන් සමග කුඩා ගමක පිඬු පිණිස හැසිර කරන ලද බත්කිස ඇත්තේ, දිය රහිත කොට පසුම්බියෙහි බහා උරහිසෙහි එල්වා සිවුර නවා එයද වම් උරහිසෙහි තබා ප්‍රසාදජනක ඉදිරියට යාම් ආපසු යෑම්, ඉදිරිය බැලීම්, වටපිට බැලීම්, අත්පා වකුටු කිරීම් දිගහැරීම් යට බලන ලද ඇස් ඇති, මනා ඉරියව් වලින් යුක්ත වූයේ තමාගේ ස්මෘති, ප්‍රඥාවන්ගේ මහත්භාවය ප්‍රකාශ කරන්නාක් මෙන්, සිහිය හා මනා නුවණ මනාව පිහිටුවා සමාහිත සිතින් පියවරින් පියවර තබනුයේම යේ. යනුයේද එම භික්ෂූන් හා අසම්මිශ්‍රව එම භික්ෂූන්ගේ පසුපසින් යේ. කුමක් හෙයින්ද යත්, මිශ්‍රනොවී වාසය කිරීම සඳහාය. තවද එම ආයුෂ්මතුන්ගේ රූව නින්දා ලබන ලදුයේ, පරිභවයට සුදුසු වූයේ පෘථග්ජනයා හෙළා දකිති. තෙරහු එය දැන මොව්හු මා නිසා අකුසලයක් රැස් නොකෙරෙත්වායි පසුපසින් යයි. මෙසේ එම භික්ෂූහුද තෙරහුද සැවැතට පැමිණ වෙහෙරට පිවිස භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එහි එළැඹෙත්. එහෙයින් **තෙන ඛොපන සමයෙන ආයසමා ලකුණ්ටක භද්දියො යි** ආදිය යූ.සේයි. එහි **දුබ්බණ්ණං** යනු විරූපී, එයින් ඔහුගේ වර්ණ **සම්පත්තියෙහිද, පෙනීම්**

සම්පත්තියෙහිද අභාවය දක්වයි. දුද්දසිකං යනු ප්‍රසාදවහ නොවන දැකුම් ඇති. එයින් ඔහුගේ අනුව්‍යඤ්ජන සම්පත්තියෙහිද, පෙනීම් සම්පත්තියෙහිද අභාවය දක්වයි. **ඔකොටිමකං** යනු මිටි. මෙයින් ශාරීරික වැඩීම් සම්පත්තියෙහි අභාවය දක්වයි. **යෙභුය්‍යෙන හි භික්ඛූනං භික්ඛූනං පරිභූත රූපං** යනු පෘථග්ජන භික්ෂූන් විසින් හෙළා දකින ලද රූප ඇතියේ. ඇතැම් ජටි වර්ගීය ආදී පෘථග්ජන භික්ෂූහු එම ආයුෂ්මත්හුගේ ගුණ නොදන්නාහු, අත්, කන්, හිස්මුදුනේ කොණ්ඩය ආදීන් ගන්නාහු, ස්පර්ශ කරන්නාහු ක්‍රීඩා කරන්නාහු පරිභව කෙරෙති. ආර්යයෝ හෝ කල්‍යාණ පෘථග්ජනයෝ එසේ නොකරති. **භික්ඛු ආමනෙතසි** යනු කවර හෙයින් අමතන ලදද යත්, තෙරුන්ගේ ප්‍රකාශ කිරීමට, මෙම භික්ෂූහු මපුත්ගේ මහානුභාවත්වය නොදනිත්. එහෙයින් ඔහුට පරිභව කරත්. එය ඔවුන්ට බොහෝකලක් අහිත පිණිස දුක් පිණිස වන්නේය. එහෙයින් මම මොහුගේ ගුණ භික්ෂූන්ට ප්‍රකාශකොට පරිභවයෙන් ඔහු මුදවන්නෙමියි භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිතෙක් වූයේය. **පසසථ** නො දක්නහුද, **න ච සා සමාපත්ති සුලභ රූපා යා තෙන භික්ඛුනා අසමාපනත** පුබ්බා යනු රූප සමවත්, අරූප සමවත්, බ්‍රහ්මවිහාර සමවත්, නිරෝධ සමවත්, ඵල සමවත් යන මෙබඳු ප්‍රභේද ඇති, ශ්‍රාවක සාධාරණ වූ යම්කිසි සමවත්හු වේද, ඒවා අතර එක් සමවතක් හෝ සුලභ රූප නොවේ. දුර්ලභය. එම ලකුණ්ටක භද්දිය භික්ෂුව විසින් නොසමවන් විරූ එබඳු සමවතක් නොමැතිමය. එයින් ඔහුට **මහිදධිකො මහානුභාවොයි** යමක් යූ.සෙයිද, එහි මහර්ධිකතාවය ප්‍රකාශ කරයි. දැන් මහානුභාවතාවය ප්‍රකාශ කරන්ට **යසසථාය** ආදිය වදාළහ. එය යට යූ.සේමය. මෙහිද භාග්‍යවතුන් වහන්සේ 'එසො භික්ඛවෙ භික්ඛු' යනාදියෙන්, මහණෙනි, මෙම භික්ෂුව මෙතෙම නොමනා පැහැ ඇත්තේය. නොමනා දැකුම් ඇත්තේය. අඟුටුමිටිය. භික්ෂූන්ගේ පිටුපසින් එයි යයි එතෙකින් හෙළා නොදැකිය යුතුය. තවද ශ්‍රාවකයෙකු විසින් පැමිණිය යුතු යම්කිසිවක් ඇත්ද, ඒ සියල්ල ඔහු විසින් අනුප්‍රාප්තය. මහත් ඍද්ධි ඇත. මහානුභාව ඇත. එහෙයින් ඔහු ගල් කුඩයක් මෙන් ගරුකොට බලන්නේය. එය ඔබලාට බොහෝකලක් හිත පිණිස, සුව පිණිස වන්නේ යයි දක්වයි. **එතමත්ථං විදිත්වා** යනු එම ආයුෂ්මත් ලකුණ්ටක භද්දියගේ මහර්ධිකතා, මහානුභාවතා ආදී භේද වූ ගුණ රැස සර්වාකාරයෙන් දැන, එකරුණ දැක්වීමට මෙ උදන් ඇතූ සේක.

එහි **නෙලගෙගා** යනු දොස ඵලයයි කියයි. ඔහුට දොසක් නැත්තේනුයි නෙලයි. එය කිමෙක්ද? සුපිරිසිදු සීලයයි. එය වනාහි නිර්දෝෂාර්ථයෙන් ඵලයක් නැතැයි අදහස් කරන ලදී. එම නෙලයට ප්‍රධාන වූ අග්‍ර මාර්ගය ඔහුටනුයි - **නෙලගෙගායි**. එය යමක් රථයයැයි කියයිද? එය හා සම්බන්ධයි. එහෙයින් සුපිරිසිදු සීලගග යැයි අර්ථයි. මෙහි අර්හත්ඵල සීලයයි. සුදු වැස්ම එයටනුයි **සෙත පචඡාදොයි**. පචඡාදො යනු රථය මතුයෙහි ඇතිරිය යුතු කම්බිලි ආදියයි. එය වනාහි ඉතා පිරිසිදු සුදු භාවයෙන් සුදු හෝ රත් නිල් ආදීන් අතර එක්තරා එකක් වේ. මෙහි වනාහි අර්හත්ඵල විමුක්තිය අදහස් කරන ලද හෙයින් සුපිරිසිදු බව අරබයා සෙත පචඡාදොයි යූ.සේයි. අන් තන්හි 'රථො සෙත පරිකඛාරොයිද යෙදේ. එක් සිහිය නමැති අරය ඔහුටනුයි **එකාරොයි වත්තති** යනු පවතියි. **රථො** යනු තෙරුන්ගේ ආත්මභාවය සඳහා කියයි. **අනීඝං** යනු නිදුක්, කෙලෙස් කැළඹීම් විරහිතයයි අර්ථයි. **ආයන්තං** යනු බොහෝ භික්ෂූන්ගේ පසුපසින් පැමිණෙන්නා වූ, **ඡිත්තසොතං** යනු සිඳ දමන ලද ශ්‍රෝතස් ඇතියේ, ප්‍රකෘති රථයෙහි සුවසේ පැවැත්ම සඳහා අක්ෂීර්ෂයන්හිද නැබෙහිද, තවරන ලද ගිතෙල් ආදීන්ගේ ශ්‍රෝතස ගැලීම, ගලාබැස්ම වෙයි. එහෙයින් එය නොසන්සුන් ශ්‍රෝතස් නම් වේ. මෙය වනාහි සතිස් ශ්‍රෝතසුන්ගේ ශේෂ රහිතව ප්‍රහීණ කළ හෙයින් සුන් ශ්‍රෝතස් නම් වේ. එම සුන් ශ්‍රෝතස, ඔහුට බැඳුම් නැත්තේනුයි **අබන්ධනංයි**. රථයෙහි තට්ටු ලෑල්ල, රෝද සම්බන්ධ කරන අලවංගුව සමග නිසල බව කිරීම සඳහා බොහෝ බන්ධනයන් වෙත්. එය සමග එය සම්බන්ධයි. මොහු වනාහි සියලු සංයෝජන බන්ධනයන්ගේ ශේෂ රහිතව ක්ෂය කරන ලද හෙයින් බන්ධන රහිතයි. එම නොබැඳීම. **පස්ස** යනු භාග්‍යවතුන් වහන්සේ තෙරුන්ගේ ගුණයන් කෙරෙහි සොම්නසට ප්‍රාප්ත වී තමාට කියයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ලකුණ්ටක භද්දිය අර්හත් ඵල ශීර්ෂයෙන්, යහපත් රෝදයක්, අර්හත්ඵල විමුක්තියෙන් වියනක් සහිත මෙන් කොට මනාව පිහිටි හෙයින්, කෙලෙස් ගෙවී යාම් අභාවයෙන් අපරික්ෂෝභ ලෙසින්ද, තෘෂ්ණා තැවරීම් නොමැති හෙයින් නොතැවරීම් ලෙසින්ද, සංයෝජනාදීන්ගේ අභාවයෙන් බැඳුම් රහිත මනාව පිළියෙළ කළ, මනාව යොදන ලද, උසස් පැවතුම් ඇති රථයක් කොට දක්වයි.

පස්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

7-6

සවැන්නෙහි **අඤ්ඤාකොණ්ඩඤ්ඤ** යන මෙහි කොණ්ඩඤ්ඤ යනු එම ආයුෂ්මත්හුගේ ගෝත්‍රයෙන් පැමිණි නාමයයි. ශ්‍රාවකයින් අතර සියල්ලට ප්‍රථම ආර්ය සත්‍යයන් ප්‍රතිවේධ කළේනුයි භාග්‍යවතුන් වහන්සේ විසින් 'පින්වත්නි, ඒකාන්තයෙන් කොණ්ඩඤ්ඤ දැනගත්තේය'යි දේශිත උදාන වචන වශයෙන්ද, තෙරහු සස්නෙහි අඤ්ඤා කොණ්ඩඤ්ඤ යයිම පැනුණහ. **තණ්හා සංඛය විමුත්ති** යනු තෘෂ්ණාව ගෙවී යයි. ප්‍රහීණ වේ. මෙහිනුයි තණ්හා සංඛයොයි. නිර්වාණයයි. එම තෘෂ්ණා ප්‍රහාණයෙහි විමුක්තිය තෘෂ්ණාව හෝ ගෙවයි. ප්‍රහීණ වේ. එය කරණකොට ගෙනනුයි තෘෂ්ණා සංඛයොයි. ආර්ය මාර්ගයයි. එයට ඵලය වූ කෙළවර වූ හෝ විමුක්ති යනුයි තණ්හා සංඛය විමුක්තියි. වෙනස් නොකළ හැකි ආකාරයෙන් අර්හත්ඵල සමවතයි. එය ප්‍රත්‍යවේක්ෂා කරමින් හුන්නේ වේ. මෙම ආයුෂ්මත් තෙමේ වනාහි බහුලව ඵලසමවතට සමවදියි. එහෙයින් මෙහිද එසේ කළේය. **එතමත්ථං විදිත්වා** යනු එම අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරුන්ගේ මාර්ගඵල ප්‍රත්‍යවේක්ෂණය දැන, එකරුණ දැක්වීමට මෙ උදන් ඇතූ සේක.

එහි **යස්සමූල ඡමානත්ථි** යනු යම් ආර්ය පුද්ගලයෙකුට ආත්මභාව නමැති වෘක්ෂයට මුල් වූ අවිද්‍යාවද එහි පිහිටීමට හේතු වූ ආශ්‍රව නීවරණ නුනුවණින් මෙනෙහි කිරීම් සංඛ්‍යාත භූමියද, පෘථිවියද නැත්ද, අග මගින් මුලුනුපුටා දමන ලද හෙයිනි. **පණ්ණා නත්ථි කුතො ලතා** යනු වැල් නැත. එසේනම් කොළ කොයින්දැයි පද සම්බන්ධයයි. මාන අතිමානාදී ප්‍රභේද වූ, අතු, කුඩා අතු සංඛ්‍යාත වැල්ද නැත. මද ප්‍රමාද, මායා, සාඨෙය්‍ය ආදී කෙසේවත් නොලැබේ යන අර්ථයි. නොහොත් 'කොළ නැත. වැල් කොයින්ද?' යන රුක් අංකුරයක් (කුඩා පැලයක්) වැටෙනකල්හි පළමුව කොළ වැටෙත්. පසුව අතු කුඩා අතු සංඛ්‍යාත වැල් යයි කොට යූ.සේයි. එහි යමෙකුට ආර්යමාර්ග භාවනාවගේ නොමැති කල්හි ඉපැත්මට සුදුසු වූ, ආත්මභාව වෘක්ෂයාගේ ආර්ය මාර්ගයෙන් වඩන ලද හෙයින්, යම් අවිද්‍යා සංඛ්‍යාත මූලක් වේද, එහි පිහිටීමට ස්ථාන වූ ආශ්‍රවාදිය නැත්ද? මෙහි මූල ග්‍රහණයෙන්ම මුල් කරුණෙහි ඇති අවිද්‍යාවගේ පිහිටීමෙන් වන කර්මයද, එය නොමැති කල්හිද ගන්නා ලද්දේමයයි දතයුතුය. කර්ම බීජයන් නොමැති කල්හිද එයට හේතු වූ විඤ්ඤාණංකුරයද, විඤ්ඤාණාංකුර හේතුවෙන්, නාමරූප සලායතන සංඛ්‍යාත කොළ,

සාඛාදිහුද නූපදින්නාහුම වෙති. එහෙයින් යමෙකු හට අත්බවට මුල් වූ භූමියක් නැද්ද? කොළ නැද්ද, වැල් නැද්දැයි යූ.සේයි. **තං ධීරං බන්ධනා මුත්තං** යුත ඒ සිව්වැදෑරුම් යහපත් ප්‍රධන් වීර්ය යෝගයෙන් දිනූ මරහු හෙයින් නුවණැත්තා එයින්ම සියලු කෙලෙස් **අභිසංස්කාර** බන්ධනයන්ගෙන් මිදුණේය. **කොතං නිඤ්ඤාතුමරහති** මෙහි තං යනු නිපාත මාත්‍රයයි. මෙසේ සියලු කෙලෙසුන්ගෙන් මිදුනා වූ, සීලාදී උතුම් ගුණයෙන් යුක්ත වූ, කවර නම් ප්‍රාඥ ස්වභාව ඇත්තෙක්, නින්දා කරන්ට ගර්හා කරන්ට සුදුසු වේද, නින්දාවට භාජන විය යුතු කරුණු නොමැති හෙයිනි. දෙවාපි නං **පසංසන්ති** යනු ඒකාන්තයෙන් දිව්‍ය ශක්‍ර ආදී ගුණ විශේෂ දන්නා අය (අපි ශබ්දයෙන්) මනුෂ්‍යයෝ ද, ක්‍ෂත්‍රිය පණ්ඩිතාහුද පසසති. වැඩිපුර කවර කථාද? බ්‍රහ්මුනාපි **පසංසිතො** මහා බ්‍රහ්මයා විසින්ද, අනෙකුත් බ්‍රහම, නාග, යක්‍ෂ, ගාන්ධර්වාදීන් විසින්ද ප්‍රශංසිතය. ස්තුති කරන ලද්දේමය.

සවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

7-7

සත්වැන්නෙහි **පපඤ්ච සඤ්ඤා සංඛා පහානං** යනු පමා කෙරෙත්. යම්තැනෙක්හි තමහට උපන් එම කෙලෙස් සිතිවිලි පරම්පරාව පතුරුවති. කලක් තබත්නුයි පපඤ්චයි. ක්ලේශයෝය. විශේෂයෙන් රාග, ද්වේෂ, මෝහ, දෘෂ්ටි, මාන ආදීන්ය. එසේම රාග ප්‍රපංචය, ද්වේෂ පපංචය, මෝහ පපංචය, දෘෂ්ටි පපංචය, තෘෂ්ණා පපංචය, මාන පපංචයැයි යූ.සේයි. තවද කිලිටි අර්ථය ප්‍රපංචාර්ථයයි. කසල අර්ථය ප්‍රපංචාර්ථයි. එහි රාග ප්‍රපංචයට සුභ සංඥාව නිමිත්තයි. ද්වේෂ ප්‍රපංචයට ක්‍රෝධය වස්තුවයි. මෝහ ප්‍රපංචයට ආශ්‍රවයෝය. තෘෂ්ණා ප්‍රපංචයට වේදනාවයි. දෘෂ්ටි ප්‍රපංචයට සංඥාවයි. මාන ප්‍රපංචයට විතර්කය නිමිත්තයි. එම ප්‍රපංචයන් සමග එකට යෙදුණ සංඥාව ප්‍රපඤ්ච සංඥාවයි. ප්‍රපංච සංඥාවන්ගේ සංඛ්‍යාව, භාග, කොටස් ප්‍රපඤ්ච සංඥා සංඛායි. අර්ථ වශයෙන් වනාහි නිමිත්ත සමග වූ, එම ක්ලේශයට පක්ෂ වූ කෙලෙස් සමූහයයි. මෙහි සංඥා ග්‍රහණය ඒවා සාධාරණ හේතු භාවයෙහි (ප්‍රපංච සංඛ්‍යාවෝ සංඥා උත්පත්ති හේතුකොට ඇතැයි යූ.සේයි.) ඒවාහි ප්‍රහාණයයි. ඒ ඒ මාර්ගයෙන් රාගාදී කෙලෙසුන්ගේ නැසීම යයි අර්ථයි. එකල්හි වනාහි භාග්‍යවතුන්

වහන්සේ අතීත නොයෙක් කෝටි ලක්ෂ සංඛ්‍යාත තම උත්පත්තීන්හි අනර්ථයට හේතු වූ කෙලෙස් මෙම අවසන් භවයෙහි ආර්ය මාර්ගයෙන් බෝමැඩ මුල්හිදී අනුසහිත කෙලෙස් ප්‍රහීණ කල්හි ප්‍රත්‍යවේක්ෂා කොට කෙලෙස් චරිත සත්ව සන්තානයන්ද, රාගාදී කෙලෙසුන්ගෙන් කිළිටි වූයේ, කැඳ පිරුණු ලබුගෙඩියක මෙන් ද, මෝරු පිරුණු සැළියක් මෙන්ද, චුරුණු තෙල් පොඟවන ලද කඩමාල්ලක් මෙන්ද නිදහස් කිරීම ඉවත්කිරීම දුෂ්කර බව දැක, මෙසේ මෙම ග්‍රහණය නම් කෙළවරක් නොමැති කාලයක සිට භාවිතා කරන ලද මාගේ කෙලෙස් වට ශේෂ රහිතව ප්‍රහීණ වූයේ විශ්මයකි. මනාව ප්‍රහීණ වූයේ යයි උපන් ප්‍රීති ප්‍රමෝද්‍ය ඇත්තේ උදන් ඇනූ සේක. එහෙයින් අථඛෝ භගවා අත්තනෝ පපඤ්ච සඤ්ඤා සංඛා පහානං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසිසි යූ.සේයි. එහි යස්ස පපඤ්චා ඨිතිචනත්ථි යනු යමෙකුට යැයි භාග්‍යවතුන් වහන්සේ තමාම අනෙකා මෙන් කොට නිර්දේශ කරයි. යම් අග්‍ර පුද්ගලයෙකුගේ කියන ලද ලක්ෂණ ඇති ප්‍රපංච ඔවුන් විසින් නොකරන ලදද, සසරෙහි සිටීමද නැත. නෙත්තියෙහි වනාහි ඨිති නම් අනුසය යැයි යූ.සේයි. අනුසයද භව පැවැත්මෙහි මූලය. සත්ත්වයින් සසර ප්‍රමාද කෙරෙත්නුයි පපංචයි. පපංචයිතියිද පාඨයි. එහි අර්ථය, පපංචයන්ගේ සිටීම, විද්‍යමානත්වය මාර්ගයෙන් නොසිඳීම ප්‍රපංච සිටීමයි. ප්‍රපංචයම හෝ ඉතිරි කුසල්, අකුසල් විපාකයන්ගේ පැවැත්මෙහි හේතු භාවයෙන් වෘත්තයෙහි සිටීම හෝ පපංචයිතියි. එය යම් පුද්ගලයෙකුට නැද්ද? බන්ධානං පලිසංච චිතිවත්තෙතා යනු යමෙක් බන්ධනාර්ථයෙන් බන්ධනයක් හා සමාන හෙයින් බන්ධයැයි ලද නම ඇති තෘෂ්ණා දෘෂ්ටිහු නිර්වාණ නගර ප්‍රවේශය වලක්වන හෙයින් බාධා කිරීම් සමාන හෙයින් බාධා සංඛ්‍යාත අවිද්‍යාවද ඉක්මවන ලදුයේ ඉතා සියුම් වූද කෙලෙස් ප්‍රහාණයෙන්, විශේෂයෙන් ඉක්මවන ලදුයේ, සමහරු වනාහි ක්‍රෝධය යැයිද කියති. එය නොගත යුතුය. එය වනාහී අනෙකා කෙරෙහි ඇලේයයි කියන ලද හෙයිනි.

තං නිත්තණ්හං මුනිං චරන්තං යනු හැම අයුරින්ම තෘෂ්ණා අභාවයෙන් තෘෂ්ණා රහිත වූයේ දෙලෝ මනින හෙයින් තමාගේ හා අනෙකාගේ යහපත මනින හෙයින් ද මුනි තෙම ඒකාන්තයෙන්ම සියලු සත්ත්ව හිත පිණිස සිව් ඉරියව්වෙන්ගෙන් නොයෙක් සමවත්හි හැසිරීම්වලින් අනෙකා හා සාධාරණ නුවූ ඥාන චාරයෙන් හැසිරෙන්නාහු,

නව ජානාති සදෙවකොපි ලොකො යනු දෙවියන් සහිත, බ්‍රහ්මයින් සහිත උපත් සහිත සියලු සත්වලෝකයා කිසිකලෙකත් අවමන් නොකරයි. පරිභව නොකරයි. ඉක්බිති මොහුම ලෝකයෙහි අග්‍රය. ශ්‍රේෂ්ඨය. උතුම්ය. පවර යැයි ගරුකරනුයේ සකස්ව පූජා සත්කාරයෙහි නිරත වේ.

සත්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

7-8

අටවැන්නෙහි අජ්ඣත්තං යන මෙහි මෙම අජ්ඣත්ත ශබ්දය ඡ අජ්ඣත්තිකානි ආයතනානි ආදීන්හි අජ්ඣත්තජ්ඣයෙහි ආයේය. අජ්ඣත්තා ධම්මා අජ්ඣත්තංවා අජ්ඣත්තංවා කායෙ කායානුපස්සී යනාදීන්හි ස්වකීය අධ්‍යාත්මයෙහි, සබබ නිමිත්තානං අමනසිකාරා අජ්ඣත්තං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරති ආදීන්හි විෂයධ්‍යාත්මයෙහි ඓශ්වර්යය ස්ථානයෙහි යැයි අර්ථයි. එල සමවත් වනාහි බුදුවරුන්ගේ ඓශ්වර්ය ස්ථාන නමැ. තෙනානන්ද භිකඛුනා තසමිං යෙව පුරිමසමිං සමාධි නිමිතෙත අජ්ඣත්තමෙව චිත්තං සණ්ඨපෙතබබං ආදීන්හි ගොචරධ්‍යාත්මයෙහිම දතයුතුය. මෙහිද ගෝචරධ්‍යාත්මයෙහිම දතයුතුය. එහෙයින් අජ්ඣත්තං යනු ගෝචරධ්‍යාත්ම වූ කමටහන් අරමුණෙහි යැයි යූ.සේයි. පරිමුඛං යනු අබිමුව සුපට්ඨිතාය යනු මනාව එළවන ලද කය අනුව ගිය සිහියෙන්, මෙහි සති ශීර්ෂයෙන් ධ්‍යානය යූ.සේයි. මෙය යූ.සේයි. අධ්‍යාත්ම කය අනුව බැලීම් සිහිය පිහිටුවීම් වශයෙන් මනාව ලබන ලද උදාර ධ්‍යානයට සමවැද මෙම තෙරහු භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වැඩවාසය කරන කල්හි, එක් දිනක් සැවැත්නුවර පිඬු පිණිස හැසිර පසුබත, පිණ්ඩපාතයෙන් පෙරළා පැමිණියේ, වෙහෙරට පිවිස භාග්‍යවතුන් වහන්සේට වත් දක්වා, දිවාස්ථානයෙහි දිවා විහරණය සඳහා වැඩහුන්නේ නොයෙක් සමාපත්තීන්ගෙන් දහවල් කාලය ඉක්මවා සවස් කලැ විහාර මධ්‍යයට බැස භාග්‍යවතුන් වහන්සේ ගඳකිළියෙහි වැඩහුන්නේ, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹීමට තවමත් නොකල්යයි ගඳකිළියට නුදුරෙහි, එක්තරා රුක්මුලෙකැ කල් පිරිසිදීම කොට කියන ලද සමවතට සමවැද හුනි. ශාස්තෘන් වහන්සේ එසේ හුන්නහු,

ගඳකිළියෙහි වැඩහුනුයේම දිටි සේක. එහෙයින් **තෙන බො පන සමයෙන ආයස්මා මහා කච්චායනො -පෙ- සුපටීතායායි** යූ.සේයි. **එතමත්ථං විදිත්වා** යනු ආයුෂ්මත් මහාකච්චායන තෙරුන්ගේ එම සතිපට්ඨාන භාවනා වශයෙන් අවබෝධ කළ ධ්‍යානය පාදකොට, සමවැදීම සර්වාකාරයෙන් දැන එකරුණ පැහැදිලි කිරීමට මෙළඳන් ඇනූ සේක.

එහි **යස්ස සියා සබ්බදා සති සතතං කායගතා උපට්ඨිතා** යනු යම් ආරබ්ධ විදර්ශකයෙකු හට එක්දිනක් කොටස් සයක් කොට, සියලුම කල්හි නාමරූප භේදයෙන් දෙවැදෑරුම් වූද, ශරීරය පිළිබඳ, ශරීරය අරමුණුකොට පස්වැදෑරුම් උපාදාන ස්කන්ධයන්ගේ අනිත්‍යාදී මෙනෙහි කිරීම් වශයෙන් නිතර, නිරන්තරයෙන් සත්‍යාවබෝධයෙහි යෙදෙන්නාක් මෙන්, සිහිය එළැඹ සිටියේ වේද? මේ ආයුෂ්මත් තෙමේ, ශරීරය පිළිබඳ සිහිය පැවැත්වීමේ කමටහන් වශයෙන් ධ්‍යාන උපදවා, එය පාදක කොට කායානුපස්සනා සිවටන් මුවින් විවසුන් පිහිටුවා අර්හත්වයට පැමිණියේය. හෙතෙම **පසුකල්හිද** බොහෝසෙයින් එම ධ්‍යානයට සමවැද නැගිට එසේම විදර්ශනා කොට ඵල සමවතට සමවදියි. ඒ මෙම ආයුෂ්මත් තෙමේ යම් ආකාරයකින් අර්හත්වයට පැමිණියේද, එම ක්‍රමය දක්වන්නා වූ ශාස්තෘන් වහන්සේ 'යමෙකුට හැමවිටම කායගතා සතිය එළඹ සිටින්නේ වේදැ'යි වදාරා එහි වැටහෙන ආකාරය පැහැදිලි කරන්ට, **නො චස්ස නොච මෙසියා න භවිස්සති නව මෙ භවිස්සති** යි වදාළේය. එහි අර්ථය දෙ අයුරකින් දතයුතුය. සම්මර්ශනයෙන්, පූර්වභාග වශයෙන් හා සම්මර්ශන කාල වශයෙනි. ඒවාහි පූර්වභාග වශයෙන් පළමුව, නොචස්ස නොච මෙ සියා යනු **අතීත** කාලයෙහි **ක්ලේශ** කර්ම මා හට **නො චස්ස** නොවී නම්, මේ වත්මන් කලැ මෙම ආත්මභාවය **නොචමෙසියා** මට නූපදින්නේය. යම්හෙයකින් මා හට **අතීත** කර්මක්ලේශ වූනුද, එහෙයින් ඒ නිමිත්තකොට දැන් මා හට මෙම ආත්මභාවය පවතියි. **න භවිස්සති නව මෙ භවිස්සති** යනු මෙ අත්බැව්හි ප්‍රතිපක්ෂතා පහවීමෙන්ම ක්ලේශ කර්ම නොවන්නේය. නූපදින්නේය. මත්තෙහි විපාක වට මා හට නොවන්නේය. මට නො පවතින්නේය. මෙසේ කාලත්‍රයයෙහි මා හට මේ කර්ම ක්ලේශ හේතුවෙන් හටගත් ආත්මභාව සංඛ්‍යාත ස්කන්ධ පංචකය හටගනී. ඊශ්වර නිර්මාණ වශයෙන් නොවේ. මට යම්සේද සියලු සත්ත්වයින්ට එසේයයි ප්‍රත්‍යය සහිත නාමරූප දර්ශනය ප්‍රකාශකරන ලද්දේ වේ. සම්මර්ශන කාල වශයෙන් වනාහි **නො චස්ස නොච මෙ සියා** යනු යම්හෙයකින් මෙම ස්කන්ධ පංචකය හටගෙන පැවත නොවීම් (නොපැවතීම්) අර්ථයෙන්

අනිත්‍යය. නිතර තදින් පීඩා කරන අර්ථයෙන් දුක්ඛ. තම වසයෙහි නොපවත්නා අර්ථයෙන් අනාත්මයි. මෙය ස්කන්ධ පංචකයෙන් නිදහස් වූයේ නොවේ. ඉදින් එය එසේනම් මෙය ආත්මය නම් වේද, නොවේමය. කිසිවක් **නො චසස** නොවන්නේය. මෙසේ ඇතිකල්හි, **නොච මෙ සියා** මා සතු කිසිවක් නොවන්නේය. **න භවිසසතීති** තමා කෙරෙහිම වියයුතුය. යම්සේ මෙම නාමරූප වත්මනැ පවතීද? අතීතයෙහිද ආත්මනීයත්වයෙන් ශූන්‍යය. මෙසේ නොවන්නේය. **න මෙ භවිසසති** අනාගතයෙහිද ස්කන්ධ විනිර්මුක්ත ආත්මයක් නම් කිසිවෙකුටත් නොවන්නේය. මට හටද නොවන්නේය. නොපවතින්නේය. ඉක්බිති මෙසේ කිසි පළිබෝධ හේතුවක් මා හට නොවන්නේය. **මත්තෙහිද** ආත්මනීය නම් වූ කිසිවක් මා හට නොවන්නේ යයි මින් තෙකල්හි ගතයුතු දැයක අභාව හෙයින් මාගේ යයි ගතයුතු දැයක අභාවය දක්වයි. **ඉන්** සිව්කොන් ශූන්‍යතාවය ප්‍රකාශ කරන ලද්දේ වේ. **අනුපුබ්බ විහාරි තසසො** යනු මෙසේ තෙකල්හිම ආත්ම, ආත්මනීය ශූන්‍යතාවයෙහි පිහිටි සංස්කාරගතයන් මනාව බලනුයේ, අනුක්‍රමයෙන් උදයව්‍යය ඥානාදී විදර්ශනා ඥානයන් උපදනා කල්හි අනුපූර්ව විදර්ශනා විහාර වශයෙන් අනුපූර්ව විහාරයෙක් වූයේ, **කාලෙනෙව තරෙ විසතතිකං** යනු මෙසේ විදර්හනාව මස්තකප්‍රාප්ත කොට සිටි එම යෝගාවචර තෙමේ ඉන්ද්‍රිය මුහුකුරා ගියකල්හි, චුටියානගාමිනී විදර්ශනාවෙන් මාර්ගයෙන් උගුලුවා නොදැමූ කල්හි, ආර්ය මාර්ගෝත්පත්ති කල්හි සියලු භවතෘෂ්ණයාගේ බැම් තුනීකරන හෙයින් විසත්තිකා සංඛ්‍යාත තෘෂ්ණාව තරණය කරන්නේය. මනාව තරණය කොට පරතෙර සිටින්නේ යයි අදහසයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ රහත් බව දැක්වීමෙන් ආයුෂ්මත් මහා කච්චායන තෙරුන්ගේ අර්හත්වෝත්පත්ති සඳහා මෙළඳන් ඇතූ සේක.

අටවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

7-9

නවවැන්නෙහි **මලලෙසු** යනු මල්ල නම් ජනපදවාසි රජ කුමාරවරු, ඔවුන්ගේ නිවාසය වූ එකම ජනපදය, ආරෝපනය අනුව මල්ලයැයි කියයි. එම මල්ල ජනපදයෙහි ලෝකයෙහි යමක් මල්ලයැයි කියයිද

එයයි. **සමහරු** වනාහි මාලයන්හි යයිද කියවති. **චාරිකං චරමානො** යනු ඉක්මන් නොවූ චාරිකා වශයෙන් මහා මණ්ඩල දනව් සැරියෙහි සරනුයේ, **මහතා භික්ඛු සංඝෙන** යනු නොපිරිසිදු ගණනින් යුත් මහත් ශ්‍රමණ ගණයා විසින්, එකල්හි භාග්‍යවතුන් වහන්සේට මහා භික්ෂු පිරිවරක් වූයේය. **ථූනං නාම මලලානං බ්‍රාහමණ ගාමො** යනු නැගෙනහිර හා දකුණු දිසාවට මධ්‍යම දේශයට සීමා ස්ථානයෙහි ථූන නමැති බ්‍රාහ්මණයන් බහුල හෙයින් එම බමුණුගම, **තදවසරි**, එහි වැඩවදාළ සේක. ථූන නම් මාර්ගයට සම්ප්‍රාප්ත වීයයි අර්ථයි. **අසෙසාසුං** යනු ඇසූහ. ශ්‍රෝතද්වාර සම්ප්‍රාප්ත වචන සෝෂා අනුසාරයෙන් දැනගත්හයි අර්ථයි. **ඛො** යනු පද පූරණයෙහි නිපාතයි. අවධාරණාර්ථයෙහි හෝ නිපාතයි. එහි අවධාරණාර්ථයෙන් ඇසුවෝමහුය. ඔවුන්ට ශ්‍රවණාන්තරායයක් නොවීය. පද පූරණයෙන් පද ව්‍යඤ්ජන සිලිටිභාව මාත්‍රයමය. ථූණෙය්‍යකා යනු ථූන නම් ගම්වාසීහු, බ්‍රාහ්මණ ගහපතිකා යනු මෙහි වේදය හදාරත් නුයි බ්‍රාහ්මණායි. **මන්ත්‍ර** සජ්ඣායනා කරත් යයි අර්ථයි. මෙය වනාහි උපතින් බ්‍රාහ්මණයන්ගේ යනු නිර්වචනයයි. ආර්යයෝ වනාහි බහා තැබූ පාප හෙයින් **බ්‍රාහ්මණ** යැයි කියති. **ගහපතිකා** යනු ක්ෂත්‍රිය, බ්‍රාහ්මණයන් හැර යම්කිසි ගිහිගෙය මධ්‍යයෙහි වසන්නවුන් කියති. විශේෂතාවෙන් වෛශ්‍යයෝයි. බ්‍රාහ්මණයෝ ද ගෘහපතීහු ද බ්‍රාහ්මණ ගහපතිකායි. දැන් මෙහි යමක් ඔව්හු ඇසූහුද එය දක්වන්ට **සමණො බලුහො** ගොතමො යනාදිය යූ.සේයි. එහි සන්සිඳවන ලද පාප හෙයින් ශ්‍රමණයයි දතයුතුය. ඔහුගේ පාපී අකුසල ධර්ම සංසිඳවන ලද්දේ වේ ආදිය යූ.සේයි. භාග්‍යවතුන් වහන්සේද, ඉතා උතුම් ආර්ය මාර්ගයෙන් සර්වප්‍රකාරයෙන් සන්සිඳවන ලද පව් ඇත්තේය. එහෙයින් එතුමාණන් වහන්සේට සත්‍ය වූ ගුණ අවබෝධ කරන ලද හෙයින් යම් මේ ශ්‍රමණයැයි නාමයක් වේද එය යෙදේ. **බලු** යනු අනු සුවාර්ථයෙහි නිපාතයි. **හො** යනු බ්‍රාහ්මණ ජාතිකයින්ට උපතින් හටගත් ඇමතීම් මාත්‍රයකි. හෙතෙම හොවාදී නම් වේ. ඉදින් වේද ඇලීම් සහිතව වේ යයි යූ.සේයි. **ගොතමො** යනු ගෝත්‍ර වශයෙන් භාග්‍යවතුන් වහන්සේ වර්ණනා කිරීමයි. එහෙයින් සමණො බලු හො ගොතමො යනු ශ්‍රමණයන් වහන්සේ වනාහි පින්වත් ගෞතමයානෝ යයි මේ මෙහි අර්ථයයි. **සක්‍යපුත්තො** යනු මෙය වනාහි භාග්‍යවතුන් වහන්සේගේ උසස් කුලය විදහා දැක්වීමයි. **සක්‍යකුලා පබබජිතො** ශ්‍රද්ධාවෙන් පැවිදි වූ බව දැක්වීමයි. සමහරු වස්තුව අහිමිවීමෙන් නොමඬනා ලද්දේ, වස්තුව ක්ෂය නොවූයේම එම කුලය අත්හැර නෛෂ්ක්‍රම්‍යය අවබෝධ කිරීම සඳහා ශ්‍රද්ධාවෙන් පැවිදි වූයේ

යයි යූ.සේයි. **උදපානං තිණසසව භුසසසව යාව මුඛතො පූරෙසුං** යනු ජල පානය කරන ළිඳ, තණකොළිනුත් පිදුරුවලිනුත් මුවවිට තෙක්ම වැඩුහ. තෘණාදිය බහා ළිඳ වැසූහයි අර්තයි. එම ගමට පිටතින් භාග්‍යවතුන් වහන්සේ වඩනා මගෙහි බමුණන්ගේ පරිභෝජන සඳහා වූ එක් ළිඳක් වූයේය. එය හැර එහි සියලු ළිං වැව් ආදී දිය පවත්නා ස්ථාන එකල් වියලුනාහු දිය රහිත වූහ. එකල්හි තෙරුවන්හි නොපහන් මසුරු ප්‍රකෘතික ථූනෙය්‍යකයින් භාග්‍යවතුන් වහන්සේගේ වැඩම කිරීම අසා, ඉදින් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙගමට පිවිස දෙතුන් දිනක් වාසය කරන්නේ නම් මෙම සියලු ජනතාව තම වදන්හි තබන්නේය. ඉක්බිති බමුණු දහම පිහිටීමක් නොලබන්නේය. එහි භාග්‍යවතුන් වහන්සේගේ නොවිසීම සඳහා උත්සාහ කරනුයේ. මෙගමැ අන් තන්හි දිය නැත. මෙම ළිඳ පරිභෝග කළ නොහැක්කක් කරන්නෙමු. මෙසේ කල්හි ශ්‍රාවක සංඝයා සහිත ගෞතමයන් වහන්සේ මෙ ගමට නොපිවිසෙන්නේ යයි සම්මන්ත්‍රණය කොට සත්දිනකට දිය ගෙන සැළි ආදිය පුරවා ළිඳ, තෘණයෙන්ද, පිදුරුවලින්ද වැසූහ. එහෙයින් **උදපානං තිණසසව භුසසසව යාව මුඛතො පූරෙසුං මා තෙ මුණඩකා සමණකා පානීයං අපංසූති** යි යූ.සේයි. එහි මුඩු කළ අය අතර මුඩුකළ, ශ්‍රමණයන් අතර ශ්‍රමණයැයි කියන්ට වටනේය. අවමන් කිරීමේ අදහසින් පහත්කොට සිතන්නාහු මෙසේ කීහ. **මා** යනු ප්‍රතිෂේධාර්ථයෙහිය. නොබොත්වායි අර්ථයි. **මගගා ඔකකමම** යනු මාර්ගයෙන් ඉවත්ව, එතමහා යනු යම් ළිඳක් ඔවුන් විසින් එසේ කරන ලදුයේද එම ළිඳම දක්වනුයේ වදාළහ. කිමෙක්ද එම බමුණන්ගේ එම විකෘති ක්‍රියාව ආවර්ජනය නොකොට එම ළිඳෙන් දිය ගෙන එවයි එසේ වදාළ සේක්ද, නොහොත් ආවර්ජනය කොට දනුයේම වදාළේද? භාග්‍යවතුන් වහන්සේ දනුයේම තම බුද්ධානුභාවය ප්‍රකාශකොට ඔවුන් දමනය කොට, නිහතමානී කරන්ට එසේ වදාළහ. පැන් පානය කරනු කැමැත්තේ නොවේ. එහෙයින්ම මෙහි මහා පරිනිර්වාණ සූත්‍රයෙහි මෙන් පිපාසිත වූයෙමියි නො යූ.සේයි. ධර්ම භාණ්ඩාගාරික තෙම ශාස්තෘන් වහන්සේගේ අදහස නොදන්නේ, ථූනෙය්‍යක බ්‍රාහ්මණයින් විසින් කරන ලද විකාරය කියනුයේ, **ඉදානි සො භනෙත** යනාදිය කීය. එහි ඉදානි යනු දැන්, අපගේ සම්ප්‍රාප්ත වේලායෙහිම යැයි අර්ථයි. **එසො භනෙත උදපානොයි** කියවති. තෙරහු දෙවරක් විරුද්ධ දෙයක නො කරන්නේය. දීර්ඝ දර්ශීන් වහන්සේ කරුණා දක්නා ලද්දේ වන්නේ යයි භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය ගෙන ළිඳට ගියේය. තෙරුන් යන කල්හි (ළං ළං වන කල්හි) ළිඳෙහි දිය සම්පූර්ණ වී උතුරා භාත්පස ගලයි. සියලු තෘණද,

පිදුරුද පාවී තෙමේම ඉවත් විය. එයින්ම ගලා යන මතු මත්තෙහි වැඩෙන්නා වූ දිය දහරින් එගමැ සියලු පොකුණු ආදී වියලී ගිය ජලාස පිරී ගියහ. එසේම අගල්, කුඩා වළවල් හා සියලුම පහත්බිම් පිරී ගියහ. සියලු ගම් පෙදෙස, මහ වැසි කල්හි, මහ සැඩ දිය පහරකින් මැඩගත්තේ මෙන් විය. සුදු මානෙල්, මානෙල්, නෙලුම්, සුදු නෙලුම් ආදී ජලජ පුෂ්පයන් ඒ ඒ තන්හි බීජයකින් ගිරියක් මෙන් මතුවී පිපෙන්නාහු දිය වැසූහ. විල්හි හංස කොස්වාලිහිනින්, සක්වාලිහිණින් තාරාවන්, කොක්කු ආදී ජලජ පක්ෂීහු වසන්නාහු ඒ ඒ තන්හි හැසිරුණහ. ථූණෙය්‍යක බමුණෝ, එම මහ දියපහර උතුරා ගොඩට එමින් හාත්පස රැළ තරංගයන්ගෙන් ගැවසී, කෙළවරින් නැගෙන්නා වූ, මන වඩන නොයෙක් දිය බුබුල් දැක, ආශ්චර්යය අද්භූත සිත් හටගත්තාහු මෙසේ සම්මන්ත්‍රණය කළහ. අපි ශ්‍රමණ ගෞතමයන්ට දිය සිඳීම කරන්ට උත්සාහ කළෙමු. මෙම මහ දිය පහරඔහුගේ පැමිණි කල් පටන් මෙසේ අභිවෘද්ධියට පැමිණේ. ඒකාන්තයෙන් මෙය ඔහගේ ආනුභාවයක් විය යුතුය. හෙතෙම වනාහි මහත් ඍද්ධි ඇත්තේය. මහත් ආනුභාව ඇත්තේය. යම් ආකාර වූ මහ ජලකඳක් පැන නැග අපගේ ගමද යට කරන්නේය යන මෙම කරුණ විද්‍යමාන වේ. සිදුවිය හැකිය. එහෙයින් අප ශ්‍රමණ ගෞතමයන් කරා එළැඹ පයුරුපාසනය කොට වරද දෙසමින් සමා කරන්නෙමු කියා, ඒ සියල්ලෝ එක් අදහසක්ව සමූහ, සමූහ පිරිස් වූවාහු, වී ගමෙන් නික්ම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට එළැඹියහ. එළැඹ, ඇතැමෙක් භාග්‍යවතුන් වහන්සේගේ පාද සිරසින් වැන්දාහ. ඇතැමෙක් ඇඳිලි බැඳ ප්‍රණාම කළහ. ඇතැමෙක් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුසාමීචි කථා කළහ. ඇතැමෙක් තෘෂ්ණිම්භූතව හුන්හ. ඇතැමෙක් නම්ගොත් ඇස්වූහ. මෙසේ කොට සියල්ලෝම එකත්පස්ව හිඳ භවත් ගෞතමයන් වහන්ස, මෙහි අප භවත් ගෞතමයන් වහන්සේටත්, ගෞතම ශ්‍රාවකයින්ටද දිය වැළැක්මක් කළෙමු. අසවල් ළිඳෙහි තණකොළ ද පිදුරුද බහාලීම්හ. එම ළිඳ අචේතනික වූයේම සචේතනික වූවාක් මෙන්, භවත් ගෞතමයන් වහන්සේගේ ගුණ දන්නාක් මෙන් තෙමේම සියලු තෘණද පිදුරුද ඉවත්කොට අති පරිශුද්ධත්වයට පත් වූයේය. සියලුම පහත් ප්‍රදේශ මහත් දියෙන් පරිපූර්ණ වූයේ සිත් ඇදගන්නා සුළු විය. දිය හේතුවෙන් ජීවත්වන සත්ත්වයෝ මහත් සතුටට පත්වූහ. අප වනාහි මනුෂ්‍යයින් වූයේ නමුදු භවත් ගෞතමයන් වහන්සේගේ ගුණයන් නොදනුම්හ. එබඳු වූ අප මෙසේ කළෙමු. භවත් ගෞතමයන් වහන්සේ,

යම්සේ මෙම මහා දියපහර මේ ගම යට නොකරන්නේ ද එසේ කරන සේක්වා. වරද අප කෙරෙහි පැමිණියේය. යම් අකාර අඥාන වූ ඒ අපගේ වරද භවත් ගෞතමයන් වහන්සේ අනුකම්පා උපදවා පිළිගන්නා සේක්වායි වරද ප්‍රකාශ කළහ. භාග්‍යවතුන් වහන්සේද එසේනම් නුඹලා කෙරෙහි වරද පැමිණියේය. යම් ආකාර අඥාන වූ නුඹලාගේ එම වරද, මතු සංවරය සඳහා අප පිළිගනිමු. ඔවුන්ගේ වරද පිළිගෙන, ප්‍රසන්න සිත් ස්වභාවය දැන මත්තෙහි අදහස් අනුරූප වන ලෙස දම් දෙසීය. ඔව්හු භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනය ශ්‍රවණය කොට පැහැදුණු සිත් ඇත්තාහු තිසරණාදීන්හි පිහිටා භාග්‍යවතුන් වහන්සේ වැඳ ප්‍රදක්ෂිණා කොට ගියහ. ඔවුන්ගේ පැමිණීමට කල්ඇතිවම ආයුෂ්මත් ආනන්ද තෙරහු, එම ප්‍රාතිහාර්යය දැක, ආශ්චර්යය, අද්භූත සිත් හටගත්තේ, **පාත්‍රයෙන්** පැන් ගෙනවුත් භාග්‍යවතුන් වහන්සේට එළවා එපවත් සැළ කළේය. එහෙයින් **එවං භනෙතති බො ආයස්මා ආනන්දො** යන ආදිය යූ.සේයි. එහි **මුඛතො ඔවමිත්වා** යනු එම සියලු තෘණාදිය මුවවිටින් බැහැර කොට, **විස්සන්දෙනෙතා මඤ්ඤූ** යනු පෙර දිගු රැහැණකින් ළිඳෙන් ඉස ගතයුතු ජලංගය භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය ගෙන තෙරහු ගියකල්හි මුවවිටින් බැහැර වනුයේ ළිං ගැට්ට තරමට පිරී කවුඩන් පානය කරන ප්‍රමාණයට පත්ව පැවතිනි. මෙයද තෙරහු ගියකල්හි ජල ප්‍රවෘත්ති සඳහා යූ.සේයි. ඉන් මත්තෙහි වනාහි පෙර කියන ලද අයුරින් එගම සියලු පහත් ස්ථාන දියෙන් සම්පූර්ණ වූයේය. මෙම ඍද්ධිය වනාහි බුදුවරුන්ගේ අධිෂ්ඨානයෙන් නොවේ. දෙවියන්ගේ දේවානුභාවයෙන් ද නොවේ. තවද පිරිත් දෙසුම් සඳහා රජගහනුවරින් විසාලා නුවරට වැඩම කිරීමෙහිදී මෙන් භාග්‍යවතුන් වහන්සේගේ පුණ්‍යානුභාවයෙනි. සමහරු වනාහි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ථූනෙය්‍යක බ්‍රාහ්මණයින්ගේ ප්‍රසාද හටගැන්වීම සඳහා ඔවුන්ට වැඩ කැමැති දේවතාවන් විසින් කරන ලදැයි සලකති. අනෙකුත් අය ළිඳෙහි යට වසන නාරජු එසේ කළැයි කියති.

ඒ සියල්ල නො කරුණුය. කථාවෙහිද භාග්‍යවතුන් වහන්සේගේ පුණ්‍යානුභාවයෙන්ම එසේ ජල ඉපැත්ම මනාව දක්වන ලද හෙයිනි. **එතමත්ථං විදිත්වා** යනු එම අධිෂ්ඨානයෙන් තොරව තමා කැමැති වන ලද නිෂ්පත්ති සංඛ්‍යාත අර්ථය සර්වප්‍රකාරයෙන් දැන එකරුණ දැක්වීමට මෙඋදන් ඇනූ සේක.

එහි කිං කයිරා උදපානෙන ආපා වෙ සබ්බදා සියුං යනු යමෙකුට හැමකලැ හැම තැන ජලය වේද, ජලය ලබන්නේ ද, ඔවුන්ගේ ලාභය පානය කිරීම් මාත්‍රය පමණෙක්ම නම් එම ළිඳෙන් කුමක් කරන්නේද? කවර ප්‍රයෝජනදැයි අර්ථයි. **තණ්හාය මූලතො ඡෙත්වා කිසස පරියෙසනං කරෙ** යනු යම් ආකාර වූ බඳනා ලද සත්ත්වයෝ නොකළ පින් ඇත්තෝව කැමැති දෑ නොලැබීම් දුකින් පීඩාවට පත්වෙති. එම තෘෂ්ණාවගේ මුල හෝ මුලෙහි හෝ සිද සිටියා වූ මා වැනි වූ සර්වඥ බුදුවරයෙක් කුමකට කවර කරුණෙකින් පිවයුතු පැන් සෙවීම හෝ අන්‍ය වූ සත්‍යයන් සෙවීමෙහි හැසිරෙන්නේද? මූල සමග සිඳින ලදැයි කියවති. තෘෂ්ණාවගේ මුල මුලින් මම සිඳින ලදැයි අර්ථයි. නොහොත් 'මූලතො ඡෙත්තා' යනු මුල පටන් තෘෂ්ණාවෙහි සිඳින්නහු, මෙය යූ.සේයි. යමෙක් බෝධිමූලයෙහි වූ මහා ප්‍රණිධානයෙහි පටන් අප්‍රමාණ සියලු පින් රැස, තමා ගැන නොසිතා ලෝවැසියන්ගේ හිතාර්ථයම මේරීම් වශයෙන් සම්පූර්ණ කරනුයේ මුලපටන් තෘෂ්ණාව සිඳින ලද හෙයින්, තෘෂ්ණා හේතුක වූ, කැමැති දෑ ලැබීමෙහවී අභාවය හෙයින් කුමකට කවර කරුණෙකින් දිය සෙවීමට සරසනුයේද, මෙම අන්ධබාල ථූණෙය්‍යකයෝ මෙකරුණ නොදන්නාහු මෙසේ කළහයි අදහසයි.

නවවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

7-10

දසවැන්නෙහි, **රඤ්ඤා උදෙනසස** යනු යමෙක් වජ්ජි රජු යයි කියයිද, එම උදේන නම් රජුගේ, **උය්‍යාන ගතසස** යනු උයන්කෙළි සඳහා උයනට ගියහුට, මෙහි අනදරාර්ථයෙහි ෂෂ්ඨියි. **අනෙතපුරං** යනු දනව්ව අපේක්ෂාකොට, මෙය සම්බන්ධාර්ථයෙහි ෂෂ්ඨියි. **කාලං කතානි** යනු ගින්නෙන් දැවී මළාහු වෙති. **සාමාවතී පමුඛානි** යන මෙහි මෙම සාමාවතී කවර තැනැත්තියක්ද? කෙසේ දැවිනිද? කියනු ලැබේ. භද්දවතී සිටුහුගේ දියණිය ඝෝෂක සිටුහු විසින් ධීතෘ ස්ථානයෙහි තබනලදුව පන්සියයක් ස්ත්‍රීන් පිරිවරා උදේන රජුගේ අග්‍ර මහේෂිකාව වූයේ, මෛත්‍රී

විහරණ බහුල ආර්යශ්‍රාවිකා සාමාවතී නමැ. මෙය කෙටි විස්තරයයි. විස්තර වශයෙන් වනාහි මූලපටන් සාමාවතියගේ උත්පත්ති කථාව ධම්මපද වස්තුවෙහි කියන ලද ක්‍රමයෙන් දතයුත්තාහ. මාගන්දිය නම් බමුණුගේ දියණියයි. තම මව්පියන්ට

දිස්වාන තණ්හං අරතිං රගඤ්ච - නාහොසි ඡන්දෝ අපි මෙථුනසම්ං
කිමෙවිදං මුත්තකරීස පූණං - පාදාපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ

තෘෂ්ණා, අරති, රගා යන මර දූවරුන් ද දැක මෛථුනයෙහි කැමැත්තක් නොවීය. මළ මූත්‍ර පිරුණු මෙය කිමෙක්ද? මැය මාගේ පාවලින්ද ස්පර්ශ කිරීමට නොකැමැත්තෙමි.

යන භාග්‍යවතුන් වහන්සේ විසින් දේශිත මෙම නය අසා ශාස්තෘන් වහන්සේ කෙරෙහි බඳනා ලද ක්‍රෝධ ඇති මාගන්දිය පසුකල්හි උදේන රජුගේ අගමෙහෙසුන් තනතුරෙහි තබන ලදී. භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවරට එළැඹි බවද, සාමාවතී ප්‍රමුඛ පන්සියයක් ස්ත්‍රීන්ගේ උපාසිකා භාවයට පත් බවද දැන, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙනුවර පැමිණියේය. දැන් ඔහුට කළයුත්ත දන්නෙමි මැලාද ඔහුගේ උපස්ථායිකාවන්ය. සාමාවති ප්‍රමුඛ මැලාටද කළයුත්ත දන්නෙමියි නොයෙක් ක්‍රමයෙන් තථාගතයන් වහන්සේටද ඇලාටද අනර්ථයක් කරන්ට උත්සාහ කොට ද නොහැකි වනුයේ, නැවත එක්දිනක් රජු සමග උයන්කෙළියට යනුයේ සුළු පියාට, සාමාවතිය ගේ පහයට ගොස් වස්ත්‍ර කොටුගුල්, තෙල් කොටුගුල් විවර කරවා, වස්ත්‍ර තෙල් සැළිවල තෙමා ස්ථම්භයන් වෙලා, ඇලා සියල්ල එක්කොට දොරවල් වසා, පිටත යන්ත්‍රයක් සවිකොට, දඬු පහන්වලින් ගෙට ගිනි දෙමින් බැස එනු යයි පණිවුඩයක් යැවීය. හෙතෙම එය අසා, පහයට නැග කොටුගුල් විවරකොට, වස්ත්‍ර තෙල් සැළිවල පොඟවා ස්ථම්භයන් වෙලීමට ඇරඹීය. ඉක්බිති සාමාවති ප්‍රමුඛ ස්ත්‍රීහු, සුළු පියාණෙනි, මේ කිමෙක්දැයි කියමින් ඔහු කරා එළැඹුනහ. මෑණිවරුනි, රජු දැඩි කිරීම (ශක්තිමත්) කිරීම සඳහා ස්ථම්භයන් තෙල් වස්ත්‍රවලින් වෙළවයි (ඔතවයි) රජගෙහි මනා යෙදීම්, නොමනා යෙදීම් දැන ගැනීම දුෂ්කරය. මා සම්පයෙහි නොවිඳ යයි කියා ආවා වූ ඇලා ගර්භයන්ට (කාමර) ප්‍රවේශ කරවා දොරවල් වසා පිටත යන්ත්‍රයක් දී, මුල පටන් ගිනි දෙමින් බැස්සේය. සාමාවතිය ඇලාට මව්වරුනි, අනවරාග්‍ර සංසාරයෙහි හැසිරෙන්නේයෝ වූයේම, ගින්නෙන් දැවුණු ආත්මභාවයන්ගේ

පිරිසිඳීම බුදු නැණින් ද පහසු නොවේ. පමා නොවව් යයි අවවාද දුන්නීය. ඇලා බුදුරදුන් හමුයෙහි දහම් අසා, පැමිණි මාර්ගඵල ඇති ශාස්තෘ ශාසනයි දත් අශෛක්ෂ්‍ය ප්‍රතිසම්භිදා ප්‍රාප්ත බුජ්ජුත්තරා ආර්ය ශ්‍රාවිකාව විසින්, ශාස්තෘන් වහන්සේ විසින් දේශනා කරන ලද ක්‍රමයෙන්ම ධර්මය දේශනා කරනු ලබන්නී ඇය හමුයෙහි සෝවාන් ඵලය අවබෝධ කරන ලද්දාහු අතරතුර කමටහන් මෙනෙහි කිරීමෙහි මනාව යෙදුනාහු, ගෙය දැවී යන කල්හි වේදනා පරිග්‍රහ කමටහන මෙනෙහි කරන්නියෝ සමහරු දෙවන ඵලයට ද, සමහරු තෙවන ඵලයටද පත්ව කළුරිය කළහ. ඉක්බිති භික්ෂූහු කොසඹෑ නුවර පිඬු පිණිස හැසිරෙන්නාහු එපවත් දැන, පසුබත්හි භාග්‍යවතුන් වහන්සේට සැළකොට ඇලාගේ මරණින් මතු භවය පිළිබඳ විමසූහ. භාග්‍යවතුන් වහන්සේද ඇලාගේ ආර්යඵල අධිගමය භික්ෂූන්ට වදාළේය. එහෙයින් තෙන බො පන සමයෙන රඤ්ඤා උදෙනස්ස -පෙ- **අනිපඵලා කාලං කතා** යි යූ.සේයි. එහි අනිපඵලා යනු නිෂ්ඵල නොමව්, සම්ප්‍රාප්ත සෝවාන්ඵල ආදිය සහිතව ම කළුරිය කළහයි අර්ථයි. එම ඵල ලබන්නා වූ සාමාවතී ආදීහු:-

> ආරභථ නික්කමථ යුඤ්ජථ බුද්ධසාසනෙ
> ධුනාථ මච්චුනො සෙනං නළාගාරංව කුඤ්ජරෝ
> යෝ ඉමස්මිං ධම්ම විනයෙ - අපපමත්තෝ විපස්සති
> පහාය ජාති සංසාරං - දුක්ඛස්සන්තං කරිස්සති ති

අරඹව්. ගිහිගෙන් නික්මෙව්. බුදු සසුන්හි යෙදෙව්. මරහුගේ සේනාව දළ ඇතෙක් බටලීයෙන් තැනූ නිවසක් (බට කැලයක්) විනාශ කරන්නාක් මෙන් විනාශ කරව්. යමෙක් මෙම ධර්ම විනය සංඛ්‍යාත සස්නෙහි අප්‍රමාදීව විඳසුන් වඩයිද, හෙතෙම ඉපදීම් සංඛ්‍යාත සසර දුරුකොට දුක් කෙළවර කරන්නේය.

යන ගාථාවන්ගෙන් අවවාද කරනු ලබන්නාහු දුක් වේදනා පරිග්‍රහ කර්ම ස්ථානය මෙනෙහි කරන්නාහු විඳසුන් වඩා දෙවන තෙවන ඵලයන් ලැබූහ. බුජ්ජුත්තරාව ආයුෂ ශේෂ ඇති හෙයින් ද, පෙර එවැනි කර්ම නොකළ හෙයින් ද එම පහයෙන් පිටත වූයේය. දස යොදනෙක් අතර ගියේ යැයි ද කියති. ඉක්බිති භික්ෂූහු දම්සභායෙහි ඇවැත්නි, ආර්ය ශ්‍රාවිකාවන්ගේ මෙබඳු මරණ ඒකාන්තයෙන් පුදුමයෙකැයි කථාවක්

ඉපදවූහ. ශාස්තෘන් වහන්සේ වැඩමකොට මහණෙනි, දැන් මෙහි කවරනම් කථාවක් ආශ්‍රිතව සිටියහුදැයි විචාරා මෙනම් කථාවකින් යැයි කී කල්හි, මහණෙනි, ඈලාට යම් ආකාර වූ, මෙ අත් බැව්හි සිදු නොවිය යුත්තක් නොවිය. පෙර කරන ලද කර්මයට සිදුවිය යුත්තක්ම ඈලා විසින් ලබන ලදැයි වදාරා ඔවුන් විසින් ආයාචනා කරන ලදුයේ අතීත වත් ගෙනහැර දක්වා වදාළ සේක. අතීතයෙහි බරණැස් නුවර බඹදත් රජ රාජ්‍යය කරවන කල්හි පසේ බුදුවරු අටනමක් රජුගේ නිවෙස්නෙහි නිතර වළඳති. පන්සියයක් ස්ත්‍රීහු උන්වහන්සේලාට උවටැන් කරති. ඔවුනතර සත් පසේ බුදු කෙනෙක් හිමවතට වඩිති. එක් නමක් නදීතෙර සමීපයෙහි එක් තෘණ රැසක සමවතින් වැඩහිඳියි. නැවත එක් දිනක රජු පසේ බුදුවරු වැඩම කළ කල්හි එම ස්ත්‍රීන් සමග ජල ක්‍රීඩා ක්‍රීඩාකරනු කැමැත්තේ ගියේය. එහි එම ස්ත්‍රීහු දහවල් කාලයෙහි ජලයෙහි ක්‍රීඩාකොට සීතලෙන් පීඩාවට පත් වූයේ, ගිනි තපිනු කැමැතියේ එම තෘණ රාශිය මතුයෙහි මනාව වියලී ගිය තෘණයෙන් ගැවසී ගත්තේ තෘණ රැසකැයි සංඥාවෙන් පිරිවරා සිටියාහු ගිනි දමා තෘණ දැවී වැටෙන කල්හි පසේබුදුන් දැක, රජුගේ පසේ බුදුරජුන් පිළිස්සේ, එය රජු දැන අප නසන්නේ යයි මනාව දැවීම කරන්නෙමුයි (සම්පූර්ණයෙන්) සියලු ස්ත්‍රීහු ඔබිනොබින් දර ආදිය ගෙනවුත් පසේ බුදුන් මතුයෙහි රැසක් කොට දල්වා දැන් දැවෙන්නේ යයි ගියහ. ඈලා පළමුව චේතනාවකින් තොරව වී දැන් කර්මයෙන් බැඳුනහ. පසේබුදුන් වනාහි සමවත තුළ ඉදින් දර කරත්ත දහසක් වුව ගෙනවුත් දල්වනුයේ සිරුරට උණුසුම් ආකාර මාත්‍රයක් හෝ ගන්වන්ට නොහැකි වෙති. එහෙයින් පසේ බුදුරදහු සත්වන දින සමවතින් නැගිට සුවසේ වැඩි සේක. ඈලා එම කර්මය කළ හෙයින් බොහෝ වර්ෂ දහස් ගණන් බොහෝ වර්ෂ ලක්ෂ ගණන් නිරයෙහි පැසී එම කර්මයෙහිම අවශේෂ විපාක වශයෙන් ආත්මභාව සියයක මෙම ක්‍රමයෙන් ගෘහය පිළිස්සෙන කල්හි පිළිස්සුණාහ. මෙය ඈලාගේ පූර්ව කර්මයයි. ඈලා මෙඅත් බැව්හි ආර්යඵල සාක්ෂාත් කළහ. රත්නත්‍රය ඇසිරි කළහ. එහෙයින් එහි අනාගාමිනියන්ව සුද්ධාවාසයන්හි උපන්හ. අනෙක් සමහර අය තාවතිංසයෙහි. සමහරෙක් යාමයෙහි. සමහරෙක් තුසිතයෙහි, සමහරෙක් නිම්මාණරතියෙහි, සමහරෙක් පරනිර්මිත වසවර්තියෙහි උපන්හ. උදේන රජහුද, සාමාවතියගේ ගෙය පිළිස්සේයයි අසා වේගයෙන් පැමිණෙනුයේද, ඈලා දැවුණු කල්හිම පැමිණියේය. අවුත් ගිනි නිවා, උපන් බලවත් දොම්නස් ඇත්තේ, මාගන්දිය විසින් එසේ කරවන ලද බව

උපායෙන් දැන ආර්ය ශ්‍රාවිකාවන් කෙරෙහි කරන ලද අපරාධ කර්මයෙන් චෝදනා කරනු ලබන්නේ ඤාතීන් සමග ඇයට රජ අණ කරවීය. මෙසේ ඇය පිරිවර ජනයා සහිතව ඤාති මිත්‍රයින් සමග විනාශයට පැමිණියේය. **එතමත්ථං විදිත්වා** යනු එම සාමාවතී ප්‍රමුඛ එම ස්ත්‍රීන්ගේ ගින්නෙහි වැටීමෙන් වූ විනාශයට පත්වීමේ හේතුවද, මාගන්දියගේ ඥාති මිත්‍රයින් සමග රජ අණින් විනාශයට පත්වීමේ නිමිත්තද සර්වප්‍රකාරයෙන් දැන එකරුණ දැක්වීමට මෙ උදන් ඇනූ සේක.

එහි **මොහ සම්බන්ධනෝ ලොකෝ භබබරූපොව දිසසති** යනු සත්ත්ව ලෝකයා භව්‍යරූපියෙක්හු මෙන්, හේතු සම්පන්නයක්හු මෙන් දක්නා ලැබේ. හෙතෙම මෝහය හා සම්බන්ධ වූයේ, මෝහයෙන් හාත්පසින් වසන ලදුයේ, තමාගේ හිත අහිත නොදන්නේ හිතයෙහි නොපිළිපදී. අහිත දුක් එළවන බොහෝ රැස් කෙරේ. භව රූපොව දිසසතියි ද පාඨයි. එහි අර්ථය මෙම ලෝකයා මෝහය හා එකට බැඳුනේ, මෝහයෙන් හාත්පසින් වසන ලදුයේ එයින්ම භවරූපීව ශාස්වත භාවය මෙන් ඔහුගේ ආත්මය පෙනේ. අජරාමර වූයේ මෙන් වැටහේ. යමක් කරණකොට ප්‍රාණඝාතාදී නොකටයුතු දේ කරයිද එබඳු තත්ත්වයට පත්වේ. උපධි **සම්බන්ධනෝ බාලෝ තමසා පරිවාරිතෝ සසසති විය බායති** යනු හුදෙක් මෝහය හා එකට බැඳුනාහු පමණක් නොවේ. මෙම අන්ධබාල ලෝකයා අවිද්‍යා නමැති අඳුරින් පිරිවරන ලදුයේ උපධීන් හා එකට බැඳුනේ ද වේ. **යම් නුවණකින්** වෙනස් නුවූ ආකාරයෙන් කාමයන්හිද ස්කන්ධයන්හිද, අනිත්‍යය, දුක්ය, විපරිණාම ස්වභාවයැයි දක්නේද, එහි නොමැති වීමෙන්, **අන්ධබාල පෘථග්ජනයා නුනුවණ** නමැති අඳුරින් හාත්පස පිරිවරන ලදුයේ වසන ලදුයේ වේ. එහෙයින් හෙතෙම කාම උපධි කෙලෙස් උපධි, **ස්කන්ධ** උපධි යන මෙම උපධීන්ගේ වශයෙන් ද, උපධීන්ගෙන් බැඳුනේ, **ඉක්බිති** මෙසේ දක්නහුට උපධීන් ශාස්වත මෙන්, නිත්‍යය වූයේ හැමකල් වූයේ මෙන් වැටහේ. අසසසතිරිව බායතියිද පාඨයි. එහි අර්ථය, ආත්මය හැමකල්හි විද්‍යමාන වේ. ලැබේ. අනෙකෙක් අසසසති. ලෝකයාගේ අනිත්‍යයැයි යන එම උපධිය වැරදි සිත පිහිටුවා ගැනීම් වශයෙන් එක් කොටසක් සේ වැටහේ. වැටහේ යයි අර්ථයි. රකාරය වනාහි පද සන්ධි කරයි. **පසසතෝ නත්ති කිඤ්චනං** යනු යමෙක් වනාහි සංස්කාරයන්හි සිත ඔසොවා තබා අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කෙරේද, ඔහුට මෙසේ විදර්ශනා ප්‍රඥා සහිත වූ මාර්ග ප්‍රඥායෙන් තත්වාකාරයෙන් දක්නා

කල්හි, දන්නා කල්හි, පිළිපදනා කල්හි යමක් කරණකොට සසරෙහි බඳනා ලද්දේ වන්නේ ද එබඳු රාගාදී කිසිවක් නැත. එසේ නොදක්නහුම වනාහි, අවිද්‍යා තෘෂ්ණා, දෘෂ්ටි ආදී බන්ධනයන්ගෙන් සසර බඳනා ලද්දේ වන්නේ යයි අදහසයි.

දසවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

සත්වන චූල වර්ග වර්ණනා සමාප්තයි.

8-1

පාටලී ගාමීය වර්ගයෙහි, පළමුවැන්නෙහි, **නිබ්බාණ පටිසංයුත්තාය** යනු අමෘත ධාතු සන්නිශ්‍රිත, අසංඛත ධාතුවගේ දැනුම්දීම වශයෙන් පැවැති, ධම්මියා කථාය යනු ධර්ම දේශනාවෙන් **සංදස්සෙති** යනු ස්වභාව හා කෘත්‍යය වශයෙන් ලක්ෂණ වශයෙන් නිර්වාණය දක්වයි. **සමාදපෙති** යනු එම අර්ථයම එම භික්ෂූන්ට ගන්වයි. **සමුත්තේජෙති** යනු එම අර්ථ ග්‍රහණයෙහි උත්සාහ උපදවනුයේ තෙදවත් කරයි. බබලවයි. **සංපහංසෙති** යනු නිර්වාණ ගුණයන්ගෙන් මනාව සියලු ආකාරයන්ගෙන් සන්තෝෂ කරවයි. නොහොත් **සිංදස්සෙති** යනු එම සියලු සංස්කාර **සන්සිදවීම** සියලු නැවත ඉපදීමට හේතු දුරුකිරීම, තෘෂ්ණාව **ක්ෂය** කිරීම, නොඇල්ම-නිරෝධය යැයි ආදී ක්‍රමයෙන්ම, සියලු ආකාරයෙන්, ඒ ඒ ක්‍රමයෙන් ඔවුන්ගේ අදහස්වලට ගැලපෙන අයුරින් මනාව දක්වයි. **සමාදපෙති** යන මෙයින් ආර්ය මාර්ගයෙන් ඒ අවබෝධ කළයුතු යැයි අධිගම ප්‍රතිපදාව සමග එහි භික්ෂුව, නිමිනතාවය, නම්‍රතාවය පබහාරතාවය (බැවුම අනුව ම ගමන් කිරීම) කරවනුයේ සමාදන් කරවයි. ගන්වයි. **සමුත්තේජෙති** යනු එය දුෂ්කරය. ලබාගැනීම දුෂ්කරයැයි යහපත් ප්‍රතිපත්තියෙහි පමා නොවෙව. අතරතුර කෙළවරට පැමිණෙව්. මතු හේතුසම්පත් ඇති වීර්යවත්හුට මෙය දුෂ්කර නොවේ. එහෙයින් ශීල විශුද්ධි ආදී විශුද්ධි ප්‍රතිපදාවෙහි

විරිය කරව්. උත්සාහ කරව්. ව්‍යායාම කරව් යයි නිර්වාණාධිගමය සඳහා උත්සාහවත් කරවයි. එහි හෝ සිත පිරිසිදු කරයි. **සමපහංසෙති** යනු මද නිර්මදනය කරන පිපාස හික්මවන, ඇල්ම නසන, රාගක්ෂය, ද්වේෂක්ෂය මෝහක්ෂය යැයි ද, අසංඛතයැයි ද, අමෘතයැයි ද, ශාන්ත යැයි යනාදී ක්‍රමයෙන් නොයෙක් ක්‍රමයෙන් නිවනෙහි අනුසස් ප්‍රකාශ කිරීමෙන් එම භික්ෂූන්ගේ සිත සතුටු කරනුයේ සිනහ ඇති කරවනුයේ මනාව සතුටු කරයි. මනාව සනසවයි. **තෙව භික්ඛු අට්ඨිකත්වා** යනු කිසිවක් ඇත. අප විසින් මෙම අර්ථය අවබෝධ කළයුතුයැයි මෙසේ සළකා එම දේශනාවගේ අවශ්‍යතාවය ඇත්තෝව, **මනසිකත්වා** යනු සිතෙහි තබා, අන්‍යවිහිත නොකොට, එම දේශනය තම සිත තුළට ඇතුලත් කොට, **සබ්බ චෙතසා සමන්නා හරිත්වා** යනු සියලු ආකාර කාරක සිතින් මූලපටන් අවසානය තෙක් දේශනය ආවර්ජනය කොට ඒ හා අනුගතවම සිතා බැලීම කොට, නොහොත් **සබ්බ චෙතසො සමන්නාහරිත්වා** යනු මුළු සිතින් දේශනය මනාව කඩින් කඩ ගෙනවුත්, මෙය යූ.සේයි. දෙසන්නහු යම් සිතකින් දෙස්ම කරන ලදද, හැම අයුරින්ම සිතින් ඒ අනුව යොමුකොට පැවැත්ම, දෙස්මෙන් පිටත යන්ට නොදී මනාව අවිපරීතව කඩින් කඩ ගෙනවුත් තම චිත්ත සන්තානයට ගෙනවුත් දක්වන ලද පරිදි, දේශනා කරන ලද දේශනය මනාව විමසා බලා, **ඔහිතසොතා** යනු මනාව යොමුකළ මනාව තබන ලද ශ්‍රෝතස් ඇතියේ, ඔහිත සොතා යනු අවික්ෂිප්ත ශ්‍රොතස්, එයම ලබනුයේද ශ්‍රවණයෙහි අවික්ෂෙපය චක්ෂුඉන්ද්‍රියාදීන්හි සති සංවරය මෙන්, ශ්‍රොතිඉන්ද්‍රියාදීන්හිද කිවයුතු බවට සුදුසු වේ. මෙහිද අට්ඨිකත්වා යනාදී සිව් පදයන්ගෙන් එම භික්ෂූන්ගේ එහි නියැලුණු භාවයෙන් ශ්‍රවණයෙහිලා ඇල්ම දැක්වීමෙන් සකස් වූ ශ්‍රවණය දක්වයි. **එතමත්ථං විදිත්වා** යනු එම භික්ෂූන්ගේ නිර්වාණ ප්‍රතිසංයුක්ත දැහැමි කථාවෙහි ශ්‍රවණයෙහි ඇල්මෙන් කරන ලද බව සර්වප්‍රකාරයෙන් දැන, **ඉමං උදානං** එම නිර්වාණයෙහි එයට අසමාන දම් දෙසුම් මුඛයෙන් පරමාර්ථ වශයෙන් විද්‍යමාන භාවය පැහැදිලි කිරීමට උදන් ඇනූ සේක. එහි **අත්ථි** යනු විද්‍යමාන වේ. පරමාර්ථ වශයෙන් ලබයි යයි අර්ථයි. **භික්ඛවෙ** යනු එම භික්ෂූන්ට ඇමතීමයි. උදානය නම් ප්‍රීති සොම්නසින් හටගත්තා වූ හෝ, ධර්ම සංවේගයෙන් හටගත්තා වූ හෝ ධර්ම ප්‍රතිග්‍රාහක නිරපේක්ෂ කීමයි. මෙතෙක් සූත්‍රයන්හි එසේම ආයේය. මෙහි කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ උදන් අනනුයේ එම භික්ෂූන් ආමන්ත්‍රණය කළෙහිද? එම භික්ෂූන්ට හැඟවීම සඳහායි. භාග්‍යවතුන් වහන්සේ එම භික්ෂූන්ට නිර්වාණ ප්‍රති

සංයුක්ත ධර්ම දේශනාකොට, නිර්වාණ ගුණ අනුස්මරණයෙන් උපන් ප්‍රීති සොම්නස් ඇතියේ උදන් ඇනූ සේක. නිවනින් දුරු කළයුතු සියලු ස්වභාව ධර්මය ප්‍රත්‍යය අයත් පැවතුම් ඇතිවම ලබයි. ප්‍රත්‍යයක් ඇතිකල්හි ලැබේදැයි එම භික්ෂූන්ගේ සිතෙහි හටගත් විතර්කයන් දැන ඒවා හඟවනු කැමැත්තේ අපටී **භික්ඛවෙ තදායතනං** ආදිය වදාළහ. ඒකාන්තයෙන් ඔව්හු ප්‍රතිග්‍රාහකයින් කොටයැයි නොදත යුතුය. **තදායතනං** යනු එම කරුණ, ද කාරය පද සන්ධි කරයි. නිර්වාණය වනාහි මාර්ග ඵල ඥානාදීන්ට ආරම්මණ ප්‍රත්‍යය භාවයෙන් චක්ෂු විඤ්ඤාණාදීන්ට රූපාදීන් මෙන් ආරම්මණ ප්‍රත්‍යය වූයේ යයි කාරණාර්ථයෙන් ආයතනයැයි කියයි. මෙතෙකින්ම භාග්‍යවතුන් වහන්සේ විසින් එම භික්ෂූන්ට අසංඛත ධාතුවෙහි පරමාර්ථ වශයෙන් විද්‍යමාන බව දැනුම් දෙයි. මේ එහි දහම් (නයයි.) ක්‍රමයයි. මෙහි හේතුවකින් හටගත් ධර්මයන්ගේ විද්‍යමාන හෙයින් හේතුවකින් හට නොගත් ධාතුවක් ද විය යුතුය. ස්වභාව ධර්මයන්ට ප්‍රතිපක්ෂ හෙයිනි. යම්සේ වනාහි දුක් විද්‍යමාන කල්හි, එයට ප්‍රතිපක්ෂ වූ සුවයද විද්‍යමාන වේමය. එසේම උෂ්ණය විද්‍යමාන කල්හි සීතලද විද්‍යමාන වේ. පාප ධර්මයන් විද්‍යමාන කල්හි කල්‍යාණ ධර්මද විද්‍යමාන වෙති. යූ.සේයි.

යථාපි දුක්ඛෙ විජ්ජනෙත - සුඛං නාමපි විජ්ජති
එවං භවෙ විජ්ජමානෙ - විභවොපි ඉච්ඡිතබ්බකො

යම්සේ දුක් විද්‍යමාන වන කල්හි සුවය නම් වූවක් විද්‍යමාන වේද, මෙසේ භවයෙන් විද්‍යමාන කල්හි විභවයද කැමැති විය යුතුය.

යථාපි උණ්හෙ විජ්ජනෙත - අපරං විජ්ජති සීතලං
එවං තිවිධග්ගි විජ්ජනෙත - නිබ්බාණං ඉච්ඡිතබ්බකො

යම්සේ උෂ්ණයන් විද්‍යමාන කල්හි, සීතල නම් වූ අනෙකක් විද්‍යමාන වේද, මෙසේ ත්‍රිවිධාග්නි විද්‍යමාන කල්හි නිවීමක් කැමැති විය යුතුය.

යථාපි පාපෙ විජ්ජනෙත - කල්‍යාණම්පි විජ්ජති
එවමෙව ජාති විජ්ජනෙත - අජාතිම්පි ඉච්ඡිතබ්බකංති

යම්සේ පාපයන් විද්‍යමාන කල්හි යහපත් දැයක් විද්‍යමාන වේද, එපරිද්දෙන්ම ඉපැත්ම විද්‍යමාන වන කල්හි නොඉපැත්මක්ද කැමැති විය යුතුය. යනාදිය කීහ.

තවද නිර්වාණයෙහි පරමාර්ථ වශයෙන් පවත්නා බව විවරණය කිරීම මත්තෙහි ප්‍රකට වන්නේය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අසංඛත ධාතුයෙහි පරමාර්ථ වශයෙන් විද්‍යමාන බැව් හමුයෙන් දක්වා, දැන් එයට අසමාන ධර්ම අවසාන මුඛයෙන් එහි ස්වභාවය දක්වන්ට

යත්ථ නෙව පථවී නව ආපො යනාදිය වදාළහ. නිර්වාණය සියලු සංස්කාර අසමාන ස්වභාවය යම්සේ ප්‍රත්‍යයන්ගෙන් හටගත් ධර්මයන්හි කිසිතැනක නොමැත. එසේම එහිද සියලු ප්‍රත්‍යයෙන් හටගත් ධර්ම සංඛත අසංඛත ධර්මයන්හි ගැලපීමක් හට නොගනී. එහි මේ අර්ථ ගෙනහැර දැක්වීමයි. **යත්ථ** යම් නිර්වාණයක යම් අසංඛත ධාතුයෙක්හි කර්කශ ලක්ෂණ පෘථිවි ධාතුව නැත. වැගිරෙන ලක්ෂණ ආපෝ ධාතුව නැත. උෂ්ණ ලක්ෂණ තේජෝ ධාතුව නැත. පිම්බවීම් ලක්ෂණ වායෝ ධාතුව නැත. මෙසේ සිව්මහා භූත අභාව වචනයෙන් සියලු උපාදා රූපයාගේ අභාවය ය්‍යුදේසියි. එය නිශ්‍රිත හෙයිනි. මෙසේ ශේෂ රහිතව කාම රූප භවයන්හි එහි අභාවය ය්‍යුදේසියි. එයට අයත් පැවැත්ම නොමැති හෙයිනි. මහා භූත ආශ්‍රිතයෙන් තොරව, පංචවොකාර භවය හෝ චතුවොකාර භවය හට නොගනී. දැන් අරූප ස්වභාවත්වයෙහිද, නිර්වාණයාගේ අරූප භවයට ඇතුලත් වූ ධර්මයන්ගේ එහි අභාවය දක්වන්ට, **න ආකාසානඤ්චායතනං -පෙ- න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං** යනාදිය ය්‍යුදේසියි. එහි **න ආකාසානඤ්චායතනං** යනු අරමුණු සහිත **කුසල විපාක ක්‍රියා** භේද වූ ත්‍රිවිධ වූද ආකාසනඤ්චායතන චිත්තෝත්පාදය නැතැයි අර්ථයි. සෙස්සෙහිද එම ක්‍රමයමැයි. යම්තැනක පටන් නිර්වාණයෙහි කාම ලෝකාදීන්ගේ අභාවය වේද, එතැන් පටන් එහි මෙලෝ පරලෝ ආදීන්ගේද අභාවයැයි කීය. **න අයං ලොකො න පරො ලොකො** එහි අර්ථය. යම් ආකාර වූ මෙලොව ඉහාත්මය. මෙලොව යැයි ලද ව්‍යවහාර ඇති ස්කන්ධ ලෝකයයි. යම් ආකාර වූ එයින් අන්‍ය වූ, අනෙකක්. මරණින් මතුයෙහි යැයි ලද ව්‍යවහාර ඇති ස්කන්ධ ලෝකයද යන එම දෙකම එහි නොමැතිය. **න උභො චන්දිම සුරියා** යම්තැනක රූප භවයක් ඇතිකල්හි අඳුර වන්නේය. අඳුර විනාශ කිරීම සඳහා සඳ-හිරු

පැවතිය යුතුය. සම්පූර්ණයෙන් යම් තැනක රූප භවය නැත්ද, එහි අඳුරක් කොයින්ද? අඳුර විනාශ කරන සඳහිරු හෝ නොමැත. එහෙයින් සඳ හිරු යන දෙකද, එම නිර්වාණයෙහි නැතැයි අර්ථයි. මෙයින් එම නිර්වාණයාගේම ආලෝකමත් ස්වභාවය දක්වයි. මෙතෙකින් එම භික්ෂූන් විසින් අවබෝධ නොකරන ලද, කෙළවරක් නොදක්නා සසරෙහි සිහිනෙනිදු, නොවිඳිනා ලද, ඉතා ගැඹුරු දැක්ම දුෂ්කර, අති සියුම්, තර්ක කළ නොහැකි, ඉතාමත් ශාන්ත වූ, නුවණැත්තන් විසින් විඳිය යුතු, ඉතා ප්‍රණීත අමෘත නිර්වාණය පැහැදිලි කරනුයේ පළමුව, අපෝ භිකඛවෙ තදායතනං යයි එහි විද්‍යමාන බැව් ඔවුන්ගේ අඥානාදීන් ඉවත්කොට 'යතඃ නෙව පඨවි -පෙ- න උභො චන්දිම සුරියා යි එයින් අන්‍ය ධර්මයන් පිවිසීම් මුඛයෙන් ධර්මරාජයාණන් වහන්සේ එය පැහැදිලි කරයි. එහෙයින් එහි පෘථිවි ආදී සියලු සංඛත ධර්ම අසමාන ස්වභාවය වූ යම් අසංඛත ධාතුවක් වේද, එය නිර්වාණයයි දක්වන ලද්දේ වේ. එහෙයින් **තත්‍ර පාහං භිකඛවෙ නෙව ආගතිං** වදාවී යි දෙසූහ. එහි තත්‍ර යනු එහි අපි ශබ්දය එක් කිරීමෙහිය. මහණෙනි, මම සංස්කාර නො පවත්නා කල්හි කිසිතැනක කිසිවෙකුගේ පැමිණීම නොකියමි. හේතුව පරිදි එහි ධර්ම මාත්‍රයාගේ උපදනා හෙයිනි. මෙසේ එම ආයතනයෙහිද, නිර්වාණයෙහි කිසිතැනක පැමිණීම ඒම නොකියමි. පැමිණිය යුතු කාරණයෙහි නොමැති හෙයිනි. නඉතිං කිසිතැනක යාම නොකියමි. යා යුතු කාරණයෙහි නොමැති හෙයිනි. එහි සත්ත්වයින්ගේ නුවණින් අරමුණු කිරීම් හැර පැමිණීම් හෝ යාම් නොමැත. පැවතීම් චුතවීම්, ඉපදීම් ද නැතැයි කියමි. **තදාපහනතියිද** පාලියි. එහි අර්ථය, එම ආයතනය පිටිසර ගමකින් පිටිසර ගමකට මෙන් නොපැමිණිය යුතු හෙයින් නොපැමිණේ නමැ. යාමක් නොමැති හෙයින් නොයයි නමැ. පෘථිවි පර්වතාදිය මෙන් ස්ථිරව නොපිහිටන අර්ථයින් පිහිටීම නොමැත. ප්‍රත්‍යය රහිත භාවය හෝ උත්පාද අභාවයයි. ඉන් නොමැරෙන ස්වභාව හෙයින් චුතවීම් නොමැතිවීමයි. උත්පාද, නිරෝධ අභාව හෙයින් ද, එම ද්වයය පිරිසිදීමෙන් පැවැත්මෙහි ද අභාව හෙයින් පැවැත්මක් නොමැත. චුතියක් නැත. උපතක් නැතැයි වදාරමි. හුදෙක් එය අරූප ස්වභාවය හෙයින්, ප්‍රත්‍යය රහිත භාවයෙන් ද කිසිතැනෙක්හි නොපිහිටියේනුයි අපපතිඨංයි එහි පැවැත්ම අභාව හෙයින්ද, පැවැත්මට ප්‍රතිපක්ෂ හෙයින් ද නොපැවැත්මයි. අරූප ස්වභාවයෙහි වේදනාදීන් මෙන් ද කිසිම අරමුණක නොඑල්බෙන හෙයින් උපකාර නිරපේක්ෂක හෙයින් අරමුණු රහිත වූම ආයතනයැයි එය යූ.සේයි. නිර්වාණයයි.

මෙම එව ශබ්දය නොපිහිටියේමය. නොපවත්නේම යැයි යන පද ද්වයයෙහිම යෙදිය යුතුය. **එසෙවනෙතා දුකඛස්ස** යනු යම් මේ අපපතිඨං ආදී වචනයන්ගෙන් වර්ණිත ස්තුති කරන ලද කියන ලද ලක්ෂණ ඇති නිර්වාණයයි. එයම සමස්ත වෘත්ත දුක්ඛයාගේ කෙළවර, අවසානය එහි අවබෝධය ඇතිකල්හි සියලු දුක් අභාව හෙයින් දුක්ඛයාගේ කෙළවර යැයි මෙයම එහි ස්වභාවය යැයි දක්වයි.

ප්‍රථම සූත්‍ර වර්ණනාව නිමියේ ය.

8-2

දෙවැන්නෙහි **ඉමං උදානං** යනු මෙය නිවනෙහි ප්‍රකෘතියෙන් ගැඹුරු ස්වභාව හෙයින් දැක්ම දුෂ්කර බව දැක්වීමට උදන් ඇනූ සේක.

එහි **දුද්දසං** යනු ස්වභාවයෙන් ගැඹුරු බැවින් ඉතා සියුම් බැවින්, රැස්නොකළ ඥාන රාශීන්ගෙන් දක්නට නොහැක්කේනුයි දුද්දසං යි යූ.සේයි. යමක් කරණකොට නුඹ ආරොග්‍යතාවය දන්නෙහිද, නිර්වාණය ද දකින්නෙහිය. **එසේනම්** මාගන්දිය එබඳු වූ ආර්ය පැණසක් නුඹට නැත. අනෙකක් ද යූ.සේයි. 'යම් ආකාර වූ සියලු සංස්කාරයන්ගේ සංසිඳීමක් වේද යන මෙම **කරුණද** දැක්ම දුෂ්කරය ආදියයි. **අනතං** යනු රූපාදී අරමුණුවලද, කාමාදී භවයන්හිද නැමෙන හෙයින්, එහි නැඹුරු වූ ස්වභාවයෙන් පවත්නා හෙයින්, සත්ත්වයෝ ද එහි නැමෙන හෙයින් තෘෂ්ණාව නතානමැ. මෙහි නතා නොමැතිනුයි අනතංයි. නිර්වාණ යනු අර්ථයි. අනන්තංයිද කියවති. නිත්‍ය ස්වභාව හෙයින් අන්ත විරහිත වූයේ, චුත නොවන ස්වභාව නිරුද්ධ නොවන ස්වභාවය අමෘත යැයි අර්ථයි. සමහරු වනාහි අනන්ත යන පදයට අප්‍රමාණ යැයි අර්ථ කියති. මෙහිද **දුද්දසං** යන මෙයින් ප්‍රඥාව දුර්වල කරන රාගාදී කෙලෙසුන්ගෙන් බොහෝ කලක් වඩනා ලද හෙයින් සත්ත්වයන්ගේ අප්‍රත්‍යය භාවනාව (නිවන වැඩීම) **පහසු නොවේයයි නිර්වාණයාගේ** අවබෝධතාවය දක්වයි. **'නහි සච්චං සුදසසනං'** යන මෙයින්ද එම කරුණම ප්‍රකට කරයි. එහි **සච්චං**

යනු නිර්වාණයයි. එය කිසිම ක්‍රමයකින් අසාන්ත ස්වභාව නොමැති හෙයින්, ඒකාන්තයෙන්ම ශාන්ත හෙයින් විකෘති නොවූ ආකාරයෙන් සත්‍යයැයි ගත්තේය. නහි සුදසනං සුවසේ නොදැකිය යුතුය. දීර්ඝ කාලයක් පුණ්‍ය, ඥාන රාශීන් රැස් කරන්නවුන් විසින්ම දුකින් අවබෝධ කළයුතු හෙයිනි. එසේම භාග්‍යවතුන් වහන්සේ විසින්, මවිසින් දුකසේ අවබෝධ කරන ලද්දේ වෙමියි යූ.සේයි. **පටිවිද්ධා තණ්හා පසංතො නත්ථි කිඤ්චනං** යනු නිරෝධ සත්‍යය සාක්ෂාත් කිරීම් අවබෝධ වශයෙන් අවබෝධ කරන්නහු විසින්, විෂය වශයෙන් ද, කෘත්‍ය වශයෙන් ද අරමුණු වශයෙන් ද තෘෂ්ණාව අවබෝධ කරන ලදී. මෙසේද, ආර්ය සත්‍යයන්, ආරම්මණ ප්‍රතිවේධයෙන්, නුමුළාවීම් ප්‍රතිවේධ වශයෙන්ද ප්‍රතිවේධ කරන ලදහ. විශේෂ දැනීම් අවබෝධ වශයෙන් දුක්ඛ සත්‍යයද, භාවනා අවබෝධ කිරීම් වශයෙන් මාර්ග සත්‍යයද, නුමුළාවීම් වශයෙන් අවබෝධ කරන ලද්දේ වේ. මෙසේ ප්‍රහාණ අවබෝධ කිරීම් වශයෙන් නුමුළාවීම් වශයෙන් තෘෂ්ණාව අවබෝධ කරන ලද්දේ වේ. මෙසේ චතුරාර්ය සතයයන් තත්වාකාරයෙන් ආර්ය මාර්ග ප්‍රඥායෙන් දන්නහුට දක්නහුට භවාදීන්හි නැමුණු ස්වභාව වූ තෘෂ්ණාව නැත. එය නොමැති කල්හි සියලු කෙලෙස් වෘත්තයාගේ අභාවයයි. එයින්ම කර්ම විපාක වෘත්තයන්ගේ හට නොගැන්ම වේම යැයි, මෙසේ භාග්‍යවතුන් වහන්සේ එම භික්ෂූන්ට ශෝෂ රහිත සසර වට දුක් සන්සිඳවීමට හේතුභූත වූ අමා මහ නිවනෙහි ආනුභාව ප්‍රකාශ කළ සේක. සෙස්ස කියන ලද ක්‍රමයමය.

දෙවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

8-3

තෙවැන්නෙහි, **අථඛෝ භගවා එතමත්ථං විදිත්වා** යනු එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ නොයෙක් ක්‍රමයෙන් සසරෙහි ආදීනව ප්‍රකාශ කරයි. මනාව දැක්වීම් වශයෙන් නිර්වාණ හා බැඳි ධර්ම දේශනා කළ කල්හි එම භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ විසින් මෙ සසර අවිද්‍යාදී කාරණයන්ගෙන් හේතු සහිතව ප්‍රකාශ කරන ලදී. නිර්වාණයෙහි හා එහි සංසිඳීම පිළිබඳ කිසි කරුණක් නො යූ.සේයි. එම නිවන අහේතුකය.

කෙසේ ක්‍රියාකොට සාක්ෂාත් කිරීම් පරමාර්ථයෙන් ලැබේදැයි මෙවන් අදහසෙක් වීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එම භික්ෂූන්ගේ එම කියන ලද ආකාර පරිවිතර්ක සංඛ්‍යාත අර්ථය දැන, ඉමං උදානං යනු එම භික්ෂූන්ගේ, සැක විනාශ කිරීමටද මෙලොව මහණ බමුණන්ගේ 'නිර්වාණය, නිර්වාණය යැයි කියයි. එය කථන මාත්‍රයෙක්මය. පරමාර්ථ වශයෙන් නැතැයි ද, නිර්වාණය නම් නොලබන ස්වභාවයකැයි පරලොවක් නැත යන විනණ්ඩවාදය පිළිගත් අය මෙන්, නොමනාව පිළිපන්නා වූ මෙ සස්නෙන් බාහිර, බොහෝ දෘෂ්ටි ගතිකයින්ගේ මිථ්‍යාවාදයන් බිඳීම සඳහාද, මෙම අමෘත මහා නිර්වාණයාගේ පරමාර්ථ වශයෙන් විද්‍යමාන බැව් දැක්වීමට උදන් ඇතූ සේක. එහි අජාතං අභූතං අකතං අසංඛතං යන සියලුම පද ඒ ඒ පදවලට සමානාර්ථ ඇති වචනයන්ය. නොහොත් වේදනාදීන් මෙන් හේතු ප්‍රත්‍යයයන් එකතු වීම් සංඛ්‍යාත කරුණු එකතු වීමෙන් හටනොගත්තේ, නොනිපන්නේනුයි අජාතංයි. හේතුවකින් තොරව තෙමේම හෝ නොවූයේය. පහළ නුවූයේය. නූපනැයි අභූතංයි. මෙසේ නූපන් හෙයින්ද, නුවූ හෙයින්ද යම්කිසි කරුණකින් නොකරන ලද්දේනුයි අකතංයි. උපන්, හටගත් කළ ස්වභාවය නාමරූපාදී සංඛත ධර්මයන් වේ. අසංඛත ස්වභාව ඇති නිර්වාණයට නොවේයැයි දැක්වීම සඳහා අසංඛත යැයි යූ.සේයි. ප්‍රතිලෝම වශයෙන් හෝ එකතුව හටගෙන, ප්‍රත්‍යයන්ගෙන් කරන ලදැයි සංඛතංයි. එසේ සංඛත නුවූයේ සංඛත ලක්ෂණ රහිත වූයේ නුයි අසංඛතයි. මෙසේ නොයෙක් කාරණයන්ගෙන් උත්පත්ති ස්වභාව සිදුවූ කල්හි, එකම කරුණෙකින් කරන ලද්දේ යයි සැකය හෙයින් යම් කිසිවකින් නොකරන ලදැයි දැක්වීමට අකතං යැයි යූ.සේයි. මෙසේ අප්‍රත්‍යය වූයේම තෙමේම මෙය (ස්වයංක්‍රියව) වූයේද, පහළ වූයේදැයි සැකයට එය නැවැත්වීම සඳහා අභූතං යැයි යූ.සේයි. මේ මෙහි අසංඛත අකත අභූතභාවය සියල්ල එකතුව නූපදනා ස්වභාවයැයි දක්වන්ට අජාතයැයි යූ.සේයි. මෙසේ එම සිව්පදයන්ගේ සාර්ථක භාවය දැන, ඒ මෙම නිර්වාණය 'අත්‍ථි භික්ඛවෙ' ආදී වශයෙන් පරමාර්ථ වශයෙන් නිර්වාණයෙහි අස්ථිත්වය දක්වන ලදැයි දතයුතුය. මෙහි උදන් අනන භාග්‍යවතුන් වහන්සේ විසින් මහණෙනියි ඇමතීමෙහි හේතුව යට කියන ලද අයුරින්ම දතයුතුය. මෙසේ ශාස්තෘන් වහන්සේ මහණෙනි, අජාත, අභූත අකත අසංඛත යන මේවා ඇත යයි දේශනා කොට, එහි හේතුව දක්වනුයේ **නො චෙතං භික්ඛවෙ** ආදිය වදාළහ. එහි මේ සංක්ෂේපාර්ථයයි. මහණෙනි, ඉදින් නොඉපැත්ම ආදී ස්වභාව ඇති අසංඛත ධාතුව

නොවන්නේ නම්, මෙලොව ඉපැත්ම ආදී ස්වභාවයට හේතු වූ රූපාදී ස්කන්ධ පංචක සංඛ්‍යාතයෙහි නික්මීම ශේෂ රහිත සන්සිඳීම නොපැණෙන්නේය. නො ලබන්නේය. හට නොගන්නේය. නිර්වාණය අරමුණු කොට පවත්නා සම්‍යග් දෘෂ්ටි ආදී ආර්යමාර්ග ධර්ම කෙලෙසුන් ශේෂ රහිතව සිඳිත්. එහෙයින් මෙහි සියලු වෘත්ත දුක්ඛයාගේ නොපැවැත්ම, ඉවත්වීම, නික්මීම පැණේ. මෙසේ විශේෂ වශයෙන් නිර්වාණයෙහි විද්‍යමානතාවය පෙන්වා දැන් නොඑළඹීම් වශයෙන්ද එය දක්වන්ට යසමාව බො ආදිය යූ.සේයි. එය කියන ලද අර්ථමය. මෙහිද අප්‍රත්‍ය ධර්ම, අසංඛත ධර්ම' 'මහණෙනි, යම්තැනක පෘථිවිය නොවේද? එම ආයතනය (නිවන) ඇත. 'යම් ආකාර වූ සියලු සංස්කාරයන්ගේ සන්සිඳීම, සියලු උපධීන් අත්හැරීමක් වේද, යන මෙම කරුණද දැකීම දුෂ්කරය.' 'මහණෙනි, නුඹලාට අසංඛතයද, අසංඛතගාමිණී ප්‍රතිපදාවද ඇතුලත් ධර්මය දේශනා කරන්නෙමි' ආදී නොයෙක් සූත්‍ර පදයන්ගෙන්ද, 'මහණෙනි, නොඉපැත්ම ඇත' යන මෙම සූත්‍රයෙන්ද නිර්වාණ ධාතුවෙහි පරමාර්ථ වශයෙන් හටගැන්ම මුළු ලෝකයාට අනුකම්පා කරන සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශිතය. එහෙයින් ඉදින් අප්‍රත්‍යක්ෂකාරී ප්‍රාඥයින්ට ද සැකයක් හෝ විමතියක් හෝ නැත්තේමය. අනුන් විසින් මග පෙන්විය යුතු පුද්ගලයෝ ඔවුන්ගේ සැක දුරැලීම පිණිස මේ මෙහි අදහසයි. නිර්වාණ මූඛයෙන් යුක්ති විචාරණයෙහි හෝ විශේෂයෙන් දතයුතු බැවින්, ශ්‍රේෂ්ඨ නුවූ කාමයන්ටද රූපයන්ට ද ප්‍රතිපක්ෂ වූ, එයට අසමාන ස්වභාවය වූ සසරින් නික්මීම පෙනේ. මෙසේද අන් ස්වභාව වූ සියලු සංඛත ධර්මයන්ට ප්‍රතිපක්ෂතාවයෙන්, එයට අසමාන ස්වභාව වූ නිස්සරණයෙන් විය යුතුය. යම් ආකාර වූ එම නිස්සරණය වේද, එය අසංඛත ධාතුයි. වැඩිමනත් කුමටද? අසංඛත ධර්මාරම්මණ විදර්ශනා ඥානය අනුලොම ඥානය කෙලෙස් සිඳීම් වශයෙන් අත්හරින්ට නොහැකි වේ. එසේම සම්මුති සත්‍යය අරමුණුකොට ඇති ප්‍රථම ධ්‍යානාදීන්හි ඥානයද විෂ්කම්භන වශයෙන්ම කෙලෙස් දුරකරයි. සිඳීම් වශයෙන් නොවේ. මෙසේ අසංඛත ධර්මාරම්මණ වූද, සම්මුති සත්‍යාරම්මණ වූද, ඥානයට කෙලෙසුන්ගේ සිඳීම් වශයෙන් ප්‍රහාණයෙහි අසමත් බැවින් ඒවාහි සිඳීම් වශයෙන් ප්‍රහාණකර, ආර්යමාර්ග ඥානයෙහි එම ද්වයයටම විපරීත ස්වභාව අරමුණක් විය යුතුය. එය අසංඛත ධාතුවයි. එසේම මහණෙනි, අජාත, අභූත අකත, අසංඛතයක් ඇත යයි මෙම නිර්වාණ පදයෙහි පරමාර්ථ වශයෙන්, අස්ථිත්වය ප්‍රකාශ කරන වචනය නොවෙනස් අර්ථය භාග්‍යවතුන් වහන්සේ විසින් දේශිත හෙයින්, භාග්‍යවතුන් වහන්සේ

විසින් දේශිත අවිපරීතාර්ථය එය යම්සේ 'සියලු සංස්කාර අනිත්‍යයි සියලු සංස්කාර දුක්ය. සියලු සංස්කාර අනිත්‍යයැයි වශයෙනි. එසේම නිර්වාණ ශබ්දය උපචාර මාත්‍ර පැවැත්ම යෙදෙන හෙයින් සමහර විෂයයන්හි තත්වාකාරයෙන් පරමාර්ථ විෂය වේ. සමය ශබ්දය යම්සේද එසේය. පරමාර්ථ වශයෙන් අසංඛත ධාතුව ඇත්තේමය. අනෙක එයට විපරීත විනිර්මුක්ත ස්වභාව හෙයිනි. යම්සේ පෘථුවි ධාතුව විදීම් යයි මේ ආදී ක්‍රමයන්ගෙන් යුක්ති වශයෙන් ද, අසංඛත ධාතුවගේ පරමාර්ථ වශයෙන් විද්‍යමාන භාවය දැක්විය යුතුය.

තෙවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

8-4

සිව්වැන්නෙහි, අථඛො භගවා එතමත්ථං විදිත්වා යනු එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් මනාව පෙන්වීම් වශයෙන් නිර්වාණ ප්‍රතිසංයුක්ත ධර්ම දේශනාවගේ කළ කල්හි එම භික්ෂූන්ට මෙම භාග්‍යවතුන් වහන්සේ අමෘත නිර්වාණ ධාතුවෙහි නොයෙක් ආකාර වෙනස්කම්, අනුසස් දක්වන්නහු විසින් අන්‍යයන් හා සාධාරණ නුවූ ආනුභාවය ප්‍රකාශ කරන ලදී. එහි අවබෝධ කරන උපාය මාර්ගය නොවදාරන ලදී. කෙසේ පිළිපදනා වූ අප විසින් මෙය අවබෝධ කටයුතුදැයි යන එම අදහස වූයේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එම භික්ෂූන්ගේ එම කියන ලද ආකාර ඇති විතර්ක සංඛ්‍යාත කරුණා සර්වප්‍රකාරයෙන් දැන, ඉමං උදානං යනු තෘෂ්ණා වශයෙන් කිසිතැනෙක්හි ආශ්‍රිත නුවූ, සන්සුන් කය හා සිත් ඇති වීරි පිළිපන් විදර්ශකයාට ආර්ය මාර්ගයෙන් ශේෂ රහිතව තෘෂ්ණා ප්‍රහාණයෙන් නිර්වාණාධිගමය පැහැදිලි කිරීමට මෙළඳන් ඇතූ සේක.

එහි නිසසිතසස චලිතං යනු එය මම වෙමි. එය මාගේ ආත්මයැයි තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් කම්පා වූයේ වේ. අප්‍රහීණ තෘෂ්ණා දෘෂ්ටි සහිත පුද්ගලයාට, සුව ආදීන් උපන් කල්හි ඒවා මැඩපවත්වා වසන්ට නොහැකි වන්නහුට මාගේ විදීමය මම විදිමියි ආදී ක්‍රමයෙන් තෘෂ්ණා දෘෂ්ටි ග්‍රාහ

වශයෙන් කුසල් පැවැත්මෙන් චිත්ත සන්තානයෙහි, චලනය කම්පනය, පහත දැමීම හෝ වේයයි අර්ථයි. **අනිසිතසස චලිතං නත්ථි** යනු යමෙක් වනාහි විශුද්ධි පියවරෙහි පිළිපදිනුයේ, සමථ විදර්ශනාවන්ගෙන් තෘෂ්ණා දෘෂ්ටිහු මැඩපවත්වා අනිත්‍යාදී වශයෙන් සංස්කාරයන් මෙනෙහි කරනුයේ වෙසේ. එම තෘෂ්ණා දෘෂ්ටි ඇසුරු නොකළහුට කියන ලද ආකාර චලනය, පහත දැමීම කම්පනය හෝ නැත. කරුණ මනාකොට විෂ්කම්භනය කරන ලද හෙයිනි. **චලිතෙ අසති** යනු යම්සේ තෘෂ්ණා දෘෂ්ටිග්‍රාහයෝ නොපවතිත්ද, එසේ විදර්ශනා වීථියට පිළිපන් ඒ උත්සාහවත් වූවහුට, කියන ලද ආකාර චලනයක් නොමැති කල්හි, **පසසද්ධි** යනු විදර්ශනා චිත්තය සමග හටගත් කාය චිත්තයන්ගේ දෘඪ කෙලෙස් සන්සිඳීමෙන් දෙයාකාර වූද සන්සිඳීම වේ. **පසසද්ධියා සති රති න හොති** පෙරදීම, මත්තෙහි විශේෂතාවයෙන් යුත්, සන්සිඳීම ඇතිකල්හි නිරවද්‍ය සුව අධිෂ්ඨාන සමාධියද වර්ධනයකොට එය ප්‍රඥායෙන් එක්තැන් කිරීමෙන් සමථ විදර්ශනාව යුගනද්ධව යොදා මාර්ග පරම්පරාවෙන් කෙලෙස් ක්ෂය කරන්නහුට කාමභවාදීන්හි නැමෙන හෙයින් නතායි ලද නමැති තෘෂ්ණාව අර්හත් මාර්ග ක්ෂණයෙහි ශේෂ රහිතව නොමැති බවට පත් වේ. නූපදනා ස්වභාවයට පැමිණි හෙයින් නූපදී යයි අර්ථයි. **රතියා අසති** යනු අර්හත් මාර්ගයෙන් තෘෂ්ණාව මනාව ප්‍රහීණ කළ හෙයින් භවාදීන් සඳහා ඇල්ම හා බලවත් ආශාවෙහි නැඟී සිටීම නොමැති කල්හි, **ආගති ගති නහොති** යනු ප්‍රතිසන්ධි වශයෙන් මෙලොවට පැමිණීමද, ආගමනයද, චුති වශයෙන් යාම, මෙලොවින් පරලොව ගමන්, පරලෝකත්වය නොවේ. නොපවතියි. **ආගති ගතියා අසති** යනු කියන ලද ක්‍රමයෙන් ඊමෙහි හා යාමෙහි නොමැති කල්හි. **චුතූපපාතො න හොති** යනු භවයෙන් භවයට නොසිදී යන චුති උත්පත්ති නොවේ. නොපවතියි. කෙලෙස්ව නොමැති කල්හි කම්වට සිඳින ලද්දේමය. එය සිඳි කල්හි, විපාක වට කෙසේ හටගනිද, හට නොගනිමය. එහෙයින් **චුතූපපාතෙ අසතිනෙවිධ නහුරං** යනාදිය කීය. එහි යමක් කිවයුතුද, එය යට බාහිර සූත්‍රයෙහි විස්තර වශයෙන් යූ.සේමය. එහි යූසෙයින්ම දතයුතුය. මෙසේ භාග්‍යවතුන් වහන්සේද මෙහිද එම භික්ෂූන්ගේ ශේෂ රහිත සසර වට දුක් සන්සිඳීමට හේතු වූ අමෘත මහා නිර්වාණයෙහි ආනුභාව මනා ප්‍රතිපත්තියෙන් ප්‍රකාශ කළ සේක.

සිව්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

8-5

පස්වැන්නෙහි **මල්ලෙසු** යනු මෙනම් දනව්වෙහි **මහතා භික්ඛු සංඝෙන** යනු ගුණ මහත්වයෙන් හා සංඛ්‍යා මහත්වයෙන් මහත් වූ, එම බික්සඟන සීලාදී ගුණ විශේෂ යෙදීමෙන්ද එහි සියල්ලන්ට පසුව වූවහුගේ සෝවාන් භාවය හෙයින්ද මහත් වූයේ. (යටත් පිරිසෙයින් අන්තිමයා සෝවාන් වූයේය.) නොපිරිසිදි ගණන් හෙයින් සංඛ්‍යා මහත්වයෙන්ද මහත්ය. ආයු සංස්කාර අත්හැරීමෙහි පටන් පැමිණි පැමිණි භික්ෂූහු ආපසු හැරී නොගියහ. **චුන්දස්ස** යනු එම නමින් යුක්තහුගේ, **කම්මාර පුත්තස්ස චුන්දස්ස** යනු එම නමින් යුත්තහුගේ, **කම්මාර පුත්තස්ස** රන්කරු පුතුගේ, හෙතෙම ධනාඩ්‍ය මහ කෙළෙඹියෙකි. භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රථම දර්ශනයෙන්ම සෝවාන්ව තම අඹ වනයෙහි ශාස්තෘන් වහන්සේට සුදුසු ගඳකිළියක්ද බික්සඟනට රාත්‍රිස්ථාන, දිවාස්ථාන, උපස්ථාන ශාලා, කුටි මණ්ඩප, සක්මන්මලු ආදියෙන්ද යුතුව සම්පාදනය කොට පවුරුවලින් වටකරන ලදුයේ දොරකොටු යුත් වෙහෙරක් කොට බුද්ධප්‍රමුඛ සංඝයාට භාර දුන්නේය. ඒ සඳහා **තතුසුදං භගවා පාවායං විහරති චුන්දස්ස කම්මාර පුත්තස්ස අම්බවනෙයි** යූ.සේයි. පටියාදාපෙත්වා යනු සම්පාදනය කොට යන අර්ථයි. **සූකර මද්දවං** යනු ඌරාගේ මෘදු සිනිඳු ත්‍රිකෝටි පරිශුද්ධ මඳුවං යනු ඌරුමස් නොවේ. උඹරන් විසින් තලා පොඩිකර දමන ලද උණ ගොබයැයි කියති. අනෙක් අය උඹරන් විසින් මඬනා ලද පෙදෙසෙහි හටගත් බිම්මල් (හතු) යැයි කියති. තවත් සමහරු සූකර මද්දව එක් රසායනයකැයි ගත්හ. චුන්දකර්මාර පුතු අද භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පාන්නේ යයි අසා, එය අනුභවකොට, බොහෝ කලක් ජීවත්ව සිටින්නේ නම් ඉතා යෙහෙකැයි ශාස්තෘන් වහන්සේගේ චිර ජීවන අපේක්ෂායෙන් දිනියැයි ද කියති. **තෙන මං පරිවිස** යනු ඉන් මා අනුභව කරව. කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක්ද යත්, අන් අය කෙරෙහි අනුන් කෙරෙහි කරුණාව හේතුවෙනි. එම කරුණ පෙලෙහි යූ.සේමය. ඔහු විසින් එළවන ලද භික්ෂාවෙන් අනෙකා පරිභෝග කරවීම නුසුදුසු හෙයිනැයි එසේ කියන්ට සුදුසුයැයි දක්වන ලද්දේ වේ. එම සූකර මද්දවයෙහි දෙදහසක් දිවයින් පිරිවර ඇති සිව්මහා දිවයින්හි දේවතාවෝ දිව්‍යඕජස් බහාලූහ. එහෙයින් එය අන්කිසිවෙකුට මනාව දිරවන්ට නොහැකි වේ. එකරුණ ප්‍රකාශ කරන්නා වූ ශාස්තෘන් වහන්සේ

අන්‍ය දොස් කීම්වලින් මිදීම සඳහා **නාහනතං වුත්‍ත පසසාමි** යි ආදියෙන් සිහනද නද කළ සේක. යම් ආකාර අන්‍යයන් විසින්, තමා **විසින්** අනුභවකොට වූ ඉතිරිය භික්‍ෂූන්ට අන් මිනිසුනටද නුදුන්නේය. වලක් හාරවා විනාශ කළේ යයි දොස් කියන්නාහුය. ඔවුන්ගේ කීමට අවකාශයක් නොවේවායි අන්‍ය දොස් කීම්වලින් මිදීම සඳහා සිහනද නද කළ සේක. එහි **සදෙවකෙ** යනාදීන්හි දෙවියන් සහිත වූයේ නුයි **සදෙවකොයි.** මාරයා සමග වූයේනුයි **සමාරකො** යි බ්‍රහ්මයා සමග වූයේනුයි **සබ්‍රහමකොයි.** ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූයේ නුයි **සසසමණ බ්‍රාහමණි** යි. ප්‍රජාවට අයිත් හෙයින් පජායි. දෙවි මිනිසුන් සහිත වූයේනුයි සදෙව මනුසසායි. **තසමිං සදෙවකෙ** ලොකෙ -පෙ- **සදෙව මනුසසාය,** එහි සදෙවක වචනයෙන් පස්වැදෑරුම් කාමාවචර දේවග්‍රහණයයි. **සමාරක** වචනයෙන් **ෂට්** කාමාවචර දේව ග්‍රහණයයි. සබ්‍රහ්මක වචනයෙන් **බ්‍රහ්ම** කායිකාදී බ්‍රහ්ම ග්‍රහණයයි. සසසමණ බ්‍රාහමණී වචනයෙන් සස්නට **සතුරුපස මිතුරු** මහණ බමුණන්ගේ ග්‍රහණයයි. සංසිඳවූ පව් ඇති, බහා තැබූ පව් ඇති මහණ බමුණන්ගේ ග්‍රහණයයි. පජා වචනයෙන් සත්ත්ව ලෝක ග්‍රහණයයි. සදේව මනුස්ස වචනයෙන් **සම්මුති** දෙවිවරු හා සෙසු මනුෂ්‍ය ග්‍රහණයයි මෙසේ මෙහි තෙපදයන්ගෙන් අවකාශ ලෝක වශයෙන් ද, දෙපදයකින්, ප්‍රජා වශයෙන් ද සත්ත්ව ලොක්ය ගන්නා ලදැයි දතයුතුය. වෙනත් ක්‍රමයක්, සදේවක වචනයෙන් අරූපාවචර ලෝකය ගන්නා ලදී. **සමාරක** වචනයෙන් ෂට් කාමාවචර දේවලෝකයන්, සබ්‍රහ්මක වචනයෙන් රූපී බ්‍රහ්ම ලෝකයන්, සසසමණ බ්‍රාහමණ ආදී වචනයෙන් සිව් පිරිස් වශයෙන් සම්මුති දෙවිවරු සහිත මිනිස්ලොව, සෙසු සත්ත්ව ලෝකය හෝ ගන්නා ලදැයි දතයුතුය. **භූතනා විසස** යනු අනුභව කළහුට බරෝ යනු එරුෂ, ආබාධො යනු විසභාග රෝගයක්, බාලහා යනු බලවත් වූ, **මාරණන්තිකා** යනු මරණය සම්පයට පැමිණවීමට සමත්, **සතො සමපජානො අධිවාසෙසි** යනු සිහිය මනාව පිහිටුවීම කොට නුවණින් පිරිසිඳ ඉවසූ සේක. **අවිහඤ්ඤමානො** යනු වේදනාව අනුව පැවතීම් වශයෙන්, නොසලකා සිටින ස්වභාව මෙන්, ඔබිනොබ පෙරළීම් නොකරනුයේ, නොපෙළනු ලබනුයේ මෙන් දුක් පීඩා නොවන්නාක් මෙන් ඉවසූ සේක. භාග්‍යවතුන් වහන්සේට බෙලුව නම් කුඩා ගමෙහිදීම එම වේදනාව උපන්නේය. සමවත් බලයෙන් මැඩ පවත්වන ලදුයේ, පිරිනිවන් දිනය දක්වා එය නොඉපදුනහ. දිනෙන් දින සමාපත්තීන්ගෙන් යටපත් **කිරීමෙනි.** එදින වනාහි පිරිනිවෙනු කැමැතියේ, කෝටි ලක්‍ෂයක් හස්තීන්ගේ බල දරන්නා

වූ, එකට බැඳි දියමන්ති සමාන ශරීර ඇති ප්‍රමාණ රහිත කාලයක් රැස්කල පුණ්‍ය රාශීන් ඇතියහුටද, භවය ඇති කල්හි මෙබඳු වේදනා පවතිත්. අනෙක් අය ගැන කියනුම කවරේදැයි සත්ත්වයින්ට සංවේග හටගැන්වීම සඳහා සමවතට සම නොවැදි සේක. එහෙයින් වේදනාව කර්කෂව පැවතුනහ. **ආයාම** යනු එව යමු. **චුන්දසස භත්තං භුඤ්ජිත්වා** යනාදිය පසුකල්හි ධර්ම සංග්‍රාහකයින් විසින් තබන ලද ගාථාවන්ය. එහි **භුත්තසසව සූකර මද්දවෙ** යනු වළඳන ලද්දහුට හටගත්තේය. වැළඳීම් හේතුවෙන් නොවේ. ඉදින් නොවළඳන ලද්දහුට හටගත්තෙහිද, ඉතා ගොරෝසු වන්නේය. සිනිඳු බොදුනක් වළඳන ලද හෙයින් වේදනාව තුනී විය. එහෙයින් පා වලින් වැඩම කරන්ට හැකි විය. එයින් යම් ආකාර වූ මෙම, එය අනුභව කරන ලද, තථාගතයන් හැර අනෙකෙකුට මනාව දිරවීමට යන්නේදැයි සිහනද නාද කරන ලදුයේ, එහි සාර්ථකත්වය දක්වන ලදහ. බුදුවරුන්ගේ අස්ථානයෙහි ගර්ජනයක් නම් නැත. එය පරිභෝග කරන ලද භාග්‍යවතුන් වහන්සේට කිසි විකෘති ස්වභාවයක් නොඉපදවිය. කර්මයෙන් ලද අවකාශයෙන් උපදවනු ලබන විකෘතිය අප්‍රමාදතාවයෙන් සන්සිඳවනුයේ ශරීර බල ඉපදවිය. ඉන් යම්සේ කියනු ලබන ත්‍රිවිධ ප්‍රයෝජන ඉටුකරයිද, එහෙයින් එය මනාව දිරවීමට හියේය. මාරාන්තික වූ වේදනාව අනුවණයින්ට අප්‍රකට වූයේය. **විරිචව මානො** යනු නිතර පැවැති ලේ විරේචනයක් මෙන් පැවැති, **අවොච** යනු තමා කැමැති තන්හි පිරිනිවීම සඳහා මෙසේ වදාළේය. කවර හෙයින් වනාහි භාග්‍යවතුන් වහන්සේ මෙසේ රෝගය උපන්කල්හි කුසිනාරාවට වැඩම කළසේක්ද, කිමෙක්ද පිරිනිවෙන්නට නොහැකිකෙහිද? පිරිනිවෙන්ට නම් කිසිතැනක නොහැකි නොවනු ඇත. මෙසේ සිතූ සේක. මා කුසිනාරාවට ගියකල්හි මහා සුදර්ශන සූත්‍ර දේශනාවට අර්ථෝත්පත්ති වන්නේය. ඉන් යම් ආකාර වූ, දෙව්ලොවෙහි අනුභව කළයුතු සමාන සැප සම්පත් මවිසින් මිනිස් ලොවැ අනුභව කරන ලදී. එය දෙබනවරෙකින් මනාව සරසා දෙසන්නෙමි. එය අසා බොහෝ ජනතාව කුසල් කළයුතුයැයි හඟින්නාහ. සුභද්‍ර ද එහි මා කරා එළැඹ ප්‍රශ්න විචාරා, විසඳුම් කෙළවර තිසරණයන්හි පිහිටා පැවිදිව ලද උපසම්පදා ඇතියේ කමටහන් වඩා මා ජීවමාන කල්හිම අර්හත්වයට පත්ව පශ්චිම ශ්‍රාවකයා නම් වන්නේය. අන් තන්හි මා පිරිනිවි කල්හි ධාතු නිමිතිකොට මහා කලහයක් වන්නේය. ලෙය නදියක් මෙන් ගලන්නේය. කුසිනාරාහි පිරිනිවි කල්හි ද්‍රෝණ බමුණු තෙමේ විවාදය සංසිඳුවා ධාතූන් බෙදා දෙන්නේ යයි මෙම කාරණාත්‍රයය දක්නේ

මහත් උත්සාහයෙන් කුසිනාරාවට වැඩම කළ සේක. **ඉංඝ** යනු චෝදනාර්ථයෙහි නිපාතයි. **කිලනෙතාසම්** යනු වෙහෙසට **පත්වූයෙමි.** ඉන් කියන ලද ආකාර ඇති වේදනාවන්ගේ බලවත්භාවයම දක්වයි. භාග්‍යවතුන් වහන්සේ තම ආනුභාවයෙන් එකල පාදවලින් වැඩම කළ සේක. අන් අයට වනාහි යම්සේ පියවර එසවීම හෝ කිරීමට නොහැකි වේද, එබඳු වූ වේදනාව, තීක්ෂණව, රළුව, කටුකව පැවතුනහ. එහෙයින්ම **නිසීදිසසාමි** යි වදාළ සේක. **ඉදානි** යනු දැන්, **ලුළිතං** යනු මඬනා ලද්දක් මෙන් ආකුල වූයේ **ආවිලං** යනු මඩ, අචෙඡාදිකා යනු තුනී ප්‍රසන්න දිය **සාතොදිකා** යනු මිහිරි දිය, **සීතොදිකා** සිසිල් දිය, **සෙතොදිකා** මඩ රහිත, දිය වනාහි ස්වභාවයෙන් ශ්වේත වර්ණය භූමි වශයෙන් මඩ කැළඹීමෙන්ද අන්‍යාකාරයක් වේ. කුකුත්ථා නදියද පිරිසිදු වැලිවලින් ගැවසී ගත්තේ ශ්වේත වර්ණව ගලාබසියි. එහෙයින් සෙතොදිකායි යූ.සේයි. **සුපතිත්ථො** යනු සුන්දර තොට, **රමණීයානි** මනහර බිම්කඩ හෙයින් ද සිත් ඇලවිය යුතු හෙයින් ද, කියන ලද ආකාර ඇති ජල **සම්පත්තියෙන්ද** සිත් අලවන, **කිලනෙතාසම් චුන්‍ද නිපජ්ජිසසාමි** යන මෙහි,

තථාගතයන් වහන්සේට වනාහි

කාලාවකඤ්ච ගංගෙය්‍යං - පණ්ඩරං තම්බපිංගලං
ගන්ධ මංගල හෙමඤ්ච - උපොසථ ඡද්දනෙතන චෙති

මෙසේ කියන ලද, දස ඇත් කුලයන් අතර, කාලාවක සංඛ්‍යාත යම් දස ප්‍රකෘති හස්තීන්ගේ බලය, එම එක ගංගෙය්‍ය ඇතුට වේයයි මෙසේ දස ගුණයෙන් ගණනය කළ කල්හි ප්‍රකෘති ඇතුන් කෝටි දහසක බල ප්‍රමාණ ශරීර බලයක් වේද, එම සියල්ලම එම දිනයෙහි පසුබත්හි සිට කිරිගොට්ටට බහාලන ලද දිය මෙන් ක්ෂය විය. පාවාහි සිට **කුසිනාරාවට** තෙගව්වකි. ඒ අතරත පස්විසි තැනක වැඩහිඳ, මහත් උත්සාහයක් කොට වැඩමවනුයේ හිරු අවරට යන වේලායෙහි, භාග්‍යවතුන් වහන්සේ කුසිනාරාවට පැමිණි සේක. මෙසේ රෝගය නම් සියලු **නිරෝගතා** මර්දනය කරමින්, පැමිණෙයයි යන මෙකරුණ දක්වනුයේ, දෙවින් සහිත ලෝකයාට සංවේගකර වචනයක් වදාරනුයේ, **කිලනෙතාසම් චුන්‍ද නිපජ්ජිසසාමි** යි, චුන්‍දය ක්ලාන්ත වූයෙමි. වැදහොවින්නෙමියි වදාලේය. **සීහ සෙය්‍යං** යන මෙහි, කාමභෝගී සයනය, ප්‍රේත සයනය, තථාගත

සයනය, සීහ සයනය යැයි සයනාවස්ථා (නිදීම්) සතරෙකි. එහි බොහෝ සෙයින් කාමභෝගී පුද්ගලයා වම්පසට හැරී සයනය කරයි. මෙය **කාමභෝගී සයනයයි.** මහණෙනි, බොහෝ සෙයින් ප්‍රේතයෝ උඩුකුරුව **සයනය** කරයි. මෙය ප්‍රේත සයනයයි. චතුර්ථ ධ්‍යානය, තථාගත සයනයයි. මහණෙනි, මෘගරාජ සිංහයා දකුණුපසින් (දකුණට හැරී) **සයනය** කරයි. මෙය සිංහ **සයනයයි.** මෙය තෙදින් පිරුණු ඉරියව්වක් හෙයින් උතුම් සයනය නමැ. එහෙයින් **දක්ඛිණෙන පසෙසන සීහසෙය්‍යං කපෙපසි** යි යූ.සේයි. **පාදෙ පාදං** යනු දකුණු පාදයෙහි වම් පාදය තබා, අචචාධාය යනු මඳක් පාසා ගොප්ඇටය ඉක්මවා තබා. ගොප්ඇටයෙන් ගොප්ඇටය දණින් දණ ගැටෙනකල්හි නිතර වේදනා උපදිති. සයනය පහසු නොවේ. යම්සේ වනාහි නොගැවෙද, එසේ මඳක් ඉක්මවා තැබූ කල්හි වේදනා නූපදති. සයනය පහසු වේ. එහෙයින් එසේ වැදහෙව. 'ගත්‍වාන බුදෙධා' යන මෙම ගාථා පසුකල්හි ධර්ම සංග්‍රාහකයින් විසින් තබන ලදහ. එහි **නදිකං** යනු නදියට, **අපපටිමොධ ලොකෙ** යනු මෙම දෙවියන් සහිත ලෝකයා අතරෙහි සමානයෙක නොමැති, නහාවොච **පිවිත්‍වාච උදනාරි** යනු සිරුර සිසිල් කිරීම් වශයෙන් ස්නානය කොට පැන් පානයකොට ගඟින් එතෙර වූ සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පැන් සනහන කල්හි නදිය තුළ මස් කැසුබුහු දෙතෙර දියෙහි පිහිනන්නාහු එම භූමි ප්‍රදේශය සියල්ල වනලැහැබක් මෙන් රන්වන් වූයේම විය. **පුරකඛතො** යනු ගුණයන්ගෙන් විශිෂ්ඨ සත්වෝත්තම ගරු කළයුතු ස්වභාවයෙන්, දෙවියන් සහිත **ලෝකයා** විසින් පිදීම් බුහුමන් කිරීම් වශයෙන් පෙරටු කරන ලදුයේ, **භික්ඛු ගණසස මජෙඣ** භික්ෂු සංඝයා මධ්‍යයෙහි, එකලැ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වේදනාවන්ගේ අධිමාත්‍ර භාවය දැන ආසන්න වී හාත්පස පිරිවරන ලදුයේම යෙති. **සත්ථා** යනු ඉහාත්ම හා මරණින් මතු භවයන්හි දියුණුවට අදාලව උතුම් අර්ථයන්ගෙන් **සත්ත්වයින්ට අනුසාසනා** කරන හෙයින් සත්ථායි. **පවත්තා** යනු ප්‍රවකතෘ වූ - මනාව දෙසන්නා වූ. **භගවාච ධමෙම** යනු භාග්‍යවත් ආදියෙන් භගවායි. මෙහි **සීලාදී** සාසන ධර්මයන් පැවැත්වූ දේශනා කළ, අසූහාර දහසක් ධර්මස්කන්ධයන් පවත්වන ලද (දේශනා කරන ලද) **අමබවනං එම නදීතෙර පිහිටි** අඹවනය, **ආමනතයි චුන්දකං** යනු එකෙණෙහි ආයුෂ්මත් ආනන්දයන් දිය සලුව විහිදුවමින් ගඟට බැස්සේය. චුන්දක තෙරුන් සම්පයෙහි වූයේය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඔහු ඇමතීය. **පමුඛෙ නිසීදි** යනු **කිමෙක්ද** ශාස්තෘන් වහන්සේ අණ කෙරෙත්දැයි වත්

ශීර්ෂයෙන් ඉදිරියෙහි හුන්නේය. මෙපමණෙකින් ධර්ම භාණ්ඩාගාරික ආනන්ද හිමි පැමිණියේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙසේ පැමිණි ආයුෂ්මත් ආනන්දට ආමන්ත්‍රණය කළ සේක. **උපදහෙය්‍ය** යනු උපදවන්නේය. විපිලිසර උපදවන කිසියම් පුරුෂයෙක් **සියා** වන්නේ නම්, අලාභා යනු දන් දෙන්නා වූ අන්‍යයන්ට දානානිසංස සංඛ්‍යාත ලාභ වෙති. නුඹට අලාභය. **දුල්ලද්ධං** යනු පුණ්‍ය විශේෂයකින් ලද මනුෂ්‍යත්වය නොයහපත්කොට ලබන ලදී. **යසඝතෙ** යම් ආකාර වූ නුඹ විසින්, කවරාකාර වූ පශ්චිම පිණ්ඩපාතය වළඳ තථාගතයන් වහන්සේ පිරිනිවි සේක්ද, නො තැම්බුණු සහලින් හෝ තෙත් වූ සහලින්දැයි කවරෙක් එය දනීද, ඒකාන්තයෙන් ඔහු විසින් කවර කවර හෝ දැයක් දෙන ලද්දේ වන්නේය. **ලාභා** යනු ඉහාත්ම හා මරණින් මතු දානානිසංස සංඛ්‍යාත ලාභයන්, **සුලද්ධං** යනු නුඹගේ මනුෂ්‍යාත්මය මනාසේ ලබන ලදී. **සම්මුඛා** යනු හමුයෙන් අනුශ්‍රවයෙන් නොවේ. පරම්පරායෙන් නොවේයයි අර්ථයි. **මෙනං** යනු මා විසින් එය. මා විසින් එය. **ඵලමෙ** මෙම ද්වයය. **සමඵලා** යනු සර්වාකාරයෙන් සමාන ඵල, යම් ආකාර වූ සුජාතාව විසින් දෙන ලද පිණ්ඩපාතය වළඳ තථාගතයන් වහන්සේ මනාව අවබෝධ කළෙහිද, එය කෙලෙස් අප්‍රහීණ කාලයෙහි දානයයි. චුන්දගේ මෙම දානය වනාහි ක්ෂීණාශ්‍රව කාලයෙහිය. කවර හෙයින් ඒවා සමඵල විනිද? පරිනිර්වාණ සමතාවයෙන්ද, සමවත් සමතාවයෙන්ද, අනුස්මරණ සමතාවයෙන්ද වේ. භාග්‍යවතුන් වහන්සේ වනාහි සුජාතාව විසින් දෙන ලද පිණ්ඩපාතය වළඳ ඉතිරි වූ ස්කන්ධ පමණක් ඇති, නිර්වාණ ධාතුවෙන් පිරිනිවි සේක. චුන්ද විසින් දෙන ලද්ද වළඳ ඉතිරි වූ ග්‍රහණයක් නොමැති නිර්වාණ ධාතුවෙන් පිරිනිවියේ යයි මෙසේ පරිනිර්වාණයාගේ සමතායෙන් ද සමඵල වේ. බුද්ධත්වය අවබෝධ කරන දිනයෙහිද අග්‍ර මාර්ගයට හේතු වූ සිව් විසි කෝටි ලක්ෂ සංඛ්‍යාත සමාපත්තීන්ට සමවැදිණි. පරිනිර්වාණා දිනද එම සියලු සමවත්වලට සමවැදිණි. මෙසේ සමවත් සමතායෙන් ද සමඵල වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් යමෙකුගේ එම පිණ්ඩපාතය වළඳ අනුත්තර අප්‍රමාණ චිත්ත සමාධීන්ට එළැඹ වාසය කෙළෙම්ද, ඔහුට අප්‍රමාණ වූ පුණ්‍ය ප්‍රවාහයක්, කුසල් ප්‍රවාහයක් යනාදිය ශ්‍රු.සේයි. සුජාතාව පසුකල්හි ඒ රුක් දෙවියකු නොවේය. බෝසත් තෙම පිණ්ඩපාතය වළඳ අනුත්තර සම්‍යක් සම්බෝධිය අවබෝධ කරන ලදී. සත් සතියක් ඉන් ඔහුගේ යැපීම වූයේ යයි ඇසීය. ඇයට මෙය අසා, මට ඉතා ලාභයකැයි සිහි කරන්නී බලවත් ප්‍රීති සොම්නසක් හටගත්තේය. චුන්දටද

පසුකල්හි අවසන් පිණ්ඩපාතය මවිසින් දෙන ලදැයිද, මවිසින් ධර්ම ශීර්ෂය ගන්නා ලදී. මාගේ පිණ්ඩපාතය වළඳ ශාස්තෘන් වහන්සේ බොහෝ කාලයක් තුළ අවබෝධ කළ ධර්මය සහිතව වැඩ සිට, ඉතිරි ඉතිරි වූ ග්‍රහණයක් නැති නිර්වාණ ධාතුවෙන් පිරිනිවියේ යැයි අසා, මට ඉතා ලාභයකැයි සිහි කරනුයේ බලවත් ප්‍රීති සොම්නසක් හටගති. මෙසේ සිහිකිරීම් සමතාවයෙන්ද, පිණ්ඩපාත දාන ද්වයයම සමඵල යැයි දතයුත්තාහ. ආයු සංවත්තනිකං යනු දීර්ඝායු සඳහා පවත්නා. උපචිතං යනු රැස්කරන ලද, උපදවන ලද, යස සංවත්තනිකං පිරිවර සඳහා පවත්නා, ආධිපතෙය්‍ය සංවත්තනිකං යනු ශ්‍රේෂ්ඨභාවය සඳහා පවත්නා, එතමත්ථං විදිත්වා යනු ශ්‍රේෂ්ඨ භාවය සඳහා පවත්නා, එතමත්ථං විදිත්වා යනු එම දානයෙහි මහත් ඵලතාවයද, සීලාදී ගුණයන්ගෙන් තමගේ අනුත්තර දක්ෂිණෙය්‍ය භාවයද, අනුපාදා පරිනිර්වාණයද යන තෙවැදෑරුම් වූද අර්ථය සියලු ආකාරයෙන් දැන එකරුණ දැක්වීමට මෙළඳන් ඇනූ සේක.

එහි දදතො පුඤ්ඤං පවඩ්ඪති යනු දන් දෙන්නහුට චිත්ත සම්පත්තියෙන්, දක්ෂිණෙය්‍ය සම්පත්තියෙන් ද දානමය පුණ්‍යය රැස් කෙරේ. මහත්ඵලතර, මහානිසංසතර වේයයි අර්ථයි. නොහොත් පරිත්‍යාගීහුට පින් මනාව වැඩේ යයි යන දිය යුතු දෙය පරිත්‍යාග කරන්නහු විසින් පරිත්‍යාග චේතනාව පුරුදු කළ කල්හි අනුක්‍රමයෙන් හැම තැන දෝෂයන්ට නොපැමිණීම් බහුල වූයේ ඉතා පිරිසිදු සීලය රැක සමථ විදර්ශනාද වඩන්ට හැකිවේයයි ඔහුට දානාදී වශයෙන් තෙවැදෑරුම් වූ ද පුණ්‍යය මනාව වර්ධනය වේයයි මෙසේ මෙහි අර්ථය දතයුතුය. සංයමතො යනු සඤ්ඤමතො යනු සීල නමැති සංවරයෙන් හික්මෙන්නහුට, සංවරයෙහි සිටියහුටයයි අර්ථයි. වෙරං නචීයති යනු අද්වේෂය ප්‍රධාන හෙයින් අධි සිල්වත්හුට පස්වැදෑරුම් වෛරය නොපවතියි. කාය, වාග්, චිත්තයන්ගෙන් සංවර වන්නා වූ සුවිශුද්ධ සිල්වත් තෙමේ ක්ෂාන්ති බහුල හෙයින් කිසිවෙකුටත් වෛර නොකරයි. ඔහුට රැස් කිරීමක් කොයින්ද? එහෙයින් සංවර වන්නා වූ ඔහුට සංවර හේතුවෙන් හෝ වෛරයක් නොපවතියි. කුසලො ජහාති පාපකං යනු නුවණැති දක්ෂයා සුපිරිසිදු සීලයෙහි පිහිටියේ අටතිස් අරමුණුවල, තමාට සුදුසු කමටහනක් ගෙන, උපචාර, අර්පණා ප්‍රභේද ධ්‍යානය සම්පාදනය කරනුයේ පාපකං ලාමක කාමච්ඡන්දාදී අකුසලයන් විෂ්කම්භන වශයෙන් ජහාති අත්හරියි. හෙතෙම එම ධ්‍යාන යම පාදකකොට සංස්කාරයන්හි

ක්‍ෂය ව්‍යය පිහිටුවා විදර්ශනාවට ක්‍රියා කරනුයේ විදර්ශනාව ඔසවා ආර්ය මාර්ගයෙන් ශේෂ රහිතව පාපී, ලාමක අකුසල් නැසීම් වශයෙන් දුරු කරයි. **රාග දොස මොකඛයා පරිනිබ්බුතො** යනු හෙතෙම මෙසේ පව් දුරුකොට රාගාදීන්ගේ ක්‍ෂය කිරීමෙන් ශේෂ රහිතව කෙලෙස් පිරිනිවීමෙන්ද, ඉන් මත්තෙහි ස්කන්ධ පරිනිර්වාණයෙන්ද නිවුණේ වේයයි මෙසේ භාග්‍යවතුන් වහන්සේ චුන්දගේ දක්ෂිණා සම්පත්තිය ඇසිරිකොට තමාගේද, දක්ෂිණෙය්‍ය සම්පත්තිය ද, ඇසිරි කොට, ප්‍රීති වේගයෙන් මුදාහළ උදන් ඇනූ සේක.

පස්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

8-6

සවැන්නෙනි මගධෙසු යනු මගධ රටෙහි, මෙහිද ගුණ මහත්වයෙන්ද, නොපිරිසිඳි සංඛ්‍යා හෙයින් ගණන් මහත්වයෙන්ද, මහත් වූ බික්සඟන සමග, පාටලිගාමො යනු මෙනමින් යුත් මගධ රට එක් ගමක් එම ගම සැලසුම් කරන දිනයෙහි, ග්‍රාමාංගණය තීරණය කළ ස්ථානයෙහි පලොල් අංකුර දෙක තුනක් පෘථිවියෙන් පැන නැඟී නික්මුණහ. එහෙයින් පාටලී ගම යැයිම ව්‍යවහාර කළහ. **තදවසරි** යනු එම පාටලී ග්‍රාමයට පැමිණ වදාළේය. අනුප්‍රාප්ත වූ සේක. භාග්‍යවතුන් වහන්සේ කෙදින පාටලී ගමට අනුප්‍රාප්ත වූ සේක්ද යත්, යට කියන ලද **ක්‍රම**යෙන්, දම්සෙනෙවි විසින් සැවැත චෛත්‍යයක් කරවා ඉන් නික්ම, රජගහ නුවර වසනුයේ, එහි ආයුෂ්මත් මහ මුගලන් තෙරුන්ටද, චෛත්‍යයක් කරවා, ඉන් නික්ම අම්බලට්ඨිකායෙහි වැස, ඉක්මන් නුවූ චාරිකා වශයෙන් ජනපද චාරිකාවෙහි හැසිරෙනුයේ ඒ ඒ තන්හි එක් රැයක් වාසය කරන වාසයෙන් වැස, ලෝකයට අනුග්‍රහ කරනුයේ අනුක්‍රමයෙන් පාටලීගමට අනුප්‍රාප්ත විය. පාටලීගාමියා යනු පාටලී ග්‍රාමවාසී උපාසකවරු, ඔව්හු වනාහි භාග්‍යවතුන් වන්නසේගේ පළමු දැක්මෙන්, සමහරු **තිසරණයන්හිද**, සමහරු සීලයන්හිද සමහරු සරණ සිල්හිද පිහිටියාහුය. එහෙයින්

උපාසකා යි යූ.සේයි. යෙන භගවා තෙනුපසංකමිංසු යනු අජාසත්තුගේද ලිච්ඡවි රජවරුන්ගේ ද මිනිස්සු කලින් කල ගොස් පාටලී ගමෙහි ගෘහ හිමිකරුවන් ගෘහයෙන් බැහැරකොට මසක්ද, අඩමසක්ද වාසය කරති. ඉන් පාටලී ගම්වැසි මිනිස්සු නිතර උවදුරට පත්වූවාහු, ඔවුන්ගේ පැමිණි කල්හි වසන තැන් වන්නේ යයි, එක් පැත්තක ඓශ්වර්යය පුද්ගලයින්ගේ භාණ්ඩ තැන්පත් කරන ස්ථානයද, එක් පැත්තක වාසය කරන ස්ථානයද, එක් පැත්තක ආගන්තුකයින්ටද මගී මිනිසුන්ටද, එක්පසෙක දිළින්දන්ටද, කෘපණා මිනිසුන්ටද, එක්පසක ගිලනුන්ගේ වාසස්ථානය වන්නේ යයි සියල්ලන්ට ඔවුනොවුන් නොගටා, විසුමට ප්‍රමාණත්ව මහා ශාලාවක් නගර මධ්‍යයෙහි කළහ. එහි නාමය ආවසථාගාරයයි. එය එදිනම නිමාවට ගියේය. ඔව්හු එහි ගොස් ලී වැඩ, පිරියම් වැඩ, සිතුවම් වැඩ ආදී වශයෙන් මනාව නිමකරන ලදුයේ, මනාව පිළියෙළ කරන ලදුයේ දෙව් විමනක් සමාන එය දොර කොටුයෙහි පටන් බලා මෙම ආවසථාගාරය අතිශය මනරම් වූයේ සශ්‍රීක වූයේ කවරකු විසින් වනාහි ප්‍රථමයෙන් පරිභෝග කරන ලදුයේ අපට දීර්ඝ කාලයක් හිතසුව වන්නේදැයි සිතූහ. **එකෙණෙහිම** භාග්‍යවතුන් වහන්සේ එගමට අනුප්‍රාප්ත වූයේයයි ඇසූහ. ඔවුහු ඉන් උපන් ප්‍රීති සොම්නස් ඇතියේ අප විසින් භාග්‍යවතුන් වහන්සේ එහි ගොස් වැඩමවා ගෙන පැමිණිය යුතු වන්නේය. (ගෙන ආ යුතු) එතුමාණෝ වනාහි තෙමේම අපගේ වසන ස්ථානයට සම්ප්‍රාප්ත වූ සේක. අද අපි භාග්‍යවතුන් වහන්සෙස් මෙහි වාසය කරවා, ප්‍රථමයෙන් පරිභෝග කරවන්නෙමු. එසේම භික්ෂු සංඝයා පරිභෝග කරවන්නෙමු. භික්ෂු සංඝයා පැමිණි කල්හි ත්‍රිපිටක බුද්ධවචනය පැමිණියේම වන්නේය. ශාස්තෘන් වහන්සේ ලවා මංගල වදන් දේශනා කරවන්නෙමු. ධර්මය කියවන්නෙමු. මෙසේ ත්‍රිවිධ රත්නයන් විසින් පරිභෝග කළ කල්හි පසුව අපටද අන්‍යයන්ට ද, පරිභෝග වන්නේය. මෙසේ අපට බොහෝ කලක් හිතසුව පිණිස වන්නේ යයි සනිටුහන් කොට මේ සඳහාම භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එහෙයින් **අධිවාසෙතු හනෙත භගවා ආවසථාගාරං යි** කිහ. **යෙන ආවසථාගාරං තෙනුපසංකමිංසු** යි කිහ. කිසිසේත් එය එම දිනයෙහිම නිමකළ හෙයින් දෙව් විමනක් මෙන් මනාව පිළියෙළ කරන ලදුයේ, මනාව පිළිදැගුම් කරන ලදුයේ, බුදුරදුන්ට සුදුසු ලෙස කොට නොපණවන ලදී. බුදුවරු නම් ඇතුල්ගම වසන්නේ හෝ නොවසන්නේ ආරණ්‍යධ්‍යාශ ඇතියේ අරණ්‍යයෙහි ඇලුනාහු වෙති. **එහෙයින්** භාග්‍යවතුන් වහන්සේගේ කැමැත්ත දැනගෙනම අසූන

පණවන්නෙමුයි සිතා ඔව්හු භාග්‍යවතුන් කරා එළැඹියහ. දැන් භාග්‍යවතුන් වහන්සේගේ කැමැත්ත දැන එසේ පණවන කැමැත්තාහු ආවසථාගාරය යම් තැනෙක්හිද එතැන්හි එළැඹියහ. **සබ්බ සන්ථරිං ආවසථාගාරං සන්ථරිත්වා** යනු යම්සේ සියල්ලම අතුරන ලද්දේ වේද, එසේ එය අතුරා, සියල්ලට පළමුව ගොම නම් සියලු මංගලයන්හි පවතී යයි හුණුපිරියම් කරන ලද්දා වූද, භූමිය තෙත් ගොමවලින් ඉස පිරිසිදු බව දැන යම්සේ පා තබන ලද තන්හි පියසටහන් නොපෙනේද, එසේ කොකුම්, යොන්පුජ, තුවරලා, තුරුක් තෙල් යන සිව් ජාත සුවඳින් ගල්වා මත්තෙහි නොයෙක් වර්ණ ඇති කලාල අතුරා ඒ මත්තෙහි මහා පිට තබන පලස් ආදිය හස්තස්ථරණාදී නොයෙක් වර්ණ ඇතිරිලිවලින් ඇතිරිය යුතු සියලු හිස් ඉඩ ඇතිරවූහ. එහෙයින් **සබ්බ සන්ථරිං ආවසථාගාරං සන්ථරිත්වා** යි යූ.සේයි. අසුන්හි මධ්‍යස්ථානයෙහි වූ පිහිටි මංගලස්ථම්භය ඇසිරිකොට මහානර්ස බුද්ධාසනයක් පණවා එහි යම් යම් මෘදු වූද, මනරම් වූද පසතුරුණු ඒ ඒ තන්හි අතුරවා දෙපස රත්පැහැ මනරම් දසුන් ඇති කොට්ට තබා මතුයෙහි රන් රිදී තාරකාවන්ගෙන් විසිතුරු වියනක් බැඳ සුවඳ වැල් මල්වැල් ආදියෙන් අලංකාර කොට, හාත්පස දොළොස්රියන් තන්හි මල්දැල් විසුරුවා, තිස්රියන් පමණ තන්හි, පටතිර රෙදිවලින් වටකරවා, පැසුළු බිත්තිය ඇසිරිකොට භික්‍ෂු සංඝයාට හේත්තු වන ඇඳ පුටු ආදිය පණවා, මත්තෙහි ශ්වේත පසතුරුණුවලින් අතුරවා ශාලාවෙහි නැගෙනහිර පැත්තෙහි, තමහට හිඳීමට සුදුසු අයුරක් කළහ. ඒ සඳහා **ආසනාහි පඤ්ඤාපෙත්වායි** යූ.සේයි. **උදක මණිකං** යනු මහා පළිඟු දියසැළක්. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ද භික්‍ෂු සංඝයා ද කැමැති පරිද්දෙන් අත්පා ධෝවනය කෙරෙත්වා. මුහුණ කට සෝදත්වායි, ඒ ඒ තන්හි මැණික් වර්ණ දිය පුරවා සුවඳ සඳහා නොයෙක් පුෂ්පයන් ද, දියෙහි සුවඳ කුඩු බහා කෙසෙල් කොළවලින් වසා තැබූහ. එහෙයින් **උදක මණිකං පතිට්ඨපෙත්වායි** යූ.සේයි. **තෙලපදීපං ආරොපෙත්වා** යනු රන් රිදීමය දඬු පහන්හි යෝධයන්ගේ රූප ආකාර මැණික් ඔබ්බවන ලද රූකඩ අත්වල තබන ලද කුඩා කබලිවල තෙල්පහන් දල්වා **යෙන භගවා තෙනුපසංකම්මිංසු** යන මෙහි වනාහි එම පාටලී ගම්වාසී උපාසකවරු හුදෙක් ආවස්ථාගාරයම පමණක් නොව, තවද ගමෙහි සියලුම වීථීන් පිරිසිදු කරවා ධජ ඔසවා ගෘහ ද්වාරයන්හි පුන්කලස් කෙසෙල් කඳන් ද තබවා, මුලුගම පහන් හා මල්වලින් විසුරුණු තරුවක් මෙන් කොට, කිරි බොන දරුවන්ට කිරි පොවවී. ළදරුවන් සැහැල්ලුවෙන් අනුභව කරවා

නිදි කරවවි. උස්හඬ නොනගවි. අද එක් රැයක් ශාස්තෘන් වහන්සේ ඇතුල්ගම වාසය කරන්නේය. බුදුවරු නම් අල්ප ශබ්ද කැමති වන්නෝ වෙත්යයි අණබෙරයක් හසුරුවා තෙමේ දඬුපහන් ගෙන භාග්‍යවතුන් වහන්සේ හිඳ යම්තැනෙක්හිද එහි එළැඹියහ. **අථඛෝ භගවා නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛු සංඝෙන යෙන ආවසථාගාරං තෙනුපසංකම්** ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, යමක් සඳහා භාග්‍යවතුන් වහන්සේ, මෙහි වැඩම කළෙහිද? ඒ සඳහා දැන් සුදුසු කාලයයි. මෙසේ ඔවුන් විසින් කල් දැන්වූ කල්හි භාග්‍යවතුන් වහන්සේ දියකළ ලාකඩ රසයෙන් තෙත් රත් පරසතු මල්වර්ණ රත් දෙපට සිවුර, කතුරකින් නෙලුම්මලක් කපන්නාක් මෙන් සකසා නැබ, දෙදණ යන ත්‍රිවිධ ස්ථාන වැසෙන සේ හැඳ, රන් හවඩියකින් නෙලුම් මල් මිටියක් වට කරන්නාක් මෙන් විදුලියක් හා සමාන උසස් පෙනුම ඇති කාය බන්ධනය (පටිය) බැඳ, රත් කම්බිලියකින් ඇත්කුඩ හාත්පසින් වසන්නාක් මෙන් රියන් සියයක් උස රන්මල් ඇගෑයෙකැ වස්ත්‍ර දැලක් බහාලන්නාක් මෙන්, විශාල ස්වර්ණ චෛත්‍යයෙකැ රත්කම්බිලි සැටයක් මුදාහරින්නාක් මෙන්, ගමන් කරන්නා වූ පුන්සඳ රත්වලාවකින් වසන්නාක් මෙන්, රන් ගිරක් මත, මනාසේ පැසුණු ලාකඩ රස ඉසින්නාක් මෙන් සිතුකුළුපව් මස්තකය විදුලිය දැලෙන් වට කරන්නාක් මෙන්, මුළු සක්වල, මහමෙර, යුගන්ධර, මහා පෘථිවිය සොලවා ගන්නා ලද, නුග දල්ලක් සමාන පැහැයෙන් යුත්, මනා රත් පැහැයෙන් යුත් පංශුකූල සිවුර පොරොවා, වන ගහනයෙන් නික්මුණු කේශර සිංහයෙක් මෙන් හාත්පස, පර්වත මුදුනෙන් උදා වූ පුන්සඳක් මෙන්, ළපටි හිරු මෙන්ද, තම හුන් මනොඥ මණ්ඩපයෙන් නික්මුණු සේක. ඉක්බිති එතුමාණන් වහන්සේගේ ශරීරයෙන් වළාමුවින් නික්මුණු විදිලි සමූහයක් මෙන් රශ්මිහු නික්මී රන් රස ධාරා මිශ්‍රිත රන්වන් පුෂ්ප, ඵල, පත්‍ර ශාඛා, ඇටවුම් මෙන් හාත්පස වෘක්ෂයන් පැතිරුණහ. එකෙණෙහි තම තමන්ගේ පාසිවුරු ගෙන මහ බික්සඟ භාග්‍යවතුන් වහන්සේ පිරිවැරිය. භාග්‍යවතුන් වහන්සේ පිරිවරා සිටි එම භික්ෂූහු, අල්පේච්ඡ, ලද දෙයින් සතුටුවන, විවේකයෙහි ඇලුන, ගිහියන් හා මිශ්‍ර නොවුන, පටන් ගන්නා ලද වීර්යය ඇති. අවවාද දෙන වදන් ඉවසන, චෝදනා කරන, පවට ගරහන, සිල්වත් සමාධියෙන් යුත්, ප්‍රඥා විමුක්ති, විමුක්ති ඥාන දර්ශනයෙන් යුක්ත වූයේ වූහ. ඔවුන් විසින් පිරිවරන ලද භාග්‍යවතුන් වහන්සේ රත් කම්බිලියෙන් පරික්ෂිප්ත වූයේ මෙන්, රන්කදක් රත්නෙලුම් මලින් යුත් වනලැහැබක මධ්‍යගත වූවාක් මෙන් රන් නැවක් පබලු මාණික්‍යයෙන්

වටකරන ලද්දාක් මෙන් රන්පහක් මෙන් බැබලින. මහා කාශ්‍යප ප්‍රමුඛ මහතෙරවරු වළාවන්, පංශුකූල සිවුරු පොරවා, මාණික්‍යමය යුද ඇඳුම් ඇඳගත්තා වූ, මහ ඇතුන් මෙන් පිරිවැරුහ. වැමෑරූ රාග ඇති බුන් කෙලෙස් ඇති, ලිහන ලද ගැට ඇති, සුන් බැඳුම් ඇති කුලයෙහි හෝ ගණයෙහි නො ඇලුනාවූ වූහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ වීතරාගී වූයේ වීතරාගීන් සමග, පහ වූ ද්වේෂ ඇතියේ, පහ වූ දොස් ඇතියවුන් සමග පහ වූ මෝහ ඇතියේ පහ වූ මෝහ ඇතියවුන් සමග, තෘෂ්ණා රහිත වූයේ තෘෂ්ණා රහිතයින් සමග, කෙලෙස් රහිත වූයේ නික්ලේශීන් සමග, තෙමේ බුද්ධත්වයට පත්වූයේ, අනූ බුද්ධයින් පිරිවරන ලදුයේ, පාත්‍ර පිරිවර ලද්දාක් මෙන්, කේශර සිංහයන් පිරිවරන ලද කර්ණිකාවක් මෙන් ද, අටදහසක් ඇතුන් පිරිවරන ලද සද්දන්තඇත්රජු මෙන් ද, අනූදහසක් හංසයින් පිරිවරන ලද ධ්‍රතරාෂ්ට්‍ර හංසරාජයා මෙන්ද, සේනා පිරිවරන ලද සක්විති රජහු මෙන් ද, දෙව්ගණ පිරිවරන ලද සක්දෙව් රජු මෙන් ද බඹගණ විසින් පිරිවරන ලද හාරිත මහ බඹු මෙන් ද තාරකා සමූහයා විසින් පිරිවරන ලද පුන්සඳක් මෙන් ද, අනූපම බුදුවෙසින්, අප්‍රමාණ බුද්ධ විලාසයෙන්, පාටලී ගාමීන්ගේ මාර්ගයට පිළිපැදි සේක. ඉක්බිති මෙතුමන් වහන්සේගේ, පෙරපස කයින් රන්වන් ඝණ බුද්ධ රශ්මීන් නැගී අසූ රියනක් තැන් ගත්හ. මතු කේශාන්තයෙහි පටන් සියලු කේශාවර්තයන්ගෙන් මොනර ග්‍රීව වර්ණ වූයේ ඝන බුද්ධ රශ්මීන් නැගී අහස්තල අසූ රියනක් තැන් ගත්හ. යට පාද තලයන්ගෙන් පබලුවන් රශ්මීහු ඝන පෘථිවියෙහි අසූරියනක් තැන් ගත්හ. දත්වලින්ද ඇටවලින්ද සුදු තැන්වලින් ද නියවලින්ද සම් මස් විමුක්ත ස්ථානයන්ගෙන්ද ශ්වේත ඝන බුද්ධරශ්මීහු පැන නැග අසූරියනක් තැන් ගත්හ. රත් කහ වර්ණයන්ගේ මිශ්‍ර තැන්වලින් මදවිය පැහැති රශ්මීහු පැන නැග අසූ රියනක් තැන් ගත්හ. හැම තැනකම ප්‍රභාශ්වර රශ්මීහු පැන නැංගාහ. මෙසේ හාත්පස අසූ රියනක් තැන් ෂට් වර්ණ බුද්ධ රශ්මීහු බබලන්නාහු, දඟලන්නාහු, බබලන්නාහු රන්දඬු පහන් ආදියෙන් විසිරී අහසට පනින්නා වූ පහන් දැල්ලක් මෙන්, චාතුර් ද්වීපික මහා මේඝයෙන් නික්මුණු විදුලියක් මෙන් දිසානුදිසාවන්හි ඇතුලට වැදුනහ. යමක් කරණකොට සියලු දිසා රන් සපු මල්වලින් විසුරුවනු ලබන්නාක් මෙන් ද, රන් කලයකින්, රන් රස දහරාවන්ගෙන් ඉසිනු ලබන්නාක් මෙන් ද, විසුරුවන ලද රන් වස්ත්‍රයකින් වටකරන ලද්දාක් මෙන්ද, වේරම්බ වාතයෙන් ඔසවන ලද කෑල, කිණිහිරිය, කොබෝලිල මල් සුණුවලින් ගැවසී ගත්තාක් මෙන්ද, රත්සිරියල් කුඩුවලින් පොඟවන ලද්දාක් මෙන් බැබලුනහ. භාග්‍යවතුන්

වහන්සේගේ අසූ අනුව්‍යඤ්ජන බඹයක් පමණ ප්‍රදේශය වටකොට බබලන දෙතිස්මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් ප්‍රතිමණ්ඩිත ශරීරය වලාකුල් මිදුම් ආදී කිළිටි කරන කරුණුවලින් මනාව මිදුනේය. බබලන තාරකාවක් ලෙස ආලෝකමත් වූයේ අහස්තලය ප්‍රබෝධමත් විය. මලින් පිරුණ නෙලුම් මල් වනයක් මෙන් ද, යොදුන් සියයක පෙදෙස්හි පිළිවෙළින් තබන ලද, පරසතු මල්, දෙතිස් සූර්යයන්ගේ, දෙතිස් චන්ද්‍රයන්ගේ, දෙතිස් චක්‍රවර්තීන්ගේ, දෙතිස් දෙව් රජවරුන්ගේ දෙතිස් මහා බ්‍රහ්මයන් ගේ සෞභාග්‍යයෙන් සෞභාගයය මැඩලන්නාක් මෙන් බැබලින. යම්සේ එතුමාණන් විසින් දස පාරමීන්ගෙන්, දස උප පාරමීන්ගෙන්, දස පරමාර්ථ පාරමීන්ගෙන්, මනාකොට පුරන ලද සමතිස් පාරමිතාවන්ගෙන් අලංකෘතව, කල්ප ලක්ෂයක් අධික කොට ඇති සිව් අසංඛ්‍යයක් කල්, දෙන ලද දානයෙන්, රකින ලද සීලයෙන් කළ යහපත් කර්මයෙන් එක් අත්බවෙකැ එකතුකොට විපාක දෙන්ට අවකාශ නොලැබීමෙන් සම්බාධප්‍රාප්ත වූවාක් මෙන් හටගත්තේය. නැව් දහසක බඩු එක් නැවක තබන කාලයක් මෙන්, ගැල් දහසක බඩු එක් ගැලක තබන කාලයක් මෙන්, පස් විසි ගංගාවන්ගේ මිශ්‍ර කල, මුඛ ද්වාරයන්ගේ එකට රාශී වූ කලක් මෙන් විය. මෙම බුද්ධශ්‍රීයෙන් බබලන්නා වූද, භාග්‍යවතුන් වහන්සේගේ පෙරටුව නොයෙක් දඬුපහන් දහස් ගණන් එසවූහ. පසුපසද වම්පසද, දකුණු පසද එසේය. දෑසමන්, සපු, ඉද්ද, රතුපුල්, නිලුපුල්, මූනමල්, තිකමල් ආදී පුෂ්පයන් ද, නිල් කහ ආදී වර්ණයන්ද සුවඳ කුඩුද, චාතුර් ද්වීපික මහ වැස්සෙන් විසුරුවන ලද්දා වූ ජල වර්ෂාවක් මෙන් විසුරුණාහ. පසඟ තූර්ය ඝෝෂාවද බුද්ධ, ධර්ම, සංඝ ගුණ හා බැඳි ස්තුති ඝෝෂාද සියලු දිසා පුරවමින් දොඩමලු වූවාහු මෙන් කළහ. දේව, ගුරුළු, නා, යක්, ගාන්ධර්ව හා මිනිසුන්ගේ ඇස් අමෘත පානයක් ලද්දාක් මෙන් වූහ. මෙතැන් සිට පද දහසකින් පමණ ගමන වර්ණනාව කරන්ට වටී.

මේ එහි මුඛ මාත්‍රයයි.

එවං සබ්බංග සම්පන්නෝ - කම්පයන්නෝ වසුන්ධරං
අහෙය්‍යන්නෝ පාණාහි - යාති ලොක විනායකෝ

මෙසේ සර්වාංග සම්පූර්ණ මහ පෘථුවිය කම්පා කරවමින්, ප්‍රාණීන් වෙහෙසට පත් නොකරමින් ලෝක නායකයාණන් වහන්සේ වැඩම කරයි.

දකඛිණං පඨමං පාදං - උද්ධරනෙතා න රාසභෝ
ගච්ඡනෙතා සිරිසමපනෙනා - සොභතෙ දිප දුනතමෝ

පළමුව දකුණු පාදය උදුරන්නා වූ දෙපා ඇතියවුන් අතර උතුම් වූ, නරාසභයාණන් වහන්සේ බැබලීමෙන් යුක්තව, වඩිනුයේ හොබී.

ගච්ඡතෝ බුද්ධ සෙට්ඨස්ස - හෙට්ඨා පාදතලං මුදු
සමං සම්ඵුසනෙ භූමිං - රජසානූපලිම්පති

වැඩම කරන්නා වූ, බුද්ධ ශ්‍රේෂ්ඨයාණන් වහන්සේගේ යට මෘදු පාද තලය, භූමියෙහි සමව ස්පර්ශ කෙරේ. දුහුවිල්ලෙන් නොතැවරේ.

නිනනං ඨානං උනනමති - ගච්ඡනෙත ලොක නායකෙ
උනන තඤව හොති - පඨවීච අචෙතනා

ලෝක නායකයාණන් වහන්සේ වැඩම කරන කල්හි අචෙතන පෘථිවිය ද පහත් තැන් උස් වේ. උස් තැන් සම වේ.

පාසාණා සකඛරා චෙව - කඨලා බාණු කණ්ටකා
සබ්බෙ මගගා විවජ්ජනති - ගච්ඡනෙත ලොක නායකෙ

ලෝක නායකයාණන් වහන්සේ, වැඩම කරන කල්හි ගල්, බොරලු කැට, කැබලිති කටු, වල් උල්, ගස්වල කටු යන සියල්ල දුරස් වෙති.

නාති දූරෙ උද්ධරති - නාචචා සනෙනව පක්ඛිපං
අසට්ඨයනෙතා නියාති - උභෝ ජානුච ගොපඵකෙ

ඉතා දුරදී පා නොඋදුරයි. ඉතා ආසන්නයේද බහා නොතබයි. දෙදණ ගොප්මසෙහි නොගටමින් ගෙන යයි.

නාති සීඝං පක්කමති - සමපනන චරණෝ මුනි
න චාපි සනිකං යාති - ගච්ඡමානෝ සමාහිතෝ

චරණයන්ගෙන් යුත් මුනීන්ද්‍රයානෝ අති සීඝ්‍රව ගමන් නොකරයි. සමාහිතව ගමන් කරනුයේ ඉතා සෙමින් ද නොයයි.

උද්ධං අධො තිරියඤ්ච - දිසාව විදිසංතථා
න පෙක්ඛමානො සොයාති - යුග මත්ත මපෙක්ඛතං

උඩ, යට, සරස එසේම අනුදිසා නොබලමින් බුදුරදහු වැඩම කරයි. වියගහක දුර පමණක් බලයි.

නාග වික්කන්ත චාරෝ - සෝ ගමනෙ සොභතෙ ජිනෝ
චාරුං ගච්ඡති ලොකග්ගෙහා - භාසයන්තෙතා සදෙවකෙ

ඇතෙකුගේ වික්‍රම බඳු හැසිරීමෙන් යුතු, එම ජිනේන්ද්‍රයාණෝ ගමන් කිරීමෙහිදී හොඳි. දෙවියන් සහිත ලෝකයා සතුටට පත් කරමින් ලෝකාග්‍රයාණෝ මනොඥව වඩී.

උසභරාජාව සොභන්තෙතා - චාරුචාරිව කෙසරී
තොසයන්තෙතා බහු සත්තෙත - ගා මං සෙට්ඨෝ උපාගමීති

වෘෂභ රාජයෙකු මෙන් බබලනුයේ, මනහර කෙසරිඳු මෙන් සරනුයේ, බොහොසත් තොස් ගන්වනුයේ ශ්‍රේෂ්ඨයාණෝ ගමට එළැඹී සේක.

මෙය වර්ණ කාලය නමැ. මෙබඳු කාලයන්හි භාග්‍යවතුන් වහන්සේගේ ශරීර වර්ණයෙහි හෝ ගුණ වර්ණයෙහි හෝ ධර්ම කථිකයාගේ ශක්තියම ප්‍රමාණවත්ය. චූර්ණික පදයන්හි හා ගාථා බන්ධනයන්හි යම්පමණ හැකි වේද, එපමණෙක් කිවයුතුය. නොමනාව කියන ලදැයි අතෘප්තිමත්ව පැන දුවයි යයි නොකිව යුතුය. භාග්‍යවත් බුදුවරු අප්‍රමාණ වර්ණනයන්ගේ යුක්තය. එම බුදුවරුන්ගේ ගුණ බුදුවරුද ශේෂ රහිතව ගුණය කියන්ට අසමත්ය. මුළු කල්පයම වර්ණනා කරනුයේ අවසන් කරන්ට නොහැකි වෙති. අනෙක් ප්‍රජාව ගැන කියනුම කවරේද, මෙම සිරි විලාසයෙන් අලංකෘත පිළියෙළ කළ පාටලී ගමට පිවිසි සේක. පිවිස භාග්‍යවතුන් වහන්සේ පහන් සිතින් ජනතාව විසින් මල්-සුවඳ දුම්, සුවඳසුණු ආදීන්ගෙන් පුදනු ලබන්නේ ආවසථාගාරයට පිවිසි සේක.

එහෙයින් අථඛො භගවා නිවාසෙත්වා **පත්තචීවරමාදාය සද්ධිං භික්ඛු සංඝෙන** යෙන ආවසථාගාරං තෙනුපසංකමි යි යූ.සේයි. **පාදෙ පක්ඛාලෙත්වා** යනු හැම කලැ භාග්‍යවතුන් වහන්සේගේ පාවල, බැඳුනු කුණු තට්ටුව නොබැඳේ. එම උපාසකයින්ට කුසලාභි වෘද්ධිය බලාපොරොත්තු වනුයේ, අන්‍යයන්ට දෘෂ්ටානුගතියට පැමිණීම සඳහාද භාග්‍යවතුන් වහන්සේ පා සේදූ සේක. තවද තෘෂ්ණා දෘෂ්ටීන් විසින් ගන්නා ලද, ශරීරය නම් සිසිල් කළයුත්තේ ද වේයයි එම කරුණ සඳහාද භාග්‍යවතුන් වහන්සේ ස්නාන පා සේදීම් ආදිය කෙරේමය. **භගවනතං යෙව පුරක්ඛත්වා** යනු භාග්‍යවතුන් වහන්සේ පෙරටුකොට, එහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ගේද, උපාසකයන්ගේද මධ්‍යයෙහි වැඩහුනුයේ, සුවඳ දියෙන් ස්නානය කොට සියුම් වස්ත්‍ර දරණුවකින් දිය රහිතකොට, රත්හිරියල්වලින් මැඩ රත්කම්බිලියකින් වෙළන ලද පුටුවෙහි තබන ලද තනි රන් පිළිමයක් මෙන් අතිශයින් බැබලින. මේ මෙහි පෞරාණිකයින්ගේ ගුණ වර්ණන කථන මාර්ගයයි.

ගන්ත්වාන මඬලමාලං - නාග චිකනතචාරිකො
ඔභාසයනෙත්‍රා ලොකගෙහා - නිසීදි වරමාසනෙ

ඇතෙකුට බඳු වික්‍රමයෙන් සරණ ලෝකාග්‍රයාණන් වහන්සේ මඬල මාලයට ගොස්, බබුලුවමින් උතුම් අස්නෙහි වැඩහුන් සේක.

තහිං නිසිනෙනා නරදම්මසාරථී - දෙවාති දෙවො සතපුඤ්ඤ ලකඛණො
බුද්ධාසනෙ මජ්ඣගතො විරොචති - සුවණණ නිකඛංචිය පඬුකම්බලෙ

සියයක් පුරුෂ ලක්ෂණයන්ගෙන් හෙබි, දේවාති දේව වූ මිනිසුන් දමනයෙහිලා රථාචාර්යයෙකු බඳු, පණ්ඩුකම්බල ශෛලාසනයෙහි විශාල රන් කාසියක් මෙන්, බුද්ධාසන මධ්‍යගතව එහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ බබලයි.

නෙකඛං ජම්බොනදසෙඨ - නිකඛිත්තං පණ්ඩුකම්බලෙ
විරොචති විතමලො - මණි වෙරොචනො යථා

ජම්බු නදියෙහි හටගත් රන් කාසියක් මෙන් පණ්ඩු කම්බල ශෛලාසනයෙහි බහා තැබූ මැණිකක් මෙන් සූර්යයා මෙන්, පහ වූ කෙලෙස්මල ඇති උතුමාණෝ බබලයි.

මහා සාලොව සම්පුලෙලා - මෙරුරාජාව ලංඛතො
සුවණණ රූප සංකාසො - පදුමො කොකාස කො යථා

සුපුෂ්පිත මහ සල්රුකක් මෙන්ද, අලංකෘත මහාමෙර මෙන්ද රන්රුවක් හා සම වූයේ, රත් නෙලුම් මලක් යම්සේද, එසේ,

ජනනෙතා දිපරුකෙඛාව - පබඛතගෙ යථා සිඛී
දෙවානං පාරිචඡතෙතාව - සබබපුලෙලා විරොචති

දිලිසෙන පහන් රුකක් මෙන් ද, පර්වත මුදුනෙහි මොණරෙකු යම්සේද, එසේම සම්පූර්ණයෙන් මල් පිපුණ දෙවියන්ගේ පරසතු රුක මෙන්ද බබලයි.

පාටලී ගාමිකෙ උපාසකෙ ආමනෙනසි යනු එම උපාසකයින් අතර බොහෝ දෙන සීලයන්හි පිහිටියහ. ප්‍රථමයෙන් **සීල** විපත්තියෙහි ආදීනව ප්‍රකාශකොට, පසුව සීල සම්පත්තියෙහි අනුසස් දක්වන්ට 'පඤ්චිමෙ ගහපතයො' යන ක්‍රමයෙන් දම් දෙසුම සඳහා ඇමතූ සේක. එහි **දුසසීලො** යනු සිල් රහිත, **සීල විපනෙනා** යනු පිරිහී ගිය සීලය, බුන් සංවරය, මෙහි දුස්සීල යන පදයෙන් පුද්ගලයාගේ සිල් අභාවය ශූ.සේයි. එම සිල් අභාවය දෙයාකාරය. සමාදන් නොවීමෙන් හෝ සමාදන් වන ලද්දෙහි භේදයෙන් ද යන දෙ අයුරිනි. ඒවා අතර පළමුවැන්නෙහි වැරදි සහිත භාවයක් නොමැත. දෙවැන්න අතිශයින් වැරදි සහිතය. අදහස් කරන ලද **ආදීනව නිමිතිකොට පුද්ගලධිෂ්ඨා දේශනාවෙන් දක්වන්ට සීලවිපනෙනායි** ශූ.සේයි. ඉන් දුසසීලො යන පදයෙහි අර්ථය දක්වයි. **පමාදාධිකරණං** යනු ප්‍රමාද හේතුවෙන්, මෙම සූත්‍රය ගෘහස්ථයින්ගේ වශයෙන් ආයේය. ප්‍රවෘජ්ජිතයින්ටද අදාල වේමය. ගෘහස්ථයෝ වනාහි යම් ශිල්පයක් හේතුවෙන් ගොවිතැනින්, වෙළඳමෙන්, ගව පාලනයෙන් ආදී යම්කිසිවකින් **ජීවිකාව** කරයි. ප්‍රාණඝාතාදී වශයෙන් පමා වූයේ එය යථා කලැ සම්පාදනය කරන්ට නොහැකි වේ. ඉක්බිති ඔහුගේ කටයුතු නැසේ. සතුන් නොමැරීමට කළ නියමය පවත්නා කල්හි, ප්‍රාණඝාතාදීන් කරනුයේ දඬුවම් වශයෙන් මහත් භෝග හානියට පත් වේ. පැවිදි දුසිල්හු ප්‍රමාද හේතුයෙන්, සීලයෙන්, බුදු වදනින්, ධ්‍යානයෙන් සප්ත ආර්ය ධනයෙන් පරිහානියට පැමිණේ. **පාපකො කිනති සඳ්ධා** යනු ගෘහස්ථයාට, අසවල් කුලයෙහි උපන් අසවලා, පාපී ස්වභාව ඇති දුසිලෙකි අත්හල මෙලෝ පරලෝ ඇත්තෙකි. සලාක

බත් මාත්‍රයක් හෝ නොදේයයි සිව් පිරිස මැද පාපී කීර්ති ශබ්දයක් පැන නගී. ප්‍රව්‍රජ්ජිතයාට, අසවලා ශාස්තෘ ශාසනයෙහි පැවිදිව සිල් රක්නට නොහැකි විය. බුදුවදන් ගන්ට නොහැකි විය. වෙදකම් ආදී ඔට අගෞරව කටයුතුවලින් යුක්තව ජීවත් වේ, යයි මෙසේ පාපී කීර්ති ශබ්ද පැන නගී. **අවිසාරදෝ** යනු ගෘහස්ථයා බොහෝ දෙන රැස්වන ස්ථානයෙහි කිසිවෙක් මාගේ කටයුතු ඒකාන්තයෙන් දැන ගන්නේය. එකල්හි මට නිග්‍රහ කරන්නාහ. රජ කුලයට හෝ දක්වත් යයි භය සහිතව එළැඹෙති. මුහුණ හකුලා ගත්තේ නවාගත් කඳ ඇත්තේ මුව යටිකුරුව හිඳියි. නිර්භයව කථා කරන්ට නොහැකි වේ. ප්‍රව්‍රජ්ජිතයාද, බොහෝ භික්ෂු සංඝයා රැස්වූ කල්හි, ඔව්හු ඒකාන්තයෙන් මාගේ ක්‍රියාව දැනගන්නාහ. එකල්හි මට හැර (අත්හරවා) ශ්‍රමණභාවයෙන් ඉවත් කරවා ඇද දමන්නාහයි බිය සහිත එළැඹේ. නොබියව කථා කරන්ට නොහැකි වේ. ඇතැමෙක් දුසිලෙක් හා සමාන වූයේ නොදුසිලෙකැ, අල්පේච්ඡකයෙකු මෙන් හැසිරේ. ඔහුද අදහසින්, මුහුණ හකුලා ගත්තේ වේ. මුළා වූයේම කළුරිය කරයි. මරණ මංචකයෙහි හොත් දුසිල්හුට දුසිල් ක්‍රියා භාරගෙන පැවැති තැන් ඉදිරියට එති. හෙතෙම ඇස් හැර මෙලොවද ඇස් පියා පරලොවද බලයි. ඔහුට සතර අපායයන් කර්මානුරූපව වැටහෙති. ආයුධ සියයකින් පහරදෙනු ලබන්නාක් මෙන්ද, ගිනිදැලුවෙන් වැළඳගන්නාක් මෙන් ද වේ. හෙතෙම වළක්වව්, වළක්වව් මරහඬ දෙනුයේ මැරේ. එහෙයින් **සම්මූළ්හෝ කාලං කරොති** යි යූ.සේයි. **කායස්ස භෙදා** යනු තෘෂ්ණාදීන් විසින් ගන්නා ලද ස්කන්ධයාගේ අත්හැරීමෙන්, **පරම්මරණා** යනු ඉන් අනතුරු උපදවන ස්කන්ධ ග්‍රහණයයි. නොහොත් කායස්ස භෙදා යනු ජීවිතෙන්ද්‍රියයාගේ සිදීමෙන්, පරම්මරණා යනු චුතියෙන් මත්තෙහි, **අපායං** යනාදි සියල්ල නිරය පර්යාය නාමයන්ය. නිරය වනාහි ස්වර්ග මෝක්ෂවලට හේතු කාරණ වූ පුණ්‍ය සංඛ්‍යාත අයගෙන් ඉවත් වූ හෙයින්, සුව නම් වූ අයයාගේ පැමිණීමෙහි අභාව හෙයින් අපායයි. දුකෙහි පැවැත්ම පිළිසරණය නුයි **දුග්ගති** යි. ද්වේෂ බහුලතාවයෙන් හෝ දුෂ්ඨ ක්මයෙන් උපන් පැවැත්මනුයි **දුග්ගති** යි. නොමනාව කළ ක්‍රියාකාරීහු මෙහි විමසව වැටෙත්නුයි **විනිපාතොයි**, මෙහි වැටෙනවුන් විනාශ වෙති. බිඳෙනු ලබන අඟපසඟ ඇත්තේනුයි **විනිපාතො** යි. මෙහි ආශ්වාද සංඥී අය නැත්තේනුයි **නිරයො** යි. නොහොත් අපාය ග්‍රහණයෙන් තිරිසන් යෝනිය දක්වයි. තිරිසන් යෝනිය වනාහි යහපත් පැවැත්මෙන් පහවූ හෙයින් අපායයි. මහේශාක්‍ය නාගරාජාදීන් හටගන්නා හෙයින් දුගතිය නොවේ.

දුගති ග්‍රහණයෙන් ප්‍රේත විෂය දක්වයි. එය අපාය මෙන්ම දුගතියද වේ. යහපත් පැවැත්මෙන් පහ වූ හෙයින් ද, දුකට පැවැත්ම වූ හෙයින් ද වේ. අසුරයන් සමාන විනිපාත අභාව හෙයින් ද, මහිර්ධික ප්‍රේතයින්ගේද විද්‍යමාන හෙයින් ප්‍රේතයින් විනිපාත නොවේද, විනිපාත ග්‍රහණයෙන් අසුර කොටස දක්වයි. එය වනාහි කියන ලද අර්ථයෙන් අපායද, දුගතියද, සියලු සම්පත් රාශීන්ගෙන් වැටුණු හෙයින් විනිපාත යැයි කියයි. නිරය ග්‍රහණයෙන් අවීචි ආදී නොයෙක් ආකාර වූ නිරයම දක්වයි. උපපජ්ජති යනු හට ගනී. අනුසස් කථා කියන ලද්දට වෙනස් අයුරින් දතයුතුය. මේ වනාහි විශේෂයයි. **සීලවා** සමාදන්වීම් වශයෙන් සිල්වත් වූයේ, **සීල සම්පන්නෝ** යනු පිරිසිදු හා සම්පූර්ණ ද කොට සීලයාගේ සමාදානයෙන් සීල සම්පන්න වූයේ, **භොගකඛඣං** යනු භෝග රාසියක්, **සුගතිං සගගං ලොකං** යන මෙහි සුගති ග්‍රහණයෙන් මිනිසුන් උපදනා තැනද සංග්‍රහ වේ. ස්වර්ග ග්‍රහණයෙන් දෙවිවරු උපදනා තැනමය. එහි සුන්දර උපදනා තැනනුයි සුගතියි. රූපාදී විශේෂයන්ගෙන් මනාව අග්‍රනුයි සගොගායි. ඒ සියල්ලම කැඩී බිඳී පලුදුවන අර්ථයෙන් ලෝකයි. **පාටලීගාමියෙ උපාසකෙ බහුදෙව රත්තිං ධම්මියා කථාය** යනු අන්‍ය වූ පාලියෙන් තොර ධර්ම කථාවෙන්ද ආවාස දාන අනුමෝදනා කථාවෙන් ද, එහි පාටලී පුත්‍ර නුවර නිර්මාණය කරන, අජාසත් විසින් අන්‍ය ගම් නියම්ගම් රාජධානීන්හි යම් සීලාචාර සම්පන්න කෙළෙඹියෝ වෙත්ද, ඔවුහු කැඳවා, ධන ධාන්‍ය ගෘහ වස්තු කෙත්වතු ආදීන්ද, ආරක්ෂාවට යොදන දෑද දී පදිංචි කරවති. එහෙයින් අනුසස් දක්නා වූ, පාටලිග්‍රාමීය උපාසකවරු විශේෂයෙන් සීලගරුක වූවාහු, සියලු ගුණයන්ටද, සීලයටද ස්ථිර නිශ්චය පවත්නා හෙයින්, ඔවුන්ට පළමුව සීලානිසංස ප්‍රකාශකොට, ඉන් මතුයෙහි අහස් ගඟ බස්වන්නාක් මෙන්, පෘථිවි ඕජාව අදින්නාක් මෙන්, මහ දඹගහක් මස්තකයෙන් ගෙන සොලවන්නාක් මෙන්, යොදුනක් දිග මීකඩක් චක්‍ර යන්ත්‍රයෙන් මිරිකා මිහිරි කොටස පොවන්නාක් මෙන්, භාග්‍යවතුන් වහන්සේ, පාටලී ගාමිකයින්ට හිතසුව එළවන ප්‍රකීර්ණක කථාව දෙසනුයේ, ගෘහපතිවරුනි, තෙලැ ආවාසදානය නම් මහ පිනෙකැ. නුඹලගේ වාසස්ථානය මා විසින් පරිභෝග කරන ලදී. භික්ෂු සංඝයා විසින් ද පරිභෝග කරන ලදී. මවිසින්ද, භික්ෂු සංඝයා විසින්ද, පරිභෝග කළ කල්හි ධර්මරත්නය විසින්ද පරිභෝග කරන ලද්දේ වේ. මෙසේ ත්‍රිවිධ රත්නය විසින් පරිභෝග කළ කල්හි ප්‍රමාණ කළ නොහැකි විපාකයෙක්ද වේ. තවද වාසස්ථාන දානය දුන් කල්හි, සියලු දානයන් දෙන ලදුයේම

වේ. භූමියෙහි පිහිටි කොළ සෙවෙනි කළ ගෙයක් හෝ කොළඇතු මඩුවක් හෝ සංඝයා උදෙසා කළ කල්හි අනුසස් පිරිසිඳීමට නොහැකිය. ආවාස දානානුභාවයෙන් භවයෙහි උපදිනු ලබනහුට පීඩාකාරී ගැබ් විසීමක් නම් නොවේ. දොළොස්රියන් කාමරයක් මෙන් ඔහුගේ මව්කුස සම්බාධ රහිතවම වේය යැයි මෙසේ නොයෙක් ක්‍රමයන්ගෙන් විසිතුරු බොහෝ ධර්ම කථා දේශනා කොට,

සීතං උණ්හං පටිහනති - තතෝ වාළමිගානිච
සිරිංසපෙව මකසෙ - සිසිරෙ චාපි වුට්ඨියෝ

එයින් සීත හා උෂ්ණයද, නපුරු සතුන්ද, සර්පයින්ද, මදුරුවන්ද සීත ඍතුවෙහි වැස්සද වළක්වයි.

තතෝ වාතාතපෝ සොරෝ - සඤ්ජාතෝ පටිහඤ්ඤති
ලෙනත්ථංච සුඛත්ථංච - ඣායිතුංච විපසසිතුං

එයින් ආරක්ෂාව සඳහාද සුවය සඳහාද ධ්‍යාන වඩන්ටද, විදර්ශනා කරන්ටද, ගොරතර වාතය හා හිරු රැස්ද හටගත්තේ නසයි.

විහාරදානං සංඝස්ස - අග්ගං බුද්ධෙන වණ්ණිතං
තස්මාහි පණ්ඩිතෝ පොසෝ - සම්පස්සං අත්තමත්තනෝ
විහාරෙ කාරයෙ රමෙම - වාසයෙත්ථ බහුස්සුතෙ

සංඝයාට වෙහෙර දානය අග්‍රයැයි බුදුරදුන් විසින් වර්ණිතය. එහෙයින් තම සුභසිද්ධිය දක්නා නුවණැති පුරුෂයා රමණීය විහාරයන් කරවන්නේය. එහි බහුශ්‍රැතයින් වාසය කරවන්නේය.

තෙසං අන්නඤ්ච පානඤ්ච - වත්ථසෙනාසනානිච
දදෙය්‍ය උජුභූතෙන - විප්පසන්නෙන චෙතසා

ඔවුන්ට ආහාර හා පානද, වස්ත්‍ර හා සෙනසුන්ද ඍජු වූ, සුපහන් සිතින් දෙන්නේය.

තෙ තස්ස ධම්මං දෙසෙන්ති - සබ්බ දුක්ඛා පමුදනං
ය සෝ ධම්මං ඉධඤ්ඤාය - පරිනිබ්බාති අනාසවොති

මෙලොව යමෙක් එම ධර්මය දැන ආශ්‍රව රහිතව පිරිනිවේද, එබඳු සියලු දුක් දුරුලීමට ඔව්හු ඔහුට දම් දෙසති.

මෙසේ මෙයද, ආවාස දානයෙහි අනුසස් යැයි බොහෝ රැයක් අතිරේක තරව යාම එකහමාරක් ආවාසදාන අනුසස් කථා වදාළ සේක. එහි මෙම ගාථා සංග්‍රහයට නැගුනාහු **ප්‍රකීර්ණක** ධර්මදේශනා සංග්‍රහයට නොනගී. **සන්දසෙසතථා** ආදිය කියන ලද අර්ථමය. **අභික්කනතා** යනු ඉක්ම ගියාහු යාම ද්වයයක් ගතවූවාහු. **යස්සදානි කාලං මඤ්ඤථා** යනු යම් ගමනකට නුඹලා කල් හඟිවිද? නුඹලාට යාමට කාලයයි. යව් යැයි යූ.සේයි. කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ ඔව්හු පිටත්කොට හැරියෙහිද? අනුකම්පාවෙනි. තුන්යම් රාත්‍රියක් එහි හිඳ කල්යවන්නා වූ ඔවුන්ගේ ශරීරයන්හි ආබාධ උපදින්නේ යයි ද, භික්ෂු සංඝයාද හළ, සයන හිඳීම්හි අවකාශයක් ලබන්ට වටී. මෙසේ දෙපාර්ශ්වයටම අනුකම්පාවෙන් පිටත්කර හැරියේය. **සුඤ්ඤාගාරං** යනු වෙන වෙනම ශූන්‍යාගාර නම් එහි නැත. එම ගෘහපතිනු එම ආවසථාගාරයෙහිම එක් පාර්ශ්වයෙක්හි, පට වස්ත්‍රයකින් වට කරවා කැප ඇඳක්ද පණවා එහි කැප පසතුරුණු අතුරා මතුයෙහි රන් රිදී තාරකා සුවඳ මල් ආදියෙන් සරසා වියනක් බැඳ සුවඳ තෙල් පහන් නැංවූහ. (තැබූහ.) ශාස්තෘන් වහන්සේ ධර්මාසනයෙන් නැගිට මදක් විඩාහරිනු කැමැතියේ මෙහි වැද හොවින්නේ නම් ඉතා යෙහෙකි. මෙසේ මේ අපගේ තානායම්පොල භාග්‍යවතුන් වහන්සේ විසින් සිව් ඉරියව්වලින් පරිභෝග කරන ලදුයේ බොහෝ කලක් හිතසුව සඳහා වන්නේ යයි සිතූහ. ශාස්තෘන් වහන්සේද එම කරුණම සඳහා එහි දෙපට සිවුර පණවා සිංහ ශයනය කළ සේක. ඒ සඳහා **සුඤ්ඤාගාරං පාවිසියි** යූ.සේයි. එහි පා සෝදන තැන සිට ධර්මාසනය දක්වා වැඩිසේක්ද, එතෙක් තැන් ගමන් කිරීම නිපැයිනි. ධර්මාසනයට පත්ව මදක් සිටියේය. මේ එහි සිටීමයි. දෙයාමයක් ධර්මාසනයෙහි හුන්නේය. මෙතෙක් තැන් හිඳීම නිපැයිනි. උපාසකයන් යවා ධර්මාසනයෙන් බැස කියන ලද තන්හි සිංහ ශයනය කළ සේක. මෙසේ එම ස්ථාන භාග්‍යවතුන් වහන්සේ විසින් පරිභෝග කරන ලද්දේ විය. **සුනීධ වස්සකාරා** යනු සුනීධ හා වස්සකාරද යන දෙදෙනා **දෙව බ්‍රාහ්මණා මගධ මහා මත්තා** යන මගධ රජුගේ මහ ඇමතිවරු හෝ මගධ රටෙහි මහ ඇමතිවරු, මහත් ඓශ්වර්ය ප්‍රමාණයකින් යුක්ත වූයේ නුයි මහාමත්තයි. **පාටලී ගාමෙ නගරං මාපෙනති** යනු පාටලි ග්‍රාම සංඛ්‍යාත බිම් පෙදෙස්හි නගරයක් නිර්මාණය කරති.

වජ්ජීනං පටිබාහාය යනු ලිච්ඡවි රජුන්ගේ ආදායම් මාර්ග සිඳලීම සඳහා **සහසඍ සහසෙසවා** යනු එක් එක් වර්ග වශයෙන් දහසක් දහසක් බැගින්, **වත්‍ථූනි** යනු ගෘහ වස්තූන්, **චිත්තානි නමෙනති නිවෙසනානි මාපෙතුං** යනු රජුට, රාජ මහා මාත්‍යයන්ට නිවෙස් තනන්ට වාස්තු විද්‍යා පාඨකයින්ට සිත නැමෙත්. ඔව්හු වනාහි තම ශිල්පානු භාවයෙන් යට පෘථිවියෙහි තිස්රියන් ප්‍රමාණ තන්හි මෙහි නාගයින් අධිගෘහිතය. මෙහි යක්ෂයින් අධිගෘහිතය. මෙහි භූතයින් අධිගෘහිතය. මෙහි ගලක් හෝ කණුවක් හෝ තිබේයයි දනිත්. ඔවුහු එකල්හි ශිල්ප මතුරා දෙවිවරු සමග කථා කරන්නාක් මෙන් මවති. නොහොත් ඔවුන්ගේ ශරීරයන්හි දෙවිවරු අධිගෘහිතව ඒ ඒ තන්හි නිවෙස් මවන්ට (තනන්ට) සිත නැමෙත් ඔව්හු සිව්කොන්හි කණු කොටා (සිටුවා) වස්තුව ගත් කෙණෙහි ඉවත්ව යෙති. ශ්‍රද්ධාවත් කුලයන්ගේ ශ්‍රද්ධාවත් දෙවිවරු එසේ කරති. අශ්‍රද්ධාවත් කුලයන්හිගේ ශ්‍රද්ධාවත් දෙවිවරු එසේ කරති. අශ්‍රද්ධාවත් කුලයන්ගේ අශ්‍රද්ධාවත් දෙවිවරු එසේ කරති. කවර කරුණෙකින්ද, ශ්‍රද්ධාවත් දෙවිවරුන්ට, මෙබඳු සිතක් වේ. මෙහි මිනිස්සු ගෙවල් තනන්නාහු පළමුව භික්ෂු සංඝයා වඩා හිඳුවා යහපත් කරුණු දේශනා කරවන්නාහ. ඉක්බිති අප සිල්වතුන් දර්ශනය, දහම් කථා, පැණ විසඳුම් අනුමෝදනා ශ්‍රවණය කරන්ට ලබන්නෙමු. මිනිස්සුද දන් දී අපට පින් දෙත් යයි සිතති. අශ්‍රද්ධාවත් දෙවිවරුද තම අදහස් අනුරූපව ඔවුනගේ ප්‍රතිපත්ති දැක්මට, කථා ශ්‍රවණය කරන්ට ලබන්නෙමුයි එසේ කෙරෙත්. **තාවතිංසෙ** යනු යම්සේ වනාහි එක් කුලයක එක් පණ්ඩිත මිනිසෙක්ද, එක් වෙහෙරක එක් බහුශ්‍රැත භික්ෂුවක්ද, දැඩිසේ ගෙන අසවල් කුලයෙහි මිනිස්සු පණ්ඩිතයහ. අසවල් වෙහෙරෙහි භික්ෂූහු බහුශ්‍රැත යැයි. ශබ්දයක් පැණ නගිද, එපරිද්දෙන්ම, සක්දෙව් රජුද විස්කම් දෙවිපුතුද දැඩිසේ ගෙන, තව්තිසා වාසීහු පණ්ඩිතයහැයි ශබ්දයක් පැන නැංගේය. එහෙයින් **තාවතිංසෙහි** යි යූ.සේයි. **සෙය්‍යථාපි** ආදියෙන් තව්තිසා වැසි දෙවියන් සමග මන්ත්‍රණය (කථා) කොට මෙන් සුනීධ වස්සකාරාදීහු නගර නිර්මාණය කරත්යැයි දක්වයි. **යාවතො අරියායතනං** යනු ආර්ය මනුෂ්‍යයන්ගේ යම් පමණ රැස්වන තැන් නම් **තිබේද? යාවතා** වණිපපථෝ යන යම් පමණ වෙළඳුන්ගේ ගෙන එන ලද බඩු තොග වශයෙන් විකුණුම් - මිලදී ගැනුම් ස්ථාන හා වෙළඳුන්ගේ වාසය කරන ස්ථාන හෝ තිබේද, **ඉදං අගගනගරං** යනු එම ආර්යායතන වෙළඳ මධ්‍යස්ථානයන්ට මෙම නගරය අග්‍ර, ජ්‍යෙෂ්ඨ, ප්‍රමුඛ වන්නේ ය. **පුදභෙදනං** යනු බඩුපොදි ලිහන තැන බඩු භාණ්ඩයන්ගේ මිදන තැන යයිද යූ.සේයි.

මුළු දඹදිව නොලද භාණ්ඩයන්ගේ වුව මෙතැනදීම ලබන්නාහ. අන් තන්හි නොවිකුණුන භාණ්ඩද මෙහිදීම විකිණීම යන්නාහ. එහෙයින් මෙහිදීම වෙළඳ බඩු ගෙනැවිත් මලු බිඳින්නාහයි (ලිහන්නාහයි) අර්ථයි. සිව් ද්වාරයන්හි පැමිණියවුන්ගෙන් සතරක්ද, සභාවෙහි එකක්දැයි මෙසේ දිනපතා පන්ලක්ෂයක් එහි නැගී සිටින්නාහ. (මලු බිඳින්නාහ) එම ස්වභාවයන් එයයි දක්වයි. **අගගිතොවා** ආදීන්හි ච ශබ්දය සමුච්චයාර්ථයෙහිය. ගින්නෙන්ද දියෙන්ද, මිත්‍ර භේදයෙන්ද න සින්නේයයි අර්ථයි. එහි එක් කොටසක් ගින්නෙන් නසින්නේය. නිවන්ධ නොහැකි වන්නාහ. එක් කොටසක් ගඟ ගෙන යන්නේය. එකෙක් මොහු විසින් නොකියන ලද්ද ඔහුටද, ඔහු විසින් නොකියන ලද්ද මොහුටද, කියනවුන්ගේ, කේළාම් වචනයන්ගේ වශයෙන් බිඳුණු ඔවුනොවුන් භේදයෙන් විනාශ වන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාරා ඉතා අලුයම් කල්හි, ගංතෙරට වැඩමවා, කළ මුව දෙවුම් ඇතියේ පිඬු පිණිස හැසිරෙන වේලාව බලාපොරොත්තු වෙමින් වැඩ හුන් සේක. සුනීධ වස්සකාර දෙදෙනද, අපගේ රජු ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ උපස්ථායකයෙකි. අප ඔහු කරා එළැඹි කල්හි, ශාස්තෘන් වහන්සේ පාටලී ගමට වැඩිසේක්ල. කිමෙක්ද උන්වහන්සේගේ සමීපයට එළැඹියහුද, නොඑළඹියහුදැයි හෙතෙම අප විචාරන්නේය. එළැඹියෙමුයි කී කල්හි ආරාධනා කළහුද, නොකළහුදැයි විචාරන්නේය. ආරාධනා නොකෙළෙමුයි කීකල්හි අපට දොස් නංවා නිග්‍රහ කරන්නේය. මෙයද අප නොකළ තන්හි නුවර නිර්මාණ කරමු. ශ්‍රමණ ගෞතමයන් වනාහි ගිය ගිය තන්හි කාලකන්නි සත්ත්වයෝ ඉවත්ව යති. අපි නගර විවෘත මංගල්‍යය උන්වහන්සේට කියන්නෙමුයි සිතා ශාස්තෘන් වහන්සේ කරා එළැඹ ආරාධනා කළහ. එහෙයින් අථ **බො සුනීධ වස්සකාරා** යි ආදිය යූ.සේයි. **පුබ්බණ්හ සමයං** යනු පෙරවරු කල්හි, **නිවාසෙත්වා** යන ගමට පිවිසෙන ආකාරයෙන් වස්ත්‍රය (සිවුර) හැඳ පටිය බැඳ, **පත්තචීවර මාදාය** යනු සිවුර පොරවා පාත්‍රය අතින් ගෙන,

සීලවනෙත්ථ යනු මෙහි සිල්වත්හු තමන්ගේ වාසය කරන ස්ථානයන්හි, **සඤ්ඤතෙ** යනු කාය, වාචා, චිත්තයන්ගෙන් සංයමයට **පත් වූවාහු, තාසං දක්ඛිණ මාදිසෙ** යනු සිව්පස සංඥා කෙරෙහි දුන් කල්හි, එම ගෘහ දේවතාවන් නිශ්චයකොට පින් දෙන්නේය. **පූජිතා පූජයන්ති** මෙම මිනිස්සු අපගේ ඤාතීහුද නොවෙති. මෙසේද අපට පින් දෙත්යයි

මනාව සංවිධානය කළ, ආරක්ෂාවක් කරවි යැයි මනාව ආරක්ෂා කෙරෙත්. **මානිතා මානයනති** කලින් කල, පූජා **ක්‍රියා** කිරීමෙන් පුදන ලද්දා වූ එම මිනිස්සු අපගේ ඥාතීහුද නොවෙති. **එසේ** ද වුවත් **සිව්, පස්,** අට මාසයන් අතරතුර අපට පූජා කර්ම කෙරෙත්. ගෞරව **කරත්.** උපන් විපත්වලින් පාලනය කරති. **තතො නං** යනු එයින් එම **පණ්ඩිත** ස්වභාව ඇති පුරුෂයා. **ඔරසං** යනු ළෙහි තබා වඩන ලද, **යම්සේ** තම මව ලෙයින් හටගත් (ළයෙහි තබා වඩන ලද) පුත්‍රයාට **අනුකම්පා** කෙරේද, උපන් උවදුරු දුරුකරලීම සඳහාම ඔහු යම්සේ උත්සාහ කෙරේද, **එසේ අනුකම්පා** කරත් යයි අර්ථයි. **භද්‍රානි පස්සති** යනු යහපත් දේ දකියි. **අනුමොදිත්වා** යනු ඔවුන් විසින් එදා රැස් කළ පුණ්‍යයාගේ සතුටුවීම් වශයෙන් ඔවුන්ට දැහැමි කථාවක් කොට, සුනීධ වස්සකාර දෙදෙනද, **එහි** යම් දේවතා කෙනෙක් වූහුද, ඈලාට දක්ෂිණා අනුමෝදන් කරව යන භාග්‍යවතුන් වහන්සේගේ වචනය අසා දේවතාවන්ට පින් දුන්හ. **තං ගොතම තිත්ථ නාම අහොසි** යනු එම නගරයෙහි යම් දොරෙකින් භාග්‍යවතුන් වහන්සේ නික්මුණු සේක්ද, එය ගොතමද්වාර නම් විය. ගඟින් එතෙරවීම සඳහා බට තැන ගොතම තිත්ථ නම් වූයේය. **පූරා පිරුණාහු, සමතිත්තිකා** ඉවුර සමව ජලයෙන් තෘප්ත වූයේ පිරුණේ, **කාකපෙය්‍යා** යනු ගංතෙර සිටි කවුඩන් විසින් බොන්ට හැකිවන්නා වූ ජලයයි. පද ද්වයයේම දෙ ඉවුරෙහි ජලයෙහි මනාව පිරුණු භාවයම දක්වයි. **උළුම්පං** යනු පරතෙරට යාම සඳහා දැව එකට එක්කොට ඇණ කොටා කරණ ලද්දකි. **කුල්ලං** යනු උණ, බට ආදිය වැල් ආදීන්ගෙන් බැඳ කරන ලද්දකි. **එතමත්ථං විදිත්වා** එම මහජනයාට හුදෙක් ගඟදිය මාත්‍රයක් හෝ තරණය කරන්ට අසමර්ථතාවයද, තමාට හා භික්ෂු සංඝයාට ඉතා ගැඹුරු පළල් වූ සසර මහ සයුර තරණය කොට සිටි බවද, සර්වප්‍රකාරයෙන් දැන එකරුණ මනාව දැක්වීමට මෙ උදන් ඇතු සේක.

එහි **අණණවං** යනු සියලු අවසන් පිරිසිදීමෙන් යොදුනක් ප්‍රමාණ ගැඹුර හා පළල ජලය පවත්නා ස්ථානයට (සැතපුම් 16) එය විශේෂ නාමයකි. **සරං** යනු සිහිකොට ඉවත්වන හෙයින් මෙහි නදිය අදහස් කරන ලදී. මෙය යූ.සේයි. යම් කෙනෙක් ගැඹුර හා පළල ඇති සංසාර සාගරයද, තෘෂ්ණා නදියද තරණය කෙරෙත්ද ඔව්හු ආර්යමාර්ග සංඛ්‍යාත හෙය කොට, **විසජ්ජ පල්ලලානි** දිය පිරුණු නිම්න ස්ථානයන් ස්පර්ශ නොකොටම, මෙම ස්වල්පමාත්‍ර දිය තරණය කැමැති ජනයා පහුරක්

පබන්ධති යනු බැඳීමේ වෙහෙසට පත්වේ. **නිණ්ණා** මෙධාවිනොජනා යනු ආර්ය මාර්ග **ඥාන සංඛ්‍යාත** නුවණින් යුක්ත වූ හෙයින් නුවණැති බුදුවරුද, බුද්ධ ශ්‍රාවකයෝද, පහුරෙන් තොරව, එතෙර වූවාහු පරතෙර පිහිටියාහුය.

සවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

8-7

සත්වැන්නෙහි, **අදධාන මඟ පටිපන්නෙනා** යන අද්ධාන සංඛ්‍යාත දීර්ඝ මාර්ගයට පිළිපන්නේ, යන්නේ වේ. **නාග සමාලෙන** එනම් තෙරහු, **පච්ඡා සමණෙන** මොහු එකල්හි භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායක වූයේය. එහෙයින් ඔහු පසු මහණ කොට මාර්ගයට පිළිපන් සේක. භාග්‍යවතුන් වහන්සේට වනාහි ප්‍රථම බෝධියෙහි විසි වර්ෂයක් අනිබද්ධ (නොබැඳුනා වූ) උපස්ථායකයෝ වූහ. ඉන් මත්තෙහි පරිනිර්වාණය තෙක් පස් විසි වසක් ආයුෂ්මත් ආනන්ද තෙරහු ඡායාවක් මෙන් සිට උපස්ථාන කළේය. මේ වනාහි අනිබද්ධ උපස්ථායක කාලයයි. එහෙයින් **ආයසමතා නාගසමාලෙන පච්ඡා සමණෙන** යි යූ.සේයි. දෙධාපථං යනු දෙකක් වූ මාර්ගය. දෙයාකාර මාර්ගයයි. ද්විධා පථංයිද කියවත්. (දෙමංසන්ධිය) **ආයුෂ්මත් නාගසමාල** තමා විසින් පෙර එහි කළ පුරුදු හෙයින් ඔහුගේ **සෘජුභාවය සඳහා, ස්වාමීනි** භාග්‍යවතුන් වහන්ස, මෙය මාර්ගයැයි කියයි. **භාග්‍යවතුන් වහන්සේ** වනාහි එකල ඔහුගේ උවදුරු **සහිත** බව දැන, ඉන් වෙනත් මගෙකින් **වඩිනු** කැමැතියේ, නාගසමාලය, මෙය මාර්ගයැයි වදාළේය. උවදුරු සහිතයැයි කී කල්හි එය නො අදනා, භාග්‍යවතුන් වහන්ස, එහි උවදුරක් නැතැයි කියන්නේය. එය ඔහුට බොහෝ කලක් අහිත පිණිස **දුක් පිණිස** වේයයි සලකා උවදුරු සහිත යැයි නො වදාළේය. තෙවරක් මෙය මාර්ගයයි. මෙමගින් යමුයි කියා, සිව්වන වර භාග්‍යවතුන් වහන්සේ මෙමගින් වඩින්ට නොකැමැති වේ. මේයම **ඍජු** මාර්ගයයි. **එබැවින් මම භාග්‍යවතුන්** වහන්සේට පාසිවුරු දී මෙමගින් යන්නෙමියි සිතා **ශාස්තෘන් වහන්සේට** පාසිවුරු දෙන්ට නොහැකි වනුයේ බිම තබා

එළැඹ සිටි, දුකට හේතුවන කර්මයෙන් චෝදිත වූයේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළි නොගෙනම නික්ම ගියේය. එහෙයින් **අථ ඛො ආයසමා නාගසමාලො භගවතො පත්තචීවරං තථෙව ඡමායං නික්ඛිපිත්වා පක්කාමි** යූ.සේයි. එහි **භගවතො පත්තචීවරං** යනු තම හස්තප්‍රාප්ත භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය හා සිවුර, **තථෙව** යනු එම මාර්ගයහිම **ඡමාය** පෘථිවියෙ බහා තැබීය. භාග්‍යවතුන් වහන්ස, මේ ඔබගේ පාත්‍රය හා සිවුරයි. ඉදින් කැමැති නම් ගනු මැනව. ඉදින් තමා කැමැති මාර්ගයෙහිම යනු කැමැතියහුදැයි එසේනම් එහි යනු මැනැවැයි අදහසයි. භාග්‍යවතුන් වහන්සේද තම පාසිවුරු තමන් වහන්සේම ගෙන අදහස් කළ මාර්ගයට පිළිපැද්දේය. **අනතරාමඟෙ චොරා නික්ඛමිත්වා** යනු එකල්හි, ලේ තැවරුණු අත් ඇති පනීසයයක් මිනිස්සු රාජපරාධීන්ව, වනයට පිවිස සොරකමින් ජීවිකාව කරනුයේ උවදුරු පමුණුවන භාවයෙන් රජුගේ අණසක සිදින්නෙමුයි මාර්ග අසල අරණ්‍යයෙහි සිටිති. ඔව්හු තෙරුන් එම මගින් යන්නහු දැක, මෙම ශ්‍රමණයා මෙම මාර්ගයෙන් එයි. පාවිච්චි නොකළ යුතු මාර්ගයක් පාවිච්චි කරයි. අපගේ අස්ථිත්වය නොදනී. එබැවින් ඔහුට දන්වන්නෙමුයි කිපී වැසුන තැනින් වේගයෙන් නික්මී වේගයෙන් තෙරුන් බිම හෙලා, අත්පාවලින් කොටා, ඔහුගේ මැටි පාත්‍රයද බිඳ, සිවුර කැබලි කැබලිවල ඉරා දමා පැවිදි වූවෙකු හෙයින් නුඹ නොමරමු. මෙතැන් පටන් මෙම මාර්ගයෙහි උවදුරු බව දැනගනුවයි තර්ජනය කළහ. එහෙයින් **අථ ඛො ආයසමතො -පෙ- විහෙඨෙසුං** යි යූ.සේයි. භාග්‍යවතුන් වහන්සේද මෙතෙම එම මාර්ගයෙන් ගියේ සොරුන් විසින් පීඩාවට පත් කරන ලදුයේ මා සොයා දැන් මම පැමිණෙන්නේ යයි දැන මඳක් ගොස් මාර්ගයෙන් ඉවත්ව එක්තරා රුක් මුලෙක්හි වැඩහුන් සේක. ආයුෂ්මත් නාගසමාල තෙමේද, ආපසු හැරී අවුත් ශාස්තෘන් වහන්සේ විසින් ගිය මාර්ගයම ගෙන යනුයේ එම රුක්මූලෙහි භාග්‍යවතුන් වහන්සේ දැක එළැඹ වැඳ එපවත් ශාස්තෘන් වහන්සේට සැළ කළේය. එහෙයින් **අථඛො ආයසමා නාගසමාලො -පෙ- විපඨාලෙසුං** යි යූ.සේයි. **එතමත්ථං විදිත්වා** යනු එම ආයුෂ්මත් නාගසමාලගේ තම වචනය ගණන් නොගෙන කෙළවර ක්ෂේම නුවූ මාර්ග ගමනද තමාගේ කෙළවර වූ මාර්ග ගමනද දැන එකරුණ දැක්වීමට මෙ උදන් ඇතූ සේක.

එහි සඳ්ධිං චරං යනු සමග සරනුයේ, **එකතො වසං** යනු මෙය එයටම පර්යාය වචනයකි. සමග වාසය කරනුයේයි අර්ථයි. **මීසෙසා**

අඤ්ඤේ ජනෙන වෙදගු යන දතයුතු අර්ථයෙන් වේද සංඛ්‍යාත සිව් අරිසස් මග නැණින් ගිය හෙයින්, අවබෝධ කළ හෙයින්, වේදයෙහි හෝ සියලු දතයුතු දෑහි කෙළවරට ගිය හෙයින් වෙදගුයි. තම යහපත නොදනිනුයි අඤ්ඤායි. අතිපණ්ඩිත අඥානයා යයි අර්ථයි. එම අනුවණ ජනයා සමග **මිසෙසා** හැසිරීම් මාතුය සමග මිශ්‍ර වූයේ, **විදවා පජහාති පාපකං** යනු එම වේදගු භාවයෙන් විද්වතා පාපය දනුයේ, යහපත් නුවූ තමාගේ දුක් එළවන දෑ දුරුකරයි. පාපී නොකළණ පුද්ගලයා දුරුකරයි. දෙසූ පරිදි. **කොඤ්ඤවා බිර පකොව නිනනගං** යනු යම්සේ කොස්වාලිහිණි පක්ෂියා දිය මිශ්‍රිත කිරි එලවූ කල්හි දිය අත්හැර කිරි පමණක්ම පානය කරන හෙයින්, කිරි පානය කරනුයේ පහත් තන්හි ගමන් කිරීමෙන් නිමින සංඛ්‍යාත දිය දුරුකරයි. අත්හරි. මෙසේ නුවණැතියේ වනාහි දුෂ්ප්‍රාඥ පුද්ගලයින් සමග සිටීම් නිසඳ්‍යාදීන්හි සමග වූයේද ආදරයෙන් ඔවිහු දුරුකරයි. කිසිකලෙකත් සම්මිශ්‍රණ නොවේ.

සත්වන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

8-8

අටවැන්නෙහි **විසාඛාය මිගාර මාතුයා නතතා කාලං කතා** හොති යනු විසාඛා මහ උපාසිකාවගේ, පුතුගේ දූ කුමරිය කළුරිය කරන ලද්දේ වේ. ඕ වත් සම්පන්නව සස්නෙහි මනාව පැහැදුනේ, මහ උපාසිකාවගේ ගෙට පිවිසි භික්ෂූන්ටද භික්ෂුණීන්ටද තමා විසින් කළයුතු වතාවත් හා පෙරබත් හා පසුබත්ද අප්‍රමාදව කළාය. තම මිත්තනියගේ අදහස්වලට අනුකූලව පිළිපැද්දාය. එහෙයින් විසාඛාව ගෙයින් පිටත නික්මෙනුයේ සියල්ල ඇයටම භාරකොට යයි. රුවින්ද, දර්ශනීය ප්‍රසාදවහ හෙයින් ඕ ඇයට විශේෂයෙන් ප්‍රියමනාප වූයේය. ඕ රෝගයෙන් මැඩුනී කළුරිය කළාය. එහෙයින් **තෙන බොපන සමයෙන විසාඛාය මිගාරමාතුයා නතතා කාලකතා නෙ හොති පියා මනාපායි යූ.සේයි.** ඉක්බිති මහ උපාසිකාව ඇයගේ මරණයෙන් සෝකය දරන්ට නොහැකි වූයේ, දුක් වූයේ නොමනා

සිත් ඇත්තී සිරුර බහා තැබීම (භූමදානය) කරවා ශාස්තෘන් වහන්සේ සමීපයට ගියකල්හි චිත්තාශ්වාදයක් ලබන්නේ ඉතා යෙහෙකැයි භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේය. එහෙයින් **අථඛෝ විසාඛා මිගාර මාතා** ආදිය යූ.සේයි. දිවා දිවසස යනු දවසෙහි දවල්, මධ්‍යාහ්න කාලයෙහි, භාග්‍යවතුන් වහන්සේ විසාඛාවගේ සසර වෘතයෙහි ඇල්ම දන්නේ උපායෙන් සෝකය තුනී කිරීම සඳහා, විසාඛ නුඹ කැමැති වන්නෙහිදැයි ආදිය වදාළහ. එහි යාවතිකා යම් පමණ, එකල්හි වනාහි සත්කෝටියක් ජනයා සැවැත්නුවර වාසය කෙරෙත්. ඒ සඳහා භාග්‍යවතුන් වහන්සේ, විසාඛාව සැවැත්නුවර කොපමණ බහුතර ජනතාවක්, **දෙවසිකං** දිනපතා කළුරිය කෙරෙත්දැයි විචාල සේක. විසාඛාව ස්වාමීනි, දස දෙනෙක් යනාදිය කීය. එහි **තීණි** යනු තුනයි. මෙයම හෝ පාඨයි. **අවිචිතතා** යනු නොසිස්, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තම අදහස් ප්‍රකාශ කරනුයේ එසේනම් නුඹ කිසිකලෙකත්, කිසි විටෙකත්, නොතෙත් වස්ත්‍ර හෝ නොතෙත් කෙස් ඇතිවනු හැක්කහු වන්නෙහිදැයි විචාල සේක. මෙසේ ඇතිකල්හි ඇයගේ සියලු කාලය, සෝකයෙන් මැඩුනේ මළ පුත්‍රාදීන්ගේ අවමංගල සම්ප ක්‍රියා වශයෙන් දියෙහි බැසීමෙන්, තෙත් වස්ත්‍රයෙන්, තෙත් කේශයෙන්ම විය යුතුයයි දක්වයි. උපාසිකාව එය අසා සංවේග හටගත්තී, ස්වාමීනි, එය එසේ නොවේයයි ප්‍රතික්ෂේප කොට, ප්‍රිය වස්තු විපිලිසරින් තම සිත හැරුණු බව ශාස්තෘන් වහන්සේට සැළ කරනුයේ, ස්වාමීනි, එපමණ බොහෝ දූ පුතුන් හා මුනුබුරු මිනිබිරියන්ගෙන් මට කම් නැතැයි කීවාය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඇයට, එම දුකනම් ප්‍රිය වස්තු හේතුවෙනි. ප්‍රිය වස්තු යම්පමණද, දුක්ඛයන්ද එපමණය. එහෙයින් සුව කැමැති, දුක් පිළිකුල් කරන්නහු විසින්, සර්වප්‍රකාරයෙන් ප්‍රිය වස්තුවෙන් සිත වෙන් කළ යුතුයැයි ධර්මය දේශනා කරනුයේ, **යෙසං ඛො විසාඛෙ සතං පියානි සතං තෙසං දුකඛානියි** ආදිය වදාළහ. එහි **සතං පියානි** ප්‍රිය කළයුතු වස්තු සියයකි. සතං පියනතියි සමහරු කියවති. මෙහිද එකෙහි පටන් දහය දක්වා සංඛ්‍යාව ගණන් කිරීම ප්‍රධානව පවතියි. එහෙයින් යම් කෙනෙකුට ප්‍රිය වස්තු දහයක් වේද, ඔහුට දුක් දහයකි. ආදී වශයෙන් පාලියෙහි ආයේය. සමහරු වනාහි යෙසං දස පියානං දසතෙසං දුකඛානං ආදී ක්‍රමයෙන්ද කියවති. එය යහපත් නොවේ. විස්සෙහි පටන් සියය දක්වා සංඛ්‍යාව ගණන් කිරීම ප්‍රධානවය. එහිද ගණන් කිරීමෙහි ප්‍රධානත්වයම ගෙන යෙසං ඛො විසාඛෙ **සතං පියානි සතං තෙසං දුකඛානි** විසාඛාවෙනි, යම් කෙනෙකුන්ට ප්‍රිය වස්තු සියයක්

වේද, ඔහුට දුක් සියයකි ආදි ක්‍රමයෙන් පාලියෙහි ආයේය. හැමතන්හි යෙසං එකං පියං එකං තෙසං දුක්ඛංයි පාඨයි. දුකට නොවේ. එම පක්‍ෂයෙහි එක රසත්වය හා එක් අදහස් භාවය භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව වේ. කියන ලද ක්‍රමයෙන්ම පාලිය දතයුතුය. **එතමත්ථං විදිත්වා** යනු සෝක, පරිදේව ආදී චෛතසික කායික දුක, ප්‍රිය වස්තු නිමිත්තකොට ප්‍රිය වස්තු ඇති කල්හි වේ. නොමැති කල්හි නොවේයයි එම කරුණ සර්වප්‍රකාරයෙන් දැන, එකරුණ මනාව දැක්වීමට මෙ උදන් ඇතූ සේක.

එහි අර්ථය යමෙක් ඤාති, භෝග, රෝග, සීල දෘෂ්ටි ව්‍යසනයන්ගෙන් පීඩිතව ඇතුලත දැවෙන බාලයාගේ සිත තැවීම් ලක්‍ෂණකොට කිසියම් මෘදු මධ්‍යමාදී භේදයෙන් කවරාකාර හෝ සොකාවා සෝක හෝ ඒවායින්ම පෙලුනහුට කය වියලවීමට හේතු හටගන්වන, **කෙවි** විලාප නගන ලක්‍ෂණ, **පරිදෙවිතා** යනු අනිටු ස්පර්ශ හැපුණු ශරීරයෙහි පීඩා කිරීම් ලක්‍ෂණ, **දුක්ඛාවා** එසේ නොකියන අර්ථයෙහි විකල්පාර්ථයෙන්, වා ශබ්දයෙන් ගත් හෙයින්, දොම්නස් උපායාසාදීන්ද නිශ්‍රය භේදයෙන් ගන්නා ලදී. **අනෙකරූපා** මෙම සත්වලෝකයෙහි නන්වැදෑරුම්, සෝකාදිහු පෙනෙත්. ලැබෙත්. එම සියල්ලම පියං සත්ත්ව සංස්කාර ප්‍රිය ස්වභාව වේ. **පටිච්ච** නිසා පැමිණ, ප්‍රත්‍යය කොට, පහවනති හටගනිත්. එම කියන ලද ආකාර ඇති ප්‍රිය වස්තුවෙහි, පියෙ අසනෙත යනු ප්‍රිය බව ඇතිකරන ඡන්ද රාගයන් ප්‍රහීණ කළ කල්හි, කිසිකලෙකත් **එතෙ** ඒවා හට නොගනිත් යූ.සේයි. පියතො ජායති සොකො -පෙ- පෙමතො ජායතී සොකො ආදිය එසේම පියා පහුතා කලහා විවාදා **පරිදෙව** සොකා **සහ චජ්ජරෙ** යන ආදියෙන්ද දැක්වේ. මෙහිද **පරිදෙවිතාවා දුක්ඛාවා** යනු ලිංග විපර්යාසයෙන් යූ.සේයි. පරිදෙවිතානිවා දුක්ඛානි වායි **කිවයුතු** කල්හි **විභක්ති** ලෝපය හෝ කරන ලදැයි දතයුතුය. **තසමාහි තෙ සුබිනො විතසොකා** යනු ප්‍රියතාවයෙන් හටගත් සෝකාදිහු යමෙකුට නැත්ද, එහෙයින් ඔව්හුම සුවපත් වූවාහු, පහ වූ සෝක ඇත්තාහු නමැ. ඔව්හු කවරහුද? **යෙසං පියං නත්ථි කුහිඤ්චි ලොකෙ** යනු යම් ආකාර වූ ආර්යයන්ට සියලු ආකාරයෙන්, රාගය දුරුකළ හෙයින් සත්ත්ව ලෝකයෙහි **කිසිතැනෙකත්** පුතු යැයි හෝ සොයුරැයි හෝ සොයුරු යැයි හෝ **බිරිඳැයි** හෝ ප්‍රියයක් ප්‍රියවීමක්, ප්‍රියභාවයක් නැත. සංස්කාර ලෝකයෙහිද එය මා සතුය. මෙය, මෙයින් මම නම් සුවයක් ලබම්. ලබන්නෙමියි ප්‍රියයන් ප්‍රියවීමක් ප්‍රිය භාවයක් නැත. **තසමා අසොකං විරජං පඨයානො**

පියං න කයිරාථ කුහිංචි ලොකෙ යනු පහවූ සෝක ඇති අය, පහ වූ සෝක ඇති හෙයින් සුවපත් වූයේ නමැ කිසිම විෂයයෙක්හි ප්‍රියභාවයක් නොවේ. එහෙයින් තමහට කියන ලද සෝක අභාවයෙන් **අසොකං** සෝක රහිත භාවය, රාග රජස් ආදිය පහවීමෙන් **විරජං** රජස් රහිත භාවය, අර්හත්වය, සෝකයෙහි හෝ රාග රජස් ආදීන්ගේද අභාව හේතු භාවයෙන්ද, 'අසොකං විරජං'යයි ලද නම් ඇති **නිර්වාණය පත්‍ථයානො** කත්තුකම්‍යතා කුසලචිත්තදයාගේ (කුසල් කරනු කැමැත්ත) වශයෙන් කැමැත්තක් හටගැනීම කිසිතැනෙක්හි **ලොකෙ** රූපාදී ධර්මයන්හි, යටත් පිරිසෙයින් සමථ විදර්ශනා ධර්මයන්හිද **පියං** ප්‍රියභාවයක්, ප්‍රිය වීමක් **න කයිරාථ** නූපදවන්නේය. යූ.සේයි. මහණෙනි, යහපත් දෑද දුරුකළ යුතුය. අයහපත් දෑ ගැන කියනුම කවරේද?

අටවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

8-9

නවවැන්නෙහි, ආයස්මා යනු ප්‍රිය වචනයකි. **දබ්බො** යනු එම තෙරුන්ගේ නාමයයි. **මල්ල පුත්තො** යනු මල්ල රජුගේ පුතු එම ආයුෂ්මත් තෙමේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ පාද මූලයෙහි කරන ලද, ප්‍රාර්ථනා ඇතියේ, කල්ප ලක්ෂයක් රැස්කළ පින් රාශියක් ඇතියේ, අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි මල්ල රාජ දේවියගේ කුසෙහි උපන්නේ කරන ලද ප්‍රාර්ථනා ඇතියේ, උපතින් සත්හැවිරිදි කලමැ, මව්පියන් කරා එළැඹැ, පැවිද්ද ඉල්වී. ඔව්හුද පැවිදිවැ ආචාර ධර්මයන්හි හික්මේවා. ඉදින් එය සිත් නො අලවන්නේ නම් මෙහිම එන්නේ යැයි (එනු මැනවැයි) අනුදත්හ. හෙතෙම ශාස්තෘන් වහන්සේ කරා එළැඹැ පැවිද්ද ඉල්වී. ශාස්තෘන් වහන්සේද ඔහුගේ පූර්වහේතු සම්පත් බලා පැවිද්ද අනුදත් සේක. ඔහුට පැවිදිවන වේලාවෙහි දුන් අවවාදයෙන් භවත්‍රයය ගිනිගත්තාක් මෙන් වැටහින. ඔහුද විදර්ශනා පිහිටුව හිස මුඩුකරන අවස්ථාවෙහිම අර්හත්වයට පැමිණියේය. ශ්‍රාවකයෙකු විසින්

පැමිණිය යුතු ත්‍රිවිද්‍යා, සිව් පිළිසිඹියා, ෂඩභිඥා, නවලොවුතුරු ධර්මය යන මේ ආදී සියල්ල අවබෝධ කොට අසුමහ ශ්‍රාවකයින් අතරට ඇතුලත් වූයේය. එම ආයුෂ්මතුන් විසින් යූ.සේයි. මා විසින් වනාහි උපතින් සත්වසින් අර්හත්වය සාක්ෂාත් කරන ලදී. ශ්‍රාවකයෙකු විසින් පැමිණිය යුතු යමක් ඇත්ද, මවිසින් එම සියල්ලට පැමිණෙන ලදී ආදිය. **යෙන භගවා තෙනුපසංකමි** යනු එම ආයුෂ්මත් තෙමේ එක් දිනක් රජගහ නුවර පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් ඉවත් වූයේ, භාග්‍යවතුන් වහන්සේට වත් දක්වා දිවා ස්ථානයට ගොස් කලයෙන් දිය ගෙන පා ගල්වා සිරුර සිසිල්කොට, සම්කඩ පණවා හුන්නේ කල් පිරිසිදීම කොට සමවතට සම වනි. පිරිසිදි කාලය අනුව සමවතින් නැගිට තම ආයු සංස්කාර බැලීය. එහි ඒවා ක්ෂීණය. කිහිප මොහොතක් කලැයි වැටහින. හෙතෙම යම් ආකාර වූ මම ශාස්තෘන් වහන්සේට සැල නොකොට, සබ්‍රම්සරුන් විසින් නොදතුයේ, හුන් අයුරින්ම මෙහි පිරිනිවෙන්නෙමි යන එය සුදුසු නොවේයයි සිතීය. ශාස්තෘන් වහන්සේ කරා එළැඹ පිරිනිවීම අනුමත කරවාගෙන ශාස්තෘන් වහන්සේට වත් දක්වා සස්නෙහි නෛර්යාණික බව දැක්වීම සඳහා මාගේ ඍධ්‍යානුභාවය ප්‍රකාශ කරනුයේ අහස්හි හිඳ තේජෝ ධාතු සමවතට සමවැද පිරිනිවෙන්නේ නම් ඉතා යෙහෙකැයි සිතීය. එසේ ඇතිකල්හි යමෙක් මා කෙරෙහි අශ්‍රද්ධාවත්, අප්‍රසන්න වූවාහු වෙත්ද, ඔවුන්ටද පැහැදීම උපදින්නේය. එය ඔවුන්ට දීර්ඝ කාලයක් හිතසුව සඳහා පවත්නේය. එම ආයුෂ්මත් තෙමේ මෙසේද සිතා භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ, ඒ සියල්ල එසේම කළේය. එහෙයින්, **අථඛෝ ආයසමා දබ්බෝ මල්ල ප්‍රුතෙනා යෙන භගවා තෙනුපසංකමි** ආදිය යූ.සේයි. එහි **පරිනිබ්බාන කාලෝ මෙ** යනු භාග්‍යවතුන් වහන්ස, මාගේ අනුපාදිසෙස පරිනිර්වාණ ධාතුයෙන් පිරිනිවෙන කාලය එළැඹියේය. ඒ මම භාග්‍යවතුන් වහන්සේට සැළකොට පිරිනිවෙන්ට කැමැත්තෙමි යි දක්වයි. සමහරු කීහු. තෙරහු එපමණ ජරාජීර්ණ වූයේ නැත. ගිලන් වූයේද නැත. පිරිනිවීම සඳහා ශාස්තෘන් වහන්සේ විචාරයි. මෙහි හේතුවක් නැත. මෙතිය භූමෝජක භික්ෂූහු පෙර මා හට, ප්‍රධාන හේතුවක් නොමැති, පාරාජිකාවෙන් දුර්වල කළහ. එහි විනිශ්චය සන්සිඳුනේද, ආක්‍රොශ කෙරෙත්මය. ඔවුන්ගේ වචන විශ්වාසකොට අන් පෘථග්ජනයෝද, මා කෙරෙහි, අගෞරව, පරිභව කෙරෙත් යයි, මෙම දුක්බර නිරර්ථකව උසුලා කවර ප්‍රයෝජනද? එහෙයින් මම දැන් මම පිරිනිවෙන්නෙමියි සනිටුහන් කොට ශාස්තෘන් වහන්සේ විචාරයි. එය

නොකෙරුණි. රහත්හු ආයු සංස්කාර ක්‍ෂය නුවූ කල්හි අන්‍යයන්ගේ අපවාදාදියට බියෙන් පිරිනිවීම සඳහා නොසිතත්. උත්සාහ නොකෙරෙත්. අන්‍යයන්ගේ ප්‍රසාද හේතුවෙන් බොහෝ කලක් නොසිටිත්. තවද ස්වාභාවිකවම තමා ආයු සංස්කාරයෙහි ක්‍ෂය වීම බලාපොරොත්තු වෙති. දෙසූ පරිදි,

නාහි කංඛාමි මරණං - නාහි කංඛාමි ජීවිතං
කාලඤ්ච පති කංඛාමි - නිබ්බිසං භතකෝ යථා

මරණය අපේක්‍ෂා නොකරමි. ජීවිතය අපේක්‍ෂා නොකරමි. වැටුප් සහිත කම්කරුවකු මෙන් කාලය ගැන බලාපොරොත්තු වෙමි. (සැක කරමි.)

භාග්‍යවතුන් වහන්සේද ඔහුගේ ආයු සංස්කාරය බලා ක්‍ෂය වූ බව දැන යසසදානි අඛඝගතත්තා යනු අහසට මනාව නැඟී, අහසට ගොස් යයි අර්ථයි. අභි ශබ්ද යෝගයෙන් මෙය ද්විතියා වචනයි. අර්ථය වනාහි සත්තමී වශයෙන් දතයුතුය. අහසට පැන නැඟ කුමක් කළෙහිදැයි කීය. ආකාසෙ අනතලික්ඛෙ පල්ලංකෙන නිසීදිත්වා යන ආදියයි. එහි තෙජෝ ධාතුං සමාපජ්ජිත්වා යනු තේජෝ කසිණ චතුර්ථ ධ්‍යාන සමවතට සමවැද, තෙරහු එකල්හි භාග්‍යවතුන් වහන්සේ වැඳ, තෙවරක් ප්‍රදක්‍ෂිණා කොට, එකත්පස්ව සිටියේ, භාග්‍යවතුන් වහන්ස, කල්ප ලක්‍ෂයක්, ඔබතුමන් සමග ඒ ඒ තන්හි වසමින් පින් කරනුයේ මෙම කරුණ සඳහා කෙළෙහිය. එම කරුණ අද මස්තකප්‍රාප්ත වූයේය. මෙය අවසන් දර්ශනය යැයි කීයේය. එහි යම් පෘථග්ජන භික්‍ෂූහු වෙත්ද, ඔවුන්ද සෝවාන්, සකෘදාගාමීහුද යන මොවුනතර ඇතමුන්ට මහත් කරුණාවක් වූයේය. ඇතැම්හු හැඬීම් ප්‍රාප්ත වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ සිතෙහි හැසිරීම දැන, එසේනම් දබ්බය මා හටද, බික් සඟනටද ඍද්ධි ප්‍රාතිහාර්ය දක්වවයි වදාළ සේක. 'එකෙණෙහිම සියලු බික් සඟ රැස්විය. ඉක්බිති ආයුෂ්මත් දබ්බ එකෙක්ව බොහෝ වේ ආදී ක්‍රමයෙන් ආවා වූ ශ්‍රාවක සාධාරණ සියලු ප්‍රාතිහාර්යයන් ප්‍රදර්ශනය කොට, නැවතද භාග්‍යවතුන් වහන්සේ වැඳ අහසට නැඟ, අහසෙහි පෘථ්වියක් නිර්මිතකොට, එහි පර්යංකයෙන් වැඩහුන්නේ, තේජෝ කසිණ සමවතෙහි පිරියම්කොට, සමවතට සමවැද නැගිට සිරුර ආවර්ජනාකොට, නැවත

සමවතට සමවැද ශරීරය දවන තේජෝ ධාතුව අධිෂ්ඨාන කොට පිරිනිවියෝය. අධිෂ්ඨානය සමග සියලු ශරීරය ගින්නෙන් ඇවිලුනේ විය. ක්‍ෂණයකින්ම එම ගින්න, කල්ප විනාශ ගින්නක් මෙන් ස්වල්ප මාත්‍ර වූද සංස්කාර ගතයක් දැලි (අලු) මාත්‍රයක් ද එහි කිසිවක් ශේෂ රහිතව අධිෂ්ඨාන බලයෙන් දවා නිවුනි. එහෙයින් **අථ බො ආයසමා දබ්බො මල්ලපුත්තො** යන ආදිය යූ.සේයි. එහි **වුට්ඨහිත්වා පරිනිබ්බායි** යනු සෘද්ධි **සිතින්** නැගිට භවංග සිතින් පිරිනිවියේය. **කඨාය මනතසස** දැල්වෙනු ලබන, **ඩය්‍හමානසස** යනු එයටම පර්යාය වචනයකි. නොහොත් **කඨාය මානසස** යනු ගිනිදැල් පැවැති ක්‍ෂණය සඳහා යූ.සේයි. ඩය්‍හා මානසස යනු ගිනි අඟුරු පැවැති ක්‍ෂණයයි. ඡාරිකා යනු අළු, මසි යනු දැලි, **න පඤ්ඤායිත්‍ථ** නො පැණින. අධිෂ්ඨාන බලයෙන් සියල්ල සැනෙකින්ම අතුරුදන් වීයයි අර්ථයි. කවර හෙයින් තෙරහු උතුරු මිනිස්දමින් ඍද්ධි ප්‍රාතිහාර්යය දැක්වීද? භාග්‍යවතුන් වහන්සේ විසින් ඍද්ධි ප්‍රාතිහාර්යය කිරීම ප්‍රතික්‍ෂෙප කරන ලද්දේ නොවේදැයි එය චෝදනා නොකළ යුතුය. ගිහීන් හමුයෙහි ප්‍රාතිහාර්යය කිරීම ප්‍රතික්‍ෂේප කරන ලද හෙයිනි. එයද වනාහි විකුර්වණ වශයෙනි. අධිෂ්ඨාන වශයෙන් නොවේ. මෙම ආයුෂ්මත් තෙමේ ධර්මස්වාමීන් විසින් අණ කරන ලදුයේ ප්‍රාතිහාර්යය දැක්වීය. **එතමත්‍ථං විදිත්වා** යනු එම ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රයාගේ උපාදාන රහිත පිරිනිවීම සර්වප්‍රකාරයෙන් දැන එකරුණ දැක්වීමට මෙ උදන් ඇතූ සේක.

එහි අභෙදි කායො යනු යම් ආකාර වූ සියලු භූතෝ පාදාය භේද වූ සිව් සන්තති රූප කයක් වේද, එය බිඳිණි. ශේෂ රහිතව දැවිණි. නැසිනි. අතුරුදන් විය. නූපදනා ස්වභාවයට පැමිණියේය. **නිරොධි සඤ්ඤා** යනු රූපායතනාදීන්ට ගෝචරතාවයෙන් රූපසංඥාදී භේද වූ සියලුම සංඥාවෝ ප්‍රතිසන්ධි රහිත වූ නිරෝධයෙන් නිරුද්ධ විය. වෙදනාසීති **භවිංසු සබ්බා** යනු විපාක වේදනා, ක්‍රියා වේදනා යන සියලු වේදනාවෝ අප්‍රතිසන්ධික නිරෝධයෙන් නිරුද්ධ හෙයින්, ස්වල්ප මාත්‍ර වූද වේදනා දාහයෙහි අභාවයෙන් සිසිල් වූයේ වූහ. කුසල්, අකුසල් වේදනා ආදී සියලුම වේදනාවන් අර්හත් ඵල ක්‍ෂණයෙහිම නිරෝධයට ගියේය. **වීතිරහිංසුයිද** කියවති. (ඉක්ම යාම) විද්‍යමාන නොවූවාහු නිරුද්ධ වූහයි අර්ථයි. **වූපසමිංසු සංඛාරා** යනු විපාක, ක්‍රියා ප්‍රභේද වූ සියලුම සංස්කාර ස්කන්ධ අප්‍රතිසන්ධික නිරෝධයෙන්ම නිරුද්ධ හෙයින් විශේෂයෙන්ම

සන්සිඳුනහ. **විඤ්ඤාණං අපඨමාගමා** යනු විපාක ක්‍රියා භේද වූ සියලුම විඤ්ඤාණය ප්‍රතිසන්ධි රහිත නිරෝධයෙන්ම අස්තයට, විනාශයට ආයේය. පැමිණියේය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රයාගේ පංච ස්කන්ධයන්ගේ කල් ඇතිවම, කෙලෙස් අභිසංස්කාර උපාදානයාගේ ශේෂ රහිතව නිරුද්ධ හෙයින්, දර නැති ගින්නක් මෙන් අප්‍රතිසන්ධික නිරෝධයෙන් නිරුද්ධ බැව් හේතුකොට, ප්‍රීති වේගයෙන් මුදා හළ මෙ උදන් ඇනූ සේක.

නවවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

8-10

දසවැන්නෙහි, **තත්‍ර බො භගවා භික්ඛු ආමනෙතසි** භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කැමැත්ත ඇතිතාක් කල් වාසයකොට, දනව් සැරිසරනුයේ පිළිවෙළින්ම සැවතට පත්ව, දෙව්රමැ වාසය කරනුයේ, යම් යම් භික්ෂූන්ට ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රගේ පිරිනිවන ප්‍රත්‍යක්ෂ නොවීද, ඔවුන්ට එය ප්‍රත්‍යක්ෂ කොට දක්වන්ට, යම් ආකාර වූ, මෙත්තිය භූම්මජකයන් විසින් කරන ලද අභූත අසත්‍ය දෝෂාරෝපණයෙන්, තෙරුන් කෙරෙහි, ගෞරව රහිත පෘථග්ජනයෝ වෙත්ද, ඔවුන්ට තෙරුන් කෙරෙහි බුහුමන් ඉපදවීම සඳහා ද ආමන්ත්‍රණය කළ සේක. එහි **තත්‍ර** යනු වචන හැඟවීමේ නිපාත මාත්‍රයයි. **බො** යනු අවධාරණාර්තයෙහිය. **එහි තත්‍ර** යන මෙයින් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ආමන්ත්‍රණය කෙළේයයි එම පදයන්ගෙන් කියනු ලබන්නම බබලවයි. **බො** යන මෙයින් ආමන්ත්‍රණය කෙළේමය. ඇමතීමෙහි ලා භාග්‍යවතුන් වහන්සේට **කිසි අනතුරක් නුවූයේ** යයි යන මෙකරුණ දක්වයි. නොහොත් **තත්‍ර** යනු එම අරමුහි, **බො** යන වදන් ලකර නිපාතයි. **ආමනෙතසි** යනු වදාළේය. කවර හෙයින් වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ම ආමන්ත්‍රණය කළ සේක්ද? ජ්‍යෙෂ්ඨ හෙයින්, ශ්‍රේෂ්ඨ හෙයින්, ආසන්න හෙයින් හැම කලැ තැන්පත් කරන ලද හෙයින්, ධර්ම දේශනාවට විශේෂයෙන් බඳුනු වූ හෙයින්ද වේ.

භික්ඛවො යනු ඔවුන්ට ආමන්ත්‍රණය කිරීම් ආකාර වචනයයි. **භදන්තෙනති** යනු ආමන්ත්‍රිත භික්ෂූන්ගේ, ගෞරවයෙන් ශාස්තෘන් වහන්සේට පිළිවදන් දීමයි. **භික්ඛවොයි** කියන්නා වූ භාග්‍යවතුන් වහන්සේ එම භික්ෂූන් අමතයි. **භදන්තෙන** යි ස්වාමීනියි කියන්නා වූ ඔව්හු පසු අමතති. තවද භික්ඛවො යන මෙයින් කරුණායෙන් පැතිරුණ සෞම්‍ය හෘදය නසන නිපාත පූර්වාංගම වචනයෙන් ඒ භික්ෂූහු කමටහන් මෙනෙහි කිරීම් ධර්ම ප්‍රත්‍යවේක්ෂා කිරීම් ආදියෙන් නවත්වා තම මුව අබිමුව කරයි. **හනෙන** යි මෙයින් ශාස්තෘන් වහන්සේ කෙරෙහි ආදර බුහුමන් ගෞරව දැක්වීම් වචනයෙන් එම භික්ෂූහු තමාගේ මනා ශ්‍රවණතාවය, අවවාද පිළිගැනීම් ගෞරව භාවයද දන්වති. **භගවතො පච්චස්සොසුං** යනු එම භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනයට පිළිවදන් දුන්හ. ශ්‍රමණ කාම්‍යතාවය ජනනය කළහ. **එතදවොච** යනු භාග්‍යවතුන් වහන්සේ දැන් දේශනා කරනු ලබන සියලු සූත්‍රය දේශනා කළ සේක. දබ්බස්ස හික්ඛවෙ මල්ල පුත්තස්ස ආදිය අනතුරු සූත්‍රයෙහි කියන ලද අර්ථමය. **එතමත්ථං** යන ආදීන්හිද පෙර නොකී විරූවක් නැත. අනතුරු සූත්‍රයෙහි කියන ලද ක්‍රමයෙන්ම දතයුතුය. ගාථාවන්හි වනාහි **අයොඝන හතස්ස** යනු එයින් යකඩය පහරනුයි අයොඝනයි. ලොකුරුවන්ගේ යකුළද, යකඩ මිටියද, එම කුළු ගෙඩියෙන් නසන ලද පහර දෙන ලද, සමහරු වනාහි අයොඝන හතස්ස යනු ඝණ යකඩ ගුලිය පහරන කලැයි අර්ථ කියති. මෙහි එව ශබ්දය නිපාත මාත්‍රයකි. **ජලතො ජාතවෙදසො** යනු දිලියෙන ගින්නෙහි (ගේ) එය අනාදරාර්ථයෙහි ෂෂ්ඨියි. **අනුපුබ්බූප සන්තස්ස** යනු අනුක්‍රමයෙන් සන්සුන් වූ, නිවුනා වූ, නිරුද්ධ වූ **යථා නඤ්ඤායතෙ ගති** යනු යම්සේ එහි යාම නොපැනේද, මෙය යූ.සේයි. යකඩ, මිටි, කුළු ආදියෙන් පහරන ලද, යකුළෙන් පහරන ලද, මනාව පහරන ලද, ලොහො බඳුන් ආදියට ගිය ජල මානය ගින්නෙන් විනාශ වන්නාක් මෙන් එසේ උපන්නා වූ හෝ ශබ්දය අනුක්‍රමයෙන් සන්සුන් වූයේ මනාව සන්සුන් වූයේ දස දිසාවන්හි කිසිතැනෙක්හි පැවැත්මෙක් නොපැනේ. ප්‍රත්‍යය නිරෝධයෙන් අප්‍රතිසන්ධිකව නිරුද්ධ වූ හෙයිනි. **එවං සම්මා විමුත්තානං** යනු මනා හේතුවෙන්, න්‍යායනේ, තදංග, විෂ්කම්භන විමුක්ති පූර්වාංගම ආර්ය මාර්ගයෙන්, සිව් උපාදානයන්ගෙන් ද ආශ්‍රවයන්ගෙන්ද මනාව මිදුනවුන්ගේ, එයින්ම, කාම ප්‍රබන්ධ සංඛ්‍යාත කාමෝඝ භව ඕඝ ආදී භේද වූ ඉතිරි ඕඝයන්ද තරණයකොට සිටි හෙයින්, **කාම බන්ධොගතාරිනං** මනාව සන්සිඳවන ලද සියලු කෙලෙස් කම්පා වූ හෙයින්, කෙලෙස් රැස්

කිරීම් වාතයන්ගෙන් ද කම්පා නොවන හෙයින්, නොසැලෙන අනුපාදිශේෂ නිර්වාණ සංඛ්‍යාත සියලු සංස්කාර සන්සිඳීමට පැමිණි අවබෝධ කළ ක්ෂිණාශ්‍රවයන්ගේ **ගති** දිව්‍ය මනුෂ්‍ය ආදී භේද වූ උත්පත්තීන්හි මෙනම් අයෙකැයි පැනවිය යුත්තෙහි අභාව හේතින් **පඤ්ඤාපෙතුං නසක්කි** නොලබයි. කියන ලද ගින්න මෙන් අප්‍රඥප්තික භාවයටම ඔහු ගියේ යයි අර්ථයි.

දසවන සූත්‍ර වර්ණනාව නිමියේ ය.

අටවන වර්ග වර්ණනාව සමාප්තයි.

මෙතෙකින්

සුවිමුත්ත චිත්තවොදාන - දෙව දානව මානිනෝ
පඤ්ඤත්ත තණ්හා සන්තානෝ - පීති සංවෙග දීපනෝ

මනාව මිදුණු, සිත පිරිසිදු කරන සුරාසුර පූජිත, සිය සිත් සතන්හි සුන් තෘෂ්ණා සහිත වූ ප්‍රීතිය හා සංවේගය දක්වන්නා වූ,

සද්ධම්මදාන නිරතෝ - උපාදානක්ඛයා වහෝ
තත්ථ තත්ථ උදානෙන - උදානෙසි විනායකෝ

උපාදානක්ෂය ඵළවන, සදහම් දන්හි නිරත වූ ශ්‍රේෂ්ඨ නායකයාණෝ, ඒ ඒ තන්හි හටගත් ප්‍රීතියෙන් ප්‍රීති වාක්‍යයන් පහළ කළ සේක.

තෙ සබ්බෙ එකතෝ කත්වා - ආරොපෙත්ථහි සංගහං
උදානමිති සංගීතං - ධම්ම සංගාහකෙහි යං

එම සියල්ල එකතුකොට, සංග්‍රහ කොට එළවන්නා වූ, ධර්ම සංග්‍රාහකයින් විසින් යමක් උදානයැයි සංගෘහිතද,

තස්ස අත්ථං පකාසෙතුං - පොරණට්ඨ කථානයං
නිස්සාය යා සමාරද්ධා - අත්ථ සංවණ්ණනාමයා

එහි අර්ථ ප්‍රකාශ කරන්ට, පුරාණ අර්ථකථා ක්‍රමය ඇසිරිකොට, මා විසින් අර්ථ සංවර්ණනාවක් මනාව අරඹන ලදද?

සා තත්ථ පරමත්ථානං - සුත්තනෙත්තසු යථාරහං
පකාසනා පරමත්ථ දීපනී නාම නාමතො

එහි සූත්‍රාන්තයන් හි, උතුම් අර්ථයන්ගේ, සුදුසු පරිදි, ප්‍රකාශනය නමින් පරමත්ථ දීපනී නම් වේ.

සමත්තතා පරිනිට්ඨානං - අනාකුල විනිච්ඡයා
චතුනතිංස පමාණාය - පාලියා භාණවාරතො

පෙළෙහි බණවර වශයෙන්, ප්‍රමාණයෙන් සූතිසක් වූ නිරවුල් විනිශ්චයෙහි නිමවීමට සම්ප්‍රාප්ත විය.

ඉති තං සංඛරොනෙතන - සං තං අධිගතං මයා
පුඤ්ඤං තසසානුභාවෙන - ලොකනාථසස සාසනං

මෙසේ එය සකසන්නා වූ, මවිසින් යමක් ලබන ලදද, එම පුණ්‍යානුභාවයෙන් ලෝකනාථයාණන් වහන්සේගේ සස්න,

ඔභාසෙත්වා විසුද්ධාය - සීලාදි පටිපත්තියා
සඛෙබපි දෙහිනො හොනතු - විමුත්ති රසභාගිනො

පිරිසිදු සීලාදී ප්‍රතිපත්තියෙන් බබලවා සියලු දේහධාරීහු, විමුක්ති රසයෙහි කොටස්කරුවෝ වෙත්වා.

චිරං තිටඨතු ලොකසමිං - සමමා සමබුද්ධ සාසනං
තසමිං සගාරවා නිවචං - හොනතු සඛෙබපි පාණිනො

ලොවැ, සම්මා සම්බුදු සසුන චිරකල් පවතීවා. සියලු ප්‍රාණීහු එහි නිතර ගෞරව සහිත වෙත්වා.

සම්මා වසතු කාලෙන - දෙවොපි ජගතීපති
සද්ධම්ම නිරතො ලොකං - ධම්මෙනෙව පසාසතූති

වර්ෂාවද මනාව කල්හි වසීවා. භූපති තෙමේ දහම්හි නිරත ලෝකයා දැහැමින්ම පාලනය කෙරේවා.

බදරතීර්ථ වෙහෙස වැසි ආචාර්ය ධර්මපාල තෙරහු විසින් කරන ලද,
උදානයෙහි අර්ථ කථාව සමාප්තයි.


නිබ්බාන පච්චයො හොතු
නිවනට හේතු වේවා !

පාලි අට්ඨකථා සහ එහි පරිවර්තන වියත්හු

1.	සුමංගල විලාසිනී - දීඝනිකායට්ඨ කථා-I	දයා ගුණසේකර මහතා පී.එල්.කේ. පෙරේරා මහතා
2.	සුමංගල විලාසිනී දීඝනිකායට්ඨ කථා-II	බී.එම්.පී. බාලසූරිය මහතා
3.	පපඤ්චසූදනී මජ්ඣිම නිකායට්ඨ කථා I	ආඳාවල දේවසිරි හිමි
4.	පපඤ්චසූදනී මජ්ඣිම නිකායට්ඨ කථා II	විජිතානන්ද සරත්චන්ද්‍ර මහතා
5.	පපඤ්චසූදනී මජ්ඣිම නිකායට්ඨ කථා III	දයා ගුණසේකර මහතා
6.	පපඤ්චසූදනී මජ්ඣිම නිකායට්ඨ කථා IV	බලපිටියේ සිරිසීවලී හිමි
7.	සාරත්ථප්පකාසිනී සංයුත්ත නිකායට්ඨ කථා I	එන්.එච්. පෙරේරා මහතා
8.	සාරත්ථප්පකාසිනී සංයුත්ත නිකායට්ඨ කථා II	හත්තොටුවේ ඉන්දරතන හිමි
9.	සාරත්ථප්පකාසිනී සංයුත්ත නිකායට්ඨ කථා III	ජිනදාස ගොඩකන්ද මහතා
10.	මනෝරථපූරණී අංගුත්තර නිකායට්ඨ කථා I	කපිල අභයවංස මහතා
11.	මනෝරථපූරණී අංගුත්තර නිකායට්ඨ කථා II	කපිල අභයවංස මහතා
12.	පරමත්ථජෝතිකා ඛුද්දක පාඨට්ඨ කථා	මැදඋයන්ගොඩ විජයකිත්ති හිමි
13.	ධම්මපදට්ඨ කථා I	වැලමිටියාවේ සිරිධම්මරක්ඛිත හිමි
14.	ධම්මපදට්ඨ කථා II	පන්නල සුමේධ හිමි
15.	පරමත්ථදීපනී උදානට්ඨ කථා	ඩබ්.ඇල්.පී. ධර්මදාස මහතා
16.	පරමත්ථදීපනී ඉතිවුත්තකට්ඨ කථා	ඇස්වත්තේ රේවත හිමි
17.	පරමත්ථදීපනී සුත්තනිපාතට්ඨ කථා	නිමල් ලාල් රංජිත් මහතා
18.	පරමත්ථදීපනී සුත්තසංගහට්ඨ කථා	ආඳාවල දේවසිරි හිමි
19.	පරමත්ථදීපනී පේතවත්ථු අට්ඨකථා	විජිතානන්ද සරත්චන්ද්‍ර මහතා
20.	පරමත්ථදීපනී විමානවත්ථු අට්ඨකථා	ජිනදාස ගොඩකන්ද මහතා ලක්ෂපතියේ සමාධි මෙහෙණිය
21.	පරමත්ථදීපනී ථේරගාථා I	හත්තොටුවේ ඉන්දරතන හිමි
22.	පරමත්ථදීපනී ථේරගාථා II	පී.එල්.කේ. පෙරේරා මහතා
23.	පරමත්ථදීපනී ථේරීගාථා	ජී.එස්බී. සේනානායක මහතා
24.	සාරත්ථ සමුච්චය චතුභාණවාරට්ඨ කථා	වටගෙදර විමලබුද්ධි හිමි
25.	ජාතකට්ඨ කථා පළමුවන භාගය	යාලේගම චන්දකිත්ති හිමි
26.	ජාතකට්ඨ කථා දෙවෙනි භාගය	ටී.ජී. ජයතිලක මහතා
27.	ජාතකට්ඨ කථා තෙවෙනි භාගය	පල්ලේගම සමිත හිමි
28.	ජාතකට්ඨ කථා සිව්වෙනි භාගය	මාවනානේ සෝමින්ද හිමි

29.	ජාතකට්ඨ කථා පස්වෙනි භාගය	මාවනානේ සෝමින්ද හිමි
30	ජාතකට්ඨ කථා සයවෙනි භාගය	සරත්චන්ද්‍ර අමරතුංග මහතා
31.	ජාතකට්ඨ කථා සත්වෙනි භාගය	එච්.ජී.එස්. නිශ්ශංක මහතා පී.එල්.කේ. පෙරේරා මහතා
32.	සද්ධම්මපජ්ජොතිකා චූලනිද්දෙස අට්ඨකථා	නිමල්ලාල් රංජිත් මහතා
33.	සද්ධම්මපජ්ජොතිකා මහානිද්දෙස අට්ඨකථා	හත්තොටුවේ ඉන්දරතන හිමි
34.	විසුද්ධ ජනවිලාසිනී අපදානට්ඨ කථා I	සරත්චන්ද්‍ර අමරතුංග මහතා
35.	විසුද්ධ ජනවිලාසිනී අපදානට්ඨ කථා II	දයා ගුණසේකර මහතා
36.	මධුරත්ථවිලාසිනී බුද්ධවංස අට්ඨකථා	කීර්ති නාරම්පනාව මහතා
37.	පරමත්ථදීපනී චරියාපිටකට්ඨ කථා	මැදඋයන්ගොඩ විජයකිත්ති හිමි
38.	සමන්තපාසාදිකා විනයට්ඨ කථා I	අම්බලන්ගොඩ ධම්මකුසල හිමි
39.	සමන්තපාසාදිකා විනයට්ඨ කථා II	අම්බලන්ගොඩ ධම්මකුසල හිමි
40.	සමන්තපාසාදිකා විනයට්ඨකථා III	අම්බලන්ගොඩ ධම්මකුසල හිමි
41.	කංඛාවිතරණී ප්‍රාතිමෝක්ෂ වර්ණනා	කපිල අභයවංස මහතා
42.	නෙත්තිප්පකරණට්ඨ කථා	මැදගම්පිටියේ විජිතධම්ම හිමි
43.	පරමත්ථදීපනී පංචප්පකරණට්ඨ කථා	බී.එම්.පී. බාලසූරිය මහතා
44.	පරමත්ථදීපනී පංචප්පකරණට්ඨ කථා	බී.එම්.පී. බාලසූරිය මහතා
45.	සමොහවිනොදනී විභංගට්ඨ කථා	බී.එම්.පී. බාලසූරිය මහතා
46.	අත්ථසාලිනී ධම්මසංගණිප්පකරණට්ඨ කථා	සෝමරත්න ගම්ලත් මහතා
47.	සද්ධම්මපකාසිනී පටිසම්භිදා මග්ගට්ඨ කථා	ඩබ්ලිව්.ඇල්.පී. ධර්මදාස මහතා
48.	විසුද්ධි මාර්ගය පළමුවන කොටස	හේමචන්ද්‍ර දිසානායක මහතා
49.	විසුද්ධි මාර්ගය දෙවන කොටස	හේමචන්ද්‍ර දිසානායක මහතා
50.	කංඛා විතරණී මාතිකට්ඨ කථා	

නමින් අටුවාවක් ඇත. එය කංඛාවිතරණී ප්‍රාතිමෝක්ෂ වර්ණනාව හා එකම සමාන බැවින් පරිවර්තනය කර නැත.



THE BO-TREE AT ANARAJAPOORA.

ටෙනන්ට් 1859

භදන්ත බුද්ධඝොෂාචාර්‍යපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධිය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිහළඨකථා පාලියට පරිවර්තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk, info@buddhistcc.com
www.buddhistcc.net

ISBN 978-955-1604-36-3